වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயல்திறன் அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2025









ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

போக்குவரத்துஇ நெடுஞ்சாலைகள்இ துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு

MINISTRY OF TRANSPORT, HIGHWAYS, PORTS AND CIVIL AVIATION



ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

ප්‍රවාහන අංශය

කාර්යසාධන වාර්තාව - 2025

7 වෙනි මහල
සෙත්සිරිපාය - අදියර II
බත්තරමුල්ල

ජූනි 2026

පටුන

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය
1.1 හැඳින්වීම..... 03
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු..... 09
1.3 ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යන්..... 09
1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන..... 10
1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු..... 10
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන..... 10
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු..... 12

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම
2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක..... 17
2.1.1 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව..... 17
2.1.1.9 මහව ඕමන්ත දුම්රිය මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය..... 23
2.1.2 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව..... 24
2.1.3 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය..... 35
2.1.4 ජාතික ගමනාගමන කොමිෂන් සභාව..... 40
2.1.5 ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය 50
2.1.6 මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව 57
2.1.7 සී/ස ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම..... 62
2.1.8 මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය..... 65
2.1.9 කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය..... 69

03. පරිච්ඡේදය - 2025 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය
3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය..... 79
3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය..... 79
3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය..... 79
3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්..... 79
3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය..... 79
3.7 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය..... 79
3.8 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන..... 80
3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය..... 80
3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව 80

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක
4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)..... 83

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය
5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු..... 89
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග..... 95

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය..... 99
6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන අයුරු 99
6.3 මානව සම්පත් සංවර්ධනය තුලින් ජනතා සේවාව කාර්යක්ෂම කරවීම..... 99

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව..... 107

ඡායාරූප එකතුව..... 115

01 වන පරිච්ඡේදය

ආයතනයේ පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ප්‍රවාහන පද්ධති සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ කළමනාකරණය කිරීම රටක ආර්ථික වර්ධනය සහ සමාජ යහපැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය කරුණකි. එය සාක්ෂාත් කර ගැනීම සඳහා අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය යටතේ පවතින ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සහ සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්) සමාගම යන ආයතනයන් විශාල දායකත්වයක් දක්වන අතර, එමඟින් සියලු පුරවැසියන් සඳහා කාර්යක්ෂම, ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි සංචලතාව සහතික කරයි.

රටේ දහනය කරන ඉන්ධනවලින් වැඩි ප්‍රතිශතයක් ප්‍රවාහන ක්ෂේත්‍රයට වැයවන අතර ඒ ඔස්සේ වායු දූෂණයට සැලකිය යුතු දායකත්වයක් සපයයි. මෙම තත්ත්වයට විසඳුම් ලෙස පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් දක්වා ක්‍රමිකව පරිවර්තනය වීමේ දැක්මක් සහිතව කාර්යක්ෂම, විශ්වසනීය, ආරක්ෂාකාරී, සැමට සුවපහසු සහ නවීන ප්‍රශස්ථ තාක්ෂණික ක්‍රමවේදයන්ගෙන් සමන්විත ප්‍රවාහන සේවාවක් ස්ථාපනය කිරීමට මෙම අමාත්‍යාංශය කැපවී සිටිනු ඇත.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මෙරට ප්‍රවාහන ක්ෂේත්‍රයට ප්‍රධාන දායකත්වයක් දක්වන අතර, මගී ප්‍රවාහනය, භාණ්ඩ ප්‍රවාහනය, විශේෂ මගී දුම්රිය සේවා ක්‍රියාත්මක කිරීම සහ දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ප්‍රධාන කාර්යභාරයන් වේ. 2025 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසන් වන විට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් දුම්රිය මගී ජනතාව මිලියන 97.46ක් සඳහා සේවය සපයා ඇති අතර 2025 වර්ෂයේ උපයා ඇති මුළු ආදායම රුපියල් මිලියන 17,166 කි.

ශ්‍රී ලංකාව තුළ ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය, වාහන හිමිකම් පැවරීම ලියාපදිංචිය, රියදුරු බලපත් නිකුත් කිරීම, මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාවන් සැපයීම සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය වැනි ප්‍රධාන කාර්යයන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඉටු කරනු ලබයි. ඒ සඳහා නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයත්, වේරහැර රියදුරු බලපත්‍ර කාර්යාලයත් කේන්ද්‍ර කර ගනිමින් සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි කාර්යාල 24ක් ඇති අතර, ඉන් දිස්ත්‍රික් කාර්යාල 11ක් මාර්ගගත ක්‍රමයට (Online) ක්‍රියාත්මක වන අතර කාර්යාල 5ක් රියදුරු බලපත්‍ර කටයුතුවලට අමතරව වාහන පැවරුම් කටයුතු ද සිදුකරයි.

මෙරට මාර්ගවල ධාවනය වන වාහන මඟින් සිදුවන පරිසර දූෂණය අවම කර ගැනීම මෙන්ම නිසි වාහන වායු විමෝචන ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ නියාමනය සඳහා වාහන වායු විමෝචන වැඩසටහන ද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබයි.

ශ්‍රී ලංකාව තුළ විශාල භූමි ප්‍රමාණයක් ආවරණය කරමින් බස් රථ මඟින් පොදු මගී ප්‍රවාහන සේවය ලබාදීම සඳහා රජයේ සහ පෞද්ගලික බස් රථ සේවාව විශාල කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ඉන් විශේෂී ස්ථානයක්

හිමි වන අතර එමඟින් මගී ප්‍රවාහන සේවා ඉල්ලුමෙන් 40% - 50% සේවා සම්පාදනය සිදු කරන අතර ඒ සඳහා දෛනිකව බස් රථ 5,061ක් පමණ ධාවනය කෙරේ. සිසු සැරිය, ගැමි සැරිය හා නිසි සැරිය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අනාර්ථික මාර්ගවල බස් සේවා යෙදවීම, දුර ගමන් සේවා, උත්සව හා විශේෂ අවස්ථාවන්වලදී බස් සේවා සැපයීම, විභාග කාලසීමාවල විභාග දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය බස්රථ ලබාදීම, තැපැල් සහ පුවත්පත් ප්‍රවාහනය, වැඩිහිටියන් සහ ශිෂ්‍යයන් සඳහා සහනදායී වාර ප්‍රවේශපත් ලබාදීම ආදී කාර්යයන් රාශියක් ශ්‍රී ලංගම මඟින් ඉටු කරනු ලබයි.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ජන සමාජයට කාර්යක්ෂම, ගුණාත්මක, සුව පහසු, පරිසර හිතකාමී ප්‍රවාහන සේවාවක් ලබාදීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක වේ. බස් සේවා සැපයීම, බස් ගාස්තු සකස් කිරීම, කාලසටහන් සහ සේවා අධීක්ෂණය, නාගරික ප්‍රවාහන සැලසුම් සකස් කිරීම, බස්රථ කාර්ය මණ්ඩල පුහුණු කිරීම, මහජන පැමිණිලි ලබා ගැනීම සහ ඒවා කඩිනමින් විමර්ශනය කිරීම, රෙගුලාසි සහ ජාතික ප්‍රවාහන සංඛ්‍යා ලේඛන සකස් කිරීම වැනි කාර්යයන් මෙම ආයතනය මඟින් සිදු කරනු ලැබේ. තවද මෙතෙක් කලක් නියාමනයට ලක් නොවූ මගී ප්‍රවාහනයේ යෙදෙන ත්‍රී රෝද රථ, කාර්යාල ප්‍රවාහන සේවා සහ පාසල් ප්‍රවාහන සේවා සඳහා රෙගුලාසි සකස් කිරීමේ බලය 2025 වර්ෂයේ දී ජාතික ගමනාගමන කොමිෂන් සභාවට ලැබී ඇත.

රියදුරන්ගේ වෛද්‍ය පරීක්ෂණ සිදුකර ඔවුන්ගේ යෝග්‍යතාවය සහතික කොට වෛද්‍ය සහතික නිකුත් කිරීම ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ ප්‍රධානතම කාර්යය වන අතර, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය අතර සේවා මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්බන්ධ කර වෛද්‍ය සහතික සුහුරු තාක්ෂණය මඟින් ලබාදීමේ ක්‍රමවේදය 2025.04.07 දින සිට නුගේගොඩ ප්‍රධාන කාර්යාලය හා වේරහැර ශාඛා කාර්යාලයෙහි ආරම්භ කර ඇත. රියදුරු බලපත්‍ර අලුත් කිරීම සඳහා වෛද්‍ය සහතික ලබා ගැනීමට පැමිණෙන සේවාලාභීන්ගට කාර්යක්ෂම හා තෘප්තිමත් සේවයක් සැපයීමේ අරමුණින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නුගේගොඩ පිහිටි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයෙහි තාවකාලික රියදුරු බලපත්‍රය ලබා ගැනීමේ සේවාවක් 2025.09.30 දින සිට ආරම්භ කර ඇත.

මාර්ග ආරක්ෂාව සහ සම්බන්ධිත විෂයානුබද්ධ ව්‍යාපෘති කෙරෙහි වගකීම දරණ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලට දැනුම හා තොරතුරු ලබාදීම, මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය සහ මූල්‍යමය සහ වෙනත් සහය ලබාදීම, හඳුනා නොගත් වාහන වලින් අනතුරට පත් තැනැත්තන්ට සහ මියගිය අය සඳහා මූල්‍ය ප්‍රදානයන් ලබාදීම වැනි කාර්යයන් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් ඉටු කරනු ලබයි.

සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්) සමාගම මඟින් ශ්‍රී ලංගමට අයත් අබලන් හා අනතුරුවලට ලක්වූ බස් රථවල බඳ අලුත්වැඩියාව සිදු කරනු ලබයි. මීට අමතරව නවීන යන්ත්‍ර උපකරණ වලින් සමන්විත වාහන සේවා මධ්‍යස්ථානයක් ද ක්‍රියාත්මක වේ. පෙර වර්ෂවල මසකට බස් රථ බඳ 08 – 10 ත් අතර ප්‍රමාණයක් අලුත්වැඩියා කර ඇති අතර 2025 වර්ෂයේ දී, එය බස් රථ 10 – 14 ත් අතර ප්‍රමාණයකින් අලුත්වැඩියා කටයුතු කර ඇත.

මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවාව කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රය හමුවේ ඇති අභියෝග ජය ගනිමින් ජනතාවට ඉතා උසස් ප්‍රමිතියෙන් යුත් කාර්යක්ෂම, ඵලදායි, මහජන හිතකාමී ප්‍රවාහන සේවාවක් ලබාදීම සඳහා අමාත්‍යාංශය, ඒ යටතේ පවතින අනුබද්ධිත ආයතන අධීක්ෂණය කරමින් එම ආයතන සමඟ සහයෝගීතාවයෙන් ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරයි.

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ (ප්‍රවාහන අංශය) මඟින් පහත සඳහන් විශේෂ කාර්යයන් සිදු කර ඇත.

- "පොදු මගී ප්‍රවාහනය සඳහා යොදාගනු ලබන බස්රථ සඳහා අවම පිරිවිතර හඳුන්වා දීම" සම්බන්ධයෙන් නිලධාරී කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව, එහි තීරණය මඟින් රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාත්මක කිරීමට නිසි අනුමැතියක් ලබා නොමැති බැවින් හා ඉදිරිපත් වූ සංශෝධන හේතුවෙන් එම සංශෝධන පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා නව කමිටුවක් පත් කර ඇත. ඒ අනුව නව කමිටුව විසින් සකස් කරන ලද පිරිවිතර වාර්තාව, වාහන නිෂ්පාදකයින් හා වාහන මෙරටට ගෙන්වන ආයතන සහභාගීකර ගනිමින් පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර 2026 ජනවාරි මස අවසානයේදී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

- මෙට්‍රෝ බස් ව්‍යාපෘතිය යටතේ කොළඹ නාගරික ප්‍රදේශය තුළ මගී ප්‍රවේශය සඳහා සැප පහසු පතුළ පහත් බස්රථ (Low-floor buses) 100ක් යෙදවීමට අපේක්ෂිතව ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 3,000ක මුදලක් 2025 අයවැයෙන් වෙන් කිරීමට අනුමත වී ඇත. ඒ අනුව මේ වන විට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ පරිපාලිත සමාගමක් වශයෙන් ලංකා මෙට්‍රෝ ට්‍රාන්ස්සිට් (පුද්) සමාගම ලෙසින් සමාගම ලියාපදිංචි කර ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර ඇත. ව්‍යාපෘතියට අදාළ බස් රථ ධාවන මාර්ග 06ක් හඳුනාගෙන ඇති අතර මෙම බස් රථ වලට සුදුසු වන පරිදි අවශ්‍ය යටිතල පහසුකම් එම මාර්ග තුළ සකස් කිරීම සඳහා අදාළ කටයුතු සිදු කරමින පවතී. 2026 ජූනි මස අවසන් වන විට මෙම බස් රථ ධාවනය ආරම්භ කිරීමට අපේක්ෂිතව ඇත.

- ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය - 2009 යාවත්කාලීන කර සකස් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික ගොඩබිම් ප්‍රවාහන ප්‍රතිපත්තිය 2025 අමාත්‍ය මණ්ඩලය අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ නමුත් නව රජයේ ප්‍රතිපත්තීන් හා ප්‍රමුඛතා අනුව නැවත යාවත්කාලීන කිරීමට උපදෙස් ලැබී තිබුණි. ජාතික ගොඩබිම් ප්‍රවාහන ප්‍රතිපත්ති කෙටුම්පත නව රජයේ ප්‍රතිපත්ති සමඟ ගැලපීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර ඒ අනුව, කමිටුව මඟින් ප්‍රතිපත්ති කෙටුම්පත ඉදිරිපත් කරන ලදි. ඉන්පසුව විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් අනුව මහාමාර්ග අංශයේ විෂය පථයට අදාළ කරුණු ද ඇතුළත් කරමින් ප්‍රතිපත්ති කෙටුම්පතෙහි අවශ්‍ය සංශෝධනයන් සිදුකරමින් පවතී.


- විද්‍යුත් සංචරණය රට තුළ ප්‍රවර්ධනයට හා පොදු ප්‍රවාහන සේවය දියුණු කිරීමට අදාළව

සුදුසු ක්‍රමෝපායක් තෝරා ගැනීම සඳහා හා දැනට යොදාගෙන ඇති පිරිවිතරයන් හා වාර්තා අධ්‍යයනය කිරීමට මෙන්ම විවිධ පාර්ශව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. ඒ අනුව අවස්ථා කිහිපයකදී ඉදිරිපත් වූ යෝජනා සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අතර විද්‍යුත් බස් රථ ශ්‍රී ලංකාව වෙත හඳුන්වා දීම සම්බන්ධයෙන් විවිධ පාර්ශව වෙතින් අදහස් හා යෝජනා ද ලබා ගෙන ඇත. සියළු යෝජනා අධ්‍යයනය කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීමට අපේක්ෂිතව ඇත.

- වියානා සම්මුතිය අත්සන් කිරීම සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යන අදාල ආයතන සම්බන්ධ කර ගනිමින් වැඩමුළුවක් පවත්වා එහි වෙනස්කම් සිදු කර ගත යුතු articles හඳුනා ගත් අතර පසුව අවස්ථා කිහිපයකදී ඉහත ආයතනවලින් තෝරා ගත් පිරිසක් සමඟ සාකච්ඡා පවත්වා නිසියාකාරව articles වෙනස්විය යුතු ආකාරය යෝජනා කර විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත නිර්දේශ ලිපියක් යවන ලදී.


- 2025 වර්ෂය තුළ දී අමාත්‍ය මණ්ඩල සංදේශ 74ක් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමුකර ඇති අතර එම සියලු සංදේශ සඳහා තීරණ ලැබී ඇත.

2022 වර්ෂයේ සිට 2025 දක්වා ප්‍රවාහන අංශයට වෙන් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන වියදම් වී ඇති ආකාරය පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ.



2025 වර්ෂයේ ප්‍රවාහන අංශය හා අනුබද්ධිත ආයතන වෙනුවෙන් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් වී ඇති ආකාරය

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ - ප්‍රවාහන අංශය හා අනුබද්ධිත ආයතන වෙත 2025 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වශයෙන් භාණ්ඩාගාර හා ස්වයං ප්‍රතිපාදන රුපියල් මිලියන 63,278.16ක් වෙන් වී ඇත. එම ප්‍රතිපාදන ප්‍රවාහන අංශය හා අනෙකුත් ආයතන අතර බෙදී ඇති ආකාරය පහත වට ප්‍රස්ථාරයෙන් දැක්වේ.



ප්‍රවාහන අංශයේ **2025** වර්ෂයේ දී ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් වී ඇති ආකාරය

ප්‍රතිපාදන	ආයතනය	සංශෝධිත ප්‍රාග්ධන (රු.මි)	සංශෝධිත පුනරාවර්තන (රු.මි)	එකතුව (රු.මි)
භාණ්ඩාගාර ප්‍රතිපාදන	ප්‍රවාහන අංශය	22,251.5	17,671.00	**39,922.50**
	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	29,079.20	31,378.00	**60,457.20**
	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	1,455.00	3,614.00	**5,069.00**
එකතුව		**52,785.7**	**52,663.00**	**105,448.7**
ස්වයං ප්‍රතිපාදන	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය	10,225.25	84,203.98	**94,429.23**
	ජාතික ගමනාගමන කොමිෂන් සභාව	84.61	491.98	**576.59**
	ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය	101.9	1090.00	**1191.9**
	මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව	73.7	8.91	**82.61**
	ලක්දිව ඉංජිනේරු (පුද්) සමාගම	7.00	314.00	**321**
එකතුව		**10,492.46**	**86,108.87**	**96,601.33**
මුළු එකතුව		**63,278.16**	**138,771.87**	**202,050.03**

2025 වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය විෂයයන්හි ප්‍රගතිය

ආයතනය/ ව්‍යාපෘතිය		ප්‍රාග්ධන (රු. මි)		පුනරාවර්තන (රු.මි)	
		සංශෝධිත ප්‍රතිපාදන	**2025.12.31** දිනට වියදම	සංශෝධිත ප්‍රතිපාදන	**2025.12.31** දිනට වියදම
ප්‍රවාහන අංශය (අමාත්‍යාංශය)		8.00	3.19	362.00	321.07
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය		4,176.50	3,838.78	15,150.00	15,150.00
ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේ රු. මි. 318 ශේෂ අරමුදල භාවිතා කරමින් ශ්‍රීලංගම සඳහා බස් රථ 600 ක් මිලදී ගැනීම		3,000.00	-	-	-
ජාතික ගමනාගමන කොමිෂන් සභාව		-	-	1,913.00	1,700.00
කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය	TPPF	286.57	236.82	-	-
	REIP	11,488.43	5,638.10	-	-
මහ කොළඹ ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (3K ව්‍යාපෘතිය)		289.00	289.00	246.00	231.09
පොදු ප්‍රවාහනය නවීකරණය සඳහා පත්ල පහත් බස් රථ 100 ක් මිලදී ගැනීම		3,003.00	3001.63	-	-
එකතුව		**22,251.50**	**13,007.52**	**17,671.00**	**17,402.16**

TPPF- (Transport Project Preparatory Facility) ප්‍රවාහන ව්‍යාපෘති සැලසුම් කිරීමේ පහසුකම

REIP- (Railway Efficiency Improvement Project) දුම්රිය කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

දැක්ම

ශ්‍රී ලංකාව, කලාපය තුළ ප්‍රමුඛතම මහජන කේන්ද්‍රීය ප්‍රවාහන පද්ධතිය සහිත රට බවට පත් කිරීම

මෙහෙවර

ජනතාවගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීම උදෙසා නව්‍යතම තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කරමින් ඉතා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය සහ තිරසාරව පවත්වාගෙන යාම

අරමුණු

- මගීන්, භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ සංචාරක ප්‍රවාහන පහසුකම් සැපයීම
- මහජන විශ්වාසය දිනා ගනිමින් රථවාහන තදබදය සහ මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා කාලසටහනකට අනුව ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම
- ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම
- මහාමාර්ග හා දුම්රිය මාර්ගවලට සම්බන්ධ පරිසර සහ මගී හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ස්ථාපනය
- 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත ක්‍රියාවට නැංවීම
- 1950 අංක 18 දරණ දුම්රිය පනත ක්‍රියාත්මක කිරීම
- 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත ක්‍රියාවට නැංවීම
- 1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත ක්‍රියාවට නැංවීම
- 1951 අංක 14 දරණ මෝටර් රථ ප්‍රවාහන පනත ක්‍රියාවට නැංවීම
- වෙනත් අමාත්‍යාංශයකට පවරා නොමැති ප්‍රවාහන විෂයය පවරා ඇති අමාත්‍යාංශ හා ඊට අනුබද්ධිත ආයතනයන් වෙත පවරා ඇති විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් ක්‍රියාවට නැංවීම

1.3 ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන්

අංක 2412/08 හා 2024.11.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා පහත කාර්යයන් හා කර්තව්‍යයන් පවරා ඇත.

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ප්‍රවාහන විෂයට සහ ප්‍රවාහන අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අමාත්‍යාංශ විෂයය පථයට අයත් මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීමට සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදාගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
- වාහන තදබදය අවම කිරීම සඳහා වාහන අංගන පිහිටුවීම
- මගී තොටුපල සේවාවන් සැපයීම

- ආරක්ෂාකාරී සහ විශ්වාසනීය මගී ප්‍රවාහන සේවාවක් සැපයීම
- පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් හඳුන්වාදීම පෞද්ගලික ප්‍රවාහන සේවාවන් නියාමනය කිරීම
- බස්රථ නිෂ්පාදනය හා ප්‍රවාහන ක්ෂේත්‍ර යටිතල පහසුකම්වලට අදාළ දේශීය කර්මාන්ත පද්ධතියක් ගොඩනැඟීම
- නව දුම්රිය මාර්ග ඉදිකිරීම, පවතින දුම්රිය මාර්ග නඩත්තු කිරීම, පුළුල් කිරීම සහ ඊට අදාළව ඉඩම් පවරා ගැනීම සහ යටිතල පහසුකම් සංවර්ධනය
- වරායන් වෙත දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම සහ පුළුල් කිරීම
- 24/7 පුරා පවතින දුම්රිය සේවාවක් සැපයීම
- විදුලි දුම්රියන් ලබාගැනීමට හැකිවන පරිදි දුම්රිය පද්ධතිය ක්‍රම ක්‍රමයෙන් සංවර්ධනය කිරීම
- තනි පිල්ලේ දුම්රිය සේවාවක් හා සැහැල්ලු දුම්රිය මාර්ග ක්‍රමයෙන් හඳුන්වා දීම
- රජයේ හා පෞද්ගලික බස් රථ සේවාවන් ඒකාබද්ධ කර, නව තාක්ෂණය උපයෝගී කරගනිමින් පොකුරු බස් රථ සමාගම් නිර්මාණය කිරීම
- POS ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ යන්ත්‍ර සියලු බස් රථ සඳහා හඳුන්වා දීම
- ආබාධිත , වයෝවෘද්ධ අයවලුන් සඳහා දුම්රිය හා බස් රථ, දුම්රිය ස්ථාන හා බස් නැවතුම්පලවල විශේෂ ප්‍රවේශතා පහසුකම් සලසා දීම
- මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම
- රියදුරු බලපත්‍ර නිකුත් කිරීම
- මෝටර් රථ වාහන වලට අදාළ මාර්ගෝපදේශ සහ නීතිරීති නිකුත් කිරීම සහ නියාමනය කිරීම
- හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රයේ දායකත්වය උදෙසා උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනවලට පැවරී ඇති අනෙකුත් විෂයයන්ට අදාළ සියලු කටයුතු කිරීම
- අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතන අධීක්ෂණය කිරීම.

1.4 අමාත්‍යාංශයේ (ප්‍රවාහන අංශය) සංවිධාන සටහන - (පිටු අංක 11)


1.5 අමාත්‍යාංශය (ප්‍රවාහන අංශය) යටතේ පවතින දෙපාර්තමේන්තු

- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

1.6 අමාත්‍යාංශය (ප්‍රවාහන අංශය) යටතේ පවතින ආයතන

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- ජාතික ගමනාගමන කොමිෂන් සභාව
- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
- මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
- සී/ස ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම

1.4 ප්‍රවාහන,මහාමාර්ග,වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ සංවිධාන සටහන (ප්‍රවාහන අංශය)



1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති

ව්‍යාපෘතියේ නම	මූල්‍ය ප්‍රභවය		ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම (රු.මි.)	සමුච්චිත වියදම (රු.මි.) (2025.12.31 දිනට)	කාල සීමාව	සාරාංශගත ව්‍යාපෘති ප්‍රගතිය	
	දේශීය/ විදේශීය	ආයතනය				%	විස්තර
1. මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	දේශීය	ශ්‍රී ලංකා රජය	5,805.30 මෙහෙයුම් වියදම් ලෙස 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා රු.මිලි. 788ක් ව්‍යාපෘතිය වෙත ලැබී ඇත.	5,739.84 මීට අමතරව 2021 සිට 2025 දක්වා පුනරාවර්තන වියදම් ලෙස ලබාදුන් රු.මිලි.788ක මුදල මාකුඹුර හා කඩවත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථා නවල මෙහෙයුම් හා නඩත්තු වියදම් ලෙස දරා ඇත.	**අදියර 1** නගර සංවර්ධන සැලසුම් සකස් කිරීම 2009 සැප්තැම්බර් – 2014 මාර්තු **අදියර 2** බහුවිධ මධ්‍යස්ථානය ඉදිකිරීම. 2014 අප්‍රේල් - 2019 මාර්තු **අදියර 3** මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යෑම හා සංස්ථාපනය 2019 අප්‍රේල් - 2025 ජූනි	100%	2019.03.31 වන දින මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය මෙහෙයුම් කාර්යයන් සඳහා විවෘත කිරීමත් සමග ව්‍යාපෘතියේ සංවර්ධන කාර්යයන් අවසන් කරන ලදී. කෙසේ වුවද 2020 දක්වා මූලික මෙහෙයුම් කාර්යයන් (Pilot Operation) ව්‍යාපෘතිය මඟින්ම සිදුකරන ලෙසට මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙන් උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන මෙහෙයුම් පද්ධති වැඩිදියුණු කිරීම එම කාලසීමාව තුළදීම ව්‍යාපෘතිය මඟින් සිදුකරන ලදී. 2022 වසරේ සිට කඩවත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයද ව්‍යාපෘතිය යටතට පත්කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ ඉල්ලීම පරිදි ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් සිදුකරන ලදී. ඒ අනුව 2020 වන විට ව්‍යාපෘතිය මඟින් බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන මෙහෙයුම් ආකෘතිය (Institutional Mechanism) සම්පූර්ණ කරන ලද අතර, ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතියට යොමු කල ද මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය පමණක් පවතින බැවින් 2023 වසරේ දෙසැම්බර් දක්වා ව්‍යාපෘතිය මඟින්ම සිදුකර ඉදිරි අවශ්‍යතා අනුව ව්‍යවස්ථාපිත ආයතනයක් ස්ථාපිත කිරීමේ වගකීම ප්‍රවාහන අමාත්‍යාංශය වෙත පවරන ලදී. කෙසේ වුවද එම කාලසීමාව තුළ ව්‍යාපෘතිය මඟින් අදාල මෙහෙයුම් සිදුකරන ලදී. 2024 වසරේ සහස්‍යා ආයතනය වෙත පැවරීම සිදුකල ද ඒ සඳහා JICA අනුමැතිය ලබාගෙන නොමැතිවීම හේතුවෙන් නැවත ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතියට යොමුකර ඇත.
	විදේශීය	ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය					

ව්‍යාපෘතියේ නම	මූල්‍ය ප්‍රභවය			සමුච්චිත වියදම (රු. මි.) (2025.12.31 දිනට)	කාල සීමාව විස්තර	සාරාංශගත ව්‍යාපෘති ප්‍රගතිය	
	දේශීය/ විදේශීය	ආයතනය				%	විස්තර
							ඒ අනුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන නඩත්තු හා මෙහෙයුම් කටයුතු සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය යටතේ මාස 6ක කාලසීමාවක් සඳහා විශේෂිත කළමණාකරන ඒකකයක් පිහිටුවන ලද අතර 2025 ජුනි මස කැබිනට් මණ්ඩල තීරණය අනුව 2025.07.01 දින සිට නැවතත් වර්ෂයක කාලයක් සඳහා විශේෂිත කළමණාකරන ඒකකයක් ලෙස පවත්වාගෙන යාම පිණිස අනුමත විය. ඒ අනුව 2020 වසරේ සිට ව්‍යාපෘතියේ මෙහෙයුම් කාර්යයන්ට පමණක් (Operation) ප්‍රතිපාදන වෙන්කර ඇති අතර සංවර්ධන අවශ්‍යතා සඳහා මුදල් වෙන්කිරීමක් සිදුවී නොමැත. ඒ අනුව 100% ප්‍රගතියකින් ව්‍යාපෘති කාර්යයන් අවසන් කර ඇත.
කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය							
දුම්රිය කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය (REIP)	දේශීය	ශ්‍රී ලංකා රජය	40,186.81	23,396.00	2019-2027	87%	ප්‍රසම්පාදන කාර්යයන් 33 න් 29ක් අවසන් කර ඇත. එයින් කොන්ත්‍රාත් 21 ක වැඩ අවසන් කර ඇති අතර, තවත් ප්‍රසම්පාදන කාර්යයන් 02 ක් අවසන් අදියරේ පවතී.
	විදේශීය	ADB					
කැලණිවැලි දුම්රිය මාර්ගය දෙපස සිටින අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය (TPFF)	දේශීය	ශ්‍රී ලංකා රජය	9,600.00	3,970.70	2016-2025	77%	දෙමටගොඩ ලෝකෝ මංසන්ධියේ සිට පාදුක්ක දක්වා අනවසර පදිංචිකරුවන් 860දෙනෙකු සඳහා වන්දි හා ප්‍රතිලාභ ලබා දී ඔවුන් මේ වන විට දුම්රිය රක්ෂිතයෙන් ඉවත් කර ඇත.
මහව-ඕමන්ත දුම්රිය මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය							
මහව-ඕමන්ත දුම්රිය මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය	විදේශීය	Indian Exim Bak	ඇ.ඩො. මිලියන 91.268	ඇ.ඩො. මිලියන 56.002	මාස 36	96%	මහව ඕමන්ත ප්‍රධාන දුම්රිය මාර්ගයේ කටයුතු නිමකර ඇති අතර අංගන කිහිපයක් ඉදිකිරීම් අවසන් කර ඇත.
මහව- අනුරාධපුර සංඥා පද්ධති ඉදිකිරීමේ ව්‍යාපෘතිය	විදේශීය		ඇ.ඩො. මිලියන 14.899	ඇ.ඩො. මිලියන 2.5	මාස 12	15%	මූලික ගෙවීම් අවසන් කර සැලසුම් කටයුතු සිදුකරනු ලැබේ.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1.1 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

2025 වසර ශ්‍රී ලංකා දුම්රිය සේවය (SLR) සඳහා විශේෂ අභියෝග සහ පරිවර්තන කාලයක් ලෙස සලකුණු විය. දෛනිකව 325,000 ක සංඛ්‍යාවක් දුම්රිය සේවය භාවිතා කරන අතර එය සමස්ත රටේ ප්‍රවාහන අවශ්‍යතාවයෙන් 6%ක් ලෙස ගණනය කර ඇත.

කල් ඉකුත් වූ යටිතල පහසුකම්, ධාවනයට සුදුසු දුම්රිය ප්‍රමාණය, මෙහෙයුම් සීමාවන්, සහ මානව සම්පත් හිඟය හේතුවෙන් දුම්රිය සේවය පවත්වාගෙන යාමේ අභියෝග සමග වසර පුරාම, මගී සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන්ගේ අඛණ්ඩතාව තහවුරු කිරීම, ප්‍රමුඛ යටිතල සංවර්ධන සහ නවීකරණ ව්‍යාපෘති ඉදිරියට ගෙනයාම, සහ ජාතික දුම්රිය ජාලයට බලපාන නව අවදානම් වලට වේගයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව අඛණ්ඩ උත්සාහයක නිරත විය.

වසර අවසානයේ සිදු වූ දිවිවා සුළි කුණාටුව හේතුවෙන් දුම්රිය මාර්ග සහ පාලම් දැඩි ලෙස හානි විය. ඒ හේතුව නිසා දුම්රිය මෙහෙයුම් කටයුතු සමස්ත දුම්රිය මාර්ග පද්ධතියෙන් 22% කට සීමා විය. දුම්රිය සේවයේ සියලුම දෙනාගේ සාමූහික මැදිහත්වීමෙන්, ත්‍රිවිධ හමුදා සහ සාමාන්‍ය ජනතාවගේ සහය සමග දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කරන ලද අතර 2025.12.31 වන විට දුම්රිය මෙහෙයුම් සමස්ත මාර්ග පද්ධතියෙන් 70% දක්වා ඉහළ නැංවීමට දුම්රිය සේවයට හැකි විය. කෙසේ වෙතත්, දැඩි ලෙස හානි වූ උඩරට දුම්රිය මාර්ග තවදුරටත් ක්‍රියාත්මක මට්ටමේ නැත. සංචාරක ක්ෂේත්‍රයට සහ වතු ආශ්‍රිත ගමනාගමනයට ඉතාමත් වැදගත් උඩරට දුම්රිය මාර්ග කඩිනමින් යථාවත් කිරීම, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට පවතින අභියෝගාත්මක කාර්යය බවට පත් වී ඇත.

2.1.1.1 ප්‍රධාන කාර්යභාරය හා වගකීම්

- මගී ප්‍රවාහන කටයුතු ක්‍රියාත්මක කිරීම
- භාණ්ඩ ප්‍රවාහනය සිදු කිරීම
- විශේෂ මගී සහ භාණ්ඩ ප්‍රවාහන දුම්රිය සේවා ක්‍රියාත්මක කිරීම
- දුම්රිය යටිතල පහසුකම් (දුම්රිය ඇණිය, දුම්රිය සංඥා පද්ධතිය, දුම්රිය මාර්ග, ගොඩනැගිලි පාලම්) සංවර්ධනය කිරීම

2.1.1.2 මෙහෙයුම් දර්ශක

දුම්රිය මෙහෙයුම් කටයුතු වලට අදාල ප්‍රධාන දර්ශකයන්හි ප්‍රගතිය පහත වගුවෙන් දක්වා ඇත.

දර්ශකය	2025.12.31 දක්වා
මගී සංඛ්‍යාව (මිලියන)	97.46
මගී කි.මී. (මිලියන)	6,198.29
භාණ්ඩ ටොන් (මිලියන)	2.07
භාණ්ඩ ටොන් කි.මී. (මිලියන)	161.99
ධාවනය කරන ලද මුළු දුම්රිය වාර සංඛ්‍යාව	110,994

2.1.1.3 ආදායම් වියදම් විස්තර (2025.12.31 දිනට)

ආදායම් වර්ගය	ඉලක්කගත ආදායම (රු. මි.)	සත්‍ය ආදායම් උත්පාදනය (රු. මි.)	සත්‍ය ආදායම් උත්පාදනය (%)
මගී	14,700.00	13,499.03	92
භාණ්ඩ	2,200.00	2,462.44	112
වෙනත්	1,100.00	1,204.53	110
එකතුව	**18,000.00**	**17,166.00**	**95.37**

වියදම් වර්ගය	වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	2025.12.31 දිනට ප්‍රගතිය (රු.මි.)	ප්‍රතිශතය (%)
ප්‍රාග්ධන	29,079.20	18,934.22	65.11
පුනරාවර්තන	31,378.00	28,242.08	90.01
එකතුව	**60,457.20**	**47,176.30**	**78.03**

2.1.1.4 ආයතනයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනයන්ට අදාළ ප්‍රගතිය (2025.12.31 දිනට)

2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන		මූල්‍ය ප්‍රගතිය (%)	ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති			භෞතික ප්‍රගතිය (%)
භාණ්ඩාගාර	ස්වයං		ඉලක්ක	නිම කරන ලද	ක්‍රියාත්මක වෙමින් පවතී	
29,079.20	-	65.11	වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම් ඇතුළත්ව ප්‍රධාන ව්‍යාපෘති 2 ක් ඇතුළුව ක්‍රියාකාරකම් 62 ක් ක්‍රියාත්මක කිරීම	ක්‍රියාකාරකම් 11	ව්‍යාපෘති 2ක් හා ක්‍රියාකාරකම් 51 ක් ක්‍රියාත්මක වෙමින් පවතී	81

2.1.1.5 ප්‍රාග්ධන වැය විෂයයන්ට හා උපදෙපාර්තමේන්තුවලට අනුකූලව ප්‍රාග්ධන ප්‍රතිපාදනයන්ට අදාල ප්‍රගතිය (2025.12.31 දිනට)

ප්‍රධාන වැය විෂයය / උපදෙපාර්තමේන්තු	ඇස්තමේන්තු වටිනාකම (රු.මි.)	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය		
			ඉලක්කය (රු.මි.)	වියදම (රු.මි)	%	ඉලක්කය(%)	සාරාංශගත ප්‍රගතිය	%
පරිපාලන සහ ආයතන සේවා	10.40	10.40	10.40	9.61	92.50	100		100
ජර්මානු කාර්මික දුම්රිය අභ්‍යාස විද්‍යාලය – රත්මලාන	12.00	12.00	12.00	8.21	68.50	100		98
දුම්රිය ආරක්ෂක සේවය	0.5	0.5	0.5	0.49	99.89	100		99
ප්‍රවාහන උප දෙපාර්තමේන්තුව	10.50	9.60	9.60	8.87	92.50	100		86
වාණිජ උප දෙපාර්තමේන්තුව	1.50	1.50	1.50	0.99	66	100		72
දුම්රිය ඇණියේ සුළු අළුත්වැඩියා සිදු කිරීම	4,672.00	4,171.00	4,171.00	2,912.97	69.84	100		72
දුම්රිය ඇණියේ ප්‍රධාන අළුත්වැඩියා කටයුතු සිදු කිරීම	8,459.00	7,809.00	7,809.00	4,341.64	55.35	100		58
ස්ථිර මාර්ග, ගොඩනැගිලි හා නව ඉදිරිකිරීම් නඩත්තු හා අළුත්වැඩියා සිදු කිරීම	15,556.00	15,309.20	15,309.20	10,624.94	42.93	100		76
සංඥා හා විදුලි සංදේශ පද්ධතියේ අළුත්වැඩියා සිදුකිරීම	1,855.00	1756.00	1,756.00	1,026.50	57.04	100		72
එකතුව		**29,079.20**		**18,934.22**	**65.11**			**81**

ක්‍රියාකාරකම් 11 ක්‍රියාත්මක කර අවසන්ව ඇති අතර අනෙකුත් අදාල ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් සිදුකරමින් පවතී

2025 වර්ෂය තුළ දුම්රිය මගී සේවාවන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම වෙනුවෙන් මාර්ග ජාලය, ගොඩනැඟිලි, පාලම් සහ සංඥා පද්ධති සම්බන්ධයෙන් පහත කාර්යයන් සිදු කරන ලදි.

මාර්ග ජාලය හා යටිතල පහසුකම්

- **ප්‍රධාන මාර්ග සංවර්ධනය:** මහනුවර, පේරාදෙණිය සහ කඩුගන්නාව දුම්රිය මාර්ග සංවර්ධන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
- **උඩරට මාර්ගය:** උඩරට දුම්රිය මාර්ගයේ පීලි නඩත්තුව සඳහා කොන්ක්‍රීට් සිල්පර 10,000ක් සහ චෙක්රේල් (Check rails) මිලදී ගැනීමට කටයුතු කිරීම
- **නව ව්‍යාපෘති:**
  - ✓ කැලණිවැලි දුම්රිය මාර්ගයේ නවීකරණ කටයුතු ආරම්භ කිරීම
  - ✓ මීගමුව සිට කොච්චිකඩේ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම
  - ✓ ගැටඹේ සිට සරසවි උයන දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ වැඩකටයුතු ඉදිරියට පවත්වාගෙන යාම
- **ප්‍රතිසංස්කරණ:**
  - ✓ මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ 96% ක වැඩ නිම කිරීම
  - ✓ මුහුදුබඩ මාර්ගය වෙනුවෙන් මල නොබැඳෙන පීලි 4,000 ක් සහ නව පීලි 10,000 ක් ආනයනය කිරීම
  - ✓ 'දිට්වා' සුළි කුණාටුවෙන් හානි වූ දුම්රිය මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම
- **ගොඩනැඟිලි හා පාලම්:**
  - ✓ කැලණි නව ද්විත්ව පාලම ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කිරීම
  - ✓ ගනේවත්ත, ලුණුවිල සහ කඩිගමුව දුම්රිය ස්ථානවල ගුවන් පාලම් (Overhead Bridges) ඉදිකර අවසන් කිරීම
  - ✓ නව දුම්රිය ස්ථාන ගොඩනැඟිලි ඉදිකිරීම හා පවත්නා ස්ථානවල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම

දුම්රිය ඇණිය (Rolling Stock)

- **මැදිරි පුනරුත්ථාපනය:** තන්ත්‍රී සමාගම සමඟ එක්ව ක්‍රියාත්මක කළ මැදිරි 200 ක ව්‍යාපෘතියේ දිගුවක් ලෙස, තවත් මැදිරි 100 ක් පුනරුත්ථාපනය කර ධාවනයට එක් කිරීම
- **කර්මාන්තශාලා සංවර්ධනය:** රත්මලාන දුම්රිය වැඩබිම තුළ ආසියානු සංවර්ධන බැංකු (ADB) ආධාර යටතේ බලවේග කට්ටල අලුත්වැඩියා කිරීමේ නව කර්මාන්තශාලාවක් ඉදිකිරීම
- **දේශීය අලුත්වැඩියා:** රත්මලාන කර්මාන්තශාලාව මඟින් දුම්රිය මැදිරි 02ක් සම්පූර්ණයෙන් අලුත්වැඩියා කර අවසන් කිරීම හා තවත් මැදිරි කිහිපයක වැඩකටයුතු සිදු කිරීම
- **නව ප්‍රසම්පාදන:** කොළඹ තදාසන්න සේවාව සඳහා අලුතින් බලවේග කට්ටල (Power Sets) 05 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම

සංඥා හා විදුලි සංදේශ පද්ධතිය

- **සංඥා පද්ධති ස්ථාපනය:**
  - ✓ ගල්ගමුව හා තලාව දුම්රිය ස්ථානවල තාවකාලික සංඥා පද්ධති ස්ථාපිත කිරීම

- ✓ මහව සහ නාගොල්ලාගම අතර 'Block' සංඥා පද්ධතිය සහ බල සැපයුම් පද්ධතිය (Power System) නවීකරණය
- ✓ මහනුවර හා පේරාදෙණිය අතර ස්වයංක්‍රිය සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීම

- **ආරක්ෂාව සහ නිරීක්ෂණය:** මගී ආරක්ෂාව තහවුරු කිරීම පිණිස හැටන් සහ අලුත්ගම දුම්රිය ස්ථානවල නව CCTV පද්ධති ස්ථාපිත කිරීම

2.1.1.6 සපුරාගත් ඉලක්ක

පෙර වර්ෂයන්ට සාපේක්ෂව වැඩි ප්‍රාග්ධන මුදලක් දුම්රිය දෙපාර්තමේන්තුවට වෙන් කිරීමට රජය කටයුතු කරන ලදි. ඒ අනුව, රත්මලාන දුම්රිය අලුත්වැඩියා අංගනයේ නව ඉදිකිරීම් වේගවත් කිරීමට කටයුතු කරන ලදි. ඒ අනුව දුම්රිය රියදුරු පුහුණු කටයුතු සඳහා නව දුම්රිය පුහුණු ප්‍රතිරූපක පද්ධතියක් (Train Simulator) රත්මලාන දුම්රිය අංගනයේ ආරම්භ කරන ලදි.

මීට අමතරව දුම්රිය අලුත්වැඩියාව සඳහා නව කර්මාන්තශාලාවක් ඉදිකිරීමේ කටයුතු වේගවත් කිරීමට කටයුතු කරන ලද අතර 2026 වර්ෂයේ දී එය ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒමට හැකියාව ඇත. තවද, දුම්රිය මූලස්ථාන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට පියවර ගන්නා ලදි.

දුම්රිය දෙපාර්තුමේන්තුවේ පැවති දැඩි සේවක හිඟය අවසන් කරමින් දුම්රිය දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවාවන් පවත්වා ගෙන යාමට අවශ්‍ය අත්‍යාවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරන ලදි. ඒ අනුව 1446 දෙනෙකු බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදුන් අතර ඒ අතරින් 628 දෙනෙකු 2025 වර්ෂය තුළ බඳවා ගැනීමට කටයුතු කරන ලදි.

අ. අ	තනතුර	වැටුප් ක්‍රේතය	බඳවා ගත් සංඛ්‍යාව
1	ජ්‍යෙෂ්ඨ දුම්රිය ස්ථානාධිපති	MN-07	44
2	දුම්රිය එන්ජින් රියදුරු	Railway-2025	13
3	දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (යාන්ත්‍රික)	MT-02	210
4	දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර (විදුලි)	MT-02	45
5	මූලික තාක්ෂණික ශිල්පී තනතුරු	MT-01	189
6	යාඩ් ෆෝමන්	MN-02	6
7	සංචාරක ප්‍රවේශ පත්‍ර විභාගකරු	MN-01	2
9	නිදන මැදිරි සේවක	MN-01	2
10	ප්‍රවේශ පත්‍ර සංග්‍රාහක	MN-01	8
11	ෂන්ටර්	MN-01	25
12	පොයින්ට්ස්මන්	PL-03	43
13	පොලිස්මන්	PL-03	20
14	දුම්රිය තාක්ෂණ ශිලපී සහායක	PL-03	21
	එකතුව		**628**

2.1.1.7 අභියෝග සහ ගැටළු

2025 වර්ෂයේ ශ්‍රී ලංකා දුම්රිය සේවය මුහුණ දුන් බරපතළම අභියෝගය වූයේ 2025.11.27 සිට 2025.11.30 දක්වා දිට්වා සුළිකුණාටුව නිසා ඇති වූ ආපදා තත්ත්වයයි. එමගින් දුම්රිය යටිතල පහසුකම්වලට දැඩි හානි සිදු වූ අතර සමස්ත දුම්රිය ධාවනය අඩාල විය.

දිට්වා සුළි කුණාටුවට පෙර, ශ්‍රී ලංකා දුම්රිය සේවය දිනකට සාමාන්‍යයෙන් දුම්රිය ගමන් වාර

330ක් ක්‍රියාත්මක කළ අතර, මසකට මිලියන 8.1ක පමණ මගී පිරිසක් ප්‍රවාහනය කරමින් රුපියල් බිලියන 1.18ක මාසික ආදායමක් උපයා ඇත. කෙසේ වෙතත්, ව්‍යසනයෙන් පසුව මාසික මගී සංඛ්‍යාව මිලියන 5.7 දක්වා 29.7%කින් පහත වැටුණු අතර, මාසික ආදායම රුපියල් මිලියන 400.8 දක්වා 65.9%කින් තියුණු ලෙස පහත වැටුණි. යටිතල පහසුකම්වලට සිදුවූ දැඩි හානි හේතුවෙන් දෛනික දුම්රිය මෙහෙයුම් ගමන් වාර 330 සිට 280 දක්වා (15%ක අඩුවීමක්) සීමා විය. මීට අමතරව, වේග සීමා පැනවීම් සහ දුම්රිය ජාලයේ කොටස් වශයෙන් වසා දැමීම් හේතුවෙන් මෙහෙයුම් කටයුතුවලට තවදුරටත් බාධා එල්ල විය. මෙම බාධාවන් හේතුවෙන් සංචාරක ව්‍යාපාරය හා වතු ආශ්‍රිත ජනතාවගේ අත්‍යවශ්‍ය ප්‍රවාහන කටයුතු දැඩි බලපෑමකට ලක් විය.

දිට්වා සුළි කුණාටුවට පෙර පවා, දුම්රිය සේවය නිරන්තර ව්‍යුහාත්මක සහ ආයතනික අභියෝගවලට මුහුණ දෙන ලදි. පැරණි වූ දුම්රිය මාර්ගවල යටිතල පහසුකම්, අවදානම් සහිත පාලම් සහ ජලාපවහන පද්ධති, ප්‍රධාන මාර්ගවල පවතින සීමිත පහසුකම් සහ ප්‍රමාණවත් නොවන දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව මීට ඇතුළත් විය. අතින් ක්‍රියා කරන හෝ අර්ධ ස්වයංක්‍රීය සංඥා පද්ධති මත යැපීම, ප්‍රමාද වූ නඩත්තු කටයුතු සහ මූල්‍යමය හා තාක්ෂණික ධාරිතාවේ පවතින සීමිත බව හේතුවෙන් සේවා සැපයීම තවදුරටත් දුෂ්කර විය.

දෛනික දුම්රිය ධාවනය පවත්වාගෙන යාම සඳහා දුම්රිය එන්ජින් 60ක් සහ බලවේග කට්ටල 100ක් අවශ්‍ය වුවද මේ වනවිට පවතින එන්ජින් සහ බලවේග කට්ටල සංඛ්‍යාව ඊට වඩා අඩුය. තවද, දුම්රිය එන්ජින් සහ මැදිරි (Rolling stock) සමූහයෙන් සැලකිය යුතු කොටසක් යල් පැන ගොස් තිබීම හේතුවෙන් විශ්වාසදායක සේවාවක් සැපයීමට නොහැකි වීම, නඩත්තු පිරිවැය ඉහළ යාම සහ මෙහෙයුම් නම්‍යශීලීභාවය සීමා වීම සිදු විය.

2.1.1.8 ඉදිරි සැලසුම්

දිට්වා සුළි කුණාටුවෙන් පසු හානියට පත් වූ දුම්රිය මාර්ග කඩිනමින් මෙන්ම පෙර තිබූ තත්ත්වයට වඩා විශිෂ්ට අන්දමට ප්‍රතිසංස්කරණය කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත. ඒ සඳහා ඇ.ඩො. මිලියන 427 ක විදේශීය තාක්ෂණික සහ මූල්‍ය සහය ලබාගැනීම සඳහා මූලික කටයුතු සිදු කරන ලද අතර, ඇ.ඩො. මිලියන 230 ක ඉන්දීය ණය ආධාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට මූලික සාකච්ඡා සිදු කරමින් පවතී.

එසේම, දුම්රිය සේවය පවත්වා ගැනීමට අවශ්‍ය නව දුම්රිය කට්ටල මිලදී ගැනීමට සහ පවතින දුම්රිය බලඇණිය අලුත්වැඩියා කිරීමට ද වැඩසටහනක් ක්‍රියාත්මක වෙමින් පවතී. එසේම කොළඹ තදාසන්න දුම්රිය සේවාවන් විදුලි දුම්රිය සේවා බවට ක්‍රමයෙන් පරිවර්තනය කිරීමට සහය වන පරිදි කොළඹ තදාසන්න සුඛෝපභෝගී සැහැල්ලු දුම්රිය සේවාවක් ආරම්භ කිරීමට ද නියමිතය. ඒ සඳහා නව සැහැල්ලු දුම්රිය 20ක් මිලදී ගැනීමට නියමිතය.

දුම්රිය සේවය භාවිතා කරන මගීන්ට ගුණාත්මක සේවාවක් සැපයීමේ අරමුණින් දුම්රිය ස්ථාන නවීකරණය කිරීමට ද නව වැඩසටහනක් හඳුන්වා දෙනු ලැබේ. ඒ අනුව ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ ක්‍රියාත්මක සිහින ගමනාන්ත වැඩසටහනට සමගාමීව සියලුම දුම්රිය ස්ථාන නවීකරණය කිරීමට කටයුතු කෙරෙනු ඇත.

තවද, දුම්රිය ප්‍රවේශපත්‍ර සේවා ඇතුළු ඩිජිටල් සේවාවන් පුළුල් කිරීමටද අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2026 වර්ෂයේ ප්‍රවේශ ඩිජිටල් ප්‍රවේශපත්‍ර වැඩසටහනේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

2.1.1.9 මහව - ඕමන්ත දුම්රිය මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය

මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය ආරම්භක දිනය 2019 නොවැම්බර් 29 වේ.

පහත සිතියම මඟින් නිරූපනය වන පරිදි මෙම ව්‍යාපෘතිය අදියර 04කින් සමන්විත වේ.



මහව සිට අනුරාධපුරය දක්වා සංඥා පද්ධතිය ඉදි කිරීමේ ව්‍යාපෘතිය ඉන්දියානු ප්‍රදානයන් යටතේ 2025.10.09 දින ආරම්භ කරන ලදී.

- සේවා යෝජකයා -
  ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
- උපදේශන ආයතනය -
  ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
- කොන්ත්‍රාත්කරු - ඉර්කෝන් ජාත්‍යන්තර සමාගම

2025 වර්ෂයේදී සිදු කරන ලද විශේෂිත කාර්යයන්

1. දුම්රිය මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ,
   - වැඩ අවසන් කිරීමට නියමිතව තිබූ දුම්රිය අංගන 03ක පාශ මාර්ග වල නවීකරණ කටයුතු සිදුකර නිම කිරීම
   - අදියර III යටතේ වන වවුනියාව ඕමන්තේ අතර AT (Alumino Thermit) welding කටයුතු 73% ක් දක්වා අවසන් කිරීම
   - මහව සිට අනුරාධපුරය දක්වා හරස්මාර්ග වල shoulder සහ මතුපිට සැකසුම් කටයුතු නිම කිරීම
   - ව්‍යාපෘතිය යටතේ ප්‍රතිස්ථාපනය කිරීමට යෝජිතව තිබූ මහව සිට අනුරාධපුරය අතර කොට්ඨාශයේ පාලම් 05ක ප්‍රමාණය සඳහා අවශ්‍ය Bridge Guarders සහ අනෙකුත් උපාංග මෙරටට ගෙන්වා ගැනීම
   - මහව සිට අනුරාධපුරය දක්වා කොට්ඨාශයේ දුම්රිය මාර්ගය දෙපස ජලය බැස යාම සඳහා අවශ්‍ය කාණු පද්ධතිය සකස් කිරීමේ කටයුතු සිදු කිරීම

2. මහව සිට අනුරාධපුරය දක්වා සංඥා ව්‍යාපෘතිය යටතේ,
   - ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක විය යුතුව තිබූ ව්‍යාපෘතිය ඉන්දියානු ප්‍රදානයක් බවට පත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම
   - අදාළ මූලික ගෙවීම් කටයුතු සිදු කර 2025.10.09 දින ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම

- ව්‍යාපෘතියේ සැලසුම් සකස් කිරීමේ කටයුතු නිම කිරීම

අපේක්ෂිත අරමුණු

- නවීකරණය සිදු කර දුම්රිය ධාවනයට ලබා දී ඇති මහව සිට අනුරාධපුරය දක්වා දුම්රිය මාර්ග කොට්ඨාශයේ ඉදිකිරීමට නියමිත සංඥා පද්ධතියේ කටයුතු අදාළ ව්‍යාපෘති කාල රාමුව තුළ නිම කිරීම
- මහව සිට අනුරාධපුරය අතර කොට්ඨාශයේ පවතින පාලම් 5, නව වැඩි දියුණු කරන ලද පාලම් මගින් ප්‍රතිස්ථාපනය සිදු කිරීම
- මේ වන විට වැඩ නිම කිරීමට ඇති දුම්රිය අංගන වල පවතින පාශ මාර්ගවල නවීකරණ කටයුතු සිදු කිරීම
- අබන්පොල හා ගල්ගමුව අතර වන අලි හුවමාරුව සඳහා ඉදිකර ඇති අලි උමං මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම
- මහව සිට අනුරාධපුරය දක්වා පවතින දුම්රිය හරස්මාර්ග සඳහා සුදුසු ආරක්ෂණ පද්ධති සංඥා ව්‍යාපෘතිය යටතේ ඉදි කිරීම

භෞතික ප්‍රගතිය (2025.12.31 දිනට)

ව්‍යාපෘතිය	ප්‍රගතිය
මහව ඕමන්තේ දුම්රිය මගී පුනරුත්ථාපන ව්‍යාපෘතිය	96%
මහව අනුරාධපුර සංඥා පද්ධති ඉදිකිරීමේ ව්‍යාපෘතිය	15%

2.1.2 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

1927 අංක 20 දරණ මෝටර් වාහන ආඥා පනත යටතේ 1928 ජනවාරි පළමුදින මෝටර් රථ රෙජිස්ට්‍රාර් කාර්යාලය ආරම්භ කර ඇති අතර වර්තමානය වන විට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ලෙස කටයුතු කරයි.

ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කරගනිමින් සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් කාර්යාල ආරම්භ කර ඇති අතර ඉන් දිස්ත්‍රික් කාර්යාල 11ක් මාර්ගගත ක්‍රමයට (Online) ක්‍රියාත්මක වේ. ඉන් දිස්ත්‍රික් කාර්යාල 5ක් රියදුරු බලපත්‍ර කටයුතු වලට අමතරව වාහන පැවරුම් කටයුතු ද සිදුකරයි.

2.1.2.1 කාර්යභාරය

වාහන නියාමනය සම්බන්ධයෙන් අනෙකුත් ආයතන රාශියක් සහ ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතර පවතින තත්ත්වයන් යාවත්කාලීන කරමින් නීති හා රෙගුලාසි සකස් කිරීමත්, ඒවා ක්‍රියාත්මක කිරීමත් එමඟින් ආරක්ෂිත සහ පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් සියලු දෙනාට උරුම කිරීම.

2.1.2.2 ආදායම් වියදම් විස්තර (2025.12.31 දිනට)

වියදම් වර්ගය	වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	ප්‍රතිශතය (%)
ප්‍රාග්ධන	1,455.00	951.43	65.39
පුනරාවර්තන	3,614.00	1,395.00	38.60
එකතුව	**5,069.00**	**2,346.43**	**46.23**

ආදායම් වර්ගය	ඉලක්කගත ආදායම් (රු.මි.)	සත්‍ය ආදායම් උත්පාදනය (රු.මි.)	සත්‍ය ආදායම් උත්පාදනය (%)
සුඛෝපබෝගී වාහන බදු	40,000.00	52,151.08	130.38
වාහන විකිණීම මත බදු	18.00	18.85	104.72
මෝටර් වාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු හා අනෙකුත් ලැබීම්	18,000.00	20,300.41	112.78
මෝටර් වාහන පැවරීමේදී වාහන ආනයන බලපත්‍ර යටතේ අයකරන ගාස්තු	11.00	16.76	152.36
එකතුව	**58,029.00**	**72,487.00**	**124.92**

2.1.2.3 ප්‍රාග්ධන ප්‍රතිපාදනයන්ට අදාල ප්‍රගතිය (2025.12.31 දිනට)

2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (රු.මි.)		මූල්‍ය ප්‍රගතිය (%)	ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති			භෞතික ප්‍රගතිය (%)
භාණ්ඩාගාර	ස්වයං		ඉලක්කය	නිම කරන ලද	ක්‍රියාත්මක වෙමින් පවතින	
1,455.00	-	65.39	9	9	-	66

2.1.2.4 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2025.12.31 දිනට)

අනු අංකය	වැඩසටහන/ ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම්	ඇස්තමේන්තු වටිනාකම (රු.මි.)	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය		
				ඉලක්කය (රු.මි.)	වියදම (රු.මි.)	%	ඉලක්කය	සාරාංශ ගත ප්‍රගතිය	%
01	**මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - වෙන් කළ ප්‍රතිපාදනය රු.මි. 50**								
1.1	ගොඩනැගිලි නඩත්තු සහ ඉදි කිරීම් (ප්‍රධාන කාර්යාලය)	25	25	50	20.53	83	-		100
1.2	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ (ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල)	15	15		9.15	61	-		100
1.3	වාහන	10	10		6	60			80
02	**මූලධන වත්කම් අත්පත් කර ගැනීම - වෙන් කළ ප්‍රතිපාදනය රු.මි. 156**								
2.1	ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ	25	25	156	24.83	99.5	-	ව්‍යාපෘතිවලට අදාල වැඩ කටයුතු නිම කර ඇත.	100
2.2	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ (ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල සඳහා)	125	125		125	100	-		100
2.3	ප්‍රධාන කාර්යාලයේ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම				(307-2-1-1-2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැය විෂයට මාරු කරන ලදී.)				0
03	**හැකියා වර්ධනය - වෙන් කළ ප්‍රතිපාදනය රු.මි. 5**								38
3.1	කාර්ය මණ්ඩල පුහුණු	5	5	5	1.9	38	-		100

04	**වෙනත් මූලධන වියදම් - වෙන් කළ ප්‍රතිපාදනය රු.මි. 1,200**								
4.1	රියදුරු බලපත්‍ර මුද්‍රණය	1200	1200	1200	719	60	-		100
05	**දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ප්‍රාදේශීය කාර්යාල සංවර්ධනය කිරීම - වෙන් කළ ප්‍රතිපාදනය රු.මි. 50**								
5.1	ගොඩනැගිලි සහ ඉදි කිරීම් (රු.මි. 48.8 ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිකුත් කර ඇත)	50	50	50	45.02	90	-		100
06	**විද්‍යුත් රථ වාහන දත්ත පද්ධතිය (E-Motoring) - වෙන් කළ ප්‍රතිපාදනය රු.මි. 55**								
6.1	ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ			මෙම රු.මි.55 ප්‍රතිපාදන මූලධන වත්කම් අත්පත් කර ගැනීම යටතේ යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ (ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල සඳහා) වැය විෂය සඳහා 2025.11.07 දින 307-2-1-1-1-2103 මාරු කරන ලදී.					0
6.2	ගොඩනැගිලි සහ ඉදි කිරීම්								0
6.3	මෘදුකාංග සංවර්ධනය								0
	එකතුව	**1,455**	**1,455**	**1,455**	**951.43**	**65.39**	**100**		**66**

2.1.2.5 ආයතනයේ ප්‍රගතිය පෙන්නුම් කෙරෙන අනෙකුත් තොරතුරු

වාහන ලියාපදිංචිය සහ පැවරීම් (2025.12.31 දිනට)

අනු අංකය	වාහන පංතිය	2025.12.31 දිනට නව ලියාපදිංචි වාහන ප්‍රමාණය	2025.12.31 දිනට පැවරුම් ප්‍රමාණය
1.	මෝටර් කාර්	68,047	187,022
2.	ද්විත්ව කාර්ය වාහන	3,263	59,047
3.	ත්‍රිරෝද රථ	16,843	183,836
4.	යතුරුපැදි	254,817	316,149
5.	කොඩිරි සයිකල්	01	305
6.	මෝටර් ට්‍රයිසිකල් වැන්	489	713
7.	ඉඩම් වාහන ට්‍රැක්ටර්	4,701	10,951
8.	සිංගල් කැබ් රථ	3,673	37,549
9.	මෝටර් ලොරි	2,269	46,958
10.	ප්‍රයිම් මූවර්	588	854
11.	ලොරි ට්‍රෙලර් /බවුසර්	441	677
12.	ට්‍රැක්ටර් ට්‍රෙලර් /බවුසර්	3,052	911
13.	ඉඩම් වාහන (අත් ට්‍රැක්ටර්)	1,326	1,928
14.	බස් රථ	2,096	19,098
15.	ගිලන් රථ	31	98
16.	අවමංගල රථ	01	12
17.	විශේෂ කාර්ය වාහන	448	1,448
18.	මෝටර් හෝම්	-	-
19.	ත්‍රීවිල් කාර්	-	75
20.	ෆෝක් ලිෆ්ට්	-	08
	එකතුව	**362,086**	**867,639**

රියදුරු බලපත්‍ර නිකුත් කිරීම (2025.01.01 සිට 2025.12.31 දක්වා)

අනු අංකය	විස්තරය	රියදුරු බලපත්‍ර ප්‍රමාණය
1	නව රියදුරු බලපත්‍ර නිකුත් කිරීම	183,737
2	රියදුරු බලපත්‍ර අළුත් කිරීම	380,737
3	රියදුරු බලපත්‍ර තාවකාලිකව තහනම් කිරීම්	5,428

වාහන ආනයනකරුවන් ලියාපදිංචි කිරීම (2025.01.01 සිට 2025.12.31 දක්වා)

අංකය	විස්තරය	ප්‍රමාණය
01	වාහන ආනයන කරුවන් අළුතින්ම ලියාපදිංචි කිරීම්	1,077
02	ලියාපදිංචි කර එම ලියාපදිංචිය අළුත් කර ඇති වාහන ආනයන කරුවන් ප්‍රමාණය	781
03	සක්‍රීය මුළු ලියාපදිංචි ආනයන කරුවන් ගණන	1,858

ධාවනයට නුසුදුසු වාහන හා වායු විමෝචන තත්ත්වයන් මාර්ගයේදී පරීක්ෂා කිරීම (2025.01.01 සිට 2025.12.31 දක්වා)

අනු අංකය	විස්තරය	ප්‍රමාණය
01	වායු විමෝචන තත්ත්වයන් පරීක්ෂා කිරීම	16,616
02	වායු විමෝචනය හේතුවෙන් ධාවනයට නුසුදුසු වාහන සඳහා නඩත්තු සහ තහනම් නියෝග ලබා දීම	2,581

2.1.2.6 අත් කරගත් විශේෂ ජයග්‍රහණ

දළ වශයෙන් වාහන මිලියන හතක් සහ රියදුරු බලපත්‍ර මිලියන දහසයක් පමණ ප්‍රමාණයක් සඳහා කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දහසකට ආසන්න ප්‍රමාණයකින් සියළුම සේවාවන් අඛණ්ඩව සිදුකරන අතර ආයතනයේ කාර්ය මණ්ඩලයේ දැඩි කැපකිරීම මත රජයට විශාල ආදායම් ඉලක්කයක් සපුරා දීමට සමත්ව සිටී.

- සංචාරක ප්‍රවර්ධනය වෙනුවෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපර්තමේන්තුවේ රියදුරු බලපත්‍ර සේවා කවුළුවක් කටුනායක ගුවන්තොටුපලේදී ආරම්භ කිරීම
- වර්ෂයේ ආදායම් ඉලක්කය සම්පූර්ණ කිරීම
- අම්පාර දිස්ත්‍රික් කාර්යාලය රියදුරු බලපත්‍ර නිකුත් කිරීම මාර්ගගත ක්‍රමයට (online) සිදුකිරීම
- මහජන පැමිණිලි කළමනාකරණය කිරීම සඳහා අභ්‍යන්තර කටයුතු ඒකකයක් ආරම්භ කිරීම

2.1.2.7 ගැටළු හා අභියෝග

- මහජනතාවට සහ කාර්ය මණ්ඩලයට ප්‍රමාණාත්මක ඉඩකඩ නොමැති වීම
- ප්‍රමාණවත් තාක්ෂණික කාර්ය මණ්ඩලයක් නොමැති වීම.
- ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාල වල ප්‍රමාණවත් ලේඛණාගාර පහසුකම් නොතිබීම
- දිස්ත්‍රික් කාර්යාලවල කාර්යාල ඉඩපහසුකම් පිළිබඳ ගැටළු සහ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීමට හා වාහන පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම

2.1.2.8 ඉදිරි සැලසුම්

2028 වසරට ශතකයක් සම්පූර්ණ වන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අභියෝග සහ ගැටළු හදුනාගනිමින් මහජනතාවට වඩාත් කාර්යක්ෂම හා සුහද සේවාවක් ලබාදීමට සැලසුම් සකස් කරමින් පවතී.

2.1.2.9 වාහන වායු විමෝචන භාරකාර අරමුදල

2.1.2.9.1 ආදායම් -වියදම් විස්තර (2025.12.31 දක්වා)

වියදම් වර්ගය	වෙන් කළ ස්වයං ප්‍රතිපාදන (රු. මි.)	ප්‍රගතිය (රු. මි.)	ප්‍රතිශතය (%)
ප්‍රාග්ධන	93.00	3.20	3.30
පුනරාවර්තන			
මෙහෙයුම් වියදම්	44.00	23.00	52.30
සංවර්ධන වියදම්	290.00	130.00	45.00
එකතුව	**427.00**	**156.20**	**36.58**

ආදායම් වර්ගය	ඉලක්කගත ආදායම (රු. මි.)	සත්‍ය ආදායම් උත්පාදනය (රු. මි.)	සත්‍ය ආදායම් උත්පාදනය (%)
වාහන වායු විමෝචන පරීක්ෂණ සඳහා 10% ක වැඩසටහන් ගාස්තුව	362.00	389.00	100.00
ස්ථාවර තැන්පත් සඳහා පොලී ආදායම	70.00	77.00	64.00
එකතුව	**432.00**	**466.00**	**107.80**

2.1.2.9.2 සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතිය (2025.12.31 දිනට)

වැඩසටහන / ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම	ඇස්තමේන්තු වටිනාකම (රු. මි.)	වෙන් කළ ස්වයං ප්‍රතිපාදන (රු. මි.)	මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය		
			ඉලක්කය (රු. මි.)	වියදම (රු. මි.)	%	ඉලක්කය (ඒකක)	සාරාංශගත ප්‍රගතිය	%
01. මාර්ගස්ථ දුම් පරීක්ෂණ වැඩසටහන්/ ස්ථානීය වාහන පරීක්ෂණ වැඩසටහන්/ දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන අධීක්ෂණය ඇතුළු අධීක්ෂණ හා නියාමන කටයුතු සිදුකිරීම	10.00	10.00	10.00	3.7	37	01. අහඹු වාහන පරීක්ෂා කිරීම් 15,000 ක්. 02. මාසිකව ස්ථානීය වාහන පරීක්ෂා 300/ මහජනතාවගේන් පැමිණිලි 100ක් කැඳවා ගැනීම. 03. මාසිකව දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන 20 ක් පරීක්ෂා කිරීම.	15,404 1,212 72	100 100 30
02.1 වාහන වායු විමෝචන පරීක්ෂණ සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම හා දැනුවත් කිරීමේ පත්‍රිකා/ ස්ටිකර් මුද්‍රණය කිරීම	23.5	23.5	23.5	4.2	18	වර්ෂයකට වැඩමුළු 04 ක් පැවැත්වීම. අත්පත්‍රිකා/ස්ටිකර්/පොත් 5000 ක් බැගින් මුද්‍රණය කිරීම.	07 අත්පත්‍රිකා 5000,දැනුවත් කිරීමේ පත්‍රිකා 2000,සහතික පත්‍ර 1000	100

වැඩසටහන / ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම	ඇස්තමේන්තු වටිනාකම (රු. මි.)	වෙන් කළ ස්වයං ප්‍රතිපාදන (රු. මි.)	මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය		
			ඉලක්කය (රු. මි.)	වියදම (රු. මි.)	%	ඉලක්කය (ඒකක)	සාරාංශගත ප්‍රගතිය	%
02.2 ජන මාධ්‍ය තුලින් දැනුවත් කිරීමේ ව්‍යාපෘති සිදු කිරීම	11.8	11.8	11.8	2.47	20	වර්ෂයකට වීඩියෝ 04 ක් නිර්මාණය කිරීම. සමාජ මාධ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	සමාජ මාධ්‍ය ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ජනමාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා වාහන දුම් වලින් වන සෞඛ්‍ය අවධානම සම්බන්ධ වීඩියෝවක් නිර්මාණය කරන ලදී.	100
03. යටිතල පහසුකම් වර්ධනය හා මානව සම්පත් සංවර්ධනය, ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම තුලින් වාහන වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලයේ ධාරිතාවය වැඩි දියුණු කිරීම	93.0	93.0	93.0	4.2	5	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වේරහැර පරිශ්‍රයේ වාහන වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම. වාහන වායු විමෝචන පරීක්ෂණ උපකරණ මිලදී ගැනීම. මානව සම්පත් සංවර්ධන වැඩමුළු ක්‍රියාත්මක කිරීම.	පරීක්ෂණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත. වාහන වායු විමෝචන වැඩසටහන හා සම්බන්ධ පාර්ශ්ව සඳහා ධාරිතා පුහුණු වැඩසටහන් පවත්වා ඇත.	100 80
04. පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල්ලබා දීම	238.4	238.4	238.4	119.7	50	01. ජාතික වායු තත්ත්ව වෙබ් අඩවිය සකස් කිරීම	දිවයිනේ වැඩි ප්‍රදේශයක් ආවරණය කරමින් සංසරණ වායු තත්ත්වය පිළිබවද තොරතුරු ලබා ගැනීම සඳහා මෘදුකාංගයක් නිර්මාණය කර එම දත්ත අවශ්‍ය පාර්ශවයන් වෙත ලබා	80

වැඩසටහන / ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම	ඇස්තමේන්තු වටිනාකම (රු. මි.)	වෙන් කළ ස්වයං ප්‍රතිපාදන (රු. මි.)	මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය		
			ඉලක්කය (රු. මි.)	වියදම (රු. මි.)	%	ඉලක්කය (ඒකක)	සාරාංශගත ප්‍රගතිය	%
						02. වායු තත්ත්වය මිනුම් කිරීම හා එම දත්ත මහජනතාවට ප්‍රදර්ශනය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට අරමුදල් ලබා දීම 03.වෙනත් ව්‍යාපෘති සඳහා අරමුදල් ලබා දීම	ගැනීම සඳහා ජාතික වැඩපිළිවෙලක් සකස් කර ඇත. වායු තත්ත්ව දත්ත ලබා ගැනීම සඳහා වෙබ් අඩවිය නිර්මාණය කර අවශ්‍ය පාර්ශ්ව සඳහා දත්ත ලබා ගැනීමට වෙබ් අඩවිය දියත් කර ඇත. වායු දූෂ්‍යකාරක අවම කිරීම සඳහා රුක් රෝපණ වැඩසටහන් සඳහා අරමුදල් ලබාදී ඇත. රථ වාහන කළමනාකරණය සඳහා මාර්ග සංඥා පුවරු වල count down timers සවිකිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත අරමුදල් ලබා දී ඇත.	
05.වාහන නිසි පරිදි නඩත්තුව හා අළුත්වැඩියාව සම්බන්ධයෙන් ගරාජ වල තාක්ෂණික නිළධාරින් සඳහා පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කිරීම	5.0	5.0	5.0	-	25	ගරාජ වල කාර්මික ශිල්පීන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම හා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ලබා දීම.	පුහුණු වැඩමුළු පැවැත්වීම සඳහා මහජන උපයෝගීතා කොමිෂන් සභාව සමග ගිවිසුම් අත්සන් කිරීමට සූදානම් කර ඇත.	20

2.1.2.9.3 ආයතනයේ ප්‍රගතිය පෙන්නුම් කෙරෙන වෙනත් තොරතුරු

- ආයතනය සඳහා ISO 9001:2015 තත්ත්ව සහතිකය ලබා ගැනීම
- UNESCAP ආයතනය විසින් සංවිධානය කරන ලද Regional Action Program on Air Pollution තාක්ෂණික උපදේශන සමුළුවේ වාහන වායු විමෝචන පරීක්ෂණ සඳහා නව තාක්ෂණික යොදාගැනීම් සම්බන්ධව ඉදිරිපත් කිරීමක් සිදු කිරීම

2.1.2.9.4 අභියෝග හා ගැටලු

- වාහන වායු විමෝචන භාරකාර අරමුදල ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස මෝටර් වාහන පනතට ඇතුළත් කිරීම
- කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය අවම සේවක පිරිසක් නොමැති වීම හා ස්ථීර මාණ්ඩලික නිළධාරීන් කිසිවෙකු නොමැතිවීම

2.1.2.9.5 අත්කරගත් විශේෂ ජයග්‍රහණ

වාහන වායු විමෝචන භාරකාර අරමුදල ව්‍යවස්ථාපිත කිරීම සඳහා මෝටර් රථ පනත සංශෝධනය කිරීම සඳහා ප්‍රතිපත්තිමය අනුමැතියක් අමාත්‍ය මණ්ඩලයෙන් ලබා ගැනීම.

2.1.2.9.6 ඉදිරි සැලසුම්

- තිරසර ප්‍රවාහන කළමනාකරණය සඳහා වගකිවයුතු ආයතනයක් වශයෙන් වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ කාර්යාලය ස්ථාපිත කිරීම හා අවශ්‍ය නිළධාරීන් බඳවා ගැනීම

- 2028 වර්ෂයේ දී නව වාහන වායු විමෝචන ප්‍රමිති හා නව පරීක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීම සඳහා අධ්‍යයනයන් හා පර්යේෂණ ආරම්භ කිරීම

- වායු තත්ත්ව කළමණාකරණය හා මාර්ග ආරක්ෂාව සම්බන්ධව ජාතික පර්යේෂණ සමුළුවක් පැවැත්වීම

2.1.3 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

“1957 වර්ෂයේ අංක 48 දරණ මෝටර් ගමනාගමන පනත” යටතේ එවකට පැවති බස් සමාගම් ජනසතු කරමින් 1958 වර්ෂයේ ජනවාරි පළමු වන දින ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවා ඇත. ඉන් අනතුරුව විවිධ පරිවර්තනයන්ට ලක්ව 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත මඟින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලංගම) පිහිටුවන ලදී. ඒ අනුව, වර්තමානය වන විට 24,468 ක සේවක මණ්ඩලයක් මඟින් දීප ව්‍යාප්තව පිහිටා ඇති ඩිපෝ 107 කින් හා උපඩිපෝ 12 කින් මෙරට ජනතාවගේ දෛනික මගී ප්‍රවාහන සේවා ඉල්ලුමෙන් 40% - 50% අතර සේවා සම්පාදනයක් ශ්‍රී ලංගම මඟින් සිදුවන අතර ඒ සඳහා දෛනිකව බස් රථ 5,061 ක් පමණ ධාවනයට ලබා දෙනු ලබයි.

ප්‍රාදේශීය කාර්යාල 12 මඟින් ඩිපෝවන් සඳහා උපදෙස් දීමත්, ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධීකරණය කිරීම මඟින් ගුණාත්මක, කාර්යක්ෂම හා ඵලදායී බස් සේවාවක් සැපයීම පිණිස කටයුතු ප්‍රවර්ධනයත් සිදු කරන අතර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් පහත කාර්යයන් ඉටුකරනු ලබයි.

- සිසු සැරිය, ගැමි සැරිය හා නිසි සැරිය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අනාර්ථික මාර්ගවල බස් සේවා යෙදවීම
- දුර ගමන් සේවා සඳහා බස් සේවා යෙදවීම
- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රවාහන නියෝජිත ලෙස සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම
- උත්සව, විශේෂ අවස්ථා, පාර්ලිමේන්තු, පළාත් සභා මැතිවරණ ආදි අවස්ථාවන්වලදී බස් සේවා සම්බන්ධීකරණ කිරීම
- විභාග දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම්ගතව විභාග ප්‍රශ්නපත්‍ර, කාර්යමණ්ඩල ප්‍රවාහනය ආදිය සඳහා බස්රථ ලබාදීම
- තැපැල් සහ පුවත්පත් ප්‍රවාහනය
- රියදුරන්, කොන්දොස්තරවරුන්, යාන්ත්‍රික ශිල්පීන් සහ අධීක්ෂණ කාර්යය මණ්ඩලය වෙනුවෙන් සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම
- වැඩිහිටියන් සහ ශිෂ්‍යයන් සඳහා සහනදායී වාර ප්‍රවේශපත් ලබාදීම
- බස් ධාවනය සම්බන්ධයෙන් ප්‍රාදේශිකයන්, මහා භාණ්ඩාගාරය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, පළාත් සභා, අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම
- ශ්‍රී ලංගමයේ රියදුරු පුහුණු පාසල් වලින් මනා පුහුණුව ලැබූ විනයගරුක රියදුරන් සැපයීම
- ප්‍රාදේශීය වැඩපොල වලින් නිෂ්පාදනය කරනු ලබන එන්ජින් කට්ටල් / උපකට්ටල් (එන්ජින්, ගියර් පෙට්ටි, ස්ටාටර් මෝටර්, ඕල්ටනේටර් හා ඉන්ජෙක්ටර් පොම්ප) ඩිපෝවන් වෙත සැපයීම
- පළාත් වැඩපොළවල් සඳහා ඉතා වැදගත් අමතර කොටස් නිකුත් කිරීම සඳහා නාරාහේන්පිට ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ගබඩාව පවත්වාගෙන යාම
- ඩිපෝවන්වල බස් ධාවනය සම්බන්ධයෙන් ආරක්ෂක විමර්ශනය, හදිසි වැටලීම්, සෝදිසි කිරීම් ආදිය පැවැත්වීම

2.1.3.1 ආදායම් වියදම් විස්තර (2025.12.31 දිනට)

වියදම් වර්ගය	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	ප්‍රතිශතය (%)
ප්‍රාග්ධන			
2025 වර්ෂයේ මුළු ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව	**10,225.25**	**36.02**	**0.35**
පුනරාවර්තන			
බස් රථවල මෙහෙයුම් වියදම්	61,125.67	55,337.16	90.53
බස් රථවල වෙනත් විවිධ්‍ය වියදම්	10,393.73	8,861.55	85.26
කාර්යාල සේවක වැටුප් හා චේතන වියදම්	4,524.17	4,007.47	88.58
වෙනත් පරිපාලන වියදම්	6,207.68	3,712.61	59.81
මූල්‍ය වියදම්	6.47	7.26	112.21
ප්‍රාදේශිය වැඩපොල	1,946.26	874.32	44.92
පුනරාවර්තන එකතුව	**84,203.98**	**72,800.37**	**86.46**
ප්‍රාග්ධන එකතුව	**10,225.25**	**36.02**	**0.35**
මුළු එකතුව	**94,429.23**	**72,836.39**	**77.13**

ආදායම් වියදම් වාර්තාව (2025.12.31 දිනට)

මාසය	මුළු බස් රථ සංඛ්‍යාව	දිනකට ධාවනයට ලබා දුන් බස් රථ ගණන	දිනකට ධාවනය කළ බස් රථ ගණන	ධාවනය කළ කිලෝමීටර් ගණන	මාර්ග ලේඛන ආදායම (රු.මි.)	ඉන්ධන වියදම (රු.මි.)	මුළු ආදායම (රු.මි.)	මුළු වියදම (රු.මි.)
ජනවාරි	7,137	5,105	4,590	34,426,312	4,347.95	2,854.85	5,871.82	5,976.18
පෙබරවාරි	7,137	5,077	4,382	31,124,503	3,979.22	2,575.31	5,780.56	5,531.83
මාර්තු	7,136	5,084	4,541	34,426,312	4,448.69	2,857.41	6,471.72	5,948.40
අප්‍රේල්	7,135	5,138	4,330	30,116,410	4,271.80	2,655.63	6,015.86	5,795.38
මැයි	7,135	5,009	4,350	30,817,533	4,118.72	2,598.19	5,956.19	5,790.32
ජූනි	7,136	4,961	4,422	30,672,072	4,167.12	2,584.58	6,364.36	5,741.86
ජූලි	7,137	4,981	4,428	32,168,579	4,419.78	2,827.42	6,516.64	6,158.18
අගෝස්තු	7,141	4,966	4,431	31,752,732	4,494.98	2,831.13	6,635.68	6,066.10
සැප්තැම්බර්	7,137	4,954	4,428	30,955,713	4,168.68	2,697.05	6,403.41	5,967.64
ඔක්තොම්බර්	7,137	4,985	4,612	31,821,542	4,205.18	2,702.69	6,430.24	5,959.44
නොවැම්බර්	7,137	4,946	4,138	28,378,636	3,780.79	2,361.32	5,872.47	5,372.67
දෙසැම්බර්	7,137	4,976	4,352	28,378,652	4,087.85	2,531.88	6,700.92	5,863.87

2.1.3.2 ආයතනයේ සමස්ත ප්‍රගතිය (2025.12.31 දිනට)

වියදම් වර්ගය		2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන		මූල්‍ය ප්‍රගතිය (රු.මී.)	ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති			භෞතික ප්‍රගතිය (%)
		භාණ්ඩාගාර (රු.මී.)	ස්වයං (රු.මී.)		ඉලක්කය	නිමකරන ලද	ක්‍රියාත්මක වෙමින් පවතින	
2025.12.31	ප්‍රාග්ධන	1,500.00		1,399.45	1	-	1	ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවති (භාණ්ඩාගාර ප්‍රතිපාදන ව්‍යාපෘති 2.1.3.3 වගුවේ දක්වා ඇත)
		*2,676.50		2,439.17	7	4	3	
	පුනරාවර්තන	15,150.00		15,150.00	4	-	4	
2025.12.31	ප්‍රාග්ධන		10,225.25	57.88	6	-		
	පුනරාවර්තන		84,203.98	72,800.37	මේ තුළ සේවක වැටුප් ගෙවීම ඇතුලූ සියළු පරිපාලන වියදම් අන්තර්ගත කර ඇත			

*2025 වර්ෂය තුළ අමතර ප්‍රතිපාදන ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලංගම) වෙත ලබා දෙන ලදි.

2.1.3.3 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2025.12.31දිනට)

අ. අ.	වැඩසටහන/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම	ඇස්තමේන්තු වටිනාකම (රු.මි.)	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි)	මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය		
				ඉලක්කය (රු.මි)	වියදම (රු.මි.)	ප්‍රතිශතය (%)	ඉලක්කය	සාරාංශගත ප්‍රගතිය	ප්‍රතිශතය (%)
භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති									
1	බස් රථ ඇණියේ පුනරුත්ථාපන කටයුතු හා රථ ඇණිය පුළුල් කිරීම	1,500.00	1,500.00	1,500.00	1,399.45	93.3			
	එන්ජින්						1,073	එන්ජින් 415ක් සාදා නිම කර ඇත.	39
	ගියර් බොක්ස්						1,763	ගියර් බොක්ස් 284 ක් සාදා නිම කර ඇත	15
	බස් බොඩි						2,070	බස් බොඩි 211ක් අළුත්වැඩියා කොට නිම කර ඇත.	23
2	බස් රථ පුනරුත්ථාපන වැඩසටහන යටතේ බස්රථ නවීකරණය කිරීම	758.00	357.47	357.47	154.89	43.33	400	බස්රථ පුනරුත්ථාපන වැඩසටහන යටතේ බස්රථ 242ක් නවීකරණය කර ඩිපෝවන්වලට ලබා දී ඇත.	60.5
3	අශෝක් ලේලන්ඩ් BS III එන්ජින් කට්ටල් 60ක් මිළදී ගෙන බස්රථ සඳහා සවි කිරීම	345.6	345.6	345.6	332.39	96.18	60	එන්ජින් කිට් 60ක් මිළදීගෙන ස්ථාපනය සඳහා ඩිපෝ වලට භාර දී ඇත.	100
4	BS IV එන්ජින් කට්ටල් 60ක් මිළදී ගෙන බස් රථ සඳහා සවි කිරීම	374.4	374.4	374.4	360.83	96.38	60	එන්ජින් කිට් 60ක් මිළදීගෙන ස්ථාපනය සඳහා ඩිපෝවලට භාර දී ඇත.	100

අ. අ.	වැඩසටහන/ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම	ඇස්තමේන්තු වටිනාකම (රු.මි.)	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි)	මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය		
				ඉලක්කය (රු.මි)	වියදම (රු.මි.)	ප්‍රතිශතය (%)	ඉලක්කය	සාරාංශගත ප්‍රගතිය	ප්‍රතිශතය (%)
5	BS III ACඑන්ජින් කට්ටල් 12 ක් මිළදීගෙන බස් රථ සඳහා සවි කිරීම	84	84	84	78.53	93.49	12	එන්ජින් කිට් 12ක් මිළදීගෙන ස්ථාපනය සඳහා ඩිපෝවලට භාර දී ඇත.	100
6	YUTONG එන්ජින් කට්ටල් 30 ක් මිළදී ගෙන බස් රථ සඳහා සවි කිරීම	186	186	186	212.00	98.83	30	භාණ්ඩ ලබාගෙන කටුබැද්ද SLTTS (Super Luxury Tourisum Transport Service) වෙත ලබා දී ඇත.	100
7	YUTONG ගියර් පෙට්ටි 30 ක් මිළදී ගෙන බස් රථ සඳහා සවි කිරීම	28.5	28.5	28.5					
8	ඩිපෝ පරිශ්‍ර මාර්ග සහ අංගන කාපට් කිරීම. (මට්ටක්කුලිය, මොරටුව, පානදුර, අවිස්සාවේල්ල, තලංගම, කඩවත, කිරිඳිවැල, ගම්පහ, මතුගම)	900	1,300.53	1,300.53	1,300.53	100	ඩිපෝ පරිශ්‍ර 9	අවිස්සාවේල්ල, පානදුර, ගම්පහ, කිරිඳිවැල හා තලංගම ඩිපෝවන්හි කාර්යයන් අවසන් කර ඇති අතර මොරටුව 80%ක් කාර්යයන් නිම කර ඇත. මට්ටක්කුලිය කාර්යයන් ප්‍රදානය කර ඇත. කඩවත හා මතුගම ඩිපෝවන් ඉවත් කර ඇත.	80%

ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ වෙන්වී ඇති ප්‍රතිපාදන මඟින් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති අතර එම ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතී.

i. ආබාධ සහිත පුද්ගලයන්ට පහසුකම් සහිත පතුළ පහත් බස්රථ 10 මිලදී ගැනීම - මුළු ඇස්තමේන්තුව රුපියල් මිලියන 430.7 වන අතර 2026 වර්ෂයේ මාර්තු 15ට පෙර බස්රථ ලබාදීමට අපේක්ෂිතයි. 2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 340 කි.

ii. පිටකොටුව මධ්‍යම බස්රථ නැවතුම්පළ නවීකරණ ව්‍යාපෘතිය - මුළු ඇස්තමේන්තුව රුපියල් මිලියන 425 වන අතර 2025 වසර සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන රු.මි. 120 කි. 2026 වර්ෂයේ අප්‍රේල් මස වන විට නිම කිරීමට අපේක්ෂා කරන අතර 2025.12.31 වන දිනට නවීකරණ කටයුතු 45%ක සහ ඉදිකිරීම් කටයුතු 12%ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. 2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය රු.මි.119.67 කි.

2.1 4 ජාතික ගමනාගමන කොමිෂන් සභාව

බස් රථ මඟින් මගී ප්‍රවාහනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව, ආණ්ඩුවට උපදෙස් දීම සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ ජාතික ගමනාගමන කොමිෂන් සභාව පිහිටුවා ඇත. 1996 අංක 30 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත මඟින්ද, 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත මඟින්ද 2017 අංක 06 දරණ ජාතික ගමනාගමන (සංශෝධන) පනත මඟින්ද 2025 අංක 8 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත මඟින්ද 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට කටයුතු කර ඇත. 2025 අංක 8 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත මඟින් බස්රථ මඟින් මගී ප්‍රවාහනය වෙනුවට මාර්ගස්ථ ප්‍රවාහනය යන වචනය ආදේශ කිරීමෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ විෂය පථය පුළුල් කර ඇත.

ඒ අනුව මෙතෙක් කලක් නියාමනයට ලක් නොවූ මගී ප්‍රවාහනයේ යෙදෙන ත්‍රී රෝද රථ, කාර්යාල ප්‍රවාහන සේවා සහ පාසල් ප්‍රවාහන සේවා සඳහා රෙගුලාසි සකස් කිරීමේ බලය ජාතික ගමනාගමන කොමිෂන් සභාවට ලැබී ඇත.

2.1.4.1 ආදායම් වියදම් විස්තර (2025.12.31 දිනට)

වියදම් වර්ගය	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	ප්‍රතිශතය (%)
විශේෂ ව්‍යාපෘති වියදම්			
ප්‍රාග්ධන	54.01	44.21	81.85
පුනරාවර්තන			
භාණ්ඩාගාර	1,913.00	1,700.00	89.47
ස්වයං	58.91	46.59	79.08
එකතුව	**2,025.92**	**1,790.80**	**88.96**
ව්‍යාපෘති නොවන වියදම්			
ප්‍රාග්ධන	30.60	9.98	32.61
පුනරාවර්තන	433.07	364.09	84.07
එකතුව	**463.67**	**374.07**	**80.67**

ආදායම් වර්ගය	ඉලක්කගත ආදායම (රු.මි.)	සත්‍ය ආදායම (රු.මි.)	සත්‍ය ආදායම් උත්පාදනය (%)
1. බලපත්‍ර ආදායම			
මාර්ග බලපත්‍ර ආදායම	134.96	133.29	98.76
මාර්ග ටෙන්ඩර් ආදායම	414.53	413.40	99.72
එකතුව	**549.49**	**546.69**	**99.49**
2. වෙනත් ආදායම්	187.16	170.34	91.01
3. පොළී ආදායම්	57.23	68.38	119.48
එකතුව	**244.39**	**238.72**	**97.68**
මුළු එකතුව	**793.88**	**785.41**	**98.93**

2.1.4.2 ආයතනයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනයන්ට අදාල ප්‍රගතිය (2025.12.31 දිනට)

2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (රු.මි.)		මූල්‍ය ප්‍රගතිය (%)	ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති			භෞතික ප්‍රගතිය (%)
භාණ්ඩාගාර	ස්වයං		ඉලක්කය	නිම කරන ලද	ක්‍රියාත්මක වෙමින් පවතින	
-	54.01	81.85	5	2	3	80

2.1.4.3 සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතිය **(2025.12.31** දිනට)

වැඩසටහන/ ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම	ඇස්තමේන්තු ගත වටිනාකම (රු.මි.)	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මුල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය		
			ඉලක්කය (රු.මි.)	වියදම (රු.මි.)	%	ඉලක්කය (ඒකක)	සාරාංශගත ප්‍රගතිය	%
සිසුසැරිය	1,628.228	1,628.228	1,628.228	1,562.5	95.96	නව සේවා 100 ආරම්භ කිරීම.	නව සිසුසැරිය සේවා 77 ක් ආරම්භ කරන ලදි.	77
ගැමිසැරිය	26.431	26.431	26.431	2.78	10.51	නව සේවා 120 ආරම්භ කිරීම.	නව ගැමි සැරිය සේවා 1 ක් ආරම්භ කරන ලදි.	0.83
නිසිසැරිය	245.34	245.34	245.34	134.72	54.91	නව සේවා 600 ආරම්භ කිරීම.	නව සේවා 611 ආරම්භ කරන ලදි.	102
බස් පර්යන්තය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම	9.5	9.5	9.5	10.01	105	ජංගම බස් රථ පරීක්ෂණ වැඩසටහන් 16ක් හා බස් රථ පරීක්ෂණ වැඩමුළු 6ක් පැවැත්වීම.	ජංගම බස් රථ පරීක්ෂණ වැඩසටහන් 16ක් හා බස් රථ පරීක්ෂණ වැඩමුළු 5ක් පවත්වා ඇත.	95
රථවාහන ඉල්ලුම සහ සේවා තත්ත්ව සමීක්ෂණ	7.0	7.0	7.0	6.16	88	සමීක්ෂණ 30 ක් පැවැත්වීම.	සමීක්ෂණ 106ක් පවත්වන ලදි.	100

බස් රථ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම	9.0	9.0	9.0	8.56	95.5	පුහුණු වැඩසටහන් 45 ක් පැවැත්වීම.	පුහුණු වැඩසටහන් 44 ක් පවත්වන ලදි.	98
කාලසටහන් සහ සේවා අධීක්ෂණය	6	6	6	4.96	83	කොළඹ සිට බස්රථ ධාවනය වන ප්‍රධාන පිවිසුම් මාර්ග 02 සඳහා ඒකාබද්ධ කාලසටහන් ක්‍රියාත්මක කිරීම.	පුත්තලම් පිවිසුම් මාර්ගයේ ඒකාබද්ධ කාලසටහන් සකස් කර ක්‍රියාත්මක කරන ලදි. සතියේ දින අනුව වෙනස්වන මගී ඉල්ලුම් අනුව දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඒකාබද්ධ කාලසටහන් සංශෝධනය කිරීම හා මගී අවශ්‍යතාවය අනුව පවත්නා කාලසටහන් සංශෝධනය කිරීම.	60
බස්රථ ගාස්තු සකස් කිරීම	0.1	0.1	0.1	0.054	54	වාර්ෂික බස් ගාස්තු සංශෝධනය ප්‍රකාශයට පත්කිරීම සහ ඉන්ධන මිල වෙනස්වීම මත අන්තර්වාර බස් ගාස්තු සංශෝධනය සිදු කිරීම, ගාස්තු විෂමතා ඉවත් කිරීම සහ බස් ගාස්තු ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම.	වාර්ෂික බස් ගාස්තු සංශෝධනය ප්‍රකාශයට පත් කරන ලදී. බස් ගාස්තු ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත් කර එම කමිටුව විසින් බස් ගාස්තු ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය දත්ත රැස්කරමින් පවතී. මාර්ග 37 ක බස් ගාස්තු විෂමතා ඉවත් කිරීම සිදුකර ඇත.	55

අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ පද්ධතිය	12.906	12.906	12.906	5.4	42	අභ්‍යන්තර තොරතුරු පද්ධතිය සඳහා නඩත්තු වියදම් දැරීම.	අභ්‍යන්තර තොරතුරු පද්ධතිය සඳහා වැයවන නඩත්තු වියදම් දැරීම.	55
ජී.පී.එස් උපකරණ සහ පාලන කාමරයේ නඩත්තු පිරිවැය	8.65	8.65	8.65	8.34	96.4	ජී.පී.එස් සහ පාලන මැදිරිය සක්‍රියව පවත්වාගෙන යාමේ වියදම් දැරීම.	ජී.පී.එස් සහ පාලන මැදිරිය සක්‍රියව පවත්වාගෙන යාමේ වියදම් දැරීම.	100
රෙගුලාසි සකස් කිරීම	0.1	0.1	0.1	0.05	50	ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත අනුව රෙගුලාසි සකස් කිරීම.	මෙහෙයුම් කටයුතු සඳහා වන රෙගුලාසි කෙටුම්පත් කර ඇත. අන්තර් පළාත් බස්රථ මෙහෙයුම් කටයුතු හා පාසල් ප්‍රවාහන සේවා, කාර්යාල ප්‍රවාහන සේවා සහ ත්‍රීරෝද රථ සඳහා රෙගුලාසි කෙටුම්පත් කර ඇත.	65
දුරගමන් සේවා සංඥා පුවරු සවිකිරීම	1.2	1.2	1.2	0.89	74	දුර ගමන් බස් රථ නැවතුම් ස්ථාන 750 හඳුනා ගැනීම.	දුර ගමන් බස් රථ නැවතුම් ස්ථාන 1836 ක් හඳුනාගෙන ඇත.	100
දුරගමන් සේවා විවේක ස්ථාන	0.2	0.2	0.2	0.09	45	දුර ගමන් සේවා බස්රථ නවත්වනු ලබන ආපනශාලාවල තත්ත්වය ඉහල නැංවීම.	කොළඹ සිට බස්රථ ධාවනය වන ප්‍රධාන පිවිසුම් මාර්ග 2ක බස්රථ නවත්වනු ලබන ආපනශාලා	88

							පරීක්ෂා කර තත්ත්වය උසස් කිරීමට සඳහා උපදෙස් ලබාදී ඇත. පුත්තලම් මාර්ගයේ දැනට බස්රථ නවත්වනු ලබන ආපනශාලා හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් පවත්වන ලදි.	
පාරිභෝගික සේවා	0.5	0.5	0.5	0.40	80	මහජන සම්බන්ධතා සඳහා ක්‍රමවේද සකස් කිරීම.	මගීන්ගෙන්, මගී ප්‍රවාහන සේවා හිමිකරුවන්ගෙන් සහ මගී ප්‍රවාහන සේවා රියදුරන්ගෙන් තොරතුරු, යෝජනා සහ අදහස් ලබා ගැනීම (පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ ස්ටිකර් ප්‍රදර්ශනය කිරීම). NTC WhatsApp අංකය හරහා මහජන පැමිණිලි ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව මගීන් දැනුවත් කිරීම සඳහා ස්ටිකර් අලවා ඇත.	10
උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම	0.1	0.1	0.1	-	-	ඉදිරි වසර 5 ක් සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම.	ආයතනයේ නිළධාරීන් විසින් මේ වන විට දළ උපාය මාර්ගික සැලැස්මක් සකස් කර කෙටුම්පත් කර ඇත.	20

වාර්ෂික ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන සකස් කිරීම.	2.0	2.0	2.0	0.02	1	ජාතික ප්‍රවාහන සංඛ්‍යා ලේඛණ වාර්තාව 2025 ප්‍රකාශයට පත් කිරීම.	2025 දෙසැම්බර් 31 දින ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධියට පත්කර ඇත.	100
පාර්ශ්වකරුවන් සඳහා ප්‍රවාහන ආශ්‍රිත දැනුවත් කිරීමේ වැඩසටහන්	1.0	1.0	1.0	0.25	25	පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 8 ක් පැවැත්වීම.	මගී දැනුවත් කිරීමේ වැඩසටහන – 1 කොන්දොස්තර පුහුණු වැඩසටහන් - 1 ප්‍රවාහන අධිකාරි නිලධාරීන් - 1 අධිවේගි බස්රථ හිමිකරුවන් - 1 අන්තර් පළාත් බස්රථ රියදුරු -1 කාන්තා දින රූපවාහිනී වැඩසටහන් - 1 කාන්තා දින මාධ්‍ය සාකච්ජාව -1 කාන්තා දින ස්ටිකර් ඇලවිමේ වැඩසටහන් - 1	100

නාගරික ප්‍රවාහන සැලසුම්	0.15	0.15	0.15	0.42	280	• මෙට්‍රෝ බස් සමාගම් සඳහා බස් මාර්ග හඳුනා ගැනීම • ආබාධ සහිත පුද්ගලයින් සඳහා බස් මාර්ග හඳුනා ගැනීම • යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන සඳහා ප්‍රවාහන සැලසුම් සකස් කිරීම.	ලංකා මෙට්‍රෝ ට්‍රාන්සිට් (පුද්ගලික) බස් සමාගමට මාර්ග 5ක් තෝරාගෙන ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය මගින් බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථානය, කුරුණෑගල-ගැටිටුවාන ප්‍රවාහන සැලැස්ම සකස්කර ඇත. ආබාධිත සහිත පුද්ගලයින් සඳහා බස් රථ යෙදවීමට මාර්ග 6 ක් හඳුනාගෙන ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.	40
ප්‍රාග්ධන ව්‍යාපෘති								
අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ පද්ධතිය	6.43	6.43	6.43	6.93	107%	අභ්‍යන්තර තොරතුරු පද්ධතිය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන වියදම් දැරීම.	අභ්‍යන්තර තොරතුරු පද්ධතිය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන වියදම් දැරීම.	50
පාරිභෝගික සේවා ඒකකය	0.58	0.58	0.58	-	-	ඇමතුම් මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම.	ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇත.	100
ජාතික ගමනාගමන	2	2	2	1.97	98.5	ජාතික ගමනාගමන කොමිෂන්	වාහන පෝට්කෝවේ වහල	60

කොමිෂන් සභා පරිශ්‍ර ප්‍රතිසංස්කරණය සහ නඩත්තුව						සභා පරිශ්‍ර ප්‍රතිසංස්කරණය සහ නඩත්තුව.	නවීකරණය, water proofing slab සකස් කිරීම, වාහන පෝට්කෝව, තාප්පය පින්තාරු කිරීම, බැස්ටියන් මාවත බස් පර්යන්තයේ බස් පර්යන්ත නවීකරණය කිරීම, බැස්ටියන් මාවත බස් පර්යන්තයේ බස් පර්යන්තවල කපුටන් රැඳෙන ස්ථාන ආවරණය කිරීම.	
බැස්ටියන් මාවත සහ වවුනියාව පර්යන්ත ප්‍රතිසංස්කරණය කිරීම	30	30	30	23.58	78.6	බැස්ටියන් මාවත සහ වවුනියාව පර්යන්ත ප්‍රතිසංස්කරණය කිරීම.	වවුනියාව බස් පර්යන්තයේ සිවිලිම සැකසීම, Louver පැනල සැකසීම හා පින්තාරුව.	90
බැස්ටියන් මාවතේ වේදිකා ඉදි කිරීම - අධිවේගී මාර්ග බස් රථ සඳහා වේදිකාවක් ඉදි කිරීම	15	15	15	11.72	78	බැස්ටියන් මාවතේ වේදිකා ඉදිකිරීම - අධිවේගී මාර්ග බස් රථ සඳහා අදියර I වේදිකා 01 ක් ඉදිකිරීම.	බස්රථ 4 ක් නැවැත්වීම සඳහා වේදිකාවක් සකස් කිරීම.	100

2.1.4.4 ආයතනයේ ප්‍රගතිය පෙන්නුම් කරන වෙනත් තොරතුරු

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම.

එය 2025 අංක 8 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධිත) පනත ලෙස 2025 ජූනි මස 19 දින පාර්ලිමේන්තුව මගින් බලාත්මක කරන ලදී.

2.1.4.5 අභියෝග හා ගැටළු

- 2025 අංක 08 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධිත) පනත මගින් ආයතනයේ විෂය පථය පුළුල් වීමත් සමඟ ඊට අදාළ පුහුණු මානව සම්පත් හා භෞතික සම්පත් සම්පූර්ණ කර ගැනීමට කල් ගතවීම
- ප්‍රවාහනය සම්බන්ධ තීන්දු තීරණ ගැනීම සඳහා මධ්‍යගත දත්ත පද්ධතියක් (Centralized Data System) නොමැතිවීම සහ පර්යේෂණ හා සංවර්ධන අංශයක් ස්ථාපිත වී නොතිබීම
- නව තාක්ෂණය යොදාගැනීමේදී ඒ සඳහා සුදුසුකම්ලත් පුහුණු නිළධාරීන් බඳවා ගැනීමේදී පවතින ගැටළු
- නියාමන බලය සීමාවීම
- පෞද්ගලික මගී ප්‍රවාහන සේවය තනි තනි ආයෝජකයින්ගෙන් සැදුම්ලත් ක්ෂේත්‍රයක් වීම

2.1.4.6 ඉදිරි සැලසුම්

- 2025 අංක 8 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධිත) පනත සඳහා රෙගුලාසි සකස් කර ගැසට් කිරීම
- ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ තවදුරටත් විය යුතු සංශෝධන සිදු කිරීම
- ඉදිරි වසර පහ සඳහා උපාය මාර්ගික සැලැස්ම /සංයුක්ත සැලැස්ම සකස් කිරීම
- ගමනාගමන දත්ත මධ්‍යස්ථානයක් **(National Transport Data Centre – NTDC)** පිහිටුවීම
- ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙහි ආයතනික ව්‍යුහය පුළුල් කිරීම
- විදේශීය මූල්‍ය ආධාර (ADB, JICA, World Bank) සමඟ එක්ව E-Transport Project, Sector Reform සම්බන්ධයෙන් අධ්‍යනය කිරීම සහ ජාතික ප්‍රවාහන සැලැස්මක් (National Transport Plan) සකස් කිරීම
- Integrated Transport Management System (ITMS): GPS, E-ticketing, Vehicle Monitoring, Complaint Handling හඳුන්වා දීම
- ප්‍රවාහනය සම්බන්ධ ජාතික පුහුණු ආයතනයක් පිහිටුවීම
- මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ජාතික වශයෙන් ක්‍රියාත්මක විය හැකි මාධ්‍ය ඒකකයක් පිහිටුවීම
- මගී අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා මගී සංගම් පිහිටුවීම
- සමාජ සුබ සාධන බස් සේවා පුළුල් කිරීම සඳහා පවතින හැකියාව අධ්‍යයනය කිරීම
- සියළු මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා සඳහා ගාස්තු නියාමනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීම

2.1.5 ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

සීමාසහිත සවුත් වෙස්ටර්න් බස් සමාගමට අයත්ව, එහි සේවක සේවිකාවන් හට වෛද්‍ය පහසුකම් සැපයීම සඳහා වෛද්‍ය මධ්‍යස්ථානයක් ලෙස රත්මලාන ඩිපෝ පරිශ්‍රයේ පිහිටුවා තිබූ මෙම ආයතනය 1958 බස් සමාගම් ජනසතු කිරීමත් සමඟම ලංකා ගමනාගමන මණ්ඩලය සතු විය. බස් ජන සතුවෙන් පසුව "ලංගම වෛද්‍ය කොට්ඨාශය" නමින් මෙය හඳුන්වන ලදි.

සේවා පුළුල් කිරීමේ අරමුණින් රත්මලාන ඩිපෝ පරිශ්‍රය තුළ පිහිටුවා තිබූ වෛද්‍ය මධ්‍යස්ථානය, 1970 වර්ෂයේදී ලංකා ගමනාගමන මණ්ඩලය සතුව තිබූ නුගේගොඩ, හයිලෙවල් පාර, අංක : 170 දරණ ස්ථානයට ගෙන එන ලද අතර, වර්තමානයේ "ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය" යන නමින් ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ස්වයං ආදායම් උත්පාදන රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වේ.


1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත මගින් ස්ථාපිත කර ඇත.

ආයතනයේ මූලික අරමුණු ඉටුකර ගැනීම උදෙසා, 1999 නුගේගොඩ ප්‍රධාන කාර්යාලයෙන් ආරම්භ වී මේ වන විට දිස්ත්‍රික්ක විසිපහ තුළම ව්‍යාප්ත වී ඇති ශාඛා කාර්යාල ජාලයකින් සමන්විත වේ.

2.1.5.1 ආයතනයේ ප්‍රධාන කාර්යයන්

බර වාහන රියදුරන්, සැහැල්ලු වාහන රියදුරන්, රියදුරු පාසල්වලින් පුහුණුව ආරම්භ කිරීමට අපේක්ෂිත සියලුදෙනා, ගරු අධිකරණය, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ඇතුළු වෙනත් බාහිර ආයතන මගින් යොමුකරන රියදුරන්ගේ, වෛද්‍ය පරීක්ෂණ සිදුකර ඔවුන්ගේ යෝග්‍යතාවය සහතික කොට වෛද්‍ය සහතික නිකුත් කිරීම මෙම ආයතනයේ ප්‍රධාන කාර්යය වේ.

2025 දෙසැම්බර් මස 31 දක්වා සිදු කරන ලද මුළු වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව 1,037,390ක් වේ. එමඟින් 2025 දෙසැම්බර් මස 31 දක්වා සෞඛ්‍යමය හේතූන් මත රියදුරු වෘත්තියේ යෙදවීමට නුසුදුසු බවට වෛද්‍යවරුන් විසින් නිගමනය කර ඇති ප්‍රමාණය 8.25%ක් වේ. එනම් පරීක්ෂණ සඳහා ඉදිරිපත් වූ සෑම අපේක්ෂකයන් 100 දෙනෙකුගෙන් 8-9%ත් අතර සංඛ්‍යාවක් සෞඛ්‍යමය හේතූන් මත රිය පැදවීමට නුසුදුසු බවට තහවුරු වී ඇත.



හදුනාගත් රෝගාබාධවලින් වැඩි ප්‍රතිශතයකට හේතුව ඇස් පෙනීමේ දුර්වලතාවය බව ඉහත වෛද්‍ය සහතික නිකුත් කිරීමේ ප්‍රගතිය ප්‍රස්ථාරයෙන් පැහැදිලි වේ.

2.1.5.2 ආදායම් - වියදම් විස්තර (2025.12.31 දිනට)

වියදම් වර්ගය	වෙන් කළ ප්‍රතිපාදන(රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	ප්‍රතිශතය (%)
ප්‍රාග්ධන	101.90	25.37	24.90
පුනරාවර්තන	1,090.00	1,052.00	96.51
එකතුව	**1,191.90**	**1,077.37**	**90.39**

ආදායම් වර්ගය	ඉලක්කගත ආදායම් (රු.මි.)	සත්‍ය ආදායම් උත්පාදනය (රු.මි.)	සත්‍ය ආදායම් උත්පාදනය (%)
වෛද්‍ය සේවා	1,694.00	1,708.00	100.82
අනෙකුත්	110.00	156.00	141.82
එකතුව	**1,804.00**	**1,864.00**	**103.33**

2.1.5.3 ආයතනයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනයන්ට අදාළ ප්‍රගතිය (2025.12.31 දිනට)

මූල්‍ය ප්‍රතිපාදන (රු.මි.)		මූල්‍ය ප්‍රගතිය (%)	ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති			භෞතික ප්‍රගතිය (%)
භාණ්ඩාගාර	ස්වයං		ඉලක්කය	නිම කරන ලද	ක්‍රියාත්මක වෙමින් පවතින	
-	101.9	24.90	15	5	10	45

2.1.5.4 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2025.12.31 දිනට)

අ. අ	වැඩසටහන/ ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම	ඇස්තමේන්තු වටිනාකම (රු.මි.)	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය		
				ඉලක්කය (රු.මි.)	වියදම (රු.මි.)	(%)	ඉලක්කය	සාරාංශගත ප්‍රගතිය	(%)
01	ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාල සඳහා පරිගණක හා උපාංග මිලට ගැනීම								
	PC	14	14	14	13.22	94.43	42	39	92.85
	Fire wall	12	12	12	-	-	-	-	-
	Multi-function printers	1	1	1	0.94	94	6	6	100
	Bar code reader	0.05	0.05	0.05	-	-	අවශ්‍යතාවය අනුව මිලදී ගනී	-	-
	Network switch	1.2	1.2	1.2	1.14	95	1	1	100
	POS system for pharmacy	1	1	1	-	-	1	මේ වන විට අදාළ කාර්යය ආරම්භ කර ඇත	5
02	ප්‍රධාන කාර්යාලයේ CCTV කැමරා සවි කිරීම	0.4	0.4	0.4	0.4	100	5	5	100
03	ප්‍රධාන කාර්යාලයේ රියදුරු හා ආරක්ෂක විවේකාගාරය ඉදි කිරීම් කටයුතු අවසන් කිරීම	3	3	3	3	100	1	1	100

අ. අ	වැඩසටහන/ ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම	ඇස්තමේන්තු වටිනාකම (රු.මි.)	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය		
				ඉලක්කය (රු.මි.)	වියදම (රු.මි.)	(%)	ඉලක්කය	සාරාංශගත ප්‍රගතිය	(%)
04	ප්‍රධාන කාර්යාලයේ සූර්ය පැනල ස්ථාපිත කිරීමට කටයුතු කිරීම	25	25	25	-	-	-	ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී	10
05	ප්‍රධාන කාර්යාලයේ කඩා වැටී තිබූ පිටුපස තාප්පයේ ඉදි කිරීම් කටයුතු අවසන් කිරීම	1.75	1.75	1.75	1.75	100	1	1	100
06	ගම්පහ, කෑගල්ල, ගාල්ල, මාතර හා පොළොන්නරුව කාර්යාල, රජයේ ගොඩනැඟිලිවල ස්ථාපිත කිරීමට කටයුතු කිරීම	24	24	24	-	-	5	ගම්පහ, ගාල්ල, පොළොන්නරුව කාර්යාල සඳහා රජයේ ගොඩනැඟිලි සොයාගෙන අවසන් කර ඇත	10
07	ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාල සඳහා ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගැනීම	2	2	2	1.4	70	අවශ්‍යතාවය අනුව මිලදී ගනී		90

අ. අ	වැඩසටහන/ ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම	ඇස්තමේන්තු වටිනාකම (රු.මි.)	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය		
				ඉලක්කය (රු.මි.)	වියදම (රු.මි.)	(%)	ඉලක්කය	සාරාංශගත ප්‍රගතිය	(%)
08	ප්‍රධාන කාර්යාලය වායු සමීකරණය කිරීම. රු.මි.7, අවශ්‍යතාවය අනුව අනෙකුත් කාර්යාල සඳහා රු.මි.2	9	9	9	1.89 (අනෙකුත් කාර්යාල සඳහා)	21	9 (ප්‍රධාන කාර්යාලය ට වායුසමීකරණ යන්ත්‍ර)	වායුසමීකරණ යන්ත්‍ර 9ක් මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අවසන් කර ඇත	20 (ප්‍රධාන කාර්යාලය) 100 (ශාඛා කාර්යාල)
09	ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාල සඳහා වෛද්‍ය උපකරණ මිලදී ගැනීම	2	2	2	0.65	32.5	අවශ්‍යතාවය අනුව මිලදී ගනී		10
10	සේවක ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	4	4	4	-	-	1	-	-
11	සේවක මහත්ම/මහත්මීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	2	2	2	0.98	48	අවශ්‍යතාවය අනුව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ		75
	එකතුව	**101.9**	**101.9**	**101.9**	**25.37**	**24.9**			

2.1.5.5 ආයතනයේ ප්‍රගතිය පෙන්නුම් කරන වෙනත් තොරතුරු

- වෛද්‍ය පරීක්ෂණය සමත් වීමට අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව නිසි අවබෝධයක් නොමැති වීමෙන් සේවාලාභීන් අයථා මාර්ග වලින් වෛද්‍ය සහතික ලබා ගැනීම වැළැක්වීමට වෛද්‍ය නිර්ණායක යාවත්කාලීන කිරීම සහ ඒ සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම
- නවීන තාක්ෂණය ඔස්සේ පාරිභෝගික අදහස් / පැමිණිලි /යෝජනා ලබා ගැනීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම/ පැමිණෙන පැමිණිලි සඳහා ප්‍රතිචාර දැක්වීමට හැකි වීම
- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතට අදාළ නියෝග සකස් කිරීම
- කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සේවක ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සේවක මහත්ම/ මහත්මීන්ගේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ පවත්වා ශ්‍රේණිගත කිරීමට අදාළ කටයුතු සිදු කිරීම
- විදේශ පුහුණු පාඨමාලා සඳහා කාර්ය මණ්ඩලයට අවස්ථාව සැලසීම
- වසරක කාලයක් පමණ පුරප්පාඩු පැවති සමහර තනතුරු සඳහා අදාල ආයතනවල අනුමැතිය සහිතව බඳවා ගැනීමට කටයුතු කිරීම
- වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය ප්‍රථමවරට ක්‍රියාත්මක කිරීම
- ශාඛා කාර්යාල කටයුතු විධිමත් කිරීම සඳහා කාර්ය මණ්ඩල සමාලෝචනය කර පුරප්පාඩු සහිත/ අතිරික්ත කාර්ය මණ්ඩලය මාරු කිරීම
- ආයතනය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් වශයෙන් ආයතනයේ මාධ්‍ය ඒකකයක් ස්ථාපිත කිරීම
- ශාඛා කාර්යාල පහසුකම් වැඩිදියුණු කිරීම
- **"පුනරුදයේ පුරවර"** තේමාව යටතේ පළාත් පාලන සතිය නිමිත්තෙන් මහර ප්‍රාදේශීය සභාවේ ප්‍රධානත්වයෙන් 2025.09.15 දින මහජන සේවය පිණිස රියදුරු බලපත්‍ර සඳහා වෛද්‍ය සහතික ලබා දීමේ ජංගම සේවයක් ඇල්දෙණිය අභිනවාරාමයේදී ක්‍රියාත්මක කිරීම. මෙහිදී සේවාලාභීන් එකසිය පනස් දෙදෙනෙකුට සේවය සපයන ලදී
- ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ක්ලීන් ශ්‍රී ලංකා ජංගම සේවා සහ විශේෂ ජනසත්කාර වැඩ සටහන යටතේ 2025.11.26 දින දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය කේන්ද්‍ර කොට ගෙන බළ/ගම ඕවිට්ගම බෝධිරාජ මහා විද්‍යාලයේදී වෛද්‍ය සායනයක් පැවැත්වීම සහ,
- 2025.11.26 හා 27 යන දෙදින ලුණුගම් වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය කේන්ද්‍ර කර ගනිමින් සූරියවැව හා තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි පැවති

ජංගම සේවා වැඩසටහන යටතේ සේවාලාභීන් එකසිය හතළිස් එක් දෙනෙකුගේ වෛද්‍ය පරීක්ෂණ කටයුතු සිදු කිරීම

- රියදුරු බලපත්‍ර අළුත් කිරීම සඳහා වෛද්‍ය සහතික ලබා ගැනීමට පැමිණෙන සේවාලාභීන්හට කාර්යක්ෂම හා තෘප්තිමත් සේවයක් සැපයීමේ අරමුණින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නුගේගොඩ පිහිටි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයෙහි තාවකාලික රියදුරු බලපත්‍රය ලබා ගැනීම සඳහා රියදුරු බලපත්‍ර අළුත් කිරීමේ සේවාවක් 2025.09.30 දින සිට ආරම්භ කිරීම
- මත්ද්‍රව්‍ය භාවිතා කර රිය ධාවනය කරන රියදුරන් ප්‍රමාණය අවම කිරීම සඳහා පොදු මඟින් ප්‍රවාහනය කරනු ලබන බස් රථ , කොළඹ නගරයට පිවිසෙන මාර්ගයන්හිදී අහඹු ලෙස මත්ද්‍රව්‍ය පරීක්ෂණයට භාජනය කිරීමට අදාළ නියමු ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍ය ගරු බිමල් රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් 2025.11.24 දින සිදු කිරීම

2.1.5.6 අභියෝග හා ගැටළු

- **ආයතනය සඳහා ස්ථිර වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීමේ අපහසුතාවය**
- **සේවක වැටුප් සංශෝධනය කිරීම සම්බන්ධ ගැටළු** - කලමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව මගින් වැටුප් හා විශේෂ දීමනා සඳහා අනුමැතිය ලබා ගැනීමේ අපහසුතාවය නිසා සේවක ප්‍රතිලාභ වැඩි කිරීම සම්බන්ධයෙන් ගැටළු මතුවී ඇත. අනෙකුත් රාජ්‍ය ආයතන, සංස්ථා හා මණ්ඩල අනුව ලාභ ලබන්නා වූ ආයතනයක් වුවත් මෙම ආයතනයේ නිලධාරීන්ගේ හා සේවකයන්ගේ වැටුප් හා ප්‍රතිලාභ එතරම් ආකර්ශණීය නොවන බැවින් ඒ පිළිබඳව කටයුතු සිදු කල යුතුව ඇත

2.1.5.7 අත්කර ගත් විශේෂ ජයග්‍රහණ

- දිගු කාලයක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය අතර සේවා මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්බන්ධ කර වෛද්‍ය සහතික සුහුරු තාක්ෂණය මඟින් ලබාදීමේ ක්‍රමවේදය ආයතනික කාර්යාල අතුරින් 2025.04.07 දින සිට නුගේගොඩ ප්‍රධාන කාර්යාලය හා වේරහැර ශාඛා කාර්යාලයෙහි ද 2025.10.01 දින සිට ගම්පහ හා අම්පාර ශාඛා කාර්යාලයෙහි ද ආරම්භ කිරීම

2.1.5.8 ඉදිරි සැලසුම්

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු තෝරාගත් ඩිපෝ විසිපහක සේවක මහත්ම / මහත්මීන්ගේ වෘත්තීමය සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳව සොයා බැලීම
- රියදුරු බලපත්‍ර අපේක්ෂකයන්ගේ රුධිරයේ සීනි මට්ටම පරීක්ෂා කිරීමේදී ,

සීනි මට්ටම 250mg/dL වැඩි අපේක්ෂකයන්ගේ HbA1C පරීක්ෂණය සිදු කිරීම

- නව රජයේ ප්‍රතිපත්තිය අනුව අම්පාර, මඩකලපුව, බදුල්ල, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, මාතලේ, කුරුණෑගල ශාඛා කාර්යාල, රජයේ ගොඩනැඟිලිවල ස්ථාපිත කිරීමට කටයුතු කිරීම
- ගම්පහ, කෑගල්ල, ගාල්ල, මාතර ශාඛා කාර්යාලවල සී.සී.ටී.වී.කැමරා සවි කිරීම
- සියළුම ශාඛා කාර්යාලවල නව තාක්ෂණික ක්‍රමවේදය ඔස්සේ පෝළිම් කළමනාකරණය (Queue Management system) සිදු කිරීම
- ආයතනයේ අභ්‍යන්තරයේ ඇති ඖෂධාගාරය බාහිර පාර්ශවයන් වෙත විවෘත කිරීම
- විදුලිය විසන්ධි වන අවස්ථාවලදී ශාඛා කාර්යාල කටයුතු, සේවා කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා මඩකලපුව , ගාල්ල, බදුල්ල ශාඛා කාර්යාල සඳහා විදුලි ජනක යන්ත්‍ර මිලදී ගැනීම
- ආයතනයේ සේවක මහත්ම මහත්මින් පුහුණු වැඩසටහන් සඳහා යොමු කර ආයතනයේ මානව සම්පත් සංවර්ධනය තුළින් සේවාලාභියා තෘප්තිමත් කරගත් ගුණාත්මක සේවාවක් සැපයීම
- මාතර,ගාල්ල, හා ගම්පහ ශාඛා කාර්යාල කිහිපයක් වායුසමනය කිරීම

2.1.6 මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

1998 අංක 05 දරණ මෝටර් වාහන පනතට ගෙන එන ලද සංශෝධනයන්ට අනුව 213(අ) වගන්තිය යටතේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පිහිටුවා ඇති අතර, 1387/4- 2005 අප්‍රේල් 07 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් ක්‍රියාත්මක කල යුතු යැයි නියෝග කරන ලද කාර්යයන් පහත සඳහන් කර ඇත.

1) පහත දැක්වෙන දෑ පිළිබඳව පරිගණක දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාම
    - රථවාහන ප්‍රමාණය සහ ඒවායේ ලක්ෂණ සහ සංයුතිය
    - මාර්ග අනතුරු/ මරණ
    - මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර සංඛ්‍යා ලේඛන
2) මාර්ග ආරක්ෂාව විෂයය පිළිබඳ අන්තර්ජාල පහසුකම් සහිත පුස්තකාලයක් පවත්වාගෙන යාම
3) මාර්ග ආරක්ෂාව සම්බන්ධිත විෂයයන් පිළිබඳව පර්යේෂණවලට ආධාර කිරීම
4) සමාන ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධතා පැවැත්වීම හා පළපුරුදු විශේෂඥ දැනුම හුවමාරුකර ගැනීම
5) මාර්ග ආරක්ෂාව සහ සම්බන්ධිත විෂයානුබද්ධ ව්‍යාපෘති කෙරෙහි වගකීම දරණ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වලට දැනුම හා තොරතුරු ලබාදීම
6) මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාවට නැංවීම

7) රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම
8) හඳුනා නොගත් වාහන වලින් අනතුරට පත් තැනැත්තන්ට සහ මියගිය අය සඳහා මූල්‍ය ප්‍රදානයන් සිදු කිරීම
9) මාර්ග ආරක්ෂාව පිළබඳ කටයුතු සඳහා මුල්‍යමය හා වෙනත් සහය ලබා ගැනීම
10) මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් හා ව්‍යාපෘති පිළිබඳව රජයට උපදෙස් ලබාදීම

"සෑමට සුරක්ෂිත මාර්ග පද්ධතියක්" ඇති කිරීම තේමාව කර ගනිමින් ක්‍රියාත්මක වන එකම රාජ්‍ය ආයතනය මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වන අතර, වර්තමානය වන විට මෙම ආයතනය ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් සහ රාජ්‍ය ආයතනයන් 16 ක සහ රාජ්‍ය නොවන ආයතන වල නියෝජිත කණ්ඩායමකින් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විතවේ.

අංක 1368/18-2004 නොවැම්බර් 24 දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුදල සම්බන්ධයෙන් නියෝග නිකුත් කර ඇති අතර, 2021 සැප්තැම්බර් මස 17 දිනැති 2245/31 අංක දරණ ගැසට් පත්‍රයට අනුව තෘතීය පාර්ශවයේ අවදානමක් සම්බන්ධයෙන් අවස්ථානෝචිත පරිදි රක්ෂණ ඔප්පුවක් හෝ ඇපයක් නිකුත් කරනු ලබන සෑම රක්ෂකයෙකු හෝ තැනැත්තෙකු විසින් එම වාරික මුදලින් 2% කින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුදලට දායක විය යුතුය.

2.1.6.1ආදායම් - වියදම් විස්තර (2025.12.31 දිනට)

වියදම් වර්ගය	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මුල්‍ය ප්‍රගතිය (රු.මි.)	ප්‍රතිශතය(%)
පුනරාවර්තන	8.91	4.5	50.5
ප්‍රාග්ධන	73.7	60.98	82.74
එකතුව	**82.61**	**65.48**	**79.26**

ආදායම් වර්ගය	ඉලක්කගත ආදායම් (රු.මි.)	සත්‍ය ආදායම් උත්පාදනය (රු.මි.)	සත්‍ය ආදායම් උත්පාදනය (%)
රක්ෂණ ආයතන වලින් ලැබෙන 2% තෙවන පාර්ශ්වීය රක්ෂණ දායකත්ව මුදල්	84.65	79.74	94.20
ස්ථාවර තැන්පතු පොළි ආදායම් හා භාණ්ඩාගාර බිල්පත් ආදායම්	63.32	49.48	78.14
එකතුව	**147.97**	**129.22**	**87.33**

2.1.6.2 ආයතනයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනයන්ට අදාළ ප්‍රගතිය (2025.12.31 දිනට)

ස්වයං ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)	ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති			භෞතික ප්‍රගතිය (%)
		ඉලක්කය	නිම කරන ලද	ක්‍රියාත්මක වෙමින් පවතින	
73.7	82.74	15	4	11	76.75

2.1.6.3 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2025.12.31 දිනට)

වැඩසටහන/ ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම	ඇස්තමේන්තුගත වටිනාකම (රු.මි.)	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය		
			ඉලක්කය (රු.මි.)	වියදම (රු.මි.)	%	ඉලක්කය (ඒකක)	සාරාංශගත ප්‍රගතිය	%
අධික වේගයෙන් රිය ධාවනය කරන රියදුරන් සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා පොලිසියට අවශ්‍ය මුල්‍ය සහය ලබා දීම (speed guns මිලදී ගැනීම සඳහා)	50	50	50	50	100	100%	2025.01.08 දින රු.මි. 50 ක් මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලබා දීමට කටයුතු කරන ලද අතර, 2025.12.31 දින වන විට ශ්‍රී ලංකා පොලිසිය විසින් වේගමාපක මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.	100
හප්පා පලාගිය රිය අනතුරුවලට ලක්වූ වින්දිතයින් හට මූල්‍ය සහන ලබාදීමේ වැඩසටහන	08	08	08	1.85	23	100%	2025 වර්ෂය අවසන් වන විට ලැබී තිබූ සියලුම සුදුසුකම් ලත් අයදුම්පත් ඇගයීමට ලක් කරන ලදි.	100
රිය අනතුරුවලට ලක්වූ අඩු ආදායම්ලාභී වින්දිතයින් හට මූල්‍ය සහන ලබාදීමේ වැඩසටහන	05	05	05	5.26	100	100%	2024 වර්ෂයේදී කැඳවන ලද සියලුම අයදුම්පත් අතුරින් සුදුසුකම් ලත් අයදුම්පත් සියල්ල සඳහා වන්දි ලබා දී ඇත.	100
බස්නාහිර පළාතේ තෝරාගන්නා ලද පාසලක් සඳහා කොළඹ මහනගර සභාවේ (විහාර මහාදේවී උද්‍යානයේ පිහිටි) මාර්ග ආරක්ෂණ ළමා ඒකකයේ වැඩසටහනක් පැවැත්වීම	0.4	0.4	0.4	0.4	100	100%	ජාතික බාලදක්ෂ වැඩසටහන හා ශාන්ත ජෝන් ගිලන් රථ සේවාව හා එක්ව මාර්ග ආරක්ෂාව පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.	100

*** භෞතික ප්‍රගතිය 100%ක් වන ව්‍යාපෘතිවල තොරතුරු පමණක් අන්තර්ගත කර ඇත**

2.1.6.4 අභියෝග හා ගැටළු

i. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ වැඩබලන අධ්‍යක්ෂ වරයෙක්, වැඩබලන ගණකාධිකාරීවරයෙක් හා ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශයෙන් අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් 6 ක්, කළමනාකරණ සේවා නිලධාරියෙක්, දුම්රිය කාර්ය සහයකවරියක් හා රියදුරෙක් කාර්යාලීය කටයුතු සඳහා යොදවා ඇත. ආයතනික කටයුතු වඩාත් ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගැනීම සඳහා ආයතනයේ විෂයපථය සැලකීමේදී මෙම කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවේ

ii. ආයතනයේ කාර්යාලීය කටයුතු සඳහා අත්‍යාවශ්‍ය අධ්‍යක්ෂ, ගණකාධිකාරී වැනි තනතුරු පසුගිය වසර දෙකක කාලය තුළදී වරින්වර අවස්ථා කිහිපයකදී හිස්ව පැවතීම නිසා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කටයුතු ප්‍රශස්ථ මට්ටමකින් පවත්වා ගැනීමට නොහැකි වීම

2.1.6.5 ඉදිරි සැළසුම්

i. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව, ප්‍රවාහන සුරක්ෂාව පිළිබඳ කොමිෂන් සභාව ලෙස ස්ථාපිත කිරීම

ii. මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් වන ජාතික දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම

iii. මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් වන 2025 – 2026 ජාතික ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කර 2027 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා නව ක්‍රියාකාරී සැළැස්මක් සකස් කිරීම

iv. අධික වේගයෙන් රිය ධාවනය කරන රියදුරන් සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා පොලිසියට අවශ්‍ය තාක්ෂණික උපකරණ ලබාදීම

v. මත්ද්‍රව්‍ය භාවිතා කර රිය ධාවනය කරන රියදුරන් සඳහා නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන වැඩපිළිවෙළ සඳහා ශ්‍රී ලංකා පොලිසියට සහය වීම

vi. බස් රථ රියදුරන් සඳහා මගී ප්‍රවාහන බලපත්‍ර ලබාදීම සඳහා වන නීතිමය පසුබිම සකස් කිරීම

vii. වාහන යෝග්‍යතා සහතික ලබාදීම සඳහා වන නීතිමය පසුබිම සකස් කිරීම

viii. කඳුකර ප්‍රදේශ හා අධි අවදානම් ප්‍රදේශ ආශ්‍රිතව මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන ජාතික සැලැස්මක් සකස් කිරීම

ix. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල බස් රථ සඳහා AI Camera ස්ථාපිත කිරීම

x. පාසල් ළමුන් ප්‍රවාහන රථ සඳහා මූල්‍ය පහසුකම් ලබාදීම සඳහා වන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම

xi. පොදු ප්‍රවාහන මාධ්‍ය භාවිතා කරන මගීන් හට මාර්ග රිය අනතුරකදී රුපියල් මිලියනයක උපරිම වන්දි මුදලක් ලබාදීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම

2.1.7 සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්) සමාගම

1957 අංක 48 දරන මෝටර් රථ ප්‍රවාහන පනතේ 25 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව එවක සිටි ප්‍රවාහන අමාත්‍යවරයා විසින් 1970.11.20 දින අංක 14933 දරන රජයේ ගැසට් පත්‍රයේ නියෝගයක් ප්‍රකාශයට පත් කිරීම මඟින් ඔටෝමොබයිල් පුද්ගලික (ලංකා) ලිමිටඩ් නමට තිබූ අක්කර 24 ක වපසරියකින් යුත් ඉඩමක් ලංකා ගමනාගමන මණ්ඩලයේ භාවිතය සඳහා පවරා දෙමින් මෙම ආයතනය ආරම්භ කිරීමට මූලික පියවර ගෙන ඇත.

එහිදී ඒකල මධ්‍යම වැඩපළ 1974.02.15 වන දින ආරම්භ කරන ලදී. ආරම්භයේ සිටම මෙම ආයතනය අලුත් බස්රථ බඳ අළුත්වැඩියාව මෙන්ම පරණ බස්රථ බඳ අළුත්වැඩියාවද මූලික වශයෙන් සිදුකරනු ලබයි. මෙම වැඩපළ අංශ දෙකකින් සමන්විත වන අතර, එක් වැඩපලක් මධ්‍යම වැඩපළ ලෙස ක්‍රියාත්මක වූ අතර, ඒකල වැඩපළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් විය.

ජනතාකරණ වැඩපිළිවෙල යටතේ 1993.06.14 දින මෙම වැඩපළවල් දෙකම ඒකාබද්ධ කර ඒකල ඉංජිනේරු කටයුතු පිලිබඳ පුද්ගලික සමාගමක් ලෙස පෞද්ගලීකරණය කරන ලදී.

පසුව මෙම පුද්ගලික සමාගම චීනයෙන් ආනයනය කරන ලද ශ්‍රේට්වෝල් බස් 400 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. 2001 වර්ෂයේ සිට ප්‍රවාහන විෂයභාර අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන රජයට අනුබද්ධ සමාගමක් ලෙස ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම ලෙස එය කළමනාකරණය කරන ලදී. තවද ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීමේ අරමුණින් පුහුණු තරුණ තරුණියන් සම්බන්ධ කරගනිමින් රටට අවශ්‍ය බස්රථ බඳ තැනීමට මෙම ආයතනය කටයුතු කරයි.

2.1.7.1 ප්‍රධාන කාර්යභාරය හා වගකීම්

මෙම ආයතනයේ මූලික පරමාර්ථය වන්නේ ශ්‍රී ලංගම බස්රථ අඩු වියදමකින් උසස් ප්‍රමිතියක් යටතේ අලුත්වැඩියා කොට පොදුජන සේවයට එක් කිරීමයි. එහිදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් අබලන් හා අනතුරු වලට ලක් වූ බස් රථවල බඳ අලුත්වැඩියාව සිදු කරනු ලබයි.

ඒ අනුව එක් අංශයක ශ්‍රී ලංගම බස්රථවල බඳ අලුත්වැඩියාවන් සිදු කරන අතර, නවීන යන්ත්‍ර උපකරණ වලින් සමන්විත වාහන සේවා මධස්ථානය අනෙක් අංශයේ ක්‍රියාත්මක වේ .

පෙර වර්ෂවල මසකට බස් බොඩි 08 – 10 ත් අතර ප්‍රමාණයක් අලුත්වැඩියා වූ අතර 2025 වර්ෂයේ බස්රථ 10 – 14 ත් අතර ප්‍රමාණයකින් අලුත්වැඩියා කර ඇත.

2.1.7.2 ආදායම් - වියදම් විස්තර (2025.12.31 දිනට)

වියදම් වර්ගය	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි)	ප්‍රතිශතය (%)
ප්‍රාග්ධන	7.0	6.4	91
පුනරාවර්තන	314.0	291.3	92
එකතුව	**321.0**	**297.7**	**92**

ආදායම් වර්ගය	ඉලක්කගත ආදායම් (රු.මි.)	සත්‍ය අදායම් උත්පාදනය (රු.මි.)	සත්‍ය අදායම් උත්පාදනය (%)
බස් රථ අළුත්වැඩියාව	324.0	287.6	88
එකතුව	**324.0**	**287.6**	**88**

පුනරාවර්තන වියදම් වර්ගය	දරණ ලද වියදම (රු.මි.)
සේවක වැටුප් හා වේතන	154.53
අමතර කොටස්	130.01
වෙනත් වියදම්	6.94
එකතුව	**291.48**

අලුත්වැඩියා කරන ලද බස් රථ ප්‍රමාණය	125
ශ්‍රී ලංගම වෙතින් ලැබුණු මුදල (රු.මි)	287.63
නිෂ්පාදනය සඳහා වියදම (රු.මි)	250.12
ලාභය (රු.මි)	37.52

2.1.7.3 ආයතනයේ සමස්ත ප්‍රගතිය (2025.12.31 දිනට)

මූල්‍ය ප්‍රතිපාදන (රු.මි.)		මූල්‍ය ප්‍රගතිය (%)	ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති			භෞතික ප්‍රගතිය (%)
භාණ්ඩාගාර	ස්වයං		ඉලක්කය	නිම කරන ලද	ක්‍රියාත්මක වෙමින් පවතින	
-	7.0	91	01	-	01	90

2.1.7.4 සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතිය (2025.12.31 දිනට)

වැඩසටහන/ ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම	ඇස්තමේන්තු වටිනාකම (රු.මි.)	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය		
			ඉලක්කය (රු.මි.)	වියදම (රු.මි.)	%	ඉලක්කය (ඒකක)	සාරාංශගත ප්‍රගතිය	%
ගොඩනැගිලි අළුත්වැඩියාව	7.0	7.0	7.0	6.4	91	100%	නිම කර ඇත	90

2.1.7.5 ආයතනයේ ප්‍රගතිය පෙන්නුම් කරන වෙනත් තොරතුරු

මූල්‍ය ප්‍රගතිය (2019 – 2025 දක්වා)

වර්ෂය	ආදායම (රු.මි.)	වියදම (රු.මි.)
2019	193.70	169.80
2020	131.70	146.00
2021	142.00	153.00
2022	256.52	248.22
2023	214.65	186.64
2024	229.00	199.74
2025	287.63	250.11

2.1.7.6 අභියෝග හා ගැටළු

- ආයතනය පිහිටි ඉඩම සහ ගොඩනැගිලි ශ්‍රී ලංගමයට අයත් බැවින් ගොඩනැගිලි ඉදිකිරීමේදී හා සේවා පුළුල් කිරීමේ ගැටළු පැන නැගීම
- අනුමත බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක නොවීම නිසා සමාගමේ පුහුණු ශ්‍රමිකයන් හිඟවීම
- අලුත්වැඩියාව සඳහා ශ්‍රී ලංගම බස්රථ ලක්දිව ඉංජිනේරු සමාගම වෙත ලබාදීම සීමාකිරීම
- ඇස්තමේන්තුගත මුදලට අලුත්වැඩියා කිරීමේදී ලබාදෙන මුදල අඩුකිරීම සහ ගෙවීම ප්‍රමාද වීම
- කාරක ප්‍රාග්ධනයක් නොමැතිවීම හා බස්රථ අමතර කොටස් මිල සීග්‍රයෙන් ඉහළයාම

2.1.7.7 ඉදිරි ඉලක්ක

- ශ්‍රී ලංගම බස්රථ වල බඳ සකස් කිරීමට අමතරව බස්රථ කොටස් එකතු කොට නව බස්රථයක් සකස් කිරීමේ වැඩපිළිවෙලක් ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතී
- ශ්‍රී ලංගම සහ පුද්ගලික මගී ප්‍රවාහන බස්රථ අලුත්වැඩියාව වර්ධනය කිරීම

- බස්රථ වලට අමතරව වෙනත් අමතර ආදායම් උත්පාදන ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කර අදායම වර්ධනය කර ගැනීම
- මෝටර් රථ ප්‍රවාහන ක්ෂේත්‍රයේ වාණිජ කටයුතු සඳහා අලෙවි නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම
- සේවක මණ්ඩල අභිප්‍රේණය සඳහා වැටුප් ඉහළ නැංවීම හා දිරි දීමනා ක්‍රමයක් හඳුන්වා දීම
- සේවක සුබසාධනය සඳහා ප්‍රවාහන, රක්ෂණ හා වෛද්‍ය වැනි පහසුකම් ලබාදීමට කටයුතු කිරීම
- 100KVA විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීම සහ එමඟින් ආයතනයට අවශ්‍ය විදුලිය උත්පාදනය
- ආයතනයේ කර්මාන්ත ශාලාව සඳහා තහඩු නැමීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම

2.1.8 මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් මහකොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී. එය මහකොළඹ නාගරික ප්‍රවාහන පද්ධතිය සඳහා දීර්ඝ කාලීන විසඳුමක් ලෙස සහ ප්‍රවාහන පද්ධතිය ආරක්ෂිත, සුවපහසු සහ විශ්වාසදායී සේවාවක් බවට පත් කිරීමේ අරමුණු ඇතිව ක්‍රියාත්මක වේ.

එහිදී පොදු ප්‍රවාහනය භාවිතය ප්‍රවර්ධනය කිරීම, රථ වාහන තදබදය අවම කිරීම, රථ වාහන මගින් වන පරිසර දූෂණය අවම කිරීම සහ ප්‍රවාහනය ආශ්‍රිත අනතුරු අවම කිරීම සහ මගීන්ගේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම වැනි නාගරික ප්‍රවාහන ප්‍රතිපත්ති අරමුණු කරගෙන ක්‍රියාත්මක වේ.

2.1.8.1 අදායම් - වියදම් විස්තරය (2025.12.31 දිනට)

වියදම් වර්ගය	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය(රු.මි.)	ප්‍රතිශතය (%)
ප්‍රාග්ධන	289.00	289.00	100.00
පුනරාවර්තන	246.00	231.09	93.94
එකතුව	**535.00**	**520.09**	**97.21**

ආදායම් වර්ගය	ඉලක්කගත ආදායම්(රු.මි.)	සත්‍ය ආදායම් උත්පාදනය(රු.මි.)	සත්‍ය ආදායම් උත්පාදනය(%)
මාකුඹුර හා කඩවත Park & Ride සේවාව සැපයීමේ ආදායම	20.00	17.00	85.00
සනීපාරක්ෂක සේවා සැපයීමේ ආදායම	6.00	4.50	75.00
බිම් කුලිය හා සේවා සැපයීමේ ආදායම	30.00	13.00	43.34
එකතුව	**56.00**	**34.50**	**61.61**

මගී ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා මහකොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය විසින් 2025 වසරේ විවිධ ව්‍යාපෘති, වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන

විධිමත් වූ පොදු ප්‍රවාහන සේවාවක් සැලසීම සඳහා බස් රථ රියදුරු සහ කොන්දොස්තර මහතුන්ගේ සේවාවන් සහ ඔවුන්ගේ කාර්යභාරය විශේෂයෙන් වැදගත් වේ. එම නිසා පොදු ප්‍රවාහන සේවාවේ ගුණාත්මකභාවය ඉහල නැංවීම සඳහා සහ මගීන්ට වෘත්තීයමය වශයෙන් සේවා සැපයීම, ආරක්ෂිත, සුවපහසු පරිසරයක් ඇති කිරීම සඳහා සාර්ථක වැඩපිළිවෙලක් ලෙස බස්රථ රියදුරු සහ කොන්දොස්තර මහතුන් දැනුවත් කිරීමේ වැඩසටහන සංවිධානය කරනු ලැබිණි. එහිදී ඔවුන්ගේ පුහුණුව සඳහා සහතික පත් ප්‍රදානය කිරීමද සිදු කරන ලදී.

අන්තර්කරණ සහය මධ්‍යස්ථානය (උපකාරක කවුන්ටරය) විවෘත කිරීම

පොදු ප්‍රවාහන සේවාව වෙත, සියලුම මගීන්ට ප්‍රවේශ වීමේ හැකියාව සහ පොදු ප්‍රවාහනය තුළ විශේෂයෙන් කාන්තා ආරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය කේන්ද්‍ර කර

ගනිමින් ශ්‍රව්‍යාබාධිත මගී ජනතාව වෙනුවෙන් හදිසි දැනුම්දීමේ අංක, මගීන්ට සන්නිවේදන පහසුව, තොරතුරු දැනගැනීමේ පහසුව වැනි සේවාවන්ගෙන් සමන්විත වන අන්තර්කරණ සහය මධ්‍යස්ථානය (Inclusive Support Centre) නමින් උපකාරක කවුන්ටරයක් (Helpdesk) විවෘත කරන ලදී.

විද්‍යුත් සංචලනය ප්‍රවර්ධනය කිරීම

හරිත ප්‍රවාහනය (Green Transport) යන සංකල්පය පාදක කරගනිමින් ඉන්ධන දහනය අවම කිරීම, පරිසරයට එකතුවන කාබන් ඩයොක්සයිඩ් වායු ප්‍රමාණය අවම කිරීම තුලින් පරිසර දූෂණය වැළැක්වීම සඳහා ත්‍රී රෝද රථ සඳහා E-Battery හඳුන්වා දීමට සමගාමීව මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ ත්‍රී රෝද රථ ඉලෙක්ට්‍රික් ත්‍රී රෝද රථ බවට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය මත සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කර ඇත.

සුඛෝපභෝගී මගී ප්‍රවාහන බස් රථ වල තත්ත්වය පරීක්ෂාව කිරීම

පොදු ප්‍රවාහන සේවාව භාවිතා කරන මගීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් සහ මගීන්ට විශ්වසනීය සේවාවක් ලබා දීමේ අරමුණින් ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය "ක්ලීන් ශ්‍රී ලංකා" ව්‍යාපෘතිය යටතේ මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය කේන්ද්‍ර කර ගනිමින් අධිවේගී මාර්ගයේ ගමන් ගන්නා සුඛෝපභෝගී මගී ප්‍රවාහන බස් රථ වල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණ ස්ථානයක් විවෘත කර මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.

පාර්සල් සහ හෙල්මට් කවුන්ටර ස්ථාපිත කිරීම

මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හරහා ගමන් කරන මගීන් සඳහා තම ගමන් මලු හෝ භාණ්ඩ තබා යා හැකි පරිදි පාර්සල් කවුන්ටර පහසුකම 2025 ඔක්තෝබර් 10 වන දින ආරම්භ කරන ලදී. එහිදී මගීන්ට, සුරක්ෂිතව ලොකර් තුළ භාණ්ඩ තබා යාමේ පහසුකම, විවිධ ප්‍රමාණයන්හි ලොකර්, පැය 24 පුරාවටම ආරක්ෂාව, තොරතුරු දැනගැනීමේ QR කේතය, භාණ්ඩ භාර දීම, නැවත ලබා ගැනීම සහ ගෙවීම් සඳහා සේවා සහය යන පහසුකම් බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය තුළ දී ලබා ගැනීමේ හැකියාව පවතී.

තවද, ඉදිරියේදී ඩිජිටල් ගෙවීමේ ක්‍රමවේදයන් මගින් අදාල තොරතුරු සනාථ කර ගැනීමේ පහසුකම්, මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ලොකර් වෙන් කර ගැනීමේ පහසුකම් මෙන් ම ස්වයංක්‍රිය ලොකර් පහසුකම් වැනි සේවා වැඩි දියුණු කිරීමේ හැකියාව ද පවතී.

එමෙන්ම Park & Ride සේවාව භාවිතා කරන යතුරු පැදිකරුවන් සඳහා හෙල්මට් කවුන්ටරයක් ද ස්ථාපිත කරන ලදී. පොදු ප්‍රවාහන මාධ්‍යය වෙත පිවිසෙන ඔවුන්ට ආරක්ෂිතව තම හිස් වැසුම් රඳවා තබා යාමට හැකි පහසුකම් හෙල්මට් කවුන්ටරය තුළ ඇතුළත්ය.

Park & Ride පහසුකම

කොළඹ නගරය තුළ ප්‍රවාහන සේවාවන් විධිමත් කිරීමේ ප්‍රවාහන අංගයක් වන Park & Ride සේවාව මාකුඹුර සහ කඩවත බහුවිධ ප්‍රවාහන

මධ්‍යස්ථානයන්හිදී ක්‍රියාත්මක කෙරෙයි. එහිදී මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ දිනකට 800 කට වැඩි වාහන සංඛ්‍යාවක් සේවා ලබා ගන්නා අතර කඩවත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ දිනකට 300 කට වැඩි වාහන සංඛ්‍යාවක් සේවා ලබා ගනී.

එමගින් මගීන්ට වාහන තදබදය අවම කිරීම තුලින් කාලය ඉතිරි වීම, බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයට ඇතුළු වීමේ පහසුකම, දැරිය හැකි වාහන නැවැත්වීමේ ගාස්තු නිසා පිරිවැය ඉතිරි කිරීම, ආරක්ෂාව, පෞද්ගලික රථවාහන භාවිතය සීමා කිරීම තුලින් මුදාහරින කාබන් විමෝචනය අවම වීම හරහා සිදු වන පරිසර දායකත්වය වැනි ප්‍රතිඵල ඇති වේ.

කසල කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මගීන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව වඩාත් තහවුරු කිරීම සහ පරිසර තත්ත්වයන් ආරක්ෂා කිරීම මගින් තිරසාර සංවර්ධන කාර්යයන් ලහා කර ගැනීම සඳහා Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය තුළ කසල කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම (මඟීන් සහ කාර්යය මණ්ඩල සඳහා)

මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය වෙත පිවිසෙන මගීන්ගේ සහ අවට ප්‍රදේශවාසීන්, ආයතන නිලධාරීන්, සහ මගීන් ද ඇතුළුව සියලු දෙනාගේ ආරක්ෂාව වෙනුවෙන් සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025.09.26 දින ක්‍රියාත්මක කරනු ලැබිණි.

ගිනි නිවීමේ පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම (Fire Training II)

මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය තුළ දෛනිකව සිදු වන මෙහෙයුම් කටයුතු අතරතුර ගිනි ගැනීමේ අනතුරු ඇතිවීමේ අවදානම අවම කිරීම සහ එවැනි හදිසි අවස්ථාවලදී නිවැරදිව, ඉක්මනින් සහ ආරක්ෂිත ලෙස ක්‍රියා කිරීමට අත්‍යවශ්‍ය පුහුණුලත් නිලධාරී පිරිසක් ඇති කිරීමට ගිනි නිවීමේ හා ආපදා කළමනාකරණ ඒකකය සමග 2025/03/04 දින සහ 2025/11/19 දින විශේෂ පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

එමඟින් ගිනි අනතුරු වල හේතු, ආරම්භක අවධියේදී ගිනි නවතා ගැනීමේ ක්‍රම, ගිනි නිවාරණ උපකරණ නිවැරදි ලෙස භාවිතා කිරීම, හදිසි අවස්ථාවකදී ඉවත් වීමේ ක්‍රියාමාර්ග (Evacuation Procedures) සහ කාර්ය මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු වගකීම් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙනු ලැබිණි.

සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම (HIV Test Program)

සමාජයේ ක්‍රමයෙන් තරුණ තරුණියන් පැතිර යන HIV ආසාදනයන් හේතුවෙන්, විශේෂයෙන් HIV පිලිබඳ දැනුවත්භාවය වැඩි කිරීම, ආරම්භක අවධියේදී හඳුනාගැනීම සහ අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබා ගැනීමට මෙම වැඩසටහන මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක කරනු ලැබිණි.

සුනිත්‍ය බල ශක්තිය ප්‍රවර්ධනය

පරිසර හිතකාමී මධ්‍යස්ථානයක් බවට මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය පත් කිරීම සඳහා, එහි විදුලි බලය උත්පාදනය වෙනුවෙන් සූර්ය පැනල් වැනි ශක්ති මූලාශ්‍ර භාවිතා කර ඇත. මෙමඟින් විදුලි පිරිවැය අවම කරමින්, කාබන් වායු නිකුත් කිරීම අඩු කර පරිසර සංරක්ෂණයට දායක වන අතර, එමගින් ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ තිරසාරත්වය ප්‍රවර්ධනය කිරීම සිදු කරයි. දෛනිකව 1 MWh ප්‍රමාණයක් ඒ හරහා නිපදවනු ලබන අතර 2019 වසර සිට 2025 අවසාන වන තෙක් සම්පූර්ණ වශයෙන් 1.4 GWh ක් විදුලිය නිෂ්පාදනය කර ඇති අතර එමගින් කිලෝග්‍රෑම් 559,000 ක කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණයක් පරිසරයට එකතුවීම වලක්වා තිබේ.

2.1.9 කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය

2.1.9.1 දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා පොදු ප්‍රවාහනය ශක්තිමත් කර ප්‍රවලිත කරමින් තිරසර ආර්ථික සංවර්ධනයට දායක වීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියට ආසියානු සංවර්ධන බැංකුව (ණය අංක 3806 SRI) මඟින් අරමුදල් සපයන අතර, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම ඇ.ඩො.මි. 192 ක් වේ. පසුව ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ රජයේ හදිසි මිල දී ගැනීම් වෙනුවෙන් ණය මුදලින් ඇ.ඩො.මි. 35 ක් වෙන් කරන ලද අතර, ඒ අනුව ශ්‍රී ලංකා දුම්රිය සේවයේ හා ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ එකඟතාවය මත ඇ.ඩො.මි. 125ක් සඳහා ව්‍යාපෘති කාර්යයන් සංශෝධනය කරන ලදි. ව්‍යාපෘතියේ කටයුතු 2019 පෙබරවාරි මස දී ආරම්භ විය. ණය ගිවිසුම 2019 අගෝස්තු මාසයේ දී අත්සන් කරන ලද අතර, 2020.08.20 දින ආරම්භ කළ ව්‍යාපෘතිය 2025.06.30 අවසන් කිරීමට නියමිතව තිබූ අතර නිම කිරීමට නියමිතව තිබූ කාර්යයන් කිහිපයක් අවසන් වී නොතිබූ බැවින් ඒවා නිම කිරීම සඳහාත් ඉතිරිව තිබූ අරමුදල් භාවිතා කර කොළඹ කොටුව දුම්රිය ස්ථානය සංවර්ධනය කිරීම සඳහාත් අවශ්‍ය මාස 24 ක කාල දිගුවක් ලබා දෙමින් ණය ගිවිසුමේ කාලය 2027 ජූනි මස 30 දක්වා දීර්ඝ කර ඇත. ණය මුදල ආපසු ගෙවීම ආරම්භ කිරීම සඳහා ලබා දී ඇති සහන කාලය වසර 08 ක් වන අතර, ගෙවීම් කාලය 2048 වසරෙන් අවසන් වේ.

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය සහ ප්‍රවාහන ව්‍යාපෘති සැලසුම් කිරීමේ පහසුකම යන ව්‍යාපෘති සැලසුම් කිරීමේ තාක්ෂණික සහාය යටතේ යෝජිත සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම කල් ගත වන ක්‍රියාවලියක් බැවින්, පැවති දුම්රිය පද්ධතියේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම සඳහා කෙටි කාලීනව විසඳිය හැකි මෙන්ම ඉදිරියේ දී ප්‍රධාන සංවර්ධන සැලසුම්වලට දායකත්වය ලැබෙන පරිදි දුම්රිය මෙහෙයුම්වල දී බලපා තිබූ විශේෂිත ගැටළු සඳහා පිළියම් යෙදීමට දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.

2.1.9.1.1 ප්‍රධාන කාර්යභාරය හා වගකීම

මෙම ව්‍යාපෘතිය යටතේ දුම්රිය මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය, ආරක්ෂාව සහ තිරසරභාවය වැඩිදියුණු කිරීමට ප්‍රධාන නිමැවුම් 05 ක් ලබා

කර ගැනීම සඳහා කෙටි කාලීනව ක්‍රියාත්මක කොට අවසන් කළ හැකි පහත ව්‍යාපෘති ඉටු කරයි.

නිමැවුම 1 - දුම්රිය මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිකරලීම :

- දීප ව්‍යාප්ත දුම්රිය විදුලි සංදේශ පද්ධතිය දුම්රිය සේවය සඳහා ප්‍රසම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
- නවීකරණය කරන ලද ටිකට්පත්/ සුහුරු ප්‍රවේශපත් නිකුත් කිරීමේ සහ ආසන වෙන්කිරීමේ පද්ධතිය ප්‍රසම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
- මෙහෙයුම් මූලස්ථානය සහ දුම්රිය පාලන මධ්‍යස්ථානය ඉදිකිරීම

නිමැවුම 2 - දුම්රිය නඩත්තු ධාරිතාව වැඩි කිරීම :

- Sleeper Tamping යන්ත්‍රය ප්‍රසම්පාදනය
- Universal Armature Machine යන්ත්‍රය ප්‍රසම්පාදනය
- Computer Numerical Control Underfloor Wheel Lathe යන්ත්‍රය ප්‍රසම්පාදනය
- Crane and Backhoe Motor Car යන්ත්‍රය ප්‍රසම්පාදනය
- Railroad Loader යන්ත්‍රය ප්‍රසම්පාදනය
- රත්මලාන දුම්රිය DMU කර්මාන්ත ශාලාව සැලසුම් කිරීම සහ ඉදිකිරීම
- Ballast Profilling Machine යන්ත්‍රය ප්‍රසම්පාදනය
- Hydraulic Railway Crane යන්ත්‍රය ප්‍රසම්පාදනය
- දුම්රිය එන්ජින් හා මාර්ග අළුත්වැඩියාව සඳහා අමතර කොටස් මිළදී ගැනීම
- දුම්රිය පිලි 10,000ක් මිළදී ගැනීම

නිමැවුම 3 - දුම්රිය ධාවන ආරක්ෂාව, මගී/ මහජන ආරක්ෂාව වැඩි කිරීම :

- දුම්රිය මාර්ගය දෙපස අනාරක්ෂිතව පදිංචි වී සිටින පවුල් නැවත පදිංචි කිරීම සඳහා වූ නිවාස යෝජනා ක්‍රමය (මාලපල්ල) ඉදිකිරීම
- දුම්රිය ස්ථාන සඳහා මගී ආසන පහසුකම් සැපයීම
- කොළඹ කොටුව, මරදාන, අනුරාධපුර හා මහනුවර දුම්රිය ස්ථානයන්හි මගී පහසුකම් සංවර්ධනය කිරීම
- කොළඹ කොටුව දුම්රිය ස්ථානය සංවර්ධනය කිරීම

නිමැවුම 4 - දුම්රිය කාර්ය මණ්ඩලවල පුහුණුව සඳහා පුහුණු මධ්‍යස්ථානයේ (රත්මලාන) පහසුකම් වැඩිකරලීම

- දුම්රිය පුහුණු මධ්‍යස්ථානය සඳහා විදුලි උත්පාදන යන්ත්‍රයක් සැපයීම
- දුම්රිය එන්ජින් සමායවිකය ප්‍රසම්පාදනය (Train Simulator)

නිමැවුම 5 - ඉහත කාර්යයන් සහ දුම්රිය සංවර්ධනය ඉටු කිරීම සඳහා අවශ්‍ය සම්පත් සහ උපදේශක සේවා ලබාගැනීම:

- මහනුවර තදාසන්න දුම්රිය මාර්ගය සඳහා වූ විස්තරාත්මක සැලසුම් සකස් කිරීමේ උපදේශන සේවාව ලබා ගැනීම
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වූ උපදේශන සේවාව ලබාගැනීම

2.1.9.1.2 ව්‍යාපෘතියේ ප්‍රගතිය (2025.12.31 දිනට)

ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම් 32 ක් හඳුනාගන්නා ලද අතර ක්‍රියාකාරකම් 7ක් පමණක් 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ඉතිරි වී තිබුනි.

වැඩසටහන / ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම්	මුළු ඇස්තමේන්තු වටිනාකම (රු.මි.)	ආරම්භක දිනය	අවසන් කිරීමට නියමිත දිනය	2025 වර්ෂයේ වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (2025 වර්ෂය සඳහා)			භෞතික ප්‍රගතිය (2025 වර්ෂය සඳහා)			සමුච්චිත ප්‍රගතිය %	
					ඉලක්කය (රු.මි.)	වියදම (රු.මි.)	%	ඉලක්කය (ඒකක)	සාර්ථකත්වය	%	භෞතික	මූල්‍ය
දුම්රිය කාර්යක්ෂමතාවය ඉහල නැංවීමේ ව්‍යාපෘතිය	33,878.40	2019.09.06	2027.06.30	11,488.43	10,150.00	5,628.10	55	ක්‍රියාකාරකම් 7 *	ක්‍රියාකාරකම් 3 **	60	87	69

*** 2025 වර්ෂයේ ඉලක්කගත ක්‍රියාකාරකම්**

1. නවීකරණය කරන ලද ටිකට්පත්/ සුහුරු ප්‍රවේශ්‍රපත්‍ර නිකුත් කිරීමේ සහ ආසන වෙන්කිරීමේ පද්ධතිය ප්‍රසම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
2. Computer Numerical Control Underfloor Wheel Lathe යන්ත්‍රය ප්‍රසම්පාදනය
3. රත්මලාන දුම්රිය DMU කර්මාන්ත ශාලාව සැලසුම් කිරීම සහ ඉදිකිරීම
4. දුම්රිය එන්ජින් හා මාර්ග අළුත්වැඩියාව සඳහා අමතර කොටස් මිළදී ගැනීම
5. දුම්රිය ස්ථාන සඳහා මගී ආසන පහසුකම් සැපයීම
6. කොළඹ කොටුව, මරදාන, අනුරාධපුර හා මහනුවර දුම්රිය ස්ථානයන්හි මගී පහසුකම් සංවර්ධනය කිරීම
7. දුම්රිය එන්ජින් සමායවිකය ප්‍රසම්පාදනය (Train Simulator)

****2025 වර්ෂයේ නිම කර ඇති ක්‍රියාකාරකම්**

1. දුම්රිය ස්ථාන සඳහා මගී ආසන පහසුකම් සැපයීම
2. කොළඹ කොටුව, මරදාන, අනුරාධපුර හා මහනුවර දුම්රිය ස්ථානයන්හි මගී පහසුකම් සංවර්ධනය කිරීම
3. දුම්රිය එන්ජින් සමායවිකය ප්‍රසම්පාදනය (Train Simulator)

2.1.9.1.3 අභියෝග හා ගැටළු

- දුම්රිය සුහුරු ප්‍රවේශපත්‍ර හා ආසන වෙන්කිරීම් පද්ධතිය ලබාගැනීමේ කොන්ත්‍රාත්තුව සඳහා වන කොන්ත්‍රාත් ව්‍යතිරේකය අත්සන් කිරීම 2025.12.09 වන දින සිදු කරන ලද බැවින් වර්ෂය තුළ අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය ලගා කර ගැනීමට

නොහැකි වී ඇත. ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 62% වන අතර කොන්ත්‍රාත් ව්‍යතිරේකය අත්සන් කිරීමෙන් පසු පිළියෙල කරන ලද නව ක්‍රියාකාරකම් සැලැස්ම අනුව, 2026 වර්ෂයේ ජූනි මස 26 දින වන විට කොන්ත්‍රාත්තුවෙහි කටයුතු අවසන් කිරීමට අපේක්ෂිතය.

- ඩීසල් බලවේග කට්ටල අළුත්වැඩියා කිරීමේ නව කර්මාන්තශාලාව (DMU Workshop) ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් ප්‍රගතිය 60%ක් වන අතර 2026 වර්ෂයේ ජූලි 27 දින වන විට කටයුතු නිම කිරීමට අපේක්ෂිතය. තවද, 2025 වර්ෂය අවසන් වන විට අත්කර ගැනීමට අපේක්ෂිත කළ භෞතික හා මූල්‍ය ප්‍රගතිය අත් කර ගැනීමට නොහැකි විය. මේ සඳහා සියළු පාර්ශවයන් සමඟ සතිපතා ප්‍රගති රැස්වීම් පවත්වා ගැටළු විසඳීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කර කොන්ත්‍රාත්කරු වෙත නිශ්චිත ඉලක්ක ලබාදී ඇත.

2.1.9.1.4 අත් කරගත් විශේෂ ජයග්‍රහණ

- Railroad Loader යන්ත්‍රය මිළ දී ගැනීමෙන් පසුව භාවිතය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත
- Track Motor Car with 12 Nos. mini wagon යන්ත්‍රය මිළ දී ගැනීමෙන් පසුව භාවිතය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත
- Ballast Profiling Machine යන්ත්‍රය මිළ දී ගැනීමෙන් පසුව භාවිතය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත
- මාලපල්ල දුම්රිය ස්ථානය අසල මහල් නිවාස සංකීර්ණය ඉදිකිරීම.

නිවාස 120කින් යුතු මහල් නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නිම කර කැළණිවැලි දුම්රිය මාර්ගයේ නාවින්න සිට පාදුක්ක දුම්රිය ස්ථානය දක්වා වූ කොටසේ දුම්රිය රක්ෂිතයේ පදිංචි අනවසර පුද්ගලයින් 112ක් නැවත පදිංචි කිරීමේ කටයුතු අවසන් කර ඇත.

- දුම්රිය එන්ජින් ක්‍රමාකෘතියක් (Train Simulator) යන්ත්‍රය මිළ දී ගෙන ස්ථාපනය කිරීමෙන් පසු භාවිතය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.
- 50T ධාරිතා ජංගම හයිඩ්‍රොලික් දුම්රිය දොඹකරය මිළ දී ගැනීමෙන් පසුව භාවිතය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.
- කොළඹ කොටුව, මරදාන හා අනුරාධපුර දුම්රිය ස්ථානයන්හි මගී පහසුකම් සංවර්ධනය කර ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.
- කොළඹ දුම්රිය පාලන කාර්යාලය සහ දුම්රිය මෙහෙයුම් මූලස්ථානය ඉදිකිරීම

පවත්නා අවශ්‍යතා තරමේ ඉඩ කඩ නොමැති, වසර 50 ක් පමණ පැරණි, නව මෙහෙයුම් පද්ධතියක් ස්ථාපිත කිරීමට නුසුදුසු තත්ත්වයේ ඇති දැනට භාවිතා කරන පාලක මධ්‍යස්ථානය වෙනුවට නවීන දුම්රිය පාලක මධ්‍යස්ථානයක් සහ දුම්රිය මෙහෙයුම් මූලස්ථානයක් ඉදිකිරීම. මෙහි ඉදිකිරීම් කටයුතු නිම කර ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාර දීමට නියමිතව ඇත

2.1.9.1.5 ඉදිරි සැලසුම්

කොළඹ කොටුව සහ මරදාන දුම්රිය ස්ථාන වැඩි දියුණු කිරීම

මේ යටතේ මගී ජනතාවගේ ආරක්ෂාව හා සුව පහසුව වැඩි දියුණු කිරීම සඳහා කොළඹ කොටුව දුම්රිය ස්ථානය නවීකරණය සඳහා කටයුතු කෙරෙනු ඇත. මේ සඳහා ටෙන්ඩර් කැඳවා ඇගයීම් අවසන් කර ඇත.

2.1.9.2 කැළණිවැලි දුම්රිය මාර්ගයේ දුම්රිය ප්‍රවේශ අයිතිය තුළ පදිංචි අනවසර පවුල් නැවත පදිංචි කිරීම

කැළණිවැලි දුම්රිය මාර්ග රක්ෂිතය තුළ හා ප්‍රධාන දුම්රිය මාර්ගයේ පැරණි කැළණිය දුම්රිය පාලම ප්‍රතිස්ථාපනය කිරීමේදී බලපෑමට ලක්වන දුම්රිය රක්ෂිතය තුළ පිහිටි නිවාසවල, අනාරක්ෂිතව පදිංචිව සිටින පවුල් හා වෙනත් කටයුතු සඳහා දුම්රිය රක්ෂිතය භාවිතා කරන්නන් 1,553ක් පමණ, නාගරික සංවර්ධන අධිකාරියෙන් මිළදී ගන්නා නිවාස 938ක හා දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙන් කොට්ටාව මාලපල්ල ඉදිකරන ලද නිවාස ඒකක 116ක් ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු ව්‍යාපෘතිය යටතේ සිදු කෙරේ.

තවද, අනවසර පදිංචිකරුවන් ඉවත් කර නිදහස් කරගත් දුම්රිය රක්ෂිතයේ කඩා ඉවත්කර දමන ලද ඉදිකිරීම් වල කොටස් හා සුන්බුන් ඉවත්කර භූමිය පිළිසකර කිරීම සහ එම දුම්රිය රක්ෂිතය මහජනයා විසින් නැවත පරිහරණය කිරීමෙන් වළක්වා ගැනීම සඳහා දුම්රිය රක්ෂිතය භාවිතයට නොගන්නා ලෙස දන්වා භාෂාත්‍රයෙන්ම අවවාදාත්මක දැන්වීම් පුවරු සවිකිරීම අදාළ කටයුතු සිදු කිරීම සඳහා වැය වන මිළ ගණන් අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතය. මෙයට අමතරව දැනට නිදහස් කරගෙන ඇති දෙමටගොඩ සිට කිරුළපන දක්වා කොටසේ දුම්රිය රක්ෂිතය ආරක්ෂා කර ගැනීම සඳහා දුම්රිය සාමාන්‍යාධිකාරීතුමා දැනුවත් කර ඇත. ඉහත සියලුම නැවත පදිංචි කිරීමේ කටයුතු අමාත්‍ය මණ්ඩල අනුමැතීන්ට යටත්ව සිදු කර ඇත.

මහල් නිවාස සංකීර්ණය	අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇති නිවාස ඒකක ගණන	ලබා දී ඇති ඒකක ගණන	ලබා දීමට නියමිත නිවාස ඒකක ගණන
ලක්හිරු සෙවණ මාලිගාවත්ත B - මහල් නිවාසය	189	424	මෙම මහල් නිවාස ඒකක වල ප්‍රතිස්ථාපන කටයුතු අවසන් කර ඇත.
C - මහල් නිවාසය	190		
D - මහල් නිවාසය	45		
සියපත් සෙවණ දෙමටගොඩ -	30	30	
කොළොම්තොට සරසවි උයන කාලිංග මාවත -	240	240	
කොළඹගේ මාවත අදියර I	100	-	100
කොළඹගේ මාවත අදියර II	144	-	144
කොට්ටාව - මාලපල්ල (REIP)	116	110	-
එකතුව	**1058**	**804**	**244**

2.1.9.2.1 ව්‍යාපෘතියේ ප්‍රගතිය (2025.12.31 දිනට)

ලබාදුන් ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (2025.12.31 දිනට)		භෞතික ප්‍රගතිය (2025.12.31 දිනට)	
	%	රු.මි.	%	විස්තරය
286.57	80	236.82	77	• දෙමටගොඩ ලොකෝ මංසන්ධියේ සිට කිරුළපන දුම්රිය ස්ථානය දක්වා අනවසර පදිංචිකරුවන් 751 දෙනෙකු සඳහා වන්දි හා ප්‍රතිලාභ ලබා දී ඔවුන් මේ වන විට දුම්රිය රක්ෂිතයෙන් ඉවත් කර දුම්රිය රක්ෂිතය නිදහස් කරගෙන පිළිසකර කර ඇත • කිරුළපන දුම්රිය ස්ථානයේ සිට පැගිරිවත්ත දුම්රිය ස්ථානය දක්වා කොටසේ අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය කොළඹගේ මාවත අදියර II මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 144 හි ඉදිකිරීම් ප්‍රගතිය 96% ක් වන අතර ඉදිකිරීම් කටයුතු 2025 වසරේ ඔක්තෝම්බර් මස අවසන් කිරීමට නියමිත වුවද එය 2026 පෙබරවාරි දක්වා ගෙනයාමට සිදුවන බව දන්වා ඇත • පැගිරිවත්ත දුම්රිය ස්ථානයේ සිට නාවින්න දේවානන්ද මාර්ගය - දුම්රිය හරස් මාර්ගය දක්වා කොටසේ අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය නිවාස ඒකක, කොළඹගේ මාවත (අදියර I) මහල් නිවාස සංකීර්ණයෙන් ලබා ගැනීමට නියමිතය. එහි ඉදිකිරීමේ ප්‍රගතිය 39% කි. ඉදිකිරීම් ප්‍රමාද වීම හේතුවෙන් මෙම නිවාස, මහරගම නිවාස සංකීර්ණයෙන් ලබා ගැනීම සඳහා සාකච්ඡා කරමින් පවතී • නාවින්න දේවානන්ද මාර්ගය සිට පාදුක්ක දුම්රිය ස්ථානය දක්වා වූ කොටසේ නිවාස ඒකක 110යෙහි ප්‍රතිස්ථාපන කටයුතු අවසන් කර නේවාසික නොවන ඉදිකිරීම් 28ක් සඳහා තක්සේරුගත වටිනාකම ලබා දී දුම්රිය රක්ෂිතයෙන් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී

2.1.9.2.2 අභියෝග හා ගැටළු

කොළඹගේ මාවත (අදියර I) යටතේ ලබා ගැනීමට නියමිත නිවාස ඒකක 100, මීළඟ පිරිවැය ආවරණය කරගැනීමේ පදනම් මත සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව නව මිළ ගණන් යටතේ ලබා ගැනීම සඳහා වන අවබෝධතා ගිවිසුම් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ අත්සන් කළ යුතුව ඇත. ඉදිකිරීම් ප්‍රමාද වීම හේතුවෙන් මෙම නිවාස මහරගම නිවාස සංකීර්ණයෙන් ලබා ගැනීම සඳහා සාකච්ඡා කරමින් පවතී.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් කොළඹගේ මාවත (අදියර II) නිවාස ව්‍යාපෘතිය යටතේ ලබා දීමට නියමිතව තිබූ නිවාස ඒකක, අවබෝධතා ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය වෙත ලබා දීමට නියමිතව පැවතියේ 2024.03.24 වන දිනය. එහෙත් මහල් නිවාස සංකීර්ණයේ මළාපවහන පද්ධතියේ වැඩ කටයුතු නිම කර නියමිත දිනට ව්‍යාපෘතිය වෙත ලබා දීමට නොහැකි වූ බැවින් අවබෝධතා ගිවිසුම් 2026.03.30 දක්වා දීර්ඝ කිරීමට සිදු විය. එබැවින් 2025 වසර තුළ නැවත පදිංචි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් අපේක්ෂිත ප්‍රගතිය අත්පත් කර ගැනීමට නොහැකි විය.

2.1.9.2.3 ඉදිරි සැලසුම්

අවිස්සාවේල්ල සිට රත්නපුර දක්වා දුම්රිය මාර්ගය දීර්ඝ කිරීම සඳහා වන ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක සැලසුම් සකස් කිරීම.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා

ලේකම්

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

Senior Professor K. Kapila C. K. Perera
Secretary
Ministry of Transport, Highways and Urban Development
7th Floor, Sethsiripaya (Stage II)
Battaramulla

03 පරිච්ඡේදය

සමස්ත මූල්‍ය කාර්යසාධනය

03 පරිච්ඡේදය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය
3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය
3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

මෙම ප්‍රකාශනවලට අදාල තොරතුරු මහාමාර්ග අංශය විසින් පිළියෙල කරනු ලබයි.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. '000'

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002-01-01-00	ගෙවල් කුලී	230	230	80	34.78 %
2002-02-99-00	පොළි	1,250	1,250	1,170	93.60%
2003-0 -99.00	වෙනත්	2,000	30,000	40,190	133.96%
2006-02-01-00	ප්‍රාග්ධන විකුණුම් (වාහන)	-	104,540	104,900	100.34%
2006-02-02-02	ප්‍රාග්ධන විකුණුම් (වාහන)	200	200	440	220.00%

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. '000'

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තක්‍ෂ වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	16,099,000.00	17,671,166.26	17,402,161.55	98.48 %
ප්‍රාග්ධන	19,548,000.00	22,251,500.00	13,007,521.40	58.46%

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. '000'

අංශය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
001	ජනාධිපති ලේකම් කාර්යාලය	මධ්‍යම. බස්. නැ.	50,000.00	120,000.00	119,675.86	99.73%
		ආබාධිත පුද්ගලයින්ට පහසුකම් සහිත බස් 10 මිලදී ගැනීම	340,000.00	340,000.00	340,000.00	100%
020	මැතිවරණ කොමිශන් සභාව	මැතිවරණ ගෙවීම් ණය අයකිරීම්	476.06	476.06	476.06	100%
253	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම	129.04	129.04	129.04	100%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.'000'

වත්කම් කේතය	කේත විස්තරය	**2025.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2025.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණ යට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	21,814,028.80	21,814,028.80		
9152	යන්ත්‍රෝපකරණ	2,584,828.78	2,584,828.78		
9153	ඉඩම්	2,888,951.13	2,888,951.13		
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	කෙරීගෙන යන වැඩ	836,378.48	836,378.48		
9180	බදු දෙන ලද වත්කම්	-	-		

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව **

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව මහාමාර්ග අංශය විසින් ඉදිරිපත් කරනු ලබයි.

04 පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

04 පරිච්ඡේදය
කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100 - 90%	89- 75%	74 - 50%	49 - 0%
දුම්රිය ප්‍රවාහනය				
➢ මගී සංඛ්‍යාව (මිලියන)		✓		
➢ මගී කි.මී. (මිලියන)		✓		
➢ භාණ්ඩ ටොන් (මිලියන)			✓	
➢ භාණ්ඩ ටොන් කි.මී. (මිලියන)			✓	
බස් රථ ප්‍රවාහනය				
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය				
➢ ධාවනයට ලබා දුන් බස් රථ ප්‍රමාණය	✓			
➢ ධාවනය කරන ලද බස් රථ ප්‍රමාණය	✓			
➢ ධාවනය කරන ලද කිලෝමීටර් ප්‍රමාණය			✓	
➢ කිලෝමීටරයට මාර්ග ලේඛණ ආදායම		✓		
ජාතික ගමනාගමන කොමිෂන් සභාව				
➢ ක්‍රියාත්මක කරන ලද සිසුසැරිය බස් රථ සේවා සංඛ්‍යාව		✓		
➢ ක්‍රියාත්මක කරන ලද නිසිසැරිය බස් රථ සේවා සංඛ්‍යාව	✓			
➢ ක්‍රියාත්මක කරන ලද ගැමිසැරිය බස් රථ සේවා සංඛ්‍යාව				✓
➢ බස් පර්යන්තය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම	✓			
➢ රථවාහන ඉල්ලුම සහ සේවා තත්ත්ව සමීක්ෂණ	✓			
➢ පොදු බස් සේවාව සඳහා ආයතනික ප්‍රතිසංස්කරණ සංවර්ධනය කිරීම				✓
➢ බස් රථ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම	✓			
➢ කාලසටහන් සහ සේවා අධීක්ෂණය			✓	
➢ බස්රථ ගාස්තු සකස් කිරීම			✓	
➢ අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ පද්ධතිය			✓	
➢ ජී.පී.එස් උපකරණ සහ පාලන කාමරයේ නඩත්තු පිරිවැය	✓			
➢ රෙගුලාසි සකස් කිරීම			✓	
➢ දුරගමන් සේවා සංඥා පුවරු සවිකිරීම	✓			

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100 - 90%	89- 75%	74 - 50%	49 - 0%
➢ දුරගමන් සේවා විවේක ස්ථාන		✓		
➢ පාරිභෝගික සේවා				✓
➢ උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම				✓
➢ වාර්ෂික ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන සකස් කිරීම	✓			
➢ පාර්ශවකරුවන් සඳහා ප්‍රවාහන ආශ්‍රිත දැනුවත් කිරීමේ වැඩසටහන්	✓			
➢ නාගරික ප්‍රවාහන සැලසුම්				✓
➢ අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ පද්ධතිය			✓	
➢ පාරිභෝගික සේවා ඒකකය	✓			
➢ ජාතික ගමනාගමන කොමිෂන් සභා පරිශ්‍ර ප්‍රතිසංස්කරණය සහ නඩත්තුව			✓	
➢ බැස්ටියන් මාවත සහ වවුනියාව පර්යන්ත ප්‍රතිසංස්කරණය කිරීම	✓			
➢ බැස්ටියන් මාවතේ වේදිකා ඉදිකිරීම - අධිවේගී මාර්ග බස් රථ සඳහා වේදිකාවක් ඉදිකිරීම	✓			
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව				
➢ දිස්ත්‍රික් කාර්යාල නවීකරණය	✓			
➢ දිස්ත්‍රික් කාර්යාල මාර්ගගත කිරීම				✓
➢ දිස්ත්‍රික් කාර්යාල යන්ත්‍ර සූත්‍ර අත්පත් කර ගැනීම		✓		
➢ කාර්ය මණ්ඩල පුහුණු කිරීම				✓
ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය				
➢ පරිගණක මිලදී ගැනීම		✓		
➢ ශාඛා කාර්යාල සඳහා CCTV කැමරා සවි කිරීම (කුරුණෑගල අනුරාධපුර)	✓			
➢ ප්‍රධාන කාර්යාලයේ රියදුරු හා ආරක්ෂක විවේකාගාරය ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම	✓			
➢ ප්‍රධාන කාර්යාලයේ සූර්ය පැනල ස්ථාපිත කිරීමට කටයුතු කිරීම				✓
➢ ප්‍රධාන කාර්යාලයේ කඩා වැටී තිබූ පිටුපස තාප්පයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම	✓			
➢ රජයේ ගොඩනැඟිලිවල කාර්යාල ස්ථාපිත කිරීමට කටයුතු කිරීම				✓
➢ ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාල සඳහා ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගැනීම	✓			
➢ ප්‍රධාන කාර්යාලය වායු සමීකරණය කිරීම හා අවශ්‍යතාවය අනුව අනෙකුත් කාර්යාල වායු සමීකරණය කිරීම				✓

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100 - 90%	89- 75%	74 - 50%	49 - 0%
➢ ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාල සඳහා වෛද්‍ය උපකරණ මිලදී ගැනීම				✓
➢ සේවක මහත්ම/මහත්මීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.		✓		
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව				
➢ මාර්ග ආරක්ෂාව කළමනාකරණය			✓	
➢ අනතුරකින් පසු ප්‍රතිකර්ම සිදුකිරීම	✓			
➢ මාර්ග භාවිතා කරන්නන්ගේ අරක්ෂාව තහවුරු කිරීම		✓		
➢ සුරක්ෂිත මාර්ග පද්ධතියක් ඇති කිරීම		✓		
මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය				
➢ ප්‍රවාහන පද්ධතිය භාවිතා කරන මගීන් හා සේවාවන් සංඛ්‍යාව	✓			
➢ සංවර්ධනය කළ/හදුන්වාදුන් සේවාවන් සංඛ්‍යාව			✓	
➢ ආදායම් උත්පාදනය සඳහා ලබා දුන් බිම් පෙදෙස් ප්‍රමාණය			✓	
➢ නව ආදායම් උත්පාදන සංඛ්‍යාව			✓	
➢ නඩත්තු හා කළමනාකරණය වෙනුවෙන් දරණ ලද වියදම	✓			
➢ නඩත්තු හා කළමනාකරණ නව ගිවිසුම් සංඛ්‍යාව			✓	
➢ සම්පූර්ණ කරන ලද මිලදී ගැනීම් සංඛ්‍යාව		✓		
➢ සූර්ය පැනල තුලින් නිපදවන ලද බලශක්ති ධාරිතාව	✓			
➢ ක්‍රියාත්මක කරන ලද පුහුණු හා සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව	✓			
කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය				
දුම්රිය කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය				
➢ දුම්රිය ස්ථාන 343ක සහ දුම්රිය කට්ටල 275ක ස්ථාපිත, දිගුකාලීන පරිණාම විදුලි සංදේශ පද්ධතිය	✓			
➢ බහු-විකුණුම් සහ බහු-ගෙවීම් නාලිකා ස්මාර්ට් ටිකට්පත් සහ ආසන වෙන් කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක වීම			✓	
➢ මෙහෙයුම් මූලස්ථානය සහ දුම්රිය පාලන මධ්‍යස්ථානය ඉදිකිරීම	✓			
➢ දුම්රිය මැදිරි සහ ධාවන පථ නඩත්තු උපකරණ මිලදී ගැනීම	✓			

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100 - 90%	89- 75%	74 - 50%	49 - 0%
➢ වැඩිහිටි පුද්ගලයින්, කාන්තාවන්, ළමුන් සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා ඇතුළත් අංග සහිත නිවාස ඒකක 120 ක් ඉදිකිරීම	✓			
➢ දුම්රිය සමායවිකය මිලදී ගෙන ස්ථාපනය කිරීම	✓			
➢ මහනුවර තදාසන්න දුම්රිය පද්ධතියේ කිලෝමීටර් 55 ක ධාවන පථ සඳහා ශක්‍යතා සහ සවිස්තරාත්මක සැලසුම් අධ්‍යයනය අවසන් කර ඇත			✓	
මහව-ඕමන්ත දුම්රිය මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය				
➢ පාලම් 5 ඉදිකිරීම				✓
➢ ඉතිරි ගෙවීම් කටයුතු සිදුකිරීම				✓
➢ අංගනවල ඉතිරි ඉදිකිරීම් සිදුකිරීම				✓
➢ ව්‍යපෘති ආරම්භය සඳහා අත්තිකාරම් ගෙවීම				✓
අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක				
➢ පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව	✓			
➢ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා ලබා දී ඇති පුහුණුවීම් සංඛ්‍යාව	✓			
➢ පාර්ලිමේන්තුව වෙත වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීම	✓			
➢ අමාත්‍යාංශය වෙත ලැබෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් වැය කරන ලද ප්‍රතිශතය		✓		
➢ වර්ෂය තුළ පවත්වා ඇති විගණන හා කළමනාකරණ කමිටු සංඛ්‍යාව	✓			

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

05 පරිච්ඡේදය
තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

3 වන තිරසර සංවර්ධන අරමුණ

නිරෝගිමත් ජීවිතයක් සහතික කර, සෑම වයසකම සිටින සෑම අයෙකුටම යහජීවනය ප්‍රවර්ධනය කිරීම.

(3.6) 2030 වන විට මහා මාර්ගවල සිදු වන අනතුරුවලින් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම

9 වන තිරසර සංවර්ධන අරමුණ

ස්ථායී යටිතල පහසුකම් ගොඩනැගීම, සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම හා නවෝත්පාදනයන් දිරිගැන්වීම.

(9.1) ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

11 වන තිරසර සංවර්ධන අරමුණ

නගර හා ජනාවාස සංයුක්ත, සුරක්ෂිත, ස්ථායී සහ තිරසර කරලීම.

(11.2) විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්ත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින්, සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මඟින් 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී අඩු මිළට ලබා ගත හැකි ප්‍රවේශ විය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම.

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (2019 වසරට සාපේක්ෂව)		
			0 - 49%	50 - 74%	75 - 100%
3 වන තිරසාර සංවර්ධන අරමුණ	3.6	• අධික වේගයෙන් රිය ධාවනය කරන රියදුරන් සඳහා නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසියට අවශ්‍ය මුල්‍ය සහය ලබා දීම (speed guns මිලදී ගැනීම සඳහා)			✓
		• හප්පා පලාගිය රිය අනතුරුවලට ලක්වූ වින්දිතයින් හට මූල්‍ය සහන ලබාදීමේ වැඩසටහන			✓

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (2019 වසරට සාපේක්ෂව)		
			0 - 49%	50 - 74%	75 - 100%
3 වන තිරසාර සංවර්ධන අරමුණ	3.6	• රිය අනතුරුවලට ලක්වූ අඩු ආදායම්ලාභී චින්දිතයින් හට මූල්‍ය සහන ලබාදීමේ වැඩසටහන			✓
		• රිය නියාමක වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් සඳහා රිය නියාමක කට්ටල 300 ක් ලබා දීම සඳහා 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් උපකරණ පාසල් සඳහා බෙදා දීම			✓
		• අනතුරු බහුල ග්‍රාමීය මාර්ග ආශ්‍රිතව හදුනාගන්නා ස්ථාන ආශ්‍රිතව විකල්ප යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වන වැඩසටහන			✓
		• මාර්ග නීති ආරක්ෂා කිරීම, මාර්ග අනතුරු අවම කර ගැනීම හා මාර්ග අනතුරක් සිදුවූ අවස්ථාවකදී ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් ත්‍රී රෝද රථ රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහන		✓	
		• මාර්ග නීති ආරක්ෂා කිරීම, මාර්ග අනතුරු අවම කර ගැනීම හා මාර්ග අනතුරක් සිදුවූ අවස්ථාවකදී ප්‍රතිචාර දැක්වීම සම්න්ධයෙන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන දැනුවත් කිරීමේ වැසටහන් පැවැත්වීම			✓
		• මාර්ග නීති ආරක්ෂා කිරීම, මාර්ග අනතුරු අවම කර ගැනීම හා මාර්ග අනතුරක් සිදුවූ අවස්ථාවකදී ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංගම හා පොදු ප්‍රවාහන බස්රථ රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම		✓	
		• මාර්ග ආරක්ෂාවට අදාල මූලික සංකල්ප පෙරපාසල් දරුවන්ට ලබා දීම සඳහා දිවයිනේ පෙරපාසල් 1000 ක් සඳහා ඉගෙනුම් ආධාරක (මුද්‍රිත බැනර් හා මාර්ග ආරක්ෂාව පිළිබඳව ඉගැන්වීමේ මාර්ගොපදේශ සංග්‍රහය) ලබා දීම			✓
		• බස්නාහිර පළාතේ තෝරාගන්නා ලද පාසලක් සඳහා කොළඹ මහනගර සභාවේ (විහාර මහාදේවී උද්‍යානයේ පිහිටි) මාර්ග ආරක්ෂණ ළමා ඒකකයේ වැඩසටහනක් පැවැත්වීම			✓

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (2019 වසරට සාපේක්ෂව)		
			0 - 49%	50 - 74%	75 - 100%
3 වන තිරසාර සංවර්ධන අරමුණ	3.6	• මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව "ජාතික ප්‍රවාහන සුරක්ෂාව පිළිබඳ කොමිෂන් සභාව " ලෙස ස්ථාපිත කිරීම			✓
		• මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සඳහා තිරසාර සංවර්ධනය මත පදනම් වූ සංයුක්ත සැලැස්මක් සකස් කිරීම		✓	
		• රක්ෂණ ආයතන මඟින් මාර්ග ආරක්ෂණ අරමුදල වෙත ප්‍රේෂණය කරන දායකත්ව මුදල්වල නිරවද්‍යතාව තහවුරු කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම			✓
		• 2025-2026 මාර්ග ආරක්ෂණ ක්‍රියාකාරී සැළැස්ම ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම			✓
		• වායු විමෝචන ප්‍රමිතීන්ට අනුකූල වන වාහන සංඛ්‍යාව වැඩි කිරීමෙන් සංසරණ වායු ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම			✓
		• පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම			✓
		• දුම්රිය මාර්ගයේ නවීකරණය හරහා එම මාර්ග භාවිතා කරන මඟීන්ගේ සුව පහසුව වැඩිදියුණු කිරීම			✓
		• ප්‍රවාහන ගැටළු නිරාකරණය සඳහා දිස්ත්‍රික් ප්‍රවාහන සම්බන්ධීකරණ කමිටුවක් ස්ථාපිත කර ක්‍රියාවට නැංවීම			✓
		• රථ වාහන බාධක අවම කර ගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක මාර්ග ආරක්ෂක කමිටු සඳහා ක්‍රියාකාරී සහභාගීත්වය			✓
		• පෞද්ගලික රථවාහන භාවිතය සීමා කිරීම හා පොදු ප්‍රවාහන සේවාව සඳහා ආකර්ශනයක් ඇති කිරීම			✓
		• Park & Ride සංකල්පය දිරිමත් කිරීම			✓
		• පාර්සල් කවුන්ටර, Park & Ride සේවාව භාවිත කරන මඟීන් හට හෙල්මට් කවුන්ටරය වැනි ප්‍රවාහන සේවා වැඩිදියුණු කිරීම			✓

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (2019 වසරට සාපේක්ෂව)		
			0 - 49%	50 - 74%	75 - 100%
9 වන තිරසාර සංවර්ධන අරමුණ	9.1	• ශ්‍රී ලංකාවේ සිදු කරනු ලබන වායු ගුණාත්මකභාවය ආශ්‍රිත පර්යේෂණ ගණන වැඩි කිරීම.			✓
		• පැයට කි.මී.100ක දුම්රිය වේගයක් පවත්වා ගත හැකි බැවින් ගමන් කාලය අවම කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම		✓	
		• ප්‍රවාහන ක්‍රමය අනුව මගී සහ භාණ්ඩ ප්‍රවාහන පරිමාව: වැඩිදියුණු කරන ලද මාර්ග, ග්‍රාමීය ජනතාවට අන්තර් හුවමාරු සේවා සහ නගර වෙත ප්‍රවේශ වීමට පහසුකම් සපයයි			✓
		• දුම්රිය ස්ථාන 343ක සහ දුම්රිය කට්ටල 275ක ස්ථාපිත දිගුකාලීන පරිණාම විදුලි සංදේශ පද්ධතිය ස්ථාපිත කිරීම			✓
		• මෙහෙයුම් මූලස්ථානය සහ දුම්රිය පාලන මධ්‍යස්ථානය ඉදිකිරීම			✓
		• දුම්රිය සමායවිකය මිලදී ගෙන ස්ථාපනය කිරීම			✓
		• දුම්රිය ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම හා ආසන වෙන් කිරීමට සුහුරු ප්‍රවේශ පද්ධතියක් ස්ථාපිත කිරීම		✓	
		• සියලුම අන්තර් පළාත් මාර්ග සඳහා ඒකාබද්ධ කාලසටහන් ක්‍රියාත්මක කිරීම		✓	
		• රියදුරු/කොන්දොස්තර පුහුණුව - පුහුණු වැඩසටහන් 40 ක් පැවැත්වීම			✓
		• පළාත් සියලුම බස් රථ සඳහා GPS සවිකිරීම			✓
		• ජාතික ප්‍රවාහන සංඛ්‍යා ලේඛන සැකසීම හා ප්‍රසිද්ධියට පත්කිරීම			✓
		• සීමිත නැවතුම් සංඥා පුවරු සවිකිරීම සඳහා ස්ථාන 1836ක් හඳුනාගැනීම			✓
		• MMC-K ගොඩනැගිල්ලේ වහලය මත සූර්ය බලශක්ති උත්පාදන පද්ධතියක් ස්ථාපනය කිරීම මඟින් පුනර්ජනනීය මූලාශ්‍රයකින් සම්පූර්ණ බලශක්ති අවශ්‍යතාවය සැපයීම සහ අමතර විදුලි උත්පාදනය Net Plus ක්‍රමය මත බලශක්ති උත්පාදනය			✓

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (2019 වසරට සාපේක්ෂව)		
			0 - 49%	50 - 74%	75 - 100%
9 වන තිරසාර සංවර්ධන අරමුණ	9.1	• විද්‍යුත් ත්‍රී රෝද රථ සඳහා බැටරි හුවමාරු මධ්‍යස්ථානය			✓
		• කසල කළමනාකරණය සඳහා ප්ලාස්ටික් වෙන් කර නිසි පරිදි නැවත ප්‍රතිචක්‍රීකරණය වෙත යොමු කිරීම			✓
11 වන තිරසාර සංවර්ධන අරමුණ	11.2	• ජාතික ගමනාගමන කොමිෂන් සභාව නව සිසුසැරිය සේවා 77ක් ආරම්භ කිරීම			✓
		• ජාතික ගමනාගමන කොමිෂන් සභාව නව ගැමිසැරිය සේවා 01ක් ආරම්භ කිරීම	✓		
		• ජාතික ගමනාගමන කොමිෂන් සභාව නිසි සැරිය සේවා 611ක් ආරම්භ කිරීම			✓
		• මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය අතර සේවා මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්බන්ධ කර වෛද්‍ය සහතික සුහුරු තාක්ෂණය මඟින් ලබාදීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම	✓		
		• 2025 වර්ෂය තුළ ජංගම සේවා කිහිපයක් ක්‍රියාත්මක කිරීම			✓
		• වසරකට දුම්රිය මඟින් සංඛ්‍යාව (මිලියන) 2015 වසර: 133.29 2030 වසර: 150		✓	
		• ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ව්‍යාපෘති 13ක් ක්‍රියාත්මක කිරීම		✓	
		• සංසරණ වායු තත්ත්වය මිණුම් කිරීම හා වායු තත්ත්ව කළමනාකරණය සඳහා ප්‍රතිපාදන ලබා දීම		✓	
		• රථවාහන ඉල්ලුම හා සේවා තත්ත්ව සමීක්ෂණ 106ක් පැවැත්වීම			✓
		• දුම්රිය මැදිරි සහ ධාවන පථ නඩත්තු උපකරණ මිලදී ගැනීම			✓
		• වැඩිහිටි පුද්ගලයින්, කාන්තාවන්, ළමුන් සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා පහසුකම් සහිත නිවාස ඒකක 120 ක් ඉදිකිරීම			✓

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (2019 වසරට සාපේක්ෂව)		
			0 - 49%	50 - 74%	75 - 100%
11 වන තිරසාර සංවර්ධන අරමුණ	11.2	• උපරිම කාර්යක්ෂමතාවයක් හා අවම ඉන්ධන භාවිතයක් සහිතව හරිත භාණ්ඩ ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය භාවිත කිරීමට හැකි පරිදි පාශ මාර්ග පද්ධති සියළුම දුම්රිය ස්ථාන සඳහා ඉදිකිරීම		✓	
		• ඉදිකරන ලද MMC-K ගොඩනැගිල්ල සියලුම මගීන්ට සම සේ ප්‍රවේශ විය හැකි පරිදි සකස් කිරීම (දෘෂ්‍යාබාධිතයින් සඳහා tactile, විදුලි සෝපාන පැනලයේ බ්‍රේල්, ශාරීරික ආබාධිතයන් සඳහා විශේෂිත පිවිසුම්, සහ සෝපාන, ශ්‍රවණය කළ හැකි ආබාධිතයන් සඳහා ප්‍රදර්ශන පද්ධති සහ වෙනම පිරිමි සහ ගැහැණු සනීපාරක්ෂක පහසුකම්) • සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා විශේෂ සෞඛ්‍ය පරීක්ෂණ වැඩසටහන්, වෛද්‍ය හමු, උපදේශන සේවාවන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම • අධිවේගී මාර්ගයේ බස් රථ වල ගමන් ගන්නා මගීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා බස් රථ මූලික පරීක්ෂණයකින් අනතුරුව ධාවනයට එක් කිරීමට සුදුසු පරීක්ෂණ ස්ථානයක් ස්ථාපිත කිරීම			✓
		• සියලුම ජනතාවට පොදු ප්‍රවාහනයට පහසු ප්‍රවේශයක් සලසා දීම. භේදයකින් තොරව සියලුම මගීන්ට අමතර වියදමකින් ද තොරව විශ්වාසනීය ප්‍රවාහන පහසුකම් සැලසීම ✓ කැළණි වැලි දුම්රිය මාර්ගයට සම්බන්ධ බස් පර්යන්තයෙන් අධිවේගී මාර්ග හරහා දිවයිනේ සෑම ප්‍රදේශයකටම ගමන් කිරීමට මධ්‍යම ස්ථානයක් හා Park&Ride පහසුකම් ලබා දීම ✓ පොදු ප්‍රවාහන ක්‍රම භාවිතා කරන පුද්ගලයින් සංඛ්‍යාව වැඩි කිරීම ✓ ගමන් කාලය අඩු කිරීම සහ තදබදය අඩු කිරීම ✓ සියලු මගීන්ට පොදු ප්‍රවාහනය වෙත පිවිසීම පහසු කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක කෙරෙන පළමුවෙනි අන්තර්කරණ සහය මධ්‍යස්ථානය පිහිටුවීම ✓ රියදුරු කොන්දොස්තර මහතුන් වෙනුවෙන් සංඥා භාෂාව පුහුණු කිරීම			✓

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2015 වර්ෂයේදී පවත්වන ලද තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේදී සම්මත කරගත් 2030 න්‍යාය පත්‍රයට අනුකූල වෙමින් රටේ සමස්ත සංවර්ධනයට ඵලදායි ලෙස දායකත්වයක් සැපයීම අරමුණු කොට ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ශක්තිමත් ප්‍රවාහන සේවාවක් ඇති කිරීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය පියවර රැසක් මේ වන විට දියත් කර ඇත. අමාත්‍යාංශය විසින් හඳුනාගන්නා ලද ජයග්‍රහණ දර්ශකවලට අදාළ ප්‍රගතිය 5.1 ඡේදයේ වගුව මඟින් දක්වා ඇත. තිරසර සංවර්ධන අරමුණු 3, 9 සහ 11හි ඉලක්ක කිහිපයක් ලභා කරගැනීම සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රය ඍජු දායකත්වයක් දක්වන අතර අනෙකුත් තිරසර සංවර්ධන අරමුණු ගණනාවක ඉලක්ක ලභා කරගැනීම සඳහා වක්‍ර දායකත්වයක් සපයයි.

තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමේ දී මුහුණ දෙන අභියෝග

- විශාල ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ආයෝජන සපයා ගැනීමේ ගැටළු
- ඉඩම් අත්පත් කර ගැනීම, පවරා ගැනීම සහ නැවත පදිංචි කිරීම සම්බන්ධ ගැටළු
- සේවක ගැටළු සහ අනපේක්ෂිත වෘත්තීය සංගම් ක්‍රියාමාර්ග
- ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධව සිදුකරන පර්යේෂණ ප්‍රතිඵල, සොයාගැනීම්, ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට ප්‍රයෝගිකව යොදා ගැනීමේ දුර්වලතා
- නව තාක්ෂණය යොදා ගැනීමේදී ඇතිවන තාක්ෂණික ගැටළු

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	30	22	08
තෘතියික	05	04	01
ද්විතියික	164	111	53
ප්‍රාථමික	56	37	19

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන අයුරු

අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර ඉටු කරලීම වෙනුවෙන් ඉලක්කගත අරමුණුවලට ළඟාවීමේදී මානව සම්පත් හිඟය සෘජු බලපෑමක් සිදු කරන අතර, අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට වැයවන කාලසීමාවන්හි වැඩිවීමක් සිදුවීමේ හැකියාවක් ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය තුළින් ජනතා සේවාව කාර්යක්ෂම කරවීම

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම *
				දේශීය (රු. 000)	විදේශීය (ඇ.ඩො)		
01.	කාර්යාල කාර්ය සේවයේ රාජකාරී සම්බන්ධ පුහුණුව	05	දින 02	60		දේශීය	ලබාගත් දැනුම තුළින් රාජකාරී කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම
02.	කාර්යාල සහායකයන්ගේ භූමිකාව හා වගකීම්	01	දින 02	12		දේශීය	
03.	නිවාඩු භාර නිළධාරියාගේ කාර්යභාරය	01	දින 01	6.5		දේශීය	
04	වාහන නඩත්තුව පිළිබඳ පුහුණුව	03	දින 01	19.5		දේශීය	
05.	මූලික විමර්ශන පිළිබඳ පුහුණුව	01	දින 01	6.5		දේශීය	

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම *
				දේශීය (රු. 000)	විදේශීය (ඇ.ඩො)		
06.	පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම පිළිබඳ පුහුණුව	02	දින 01	13		දේශීය	ලබාගත් දැනුම තුළින් රාජකාරී කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම
07.	විනය කාර්ය පටිපාටිය පිළිබඳ පාඨමාලාව	01	දින 10	25		දේශීය	
08.	රියදුරන් සඳහා එක්දින වැඩමුළුව	04	දින 01	24		දේශීය	
09.	ගබඩා කළමනාකරණය, ඉන්වෙන්ට්‍රි පාලනය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය පිළිබඳ පුහුණුව	01	දින 02	13		දේශීය	
10.	මානව හිමිකම් නීතිය පිළිබඳ පුහුණු වැඩසටහන	අමාත්‍යාංශ නිලධාරීන් සඳහා	දින 01	16.711		දේශීය	
11.	මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ පුහුණු වැඩසටහන		දින 01	7.2		දේශීය	
12.	මූල්‍ය කළමනාකරණ ක්‍රම ශිල්ප සම්බන්ධ පුහුණු වැඩසටහන		දින 01	7.58		දේශීය	
13.	සුපිළිපන්නභාවය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩමුළුව		දින 01	19		දේශීය	
14.	නිවාඩු භාර නිළධාරියාගේ කාර්යභාරය	01	දින 01	6.5		දේශීය	

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම *
				දේශීය (රු. 000)	විදේශීය (ඇ.ඩො)		
15.	ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධ පුහුණුව	02	දින 02	24		දේශීය	ලබාගත් දැනුම තුළින් රාජකාරී කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම
16.	කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි ලිවීම	01	දින 01	6.5		දේශීය	
17.	රාජකාරි ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම පිළිබඳ පුහුණුව	02	දින 01	13		දේශීය	
18.	රාජ්‍ය නිළධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණුව (NILS ආයතනය)	01	දින 01	6.5		දේශීය	
19.	Certificate in ICT and Artificial Intelligent (AI) for office productivity	01	දින 05	30		දේශීය	
20.	Certificate in Procurement Procedure	02	දින 05	60		දේශීය	
21.	වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණුව (SDFL ආයතනය)	01	දින 02	13		දේශීය	
22.	රියදුරන් සඳහා එක්දින වැඩමුළුව	03	දින 01	18		දේශීය	
23.	Sub regional Consultation workshop on the draft SASEC transport sector strategy 2035	01	දින 01		USD 75	විදේශීය	

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම *
				දේශීය (රු. 000)	විදේශීය (ඇ.ඩො)		
24.	Knowledge Exchange between Japan and Sri Lanka on efficient and resilient and urban transportation	01	දින 05		USD 175	විදේශීය	ලබාගත් දැනුම තුළින් රාජකාරී කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම
25.	Global Sustainable Transport Cultural Exchange Project (GSTCEP)	01	දින 21		USD 375	විදේශීය	
26.	Digitalization of supply chains and logistics	01	දින 11		USD 350	විදේශීය	
27.	ASIA Pacific Road safety Conference	01	දින 03		USD 125	විදේශීය	
28.	Workshop for the midterm review of the BIMSTEC Master plan for transport connectivity	01	දින 02		USD 75	විදේශීය	
29.	Leaders in Urban Transport planning – work shop	01	දින 06		USD 200	විදේශීය	
30.	Second Workshop for the Midterm Review of the BIMSTEC Master plan for transport connectivity	01	දින 02		USD 100	විදේශීය	

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම *
				දේශීය (රු. 000)	විදේශීය (ඇ.ඩො)		
31.	Seminar on Construction & Management of Development zone for Sri Lanka	01	දින 14		USD 375 & ස්ටාර්ලිං පවුම් 75	විදේශීය	ලබාගත් දැනුම තුළින් රාජකාරී කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම
32.	JICA Knowledge co-creation program (urban public transport)	01	දින 20		USD 375	විදේශීය	
33.	Seminar on Carbon Neutrality and Energy Innovation Development zone	01	දින 14		USD 375 & ස්ටාර්ලිං පවුම් 75	විදේශීය	
34.	South Asia Sub-Regional Economic Cooperation (SASEC) Program's Working Group Meeting	01	දින 03		USD 200	විදේශීය	

* ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන අයුරු

විධිමත් පුහුණුවීම් ලැබීම තුලින් නිලධාරීන්ගේ දැනුම හා කාර්යක්ෂමතාව වැඩිදියුණු වන අතර ඒ තුලින් කාර්යක්ෂම ජනතා සේවයක් ලබාදීමට හැකියාවක් ලැබේ.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරාකරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ		
2.9	භානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරීක්ෂණ කියාමාර්ග
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය හා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස්කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	අදාළ අංශ වෙතින් නියමිත දිනට පිළිතුරු නොලැබීම	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2025 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරීක්ෂණ කියාමාර්ග
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2025 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරීක්ෂණ කියාමාර්ග
	103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම			
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රා.ප.ව. 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කිරීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළපසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරීක්ෂණ කියාමාර්ග
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරීක්ෂණ ක්‍රියාමාර්ග
	වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම			
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය අනුව සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල නොවේ	විගණන ඡේද නොමැත	

ඡායාරූප එකතුව

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව





රියදුරු පුහුණු කටයුතු සඳහා නව දුම්රිය පුහුණු ප්‍රතිරූපක පද්ධතියක් (Train Simulator) ස්ථාපනය





ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු තනතුරු සඳහා නව පත්වීම් ප්‍රදානය

මහව ඕමන්ත දුම්රිය මාර්ග පුනුරුත්ථාපන ව්‍යාපෘතිය



අඹන්පොල අංගනය



ශ්‍රාවස්තිපුර අංගනය



වන අලි උමංමාර්ගය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය





නව එන්ජින් කට්ටල 415 ක් බස්රථ සඳහා සවිකර ධාවනයට එක් කිරීම





ශ්‍රී ලංගම මධ්‍යම බස්නැවතුම්පළ නවීකරණය

ජාතික ගමනාගමන කොමිෂන් සභාව







සමාජ සුභසාධනය ප්‍රමුඛ කොටගත් බස්රථ සේවා සැපයීම

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය





රියදුරු බලපත්‍ර සඳහා වෛද්‍ය සහතික ලබා දීමේ ජංගම සේවයක් ඇල්දෙණිය අභිනවාරාමයේදී ක්‍රියාත්මක කිරීම.





අහඹු ලෙස මත්ද්‍රව්‍ය පරීක්ෂණයට භාජනය කිරීමට අදාළ නියමු ව්‍යාපෘතිය ආරම්භ කිරීම

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව



පාසල් මාර්ග ආරක්ෂණ සංසද පිහිටුවීමේ වැඩසටහන්

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය

දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය



Railroad Loader යන්ත්‍රය



Track Motor Car with 12 Nos. mini wagon යන්ත්‍රය



Ballast Profiling Machine යන්ත්‍රය



50T හයිඩ්‍රොලික් දොඹකරය



මාලපල්ල දුම්රිය ස්ථානය අසල මහල් නිවාස සංකීර්ණය ඉදිකිරීම



කොළඹ දුම්රිය පාලන කාර්යාලය සහ දුම්රිය මෙහෙයුම් මූලස්ථානය ඉදිකිරීම.




කොළඹ කොටුව , මරදාන හා අනුරාධපුර දුම්රිය ස්ථානයන් හි මගී පහසුකම් සංවර්ධනය කර ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත

කැළණිවැලි දුම්රිය මාර්ගයේ දුම්රිය ප්‍රවේශ අයිතිය තුළ පදිංචි අනවසර පවුල් නැවත පදිංචි කිරීම




කොළඹගේ මාවත (අදියර II) නිවාස ඒකක 144

කැළණිවැලි දුම්රිය මාර්ග රක්ෂිතයේ නාවින්න සිට පාදුක්ක දක්වා නව නිවාසලාභීන් වෙත හිමිකම් සහතිකපත් හා යතුරු ලබා දීම




නව නිවාස ඒකක හිමි ව්‍යාපෘති ප්‍රතිලාභීන් කොට්ටාව මාලපල්ල පර්ල් රෙසිඩන්සීස් මහල් නිවාස සංකීර්ණයේ නැවත පදිංචි කිරීමෙන් පසු තත්ත්වය

කැළණිවැලි දුම්රිය මාර්ග රක්ෂිතයේ නාවින්න සිට පාදුක්ක දක්වා අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කර දුම්රිය මාර්ග සංවර්ධනයට අවශ්‍ය දුම්රිය රක්ෂිත මාර්ග පථය නිදහස් කර ගැනීම

මහකොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය







පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන



අන්තර්කරණ සහය මධ්‍යස්ථානය (උපකාරක කවුන්ටරය) විවෘත කිරීම





ත්‍රී රෝද රථ ඉලෙක්ට්‍රික් ත්‍රී රෝද රථ බවට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය මත සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම



Park & Ride පහසුකම්





පාර්සල් සහ හෙල්මට් කවුන්ටර ස්ථාපිත කිරීම



ප්ලාස්ටික් අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා ස්ථාන කිහිපයක් ස්ථාපිත කිරීම



සුඛෝපභෝගී මගී ප්‍රවාහන බස් රථ වල තත්වය පරීක්ෂාව කිරීම සඳහා පරීක්ෂණ ස්ථානයක් විවෘත කිරීම.







සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම



විදුලි බල සූර්ය පැනල් භාවිතා කිරීම



ගිනි නිවීමේ පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම



වාර්ෂික කාර්යසාධන වාර්තාව

2025

ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
(මහාමාර්ග අංශය)

“මහනැගුම මහමැදුර”, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල

පෙරවදන

ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ (මහාමාර්ග අංශය) වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2025, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 මඟින් ලබාදී ඇති උපදෙස් අනුව සකස් කර ඇත.

මෙම වාර්තාව මඟින් ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ (මහාමාර්ග අංශය) භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිබඳව සවිස්තරාත්මකව දක්වා ඇත.

පටුන

1 වන පරිච්ඡේදය – ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම 01

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු 02-03

1.3 ප්‍රධාන කාර්යභාරයන් 04

1.4 සංවිධාන සටහන ,මහාමාර්ග අංශය 05

1.5 මහාමාර්ග අංශයේ හැඳින්වීම

1.5.1 අමාත්‍යාංශයේ ක්‍රියාකාරී අංශයන් 07

1.6 වෙනත් ව්‍යවස්ථාපිත ආයතන 16

1.7 මහාමාර්ග අංශයේ ආයෝජනය 17

2 වන පරිච්ඡේදය – ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

2.1 නව ප්‍රවේශයන් 19

2.1.1 මධ්‍යම අධිවේගී මාර්ගය තුන්වන අදියර - රඹුක්කන සිට ගලගෙදර දක්වා අදියර II ඉදිකිරීම 19

2.1.2 කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය - බෑවුම් අංක 1 (අලුත්මාවත අන්තර්හුවමාරුව) 19

2.1.3 කඩවත පද්ධති අන්තර් හුවමාරුව සහ මධ්‍යම අධිවේගී මාර්ගය අදියර Iහි මීර්ගම දෙසට මීටර් 500ක් ඉදිකිරීම 19

2.1.4 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 4වන කොටස (කුරුණෑගල - දඹුල්ල කොටස) 20

2.1.5 රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 20

2.1.6 කොළඹ-රත්නපුර-වැල්ලවාය-මඩකලපුව මාර්ගයේ ගොඩගම සිට අවිස්සාවේල්ල දක්වා (කි.මී. 27+430 සිට කි.මී. 58+550දක්වා) කොටස මංතීරු 04ක් දක්වා පුළුල් කිරීම 21

2.2 අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන

2.2.1අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණය 23

2.2.2 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 25

2.2.3කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය 28

2025 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය 30

2.3 මහාමාර්ග සංවර්ධන වැඩසටහන

2.3.1 ශ්‍රී ලංකාවේ මහාමාර්ග ජාලය 33

2.3.2 මාර්ග සහ පාලම් නඩත්තු කිරීම(මාර්ග නඩත්තු භාරකාර අරමුදල) 34

2.3.3 යටිතල පහසුකම් හා මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය 35

2.3.4 රථවාහන ගමනාගමන කළමනාකරණව්‍යාපෘතිය 37

2.3.5 පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි (A005) මාර්ගය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය 38

2.3.6 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල II) 40

2.3.7මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල) 41

2.3.8 කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය 42

2.3.9 ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර I 43

2.3.10 දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (I Road 2) 44

2.3.11 බස්නාහිර පළාත් ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 45

2.3.12 පානදුර දක්වා සමුද්‍රීය මාර්ගය දීර්ඝ කිරීමේව්‍යාපෘතිය 46

2.3.13 විකල්ප මාර්ග කි.මී.100,000 සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 47

2.3.14 ගාල්ල-දෙනියාය මාර්ගයේ කි.මී.78+000-130+600 දක්වා වූ මාර්ග කොටස වැඩිදියුණු කිරීම 48

2.3.15 ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය 49

2.316 මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය 51

2.3.17 කොරියානු රජයේ ආධාර යටතේ ජාතික රථවාහන ගමනාගමන දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීමේ හා ධාරිතා ගොඩනැඟීමේ ව්‍යාපෘතිය 52

2.3.18 ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන 53

2025 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව මහාමාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය 54

2.4 මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම 59

2.4.1 මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම 59

2.5 පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම

2.5.1 ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත්/ අබලන් පාලම් නැවත ඉදිකිරීම / ප්‍රතිනිර්මාණය 63

2.5.2 පැරණි පාලම් කොටස් භාවිතා කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම 64

2.5.3 ජාතික මහාමාර්ගයන්හි පිහිටි පාලම් 25 ක් නැවත ඉදිකිරීම 64

2.5.4කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් 02 ක් ඉදිකිරීම 66

2.5.5 කොම්පඤ්ඤවීදිය ප්‍රදේශයේ ගුවන් පාලම් 03ක් ඉදිකිරීම 67

2.5.6 වඩඩුවාකල් පාලම නැවත ඉදිකිරීම 68

2.5.7 යටියන්තොට - මාගම්මන මාර්ගයේ ගරාගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම 69

සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය 70

2.7 මූල්‍ය ප්‍රගති සමාලෝචනය 73

2.7.1 මෙහෙයුම්ක්‍රියාකාරකම් 74

2.7.2 සංවර්ධන ක්‍රියාකාරකම් 75

2.8 අනාගතය සඳහා ඉදිරි දැක්ම 87

3 වන පරිච්ඡේදය – සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 89

3.3මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 91

3.4මූල්‍යප්‍රවාහ ප්‍රකාශය 92

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන් 93

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 105

3.7වෙන්කරනලදප්‍රතිපාදනඋපයෝගීකරගැනීමේකාර්යසාධනය 105

3.7 මු.රෙ.208 ප්‍රකාරව, මෙම දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ පළාත් සභාවනියෝජිතයෙකු ලෙස වෙනත් අමාත්‍යාංශවලට/ දෙපාර්තාමේන්තු වලටප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 105

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 105

3.9 විගණකාධිපති වාර්තාව 106

4 වන පරිච්ඡේදය – කාර්යසාධන දර්ශක

හැඳින්වීම 107

4.1 කාර්යසාධන දර්ශක 107

5 වන පරිච්ඡේදය – තිරසර සංවර්ධන අරමුණු (SDGs) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු (SDGs)අත්පත්කරගැනීමේ කාර්යසාධනය 109

5.2 මාර්ග අංශයේ තිරසර සංවර්ධන අරමුණු අත්පත් කරගැනීම හා මුහුණ දුන් අභියෝග 110

6 වන පරිච්ඡේදය – මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 113

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයෙහි බලපෑම 113

6.3 මානව සම්පත් සංවර්ධනය 115

7 වන පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව 119

ඡායාරූප එකතුව I-VI

ඇමුණුම්

ඇමුණුම 01 2025 වර්ෂයේදී ප්‍රදානය කරන ලද ප්‍රසම්පාදනයන් VII

ඇමුණුම 02 ශ්‍රී ලංකාවේ නිමකරන ලද හා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අධිවේගී මාර්ග ජාලය XIII

ඇමුණුම 03 අධිවේගී මාර්ගයන්හි රථවාහන ධාරිතාවය හා ආදායම XIV

ඇමුණුම 04 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය XVIII

ඇමුණුම 05 ශ්‍රී ලංකාවේ නිමකරන ලද හා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ගව්‍යාපෘති XXII

ඇමුණුම 06 අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වැඩිදියුණු කරන ලද මාර්ගයන්හි ප්‍රගතිය XXIII

ඇමුණුම 07 විගණකාධිපති වාර්තාව XXV

පරිච්ඡේදය 1

ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මාර්ග ජාලය යනු ආර්ථික ක්‍රියාකාරීත්වය, සමාජීය ඒකාබද්ධතාවය සහ අවකාශීය සම්බන්ධතාවය සඳහා පදනම සපයන වඩාත් උපායමාර්ගික පොදු වත්කම්වලින් එකකි. වර්ග කි.මී. 65,610ක වපසරියකින් ද මිලියන 21.9 කට ආසන්න වූ ජනගහණයකින් ද වර්ග කිලෝමීටරයකට කිලෝමීටර 1.76ක මාර්ග ඝනත්වයකින් ද (මහ බැංකු වාර්ෂික වාර්තාව - 2024) ශ්‍රී ලංකාව සමන්විත වේ. ඒ අනුව මාර්ග ඝනත්වයන් එකිනෙක සලකා බැලීමේදී බොහෝ දකුණු ආසියානු රටවල් අභිබවා යාමට වත්මන් ශ්‍රී ලංකාවට හැකිව ඇත. ශ්‍රී ලංකාවේ මාර්ග ප්‍රවාහනය ජාතික ගමනාගමන ව්‍යුහය තුළ ප්‍රමුඛතම ප්‍රවාහන ක්‍රමය බවට පත්ව ඇති අතර නම්‍යශීලීභාවය, ප්‍රවේශ්‍යතාව සහ පිරිවැය කාර්යක්ෂමතාවය පිළිබිඹු කරමින්, මගී ප්‍රවාහනයෙන් 94% ක් සහ භාණ්ඩ ප්‍රවාහනයෙන් 98% ක්ම මාර්ග ඔස්සේ සිදු කෙරේ.

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය මගින් පරිපාලනය කරනු ලබන, මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) එහි ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස කටයුතු කරයි. මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිතව පිහිටවූ ආයතනයක් වන අතර 1981 අංක 73 දරණ පනත් කෙටුම්පත අනුව අමාත්‍යාංශය යටතට පවරාගෙන ඇති අතර 1986 දී එය මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම අනුප්‍රාප්තිකයා බවට පත් විය. මෙය ජාතික මහාමාර්ග ජාලය සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීමෙහිලා වගකිවයුතු දායකත්වයක් සපයනු ලැබේ.

2025 වසර අවසාන වන විට, ශ්‍රී ලංකාවේ මාර්ග ජාලය ආසන්න වශයෙන් කි.මී 12,575ක් දක්වා පුළුල් වන අතර, එයට ‘A’ ශ්‍රේණියේ (ප්‍රධාන) මාර්ග කි.මී 4,217ක්, ‘B’ ශ්‍රේණියේ (ද්විතීයික) මාර්ග කි.මී 8,045ක්, අධිවේගී මාර්ග කි.මී 312ක් සහ මීටර් 03ට වඩා වැඩි පරාසයකින් යුත් පාලම් 4,413කින් ද සමන්විත වේ. රජයට අයත් ව්‍යවසායන්හි මෑතකදී සිදු කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීම් මගින් මෙම අංශය තුළ පවතින ආයතනික වගකීම් තවදුරටත් විධිමත් කර ඇත.

ශ්‍රී ලංකාවේ මාර්ගවල ගමනාගමනයෙන් 80% කට වඩා වැඩි ප්‍රමාණයක් ජාතික මහාමාර්ග මඟින් සිදු කෙරෙන බැවින් එය මාර්ග ජාලයේ කොදු නාරටිය ලෙස ස්ථානගත කළ හැක. එබැවින් ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ වත්කම්වල දිගුකාලීන පැවැත්ම සහතික කිරීම සඳහා ජාතික මහාමාර්ග ජාලයෙහි අඛණ්ඩව ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම සහ විධිමත් නඩත්තුව අත්‍යවශයෙන්ම සිදුකළ යුතුය. මහාමාර්ග සංවර්ධනය කෙරෙහි පුද්ගලික අංශය මඟින් යොදනු ලබන ආයෝජනයන් සීමා වීම හේතුවෙන් මෙම අංශයට වාර්ෂික අයවැය, අරමුදල් සහ වෙනත් දේශීය හා විදේශීය ප්‍රභවයන් හරහා මූල්‍යකරණය සිදු කරනු ලබයි.

පසුගිය දශක කිහිපය තුළ, සැලකිය යුතු මට්ටමේ මහාමාර්ග ව්‍යාප්තියක් සිදුවී තිබුණද, බොහෝ ජාතික හා පළාත් මාර්ග මීට වසර 50 කට පෙර ඉදිකරන ලද මාර්ග වන අතර ඒවා එවකට පැවති රථවාහන ධාරිතාවය, වාහන වර්ග සහ වේග සීමාවන්ට අනුකූල වන පරිදි ඉදිකර තිබේ. රථවාහන තදබදය සහ බර වාහන භාවිතය වේගයෙන් ඉහළ ගොස් තිබීම මෙන්ම ඒ හා සමගාමීව සිදු වූ නාක්ෂණික සංවර්ධනය හේතුවෙන් නාගරික මෙන්ම ග්‍රාමීය මාර්ග පද්ධති පුරා වැඩිදියුණු කරන ලද ජ්‍යාමිතික සැලසුම්, ශක්තිමත් කරන ලද පදික ව්‍යුහයන් (pavement structures) සහ විධිමත් නඩත්තු ක්‍රමවේදයන්හි අවශ්‍යතාවය ද මතු වී තිබේ.

2025 වර්ෂයේදී, රට තුළ පැවැති සාර්ව ආර්ථික අර්බුදය මධ්‍යයේ වුවද මාර්ග අංශයේ සංවර්ධන ව්‍යාපෘති භෞතිකව හා මූල්‍යමය වශයෙන් අවම බලපෑමක් සිදුවන ආකාරයෙන් පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත. එබැවින් ඉදිරියේදී දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති අවසන් කිරීම සහ පවතින වත්කම් සුරක්ෂිත කිරීම මගින්, ප්‍රාදේශීය විෂමතා අවම කිරීමට සහ ශ්‍රී ලංකාවේ දිගුකාලීන සමාජ-ආර්ථික වශයෙන් සංවර්ධනය ලඟා කර ගැනීමට ගමනාගමන පහසුකම් ඉහළ නැංවීම තීරණාත්මක සාධකයන් වනු ඇත.

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1දැක්ම

" කාර්යක්ෂම, ආරක්ෂිත හා නව තාක්ෂණය මත පදනම් වූ මාර්ග ජාලයක් සතු මහාමාර්ග ක්ෂේත්‍රයේ අද්විතීය සේවා සපයන්නා වීම"

1.2.2. මෙහෙවර

විශේෂඥ දැනුම, අති නවීන තාක්ෂණය සහ රාජ්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් පුරවැසි අවශ්‍යතාවයන්ට සහ ජාතික සංවර්ධන අභිමතාර්ථයන්ට අනුකූලව මාර්ග ජාලය සංවර්ධනය කර, කළමණාකරණය කිරීම හා නඩත්තු කිරීම


1.2.3 අරමුණු

- ජාතික සංවර්ධන ඉලක්කයන් කෙරෙහි ළඟාවිය හැකි වන පරිදි මහාමාර්ග අංශය සඳහා ජාතික ප්‍රතිපත්ති සැකසීම
- ප්‍රධාන නගර අතර ගමනාගමනය සැපයීම, ආර්ථික මධ්‍යස්ථාන අතර කාර්යක්ෂම සබඳතාවයන් ඇති කිරීම සහ ග්‍රාමීය ප්‍රදේශ වලට ප්‍රවේශය වැඩිදියුණු කිරීම
- තිරසාර සංවර්ධනයට දායක වන ආකාරයට මාර්ග ජාලය උසස් ප්‍රමිතියකින් යුතුව නඩත්තු කිරීම
- කාර්යක්ෂම රථවාහන කළමනාකරණය සඳහා සහ අධිවේගී මාර්ග සඳහා වන පරිගණකගත ප්‍රවාහන මෙහෙයුම් පද්ධතියක් පවත්වා ගෙන යාම
- උසස් මට්ටමේ සේවාවක් සැපයීම සහ පරිශීලක හිතකාමී මාර්ග ඉදිකිරීම සඳහා මහාමාර්ග අංශයේ මානව සම්පත් ධාරිතාවය වැඩිදියුණු කිරීම
- මාර්ග පද්ධතිය ප්‍රවර්ධනය සඳහා දායක වන පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍ර සඳහා ආයෝජනය කිරීම
- මාර්ග භාවිතා කරන්නන් සඳහා මාර්ග ආරක්ෂණ මිනුම් / මාන වැඩිදියුණු කිරීම

1.3 ප්‍රධාන කාර්යභාර්යයන්

1. මාර්ග, මහාමාර්ග සහ ග්‍රාමීය යටිතල පහසුකම් විෂයට සහ අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයන්හි (මාර්ග සංවර්ධය අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්, මාර්ග නඩත්තු භාරකාර අරමුදල) විෂයයන්ට සහ ජාතික මංමාවත් පනත (2008 අංක 40) මාර්ග සංවර්ධන අධිකාරි පනතෙහි (1981 අංක 73) සඳහන් නීති හා අණපනත් වලට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම. හා වෙනත් අමාත්‍යවරයෙකු යටතට නිශ්චිතව පවරා නොමැති උක්ත සඳහන් විෂයන්ට අදාල අනෙකුත් ව්‍යවස්ථාවන් පිළිබඳ කටයුතු සිදුකිරීම
2. ග්‍රාමීය, පූර්ව නගර හා නාගරික ප්‍රදේශ සබඳතා පුළුල් කරමින් ජනතා කේන්ද්‍රීය ආර්ථික හා සමාජ සංවර්ධනයක් ඇතිවන ලෙස උසස් තත්ත්වයෙන් යුක්ත වන පරිදි ජාතික මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ත තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
3. අධිවේගී මාර්ග සංවර්ධනය, ගාස්තු නියම කිරීම, රැස්කිරීම හා නියාමනය කිරීම
4. පළාත් සභා සහ පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග පිළිබඳ ජාතික ප්‍රතිපත්ති පදනම් කොටගත් වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය හා මෙහෙයවීම.
5. අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම සහ අනෙකුත් සියලුම විෂයන්ට අදාල කටයුතු සිදු කිරීම

1.4 සංවිධාන සටහන



1.5 මහාමාර්ග අංශයේ හැඳින්වීම

1.5.1 අමාත්‍යාංශයේ ක්‍රියාකාරී අංශ

මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධානත්වය අමාත්‍යාංශ ලේකම් විසින් දරනු ලබන අතර අංශ ප්‍රධානීන් 08කගේ ප්‍රධානත්වය යටතේ ක්‍රියාත්මක වන ක්‍රියාකාරී අංශ 8 කින් සමන්විත වේ.



1.5.1.1 පාලන අංශ

ප්‍රවාහන.මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය යටතේ පාලන අංශයේ ප්‍රධානත්වය අතිරේක ලේකම් (පාලන) විසින් දරනු ලබන අතර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, සහකාර ලේකම්, නීති නිළධාරී හා පරිපාලන නිළධාරී යන විධායක නිළධාරීන් අංශයේ ක්‍රියාකාරීත්වය සඳහා දායක වේ. තවද ව්‍යාපෘති කළමණාකරණ අංශය ද අතිරේක ලේකම් (පාලන) ගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමණානකරණ) සහ සහකාර ලේකම් (ව්‍යාපෘති කළමණාකරණ) යන නිළධාරීන් අංශයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා වගකිව යුතු වේ. පාලන අංශය අමාත්‍යාංශයේ සියළුම පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වගකීම දරණ අතර අනෙකුත් සියළුම අංශයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන කාර්යාලීය පරිසරය නිර්මාණය කිරීම සිදු කරනු ලැබේ.

2025 වර්ෂය තුළ ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ ඇගයීම

1. තොරතුරු ලබාදීමේ පනත අනුව මහජනතාව සඳහා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීමේ අරමුණින් වර්ෂය තුල නිවැරදි හා කාලීන තොරතුරු ලබාදීම සිදු කරන ලද අතර අදාල කටයුතු සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව වගකීම දැරීම සඳහා තොරතුරු නිළධාරියෙකු නම් කර පත් කරන ලදී. තව ද ලබාදෙන ලද තොරතුරු පිළිබඳ අභියාචනා ඉදිරිපත් වන අවස්ථාවන්හි දී මෙම තොරතුරු ලබාදීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය පිළිබඳ ඇගැයීම් කටයුතු අතිරේක ලේකම් (පාලන) හරහා සිදු කරනු ලැබිණි.

2. ජාතික සංවර්ධන අරමුණු කරා ළඟාවීමේ දී අමාත්‍යාංශයීය විෂයානුබද්ධිත කාර්යයන් වඩාත් කාර්යක්ෂමව සහ නිවැරදිව සිදු කිරීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීම සහ වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම සඳහා එක් එක් අංශය වෙත පැවරුණු රාජකාරී ඉටු කිරීම සඳහා අවශ්‍ය වන මඟ පෙන්වීම ලබා දීම.

3. අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතන සමඟ කාර්යක්ෂම සහ අඛණ්ඩ සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් පවරන ලද කාර්යයන් ප්‍රධාන විෂය ධාරාවන් වෙත යොමු වෙමින් නිරවද්‍යව සම්පූර්ණ කිරීමට ආයතන අංශයට හැකියාව ලැබී ඇත.

4. පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තිය හඳුන්වා දීම තුලින් සේවාලාභීන් සඳහා ඵලදායී කාර්යක්ෂම සේවාවක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

5. කාර්ය මණ්ඩලයෙහි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා දැනුම හා කුසලතා ඉහළ නැංවීමට අවශ්‍ය පුහුණුවීම් අවස්ථා ලබා දී ඇත.

6. රාජ්‍ය සේවයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීමෙන් පරිගණක තාක්ෂණය යොදා ගනිමින් රාජකාරී කටයුතු ඉටුකිරීමත් ක්‍රියාත්මක කර ඇත.

7. "Clean Sri Lanka" වැඩසටහනෙහි රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් ව්‍යාපෘති යෝජනා ලබා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හා රජය මඟින් ඊට සමගාමීව ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් ආයතනය තුළ ක්‍රියාත්මක කරවීම හා ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.

8. මහාමාර්ග අංශයේ අභ්‍යන්තර කටයුතු ඒකකය ස්ථාපිත කිරීම හා සම්බන්ධීකරණ කිරීම තුළින් ආයතනය තුළ දූෂණය වැලැක්වීම සහ සුපිළිපන්න සංස්කෘතියක් වර්ධනය කිරීම, ආයතනයේ සියලුම ක්‍රියාකාරකම්වල විනිවිධභාවය සහ වගවීම සහතික කිරීම සහ ආයතනික ක්‍රියාකාරකම් සහ තීරණ සම්බන්ධ තොරතුරු වෙත මහජන ප්‍රවේශය සහතික කිරීම, ආයතනය තුළ සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කිරීම, විෂමාචාර වාර්තා කිරීම දිරිගැන්වීම,තොරතුරු හෙළිකරන්නන් ආරක්ෂා කිරීම සහ රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරමින් පවතී.

9. අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ආපදා ණය, දේපල ණය, යතුරුපැදි ණය, උත්සව අත්තිකාරම් ලබා දීම සම්බන්ධ කටයුතු සහ අග්‍රහාර රක්ෂණ ඉල්ලුම් කිරීම සම්බන්ධ කටයුතු කඩිනමින් ඉටු කිරීම.

10. පාර්ලිමේන්තු ප්‍රශ්න, උපදේශක කාරක සභා යෝජනා, මහජන පෙත්සම්, මානව හිමිකම් කඩවීම් හා හා විවිධ පාර්ශවයන්ගෙන් ලැබෙන පැමිණිලි, යෝජනා හා ඉල්ලීම් කෙටි කාලයක් තුළ අදාළ ආයතනවලට යොමු කිරීම, වාර්තා කැඳවීම, යොමු කළ ගැටලුවල වත්මන් තත්ත්වය/ ප්‍රගතිය විමසීම.

11. අමාත්‍යාංශය යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘතිවල නව පත්කිරීම්, සේවා දීර්ඝ කිරීම, නිවාඩු අනුමත කිරීම ඇතුළු ආයතනික කටයුතු කඩිනමින් සිදු කිරීම.

12. ජනාධිපති කාර්යාලය / අගමැති කාර්යාලය මඟින් ලැබෙන හා ගරු අමාත්‍ය / නියෝජ්‍ය අමාත්‍යතුමා වෙත යොමු කෙරෙන පැමිණිලි, අමාත්‍යාංශය වෙත සෘජුවම යොමු කෙරෙන පැමිණිලි, යෝජනා හා ඉල්ලීම් අදාළ ආයතනයන් වෙත යොමු කිරීම, වාර්තා කැඳවීම, යොමු කළ ගැටලුවල වත්මන් තත්ත්වය/ ප්‍රගතිය විමසීම.

1.5.1.2 ප්‍රසම්පාදන අංශය

ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය යටතේ පවතින ප්‍රසම්පාදන අංශය එවකට පැවති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ මග පෙන්වීම මත පිහිටවනු ලැබීය. ඒ අනුව මෙම අමාත්‍යාංශය යටතේ පවතින මාර්ග සංවර්ධන අධිකාරිය හා අමාත්‍යාංශයට අයත් ව්‍යාපෘති මඟින් කරනු ලබන අමාත්‍ය මණ්ඩල හා අමාත්‍යාංශ මට්ටමේ අනුමැතිය ඇතිව සිදුකළ යුතු වූ සියළුම ටෙන්ඩර් කටයුතු සඳහා පහසුකම් සපයන පාර්ශවය ලෙස ක්‍රියා කරමින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දායකත්වය දැක්වීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අමාත්‍යාංශයට අයත් වන ව්‍යාපෘති කළමනාකරණ ඒකක මඟින් වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් සකස් කර මෙම අංශය වෙත එවනු ලබන අතර මෙම අංශය මඟින් එම සියලුම දත්ත සම්බන්ධීකරණය කර සමස්ත වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම පිළියෙල කරනු ලබයි. එසේ පිළියෙල කරනු ලබන සමස්ත වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත මූලිකවම යවනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී වෙනත් රේඛීය අමාත්‍යාංශ, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය ආදී ආයතන වෙත ද, යැවීමට මෙම අංශය මඟින් කටයුතු කරනු ලබයි.

මෙම අංශයේ මානව සම්පත් දායකත්වය ප්‍රසම්පාදන විශේෂඥ තනතුරු එකකින් ද, සංවර්ධන නිළධාරී තනතුරු දෙකකින් ද, කළමණාකරණ නිලධාරී තනතුරු එකකින් ද, කාර්යාල කාර්යය සහයක තනතුරු එකකින් ද සමන්විත වේ.

2025 වර්ෂය තුල ප්‍රදානය කරන ලද අමාත්‍ය මණ්ඩල මට්ටමේ හා අමාත්‍යාංශ මට්ටමේ ප්‍රසම්පාදනයන් ගණන 53 වූ අතර ඒ පිළිබඳ විස්තර ***ඇමුණුම 01*** යටතේ දක්වා ඇත.

ප්‍රසම්පාදන අංශයේ ප්‍රධාන කාර්යභාරය

මෙම අංශයේ කාර්යභාරය පහත දැක්වෙන පරිදි සාරාංශ කර ඉදිරිපත් කළ හැකිය.

- අමාත්‍යාංශයේ වෙනත් අංශ වලින් හා මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ පවතින ව්‍යාපෘති වලින් අවශ්‍ය තොරතුරු ද ලබාගෙන අමාත්‍යාංශයට අදාල සමස්ත වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම.
- මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ සහය ඇතිව මෙම අමාත්‍යාංශයට අදාල අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ සිදු කළ යුතු ටෙන්ඩර් කටයුතු සඳහා ඉහල මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු (SHLPC), සාකච්ඡා සම්මුති කමිටු (CANC), උපදේශක ප්‍රසම්පාදන කමිටු (CPCCs) සහ ඒ සඳහා සහාය දක්වන ලංසු ඇගයීම් කමිටු (BEC) සහ ව්‍යාපෘති කමිටු (PC) පත් කර ගැනීමට අදාල කටයුතු කිරීම.
- අමාත්‍යාංශයට අදාල අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු (MPC), දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (DPC), ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු (PPC) පත්කිරීම හා ඒවාට අදාල ලංසු ඇගයීම් කමිටු (BEC) පත් කිරීම සහ එම මට්ටමේ උපදේශක ප්‍රසම්පාදන කමිටු (CPCM) පත්කිරීමට අදාල කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව සිදුකිරීම.
- ලංසු ඇගයීම් කමිටු සඳහා වෙනත් අමාත්‍යාංශවල සුදුසුකම්ලත් නිලධාරීන් පත්කර ගැනීමේ කටයුතු සිදු කිරීම.
- ප්‍රසම්පාදන කටයුතු හා සම්බන්ධ ලේඛන අනුමත කිරීම, පරිපූරක ලේඛන නිකුත් කිරීම, කොන්ත්‍රාත් ප්‍රදානය හා විවලතා අනුමත කිරීම සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු හා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සංවිධානය කිරීම හා එහිදී ගනු ලබන තීරණ පිළිබඳ වාර්තා තබා ගැනීම.
- සියළුම ප්‍රසම්පාදන කටයුතුවලට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම සඳහා අවශ්‍ය සහය ලබාදීම.
- සාර්ථක නොවූ කොන්ත්‍රාත්කරුවන්ගේ අභියාචනා ලැබුණු විට ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය හා සහයෝගයෙන් කටයුතු කිරීම.
- වාර්ෂික, කාර්තුමය හා මාසික වශයෙන් ප්‍රසම්පාදන ප්‍රගති වාර්තා සකස් කිරීම හා ඒවා භාණ්ඩාගාරයේ ඇති රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- කලින් කලට අනෙකුත් පාර්ශව සංවිධාන මඟින් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කටයුතු වලට අදාලව පවත්වනු ලබන රැස්වීම් සඳහා සහභාගී වීම.
- අමාත්‍යාංශයේ හෝ මාර්ග සංවර්ධන අධිකාරියේ සේවක මණ්ඩලය සඳහා කලින් කලට අවශ්‍ය පුහුණු ව්‍යාපෘති සංවිධානය කිරීම.

ගැටළු හා අභියෝග.

අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී පහත ගැටළු හා අභියෝගයන් හඳුනාගෙන ඇත.

- මූලික සැලසුම් හා සම්බන්ධ ප්‍රමාණ බිල්පත් සකස් කිරීමේදී ඒවායේ නිරවද්‍යතාවය පිළිබඳ සහතික වීමක් නොමැති බැවින් ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේදී ඒවායේ පිරිවැය බලාපොරොත්තු නොවූ ලෙස ඉහළ යාම.
- සැලසුම් සෑදීම, ප්‍රමාණ බිල්පත් සකස් කිරීම, ඉඩම් අත්පත් කර ගැනීම හා පාරිසරික අධ්‍යයන ආදී ප්‍රසම්පාදන පෙර සූදානම් වීමේ කටයුතු, ඇගයීම් කමිටු පත් කිරීමට ප්‍රථම අවසන් කළ යුතු වීම.
- ව්‍යාපෘති ආරම්භ කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතින්හි විෂය පථය වෙනස් කිරීම හා සම්පූර්ණයෙන්ම නව අංගයන් ප්‍රසම්පාදන සැලැස්මට එකතු කිරීම.
- කාර්යය මණ්ඩලවල ප්‍රසම්පාදනය හා සම්බන්ධ දැනුම හිහවීම. (මෙය ශක්‍යතා ගොඩනැගීමේ වැඩසටහන් මඟින් විසඳාලිය හැක.)
- ලංසු පත්‍රිකා අඩුපාඩු සහිතවීම / ප්‍රසම්පාදන කාලරාමුවට අදාල නොවන ලෙස ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ප්‍රමාදවීම.

1.5.1.3 ගිණුම් අංශය

ප්‍රවාහන,මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය වෙත වාර්ෂික අයවැය මඟින් වෙන්කෙරෙන ප්‍රතිපාදන හැසිරවීම, මෙහෙයවීම හා පාලනය කිරීමේ වගකීම ගිණුම් අංශය වෙත පැවරී ඇත. මෙලෙස වෙන් කෙරුණු ප්‍රතිපාදන කළමණාකරණය කිරීමත්, මෙම ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව යෙදවීම තුලින් උපරිම ආර්ථික ප්‍රතිලාභ රජයට ලබාදීම සහතික කිරීම මෙම අංශයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස සැලකිය හැක. අමාත්‍යාංශය යටතට ගැනෙන සියළු සංවර්ධන ව්‍යාපෘති සහ මාර්ග සංවර්ධන අධිකාරිය, මහා භාණ්ඩාගාරය සමඟ සම්බන්ධීකරණය කරමින් අයවැය අරමුදල් නොපමාව සහ බාධාවකින් තොරව උපයෝජනය සඳහා පහසුකම් සැපයීම මෙම අංශයට අයත් වන කාර්යයකි.

මේ හැරුණු කොට උපයෝජිත අරමුදල් තුලින් මූල්‍යමය කාර්යසාධනයන් ඊට සමගාමීව සිදුකරණ ලද වැයබරත් නිරීක්ෂණය කොට අංශයේ මූල්‍යමය තත්ත්වය වාර්තා කිරීමත් සිදුකරනු ලබයි. සියළුම කාර්යාලයීය නිල බැංකු ගිණුම් අධීක්ෂණය, රාජ්‍ය ගිණුම් කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඇතුළු අනෙකුත් අමාත්‍යාංශ හා ආයතන වෙත ඉල්ලුම් කරනු ලබන සියළුම වාර්තා ඉදිරිපත් කිරීම මෙන්ම අංශයේ නිළධාරීන්ගේ කුසලතාවයන් ඉහළ නැංවීම ද ආංශික ක්‍රියාකාරකම් යටතේ සිදු කරනු ලැබේ.

1.5.1.4 ඉඩම් අංශය

ප්‍රවාහන,මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය ඉඩම් අංශය මහාමාර්ග අලුතින් ඉදිකිරීමේ දී හා පුනරුත්ථාපනය කිරීමේ දී අවශ්‍ය වන ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු හා ඒ සම්බන්ධ ක්‍රියාවලිය හා බැඳී සිටින ආයතන හා පුද්ගලයින් සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම සහ ඒ හා අදාළ සියලු කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා වගකිවයුතු ප්‍රධාන අංශය ලෙස හැඳින්විය හැක.

2025 වර්ෂය තුළ අංශයේ ප්‍රධාන කාර්යභාරයන්

- මාර්ග සංවර්ධනයට අත්කරගනු ලබන ඉඩම් සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම.
- නව මාර්ග ව්‍යාපෘති සහ මාර්ග සංවර්ධන කටයුතු වලට අදාල ඉඩම් අත්කර ගැනීම සඳහා, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වන වගන්තියට අනුව අත්පත් යෝජනා ඉදිරිපත් කිරීම.
- 38(අ) අතුරු විධානය යටතේ කඩිනමින් භුක්තිය භාර ගැනීමට අදාල ඉඩම් සඳහා ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ ඉඩම් විෂය භාර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.
- අත්පත් කරගත් ඉඩම් වලට අදාල ඉදිරි කටයුතු ඉඩම් අත්කර ගැනීමේ පනතට අනුව සම්බන්ධීකරණය සිදුකිරීම.
- අත්පත් කරගත් ඉඩම් සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර දීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ අධීක්ෂණය.
- ඉඩම් අත්පත් කර ගැනීම් හා වන්දි ගෙවීමට අදාල කාර්යයන් ඉටුකිරීමේ දී ඉඩම් අමාත්‍යාංශය, තක්සේරු දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා රජයේ මුද්‍රණාලය වැනි ආයතන සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම.
- ඉඩම් අත්පත් කරගැනීමේ හා ප්‍රතිස්ථානගත කිරීමේ විශේෂ කමිටු පැවැත්වීම, කමිටු තීරණ සැකසීම හා කමිටු තීරණ දැනුම්දීම ඇතුළු කාර්යයන් ඉටුකිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ආදී ආයතන මඟින් විමසනු ලබන කරුණු සඳහා වාර්තා ඉදිරිපත් කිරීම.
- මාර්ග සංවර්ධනයට අදාළ අත්කරගත් ඉඩම් සම්බන්ධව ලැබෙන මහජන පැමිණිලි සහ දුක් ගැනවිලි සඳහා ඉදිරි කටයුතු කිරීම.
- මාර්ග අලුතින් ඉදිකිරීම හෝ සංවර්ධනය කිරීමේ කටයුතු වලදී ඉඩම් අත්කරගැනීම නිසා අවතැන් වන පිරිස් ප්‍රතිස්ථානගත කිරීම සඳහා ඉඩම් මිලදී ගැනීමට, ඉඩම් මිලදී ගැනීමේ කමිටුව මඟින් කටයුතු කිරීම.
- ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ අත්කරගත් එහෙත්

මාර්ග සංවර්ධන කටයුතු වලට අවශ්‍ය නොවන බව හඳුනාගත් ඉඩම් සඳහා, ඉඩම් අත්කරගැනීමේ පනතේ 39(අ)(I) වගන්තිය යටතේ අවසතු කිරීමට අදාලව ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

- ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ ආඥාවක් නිකුත් කිරීමෙන් අනතුරුව භුක්තිය භාරගැනීමක් සිදු නොකරන ලද ඉඩම්, ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 39(1) වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට අදාලව ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ ඉඩම් විෂය භාර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

- ඉඩම් අත්කර ගැනීමේ පනතේ 4 වන වගන්තිය යටතේ විරෝධතා පරීක්ෂණ පවත්වා නිර්දේශ ලබා දීම.

- ඉඩම් අත්කර ගැනීමට අදාළව තෙවැනි පාර්ශව විසින් පවරනු ලබන අධිකරණ ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය වාර්තා ලබා දීම, නීති සාකච්ඡා සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- ඉඩම් අත්කර ගැනීමේදී වන්දි ගෙවීම් සම්බන්ධයෙන් වන ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ අවශ්‍ය සම්බන්ධීකරණය කිරීම.

- ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ ආඥාවක් නිකුත් කිරීමෙන් අනතුරුව මාර්ග සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය නොවන බව හඳුනාගත් ඉඩම් සඳහා, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 50 වන වගන්තිය යටතේ අත්හැරීම් සඳහා වන නිර්දේශ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

- මාර්ග සංවර්ධන අධිකාරිය සතු "මහනැගුම" සමාගම් ඇවර කර ඒවායේ සම්පත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතට පවරා මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකරණ හා ව්‍යාපාරික ආකෘතිය ප්‍රතිසංවිධානය කිරීම සම්බන්ධයෙන් වන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- තොරතුරු හා මහජන සම්බන්ධතා විෂය යටතේ පහත සඳහන් රාජකාරී කටයුතු ඉටු කිරීම.

  I. අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ සඳහන් වට්ස් ඇප් (0718757654) අංකය තුළින් ලැබෙන මහජන පැමිණිලි සඳහා විසඳුම් ලබා දීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.

  II. දිනපතා පුවත්පත් වල පළ වන මහාමාර්ග විෂය පථයට අයත්වන ප්‍රවෘත්ති සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු

- අභ්‍යන්තර කටයුතු ඒකකයට අදාළව පැවරී ඇති රාජකාරී හා දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම්වලට අදාළව අමාත්‍යාංශ මට්ටමින් ඉටු කළ යුතු කාර්යයන් සිදු කිරීම.

ඉලක්ක සපුරා ගැනීම් සමාලෝචනය

- ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යාංශය වෙත යෝජනා 35 ක් ඉදිරිපත් කර ඇත.

- ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ 38(අ) අතුරු විධානයන්ට අනුව ගරු අමාත්‍යතුමාගේ අත්සනින් ඉඩම් අමාත්‍යාංශයට නිර්දේශ 38 ක් ඉදිරිපත් කර ඇත.

- ඉඩම් අත්කරගැනීමේ පනතේ 39 (අ) (1) වගන්තිය යටතේ අවසතු කිරීමට අදාලව ඉඩම් අමාත්‍යාංශය වෙත නිර්දේශ 03 ක් ඉදිරිපත් කර ඇත.

- ඉඩම් අත්කරගැනීමේ පනතේ 39 (1) වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට අදාලව ඉඩම් අමාත්‍යාංශය වෙත නිර්දේශ 01 ක් ඉදිරිපත් කර ඇත.

- ඉඩම් අත්කරගැනීමේ පනතේ 50 වන වගන්තිය යටතේ අත්හැරීමට අදාලව ඉඩම් අමාත්‍යාංශය වෙත නිර්දේශ 04 ක් යොමු කර ඇත.

- ඉඩම් අත්කරගැනීමේ හා ප්‍රතිස්ථානගත කිරීමේ විශේෂ කමිටු 06 ක් හා ඉඩම් අත්කරගැනීමේ හා ප්‍රතිස්ථානගත කිරීමේ විශේෂ කමිටු වලදී තීරණ 42 ක් ලබා දී ඇත.

- ජනාධිපති කාර්යාලයෙන් එවන ලද මහජන ගැටළු සඳහා පිළිතුරු 06 ක් යොමු කර ඇත.

- අනෙකුත් මහජන ගැටළු සඳහා පිළිතුරු ලිපි 132 ක් යොමු කර ඇත.

- අමාත්‍ය මණ්ඩල සංදේශ 05 ක් සඳහා අනුමැතිය ලැබී ඇත.

1.5.1.5 අභ්‍යන්තර විගණන අංශය

මූල්‍ය රෙගුලාසි අංක 128 හි දැක්වෙන පරිදි ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් මූල්‍ය රෙගුලාසි අංක 133 දැක්වෙන කාර්යයන් ඉටු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවිය යුතු අතර මෙම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය ඊට අනුකූලව පිහිටුවන ලද්දකි.

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථ ලෙස පහත කරුණු සඳහන් කළ හැකි වේ.

i. අමාත්‍යාංශය තුල අභ්‍යන්තර පාලන ක්‍රමය ශක්තිමත් කිරීමට සහාය වීම.

ii. සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමෙහි සහ සැලසුම් හා වැඩසටහන් සපුරාලීමෙහිලා ලබා ඇති ප්‍රගතිය නිශ්චය කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහාය වීම.

iii. උචිත අවස්ථාවලදී මෙම කර්තව්‍යයන්හි නිරතවන්නන් හා අමාත්‍යාංශ ලේකම් අතර සම්බන්ධීකාරක වශයෙන් ක්‍රියාකිරීම.

මුදල් රෙගුලාසි වලින් නියම කර ඇති කාර්යභාරය ඉටුකිරීම තුලින් 2025 වර්ෂය තුලදී ඵලදායී නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීමට අභ්‍යන්තර විගණන අංශය කටයුතු කර තිබේ.

2025 වර්ෂය තුලදී සිදුකරන ලද විගණන කාර්යයන් සහ විශේෂ පරීක්ෂණයන්

වර්ෂය තුළ හඳුනා ගන්නා ලද අවදානම් ඇගයීම් මත අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයන් සඳහා විවිධ විගණන ක්ෂේත්‍රයන් යටතේ පහත විගණනයන් සිදු කර ඇත.

i. සංවර්ධන ව්‍යාපෘති විගණනය
ii. මූල්‍ය විගණනය
iii. ආයතනික විගණනය
iv. ක්ෂේත්‍ර පරීක්ෂාව

2025 වර්ෂයේ අනුමත අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව ඉහත ක්ෂේත්‍රයන් යටතේ අඛණ්ඩ විගණනයන් හා ඊට අදාළ ස්වාධීන ඇගයීම් සිදු කර ඇති අතර, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති තුළින් අපේක්ෂිත අරමුණු හා ඉලක්කයන් සපුරා ගැනීම සඳහා කටයුතු කිරීම පිළිබඳව විගණනයට ලක්කර, අවශ්‍ය මග පෙන්වීම් සිදුකර ඇත.

විගණන සැලැස්මට පරිබාහිරව 2025 වර්ෂය තුළ අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි විශේෂ විමර්ශන 07 ක් සිදුකර, ඒ සම්බන්ධයෙන් විමර්ශන වාර්තා ඉදිරිපත් කර ඇත. මෙම අභ්‍යන්තර විගණන පරීක්ෂණ සහ විශේෂ විමර්ශන වාර්තා මගින් අමාත්‍යාංශයට සෘජුව බලපාන අභ්‍යන්තර පාලන ගැටළු පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කර තිබේ.

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් ද ව්‍යාපෘති විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් ද පැවැත්වීමට කටයුතු කර තිබේ.තව ද එහි උපදෙස් පරිදි අභ්‍යන්තර විගණන කාර්තු ඇගයීම් සිදුකර එම වාර්තා ඉදිරිපත් කර තිබේ.

<u>ඉලක්ක සපුරා ගැනීම් සමාලෝචනය</u>

2025 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව විගණන කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. එක් එක් විගණන පරීක්ෂණයන් හා විශේෂ විමර්ශනයන් තුළින් ඵලදායී විගණන පැහැදිළි

කිරීම්, නිරීක්ෂණ හා නිර්දේශ ලබා දීමටත්, ඒ තුළින් පරිපාලන සහ මූල්‍ය කළමනාකරණය, කාර්ය මණ්ඩල කළමනාකරණය, වත්කම් කළමනාකරණය, පොදු තැන්පතු ගිණුම් පරීක්ෂාව, රාජ්‍ය නිලධාරීන්ගේ ඇප තැබීම පිළිබඳ පරීක්ෂාව, මුදල් රෙගුලාසි 135 අනුව මූල්‍ය පාලන බලතල බෙදීම පිළිබඳ පරීක්ෂා කිරීම(අමාත්‍යාංශය), රාජ්‍ය නිලධාරීන්ගේ ණය ආපසු ගෙවීම් සහ අයකර ගැනීමේ ක්‍රියාවලීන් පරීක්ෂා කිරීම (අත්තිකාරම් 'B' ගිණුම) 'Clean SriLanka' ජාතික වැඩසටහනට සමගාමීව රාජ්‍ය ආයතන තුළ සංවිධිත බව පවත්වා ගැනීම සඳහා 'සෙයිරි සතිය' (Seiri Week) ක්‍රියාත්මක කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව, කොන්ත්‍රාත් ගෙවීම් පිළිබඳ පරීක්ෂාව - කි.මී 100,000 ව්‍යාපෘතිය යටතේ ගෙවන ලද වැඩ පූර්ව අත්තිකාරම් (Mobilization Advances) අතරින් නැවත අයකර ගැනීමට අපහසු යැයි හඳුනා ගෙන ඇති කොන්ත්‍රාත්තු පිළිබඳ විමර්ශනය, ගෙවීම් වවුවර් සංනිරීක්ෂණය, මහාමාර්ග අමාත්‍යාංශයේ අයවැය ශීර්ෂ යටතේ මාර්ග පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා වෙන් කළ ප්‍රතිපාදන තුළින් සංවර්ධනය කළ මාර්ග අතුරින් තෝරාගත් මාර්ග පරීක්ෂාව, (පෑලියගොඩ - පුත්තලම මාර්ගයේ ක්ෂේත්‍ර පරීක්ෂාව) හා වෙනත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලන දුර්වලතා ඉවත්කර එහි ශක්තිමත්භාවය ඉහළ නැංවීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමෙන් දායකත්වය ලබාදීමට අභ්‍යන්තර විගණන අංශයට හැකියාව ලැබී තිබේ.

තවද අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන මාර්ග සංවර්ධන අධිකාරිය, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව වැනි සමාගම්වල ගැටළු සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මඟින් නිශ්චිත තීරණ ලබාදීම හා ප්‍රගතිය පරීක්ෂා කිරීම මඟින් මෙම ආයතනවල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කරගැනීම සඳහා සහාය ලබා දී තිබේ.

1.5.1.6 ඉංජිනේරු අංශය

ශ්‍රී ලංකාව තුල මහාමාර්ග ඉදිකිරීම් සම්බන්ධ අමාත්‍යාංශ ලේකම්තුමා විසින් පවරනු ලබන සියළු තාක්ෂණික හා ඉංජිනේරුමය වගකීම් මහාමාර්ග අමාත්‍යාංශය වෙනුවෙන් දරනුයේ එහි ඉංජිනේරු අංශයයි. අංශ ප්‍රධානියා ලෙස කටයුතු කරන අතිරේක ලේකම් (ඉංජිනේරු)ගේ පූර්ණ අධීක්ෂණය යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මහාමාර්ග ඉදිකිරීම් සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

එසේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා ඊට අදාල තාක්ෂණික විගණනයන් සිදුකිරීම ද ඉංජිනේරු අංශය මඟින් සිදු කරනු ලබයි.

අංශයේ ප්‍රධාන කාර්යභාරයන්

- මහාමාර්ග ඉදිකිරීම් සම්බන්ධ සියළු ඉංජිනේරුමය කටයුතු අධීක්ෂණය හා අදාල තාක්ෂණික විගණනයන් සිදු කිරීම
- දේශීය හා විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති වල ප්‍රගතිය හා තත්වය අධීක්ෂණය කිරීම
- කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලීම් සහ විචල්‍යයන් සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම
- වාර්ෂික මිල ගණන් ලේඛනය (HSR) සැකසීම
- වෙනත් ආයතන සතු මාර්ග ජාතික මාර්ග ලෙස උත්ශ්‍රේණිගත කිරීම
- බිටුමන් (bitumen) මිලදී ගැනුම් වලදී ගැනුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කරදීම.
- සියළු ව්‍යාපෘති වලට අදාල "ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු (PSC)" සඳහා සහභාගී වීම හා ඒවා සම්බන්ධීකරණය කිරීම.
- අමාත්‍යාංශයේ සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කටයුතු සඳහා සහභාගී වීම
- කොන්ත්‍රාත්කරුවන්ගේ හිමිකම් හා ආරවුල් නිරාකරණයට අදාල කටයුතු සඳහා සහභාගී වීම
- අමාත්‍යාංශ ලේකම් විසින් පවරනු ලබන රාජකාරී ඉටුකිරීම.

<u>ඉලක්ක සපුරා ගැනීම් සමාලෝචනය</u>

- අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින් වර්ෂය තුල ක්‍රියාත්මකව පැවති ව්‍යාපෘති මඟින් ඉදිකෙරුණු මාර්ග හා පාලම් ආදියෙහි ප්‍රගතිය හා තත්ත්වය අධීක්ෂණය කරන ලද අතර ඊට සමගාමීව එක් එක් ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශයීය මට්ටමින් පවත්වන ලද ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම (PCC) සඳහා සක්‍රියව සහභාගී වීමද සිදු කරන ලදී.

- 2025 වර්ෂය සඳහා සකසක ලද මාර්ග මිල ගණන් ලේඛණය (HSR) 2025 පෙබරවාරි මාසය තුල නිමකර නිකුත් කරන ලද අතර 2023 වර්ෂයට අදාල සංශෝධිත මාර්ග මිල ගණන් ලේඛනයක් 2023.08.23 දින නිකුත් කරන ලදි.

- 2025 වර්ෂය තුල මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරන ලද, මහාමාර්ග ඉදිකිරීම් වලට සම්බන්ධ මහජන පැමිණිලි, ස්ථානීය පරීක්ෂණයන්ද සිදු කරමින් විමර්ශනය කරන ලදී.

අභියෝග හා ගැටළු

- මාර්ග මිල ගණන් ගෙන්වාගැනීමේ දී කිහිපවරක් සිහිකැඳවීම් කළ යුතු වීම හා රජය මඟින් වරින් වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ නිසා මිල ගණන් වෙනස් වීම මත මාර්ග මිල ගණන් ලේඛණය (HSR) ජනවාරි මාසය අතුලත නිකුත් කිරීමේ අපහසුතාවය.

1.5.1.7 සැලසුම් හා මෙහෙයුම් අංශය

සැලසුම් හා මෙහෙයුම් අංශය මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සැකසීම සහ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම සහ ඇගයීම හා සම්බන්ධිත අධීක්ෂණය හා සම්බන්ධීකරණය හා බැඳුණු ප්‍රධානතම වගකීම් දරන්නා වූ අංශය වේ.

සැලසුම් හා මෙහෙයුම් අංශය මඟින් 2025 වර්ෂය තුල ඉටු කිරීම සඳහා සැලසුම් කරන ලද ප්‍රධාන කාර්යයන් සාර්ථකව සම්පූර්ණ කරන ලද අතර,එම කාර්යයන්හි ප්‍රගතිය පහත පරිදි දැක්වේ.

- 2025 වර්ෂය සඳහා සකසන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත හා ජාතික විගණන කාර්යාලය වෙත 2025 පෙබරවාරි මස 18 වන දින ඉදිරිපත් කර ඇත.

- 2024 වර්ෂය සඳහා සකසන ලද වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කර 2025 ජූනි මස 27 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- 2026 වසරේ අයවැය විවාදය සඳහා සකසනු ලබන, ප්‍රගති වාර්තාව - 2025 2025 ඔක්තෝම්බර් මස 30 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- 2025 වර්ෂයේ දී, ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම (PCC) 20 ක් සාර්ථක ලෙස පවත්වා ඇත.

- එසේම, අමාත්‍ය මණ්ඩල සංදේශ 52 ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

- විශාල හා මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘතිවල ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සම්බන්ධීකරණය කරන ලද, උසස් අධ්‍යාපන, අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් කේ.එම්.ජී.එස්.එන්. කළුවැව මහතා සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් ජී.එම්.ආර්.ඩී. අපොන්සු මහතා යන මහත්වරුන්ගේ සම-සභාපතිත්වයෙන් පවත්වන ලද රාජ්‍ය ආයෝජන අධීක්ෂණ සහ ඇගයීම් කමිටු (PIMEC) 06 සඳහා අංශය සිය සහභාගීත්වය සපයා ඇත.

- රජයේ මුල්‍යාධාර ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා විද්‍යාත්මකව විශ්ලේෂණය කොට එම ව්‍යාපෘති වාර්තාවලට අදාල සංකල්ප වාර්තා 31 ක් අදාල අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

- මීට අමතරව, වර්ෂය තුල ව්‍යාපෘතීන්හි 2025 වර්ෂය සඳහා විශ්ලේණය කරන ලද මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඇතුලත් කාර්තුමය වාර්තා, මාසික වාර්තා හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත

ඉදිරිපත් කල යුතු විවිධ වාර්තා නිසි පරිදි සකස් කොට ඉදිරිපත් කරන ලදී. එමෙන්ම ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් විසින් ඉදිරිපත් කර ඇති ප්‍රගති වාර්තාවන් තවදුරටත් ඇගයීමට ලක් කිරීමද, වර්ෂය තුල අංශය විසින් සැලසුම් කල සියළුම කාර්යයන් හා අරමුණු ද සාර්ථකව හා කාර්යක්ෂමව 2025 වසර තුළදී ද සැලසුම් කළ පරිදි ඉතාමත් ඵලදායී අයුරින් සිදු කිරීමට පියවර ගන්නා ලදී.

- අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) විසින් ප්‍රධානත්වය දරණ අමාත්‍ය මණ්ඩල සංදේශ සමාලෝචන කමිටුව වෙත අමාත්‍ය මණ්ඩල නිර්දේශ 10 ක් සඳහා ගරු මහාමාර්ග අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත.

- ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් යුත් විශේෂ ව්‍යාපෘති කමිටු රැස්වීම් 05ක් (Special Project Committee Meetings) සංවිධානය කර පවත්වන ලදී.

- හදිසි අවධානය යොමු කළ යුතු කරුණු අධීක්ෂණය කිරීම සඳහා අමාත්‍යාංශ මෙහෙයුම් කමිටු (Ministry Steering Committee) රැස්වීම් 04ක් සංවිධානය කර පවත්වන ලදී.

- ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් හඳුන්වා දෙන ලද අමාත්‍යාංශ කාර්යසාධන අධීක්ෂණ පද්ධතිය (Ministry Performance Monitoring System – MPMS) වෙත දත්ත ඇතුලත් කිරීම හා අමාත්‍යාංශයට අදාළ අනෙකුත් අංශයන්හි ප්‍රගතිය කාර්තුමය වශයෙන් අදාල පද්ධතිය වෙත ඇතුලත් කිරීම.

5.1.8 ග්‍රාමීය මාර්ග සංවර්ධන අංශය

හැඳින්වීම

මාර්ග සංවර්ධනයේ දී ජාතික මාර්ග ජාලය හා සම්බන්ධ වන ග්‍රාමීය මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම ද අත්‍යවශ්‍ය කාර්යයකි. සංවර්ධිත ග්‍රාමීය මාර්ග ජාලයක අවශ්‍යතාව හා වැදගත්කම අවධාරණය කරමින් 2020/08/09 දිනැති අංක 2187/27අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී.

2022 වසරේදී ග්‍රාමීය මාර්ග සංවර්ධන විෂය නැවත ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනුනු අතර, ඒ අනුව ග්‍රාමීය මාර්ග හා පාලම් අංශය ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය යටතේ එක් අංශයක් ලෙස ක්‍රියාත්මක වේ.


වර්තමානයේ, ග්‍රාමීය මාර්ග අංශය විසින් ග්‍රාමීය මාර්ග සංවර්ධනය, ග්‍රාමීය පාලම් සංවර්ධනය සහ ග්‍රාමීය මාර්ගයන්ට අදාළ ව්‍යුහාත්මක වැඩිදියුණු කිරීම් ආදිය ක්‍රියාත්මක කරනු ලබයි.

1.6 වෙනත් ව්‍යවස්ථාපිත ආයතන

1.6.1 මාර්ග සංවර්ධන අධිකාරිය

දැක්ම

"විශිෂ්ඨ මහාමාර්ග ජාලයක් සැපයීම පිළිබඳ සමාජයේ අපේක්ෂාවන් ඉටුකරන, මහාමාර්ග ඉංජිනේරු විද්‍යාවේ බහු විෂයික විශිෂ්ඨත්වයෙන් යුත්, ප්‍රමුඛ ජාතික ආයතනය ලෙස ඇගයීමට ලක්වීම."



මෙහෙවර

"මාර්ග අංශයේ ප්‍රමුඛ ජාතික ආයතනය ලෙස මහජනතාව හා භාණ්ඩ ප්‍රවාහනය සහ ජාතියේ සාමාජීය ආර්ථික සංවර්ධනය සඳහා මග පාදමින්, පිළිගත හැකි මට්ටමක, ආරක්ෂාව හා පහසුව සලසමින් පරිසර හිතකාමී අයුරින්, සංචලතාවය හා ප්‍රවේශකත්වය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් හා කාර්යක්ෂම ජාතික මහාමාර්ග ජාලයක් සැපයීම."

ශ්‍රී ලංකාවේ මහාමාර්ග ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛතම ආයතනය ලෙස සැලකෙන ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතට ගැනෙන ප්‍රධාන ආයතනය මාර්ග සංවර්ධන අධිකාරිය ලෙස හැඳින්විය හැකිය. 1981 අංක 73 දරණ පනත් කෙටුම්පත මඟින් මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත්කෙරුණු අතර 1986 දී එය මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම අනුප්‍රාප්තිකයා බවට පත්විය.

පවතින මාර්ග ජාලය වැඩිදියුණු කිරීම සඳහා අධිවේගී සහ ඒ හා බී ශ්‍රේණියේ මහාමාර්ග නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීමේ ද නව මාර්ග, පාලම් හා අධිවේගී මාර්ග සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීමේ ද වගකීම ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරිය සතුවේ.

1.7 මහාමාර්ග අංශයේ ආයෝජනය

ශ්‍රී ලංකා රජය විසින් නිරන්තරයෙන් රට තුල ඉහළ ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යාම අපේක්ෂා කරනු ලබන අතර එහිදී සිය සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේ දී ශක්තිමත් මාර්ග ජාලයක් පවත්වා ගෙන යාම ඉතා අත්‍යවශ්‍ය සාධකයක් වන බව හඳුනාගෙන ඇත. රට තුල ජීවත් වන ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවීම උදෙසා රජය විසින් නිරන්තරයෙන් ආයෝජනයන් සිදු කරනු ලබන අතර, ප්‍රවාහන අවශ්‍යතාවයන් වෙනුවෙන් වර්ධනය වන ඉල්ලුම සපුරාලීම උදෙසා මහාමාර්ග අංශය සඳහා සමස්තයක් ලෙස ඉතා ඉහළ ආයෝජනයක් සිදු කරනු ලැබේ. මගී ජනතාවට සිය ගමනාන්තය සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි වීම, ඉන්ධන පිරිමැස්ම, ගමනාගමන පිරිවැය අවම වීම, මාර්ග තදබදය අවම වීම යන සාධක හේතුවෙන් මෙම අංශය සඳහා සිදු කරනු ලබන ආයෝජනය ඉතා ඉහළ ආර්ථිකමය වටිනාකමක් උත්පාදනය කරනු ලබන බව නිරීක්ෂණය වී ඇත. 2015 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා මහාමාර්ග අංශය සඳහා සිදුකරන ලද ආයෝජනයන්හි උපයෝජනය පහත වගුවේ දැක්වේ.


වගු අංක 1.7.1 මහාමාර්ග අංශයේ ආයෝජනය (2015-2025)

වර්ෂය	ප්‍රතිපාදන ප්‍රමාණය (රු. බිලියන)	වියදම (රු. බිලියන)	සමුච්චිත වියදම (රු. බිලියන)
2015	196.8	178.0	776.85
2016	172.6	141.7	918.58
2017	206.3	192.0	1110.61
2018	196.4	166.7	1277.28
2019	256.6	156.8	1434.08
2020	255.0	226.3	1660.34
2021	358.3	211.6	1871.94
2022	254.61	200.39	2072.33
2023	348.6	227.2	2299.53
2024	322.5	231.4	2530.93
2025	374.5	353.4	2884.33

මහාමාර්ග අංශයේ ආයෝජනය සම්බන්ධව 2025 වර්ෂයේ සිට නිරූපිත දත්ත නිරීක්ෂණය කිරීමේදී ඉහළම ආයෝජනය 2025 වර්ෂයේදී ද, අවම ආයෝජනය 2016 වර්ෂයේදී ද පෙන්නුම් කර ඇත. රට තුල ගමනාගමන හා ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් ජාතික වශයෙන් ඉතා වැදගත් අධිවේගී මාර්ග, ජාතික මහාමාර්ග ඉදිකිරීම, ජාතික මාර්ගවල පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමට අවශ්‍ය පියවර ගැනීම හේතුවෙන් 2016 වර්ෂයේ දී පෙන්වූ විචලනය හැර සෙසු සෑම වර්ෂයකදීම මෙම අංශය සඳහා වෙන් කෙරුණු ආයෝජන ප්‍රමාණයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරනු ඇත.

දක්ෂිණ අධිවේගී මාර්ගය, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හා පිටත වටරවුම් අධිවේගී මාර්ගය යන අධිවේගී මාර්ගයන්හි ඉදිකිරීම් සාර්ථකව නිම කිරීම තුලින් නගරබදව ගොඩනැගෙන වාහන තදබදය අවම කිරීම මෙන්ම ග්‍රාමීය ජනතාවට සිය නිෂ්පාදන ආර්ථික මධ්‍යස්ථාන වෙත ගෙන යාමට අවශ්‍ය පහසුකම් සැපයීමද සිදු කරන ලද අතර ඒ තුලින් ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රාදේශීය සංවර්ධනය වැඩිදියුණු වීම තුලින් මෑතකාලීනව දළ දේශීය නිෂ්පාදිතය සඳහා පළාත්බදව දක්වනු ලබන දායකත්වය ඉහළ ගොස් ඇත.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සඳහා වූ අංක 117 අයවැය ශීර්ෂය යටතේ 2025 වර්ෂය සඳහා, අයවැය ප්‍රතිපාදනය ලෙස රු.මි. 374,922.27 ක් වෙන් කරන ලද අතර පසුව එම අගය රු.මි. 374,583.24 ක් දක්වා සංශෝධනය විය. ඒ අනුව වාර්තාගත කාලපරිච්ඡේදය අවසාන වන විට, ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය විසින් 94% ක සමස්ත මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.


මහාමාර්ග අංශයේ ආයෝජනය (2015 - 2025)
400
350
300
250
200
150
100
50
0
196.76
178.05
172.6
141.73
206.3
192.03
196.3
166.67
256.6
156.8
255.0
226.26
358.3
211.6
254.6
200.39
348.6
227.2
322.5
231.4
374.5
353.4
2015
2016
2017
2018
2019
2020
2021
2022
2023
2024
2025
වර්ෂය
අයවැය ප්‍රතිපාදනය (රු.බිලියන)
වියදම (රු.බිලියන)

පරිච්ඡේදය 2

ප්‍රගතිය හා ඉදිරිදැක්ම

2.1 නව ප්‍රවේශයන්

ආර්ථික වර්ධනය ඉහළ අනුපාතයකින් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරන අතර මෙම සංවර්ධන ඉලක්කය සපුරා ගැනීම සඳහා මාර්ග ජාලය නිසි තත්ත්වයේ තබා ගැනීම අත්‍යවශ්‍ය බව හඳුනාගෙන ඇත. දිවයින පුරා වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකා රජය විසින් අයවැය ශීර්ෂ අංක 117 යටතේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය වෙත 2025 වර්ෂය සඳහා රු.මිලියන 371,813.77 ක සැලකිය යුතු මුදලක් වෙන් කර ඇත.

වාර්තා කරනු ලබන කාලසීමාව තුලදී නව ප්‍රවේශයන් යටතේ ක්‍රියාවට නැංවීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති හඳුනා ගෙන ඇත.

2.1.1 මධ්‍යම අධිවේගී මාර්ගය - අදියර III (පොතුහැර සිට ගලගෙදර දක්වා)
අදියර II ඉදිකිරීම : රඹුක්කන සිට ගලගෙදර දක්වා

මධ්‍යම අධිවේගී මාර්ගය - අදියර III, ප්‍රධාන කොටස් දෙකක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, පොතුහැර සිට ගලගෙදර දක්වා විහිදෙන මෙම මාර්ගය ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග සංවර්ධනයේ වැදගත් කොටසක් වේ.

I වන කොටස : පොතුහැර සිට රඹුක්කන දක්වා (කි.මී. 0+800 සිට 13+800 දක්වා) මුළු දිග කි.මී 13.8 කි.

II වන කොටස : රඹුක්කන (කි.මී. 13+800) සිට ගලගෙදර (කි.මී. 32+450) දක්වා වන අතර, එහි දිග කි.මී 18.65කි.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ, මධ්‍යම අධිවේගී මාර්ගය අදියර IIIහි දැනට ඉතිරිව ඇති මාර්ග කොටස සම්පූර්ණ කරමින්, ගමන් කාලය අඩු කිරීම, ප්‍රාදේශීය සම්බන්ධතාව වැඩිදියුණු කිරීම සහ මධ්‍යම පළාතේ රථවාහන තදබදය අවම කිරීමයි.

දෙවන අදියර සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු වියදම රු. මී 130,039 කි. 2026 වසරේදී මෙම දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් ලබා ගන්නා ආකාරය පිළිබඳ, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කරමින් සිටී.

මෙම ව්‍යාපෘතිය කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සමීක්ෂණ කටයුතු, මූලික සැලසුම් සැකසීමේ කටයුතු, මූලික ඉදිකිරීම් කටයුතු සහ නියමු මාර්ග ඉදිකිරීමේ කටයුතු ඉදිරියේ දී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

2.1.2 කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය - බෑවුම් අංක 1 (අලුත්මාවත අන්තර් හුවමාරුව)

කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය සඳහා බෑවුම් අංක 1 (Ramp 01) සහ බෑවුම් අංක 2 (Ramp 02) ලෙස කොටස් 02ක් ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර පිටකොටුව සහ අලුත්මාවත යන ප්‍රදේශ සම්බන්ධ කරමින් බෑවුම් මාර්ග ඉදිකිරීම මඟින් කොළඹ නගරය සහ අධිවේගී මාර්ග අතර ප්‍රවේශය වැඩිදියුණු කිරීම මඟින් අපේක්ෂිතය.

කාලෝචිත හා ලාභදායී ලෙස ඉදිකිරීමේ කටයුතු සිදුකිරීම සඳහා බෑවුම් අංක 01හි (Ramp 01) ඉදිකිරීම් කටයුතු දේශීය සමාගමක් හරහා වෙනම කොන්ත්‍රාත්කරුවෙකු වෙත ප්‍රදානය කිරීම වඩාත් සුදුසු බවට යෝජනා වී ඇත.

2.1.3 කඩවත පද්ධති අන්තර්හුවමාරුව සහ මධ්‍යම අධිවේගී මාර්ගය අදියර 01හි මීරිගම දෙසට මීටර් 500 ක් ඉදිකිරීම.

කඩවත සිට මීරිගම දක්වා විහිදෙන මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 1 වන කොටස ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ජාලය, මධ්‍යම අධිවේගී මාර්ගයේ දෙවන අදියර (මීරිගම සිට කුරුණෑගල) හා සම්බන්ධ කරන ප්‍රධානම කොටස වේ.

මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමු අදියරෙහි 3 වන පැකේජය (Package 3) යටතේ, කඩවත පද්ධති අන්තර් හුවමාරුව ඉදිකිරීම සහ මීරිගම දෙසට මීටර් 500 ක මාර්ග කොටසක් ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර, මෙමඟින් අධිවේගී මාර්ගයන් අතර සුමට සම්බන්ධතාවයක් ඇතිකිරීම අපේක්ෂා කරයි. මේ යටතේ කොන්ක්‍රීට් ව්‍යුහයන් සකස් කිරීම, භූමිය සකස් කිරීමේ කටයුතු (Earthworks), පදික වේදිකා/මාර්ග මතුපිට වැඩ (Pavement works), මාර්ග උපකරණ සවිකිරීම් (Road furniture

installation) සහ ගාස්තු අයකරන ස්ථාන (Toll plazas) දෙකක් ඉදිකිරීම මෙන්ම අධිවේගී මාර්ග බෑවුම් පහක් (05 Ramps A–F) ඉදිකිරීමේ කටයුතු සිදු කිරීමට නියමිතය.

2.1.4 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 4 වන කොටස (කුරුණෑගල - දඹුල්ල කොටස)

කුරුණෑගල සිට දඹුල්ල දක්වා ඉදිකිරීමට යෝජිත අධිවේගී මාර්ග කොටස, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ සිව්වන අදියර වේ. මංතීරු හතරකින් යුත් මෙම අධිවේගී මාර්ග කොටසෙහි මුළු දුර කිලෝමීටර් 60.3 ක් වන අතර, රිදීගම, මැල්සිරිපුර, ගලේවෙල, දඹුල්ල (A009) සහ දඹුල්ල (A006) යන ස්ථානයන්හි ඉදිවන අන්තර්හුවමාරු (Interchanges) පහකින් ද සමන්විත වේ.

මෙම ව්‍යාපෘතිය මඟින්, කලාපීය සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම, ගමන් කාලය සහ වාහන මෙහෙයුම් පිරිවැය අඩු කිරීම මෙන්ම ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථාන වෙත ප්‍රවේශවීමේ පහසුව වැඩිදියුණු කිරීම මඟින් සැලකියයුතු ආර්ථික බලපෑමක් ඇතිකරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එය භාණ්ඩ හා පුද්ගලයින් වඩාත් කාර්යක්ෂමව ප්‍රවාහනය කිරීමටත්, සංචාරක ව්‍යාපාරය නංවාලීමටත් එමඟින් ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීමටත් හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, ග්‍රාමීය ප්‍රදේශ ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන සමඟ සම්බන්ධ කිරීම හරහා සමතුලිත කලාපීය සංවර්ධනය ඇතිවීම තුලින් රටේ ජාතික ආර්ථික වර්ධනයට සහ තරඟකාරිත්වයට අවස්ථාවක් ලැබෙතැයි අපේක්ෂා කෙරේ.

මෙම මාර්ග කොටස සඳහා වන ශක්‍යතා අධ්‍යයනය (Feasibility study) නිම කර ඇති අතර, පාරිසරික බලපෑම් ඇගයීම් තක්සේරු වාර්තාව (EIA) සඳහා වන අනුමැතිය ද ලැබී ඇත. මෙම ව්‍යාපෘතියෙහි ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2017 වසරේදී ආරම්භ කෙරුණු අතර එය 2023 වසර දක්වාම සිදු කෙරුණු අතර, එවකට රට තුළ පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය සමනය වනතෙක් වසර කිහිපයක් සඳහා මෙම ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව නතර කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ බලතල සහිත නිලධාරී කමිටුව (RAMP) විසින් තීරණය කරන ලදි.

ඒ අනුව, එම කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 2023.02.15 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් පසුව, 2023.03.20 දිනැති අමප/23/0345/608/030 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, දැනටමත් අර්ධ වශයෙන් වන්දි ගෙවා ඇති, ඉඩම් කොටස් සඳහා ඉතිරි වන්දි මුදල් ගෙවීමටත්, ඉන් අනතුරුව එම ඉඩම් කොටස් සම්බන්ධ ඉදිරි කටයුතු ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරීමටත්, වන්දි ගෙවා නොමැති ඉඩම් කොටස් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට අනුව නිදහස් කිරීමටත් තීරණය කර ඇත.

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ කුරුණෑගල සිට දඹුල්ල දක්වා වූ කොටස ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීම සඳහා, දැනට අත්හිටුවා ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නැවත ආරම්භ කිරීමට 2024 ජූනි 05 දිනැති අංක 21/2024 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් යෝජනා කරන ලද අතර, 2023.03.20 දිනැති අංක 23/0345/608/030 දරන කැබිනට් තීරණයට යටත්ව ඒ සඳහා ඉදිරි කටයුතු කරගෙන යාමට මේ වන විට අනුමැතිය ලබා දී ඇත.

2.1.5 රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය

මෙම අධිවේගී මාර්ගය ඉදිකිරීමේ අරමුණ වන්නේ බස්නාහිර, දකුණ හා සබරගමු පළාත් අතර, ප්‍රවාහන පහසුකම්, ප්‍රවේශවීමේ හැකියාව සහ අන්තර්-සම්බන්ධතාවය ඉහළ නැංවීම මඟින් පළාත් අතර පවතින සම්බන්ධතාවය තවදුරටත් ශක්තිමත් කිරීමයි.

මෙම ව්‍යාපෘතිය කොටස් 3ක් යටතේ නිම කිරීමට සැලසුම් කර ඇති අතර, දැනට පවතින තත්ත්වය සලකා බලා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත පදනම්ව, එහි 1 වන කොටස ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

- **1 වන කොටස – කහතුඩුව සිට ඉංගිරිය දක්වා වූ මාර්ග කොටස (කි.මී 0.00 සිට කි.මී 25.00 දක්වා)**

මෙම අධිවේගී මාර්ග කොටස කි.මී 25 ක දිගකින් යුතු වන අතර, කහතුඩුව, හොරණ සහ ඉංගිරිය යන ස්ථානවල ඉදිවන අන්තර් හුවමාරු 3 කින් ද සමන්විත වන පරිදි සැලසුම් කර ඇත.

2.1.6 කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව A004 මාර්ගයේ ගොඩගම සිට අවිස්සාවේල්ල දක්වා (කි.මී 27+430 සිට කි.මී 58+550 දක්වා වූ) කොටස මංතීරු 4ක් දක්වා පුළුල් කිරීම

අවිස්සාවේල්ල හරහා දිවෙන මෙම මාර්ගය, කොළඹ දිස්ත්‍රික්කය, සබරගමුව, ඌව සහ මධ්‍යම පළාත් වෙත සම්බන්ධ කරන ප්‍රධානතම මාර්ගයක් ලෙස හැඳින්විය හැක. වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇති අපේක්ෂිත මාර්ග කොටස මඟින් AA004 මාර්ගය සහ කැලණිවැලි දුම්රිය මාර්ගය භාවිතා කරන්නන් හට වඩාත් වැදගත් වන අතරම එමඟින් මගීන් හට බහුවිධ ප්‍රවාහන පහසුකම් ප්‍රවේශය ලබා දෙනු ඇත.

පුවක්පිටිය හරහා දිවෙන කි.මී.08ක පමණ වන මාර්ග කොටස මාර්ග උරහිස් නොමැති පටු මංතීරු දෙකක මාර්ගයක් වන අතර, කිලෝමීටර් 3.5 ක පමණ සීමාවක් තුළ දුම්රිය හරස් මාර්ග හතරක් පිහිටා තිබීම හේතුවෙන් රථවාහන ගමනාගමනයට දැඩි බාධා එල්ල වී ඇත. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය මඟින් ඉහත මාර්ගය මංතීරු හතරක් දක්වා පුළුල් කිරීමත් දුම්රිය මාර්ගය නවීකරණය කර වෙනත් ස්ථානයකට ගෙනයාමත් සිදුකිරීමට අපේක්ෂා කරන අතර එමඟින් ගමනාගමනයට එල්ල වී දැඩි බාධාවලට විසඳුම් ලැබෙනු ඇත.

කිලෝමීටර් 31.12 ක දුර ප්‍රමාණයකින් සහ මීටර් 24 ක පළලකින් යුත් මෙම මාර්ග කොටස වැඩිදුයුණු කිරීම සඳහා දළ වශයෙන් රුපියල් බිලියන 57ක් පමණ මුදලක් වැයවෙනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

ඒ අනුව, මෙම මාර්ග කොටස වැඩිදියුණු කිරීමෙන් දුම්රිය හරස් මාර්ග ඉවත් කිරීම සහ මාර්ග ධාරිතාවය පුළුල් කිරීම මඟින් නාගරික රථවාහන තදබදය අවම කිරීම හා මගීන්ගේ ගමනාගමන පහසුව වැඩිදියුණු කිරීමට ව්‍යාපෘතිය සැලකිය යුතු දායකත්වයක් සපයන අතර එමඟින් මගීන්ගේ විශ්වාසනීයත්වය දියුණු කරයි. එපමණක් නොව, ප්‍රවාහන යටිතල පහසුකම් වඩාත් ස්ථාවර සහ ඉඩකඩ සහිත ස්ථාන කරා පෙළගැස්වීම තුළින්, නාගරිකරණය නිසා ඇතිවන පාරිසරික බලපෑම් හමුවේ දිගුකාලීන තිරසාරභාවය තහවුරු කරමින්, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ආපදා අවදානම් තත්ව අවම කිරීමේ හැකියාව ද මෙම ව්‍යාපෘතිය මඟින් සිදුවේ. මේ වන විට මෙම ව්‍යාපෘතිය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ඇගයීමට ලක්වෙමින් පවතී.

2.2 අධිවේගී මාර්ග සංවර්ධනය

ඕනෑම රටක පුද්ගල ජීවන තත්වය වැඩිදියුණු කිරීමට සහ වේගවත් ආර්ථික සංවර්ධනයක් ඇති කරලීමට කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් ස්ථාපනය කිරීම පූර්ව අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. පවතින මාර්ග ජාලය ඉතා පුළුල් වුවද බොහෝ ජාතික හා පළාත් මාර්ග ඉදිකර ඇත්තේ මීට දශක පහකටත් පෙර වන අතර එමඟින් පහසුකම් සලසා ඇත්තේ එකී කාලයේ පැවති රථවාහන ධාරිතාවය සහ වාහනවල වර්ගයන් සහ අදාල වේග සීමාවන්ට අනුකූල වන පරිදිය.එමනිසා දිවයිනේ සියලුම ප්‍රදේශ එකිනෙක සම්බන්ධ කරමින් එහා මෙහා යා හැකි උසස් තත්වයකින් යුත් මාර්ග ජාලයක අවශ්‍යතාවය මේ වන විට හඳුනාගෙන ඇති අතර ජාතික මාර්ග ජාලය වර්ධනය උදෙසා සියලුම ආර්ථික මධ්‍යස්ථාන ආවරණය වන පරිදි කි.මී. 800 කින් යුත් අධිවේගී මාර්ග ජාලයක් ඇති කිරීමට සැලසුම් කර ඇත. වර්තමානයේදී, උසස් තත්ත්වයෙන් යුත් අධිවේගී මාර්ග ජාලයක් නිර්මාණය කිරීම සඳහා හඳුනාගත් අධිවේගී මාර්ගයන් පහත පරිදි වේ.

1	කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය (කි.මී. 25.1)
2	කොට්ටාව සිට මත්තල දක්වා (කි.මී. 200) සහ අන්දරවැව සිට හම්බන්තොට දක්වා වූ (කි.මී. 16.6) දක්ෂිණ අධිවේගී මාර්ගය
3	කොට්ටාව සිට කෙරවලපිටිය දක්වා වූ පිටත වටරවුම් මාර්ගය (කි.මී. 29.5)
4	මධ්‍යම අධිවේගී මාර්ගය (කි.මී. 166.6)
5	නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කුළුණු මත ඉදිවන අධිවේගී මාර්ගය (කි.මී. 16.4)
6	කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ගය (කි.මී. 6)
7	රුවන්පුර අධිවේගී මාර්ගය

උක්ත ලැයිස්තුවට අනුව කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය, කොට්ටාව සිට මත්තල දක්වා සහ අන්දරවැව සිට හම්බන්තොට දක්වා වූ දක්ෂිණ අධිවේගී මාර්ගයට අයත් අධිවේගී මාර්ග කොටස්, කොට්ටාව සිට කෙරවලපිටිය දක්වා වූ පිටත වටරවුම් මහාමාර්ගය සහ මීරිගම සිට කුරුණෑගල දක්වා වූ මධ්‍යම අධිවේගී මාර්ගයේ දෙවන අදියර මහජනතාවගේ භාවිතය සඳහා විවෘත කර ඇත.

මීට අමතරව ඉතිරි අධිවේගී මාර්ග කොටස් අතුරින් කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය නිමකිරීමට අවසන් තත්ත්වයේ පවතින අතර නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කුළුණු මත ඉදිවන අධිවේගී මාර්ගය හා රුවන්පුර අධිවේගී මාර්ගය රටෙහි පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් තාවකාලිකව අත්හිටුවා ඇත.

ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ජාලය විදහා දැක්වෙන සිතියම ***ඇමුණුම 02*** හි දක්වා ඇත.

2.2.1 අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශය

ප්‍රවාහන,මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශයට අනුබද්ධ ආයතනයක් වන මාර්ග සංවර්ධන අධිකාරියේ, අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු සහ කළමනාකරණ අංශය සතු වගකීම වන්නේ මෙහෙයුම් කටයුතු, නඩත්තු කිරීම් කටයුතු සහ කළමනාකරණය යන කාර්යයන් ඉටුකිරීම මඟින් අධිවේගී මාර්ගයන්හි කටයුතු බාධා රහිතව පවත්වාගෙන යාමයි.

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2023.06.26 දින නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව අධිවේගී මාර්ගයන්හි කළමණාකරණය හා අධිවේගී මාර්ගයේ වත්කම් මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පූර්ණ රාජ්‍ය හිමිකාරීත්වයක් ඇති "සහස්‍රා ආයෝජන සමාගම" යටතට පවරා ඇත. කැබිනට් පත්‍රිකාව වර්ෂය අවසාන වන තුරු ක්‍රියාත්මක වී නොතිබුණි.

මෙම අංශයේ ප්‍රධාන වගකීම් ලෙස අයවැය කරණය සහ විගණනය කිරීම ද ඇතුළත්ව රථවාහන ගමනාගමන කටයුතුවල මූලික සැලසුම් කිරීම්, කළමනාකරණය කිරීම් සහ මෙහෙයවීම්, ගාස්තු අයකිරීමේ කාර්යයන් සහ

අධිවේගී මාර්ගයන්හි අදාල නඩත්තු කටයුතු සිදු කිරීම ද දැක්විය හැකිය.

රථවාහන ගමනාගමන තත්ත්වය

කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය, පිටත වටරවුම් අධිවේගී මාර්ගය සහ කොට්ටාව සිට මත්තල සහ අන්දරවැව - හම්බන්තොට දක්වා වූ අධිවේගී මාර්ග කොටස ද සහිත දක්ෂිණ අධිවේගී මාර්ගයේ රථවාහන ගමනාගමන ධාරිතාවය පිළිබඳ විස්තර වගු අංක 2.2.1.1 හි දක්වා ඇත.

වගු අංක 2.2.1.1 – 2025.12.31 දිනට අධිවේගී මාර්ගයන්හි සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමන ධාරිතාවය

වර්ෂය	පිටත වටරවුම් අධිවේගී මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගයසහඅන්දරවැව සිට හම්බන්තොට දක්වා වූ අධිවේගී මාර්ග කොටසෙහි සාමාන්‍ය දෛනික රථවාහන ධාරිතාවය	කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයෙහි සාමාන්‍ය දෛනික රථවාහන ධාරිතාවය
2014	19,095	18,401
2015	27,736	20,782
2016	44,384	23,974
2017	52,977	25,844
2018	60,524	27,971
2019	65,246	27,640
2020	71,857	19,117
2021	77,056	21,762
2022	59,833	24,746
2023	80,416	29,434
2024	81,561	34,292
2025	103,211	30,724

2022 වර්ෂයෙන් පසු 2023 වර්ෂයේ ආරම්භයේ සිට මෙහෙයුම් තත්ත්වයේ පවතින සියළුම අධිවේගී මාර්ගයන්හි රථවාහන ගමනාගමන ධාරිතාවය වෙන් වෙන් වශයෙන් වාර්තා කර ඇත.

2025 වර්ෂය අවසානයේ එක් එක් අධිවේගී මාර්ගයන්හි සාමාන්‍ය රථවාහන ගමනාගමන ධාරිතාවය පහත පරිදි වේ.

වගු අංක 2.2.1.2 - අධිවේගී මාර්ගයන්හි සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමන ධාරිතාවය - 2025

අධිවේගී මාර්ගයේ නම	සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමන ධාරිතාවය
දක්ෂිණ අධිවේගී මාර්ගය	37,732
දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව	9,528
පිටත වටරවුම් අධිවේගී මාර්ගය	40,971
කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය	30,724
මධ්‍යම අධිවේගී මාර්ගය අදියර II (මීරිගම – කුරුණෑගල)	14,980

ඉහත සඳහන් වගුවට අනුව වැඩිම රථවාහන ගමනාගමන ධාරිතාවයක් වාර්තා වී ඇත්තේ පිටත වටරවුම් අධිවේගී මාර්ගය මඟින් වන අතර අවම රථවාහන ගමනාගමන ධාරිතාවයක් වාර්තා වී ඇත්තේ දක්ෂිණ අධිවේගී මාර්ග දිගුවෙනි.

ඉහත වගු අංක 2.2.1.1මඟින් දක්වා ඇති දත්තයන්ට අනුව පිටත වටරවුම් අධිවේගී මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය සහ අන්දරවැව සිට හම්බන්තොට දක්වා වූ අධිවේගී මාර්ග කොටසෙහි සාමාන්‍ය දෛනික රථවාහන ධාරිතාවය 2024 වර්ෂයට වඩා 21% කින් වර්ධනය වී ඇත.

කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයෙහි දෛනික රථවාහන ධාරිතාවය එම අධිවේගී මාර්ගය මහජනතාවට විවෘත කළ දින සිට වාර්ෂිකව වර්ධනය වී ඇති නමුත් 2024 වසරට සාපේක්ෂව 2025 වසරේදී සාමාන්‍ය දෛනික රථවාහන ධාරිතාවය 11% කින් පමණ අඩුවී ඇත.

2025 වර්ෂයේදී අධිවේගී මාර්ගයන්හි මාසික රථවාහන ධාරිතාවය

2025 වර්ෂයේදී දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව හැර අනිකුත් සියළුම අධිවේගී මාර්ගයන්හි වැඩිම මාසික රථවාහන ධාරිතාවය අගෝස්තු මාසයේදී වාර්තා වී ඇත. 2024 වර්ෂයේදී වැඩිම මාසික රථවාහන ධාරිතාවයක් වාර්තා වී ඇත්තේ දෙසැම්බර් මාසයේදීය. 2025 වර්ෂයේ අවම

මාසික රථවාහන ධාරිතාවයක් වාර්තා වී ඇත්තේ පෙබරවාරි මාසයේදී ය.

2025 වර්ෂය අවසන් වන විට සියළුම අධිවේගී මාර්ගයන්හි මාසික රථවාහන ගමනාගමන ධාරිතාවයන්හි සන්සන්දනාත්මක විස්තරයක් ***ඇමුණුම 03 (අ) හා (ආ)*** මඟින් දක්වා ඇත.

අධිවේගී මාර්ගයන්හි වාර්තා වූ ආදායම් තත්ත්වය

වගු අංක 2.2.1.3 – 2025 වර්ෂයේදී අධිවේගී මාර්ගයන්හි ආදායම

අධිවේගී මාර්ගයේ නම	ආදායම (රු.මි)
දක්ෂිණ අධිවේගී මාර්ගය	5,039.95
දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව	1,921.11
පිටත වටරවුම් අධිවේගී මාර්ගය	4,356.95
කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය	4,048.65
මධ්‍යම අධිවේගී මාර්ගය අදියර II (මීරිගම – කුරුණෑගල)	1,580.47

ඒ අනුව, 2025 වර්ෂයේදී වාර්තා වූ දත්තයන්ට අනුව, දක්ෂිණ අධිවේගී මාර්ගය මඟින් වැඩිම ආදායමක් උපයා ගෙන ඇති අතර අවමය වාර්තා වී ඇත්තේ මධ්‍යම අධිවේගී මාර්ගයේ අදියර II මඟිනි.

තවද, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ වාර්තා වූ ආදායම 2020 හා 2021 යන වර්ෂයන් හැර අනෙකුත් වර්ෂයන්හි වාර්ෂිකව ඉහල ගොස් ඇති අතර එම කාලය තුල රටෙහි පැවති කොවිඩ් -19 වසංගතය රථවාහන ආදායම පහළ යාම කෙරෙහි බලපා ඇත.

වර්ෂය	දක්ෂිණ අධිවේගී මාර්ගය,අන්දරවැව සිට හම්බන්තොට දක්වා වූ අධිවේගී මාර්ගය හා පිටත වටරවුම් අධිවේගී මාර්ගයන්හි ආදායම (රු.මි)	කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයෙහි ආදායම (රු.මි)
2011	83.19	-
2012	1,017.02	-
2013	1,256.65	282.16
2014	2,141.35	1,887.73
2015	3,128.89	2,163.27
2016	4,550.89	2,496.81
2017	5,214.20	2,606.75
2018	5,893.92	2,821.78
2019	6,192.18	2,744.82
2020	5,811.61	1,461.55
2021	6,528.33	1,734.92
2022	6239.04	2008.80
2023	9,079.84	2,946.43
2024	11,404.12	3,588.21
2025	12,898.47	4,048.65

2025 වර්ෂය අවසන් වනවිට වැඩිම මාසික ආදායමක් උපයාගෙන ඇත්තේ අගෝස්තු මාසයේදී වන අතර අවම මාසික ආදායම වාර්තා වී ඇත්තේ පෙබරවාරි මාසයේදීය.

අධිවේගී මාර්ගයන්හි මාසික ආදායම් දත්ත පිළිබඳ විස්තරයක් ***ඇමුණුම 02 (ඇ) හා (ඈ)*** මඟින් දක්වා ඇත.

2.2.2 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය

නව යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය මීට ඉහත යෝජනා වී තිබූ කොළඹ - නුවර අධිවේගී මාර්ගයේ හා උතුරු අධිවේගී මාර්ගයේ විෂය පථයන් ඒකාබද්ධ කර නව අධිවේගී මාර්ගයක් ලෙස හඳුන්වා දෙන ලද අතර, මෙම නව සැලැස්ම මධ්‍යම අධිවේගී මාර්ගය ලෙස නම් කරන ලදී.

යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත් පැකේජ 04ක් යටතේ සිදු කිරීමට තීරණය කර ඇති අතර, ඊට අදාල තොරතුරු පහත දක්වා ඇත. ඉදිකිරීමට නියමිත සම්පූර්ණ මාර්ග කොටසෙහි ආර්ථික ශක්‍යතා

අධ්‍යයන කටයුතු සම්පූර්ණ කර ඇති අතර, එය මොරටුව විශ්වවිද්‍යාලය මඟින් සිදු කරන ලදී. එසේම, මේ සඳහා වන පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සඳහා ද අනුමැතිය හිමි ව ඇත.

පැකේජ අංක 1: කඩවත සිට මීරිගම දක්වා කොටස

මුළු දුර	: පැකේජය I සහ II - කි.මී 36.475 පැකේජය III - කි.මී 0.506
අරමුදල් සපයන ආයතනය	: චීන අපනයන හා ආනයන බැංකුව
මුළු ඇස්තමේන්තුගත පිරිවැය	: රු. මි 186,572
සංශෝධිත මුළු ඇස්තමේන්තුගත පිරිවැය:	රු. මි 267,976
ණය මුදල	: ඇ.ඩො.මි. 989.45
මුල් ආරම්භක දිනය	: පැකේජය I සහ II - 2020.09.15 පැකේජය III – 2025.10.07
සංශෝධිත සම්පූර්ණ කිරීමේ දිනය	: පැකේජය I සහ II – 2027.03.28 පැකේජය III – 2028.09.01
කොන්ත්‍රාත් මුදල	: I සහ II පැකේජය – රු. බි 229 III පැකේජය – රු. බි 10

මංතීරු හතරකින් යුත් මෙම කොටස කඩවත, ගම්පහ, වේයන්ගොඩ සහ මීරිගම-දකුණ යන ස්ථානවල පිහිටි අන්තර් හුවමාරු මධ්‍යස්ථාන 04කින් ද සමන්විත වේ. මෙම අදියර කොන්ත්‍රාත් පැකේජ 02ක් යටතේ සිදු කෙරේ.

I. කොන්ත්‍රාත් පැකේජ 1 - කඩවත සිට කොස්සින්න දක්වා කොටස ඉදිකිරීම

II. කොන්ත්‍රාත් පැකේජ 2 - කොස්සින්න සිට මීරිගම දක්වා කොටස ඉදිකිරීම

III. කොන්ත්‍රාත් පැකේජ 3 - කඩවත අන්තර් හුවමාරුවේ සිට කොස්සින්න දක්වා කොටස ඉදිකිරීම

මෙම අදියරේ ඉදිකිරීම් සඳහා වන ණය ගිවිසුම 2020.03.22 වන දින චීන අපනයන හා ආනයන බැංකුව සමඟ අත්සන් කර ඇතත් සිවිල් වැඩ ආරම්භ කිරීම සඳහා වූ නියෝගය නිකුත් කර ඇත්තේ 2020 සැප්තැම්බර් මස 15 වන දිනය.

2025 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන විට ඉදිකිරීම් කටයුතු සඳහා 39.6%ක ප්‍රගතියක් වාර්තා වී තිබූ අතර 2024 වර්ෂය අවසානය වන විට එය 36.14% ක් ලෙස වාර්තා විය.

2024 වර්ෂය අවසාන වන විට නියමු මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කි.මී. 34.0 ක් නිම කරමින් 81%ක ප්‍රගතියක් හා ඉදිකිරීමට සැලසුම් කර තිබූ තාවකාලික පාලම් 26ක් අතුරින් පාලම් 21ක ඉදිකිරීම් කටයුතු ද නිම කර තිබුණි.

වාර්තා කරනු ලබන කාලසීමාව අවසන් වන විට කි.මී. 42.1කින් යුතු නියමු මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 89%ක ප්‍රගතියක් සහිතව කි.මී. 37.47 ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබූ අතර GIC සබැඳි මාර්ගයේ (GIC Link road) පාලම් දෙකක් ඇතුළුව ඉදිකිරීමට සැලසුම් කර තිබූ තාවකාලික පාලම් 29ක් අතුරින් පාලම් 27ක ඉදිකිරීම් කටයුතු ද සම්පූර්ණ කොට තිබුණි.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	විස්තරය	2025 වසර සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය (සංශෝධිත) රු.මි.	වියදම (රු.මි)
117-02-03-18	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	300.00	243.00
	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	70,465.00	70,453.92
	එකතුව	**70,765.00**	**70,696.92**

2025 වර්ෂයේ දෙසැම්බර් මස 31 දින වන විට මෙම ව්‍යාපෘතිය 99.9%ක මූල්‍ය ප්‍රගතියක් ලභා කරගෙන ඇත.

පැකේජ අංක 2: මීරිගම සිට කුරුණෑගල දක්වා කොටස

මුළු දුර ප්‍රමාණය	: කි.මී. 40.9
අරමුදල් සපයන ආයතනය	: දේශීය බැංකු ආධාර
ඇස්තමේන්තුගත මුදල	: රු.මි. 149,020
ඇස්තමේන්තුගත මුදල(සංශෝධිත)	: රු.මි. 149,020
ආරම්භක දිනය	: 16.01.2017
අවසන් වන දිනය	: 31.12.2021
කොන්ත්‍රාත් මුදල	: රු.මි. .148,520

මංතීරු 04කින් යුත් මෙම අධිවේගී මාර්ගය මීරිගම-උතුර, නාකලගමුව, පොතුහැර (හුවමාරු පද්ධතිය), දම්බොක්ක සහ කුරුණෑගල යන ස්ථානවල පිහිටා ඇති අන්තර් හුවමාරු 05කින් ද සමන්විත වේ. ශ්‍රී ලංකා රජය විසින් දේශීය බැංකු හරහා ලබාදෙන ණය මුදලක් මෙම අදියරෙහි ඉදිකිරීම් කටයුතු සඳහා වෙන් කර ඇත.

මෙම අදියරේ ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂයේදී නිම කෙරුණු අතර 2022 ජනවාරි මාසයේදී මහජනතාව සඳහා විවෘත කරන ලදී.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ක්ෂේත්‍රය	විස්තරය	2025 වසර සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය (සංශෝධිත) රු.මි.	වියදම (රු.මි)
117-02-03-19	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	100.00	100.00
	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	1,090.00	960.87
	එකතුව	**1,190.00**	**1,060.87**

2025 වර්ෂයේ අවසානය වන විට වන විට මෙම ව්‍යාපෘතිය 89%ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

පැකේජ අංක 3: පොතුහැර සිට ගලගෙදර දක්වා කොටස

මුළු දුර ප්‍රමාණය	: කි.මී. 32 .45
අරමුදල් සපයන ආයතනය	: ශ්‍රී ලංකා රජය
ඇස්තමේන්තුගත මුදල	: රු මි. 129,897.64
ඇස්තමේන්තුගත මුදල(සංශෝධිත)	: රු.මි. 214,1866
කොන්ත්‍රාත් මුදල	: රු. මි 214,866
ආරම්භක දිනය	: 2021 ජනවාරි
අවසන් වන දිනය	: 2024 දෙසැම්බර්
අවසන් වන දිනය (සංශෝධිත)	: 2029 ජූනි

මංතීරු 04කින් සහ පොතුහැර පිහිටි පද්ධති අන්තර් හුවමාරුවක් හා පොල්ගහවෙල, රඹුක්කන හා ගලගෙදර පිහිටි සේවා අන්තර් හුවමාරු 03 කින් හා අන්තර්හුවමාරු 04 කින් ද සමන්විත මෙම කොටසේ මුළු දුර ප්‍රමාණය කි.මී. 32.45කි.

මෙම අදිරෙහි පළමු කොටස වන කි.මී. 0+800 (පොතුහැර - ලිහිණිගිරිය) සිට කි.මී. 13+800 (රඹුක්කන) දක්වා කොටසෙහි ඉදිකිරීම් කටයුතු දේශීය අරමුදල් මඟින් අදියර 02ක් ඔස්සේ මාර්ග සංවර්ධන අධිකාරියෙහි අධීක්ෂණය යටතේ දේශීය කොන්ත්‍රාත්කරුවන් මඟින් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව, පළමු අදියරෙහි ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමේ අරමුණින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් මෙකී අදියරෙහි ඉදිකිරීම් කටයුතු පැකේජ 17 කට වෙන් කොට දේශීය කොන්ත්‍රාත්කරුවන් 17 ක් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත. මෙම පැකේජවල ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂයේ අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද අතර එවකට රටෙහි පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් මාස 15ක කාලයක් ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබූ අතර නැවතත් 2023 වර්ෂයේ ජූලි මාසයේදී ආරම්භ කරන ලදී.

මෙහි දෙවන අදියර මඟින් උක්ත කොන්ත්‍රාත් පැකේජයන් යටතේ ඉදිකරනු ලබන මාර්ගයන්හි මතුපිට සකස් කිරීමේ කටයුතු කොන්ත්‍රාත් පැකේජ 03ක් ලෙස ක්‍රියාත්මක කිරීම (1T,1U,1V) 2025 වර්ෂයේ මැයි මාසයේදී ආරම්භ කරන ලදී.

රඹුක්කන සිට ගලගෙදර දක්වා වූ (කි.මී. 13+800 - කි.මී. 32+450) දෙවන කොටසෙහි ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍යාධාර සපයා ගැනීම සම්බන්ධයෙන් මෙතෙක් තීරණය කර නොමැත.

2024 වර්ෂය අවසානය වන විට මෙම ව්‍යාපෘතියෙහි සිවිල් වැඩ සඳහා 22.61%ක සමුච්ඡිත ප්‍රගතියක් අත්කරගෙන තිබූ අතර 2025 වර්ෂය අවසානයේදී එම අගය වාර්තා වූයේ 28.30% ක් ලෙසිනි.

2024 වර්ෂයේදී මෙම ව්‍යාපාතියේ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සඳහා 90% ප්‍රගතියක් වාර්තා කර තිබුන ද වාර්තා කරනු ලබන කාලසීමාව අවසන් වන විට මෙම ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා 89.67%ක අඩු ප්‍රගතියක් වාර්තා වී ඇත්තේ 2025 වර්ෂය තුළදී සිදුකරන ලද අමතර ඉඩම් අත්පත් කර ගැනීම හේතුවෙනි.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	විස්තරය	2025 වසර සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය (සංශෝධිත) රු.මි.	වියදම (රු.මි)
117-02-03-20	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	250.00	232.28
	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	15,155.31	15,110.21
	එකතුව	**15,405.31**	**15,342.50**

2025 වර්ෂය අවසන් වන විට මෙම ව්‍යාපෘතියේ 99.60%ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වී ඇති අතර 2024 වර්ෂයේදී එම අගය වාර්තා වූයේ 100% ලෙසිනි.

මධ්‍යම අධිවේගී මාර්ගයේ පිහිටීම විදහා දැක්වෙන සිතියම **ඇමුණුම 04** හි දක්වා ඇත.

2.2.3 කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය

මුළු දුර ප්‍රමාණය	: කි.මී.5.27+කි.මී.0.6- කි.මී. 6
අරමුදල් සපයන ආයතනය	: ආසියානු සංවර්ධන බැංකුව
මුළු ඇස්තමේන්තුගත මුදල (සංශෝධිත)	: රු.මි.78,903.96
සංශෝධිත ඇස්තමේන්තුගත මුදල	: රු. මි 73,976.12
කොන්ත්‍රාත් මුදල	: රු.මි. 60,018.64
ණය මුදල	: ඇ.ඩො.මි. 300
ආරම්භක දිනය	: 2019.09.27
අවසන් වන දිනය	: 2025 දෙසැම්බර්

මාර්ග භාවිතා කරන්නන් හට වඩාත් කාර්යක්ෂම සහ කඩිනම් මාර්ග සේවාවක් ලබාදීමේ අරමුණින් සැලසුම් කර ඇති මෙම ව්‍යාපෘතිය පොළව මට්ටමට ඉහළින් කුළුණු මත ඉදිකරනු ලබන ප්‍රවේශ මාර්ගයකි.

මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත නිමැවුම් ලෙස,

- නව කැළණි පාලමේ සිට ගාලුමුවදොර දක්වා දිවෙන කුළුණු මත ඉදිවන මාර්ගය ඉදිකිරීම
- සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම

යන ප්‍රධාන කොටස් 02ක් අයත් වේ. මෙම ව්‍යාපෘතිය තුළින් කොළඹ නගරයේ කාර්යබහුල ප්‍රදේශයන්වල වාහන තදබදය අවම කර ගැනීමට හැකිවනු ඇති අතර භාණ්ඩ ප්‍රවාහනය හා මගී ගමනාගමන කටයුතු ද මේ තුළින් වඩාත් කාර්යක්ෂමව හා කඩිනම්ව ඉටුකර ගත හැකි වනු ඇත. තව ද සමුද්‍රීය සේවාවන් හා ප්‍රවාහිත භාණ්ඩ බෙදා හැරීමේදී හා නාවික සේවා සැපයීමේ කාර්යන්හිදී වරාය නාවික පර්යන්තයන් සමඟ කාර්යක්ෂමව සම්බන්ධ වීමේ හැකියාවද මෙමඟින් ප්‍රවර්ධනය වනු ඇත.

මෙම ව්‍යාපෘතියේ සිවිල් වැඩ 2019 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. 2024 වර්ෂය අවසානය වන විට 97.4% ක සමස්ත භෞතික

ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇති අතර 2025 වර්ෂය අවසානයේදී ව්‍යාපෘතියේ සිවිල්වැඩ සඳහා 99%ක සමස්ත භෞතික ප්‍රගතියක් වාර්තා වී ඇත.

මීට අමතරව සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානයේ ආධාරක කණු ඉදිකිරීමේ කටයුතු 2021 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම අවසන් කරන ලද අතර, 2024 වර්ෂාවසානයේදී සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීමෙහි ප්‍රගතිය 48% වූ අතර 2025 වර්ෂය අවසානය වන විට ඒ සඳහා 64% ක ප්‍රගතියක් වාර්තා කරන ලදී.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ක්ෂේත්‍රය	විස්තරය	2025 වසර සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය (සංශෝධිත) රු.මි.	වියදම (රු.මි)
117-02-03-16	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	8,013.5	3,878.66
	එකතුව	**8,013.5**	**3,878.66**

2024 වර්ෂය අවසන් වන විට මෙම ව්‍යාපෘතිය 61% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇති අතර 2025 වර්ෂය අවසානයේදී එය 48% කි.

2025 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය

මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් හා ඒවායෙහි ක්‍රියාකාරකම් වඩාත් සුමට ලෙස ක්‍රියාත්මක කිරීමට හැකිවෙතැයි උපකල්පනය කරමින් ව්‍යාපෘතියේ ඉලක්ක මුලින් සැලසුම් කළද විවිධ අභ්‍යන්තර හා බාහිර සාධක හමුවේ එම ඉලක්ක සංශෝධනය කිරීමට සිදු වී ඇත. ඒ අනුව, මුල් ඉලක්කය හා සංශෝධනය කරන ලද ඉලක්කයන්ට අනුව භෞතික ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය පහත පරිදි සාරාංශ කර දැක්විය හැකිය.

- **මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - ඉඩම් අත්පත් කරගැනීම**

	2024			2025			
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
අදියර I	15%	8.79	58%	7.21	7.21%	3.71%	51%
අදියර III	9%	0.6%	6.6%	4%	4%	0.03%	0.75%
අදියර IV	ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවා ඇත.						

- **මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - සිවිල් වැඩ**

	2024			2025			
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
අදියර I (පැකේජ I & II)	6.75%	0.19%	2.8%	-	1.44%	3.47%	100%>
අදියර I (පැකේජ III)	-	-	-	-	6.11%	7.06%	100%>
අදියර II	මෙම අදියරෙහි සිවිල් වැඩ 2021 වර්ෂය අවසානයේදී අවසන් කර 2022 ජනවාරි මාසයේදී මහජනතාව වෙත විවෘත කරන ලදී.						
අදියර III	25.6%	22.6%	88%	23.2%	9.08%	5.7%	63%

- කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය

	2024			2025			
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
සිවිල් වැඩ	17.4%	14.8%	85%	2.6%	10.35%	6.5%	63%

2.3 මහාමාර්ග සංවර්ධනය

2.3.1 ශ්‍රී ලංකාවේ මහාමාර්ග ජාලය

ජාතික මහාමාර්ග ජාලයට සම්බන්ධ අධිවේගී මාර්ග සහ "ඒ" හා "බී" වර්ගයේ මහාමාර්ග ඉදිකිරීම හා නඩත්තු කිරීමේ වගකීම ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය හා ඒ යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරිය සතු වේ. ඉහත එක් එක් ශ්‍රේණිවලට අයත් මහාමාර්ගයන්හි දැනට පවතින මාර්ග දුර ප්‍රමාණයන් පහත දැක්වේ.

වගු අංක 2.3.1.1 2025 වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලයෙහි විහිදීම

වර්ගය/ ශ්‍රේණිය	මුළු දුර (කි.මී)
'ඒ' ශ්‍රේණියේ මහාමාර්ග	4,217.42
'බී' ශ්‍රේණියේ මහාමාර්ග	8,045.42
අධිවේගී මාර්ග	312.59
එකතුව	**12,575.43**


වගු අංක 2.3.1.2 2025.12.31 වන විට ජාතික මහාමාර්ග ජාලයේ අධිවේගී මාර්ගයන්හි ("ඊ" ශ්‍රේණිය) "ඒ" හා "බී"ශ්‍රේණියේ මහාමාර්ගයන්හි පළාත්බද වර්ගීකරණය

පළාත	ජාතික මහාමාර්ග දුර ප්‍රමාණය (කි.මී)			
	"ඒ"ශ්‍රේණිය	"බී" ශ්‍රේණිය	"ඊ" ශ්‍රේණිය	එකතුව
බස්නාහිර	373.79	1242.70	113.24	**1,729.73**
මධ්‍යම	408.59	1,348.34	-	**1,756.93**
දකුණ	352.91	1,155.47	161.82	**1,670.19**
උතුරු	734.49	524.99	-	**1,259.48**
නැගෙනහිර	619.55	557.74	-	**1,177.29**
වයඹ	352.80	1,010.89	35.67	**1,399.36**
උතුරු මැද	491.19	708.81	-	**1200.00**
ඌව	468.52	692.94	-	**1,161.46**
සබරගමුව	415.58	803.55	1.86	**1,220.98**
එකතුව	**4,217.42**	**8,045.42**	**312.59**	**12,575.43**


2025 වර්ෂයේදී මෙරට ජාතික මහාමාර්ග ජාලය, 2024 වර්ෂයේ මෙන්ම පැවති බැවින්, ජාතික මහා මාර්ග පද්ධතියේ පළාත් ව්‍යාප්තියේ ද කිසිදු වෙනසක් වාර්තා වී නොමැත. ඒ අනුව, 2025 වර්ෂය අවසාන වන විට අධිවේගී මාර්ග අතරින් වැඩිම මාර්ග දුර ප්‍රමාණයක් දකුණු පළාත තුලද අවම මාර්ග දුර ප්‍රමාණයක් සබරගමුව පළාත තුල ද පිහිටා ඇත.

"ඒ"ශ්‍රේණියේ මහාමාර්ග අතරින් වැඩිම මාර්ග දුර ප්‍රමාණයක් උතුරු පළාත තුලද අවම මාර්ග දුර ප්‍රමාණයක් වයඹ පළාත තුලද පිහිටා ඇත. එසේම"බී"ශ්‍රේණියේ මහාමාර්ග අතරින් වැඩිම මාර්ග දුර ප්‍රමාණයක් මධ්‍යම පළාත තුලද අඩුම දුර ප්‍රමාණයක් උතුරු පළාත තුලද පිහිටා ඇත.

ජාතික මාර්ග වර්ගීකරණය පහත පරිදි විස්තර කළ හැකිය.



රූපසටහන 2.3.1 - මංතීරු සංඛ්‍යාව අනුව ජාතික මහාමාර්ගයන්හි වර්ගීකරණය



රූපසටහන 2.3.2 - මාර්ගයන්හි මතුපිට පෘෂ්ඨීය රළුභාවය අනුව ජාතික මහාමාර්ගයන්හි වර්ගීකරණය

ජාතික මහාමාර්ග ජාලයේ වර්තමාන තත්ත්වය

2024 වර්ෂයට සමානව 2025 වසරේදී ද, ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අධිවේගී මාර්ගයන්හි ඉදිකිරීම් කටයුතු කිසිවක් අවසන් කිරීමට සැලසුම් කර නොතිබුණු බැවින් 2025 වර්ෂයේදී අධිවේගී මාර්ග ජාලය සඳහා අළුතින් දුර ප්‍රමාණයක් එකතු නොවිණි. එබැවින් 2024 වර්ෂයේදී පැවති අධිවේගී මාර්ග දුර කි.මී. 312, 2025 වර්ෂයේදී ද නොවෙනස්ව පැවතිණි.

2025 වර්ෂය අවසන් වන විට ජාතික මහාමාර්ග කි.මී. 1,300.40 ක වැඩිදියුණු කිරීමේ හා ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇති අතර, තවත් කිලෝමීටර් 377.13 ක වැඩ කටයුතු තවදුරටත් සිදු කෙරෙමින් පවතී.

එසේම 2024 වර්ෂයේදී මාර්ග කිලෝමීටර් 1,960.84 ක වැඩිදියුණු කිරීම් හා ප්‍රතිසංස්කරණය කටයුතු සිදු කරන ලදී.

මීට අමතරව, 2024 වර්ෂයේදී කොහුවල ගුවන් පාලම හා කොම්පඤ්ඤ වීදියේ උත්තරානන්ද මාවතේ හා විනිසුරු අක්බාර් මාවතේ පිහිටි ගුවන් පාලම් 02 ද ඇතුලත්ව ජාතික මහාමාර්ගයන්හි ගුවන් පාලම් 03 ක ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදී. ඊට අමතර වශයෙන්, 2025 වසරේදී දේශීය ආධාර යටතේ ක්‍රියාත්මක වන අබලන් පාලම් නැවත ඉදිකිරීමේ වැඩසටහන යටතේ පාලම් 31 ක නැවත ඉදිකිරීමේ කටයුතු අවසන් කරන ලද අතර 2024 වර්ෂයේදී උක්ත වැඩසටහන යටතේ නිම කරන ලද පාලම් ගණන 20කි.

2025 වසරේදී ඇති වූ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් දිස්ත්‍රික්ක 22ක මාර්ග 287 ක් සහ මාර්ග කොටස් 572 කට හානි සිදුවූ නමුත් කඩිනමින් සුන්බුන් ඉවත් කිරීම, තාවකාලික අලුත්වැඩියාවන්, ව්‍යුහාත්මක තක්සේරු කිරීම් සහ හදිසි ප්‍රතිසංස්කරණ කටයුතු හරහා 2025 දෙසැම්බර් මස අවසානය වන විට බොහෝ ජාතික මාර්ග ගමනාගමනය කළ හැකි මට්ටමට යථා තත්ත්වයට පත් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පියවර ගන්නා ලදී. ඒ මඟින් ප්‍රවාහන සේවාවන්හි අඛණ්ඩතාව පවත්වා ගනිමින්, ආර්ථික කටයුතුවලට එල්ල වූ බාධා අවම කරමින් පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු 2026 වසර තුලද තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී.

2.3.2 මාර්ග සහ පාලම් නඩත්තු කිරීම (RMTF)

ලංකාව පුරා පිහිටි ජාතික මහාමාර්ග කි.මී. 12,575.4 හා පාලම් 4,413 කට ආසන්න ප්‍රමාණයක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වාර්ෂිකව නඩත්තු කරනු ලැබේ. උක්ත වාර්ෂික නඩත්තු වැඩසටහන යටතේ මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් අධ්‍යක්ෂකවරු, ප්‍රධාන ඉංජිනේරුවන් සහ විධායක ඉංජිනේරුවන් විසින් දෛනික, කාලීන සහ හදිසි වැඩිදියුණු කිරීම් කටයුතු සිදුකරනු ලැබේ. මෙම වැඩසටහන යටතේ වැලි මුද්‍රිත තාර ආලේපනය, කඩතොළු පියවීම , මාර්ග උරහිස් ව්‍යුහ ඉදිකිරීම්, මාර්ග වැඩිදියුණු කිරීම් , සංඥා පද්ධති ස්ථාපිත කිරීම් හා මාර්ග සලකුණු කිරීම් වැනි විවිධ පරාසයන්ට අයත් වන මාර්ග නඩත්තු කිරීම් කටයුතු දිවයින පුරා සිදුකරනු ලැබේ.

වගු අංක 2.3.2.1 – 2025 වර්ෂයේදී සිදුකළ මාර්ග නඩත්තු කටයුතුවල ප්‍රගතිය

පළාත	දෛනික නඩත්තු කිරීම	පුනරාවර්තන නඩත්තු කිරීම්	කාලානුරූපී නඩත්තු කිරීම්	හදිසි නඩත්තු කිරීම	ගංවතුරින් සිදුවන හානි නඩත්තු කිරීම	එකතුව
	කිලෝමීටර්					
බස්නාහිර	1,616.48	230.5	139.70	62.40	12.50	**2,061.58**
මධ්‍යම	1,756.93	260.4	167.30	76.30	15.60	**2,267.53**
දකුණ	1,508.37	210.8	169.80	54.20	10.30	**1,953.47**
උතුර	1,259.48	180.6	129.10	40.50	8.20	**1,617.88**
නැගෙනහිර	582.99	120.4	75.80	20.60	4.10	**803.89**
අක්කරායිපත්තු	594.30	103.5	87.80	18.30	3.60	**807.5**
වයඹ	1,363.69	178.30	128.16	44.20	7.80	**1,722.50**
උතුරු මැද	1,199.90	208.60	151.45	46.60	7.30	**1,613.85**
ඌව	1,161.46	187.50	135.0	50.20	6.50	**1,540.66**
සබරගමුව	1,219.12	240.50	183.10	63.60	8.20	**1,714.52**
එකතුව	**12,262.72**	**1,921.1**	**1,367.21**	**476.9**	**84.1**	**16,112.03**

2025 වර්ෂයේදී මාර්ග සහ පාලම් නඩත්තු කිරීම යටතේ කි.මී.12,262.72 ක වැඩිම මාර්ග දුර ප්‍රමාණයක් දෛනික නඩත්තු කිරීම් යටතේ සිදු කරන ලද අතර අවම මාර්ග දුර ප්‍රමාණයක් ගංවතුරින් සිදුවන හානි නඩත්තු කිරීම සඳහා වන අතර එය කි.මී. 84.1කි.

වාර්තා වී ඇති මාර්ග දුර ප්‍රමාණයන් පිළිබඳව විමසා බැලීමේදී 2025 වර්ෂය තුලදී කි.මී.2,267.53 ක වැඩිම මාර්ග නඩත්තු ක්‍රියාකාරකම් ප්‍රමාණයක් සිදු කර ඇත්තේ මධ්‍යම පළාතේ වන අතර අවම මාර්ග නඩත්තු ක්‍රියාකාරකම් සිදු කර ඇත්තේ නැගෙනහිර පළාතේ අක්කරෙපත්තුවෙනි.

වගු අංක 2.3.2.1 – 2025.12.31 වර්ෂයේදී සිදුකළ මාර්ග නඩත්තු කටයුතුවල ප්‍රගතිය

පළාත	2025.12.31 දිනට වැලි මුද්‍රිත කාර ආලේපනය කර නැවත සකස් කරන ලද මාර්ග දුර (කි.මී.)
බස්නාහිර පළාත	කි.මී. 115.40
මධ්‍යම පළාත	කි.මී. 141.1
දකුණු පළාත	කි.මී. 146.20
උතුරු පළාත	කි.මී. 96.60
නැගෙනහිර පළාත	කි.මී. 64.5 0
නැගෙනහිර පළාත (අක්කරෙයිපත්තු)	කි.මී. 79.20
වයඹ පළාත	කි.මී. 111.66
උතුරුමැද පළාත	කි.මී. 131.15
ඌව පළාත	කි.මී. 117.40
සබරගමුව පළාත	කි.මී. 154.80
එකතුව	කි.මී. 1,158.00

වාර්තාගත ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග දුර ප්‍රමාණයන් පිළිබඳව විමසා බැලීමේදී වැලි මුද්‍රිත තාර ආලේපනය කර නැවත සකසන ලද සහ මතුපිට සකසන ලද වැඩිම දුර ප්‍රමාණය සබරගමුව පළාතෙන් වාර්තා වී ඇති අතර අවම දුර ප්‍රමාණය නැගෙනහිර පළාතෙන් වාර්තා වී ඇත.

ආර්ථික අර්බුදය හේතුවෙන් මාර්ග කි.මී.100,000 ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවීම හේතුවෙන් 2024 වර්ෂයේදී 2023 වර්ෂයට සාපේක්ෂව ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග දුර ප්‍රමාණය අඩු අගයක් ගෙන ඇත.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම් (රු.මි)
117-02-04-01	2001 ගොඩනැගිලි හා ඉදිකිරීම්	26,151.87	26,091.15
	එකතුව	**26,151.87**	**26,091.15**

2024 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට මෙම වැඩසටහනෙහි මූල්‍ය ප්‍රගතිය 99%ක් ලෙස වාර්තා වී ඇති අතර 2025 වර්ෂයේදී මේ සඳහා 98.8% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වී ඇත.

ශ්‍රී ලංකාවේ නිමකරන ලද හා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ගයන්හි සිතියමක් ***ඇමුණුම 05*** හි දක්වා ඇත.

2.3.3 යටිතල පහසුකම්, මාර්ග ආරක්ෂණ හා රථවාහන කළමනාකරණය

වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම සහ උසස් තත්ත්වයෙන් යුත් මාර්ග ජාලයක් සැලසුම් කිරීමයි. මෙම වැඩසටහන යටතේ ප්‍රමුඛ අවධානයක් යොමු කරනු ලබන්නේ මහාමාර්ග ජාලය තුල මාර්ග ආරක්ෂණය ඇතිකිරීම සඳහායි.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානතම ඒකකය වනුයේ මාර්ග සංවර්ධන අධිකාරියේ යටිතල පහසුකම්, මාර්ග ආරක්ෂණ හා රථවාහන ගමනාගමන කළමනාකරණ අංශයයි. ඒ අනුව මෙම ඒකකය මඟින් පදිකයින්ගේ හා වාහන පදවන්නන්ගේ ආරක්ෂාව වැඩිදියුණු කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මාර්ග ජාලය අනතුරු වලින් නිදහස් තැනක් කිරීමට සිය නිරන්තර උත්සාහයන් ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම වැඩසටහන යටතේ විවිධ ක්‍රියාකාරකම් වාර්ෂිකව ක්‍රියාත්මක වන අතර එම ක්‍රියාකාරකම් හි ප්‍රමුඛත්වය මාර්ග ජාලය තුල ඇතිවන හදිසි තත්ත්වයන් මෙන්ම මාර්ග ආරක්ෂණය සම්බන්ධයෙන් රථවාහන පොලිසිය හා

මහජනතාව විසින් සිදු කරන ඉල්ලීම් මත තීරණය කරනු ලබයි.

2025 වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි දැක්විය හැක.

- අනතුරුදායක ස්ථානවල ආරක්ෂාව වැඩිදියුණු කිරීම
- සංඛ්‍යාත්මකව ඉහළ මගී ජනතාවක් සිටින ප්‍රදේශවල මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම
- අනතුරුදායක ස්ථානවල මාර්ග ආරක්ෂණ උපකරණ (Flexible Bollards) සවිකිරීම

වගු අංක 2.3.3.1 2025 වර්ෂයේදී ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම්

අයිතම	ක්‍රියාකාරකම	ස්ථානය	භෞතික ප්‍රගතිය %
1	පැල්මඩුල්ල විධායක ඉංජිනේරු කොට්ඨාසයේ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම -අදියර I	පැල්මඩුල්ල	100%
2	ඇඹිලිපිටිය විධායක ඉංජිනේරු කොට්ඨාසයේ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම- අදියර I	ඇඹිලිපිටිය	100%
3	බදුල්ල විධායක ඉංජිනේරු කොට්ඨාසයේ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම	බදුල්ල	100%
4	හම්බන්තොට විධායක ඉංජිනේරු කොට්ඨාසය - රියදුරන් සඳහා පෙර අනතුරු ඇඟවීම් ලාම්පු සවිකිරීම	හම්බන්තොට	100%
5	මහනුවර විධායක ඉංජිනේරු කොට්ඨාසය - වැඩි මගී ජනතාවක් සිටින ප්‍රදේශවල මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම (පූජාපිටිය මධ්‍ය මහා විද්‍යාලය සහ සුජාතා බාලිකා විද්‍යාලය කලාප)	මහනුවර	100%
6	නාලන්ද විධායක ඉංජිනේරු කොට්ඨාසයේ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම - අදියර I	නාලන්ද	100%
7	නුවරඑළිය විධායක ඉංජිනේරු කොට්ඨාසයේ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම- අදියර I	නුවරඑළිය	100%
8	අවිස්සාවේල්ල විධායක ඉංජිනේරු කොට්ඨාසයේ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම- අදියර I	අවිස්සාවේල්ල	100%
9	වැඩි මගී ජනතාවක් සිටින ගම්පහ විධායක ඉංජිනේරු කොට්ඨාසයේ (සෙනරත් පරණවිතාන පාසල් කලාපය) මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම	ගම්පහ	100%
10	මීගමුව විධායක ඉංජිනේරු කොට්ඨාසයේ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා , මාර්ගෝපදේශක කණු, මාර්ග ස්ටඩ් සහ ආරක්ෂිත බෝලාර්ඩ් සවි කිරීම	මීගමුව	100%

වාර්තා කරනු ලබන කාලසීමාව තුලදී මෙම වැඩසටහන මඟින් 100% ක සමස්ත ප්‍රගතියක් අත් කරගෙන ඇත.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ශීර්ෂය	විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම (රු.මි)
117-02-04-21	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	1,250.00	149.70
	එකතුව	**1,250.00**	**149.70**

මෙම ව්‍යාපෘතිය මගින් 2024 වර්ෂයේදී අත්කරගෙන තිබූ මූල්‍ය ප්‍රගතිය 98% ක් වූ අතර 2025 වර්ෂයේදී 12% ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

මෙම ව්‍යාපෘතිය මඟින් 100%ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන තිබුණද, මූල්‍ය ප්‍රගතිය පහළ මට්ටමක පැවතුණි. ඊට ප්‍රධාන හේතු ලෙස 'Ditwah' සුළි කුණාටුවේ බලපෑම හේතුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ බිල්පත් නියමිත වේලාවට ඉදිරිපත් නොකිරීම සහ රුපියල් මිලියන 1,000ක මුළු ප්‍රතිපාදන ප්‍රමාණය 2025 ඔක්තෝබර් මස 30 දින වන විට ලැබීම යන කරුණු දැක්විය හැකිය.

2.3.4 රථවාහන ගමනාගමන කළමනාකරණ ව්‍යාපෘතිය

මෙය වාර්ෂික වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වන අතර පාසල්, රෝහල් හා පොදු ස්ථාන අසල පදිකයන්ගේ ආරක්ෂාව සඳහා සහ ජාතික මහාමාර්ග ජාලයෙහි මංසන්ධීන්හි රථවාහන තදබදය අවම කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග නිර්මාණ ඒකකය යටතේ ක්‍රියාත්මක කරනු ලැබිණි.

නමුත් 2022 වර්ෂයේදී යටිතල පහසුකම්, මාර්ග ආරක්ෂණ හා රථවාහන ගමනාගමන කළමනාකරණ අංශය පිහිටුවීමත් සමඟ මෙම වැඩසටහන එම අංශය වෙත මාරු කරන ලදී. මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් ත්‍රිත්වය ක්‍රියාත්මක කරනු ලැබේ.

- මාර්ග සංඥා හා මාර්ග සලකුණු කිරීම් නිර්මාණය හා අධීක්ෂණය
- පදික මාරු ස්ථාපනය කිරීම
- මාර්ග සංඥා පද්ධති වැඩිදියුණු කිරීම.

වාර්තා කරනු ලබන වර්ෂයේදී, මෙම වැඩසටහන යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම්හි ප්‍රගතිය පහත පරිදි වේ.

වගු අංක 2.3.4.1 2025 වර්ෂයේදී මේ යටතේ සිදු කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම්

අං.	ක්‍රියාකාරකම	භෞතික ප්‍රගතිය %
01	A1 මාර්ගයේ කිරිබත්ගොඩ මංසන්ධිය නවීකරණය කිරීම	100%
02	AB10 මාර්ගයේ තොටළඟ මංසන්ධිය නවීකරණය කිරීම	100%
03	B204 මාර්ගයේ කටුබැද්ද–කොස්පැලෑන මාර්ගයේ ස්වර්ණශෛල බිම්බාරාම විහාරය අසළ පෙලිකන් පද්ධතිය ස්ථාපනය කිරීම	100%
04	කැස්බෑව, පුවක්ගස්හන්දියෙහි පෙලිකන් සංඥා පද්ධතිය ස්ථාපනය කිරීම	100%
05	මඩකලපුව, A4 මාර්ගයේ කළුවංචිකුඩි මංසන්ධියේ රථවාහන ආලෝක සංඥා (TLS) පද්ධතිය ස්ථාපනය කිරීම	100%
06	B084 මාර්ගයේ පිළියන්දල මංසන්ධියේ රථවාහන ආලෝක සංඥා (TLS) පද්ධතියේ ඉතිරි වැඩ කටයුතු සිදු කිරීම	100%

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම (රු.මි)
117-02-04-22	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	250.00	93.77
	එකතුව	**250.00**	**93.77**

මෙම ව්‍යාපෘතිය මගින් 2025 වර්ෂයේදී අත්කරගෙන තිබූ මූල්‍ය ප්‍රගතිය 37.5% ක් වූ අතර 2024 වර්ෂයේදී 99% ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

2.3.5 පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි (A005) මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

මුළු දුර	: කි.මී. 147 (අදියර I), කි.මී.136 (අදියර II)
අරමුදල් සපයන ආයතනය	: අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල සහ අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල
ඇස්තමේන්තුගත මුදල	:අදියර I- රු.මී.18,200 අදියර II -රු.මී.15,963
සංශෝධිත ඇස්තමේන්තුගත මුදල	:අදියර I- රු.මී.16,950 අදියර II -රු.මී.17.201
කොන්ත්‍රාත් මුදල	:
අදියර I ඔපෙක් – රු.බි.7.44, සවුදි – රු.බි.7.52	
අදියර II ඔපෙක් – රු.බි.7.5, සවුදි – රු.බි.8.3	
ණය මුදල	: ඔපෙක් –ඇ.ඩො.මී. 60 සවුදි - ඇ.ඩො.මී. 60
ආරම්භ වන දිනය	: අදියර I – 17.01.2017, අදියර II – 01.12.2022
අවසන් වන දිනය	:අදියර I 21.04.2021 31.05.2022(සංශෝධිත), අදියර II – 31.12.2025

මෙම ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ පේරාදෙණිය - බදුල්ල - වෙන්කලාඩි (ඒ005) මාර්ගයේ කි.මී.147 ක දුර ප්‍රමාණයක් ද්විත්ව මංතීරු ලෙස උඩව පළාතේ බදුල්ල සිට නැගෙනහිර පළාතේ වෙන්කලාඩි දක්වා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තෝරා ගෙන ඇත. මෙම අදියර පහත දැක්වෙන පරිදි කොන්ත්‍රාත් පැකේජ 06ක් ඇතුලත් සංරචක 02ක් යටතේ ක්‍රියාත්මක වේ.

වගු අංක 2.3.5.1 පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් පැකේජ

සවුදි අරමුදල යටතේ ඇති කොන්ත්‍රාත් පැකේජ (‘ඒ’ සංරචකය)		
පැකේජ 01	බිබිලේ-පදියතලාව මාර්ග කොටස	කි.මී. 29
පැකේජ 02	පදියතලාව-තම්පිටිය මාර්ග කොටස	කි.මී. 30
පැකේජ 03	තම්පිටිය-වෙන්කලාඩි මාර්ග කොටස	කි.මී. 27.8
ඔපෙක් අරමුදල යටතේ ඇති කොන්ත්‍රාත් පැකේජ(‘බී’ සංරචකය)		
පැකේජ 01	බදුල්ල-පස්සර මාර්ග කොටස	කි.මී. 20
පැකේජ 02	පස්සර-ලුනුගල මාර්ග කොටස	කි.මී. 21
පැකේජ 03	ලුනුගල- බිබිලේ මාර්ග කොටස	කි.මී. 19

ඉහත සඳහන් සියළුම පැකේජයන්හි ඉදිකිරීම් කටයුතු 2022 වර්ෂය අවසන් වන විට සම්පූර්ණයෙන්ම අවසන් කරන ලදී.

<u>ණය ඉතුරුම් භාවිතය හා යෝජිත නව ව්‍යාපෘති</u>

ව්‍යාපෘතියේ මූලික විෂයපථයට අයත් මාර්ගයන්හි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් පසු ණය මුදලෙහි ඉතුරුම් මඟින් දෙවන අදියර ලෙස මාර්ග කොටස් කිහිපයක් වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා හඳුනාගන්නා ලද අතර එම මාර්ගයන්හි තොරතුරු පහත පරිදි වේ.

වගු අංක **2.3.5.2** සවුදි හා ඔපෙක් ණය ආධාරයන්හි ඉතුරුම් මඟින් ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ග පිළිබඳ විස්තර

කොන්ත්‍රාත් පැකේජය	දුර (කි.මී)	2024.12.31 දිනට භෞතික ප්‍රගතිය %	2025.12.31 දිනට භෞතික ප්‍රගතිය %
ඔපෙක් අරමුදල			
පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම- ලුණුගල -යාල්කුඹුර මාර්ග කොටසේ ඉතිරි වැඩ	කි.මී 8.7	99.6	100
පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම- යාල්කුඹුර - බිබිල මාර්ග කොටසේ ඉතිරි වැඩ	කි.මී. 10.3	99.3	99.88
බදුල්ල සිට බිබිල දක්වා මාර්ගයේ නාය යෑම් ආරක්ෂණ කටයුතු	-	-	නැවත ටෙන්ඩර් කැඳවීම සඳහා අරමුදල් සපයන ආයතනයේ එකඟතාවය බලාපොරොත්තුවෙන් සිටී.
කන්දෙහන්දිය සිට රන්දෙනිගල දක්වා මාර්ගය වැඩිදියුණු කිරීම	කි.මී. 8	0	ව්‍යාපෘති විෂය පථයට අයත් නොවන මාර්ග කොටසක් බැවින් අරමුදල් සපයන ආයතනයේ එකඟතාවය ලැබී නොමැත. දිට්වා හේතුවෙන් සිදු වූ හානිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අරමුදල් සපයන ආයතනයේ එකඟතාවය ලබා ගැනීමට සැලසුම් කරමින් පවති.
කොන්ත්‍රාත් පැකේජය	දුර (කි.මී)	2024.12.31 දිනට භෞතික ප්‍රගතිය %	2025.12.31 දිනට භෞතික ප්‍රගතිය %
සවුදි අරමුදල			
අම්පාර - උහන - මහඔය මාර්ගයේ කෙවිලියමඩුව සිට මංගලගම දක්වා මාර්ග කොටස වැඩිදියුණු කිරීම	කි.මී. 12	86%	99.7%
අම්පාර - උහන - මහඔය මාර්ගයේ මංගලගම සිට මහඔය දක්වා මාර්ග කොටස වැඩිදියුණු කිරීම	කි.මී. 13	81%	99.8%
වෙන්කලාඩි මංසන්ධිය වැඩිදියුණු කිරීම			මෙම මාර්ගය වැඩිදියුණු කිරීමේ කටයුතු MFAP ව්‍යාපෘතියට මාරු කරන ලදී. (මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය - SFD)

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ක්ෂේත්‍රය	විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම (රු.මි)
117-02-04-41 (ඔපෙක්)	2105 ඉඩම් හා ඉඩම් අත්පත් කරගැනීම්	12.00	10.50
	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	660.00	480.92
	එකතුව	**672.00**	**491.42**

සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල් යටතේ ක්‍රියාත්මක අදියර සඳහා 2024 වර්ෂයේදී 55%ක මූල්‍ය ප්‍රගතියක් හා 2025 වර්ෂයේදී 73% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ශීර්ෂය	විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදන - 20225 (රු.මි)	වියදම (රු.මි)
117-02-04-23 (යළුදි)	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	2,750.00	2,333.04
	2105 ඉඩම් හා ඉඩම් අත්පත් කරගැනීම්	1.00	1.00
	Sub Total (SFD)	**2,751.00**	**2,334.04**

සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල් යටතේ ක්‍රියාත්මක අදියර සඳහා 2024 වර්ෂයේදී 16%ක මූල්‍ය ප්‍රගතියක් හා 2025 වර්ෂයේදී 85% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

2.3.6 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල II)

මුළු දුර / පාලම් ගණන පාලම් 03	: කි.මී. 83.58
අරමුදල් සපයන ආයතනය	: අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල
ඇස්තමේන්තුගත මුදල	: රු.මි. 7,900
ඇස්තමේන්තුගත මුදල (සංශෝධිත)	: රු.මි. 10,798.15
කොන්ත්‍රාත් මුදල	: රු.මි. 9,978.15
ණය මුදල	:ඇ.ඩො.මි. 60
ආරම්භක දිනය	: 2013 ජූනි
අවසන් වන දිනය	: 2023 අප්‍රේල්
සංශෝධිත අවසන් වන දිනය	: 2027 මැයි

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වනුයේ ප්‍රමුඛතා පදනම මත තෝරාගත් මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම මගින් ජාතික මාර්ග ජාලය සංවර්ධනය කිරීමයි.

මෙම ව්‍යාපෘතියේ මූලික විෂය පථයෙහි ඉදිකිරීම් කටයුතු පූර්ණ වශයෙන්ම 2015 දෙසැම්බර් මස අවසන් වන විට නිම කෙරුණු අතර 2016 වර්ෂයේ සිට නිම කරන ලද මාර්ග ව්‍යාපෘතීන්හි බිල්පත් ගෙවීම් කටයුතු පමණක් සිදු කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ මූලික විෂය පථයෙහි ඉදිකිරීම් කටයුතු අවසන් වීමෙන් පසුව, ණය ඉතුරුම් යොදා ගනිමින් 2018 වර්ෂය අවසානයේදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කල යුතු යැයි හඳුනාගෙන තිබූ අතර එම ඉදිකිරීම් කටයුතු සියල්ලක්ම 2023 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම අවසන් කරන ලදි.

- මහනුවර - යාපනය මාර්ගයේ නාඋල නගරය සංවර්ධනය කිරීම ද ඇතුළුව මාර්ග කි.මී. 53+ 740 – 58+000 දක්වා පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම.
- ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 4/3 නැවත ඉදිකිරීම
- ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 6/1 නැවත ඉදිකිරීම
- ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 6/2 නැවත ඉදිකිරීම

උක්ත සඳහන් පළමු ක්‍රියාකාරකමෙහි මාර්ග ඉදිකිරීමේ කටයුතු 2020 වර්ෂයේදී අවසන් කරන ලද අතර ඉතිරි ක්‍රියාකාරකම්හි ප්‍රගතිය පහත දක්වා ඇත.

පාලම් අංකය	සමස්ත භෞතික ප්‍රගතිය		
	2021	2022	2023
පාලම් අංක.4/3	100%	නිමකර ඇත	නිමකර ඇත
පාලම් අංක.6/1	96%	100%	100%
පාලම් අංක.6/2	48%	82%	100%

ණය මුදලෙහි ඉතුරුම් මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති හා ඒවායේ වර්තමාන ප්‍රගතිය

මෙම ව්‍යාපෘතියෙහි ණය මුදලෙහි ඉතුරුම් මඟින් පහත සඳහන් ව්‍යාපෘති සිදු කිරීම සඳහා හඳුනාගන්නා ලද අතර 2024 හා 2025 වර්ෂ අවසන් වන විට ඒවායේ භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

- කුරින්චන්කර්නි පාලම නැවත ඉදිකිරීම - 2024 වර්ෂය අවසානයේදී අතිරේක ණය ගිවිසුම හා අභිලාෂය පළකිරීමේ ලිපිය (LOA) අත්සන් කිරීම සඳහා අරමුදල් සපයන්නාගේ එකඟත්වය අපේක්ෂාවෙන් සිටි අතර 2025 වසර අවසානයේ දී 8% ක භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇත.
- හෝමාගම - ගොඩගම මාර්ග කොටස වැඩිදියුණු කිරීම - මෙම මාර්ග කොටස සවුදි අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සපයන ආයතනයන්ගේ එකඟතාවය ලැබී නොමැති අතර එය රජයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම (රු.මි)
117-02-04-29	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	353.00	116.07
	2105 ඉඩම් හා ඉඩම් අත්පත්කරගැනීම්	22.00	21.16
	එකතුව	**375.00**	**137.22**

මෙම ව්‍යාපෘතිය සඳහා 2025 වර්ෂය අවසානයේදී අත්පත් කරගත් මූල්‍ය ප්‍රගතිය 37% ක් වන අතර 2024 වර්ෂය අවසානයේදී 78% ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

2.3.7 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල)

මුළු දුර	: කි.මී. 159.47, පාලම් 03
අරමුදල් සපයන ආයතනය	: අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල
ඇස්තමේන්තුගත මුදල	:රු.මි.6,625.32
ඇස්තමේන්තුගත මුදල (සංශෝධිත)	: රු.මි.7,035.38
කොන්ත්‍රාත් මුදල	: රු.මි.5,378
ණය මුදල	: ඇ.ඩො.මි. 40
ආරම්භක දිනය	: 2013 ජූනි
අවසන් වන දිනය	: 2025 පෙබරවාරි

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණ වනුයේ මාර්ගවල ධාරිතාවය වැඩිදියුණු කිරීම තුලින් වාහනවල මෙහෙයුම් පිරිවැය අවම කිරීම හා මහජනතාවට සේවා සැපයීම තුලින් එම ප්‍රදේශ සංවර්ධනය කිරීමයි. එමඟින් රටේ සමාජ - ආර්ථික සංවර්ධනය උදෙසා දායකත්වය ලබාදීමද මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිතය.

මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පහත දැක්වෙන මාර්ග හා මාඔය හරහා පාලම් අංක 3/2 (කරඳන පාලම) ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තු ප්‍රදානය කළ අතර එම සියලුම වැඩ කටයුතු 2022 වර්ෂයේදී අවසන් කොට ඇත.

- ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ රක්වාන - මාදම්පේ මාර්ග කොටස වැඩිදියුණු කිරීම
- A 019 මාර්ගයේ පාලම් අංක 3/2 නැවත ඉදිකිරීම
- ඇහැලියගොඩ - දෙහිඕවිට මාර්ග කොටස වැඩිදියුණු කිරීම
- ඇතුල්කෝට්ටේ - මිරිහාන - කොහුවල මාර්ගයේ ඇතුල්කෝට්ටේ සිට කොහුවල දක්වා මාර්ග කොටස වැඩිදියුණු කිරීම
- පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි මාර්ගයේ කි.මී. 2.63 ක් වැඩිදියුණු කිරීම

ණය මුදලෙහි ඉතුරුම් උපයෝජනය කිරීම

ඉහත සඳහන් ව්‍යාපෘතීන්හි සංවර්ධන කටයුතු අවසන් කළ පසු ඉතිරි වූ ණය මුදල් මඟින් ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 4/2 සහ 3/1 ප්‍රතිසංස්කරණය කිරීම 2022 වර්ෂයේදී ආරම්භ කරන ලදී. 2024 වර්ෂය අවසන් වන විට මේ දෙකෙහිම භෞතික ප්‍රගතිය 99.5% ක් ලෙස වාර්තා වූ අතර, 2025 වසර අවසානයේදී මේවායේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරන ලදී.

තවද 2024 වර්ෂයේදී තවදුරටත් ඉතුරුව පැවති ණය මුදල් මඟින් පිළියන්දල - මහරගම මාර්ගයේ කි.මී. 1+800 සිට කි.මී. 3+700 දක්වා මාර්ග කොටසෙහි වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර 2024 වර්ෂය අවසන් වන විට ඊට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පැවතිණි. වාර්තා කරනු ලබන කාලසීමාව අවසානයේදී ඒ සඳහා අරමුදල් සපයන ආයතනයන්ගේ එකඟතාවය අපේක්ෂාවෙන් සිටින ලදි.

ව්‍යාපෘතිය විසින් 2024 වර්ෂය සඳහා 75% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇති අතර 2024 වර්ෂය සඳහා ව්‍යාපෘතිය මඟින් 17% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

2024/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ශීර්ෂය	විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම් (රු.මි)
117-02-04-31	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	210.00	9.17
	2105 ඉඩම් හා ඉඩම් අත්පත්කරගැනීම්	31.30	31.30
	එකතුව	**241.30**	**40.47**

2.3.8 කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

මුළු දුර	: කි.මී. 45.94
පාලම් ගණන	: 01
අරමුදල් සපයන ආයතනය	: අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල
ඇස්තමේන්තුගත මුදල	: රු.මි. 13,526.27
ඇස්තමේන්තුගත මුදල	:රු.මි.25,041.15(සංශෝධිත)
ණය මුදල	:ඇ.ඩො.මි. 50
කොන්ත්‍රාත් මුදල	: රු.මි. 7,719
සංශෝධිත කොන්ත්‍රාත් මුදල	: රු.මි. 10,224.30
ආරම්භක දිනය	: 2013 දෙසැම්බර්
අවසන් කරන දිනය	: 2023 අප්‍රේල්
සංශෝධිත අවසන් දිනය	: 2026 ඔක්තෝම්බර්

කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික මහාමාර්ග සංවර්ධනය කිරීම සඳහා අරමුදල් වශයෙන් ඇ.ඩො.මි.50 ක මුදලක් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල (OFID) වෙතින් ශ්‍රී ලංකා රජය වෙත ලැබී ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික මාර්ග ජාලය වැඩිදියුණු කිරීම දැක්විය හැකිය. මේ මගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශයන්හි මාර්ග තදබදය අවම කිරීම තුලින් ජනතාව මාර්ගයන්හි ගතකරන කාලය අවම කොට එම කාලය ජාතික ආර්ථික වර්ධනය සඳහා දායක කර ගත හැකි වනු ඇත.

මෙම ව්‍යාපෘතියෙහි පළමු පැකේජය යටතේ ඉදිකරන ලද පාලම් හා මාර්ගයන්හි භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

වගුඅංක 2.3.8.1 කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක මාර්ග කොටස්හි භෞතික ප්‍රගතිය

මාර්ගයේ නම	දුර (කි.මී)	2024.12.31 දිනට භෞතික ප්‍රගතිය	2025.12.31 දිනට භෞතික ප්‍රගතිය
ශ්‍රී ජයවර්ධනපුර රෝහල් ප්‍රවේශ මාර්ගය	1.4	2016 වර්ෂයේදී නිම කරන ලදි.	
දෙමටගොඩ - වැල්ලම්පිටිය මාර්ගය	1.9		
කොලොන්නාව - යක්බැද්ද මාර්ගය	2.4		
වැලිකඩ - කොහිලවත්ත මාර්ගය	6		
මැද මාර්ගය	1		
කොට්ටාව - තලගල මාර්ගය	14.4	2022 වර්ෂයේදී නිම කරන ලදි.	
කෝට්ටේ - බෝපේ මාර්ගය	11.3		
ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය	7.7	අදියර I – 97.27% අදියර II – 96.84%	අදියර I – 10097% අදියර II – 100%

ඉහත සඳහන් කළ මාර්ග සහ පාලම්වලට අමතරව, කොළඹ දිස්ත්‍රික් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීම සඳහා 2024 වසරේදී පහත සඳහන් මාර්ග කොටස් දෙක තෝරා ගන්නා ලදී. ඒ අනුව 2024 සහ 2025 වර්ෂ සඳහා ඒවා මඟින් අත්කරගත් භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

- පිළියන්දල - මහරගම මාර්ගයේ (B367) කි.මී. 0+000 සිට කි.මී. 1+800 දක්වා කොටස වැඩිදියුණු කිරීම - 2024 දෙසැම්බර් මස 31 වන දිනට 1.84% ක භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇති අතර 2025.12.31 දිනට වාර්තා කර ඇති ප්‍රගතිය 73.8% කි
- පිළියන්දල - මහරගම මාර්ගයේ (B367) කි.මී. 3+700 සිට කි.මී. 5+700 දක්වා කොටස වැඩිදියුණු කිරීම - 2024 දෙසැම්බර් මස 31 වන දිනට ඉඩම් අත්පත් කරගැනීම සඳහා 98% ක ප්‍රගතියක් වාර්තා කර ඇති අතර 2025.12.31 දිනට 25.8% ක ප්‍රගතියක් වාර්තා කර ඇත.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ක්ෂේත්‍රය	විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම (රු.මි)
117-02-04-32	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	1651.70	1053.26
	2105 ඉඩම් හා ඉඩම් අත්පත්කර ගැනීම්	951.50	951.50
	එකතුව	**2603.20**	**2004.76**

මෙම ව්‍යාපෘතිය 2024 වර්ෂයේදී 87% ක මූල්‍ය ප්‍රගතියක් සහ 2025 වර්ෂයේදී 77% ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

2.3.9 ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර I

මුළු දුර : ග්‍රාමීය මාර්ග කි.මී 3,130
ජාතික මාර්ග කි.මී. 300

අරමුදල් සපයන ආයතනය :ආසියානු සංවර්ධන බැංකුව

ඇස්තමේන්තුගත මුදල : රු.මි. 135,900

ණය මුදල :ඇ.ඩො.මි. 800

ආරම්භක දිනය : 2015 මැයි

අවසන් වන දිනය : 2024 මාර්තු

සංශෝධිත අවසන් දිනය : 2024 සැප්තැම්බර්

ඒකාබද්ධ මාර්ග මෙහෙයුම් සහ සංවර්ධන වැඩසටහන තුළින් ග්‍රාමීය ප්‍රජාවන් අතර සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර ප්‍රවේශ අවස්ථා දියුණු කිරීමේ අරමුණින් දකුණ, සබරගමුව, මධ්‍යම, උතුරුමැද, වයඹ සහ බස්නාහිර යන පළාත් 6 ක තෝරාගත් ග්‍රාමීය පළාත් හා ජාතික මාර්ග වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සිදු කරනු ලැබේ. තෝරා ගනුලැබූ උක්ත මාර්ගයන්හි ප්‍රවාහන කාර්යක්ෂමතාවය ඉහළයාම මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ප්‍රතිඵලය වන අතර ඒ තුළින් ප්‍රදේශ අතර පවතින සම්බන්ධතා පුළුල් වීම සඳහා දීර්ඝ කාලීනව බලපානු ඇත.

ඒ අනුව ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) මාර්ගෝපදේශනය සහ ආරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුකූලව පිළිවෙලින් වසර පහක සහ හතක කාලයක් පුරා පළාත් පාලන ආයතන වලට අයත් (පළාත් සභා හා ප්‍රාදේශීය සභා) ග්‍රාමීය මාර්ග කි.මී. 3130 ක් සහ මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ජාතික මාර්ග කි.මී. 400 ක් පමණ නිර්මාණය, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කටයුතු මෙන්ම ඊට අදාල ප්‍රසම්පාදන කටයුතු ද සිදුකිරීමට අදහස් කෙරේ.

මෙම ව්‍යාපෘතිය 2015 වර්ෂයේ මැයි මාසයේදී ආරම්භ වූ අතර, 2024 වර්ෂයේදී අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟවූ ඇ.ඩො.මී 800ක ණය මුදල මඟින් ඇ.ඩො.මී 557 ක ණය මුදල් ප්‍රමාණයක් පමණක් මුදා හැරීම හේතුවෙන්, ව්‍යාපෘතියෙහි මූලික විෂය පථය සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත.

කෙසේ වුවද, අඩක් නිම කර තිබූ මාර්ග කොටස්වල අත්‍යවශ්‍ය වැඩකටයුතු (Critical works) නිම කිරීම සඳහා දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (iRoad 2) සිව්වන ණය වාරිකය (Tranche 4) උපයෝගී කරගන්නා ලදී. ඒ අනුව, හඳුනාගත් අත්‍යවශ්‍ය මාර්ගයන්හි වැඩකටයුතු මේ වන විට නිම කර ඇත.

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (iRoad) පළමු අදියර 2024 සැප්තැම්බර් මස 30 වන දිනෙන් අවසන් කරන ලදී.

2.3.10 දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (I Road 2)

මුළු දුර	: ග්‍රාමීය මාර්ග කි.මී 2,958 ජාතික මාර්ග කි.මී. 397
අරමුදල් සපයන ආයතනය	: ආසියානු සංවර්ධන බැංකුව (ADB)
ඇස්තමේන්තුගත මුදල	: රු.මි. 162,600
සංශෝධිත ඇස්තමේන්තු මුදල	: රු.මි. 184,382
ණය මුදල	:ඇ.ඩො.මි. 900
ආරම්භක දිනය	: 2017 ජූනි
අවසන් වන දිනය	: 2027 සැප්තැම්බර්

මෙම ව්‍යාපෘතිය මගින් ග්‍රාමීය ප්‍රදේශයන්හි මාර්ග ජාලයෙහි ප්‍රවේශවීමේ හැකියාව වැඩිදියුණු කිරීම තුළින් ග්‍රාමීය ප්‍රජාවන් අතර සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර ප්‍රවේශ අවස්ථා දියුණු කිරීම අපේක්ෂා කෙරේ.

ග්‍රාමීය මාර්ග කි.මී. 3,400 ක ප්‍රමාණයක් වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සහ උතුර, නැගෙනහිර, ඌව සහ බස්නාහිර යන පළාත් වලට අයත් කි.මී. 350 ක ජාතික මහාමාර්ගයන් ප්‍රතිසංස්කරණය හා නඩත්තුව සහ ආරක්ෂණ විධි, මාර්ග ආරක්ෂාව, නඩත්තුව, පර්යේෂණ ධාරිතාවය සහ මාර්ග සැලසුම් කිරීම හා ඉදිකිරීම යනාදිය සම්බන්ධයෙන් මාර්ග හා සම්බන්ධිත ආයතනයන්හි ධාරිතා වර්ධනය මේ යටතේ සිදු කිරීමට නියමිතය. මෙහි ව්‍යාපෘති කාලසීමාව 2018 - 2027වේ.

මේ යටතේ මාර්ග ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීමේ කටයුතු ඒ ඒ කොන්ත්‍රාත්තුවේ මුල් වර්ෂ දෙක අවසාන වන විට සම්පූර්ණ කිරීමට නියමිත අතර ඉන්පසුව පිළිවෙලින් ග්‍රාමීය හා ජාතික මහාමාර්ගයන් හි වර්ෂ 3 සහ වර්ෂ 5 ක කාලයක් කාර්යසාධනය මත පදනම් වූ නඩත්තු කිරීමේ කාල පරිච්ඡේදය ලෙස පවතී.

මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂයේ දී ආරම්භ වූ අතර, ණය ගිවිසුම 2017 වසරේ දී අත්සන් කරන ලදී. 2017 ජූනි මාසයේදී ඌව පළාතෙහි සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව සඳහා මිල ගණන් කැඳවා ඇත.

ව්‍යාපෘතියේ විෂය පථය සංශෝධනය කිරීම (Re-scope) හේතුවෙන්, 2025 දෙසැම්බර් මස අවසානය වන විට පස්වන වාරිකය (Tranche 5)

යටතේ මාර්ග පුනරුත්ථාපන කටයුතු පමණක් අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

2025 ඔක්තෝබර් 31 වන දින ඇ.ඩො.මී 102.41 සඳහා වූ පස්වන ණය වාරිකයේ (Tranche 5) ගිවිසුම අත්සන් කල අතර, එමගින් මාර්ග කි.මී 500 ක සංවර්ධන කටයුතු නිම කිරීමට අපේක්ෂා කරනු ලබන අතර ඉන් පැකේජ (Lots) 38 ක් සඳහා ලංසු (Bids) කැඳවා ඇත. මේ අතුරින් නැගෙනහිර පළාතේ පැකේජ (Lots) 8 ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති අතර, ඉතිරි පැකේජ ඇගයීම් මට්ටමේ පවතී. මෙම ඉතිරි පැකේජයන්හි කොන්ත්‍රාත්තුව 2026 වසරේ පළමු කාර්තුව තුළදී ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වේ. 2025 වසර අවසානය වන විට, මෙම ව්‍යාපෘතියේ සමුච්ඡිත භෞතික ප්‍රගතිය 0.14% කි.

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (iRoad) I සහ II යන අදියර දෙක යටතේ අත්කරගත් මූල්‍ය ප්‍රගතිය 2024 වසරේදී 54% ක අගයක් වූ අතර 2025 වසරේදී එම අගය වාර්තා වූයේ 59% ක් ලෙසිනි.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගති

ණයදෙන ඒජන්සිය	ධාරිතා විෂය/ අයිතම විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම(රු.මි.)
117-02-04-63	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	3,130.00	3.12
117-02-04-64	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	4,947.18	4,792.02
	එකතුව	**8,077.18**	**4,795.14**

2.3.11 බස්නාහිර පළාත් ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මුළු දුර	: කි.මී. 25.81
අරමුදල් සපයන ආයතනය	: අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල
ඇස්තමේන්තුගත මුදල	: රු.මී. 6,046.82
ඇස්තමේන්තුගත මුදල (සංශෝධිත)	:රු.මී 6,447.68
ණය මුදල	: ඇ.ඩො.මී. 17
කොන්ත්‍රාත් මුදල	:රු.මී. 3,579.68
ආරම්භක දිනය	: 2017 ඔක්තොම්බර්
අවසන් වන දිනය	: 2019 අගෝස්තු
සංශෝධිත අවසන් වන දිනය	: 2026 අගොස්තු

ජාතික මාර්ගයන්හි කි.මී. 25.81 ක් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කර සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියෙහි විෂය පථයට අයත් වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ, පහත සඳහන් මාර්ග 02 පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ කටයුතු පැකේජ 02ක් යටතේ ක්‍රියාත්මක කිරීමට තෝරාගත් අතර එම සියළුම කටයුතු 2023 වර්ෂයේදී නිම කරන ලදී.

1. කඩුවෙල - අතුරුගිරිය මාර්ගය (B174) (කි.මී 0+000 – 9+250)

2. වාද්දුව- මෙරොන්තුඩුව මාර්ගය (B449) සහ බෙල්ලන-මොරගල්ල මාර්ගය (කි.මී.1+000– 5+280)

ව්‍යාපෘතියෙහි ණය මුදලෙහි ඉතුරුම් මඟින් ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 9/1 නැවත ඉදිකිරීම සඳහා තෝරාගෙන ඇති අතර එම කොන්ත්‍රාත්තුව තහවුරු කිරීමේ ලිපිය 2024 දෙසැම්බර් මස 12 වන දින නිකුත් කර ඇත . 2025 දෙසැම්බර් මස අවසානය වන විට මේ සඳහා වාර්තා වූ සමස්ත භෞතික ප්‍රගතිය 7% කි.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ක්ෂේත්‍රය	වැය ශීර්ෂය/ අයිතම ශීර්ෂය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම(රු.මි.)
117-02-04-40	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	240.00	165.93
	2105 ඉඩම් හා ඉඩම් අත්පත්කර ගැනීම්	115.00	114.91
	එකතුව	**355.00**	**280.84**

මෙම ව්‍යාපෘතිය මඟින් 2024 වර්ෂයේදී අත්කරගත් මූල්‍ය ප්‍රගතිය 88% ක් වූ අතර, 2025 වසරේදී එම අගය 79% ක් ලෙස වාර්තා විය.

2.3.12 පානදුර දක්වා සමුද්‍රීය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය

90 දශකය අගභාගය පමණ වනවිට සමුද්‍රීය මාර්ගය ඉදිකිරීම, කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ රථවාහන තදබදය අවම කිරීම සඳහා වඩාත් සුදුසු විකල්පයක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව 1998 දී ආරම්භ කරන ලද සමුද්‍රීය මාර්ගය ඉදිකිරීම් කටයුතු විවිධ අදියරයන් යටතේ රත්මුතු හෝටලය සිට දෙහිවල දක්වා ක්‍රියාත්මක කරන ලදී. (කි.මී. 0+520 - කි.මී. 8+420)

යෝජිත වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය සමඟ සම්බන්ධ කිරීම හා ප්‍රවේශ වීමට හැකිවන අයුරින් සමුද්‍රීය මාර්ගය ගාලුමුවදොර දක්වා දීර්ඝ කිරීමට යෝජනා වී ඇත. කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ රථවාහන ධාරිතාවය සීඝ්‍රයෙන් ඉහලයාම නිසා වර්තමානයේදී දවසේ ඕනෑම කාලසීමාවක් තුලදී කොළඹ සිට දෙහිවල දක්වා රථවාහන තදබදයක් ඇතිවන බව වාර්තා වී ඇත.

මේ සඳහා ප්‍රධාන හේතුවක් වන්නේ විකල්ප මාර්ගයක් නොමැති වීමයි. මේ හේතුවෙන් උක්ත සමුද්‍රීය මාර්ගය පානදුර දක්වා දීර්ඝ කිරීමට යෝජනා වී ඇත.

මෙම ව්‍යාපෘතිය අදියර කිහිපයක් යටතේ ක්‍රියාත්මක කළ අතර එම එක් එක් අදියරයන් මඟින් අත්කරගත් භෞතික ප්‍රගතීන් පහත පරිදි දැක්විය හැක.

සමුද්‍රීය මාර්ගය - පළමු අදියර (රාමක්‍රිෂ්ණා මාර්ගයේ සිට මෙල්බර්න් පෙදෙස දක්වා), සමුද්‍රීය මාර්ගය - දෙවන අදියර (මෙල්බර්න් පෙදෙස සිට ග්ලේන් ආබර් පෙදෙස දක්වා),

සමුද්‍රීය මාර්ගය - තෙවන අදියර (ග්ලේන් ආබර් පෙදෙස සිට කොල්ලුපිටිය දුම්රිය පොළ දක්වා) සමුද්‍රීය මාර්ගය - හයවන අදියර (මාර්ග වැඩ) යන අදියරයන් 2021 වර්ෂයේදී අවසන් කළ අතර ව්‍යාපෘතියෙහි ඉතිරි වැඩ සියල්ලක්ම 2022 වර්ෂයේදී අවසන් කරන ලදී.

2025 දෙසැම්බර් මස 31 දින වන විට මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක අදියරයන්හි සමුච්ඡිත භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

අදියර	2024/12/31 දිනට ප්‍රගතිය	2025/12/31 දිනට ප්‍රගතිය
සමුද්‍රීය මාර්ගය - අදියර IV(රාමක්‍රිෂ්ණා මාර්ගයේ සිට ප්‍රේසර් පෙදෙස දක්වා)	අවසන් කර ඇත	
සමුද්‍රීය මාර්ගය - අදියර V-මාර්ග වැඩ		
සමුද්‍රීය මාර්ගය - අදියර VI - මාර්ග වැඩ		
සමුද්‍රීය මාර්ගය - අදියර IV - සමුද්‍රීය මාර්ගය හරහා පාලමක් ඉදිකිරීම	99%	100%

2025 දෙසැම්බර් මස අවසාන වන විට දෙහිවල සිට පානදුර දක්වා මුහුදුබඩ මාර්ගය (Marine Drive) දීර්ඝ කිරීමේ කටයුතු සඳහා වන ශක්‍යතා අධ්‍යයනය (Feasibility study) අවසන් අදියරේ පැවතිණි.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම්(රු.මි.)
117-02-04-49	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	40.00	40.00
	එකතුව	**40.00**	**40.00**

2025 දෙසැම්බර් මස 31 දින වනවිට ඉහත ව්‍යාපෘතිය මගින් අත්කර ගත් මූල්‍ය ප්‍රගතිය 100% ක් වන අතර 2024 වර්ෂය අවසන් වන විට එය වාර්තා වූයේ 86% ක් ලෙසිනි.

2.3.13 විකල්ප මාර්ග කි.මී.100,000 සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ජාතික මහාමාර්ග හා අධිවේගී මාර්ග ජාලයට ප්‍රවේශය වීමේ හැකියාව වර්ධනය කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම මාර්ග කි.මී.100,000 විකල්ප මාර්ග හා ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය හඳුනාගනු ලැබිණි.

ඒ අනුව මෙම විකල්ප මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය තුලින්,සියළුම අභ්‍යන්තර හා ග්‍රාමීය ප්‍රදේශ කරා ප්‍රවේශ වන මාර්ගයන් සංවර්ධනය කිරීමට නියමිතය.

උක්ත ව්‍යාපෘතිය යටතේ පහත ක්‍රියාකාරකම් සිදුකරනු ලැබේ.

- පවතින මහාමාර්ග හා පළාත් මාර්ග වැඩිදියුණු කිරීම
- නව විකල්ප මාර්ග හා ග්‍රාමීය මාර්ග හඳුනාගැනීම හා සංවර්ධනය කිරීම
- අතුරු මාර්ග ඉදිකිරීම
- ග්‍රාමීය මාර්ග හා ප්‍රධාන මාර්ග සමඟ පවතින සේවා සහ භාණ්ඩ සඳහා ප්‍රවේශය පහසු කරන්නා වූ මාර්ග සඳහා පාලම් ඉදිකිරීම.
- ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම

උක්ත ව්‍යාපෘතිය යටතේ මාර්ග ඉදිකිරීමේ කටයුතු; කොන්ත්‍රාත් ප්‍රදානය, සෘජු ශ්‍රමය හා වැඩ ඇණවුම් නිකුත් කිරීම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හරහා සිදු කෙරේ.

මෙම ව්‍යාපෘතිය 2024 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත් රටෙහි පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මඟින් 2022.04.26 දි නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 03/2022 අනුව ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ගයන්හි විෂය පථය අඩුකිරීමට උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව මේ යටතේ 2023 සහ 2024 වර්ෂවලදී මහජනතාවට අපහසුතාවයක් ඇති නොවන පරිදි, මාර්ග ධාවනයට සුදුසු තත්ත්වයට පත් කිරීම සඳහා ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදී.

තවද, ව්‍යාපෘති විෂය පථය (scope) අඩු කරමින් දෙපාර්ශවයේම එකඟතාවයෙන් අවසන් කිරීමට කැබිනට් අනුමැතිය හිමිව තිබුණි. මෙම ව්‍යාපෘති දෙපාර්ශවයේ එකඟතාවයෙන් නවතා දැමීම සඳහා අතිරේක ගිවිසුම් සකස් කිරීම සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග ප්‍රාදේශීය පළාත් පාලන ආයතන වෙත භාරදීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවති. ඒ අනුව, ව්‍යාපෘති පැකේජ අවසන් කිරීම සඳහා අතිරේක ගිවිසුම් අත්සන් කිරීමට කොන්ත්‍රාත්තු 2,039ක් හඳුනාගෙන ඇත. ඒ අතරින් අතිරේක ගිවිසුම් 1,864ක් සඳහා අත්සන් තබා ඇති අතර, තවත් අතිරේක ගිවිසුම් 175ක් අත්සන් කිරීමට ඇත.

ගෙවීමට තිබූ හිඟ බිල්පත් 2025 වර්ෂය තුළදී පියවා අවසන් කරන ලද අතර, ඉතිරිව ඇති මූලික අත්තිකාරම් (mobilization advance) අයකර ගැනීම සහ කාල සීමාවන් දීර්ඝ කිරීම පිළිබඳ සලකා බලා ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ව්‍යාපෘතිය වසාදැමීම හේතුවෙන් වැඩ පටන් ගැනීම සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදලෙහි ඉතිරි මුදල (balance mobilization advance) නැවත ලබාගැනීම සහ ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

2025 වර්ෂය වන විට ගෙවීමට ඉතිරිව තිබූ බිල්පත් ගෙවා අවසන් කරන ලදී.

2025 වසරේ 04 වන කාර්තුව අවසානයේදී මෙම ව්‍යාපෘතිය මඟින් 93.21% ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය විෂය/ අයිතම විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම(රු.මි.)
117-02-04-57	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	6,750.00	6,750.00
	එකතුව	**6750.00**	**6750.00**

මෙම වැඩසටහන මඟින් 2024 වර්ෂයේදී මෙන්ම 2025 වර්ෂයේදීද 100%ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

2.3.14 ගාල්ල - දෙනියාය මාර්ගයේ කි.මී. 78+000 සිට 130+600 දක්වා වූ මාර්ග කොටස වැඩිදියුණු කිරීම (සූරියකන්ද සිට රක්වාන දක්වා)

අරමුදල් සපයන ආයතනය:	ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල (OFID IV)
මුළු ඇස්තමේන්තුගත මුදල	:රු.මි. 7,600
කොන්ත්‍රාත් මුදල	:රු.මි. 10,150
කොන්ත්‍රාත් මුදල	:රු.මි. 8,646.85
ආරම්භක දිනය	: 2022 සැප්තැම්බර්
අවසන් වන දිනය	: 2026 දෙසැම්බර්

ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගය, දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කය හා සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කය එකිනෙක සම්බන්ධ කෙරෙන ප්‍රධාන මාර්ගයක් ලෙස සැලකේ. මෙම මාර්ගය ඉමදුව, අකුරැස්ස, මොරවක, දෙනියාය, සූරියකන්ද සහ රක්වාන යන ගම්මාන හරහා විහිදී ඇති අතර ඉන් "ඒ" ශ්‍රේණියේ මාර්ග තුනකට හා "බී" ශ්‍රේණියේ මාර්ග දහයකට ප්‍රවේශය සලසනු ලැබේ. එමනිසා මෙම මාර්ගය ජාතික මාර්ග ජාලයේ ඇති ඉතා වැදගත් මාර්ගයක් ලෙස හැඳින්විය හැක.

ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ මුළු දුර කි.මී.143 වන අතර, ගාල්ල - දෙනියාය දක්වා වූ මාර්ග කොටස (කි.මී.0-78) මංතීරු 02 කින් යුක්තව ලෝක බැංකු අධාර යටතේ සංවර්ධනය කිරීමට ද රක්වාන - මාදම්පේ දක්වා වූ මාර්ග කොටස (කි.මී.130.6-143.9) සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල යටතේ සංවර්ධනය කිරීම ද මීට ඉහත සිදු කරන ලදී.

මෙම මාර්ගයේ ඉතිරි කොටස වන්නේ දෙනියායේ සිට රක්වාන දක්වා වූ කි.මී.52.6 ක කොටස මාර්ග පැකේජ 02ක් යටතේ සංවර්ධනය කිරීමට නියමිත වන අතර ඒ අනුව කොන්ත්‍රාත් පැකේජ I යටතේ සූරියකන්ද සිට රක්වාන දක්වා ද (කි.මී.113- කි.මී.130) කොන්ත්‍රාත් පැකේජ II යටතේ දෙනියාය සිට සූරියකන්ද දක්වා ද (කි.මී.78 - කි.මී.113) ලෙස වැඩිදියුණු කිරීමට නියමිතය. තවද, දෙනියායේ සිට රක්වාන දක්වා වූ උක්ත මාර්ග කොටස මීටර් 3.5 ක පළලකින් යුතු මංතීරු 02 කින් හා දෙපසම මීටර් 0.5 දෘඩ උරස් සහ මීටර් 1.0 මෘදු උරස් සහිතව සංවර්ධනය කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතියේ පළමුවන අදියරෙහි ඉදිකිරීම් කටයුතු 2022 වර්ෂයේදී ආරම්භ කළ අතර 2024 හා 2025 වර්ෂයන්හි අත්කරගත් සමුච්ඡිත භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

වගු අංක 2.3.14.1 ගාල්ල - දෙනියාය මාර්ගයේ සූරියකන්ද සිට රක්වාන දක්වා වූ මාර්ග කොටසේ භෞතික ප්‍රගතිය

මාර්ග කොටස	2024/12/31 ට සමුච්ඡිත භෞතික ප්‍රගතිය (%)	2025/12/31 ට සමුච්ඡිත භෞතික ප්‍රගතිය (%)
කි.මී. 112+600 සිට කි.මී. 118+600 දක්වා මාර්ග කොටස	85.7	99.7
කි.මී. 118+600 සිට කි.මී. 124+600 දක්වා මාර්ග කොටස	69.7	98.2
කි.මී. 124+600 සිට කි.මී. 130+600 දක්වා මාර්ග කොටස	87.9	100

2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය 85% වන අතර 2025 වර්ෂාවසානයේදී ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය 87% කි.

මෙම ව්‍යාපෘතියෙහි ණය මුදලෙහි ඉතුරුම් මඟින් පහත සඳහන් මාර්ග සහ පාලම් වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කරන අතර 2024 හා 2025 වර්ෂ අවසානයේදී ඒ සඳහා අත්කරගත් භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

- වල්ගම - දියගම මාර්ගය මාර්ගය වැඩිදියුණු කිරීම (කි.මී. 0+000 – 7.06) – 2024 වර්ෂය අවසන් වන විට ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 96% ක ප්‍රගතියක් සහිතව සිදු කරමින් පවතින අතර 2025 වසර අවසානය වන විට සිවිල් වැඩ සඳහා 32% ක සමුච්චිත භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.
- ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 3/2 නැවත ඉදිකිරීම - අභිලාෂය පළ කිරීමේ ලිපිය (Letter of Acceptance) 2024 දෙසැම්බර් 12 වන දින නිකුත් කරන ලද අතර, 2025 දෙසැම්බර් අවසානය වන විට ලබා ඇති සමුච්චිත භෞතික ප්‍රගතිය 55% කි.

මෙම ව්‍යාපෘතිය මඟින් 2024 සහ 2025 වර්ෂ දෙකෙහිදීම අත්කර ගත් මූල්‍ය ප්‍රගතිය 79% කි.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ක්ෂේත්‍රය	වැය විෂය/ අයිතම විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම(රු.මි.)
117-02-04-56	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	3535.00	2778.14
	2105 ඉඩම් හා ඉඩම් අත්පත්කර ගැනීම්	5.00	4.04
	එකතුව	**3540.00**	**2782.18**

2.3.15 අන්තර්ගතිකව සම්බන්ධිත මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - ලෝක බැංකු ආධාර

මුළු දුර / පාලම් ගණන පමණ	: කි.මී.1,000 හා පාලම් 40
අරමුදල් සපයන ආයතනය	: ලෝක බැංකුව
මුළු ඇස්තමේන්තුගත මුදල	:රු.මි. 54,300
ණය මුදල	:ඇ.ඩො.මි. 178.81
ආරම්භක දිනය	: 2021 නොවැම්බර් 03
අවසන් වන දිනය	: 2026 ඔක්තෝම්බර් 31
සංශෝධිත අවසන් වන දිනය	: 2027 ඔක්තෝම්බර් 31
මුඵ දුර	:
සංරචකය 1: - ග්‍රාමීය මාර්ග කිලෝමීටර 1,066 සහ අබලන් පාලම් 47	

ලෝක බැංකුව මඟින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 150 ක් සැපයීම සඳහා එකඟ වී ඇති අතර ව්‍යාපෘති කාලය වසර 05 කි (2021-2026). අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය ප්‍රධාන සංරචක 02 යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතය. පළමු සංරචකය ප්‍රවාහන, මහාමාර්ග. වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අතර දෙවන සංරචකය කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතියේ විශය පථය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව එහි සංයුතිය පහත පරිදි වේ.

1.0 සංරචකය

මෙම ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුවහගත කිරීමෙන් පසු මෙම සංරචකය යටතට උප සංරචක 04ක් ඇතුලත් වේ.

1.1 (අ) මාර්ග ගමනාගමන සබඳතාවය වැඩිදියුණු කිරීම
(ආ) අබලන් වූ පාලම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම (නව)

1.2 මාර්ග අංශයේ ආයතනික හා ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කිරීම

1.3 මාර්ග අංශය හා ප්‍රජා ධාරිතාවය වැඩිදියුණු කිරීම

උප සංරචක 1.1(අ) යටතේ සියළුම දිස්ත්‍රික්කයන්හි (රත්නපුර, මාතලේ, අනුරාධපුර, කුරුණෑගල, මොණරාගල, පුත්තලම, හම්බන්තොට, කළුතර, මඩකපුව, පොළොන්නරුව, කොළඹ, ගාල්ල, මහනුවර, මාතර, වවුනියාව, මුලතිව්, කිලිනොච්චි, යාපනය, මන්නාරම) මාර්ග හඳුනාගැනීමේ කටයුතු අවසන් කර ඇත. 2024 අවසානය වන විට කොන්ත්‍රාත්තු 47ක් ප්‍රදානය කරන ලද අතර කි.මී 458ක ප්‍රමාණයක් භෞතිකව නිම කරන ලදී.

වාර්තා කරනු ලබන කාලසීමාව අවසන් වන විට මෙම ව්‍යාපෘතිය 76% ක සමුච්චිත ප්‍රගතියක් සමඟ කි.මී 741 ක් සම්පූර්ණ කරන ලදී. තවද 2025 වර්ෂය අවසන් වනවිට කොන්ත්‍රාත්තු 64 ක් ප්‍රදානය කරන ලද අතර කිලෝමීටර 1050 ක පාරිසරික පරීක්ෂාවන් ද සම්පූර්ණ කරන ලදී.

මීට අමතරව, 2024 වසර අවසානය වන විට උප සංරචකය 1.1 (ආ) යටතේ දුර්වල පාලම් 47ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා හඳුනාගෙන ඇති අතර, 2024 වසර අවසන් වන විට ඉහත දුර්වල පාලම්වල මූලික පිරික්සුම් ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඒ සඳහා 1.14% ක ප්‍රගතියෙක් අත්කරගෙන ඇත. 2025 දෙසැම්බර් 31 වන දින අවසන් වන විට, කොන්ත්‍රාත් 16ක් ප්‍රදානය කර තිබූ අතර තවත් කොන්ත්‍රාත් 31ක ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පැවතිණි. මෙම උප කොන්ත්‍රාත්තුව සඳහා වාර්තා කරනු ලබන කාලසීමාව අවසන් වනවිට 9%ක සමුච්චිත භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.

අන්තර්ගතිකව සම්බන්ධිත මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග සහ පාලම් වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය ***ඇමුණුම 06*** හි දක්වා ඇත.

2025 වසර අවසානය වන විට 1.2 සහ 1.3 යන උප සංරචක ක්‍රියාත්මක වෙමින් පැවති අතර, ඒ සඳහා 39%ක සමස්ත භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.

2.0 සංරචකය (Component 2)

මේ යටතේ, වෙළඳපොළ පුළුල් කිරීම / අළුත්වැඩියා කිරීම/ නැවත ඉදිකිරීම සහ කුඩා ප්‍රමාණයේ කෘෂිකාර්මික මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාව සහ ප්‍රාදේශීය කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම සිදුකර ඇත. මෙය කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ සිදුකරනු ලබයි.

නමුත් "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ බලපෑම් හේතුවෙන්, මෙහි ප්‍රතිපාදන හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීමේ සංරචකය සඳහා Contingency Emergency Response Component (CERC) වෙත යොදාගන්නා ලද අතර එම හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කරන ලදි.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	බැය විෂය/ අයිතම විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම(රු.මි.)
117-02-04-58	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	11,966.00	9,688.33
	2106 මෘදුකාංග සංවර්ධනය	18.00	16.08
	එකතුව	**11,984.00**	**9,704.41**

2024 දෙසැම්බර් මස 31 දින වනවිට මෙම ව්‍යාපෘතිය මඟින් 51%ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇති අතර 2025 වර්ෂාවසානයේදී එය 86% ක අගයක් වාර්තා කර ඇත.

2.3.16 මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය

මුළු ඇස්තමේන්තුගත මුදල : රු.මි.32,833.50	
අරමුදල් සපයන ආයතනය : ලෝක බැංකුව	
ආරම්භක දිනය	: 14.02.2022
අවසන් වන දිනය	: 30.01.2029
ණය මුදල	: ඇ.ඩො.මි.69.33

යෝජිත බහුවිධ ප්‍රවාහන පර්යන්තය මගින් මහනුවර නගර මධ්‍යයේ නවීනතම මගී ප්‍රවාහන පහසුකමක් ස්ථාපිත කරනු ලබන අතර, නගර සීමාව තුළ සහ අවට ඇති අසංවිධානාත්මක බව සහ තදබදය අවම කරමින් විවිධ ප්‍රවාහන ක්‍රම අතර මගීන් පහසුවෙන් මාරු කිරීමට හැකි වේ.

ඒ සමගම යෝජිත බහුවිධ ප්‍රවාහන පර්යන්තය පිහිටුවීම මගින් ඒකාබද්ධ කාලසටහනක් මත බස් රථ ධාවනය කිරීමට හැකියාව ලැබේ. එබැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් මගීන් පුද්ගලික ප්‍රවාහන ක්‍රම වෙනුවට පොදු ප්‍රවාහන ක්‍රම භාවිතා කිරීමට දිරිගන්වනු ඇත.

මීට අමතරව, පොදු ප්‍රවාහනය ක්‍රමවත් කිරීම තුළින් මහනුවර නගරයේ සමස්ත හැඩය වැඩිදියුණු කර එය ප්‍රියතම සංචාරක ගමනාන්තයක් ලෙස වඩාත් ආකර්ශනීය වනු ඇත.

වර්තමාන තත්ත්වය

2024 හා 2025 වර්ෂයන්හි මෙම ව්‍යාපෘතිය මගින් අත්කරගෙන ඇති සමස්ත භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

2024 හා 2025 වර්ෂයන්හි ව්‍යාපෘතිය මගින් අත්කරගෙන ඇති සමස්ත භෞතික ප්‍රගතිය

කොන්ත්‍රාත් පැකේජය	2024.12.31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය	2025.12.31 සමස්ත දිනට භෞතික ප්‍රගතිය
සිවිල් වැඩ මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය	17.8%	27%
අධීක්ෂණ ය හා උපදේශන සේවාව - KMTTP	3.2%	3.25%

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය ඛිෂය/ අයිතම විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම්(රු.මි.)
117-02-04-60	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	6,221.80	5,107.71
	2105 ඉඩම් හා ඉඩම් අත්පත්කරගැනීම්	5.00	3.44
	2102 ගෘහ භාණ්ඩ හා උපකරණ	95.02	50.96
	එකතුව	**6321.82**	**5162.12**

මෙම ව්‍යාපෘතිය සඳහා 2024 වසර අවසානයේ දී අත්කර ගත් මූල්‍ය ප්‍රගතිය 44% ක් වූ අතර 2025 වසර අවසන් වන විට එය 97% ක් ලෙස වාර්තා කර ඇත.

2.3.17 කොරියානු රජයේ ආධාර යටතේ ජාතික රථවාහන ගමනාගමන දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීමේ හා ධාරිතා ගොඩනැඟීමේ ව්‍යාපෘතිය

අරමුදල් සපයන ආයතනය : කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය	
ආරම්භක දිනය	: 01.01.2022
අවසන් වන දිනය	: 31.12.2025
ණය මුදල	: ඇ.ඩො.මි.4

ශ්‍රී ලංකාවේ වඩා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් සංවර්ධනයක් ඇති කිරීම සඳහා ජාතික මට්ටමින් රථවාහන දත්ත විශ්ලේෂණ හා කළමනාකරණ පද්ධතියක් ඇති කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. ව්‍යාපෘතියේ කාලසීමාව වසර 05ක් (2021 – 2025) වන අතර කොරියානු ජනරජය විසින් මේ සඳහා අරමුදල් සපයනු ලබයි.

මෙම ව්‍යාපෘතිය මඟින් කොළඹ දිස්ත්‍රික්කය හා ශ්‍රී ලංකාවේ සමස්ත ජාතික මාර්ග පද්ධතියම ආවරණය කරනු ලබයි. කොරියානු රජය මඟින් මේ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 4කට (KRW 4,480 million) නොඅඩු මූල්‍යාධාරයක් (Grant) ලබාදීමට නියමිත අතර එය ව්‍යාපෘතියේ වියදම් කළමනාකරණය සඳහා යොදවනු ලබන අතර ශ්‍රී ලංකා රජය මඟින්ද මේ සඳහා ප්‍රමාණවත් මුදලක් යොදනු ලබයි.

ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථය මඟින් පහත සඳහන් නිමැවුම් අපේක්ෂා කරනු ලබයි.

I. ජාතික මට්ටමේ රථවාහන ගමනාගමන දත්ත කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම

II. රථවාහන ගමනාගමන දත්ත රැස්කිරීමේ මූලික ක්‍රමෝපායක් සකස් කිරීම

III. ස්වයංක්‍රීය රථවාහන ගමනාගමන දත්ත කළමනාකරණ පද්ධතියක් සකස් කිරීම

IV. රථවාහන ධාරිතාවය පිළිබඳ විශ්ලේෂණ හැකියාව වර්ධනය කිරීම

වර්තමාන ප්‍රගතිය

මේ වන විට ඉහත ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් කොරියානු විශේෂඥයින් පිරිසකගේ හා මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශයේ නිලධාරීන් කිහිපදෙනෙකුගෙන් සමන්විත ක්‍රියාකාරී කණ්ඩායමක් හරහා සාමූහික කාර්යයක් ලෙස ක්‍රියාත්මක වේ. මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක ලෙස යටිතල පහසුකම්, මාර්ග ආරක්ෂණ හා රථවාහන ගමනාගමන කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂවරයා පත්කර ඇති අතර එම අංශයද ව්‍යාපෘතියේ කළමනාකරණ කටයුතු සඳහා මැදිහත්ව කටයුතු කරයි.

2024 හා 2025 වර්ෂ අවසාන වනවිට මෙම ව්‍යාපෘතිය මඟින් අත්කරගත් සමස්ත භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

ව්‍යාපෘති ක්‍රියාකාරකම්	2024.12.31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය(%)	2025.12.31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය(%)	2025 වර්ෂය තුල ප්‍රගතිය (%)
රථවාහන ගමනාගමන දත්ත සමුදායේ ප්‍රධාන සැලැස්ම සකස් කිරීම	100%	100%	0%
ධාරිතා සංවර්ධන පුහුණු කිරීම්	100%	100%	0%
ප්‍රමිතිගත රථවාහන ගමනාගමනය හා OD සමීක්ෂණ	73%	100%	27%
රථවාහන ගමනාගමන පුරෝකථනය හා උපයෝජනය	40%	90%	50%
ස්වයංක්‍රීය රථවාහන ගමනාගමන දත්ත සමුදාය පද්ධතිය	92%	96%	4%
ව්‍යාපාර කළමණාකරණය හා කාර්යසාධන කළමණාකරණය	58%	67%	9%

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ක්ෂේත්‍රය	වැය විෂය/ අයිතම විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම(රු.මි.)
117-02-	2104 ගොඩනැගිලි හා ඉදිකිරීම්	4000.00	2237.12
	එකතුව	**4000.00**	**2237.12**

මෙම ව්‍යාපෘතිය මඟින් 2025 වසර අවසානයේ දී අත්කර ගත් මූල්‍ය ප්‍රගතිය 91% ක් වූ අතර 2024 වසර අවසන් වන විට එය 99% ක් විය.

2.3.18 ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන

ග්‍රාමීය මාර්ග සංවර්ධනය කොන්ක්‍රීට් ඇතිරීම, අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් ඇතිරීම සඳහා ප්‍රමුඛත්වයක් ලබාදීම කෙරෙහි අවධානයක් ලබාදෙමින් ක්‍රියාත්මක වේ. වර්තමානයේදී ග්‍රාමීය මාර්ග අංශය ග්‍රාමීය මාර්ග සංවර්ධනය, ග්‍රාමීය පාලම් සංවර්ධනය සහ ග්‍රාමීය මාර්ග වැඩවලට අදාල ව්‍යුහාත්මක වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි.

2024 වර්ෂයේදී ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන යටතේ මාර්ග ව්‍යාපෘති 2,742ක් ප්‍රදානය කොට ඇති අතර ඒ අතුරින් ව්‍යාපෘති 2,720ක් වැඩකටයුතු අවසන් කර ඇති අතර මාර්ග ව්‍යාපෘති 22 වැඩ ක්‍රියාත්මක වෙමින් පවති. 2024 වර්ෂයේ සිව්වන කාර්තුව අවසන් වන විට ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන සඳහා 99% ක සමස්ත භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇත.

2025 දෙසැම්බර් මස අවසානය වන විට, ව්‍යාපෘති 3,189ක් ප්‍රදානය කර තිබූ අතර ඉන් මාර්ග ව්‍යාපෘති 2,563ක් අවසන් කර තිබුණේ 80% ක සමස්ත ප්‍රගතියක් අත්කර ගනිමිනි.

මේ යටතේ, 2025 වසරේ ආරම්භ කරන ලද ව්‍යාපෘති බොහොමයක් 'දිවිවා' සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ අහිතකර කාලගුණික තත්ත්වය මත ප්‍රමාද වූ අතර, එම කටයුතු නැවත සාමාන්‍ය තත්ත්වයට පත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ක්ෂේත්‍රය	වැය විෂය/ අයිතම විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම(රු.මි.)
117-02-04-59	2106 මෘදුකාංග සංවර්ධනය	15.00	3.17
	2509 වෙනත්	115.00	115.00
	එකතුව	**130.00**	**118.17**

ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන (Rural Road Re-awakening Programme) මගින් 2024 සහ 2025 යන වසර දෙකෙහිම අවසානය වන විට 97%ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

2025 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව මහාමාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය

මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් ඒවායෙහි ක්‍රියාකාරකම් වඩාත් සුමට ලෙස ක්‍රියාත්මක කිරීමට හැකිවෙනැයි උපකල්පනය කරමින් ව්‍යාපෘතියේ ඉලක්ක මුලින් සැලසුම් කළද විවිධ අභ්‍යන්තර හා බාහිර සාධක හමුවේ එම ඉලක්ක සංශෝධනය කිරීමට සිදු වී ඇත. ඒ අනුව, මුල් ඉලක්කය හා සංශෝධනය කරන ලද ඉලක්කයන්ට අනුව භෞතික ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය පහත පරිදි සාරාංශ කර දැක්විය හැකිය.

මාර්ග සහ පාලම් නඩත්තු කිරීම, ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණය, රථවාහන ගමනාගමන කළමනාකරණය යන ව්‍යාපෘතීන් වාර්ෂික වැඩසටහන් ලෙස ක්‍රියාත්මක වන අතර ඒවායෙහි ඉලක්ක පෙර වර්ෂ හා නිශ්චිතව සැසඳිය නොහැක්කේ එක් එක් වර්ෂයන්හීදී එම වැඩසටහන් සඳහා වෙන් කරනු ලබන අක්මුදල් මත ඒවායේ ඉලක්ක තීරණය වන බැවිනි.

- **පේරාදෙණිය - බදුල්ල - වෙන්කලාඩි මාර්ගය (ඒ5) ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය**

		2024				2025		
		සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මූල්‍ය ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
සවුදි අරමුදල් යටතේ ක්‍රියාත්මක මාර්ග කොටස	කෙවිලියාමඩු - මංගලගම දක්වා	94	86	91	14	14	13.7	98
	මංගලගම - මාඔය දක්වා	89	81	91	19	19	18.8	99
ඔපෙක් අරමුදල් යටතේ ක්‍රියාත්මක මාර්ග කොටස	ලුණුගල - යාල්කුඹුර දක්වා	7.5	7.1	95	0.4	0.4	0.4	100
	යාල්කුඹුර - බිබිල දක්වා	16.7	16.06	96	0.7	0.7	0.58	83

2022 වර්ෂය අවසන් වන විට ඔපෙක් ආධාර යටතේ හා සවුදි අරමුදල් යටතේ ක්‍රියාත්මක මාර්ග පැකේජයන්හි වැඩිදියුණු කිරීමේ කටයුතු නිම කොට ඇත.

- **මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සවුදි අරමුදල)**

	2024				2025		
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 4/3	නිමකරන ලදි.			නිමකරන ලදි.			
ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 6/1	නිමකරන ලදි.			නිමකරන ලදි.			
ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 6/2	නිමකරන ලදි.						
කින්නියා-කුරින්චන්කර්නි මාර්ගයේ කුරින්චන්කර්නි පාලම ඉදිකිරීම	0	0	0	25	15	7.92	53

2024 වර්ෂය අවසන් වන විට ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 6/2හි ඉදිකිරීම් කටයුතු අවසන් කල අතර වර්ෂය තුල අරමුදල් සපයන්නාගේ එකඟතාවය ලැබෙන තුරු කුරින්චන්කර්නි පාලමේ ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි විය.

- **මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (ඔපෙක් අරමුදල I)**

	2024				2025		
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩ් මාර්ගයේ කොටසක් වැඩිදියුණු කිරීම	නිමකරන ලදි.						
ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 4/2 නැවත ඉදිකිරීම	39.2	44.5	<100	0.5	0.5	0.5	100
ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක3/1 නැවත ඉදිකිරීම	13	25.5	<100	0.5	0.5	0.5	100

නැවත ඉදිකිරීම සඳහා හඳුනාගන්නා ලද ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් 02 හි ඉදිකිරීම් 2022 වර්ෂයේදී ආරම්භ කළ අතර 2024 වර්ෂාවසානය වන විට 99.5% ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.

- **කොළඹ දිස්ත්‍රික් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය**

	2024				2025		
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
කොට්ටාව - තලගල මාර්ගය	නිම කරන ලදි.						
ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය (අදියර I)	1.41	1.5	<100	0.03	0.03	0.03	100
ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය (අදියර II)	4.5	5.3	<100	0.5	0.22	0.103	47
පිළියන්දල - මහරගම මාර්ගය වැඩිදියුණු කිරීම (කි.මී.0+000-1+800)	1.6	1.84	<100	90	91.12	71.98	79
පිළියන්දල - මහරගම මාර්ගය වැඩිදියුණු කිරීම (කි.මී.3+700-5+700)	0	0	0	30	24	25.79	100>

2024 වර්ෂය අවසන් වන විට ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය අදියර I සඳහා 97.27% ක සමුච්ඡිත භෞතික ප්‍රගතියක් හා අදියර II සඳහා 96.84%ක සමුච්ඡිත භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇත.

- **ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන**

	2024			2025			
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
අදියර I	0.34	3%	<100	නිම කරන ලදි			
අදියර II	6.06	11.69	<100		14	0.14	1

වාර්තා කරනු ලබන කාලසීමාව අවසානයේදී අදියර Iසඳහා 91.8%ක සමුච්චිත භෞතික ප්‍රගතියක් හා අදියර II සඳහා 79.1%ක සමුච්චිත භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.

- **බස්නාහිර පළාත් ජාතික මාර්ග ව්‍යාපෘතිය**

	2024			2025			
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
කඩුවෙල - අතුරුගිරිය මාර්ගය	නිමකරන ලදි			නිමකරන ලදි			
ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ අංක 9/1 දරණ පාලම ප්‍රතිසංස්කරණය කිරීම	-			65	39.94	25.1	100>

- **ගාල්ල – දෙනියාය - මාදම්පේ මාර්ගයේ කිලෝමීටර් 78+000 සිට 130+600 දක්වා කොටස වැඩිදියුණු කිරීම (සූරියකන්ද සිට රක්වාන දක්වා කොටස)**

	2024				2025		
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
සූරියකන්ද - රක්වාන දක්වා මාර්ග කොටස (කි.මී.112+600 - 118+600)	42.43	51.11	< 100	13.05	11	14.06	100>
සූරියකන්ද - රක්වාන දක්වා මාර්ග කොටස (කි.මී.118+600 - 124+600)	29.16	30.78	< 100	27.52	14.33	28.55	100>
සූරියකන්ද - රක්වාන දක්වා මාර්ග කොටස (කි.මී. 124+600- **130+600**)	60.29	43.6	<100	9.55	9.81	10.15	100>
වල්ගම - දියගම මාර්ගය වැඩිදියුණු කිරීම	0	0	0	45	50.57	32.44	64
ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක **2/3** නැවත ඉදිකිරීම	0	0	0	65	80	54.8	68.5

වාර්තා කරනු ලබන කාලසීමාව තුල වල්ගම - දියගම මාර්ගයේ හා ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 2/3 නැවත ඉදිකිරීම කටයුතු 2024 වර්ෂය තුල ආරම්භ කිරීමට සැලසුම් කළද වර්ෂාවසානය වන විට මූලික අදියරේ පැවතුණි.

- අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය

	2024			2025			
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
ග්‍රාමීය මාර්ග කි.මී. 1000ක් ප්‍රතිසංස්කරණය කිරීම / වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම	33%	38%	<100%	31	20.46	15.58	76%

- මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය

	2024			2025			
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියේ නිර්මාණය හා ඉදිකිරීම්	23%	9.34%	40.6%	17.74	13.03	13.03	100
ආයතනික කටයුතු හා ධාරිතා සංවර්ධනය	2024 වර්ෂයේදී ආරම්භ කරන ලදී			0.05%	1.01%	1.01%	100%
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා මහල් 07 යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීම	2024 වර්ෂයේදී ආරම්භ කරන ලදී			1.43%	0.003%	0.003%	100%

2.4 මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම

2.4.1 මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම


ප්‍රධාන මාර්ග සහ කුඩා මාර්ග කොටස් සමග සම්බන්ධ කරනු ලබන අවධානයට ලක්විය යුතු එහෙත් විදේශාධාර මත ක්‍රියාත්මක කළ නොහැකි සහ අබලන් තත්ත්වයට පත් වූ කුඩා පාලම්, මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිසංස්කරණය කිරීම හා නැවත ඉදිකිරීම සිදුකරනු ලැබේ.

2025 වර්ෂයේ සිවිවන කාර්තුව අවසන් වන විට මෙම වැඩසටහන යටතේ මාර්ග කි.මී. 614.11 ක් වැඩිදියුණු කිරීම සඳහා ඉලක්ක කරන ලද අතර 33% ක ඉලක්ක අත්පත්කරගැනීමක් සහිතව වාර්තා කරන කාලසීමාව තුළදී මාර්ග කි.මී. 204.21 ක ප්‍රමාණයක වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් කරන ලදී. ඊට අමතර වශයෙන් මෙම ව්‍යාපෘතිය යටතේ පාලම් 08 ක් නැවත ඉදිකිරීමේ කටයුතු ද සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.


එසේම 2024 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය යටතේ ඉලක්ක කරන ලද මාර්ග දුර කි.මී. 57.89 අතුරින් කි.මී.53.16 ක ප්‍රමාණයක් වැඩිදියුණු කර ඇත්තේ 92% ක ප්‍රගතියක් අත්කර ගනිමිනි. තවද පාලම් 03 ක නැවත ඉදිකිරීම් කටයුතු ද 2024 වර්ෂය තුල අවසන් කරන ලදී.

2025 වර්ෂය අවසානයේදී මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ එක් එක් දිස්ත්‍රික්කය මඟින් අත්කරගන්නා ලද භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි දැක්විය හැක.

රූප සටහන 2.4.1.1 2024 වර්ෂයේ සංවර්ධිත මාර්ග දුර



රූප සටහන 2.4.1.2 2025 වර්ෂයේ සංවර්ධිත මාර්ග දුර



වගු අංක 2.4.1 2025 වර්ෂයේ මාර්ග හා පාලම් පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	දිස්ත්‍රික්කයේ නම	භෞතික ප්‍රගතිය		මූල්‍ය ප්‍රගතිය		
		2025.12.31 දිනට සමස්ත භෞතික ඉලක්කය	2025.12.31 දිනට අත්කරගත් ප්‍රගතිය (%)	අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මී)	2025.12.31 දිනට වියදම (රු.මී)	මූල්‍ය ප්‍රගතිය (%)
117-02-05-01-2506-11	කොළඹ	100	32%	571.58	570.62	99.8%
117-02-05-02-2506-11	ගම්පහ	100	39%	1,048.92	1,048.91	99.9%
117-02-05-03-2506-11	කළුතර	100	48%	82.74	82.39	99.6%
117-02-05-04-2506-11	මහනුවර	100	37%	350.26	331.15	94.5%
117-02-05-05-2506-11	මාතලේ	100	31%	167.47	151.75	91%
117-02-05-06-2506-11	නුවරඑළිය	100	52%	193.21	185.23	96%
117-02-05-07-2506-11	මාතර	100	25%	246.22	234.09	95%
117-02-05-08-2506-11	ගාල්ල	100	76%	448.24	446.47	99.6%
117-02-05-09-2506-11	හම්බන්තොට	100	49%	806.07	805.73	99.9%
117-02-05-10-2506-11	යාපනය	100	3%	57.81	56.99	99%
117-02-05-11-2506-11	කිලිනොච්චි	100	10%	22.48	22.47	99.9%
117-02-05-12-2506-11	මන්නාරම	100	3%	0.75	0.00	0%
117-02-05-13-2506-11	වවුනියාව	100	36%	72.82	72.29	99.3%
117-02-05-14-2506-11	මුලතිව්	100	50%	33.04	32.94	99.9%
117-02-05-15-2506-11	මඩකලපුව	100	33%	7.25	6.06	83.5%
117-02-05-15-2506-11	අම්පාර	100	26%	277.19	276.81	99.9%
117-02-05-17-2506-11	ත්‍රිකුණාමලය	100	38%	96.66	95.21	98.5%
117-02-05-18-2506-12	කුරුණෑගල	100	15%	20.79	15.79	76%
117-02-05-19-2506-13	පුත්තලම	100	53%	102.86	98.25	95.5%
117-02-05-20-2506-14	අනුරාධපුර	100	52%	634.24	538.95	85%
117-02-05-21-2506-15	පොළොන්නරුව	100	33%	43.43	43.42	99.9%
117-02-05-22-2506-16	බදුල්ල	100	51%	115.49	115.43	99.9%
117-02-05-23-2506-17	මොනරාගල	100	10%	15.19	15.18	99.9%
117-02-05-24-2506-18	කෑගල්ල	100	43%	367.27	367.18	99.9%
117-02-05-25-2506-19	රත්නපුර	100	30%	320.67	320.38	99.9%
එකතුව				**6,102.65**	**5,933.71**	**97%**

2024 හා 2025 වර්ෂයන්හි භෞතික ප්‍රගතිය ඇගැයීම

2024 වසරේදී, ගාල්ල, හම්බන්තොට, යාපනය, මඩකලපුව, ත්‍රිකුණාමලය, කෑගල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්ක 07ම 100% ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත. එමෙන්ම ගම්පහ, මාතර, අම්පාර, පුත්තලම, අනුරාධපුරය සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 06 මඟින් 90%කට වඩා වැඩි භෞතික ප්‍රගතියක් ලබා ගැනීමට සමත්ව තිබේ.

2025 වසරේදී කිසිදු දිස්ත්‍රික්කයක් 100%ක හෝ 90%කට වැඩි භෞතික ප්‍රගතියක් අත්කරගෙන නොමැත. මීට අමතරව 2025 වසරේදී ගාල්ල දිස්ත්‍රික්කය 75%කට වඩා වැඩි භෞතික ප්‍රගතියක් ලබා ඇත. 2024 වසරේදී කළුතර, මාතලේ සහ බදුල්ල යන දිස්ත්‍රික්ක 75% - 90% අතර භෞතික ප්‍රගතියක් අත්කර ගැනීමට සමත්ව ඇත.

2024 වර්ෂයේදී දිස්ත්‍රික්ක 25 අතරින් දිස්ත්‍රික්ක 09 ක් 75% ක ට අඩු භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇති අතර අවම භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇත්තේ මුලතිව් දිස්ත්‍රික්කයෙනි.

වාර්තා කරනු ලබන කාලසීමාව අවසාන වන විට, දිස්ත්‍රික්ක 05ක් 50%කට වඩා වැඩි භෞතික ප්‍රගතියක් අත්කරගෙන තිබූ අතර, 2025 වසරේ අවම භෞතික ප්‍රගතිය වාර්තා කර ඇත්තේ යාපනය සහ මන්නාරම යන දිස්ත්‍රික්ක වේ.

2025 වර්ෂයේදී මෙම වැඩසටහන මඟින් පළාත් වශයෙන් අත්කරගත් මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

වගුව 2.4.1.2 – 2024 හා 2025 වර්ෂයේ දී පළාත් වශයෙන් අත්කර ගත් මූල්‍ය ප්‍රගතිය

පළාතේ නම	2024/12/31 ට අත්කර ගත්මූල්‍ය ප්‍රගතිය	2025/12/31 ට අත්කර ගත්මූල්‍ය ප්‍රගතිය
බස්නාහිර	81%	99.9%
මධ්‍යම	78%	94%
දකුණ	94%	99%
උතුර	77%	99%
නැගෙනහිර	98%	99%
වයඹ	79%	92%
උතුරු මැද	71%	86%
ඌව	70%	99.9%
සබරගමුව	69%	99.9%

මහාමාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ වැඩසටහන වාර්ෂිකව ක්‍රියාත්මක වන වැඩසටහනක් බැවින්, වෙන් කරනු ලබන වාර්ෂික අයවැය ප්‍රතිපාදනය හා වාර්ෂික අවශ්‍යතාවය මත භෞතික හා මූල්‍ය ඉලක්කයන් සැලසුම් කරනු ලැබේ.

2025/12/31 ට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය-2025(රු.මි)	වියදම (රු.මි)
117-2-5	2104- යටිතල පහසුකම් සංවර්ධනය	6,102.65	5,933.71
	එකතුව	**6,102.65**	**5,933.71**

මෙම ව්‍යාපෘතිය යටතේ, ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මී 1000 වඩා වැඩි ව්‍යාපෘති සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ (NPD) අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍ය වූ බැවින්, 2025 වසරේ ආරම්භයේදී ව්‍යාපෘති යෝජනා 23ක් අනුමැතිය සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර, එම ව්‍යාපෘති යෝජනා අතුරින් යෝජනා 15ක් සඳහා අනුමැතිය හිමිවූ අතර, ඉන් පහත සඳහන් ව්‍යාපෘති 03 සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත.

i. මහයියාව උමං මාර්ගය සහ ඒ ආශ්‍රිත මාර්ග කොටස
ii. විලියම් ගොපල්ලව මාවත, මාර්ගය ඉදිකිරීම
iii. ආවරන්කල් - තොණ්ඩමනාරු මාර්ගයේ (කි.මී. 0+000 සිට 6+000 දක්වා) ABC අතුරා මතුපිට සැකසීම, පාර පුළුල් කිරීම, මාර්ග උරහිස් (Sholder) සැකසීම සහ ඇස්ෆෝල්ට් (Asphalt) ඇතිරීම.


මීට අමතරව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් තවත් ව්‍යාපෘති 03ක් නැවත සැලසුම් කිරීම සඳහා (Re-Design) උපදෙස් ලබාදී ඇති අතර ඒවා පහත පරිදි වේ.
ආවරණය කරන ලද ස්ලැබ් කොටස් සහිතව කාණු සැකසීම ද ඇතුලත්ව මහනුවර - යාපනය මාර්ගය (කි.මී 176+000-179+000) පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම, මාතර - අකුරැස්ස මාර්ගය (කි.මී 4+000-20+090) සහ පේරාදෙණිය - දෙල්තොට - රිකිල්ලගස්කඩ මාර්ගයේ කි.මී 28+000-35+000 දක්වා මාර්ග කොටස සහ කි.මී 22+750-26+000 දක්වා මාර්ග කොටස පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම.

තවද, තවත් ව්‍යාපෘති යෝජනා 04ක් සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ (NPD) අනුමැතිය අපේක්ෂාවෙන් සිටින අතර, මරදන්කඩවල - හබරණ - තිරිකොණ්ඩියාමඩු මාර්ගය (කි.මී. 25+000 සිට 31+000) සංවර්ධනය කිරීම සඳහා වූ ව්‍යාපෘති යෝජනාව සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීම මත ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොමැත.

2.5 පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම

රටේ මාර්ග ජාලයේ වැදගත් අංගයක් ලෙස සහ මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා මාර්ග සංවර්ධනයට සමගාමීව වාර්ෂිකව පාලම් 100 – 150 ක ප්‍රමාණයක් නැවත ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සිදුකළ යුතුව ඇත. (පවතින පාරු පාලම් හා පටු මෙන්ම දුබල පාලම් වෙනුවට ස්ථිර පාලම් සකස් කිරීම සිදු කළ යුතුව ඇත) තව ද පවතින මාර්ග තදබදය අවම කිරීම, ගමනාගමනයේ දී සිදුවන ප්‍රමාදය අඩු කිරීම, මාර්ග අනතුරු අවම කිරීම, වාහන නඩත්තු පිරිවැය අවම කිරීම සහ ආරක්ෂිත සහ කාර්යක්ෂම ප්‍රවාහන ජාලයක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රධාන මංසන්ධිවල ගුවන් පාලම් ඉදිකිරීම ද කළ යුතු ව ඇත. මෙම වැඩසටහන යටතේ මෙම අමාත්‍යාංශය විසින් 2021 වසරේදී ද පහසු ,ඉක්මන් හා ආරක්ෂාකාරී ගමනාගමන අවශ්‍යතා හඳුනාගනිමින් නව පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම, කුඩා හා දුර්වල පාලම් ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම සහ නැවත ඉදිකිරීම මෙන්ම නව පාලම් ඉදිකිරීම යන කාර්යයන් අන්තර්ගත වූ ව්‍යාපෘති රාශියක් හරහා සිදු කරන ලදී.

ජාතික මහාමාර්ග ජාලය (ඒ ශ්‍රේණියේ හා බී ශ්‍රේණියේ මහාමාර්ග) තුළ පාලම් 4413 පමණ ප්‍රමාණයක් පවතින අතර එම පාලම් ඒවායේ දිග ප්‍රමාණ අනුව පහත පරිදි වර්ගීකරණය කර දැක්විය හැකිය.



වගුව 2.5.1- ජාතික මාර්ගයන්හි පිහිටි පාලම් පිළිබඳ සාරාංශය

ජාතික මහාමාර්ග ජාලයේ ඉදිකරන ලද පාලම් අතරින් ඉහළම ප්‍රතිශතයකට අයත් ප්‍රමාණය දිග මීටර 10ට අඩු වර්ගීකරණ කාණ්ඩය යටතට ගැනෙන අතර අවම පාලම් ප්‍රමාණය මීටර 30ත් මීටර 50ත් අතර කාණ්ඩයට සහ මීටර 10ත් 30ත් අතර කාණ්ඩයට අයත් වේ. තව ද උක්ත වර්ගීකරණය යටතට ගැනෙන පාලම් සියල්ල ජාතික මහාමාර්ග ජාලය තුළ ස්ථාන ගත ව ඇති පාලම් වන බැවින් අධිවේගී මාර්ගයන්හි පිහිටි පාලම් මේ යටතට ඇතුළත් නොවේ.

2.5.1 ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත්/ අබලන් පාලම් නැවත ඉදිකිරීම / ප්‍රතිනිර්මාණය

මෙම වැඩසටහන යටතේ 2024 වර්ෂයේදී සවිබල ගැන්වීම් කටයුතු සිදු කරනු ලැබූ පාලම් ගණන 58කි. එම පාලම් 58 අතරින් පාලම් 35ක කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කළ අතර තවත් පාලම් 7ක ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක තත්ත්වයෙහි පැවතිණි. 2025 වර්ෂයේදී පාලම් 128ක සවිබල ගැන්වීම් කටයුතු ආරම්භ කළ අතර ඉන් පාලම් 55ක කටයුතු අවසන් කළ අතර තවත් පාලම් 07ක ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතිණි. ඒ අනුව, මෙම වැඩසටහන සඳහා අත්කරගත් ප්‍රගතිය 2024 වසරට සාපේක්ෂව 2025 වසරේදී වැඩි අගයක් ගෙන ඇත.

වගු අංක 2.5.1.1 2025 වර්ෂය තුළ ආරම්භ කරනු ලැබූ ව්‍යාපෘති සඳහා භෞතික ප්‍රගතිය

පළාත	නිමකරන ලද	ක්‍රියාත්මක වෙමින් පවතින	එකතුව
බස්නාහිර	8	13	21
මධ්‍යම	10	11	21
දකුණු	9	9	18
උතුරු	1	3	4
නැගෙනහිර	2	7	9
නැගෙනහිර (අක්කරෛපත්තු)	5	3	8
වයඹ	7	13	20
උතුරු මැද	3	2	5
ඌව	1	6	7
සබරගමුව	9	6	15
එකතුව	**55**	**73**	**128**

මෙම ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේදී වාර්තා වූ සමස්ත මූල්‍ය ප්‍රගතිය 21%ක් වූ අතර 2025 වර්ෂයේදී වාර්තා වූ සමස්ත මූල්‍ය ප්‍රගතිය 40% කි.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය ශීර්ෂය/ අයිතම ඩිස්ත්‍රරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය 2025 (රු.මි.)	වියදම් (රු.මි.)
117-02-06-08	2001 ගොඩනැඟිලි සහ ව්‍යුහයන්	3,650.00	1,464.67
	එකතුව	3,650.00	1,464.67

2.5.2 පැරණි පාලම් කොටස් භාවිතා කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම

ග්‍රාමීය ප්‍රදේශවල පවතින අවම වියදමකින් ඉදිකිරීම් කටයුතු සිදු කළ හැකි පාලම් සහ ගංවතුර වැනි හදිසි ආපදා තත්ත්වයන් යටතේ ඉක්මනින් ඉදිකිරීම් කටයුතු සිදු කළ යුතු මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගයන්හි පිහිටා ඇති ග්‍රාමීය පාලම් නැවත ඉදිකිරීම ග්‍රාමීය පාලම් අංශයේ ප්‍රධානතම වගකීමයි. මෙහිදී මූලික වශයෙන්ම පැරණි පාලම්වල යකඩ කොටස් භාවිතා කරමින් පාලම් නැවත ඉදිකිරීම සිදු කරනු ලබයි.

මෙම වැඩසටහන යටතේ 2024 වර්ෂය තුළදී, ග්‍රාමීය පාලම් 06ක නැවත ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කළ අතර, තවත් පාලම් 08ක නැවත ඉදිකිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතිණි.

2025 දෙසැම්බර් මස අවසාන වන විට, පාලම් 22ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇති අතර, පාලම් 144ක ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදුවෙමින් පවති.

මෙම ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේදී වාර්තා වූ සමස්ත මූල්‍ය ප්‍රගතිය 100%ක් වූ අතර 2025 වර්ෂයේදී වාර්තා වූ සමස්ත මූල්‍ය ප්‍රගතිය 93% කි.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය ශීර්ෂය/ අයිතම ඩිස්ත්‍රරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය 2025 (රු.මි.)	වියදම් (රු.මි.)
117-02-06-14	2104 ගොඩනැඟිලි සහ ව්‍යුහයන්	400.00	373.48
	එකතුව	**400.00**	**373.48**

2.5.3 ජාතික මහාමාර්ගයන්හි පිහිටි පාලම් 25 ක් නැවත ඉදිකිරීම

පාලම් ගණන	:පැ I – 08 , පැ II – 09, පැ III – 08, පැ IV – 01
අරමුදල් සපයන ආයතනය	: අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල (KFAED)
ඇස්තමේන්තුගත මුදල	:රු.මි. 5,070
ඇස්තමේන්තුගත මුදල (සංශෝධිත)	: රු.මි. 6,960
කොන්ත්‍රාත් මුදල: පැ I – රු.මි. 1,165.84 , පැ II– රු.මි.1,289.77, පැ III–රු.මි.2,057.61, පැ IV- රු.මි.441.03	
ණය මුදල	:කුවේට් ඩිනාර් මිලියන 10
ආරම්භක දිනය : පැ I – 07.09.2015, පැ II – 23.01.2020, පැ III – 20.07.2020 , පැ IV- 08.02.2022	
අවසන් වන දිනය: පැ I – 05.09.2017, පැ II – 21.01.2022 පැ III – 19.01.2022 , පැ IV- 07.05.2023	
අවසන් වන දිනය : පැ I – 19.06.2020, පැ II – 03.02.2022 පැ III – 15.02.2025	

මෙම ව්‍යාපෘතිය යටතේ "ඒ" හා "බී" ශ්‍රේණිවලට අයත් ජාතික මහාමාර්ගයන්හි පාලම් 25 ක් ඉදිකරනු ලැබේ. පැකේජ 4ක් යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් පැකේජ I යටතේ, පාලම් 08 ක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කොට ඇත. එම

කොන්ත්‍රාත් පැකේජ Iහි ඉදිකිරීම් කටයුතු 2015 දී ආරම්භ කළ අතර සියළුම ඉදිකිරීම් කටයුතු අවසන් කර 2020 ජූනි මස 19 වන දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දීමට හැකි වී ඇත.

කොන්ත්‍රාත් පැකේජ II හා III යටතේ පිළිවෙලින් පාලම් 09ක් සහ 08ක් ඉදිකිරීමේ කටයුතු 2020 වර්ෂයේදී ආරම්භ කරන ලදී. වාර්තා කරනු ලබන වර්ෂය අවසන් වන විට දෙවන පැකේජයේ සිවිල් වැඩ සම්පූර්ණයෙන්ම අවසන් කරන ලදී.

වාර්තාකරණ කාලසීමාව අවසානය වන විට, මෙම ව්‍යාපෘතියේ III වන පැකේජය යටතේ ඇති පාලම් ලැයිස්තුව සහ එක් එක් පාලම ලබා ඇති ප්‍රගතිය පහත පරිදි දැක්විය හැකිය.

වගු අංක 2.5.3.1කොන්ත්‍රාත් පැකේජ III යටතේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට තෝරාගනු ලැබූ පාලම්වල සමස්ත භෞතික ප්‍රගතිය

අයිතම අංක	පාලම් නම සහ අංකය	දිග ප්‍රමාණය (මීටර්)	2024.12.31 දිනට සමුච්ඡිත භෞතික ප්‍රගතිය (%)	2025.12.31 දිනට සමුච්ඡිත භෞතික ප්‍රගතිය (%)
1	පාලම් අංක 75/1 කටුගස්තොට - කුරුණෑගල - පූත්තලම මාර්ගය (ඒ 010)	124.4	99%	100%
2	පාලම් අංක 76/1 කටුගස්තොට - කුරුණෑගල - පූත්තලම මාර්ගය (ඒ 010)	16.5	100%	100%
3	පාලම් අංක 16/1 තෝප්පු - මාදම්පේ මාර්ගය (බී 419)	19	94%	100%
4	පාලම් අංක 78/5 නාවත්කුලි - කරතිව් - මන්නාරම මාර්ගය(ඒ 032)	57	96%	100%
5	පාලම් අංක 53/1 පරන්තන් - කරච්චි - මුලතිව් මාර්ගය (ඒ 035)	21.6	100%	100%
6	පාලම් අංක 31/3 කොළඹ - මහනුවර මාර්ගය (ඒ 001)	25	97%	99%
7	පාලම් අංක 32/2 කොළඹ - මහනුවර මාර්ගය (ඒ 001)	38	96%	99%
8	පාලම් අංක 3/5 බත්තුළුඔය - උඩප්පුව - ඇඳිමූනායි මාර්ගය (බී 614)	38	99%	100%

ඉහත වගුවට අනුව, 2024 වර්ෂය අවසන් වන විට තුන්වන පැකේජය යටතේ පාලම් 02ක ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබූ අතර ඉතිරි පාලම්හි ඉදිකිරීම් කටයුතු නිම කිරීමට ආසන්න තත්ත්වයේ පැවතිණි.

2024 වර්ෂය අවසන් වන විට තුන්වන පැකේජය සඳහා 98%ක සමුච්ඡිත භෞතික ප්‍රගතියක් වාර්තා වූ අතර 2025 වර්ෂය අවසානයේදී එම අගය වාර්තා වූයේ 99% ක් ලෙසිනි.

මෙම ව්‍යාපෘතියේ සිව්වන පැකේජය යටතේ කොළඹ - ගාල්ල - හම්බන්තොට - වැල්ලවාය මාර්ගයේ (A002) පාලම් අංක 52/1 2022 වර්ෂයේදී ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබුණ ද එම පාලමෙහි ඉදිකිරීම් කටයුතු 2022 ජූලි මස 21 දින සිට තාවකාලිකව නතර කරන ලද අතර 2025 මැයි 23 වනදින ව්‍යාපෘතිය අවසන් කරන ලදී.

තවද, මෙම ව්‍යාපෘතියේ පස්වන පැකේජය යටතේ තවත් පාලම් 06ක සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා හඳුනාගත්තද 2024.12.31 දිනෙන් ණය ගිවිසුම් කාලය ඉකුත් වීම හේතුවෙන්, එම කටයුතු නතර කරන ලදී.

මෙම ව්‍යාපෘතිය මඟින් 2024 වර්ෂය අවසන් වන විට 9% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇති අතර 2025 වර්ෂයේදී එම අගය වාර්තා වී තිබුණේ 98%ක් ලෙසිනි.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	වැය ශීර්ෂය/ අයිතම ඒකාබද්ධ	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය - 2025 (රු.මි)	වියදම් (රු.මි.)
117-02-06-17	2104 ගොඩනැඟිලි සහ ව්‍යුහයන්	250.00	245.91
	එකතුව	**250.00**	**245.91**

2.5.4 කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් 02ක් ඉදිකිරීම

සමස්ත මාර්ග ජාලයේ ධාරිතාවය ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රමෝපායික වැදගත්කමකින් යුත් මංමාවත්වල අන්තර් කොටස් හා ඒවායේ විවිධ මට්ටම් වැඩිදියුණු කිරීම අවශ්‍යතාවයක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇති අතර ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, හා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉහත සඳහන් කළ වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා බොහෝ ක්‍රියාමාර්ග ගෙන තිබේ. මේ යටතේ, කොහුවල සහ ගැටඹේ යන ස්ථාන වල හංගේරියානු ආධාර යටතේ නව ගුවන් පාලම් ඉදිකිරීමට කටයුතු කරමින් පවති.

- **කොහුවල ගුවන් පාලම**

මුළු දුර	: මීටර් 297
අරමුදල් සපයන ආයතනය	: හංගේරියානු අරමුදල්
ඇස්තමේන්තුගත මුදල	: රු.මි. .2,134.6
ණය මුදල	: යුරෝ මිලියන 10.9
ව්‍යාපෘති කාලසීමාව	: මාස 22
ආරම්භක දිනය	: 16.08.2021
අවසන් වන දිනය	: 16.06.2023
සංශෝධිත අවසන් වන දිනය	: 31.10.2024

කොළඹ - හොරණ මාර්ගයේ (බී 84) කොහුවල මංසන්ධියේ කොහුවල ගුවන් පාලම ඉදිකිරීමට යොජනා කර ඇති අතර එම මාර්ගය කොළඹ නගරය සඳහා අවතීර්ණ වීමට හැකි ප්‍රධාන මාර්ග අතුරින් එකක් ලෙස හැඳින්විය හැකිය. තව ද බී 84 මාර්ගය අධික ජනගහනයකින් යුත් අර්ධ නාගරික ප්‍රදේශයක් වන එම ප්‍රදේශ කොළඹ නගරය හා සම්බන්ධ කෙරෙන මෙකී මංසන්ධිය පිළිබඳව සලකා බැලීමේදී කොළඹ - හොරණ මාර්ගයේ (බී84) කොහුවල මංසන්ධිය හරහා අධික රථවාහන තදබදයක් ඇතිවන අතර ප්‍රධාන වශයෙන් ඇතුල්කෝට්ටේ - මිරිහාන - කොහුවල (බී229) යන මාර්ග හරහා පැමිණෙන රථවාහන හා බී 229 මාර්ගය ඔස්සේ බී84 මාර්ගය දෙසට රථවාහන හැරවීමේදී මෙකී තදබදය උද්ගත වේ. උක්ත තත්ත්වය හේතුවෙන් මෙම ස්ථානයේ ගුවන් පාලමක් ස්ථාපනය කිරීම මඟින් බී84 මාර්ගය ඔස්සේ සෘජුවම පවතින රථවාහන තදබදය නිසා උද්ගත වන ගැටලු බොහෝ දුරට විසඳා ගැනීමට හැකිවන අතර බී84 (කොළඹ - හොරණ) මාර්ගය ඔස්සේ රථවාහන ප්‍රවාහය අවහිරයකින් තොරව ගමන් කිරීම සඳහා ඉන් අවකාශ සැලසෙනු ඇත

2024 දෙසැම්බර් මස අවසානය වන විට කොහුවල ගුවන් පාලමේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම නිම කර තිබූ අතර, 2024 ජූලි 17 වන දින එය මහජන අයිතියට පත් කරන ලදී.

- **ගැටඹේ ගුවන් පාලම**

මුළු දුර	: ප්‍රධාන ගුවන් පාලම මීටර් 374 අතුරු ගුවන් පාලම මීටර් 124
අරමුදල් සපයන ආයතනය:	හංගේරියානු අරමුදල්
ඇස්තමේන්තුගත මුදල	:රු.මි. 8,055.6
සංශෝධිත ඇස්තමේන්තු මුදල	: රු.මි. 8,186.77
ණය මුදල	:යුරෝ මිලියන 41.1
ව්‍යාපෘති කාලසීමාව	:මාස 28
ආරම්භක දිනය	: 16.08.2021
අවසන් වන දිනය:	16.10.2023
සංශෝධිත අවසන් වන දිනය	: 16.01.2024

මහනුවරට ප්‍රවේශ වීමට හැකි ප්‍රධාන මාර්ගයන් 02ක් ලෙස විලියම් ගොපල්ලව මාවත (ඒබී42) සහ ඒ1 මාර්ගයේ අන්තර් කොටසක් වන ගැටඹේ මංසන්දිය හැඳින්විය හැක. ඒබී 042 විලියම් ගොපල්ලව මාවතේ දැනට පවතින හරස් මාර්ගය ගැටඹේ සිට මීටර් 120 ක් දුරින් පිහිටා ඇත.

යෝජිත ගුවන් පාලම මහනුවර දක්වා දිවෙන ඒ1 මාර්ගය ඔස්සේ ඒබී42 මාර්ගය හරහා ඉදිකරනු ලබයි. මීට අමතරව යෝජිත ගුවන් පාලම ඒබී42 මාර්ගයේ ඇති හරස් මාර්ගය හරහා ඉදිකිරීම් තුළින් අතුරු මාර්ගය ඔස්සේ මහනුවර නගරය සිට පැමිණෙන රථවාහන සඳහා දුම්රිය ධාවනය හේතුවෙන් මාර්ගයේ ඇතිවන රථවාහන තදබදයකින් තොරව ගමනාගමනය සඳහා ඉඩ සැලසෙනු ඇත.

ගැටඹේ ගුවන් පාලමෙහි ඉදිකිරීම් කටයුතු 2021 වසරේදි ආරම්භ කළ අතර වාර්තා කරනු ලබන කාලසීමාව අවසානයේදී ගුවන් පාලමේ ඉදිකිරීම් සඳහා 36% සමුච්ඡිත භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇතත් අතුරු ගෙවීම් සහතික (IPCs) නොගෙවීම නිසා ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා ඇත.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ක්ෂේත්‍රය	වැය විෂය/ අයිතම විස්තරය	සංශෝධිත අයවැය ප්‍රතිපාදනය 2025 (රු.මි)	වියදම් (රු.මි.)
117-02-06-26	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම්	165.00	165.00
	2104 ගොඩනැඟිලි සහ ව්‍යුහයන්	20.00	10.24
	එකතුව	**185.00**	**175.24**

වාර්තා කරනු ලබන කාලසීමාව තුලදී මෙම ව්‍යාපෘතිය මඟින් 95% ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇති අතර 2024 වර්ෂයේදී එම අගය වාර්තා වූයේ 11% ක් ලෙසිනි.

2.5.5කොම්පඤ්ඤවීදිය ප්‍රදේශයේ ගුවන් පාලම් 03ක් ඉදිකිරීම

කොම්පඤ්ඤවීදිය ප්‍රදේශයේ උත්තරානන්ද මාවතේ හා විනිසුරු අක්බාර් මාවතෙහි ගුවන් පාලම් 02ක් ඉදිකිරීම

මුළු දුර : කි.මී. 1.019

උත්තරානන්ද මාවත ගුවන් පාලම :මී.410
විනිසුරු අක්බාර් මාවත ගුවන් පාලම :මී.350
අතුරු ගුවන් පාලම :මී.224

අරමුදල් සපයන ආයතනය : දේශීය අරමුදල්

ඇස්තමේන්තුගත මුදල :රු.මී. 5,278.1

කොන්ත්‍රාත් මුදල : රු.මී. 5,278.1

ව්‍යාපෘති කාලසීමාව :මාස 12

ආරම්භක දිනය : 07.06.2021

අවසන් වන දිනය : 31.12.2022

සංශෝධිත අවසන් වන දිනය : 28.07.2024

බාලදක්ෂ මාවත, දුම්රිය පාර හරහා ඇති සර් විත්තම්පලම් ඒ ගාඩිනර් මාවත හා බෙරේ වැව සම්බන්ධ කරමින් ගුවන් පාලමක් ඉදිකිරීම

මුළු දුර : මී. 0.32

අරමුදල් සපයන ආයතනය : දේශීය අරමුදල්

ඇස්තමේන්තුගත මුදල : රු.මී. 2,981

කොන්ත්‍රාත් මුදල : රු.මී. 2,735

ව්‍යාපෘති කාලසීමාව : මාස 12

ආරම්භක දිනය : 07.06.2021

අවසන් වන දිනය : 31.12.2022

සංශෝධිත අවසන් දිනය : 13.04.2025

කාර්යබහුල අවස්ථාවන්හි දී නිර්මාණය වන දැඩි රථවාහන තදබදයට පිළියම් ලෙස මාර්ග ජාලය වැඩිදියුණු කිරීමේ දී රටේ ආර්ථිකයට ඉහළ දායකත්වයක් සැපයිය හැකි අතර ඒ සඳහා දායකත්වයක් සපයනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රතිඵල ඊට බලපෑ හැකි ප්‍රධාන සාධකයක් ලෙස ක්‍රියාකරනු ඇති බව නිරීක්ෂණය වී ඇත. කොම්පඤ්ඤවීදිය ප්‍රදේශය

හරහා දිවෙන මාර්ගයන් කොළඹ කොටුව, පිටකොටුව යන ප්‍රදේශයන් සමඟ කොළඹ නගරයේ දකුණු ප්‍රදේශය හා යා කෙරෙන ප්‍රධාන මාර්ග පද්ධතියක් ලෙස ක්‍රියාකරනු ලැබේ. ඒ අනුව මෙම ප්‍රදේශයේ මාර්ග තදබදය ඉතා ඉහළ ප්‍රමාණයක පවතින්නා වූ ද ගමනාගමන හැකියාව වැඩිදියුණු කළ යුතු වූ ද මාර්ග ලෙස විනිසුරු අක්බාර් මාවත, මැලේවීදිය, ශ්‍රී උත්තරානන්ද මාවත හා බාලදක්ෂ මාවත හඳුනා ගනු ලැබ ඇත.

ඉතා ඉහළ ජනඝණත්වයකින් හා ඉහළ සංවර්ධනයකින් හෙබි මෙම ප්‍රදේශය කරා විශාල වාහන ප්‍රමාණයක් දිනපතා ඇතුල්වීම මෙන්ම පවතින මාර්ග ජාලය හා දුම්රිය ගේට්ටු 02 ක් මේ ඔස්සේ පැවතීමද මාර්ග තදබදය වැඩි වීම කෙරෙහි විශාල වශයෙන් හේතු වී ඇත. මෙම ගැටළු සඳහා පිළියමක් ලෙස ශ්‍රී ලංකා රජය විසින් කොම්පඤ්ඤවීදියේ පවතින රථවාහන තදබදය අවමකිරීම සඳහා පිළියමක් සෙවීමට තීරණය කරනු ලැබිණි. ඒ අනුව, සිදු කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යනයන්ට අනුව හඳුනාගත් ඒකාබද්ධ මාර්ග සැලසුමක් ක්‍රියාත්මක කිරීම උදෙසා මාර්ග ශ්‍රේණි ලෙස වෙන් කිරීම හෝ දුම්රිය හුවමාරු සැකසීම හා බේරේවැව හරහා බාලදක්ෂ මාවතේ සිට සර් විත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත දක්වා හුවමාරුවක් ඉදිකිරීම අත්‍යවශ්‍ය වන බව හඳුනාගෙන ඇත. මේ අනුව යෝජිත පරිදි ගුවන් පාලම් ඉදි කිරීමට තීරණය විය.

2024 වර්ෂයේ සිවිවන කාර්තුව අවසන් වන විට බාලදක්ෂ මාවත ගුවන් පාලමේහි ඉදිකිරීම් කටයුතු සඳහා 77%ක භෞතික ප්‍රගතියක්ද වාර්තා කරනු ලබන කාලසීමාව අවසන් වනවිට 87%ක සමුච්ඡිත ප්‍රගතියක්ද වාර්තා කර ඇත.

ඒ අනුව, 2024 වර්ෂය අවසන් වන විට විනිසුරු අක්බාර් මාවත ගුවන් පාලම හා උත්තරානන්ද මාවත ගුවන් පාලම යන ගුවන් පාලම් දෙකෙහිම ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් වූ අතර, ඒවා පිළිවෙලින් 2024 ජූලි මස 11 වන දින සහ 2024 අප්‍රේල් මස 08 වන දිනයන්හීදී මහජනතාව වෙත විවෘත කරන ලදි.

2024 වර්ෂය අවසන් වනවිට මෙම ව්‍යාපෘතිය සඳහා 98%ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇති අතර 2025 වර්ෂය අවසානයේදී එම අගය වාර්තා වූයේ 93%ක් ලෙසිනි.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ක්ෂේත්‍රය	වැය විෂය/ අයිතම විස්තරය	සංශෝධිත අයවැය 2025 ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි.)
117-02-06-27	2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම්	494.00	493.45
	2104 යටිතල පහසුකම් සංවර්ධනය	4,085.00	3,770.31
	එකතුව	**4,579.00**	**4,263.77**

2.5.6 වඩඩුවාකල් පාලම නැවත ඉදිකිරීම

මුලතිව් වඩඩුවාකල් පාලම ප්‍රතිසංස්කරණය කිරීම

මුළු දුර	: මීටර් 300
ඇස්තමේන්තු ගත මුදල	: රු.මි. 1,575.42
කොන්ත්‍රාත් මුදල	: රු. මි. 1,379.57
ආරම්භක දිනය	: 12.09.2025
අවසන් වන දිනය	: 12.09.2027

පරන්තන්–කරච්චි–මුලතිව් මාර්ගයේ (A-035) අංක 50/1 දරන මෙම පාලම පොදුවේ "වඩඩුවාකල් පාලම" ලෙස හැඳින්වේ. මෙය මුලතිව් දිස්ත්‍රික්කයේ නන්දිකඩාල් කලපුව හරහා විහිදෙන අතර, මෙමඟින් ප්‍රදේශයේ ගමනාගමන පහසුව සහ කලාපීය සම්බන්ධතාවය ශක්තිමත් කරනු ලැබේ.

දැනට පවතින වඩඩුවාකල් පාලම, කණු (piers) 109 කින් හා මීටර් 410 ක දිගකින් සමන්විත වන අතර ආසන්න වශයෙන් දිනකට වාහන 1,836 ක් පමණ මේ හරහා ගමන් කරනු ඇත. මෙම පාලමට සිවිල් යුද්ධය, සුනාමි ව්‍යසනය සහ අනෙකුත් ස්වභාවික විපත් හේතුවෙන් දැඩි ලෙස

හානි සිදුවී ඇති බැවින්, එය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කිරීම අත්‍යාවශ්‍ය වේ.

අළුතින් ඉදිකිරීමට යෝජිත පාලම, මංතීරු දෙකකින් සමන්විත වන අතර, මාර්ගයේ දෙපසම ආවරණය වන පරිදි ඉදිකරනු ලබන මීටර් 7.4 කින් යුත් වාහන ධාවන තීරුවලින්ද මීටර් 1.5 කින් යුත් බයිසිකල් ධාවන තීරුවකින්ද මීටර් 1.5කින් යුත් පදික මංතීරුවකින් ද සමන්විත වන පරිදි ඉදිකිරීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය 2025 වර්ෂයේ අයවැය යෝජනාවක් ලෙස ශ්‍රී ලංකා රජයේ අරමුදල් මඟින් සිදු කිරීමට නියමිතය.

2025 දෙසැම්බර් 31 වන දින අවසානය වන විට, ව්‍යාපෘතිය මඟින් 4.8%ක සමස්ත භෞතික ප්‍රගතියකි 4.8% ක් වාර්තා කර තිබූ අතර, තාවකාලික විකල්ප මාර්ගයේ ඉදිකිරීම් කටයුතු නිමකර මහජනතාව සඳහා විවෘත කර ඇත. පාදක බැම් ඉදිකිරීම සහ කුළුණු ඉදිකිරීමේ කටයුතු 2026 වර්ෂයේ ජනවාරි මාසයේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

2.5.7 යටියන්තොට - මාගම්මන මාර්ගයේ ගරාගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි පළාත් සභා මාර්ගයක් වන යටියන්තොට - මාගම්මන මාර්ගයේ පිහිටා ඇති ගරාගොඩ පාලම සබරගමුව පළාත අවිස්සාවේල්ල - හැටන් - නුවරඑළිය මාර්ගය (A007) හා සම්බන්ධ කෙරෙන ගංඟාව හරහා වැටී ඇත. යටියන්තොට පොලිස් ස්ථානය, පාසල් 05ක්, තේ කර්මන්තශාලා 02ක් සහ තේ වතු කිහිපයක් පිහිටා ඇති මාගම්මන ප්‍රදේශය හා ඒ අවට ජීවත් වන 6500කට ආසන්න ජනතාවක් මෙම මාර්ගය තම දෛනික කටයුතු සඳහා භාවිතා කරනු ලබයි.

දැනට පවතින ගරාගොඩ පාලම කි.මී. 118ක දිගකින් හා මීටර් 4.8ක පළලකින්ද යුක්ත වේ. මෙය පළල මීටර් 4.3ක් පමණ වන කොටස් 05කින් සමන්විත වේ. ඒ අනුව, පවතින ගරාගොඩ පාලම මතින් එකවර විශාල වාහන 02ක් ගමන් කිරීම දුෂ්කර වී ඇති අතර එමඟින් මාගම්මන ප්‍රදේශයට ආසන්නව පවතින පාලමේ බඳ කොටස් හානියට පත්වී ඇත. එමනිසා පවතින ගරාගොඩ පාලම කඩාවැටීමේ අවධානමකට ලක්වී ඇති බැවින් බර වාහන ගමනාගමනය අත්හිටුවා ඇත.

එබැවින් එම ගැටළු විසඳීමට සහ ආර්ථික හා සමාජීය සංවර්ධනයට පහසුකම් සැලසීමට අඛණ්ඩ සහ අවධානම් රහිත ප්‍රවාහන පහසුකම් සැලසීම ඉතා අත්‍යාවශ්‍ය වේ. එබැවින් යටියන්තොට - මාගම්මන මාර්ගයේ සැලකියයුතු මට්ටමේ සේවාවක් සහිතව රථවාහන ගමනාගමනය සුමටව පවත්වා ගැනීම සඳහා මෙම පාලම ප්‍රතිසංස්කරණය කිරීම ඉතා වැදගත් වේ.

ඒ අනුව, ගරාගොඩ පාලමෙහි ප්‍රතිසංස්කරණ කටයුතු 2023 වර්ෂයේදී ආරම්භ කෙරුණු අතර වාර්තා කරනු ලබන කාලසීමාව අවසන් වනවිට ඒ සඳහා 62%ක සමුච්ඡිත භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇත.

2025/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය

අයවැය ඡේදය	වැය විෂය/ අයිතම විස්තරය	සංශෝධිත අයවැය 2025 ප්‍රතිපාදනය (රු.මි)	වියදම් (රු.මි.)
117-02-06-28	2001 ගොඩනැඟිලි සහ ඉදිකිරීම්	300.00	57.68
	එකතුව	**300.00**	**57.68**

2025 වර්ෂය අවසන් වන විට මෙම ව්‍යාපෘතිය මඟින් 19%ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය

මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් ඒවායෙහි ක්‍රියාකාරකම් වඩාත් සුමට ලෙස ක්‍රියාත්මක කිරීමට හැකිවෙනැයි උපකල්පනය කරමින් ව්‍යාපෘතියේ ඉලක්ක මුලින් සැලසුම් කළද විවිධ අභ්‍යන්තර හා බාහිර සාධක හමුවේ එම ඉලක්ක සංශෝධනය කිරීමට සිදු වී ඇත. ඒ අනුව, මුල් ඉලක්කය හා සංශෝධනය කරන ලද ඉලක්කයන්ට අනුව භෞතික ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය පහත පරිදි සාරාංශකර දැක්විය හැකිය.

ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත් අඛලන් පාලම් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය හා පැරණි පාලම් කොටස් භාවිතා කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති 02ම වාර්ෂික වැඩසටහන් ලෙස ක්‍රියාත්මක වන බැවින් ඒවායෙහි ඉලක්ක පූර්ණය කිරීමේ ප්‍රගතිය නිශ්චිතව සැසඳිය නොහැක.

- **පාලම් 25ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය**

	2024			2025			
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
III වන පැකේජය	9.5%	7.5%	79%	2%	2%	1%	50%

මෙම ව්‍යාපෘතියේ III වන පැකේජ මඟින් 2025 වර්ෂය අවසන් වන විට 99%ක සමුච්චිත භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇත.

- **කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් 02ක් ඉදිකිරීම**

	2024			2025			
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
කොහුවල	10.01	14.5%	100>%	ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නිම කරන ලදී			
ගැටඹේ	අතුරු ගෙවීම් සහතික (IPCs) නොගෙවීම නිසා ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා ඇත			40%	0%	0%	-

මෙම ගුවන් පාලම් 02හි සිවිල් වැඩ 2021 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2025 වර්ෂය අවසන් වන විට කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් සඳහා පිළිවෙලින් 100% හා 36% ක සමුච්චිත ප්‍රගතියක් වාර්තා කර ඇත.

- කොම්පඤ්ඤවීදිය ප්‍රදේශයේ ගුවන් පාලම් 03ක් ඉදිකිරීම

	2024			2025			
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
විනිසුරු අක්බාර් මාවත, උත්තරානන්ද මාවත හා බාලදක්ෂ මාවතේ ගුවන් පාලම් ඉදිකිරීම	13.18%	16%	<100%	ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නිම කරන ලදී			
බාලදක්ෂ මාවත, දුම්රිය පාර හරහා ඇති සර් විත්තම්පලම් ඒ ගාඩිනර් මාවත හා බේරේ වැව සම්බන්ධ කරමින් ගුවන් පාලමක් ඉදිකිරීම	1.7%	1.8%	<100%	23%	22.5	21	93%

2025 දෙසැම්බර් මස 31 වන විට විනිසුරු අක්බාර් මාවත හා උත්තරානන්ද මාවත ගුවන් පාලම් ඉදිකිරීම සහ බාලදක්ෂ මාවතේ ගුවන් පාලම් ඉදිකිරීම සඳහා පිළිවෙලින් 100% හා 98.5% සමුච්චිත ප්‍රගතියක් වාර්තා කර ඇත.

මුලතිවු හි වඩ්ඩුවාකල් පාලම ඉදිකිරීම

	2024			2025			
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
මුලතිවු වඩ්ඩුවාකල් පාලම ඉදිකිරීම	2025 වසරේදී ආරම්භ කරන ලදී			12%	0.33%	4.86%	100%>

2025 වසර අවසානය වන විට 4.86%ක සමුච්චිත ප්‍රගතියක් වාර්තා කර ඇත.

- යටියන්තොට - මාගම්මන මාර්ගයේ ගරගොඩ පාලම පුනරුත්ථාපනය කිරීම

	2024			2025			
	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)	මුල් ඉලක්කය (%)	සංශෝධිත ඉලක්කය (%)	තත්‍ය ප්‍රගතිය (%)	ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය (%)
කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට - මාගම්මන මාර්ගයේ කැලණි ගඟ හරහා ඇති ගරාගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම.	100%	39%	39%	60%	60%	23%	38%

2025 වසරේ අවසානය වන විට මේ සඳහා 62%ක සමුච්චිත භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇත.


2.7 මූල්‍ය ප්‍රගති සමාලෝචනය

පසුගිය දශකය සැලකිල්ලට ගත්විට, මහාමාර්ග අංශය සඳහා ඉහළම අයවැය ප්‍රතිපාදනයක් වෙන් කර ඇත්තේ 2025 වර්ෂය තුල දී බව සඳහන් කළහැකි අතර, දෙවන ඉහළම අයවැය 2021 වර්ෂයේදී වෙන් කොට තිබුණි. මහාමාර්ග අංශය සඳහා 2025 මූල්‍ය වර්ෂයේදී රු.මිලියන 374,583.24ක සංශෝධිත ප්‍රතිපාදනයක් වෙන් කර තිබුනි.

2025 වර්ෂයේදී මහාමාර්ග අංශයේ සමස්ත මූල්‍ය ප්‍රගතිය, එක් එක් අංශ සඳහා ලබා දුන් අයවැය ප්‍රතිපාදනයන්ට අදාලව පහත පරිදි සාරාංශගතව දැක්විය හැකිය.

ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය මඟින් 2024 දී මෙන්ම 2025 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝජනය කරමින් ප්‍රධාන සංවර්ධන වැඩසටහන් 04ක් ක්‍රියාත්මක කරන ලදී.


ඒ අනුව මහාමාර්ග අංශය 2025 වර්ෂය වෙනුවෙන් වෙන්කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝජනය කරමින් අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන, මහාමාර්ග සංවර්ධන වැඩසටහන, මාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන හා පාලම් සහ ගුවන් පාලම් ඉදි කිරීමේ කිරීමේ වැඩසටහන යන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.



රූප සටහන අංක 2.7.1 - සමස්ත මූල්‍ය ප්‍රගතිය - මහාමාර්ග අංශය

ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය සඳහා 2024 වර්ෂයේදී රු.මි. 374,922.27ක මූලික අයවැය ප්‍රතිපාදනයක් වෙන් වූ අතර එම ප්‍රතිපාදන ප්‍රමාණය වර්ෂය අවසානයේදී රු.මි. 374,583.24 ලෙස සංශෝධනය විය.

ඒ අනුව, අමාත්‍යාංශය මඟින් 2025 වර්ෂය අවසන් වන විට වර්ෂය සඳහා ලබාදුන් මුළු අයවැය ප්‍රතිපාදනයන්ගෙන් 94% ක ප්‍රමාණයක් උපයෝජනය කරගෙන ඇත.



රූපසටහන2.7.2 මහාමාර්ග අංශය සඳහා වෙන් කරන ලද සංශෝධිත අයවැය ප්‍රතිපාදන සංයුතිය 2025

ඉහත ප්‍රස්ථාරයේ දැක්වෙන පරිදි 2025 වර්ෂය තුල සමස්ත අයවැය ප්‍රතිපාදනයෙන් වැඩිම අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයක් මහාමාර්ග සංවර්ධනය සඳහාද, අවම අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයක් අමාත්‍ය කාර්යාලීය මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ද වෙන් කොට තිබුණි.

2.7.1. මෙහෙයුම් ක්‍රියාකාරකම්

අමාත්‍යාංශ මෙහෙයුම් ක්‍රියාකාරකම් පහත දැක්වෙන ආකාරයට ප්‍රධාන අයිතම/වර්ග 02කට වෙන් කර දැක්විය හැකිය.

- අමාත්‍ය කාර්යාලීය මෙහෙයුම් කටයුතු
- අමාත්‍යාංශ ආයතනික කටයුතු

2024 හා 2025 වර්ෂයන් සඳහා අමාත්‍යාංශ මෙහෙයුම් ක්‍රියාකාරකම්හි මූල්‍ය ප්‍රගතිය පහත පරිදි දැක්විය හැකිය.

වගු අංක 2.7.1.1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්හි මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	අයිතමය/වර්ගය	2024			2025		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-1-1	අමාත්‍ය කාර්යාලීය මෙහෙයුම් ක්‍රියාකාරකම්	138.02	66.61	48%	93.14	60.42	64.9
117-1-2	අමාත්‍යාංශ ආයතනික කටයුතු	253.00	187.79	74%	287.96	209.31	72.7
	එකතුව	**391.02**	**254.4**	**65%**	**381.10**	**269.73**	**71**

මෙම ප්‍රතිපාදන අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්යාලයේ මෙහෙයුම් කටයුතු සහ අමාත්‍යාංශයෙහි ආයතනික හා මෙහෙයුම් කටයුතු වෙනුවෙන් වියදම් දැරීමට වෙන් කර ඇත. මෙම ප්‍රතිපාදන ප්‍රාග්ධන හා පුනරාවර්තන ලෙස ප්‍රධාන වර්ග දෙකකට බෙදා දැක්විය හැකි අතර ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණය , වැඩිදියුණු කිරීම හා මිලදී ගැනීම සඳහා භාවිතා කරනු ලබයි. පුනරාවර්තන ප්‍රතිපාදන මගින් පුද්ගල පඩිනඩි, ගමන් වියදම්, සැපයුම් , නඩත්තු සේවා හා වර්ෂය තුල ඇතිවන අනෙකුත් පුනරාවර්තන වියදම් දරනු ලබයි.

මෙහෙයුම් කටයුතු සඳහා වැඩිම ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කරනු ලබන්නේ අමාත්‍යාංශ ආයතනික කටයුතු හා ව්‍යාපෘති හා වැඩසටහන් බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වේ. මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙනුවෙන් 2024 වර්ෂයේදී වෙන් කරන ලද ප්‍රතිපාදනය 2025වර්ෂයට වඩා වැඩි අගයක් ගත් අතර ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රතිශතය 2024 වර්ෂයේදී 2025 වර්ෂයට වඩා පහළ මට්ටමක පැවතිණි.

2.7.2. සංවර්ධන ක්‍රියාකාරකම්

2025 වර්ෂයේදී සංවර්ධන ක්‍රියාකාරකම් යටතට ගැනෙන ප්‍රධාන අයිතම/වර්ග 04ක් වූ අතර එම අයිතම 04 පහත පරිදි දැක්විය හැකිය.

- අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන
- මහාමාර්ග සංවර්ධන වැඩසටහන
- මාර්ග පුළුල් කිරීමේ හා වැඩිදියුණු කිරීමේ වැඩසටහන
- පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ වැඩසටහන

(අ) අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන

2024 වර්ෂයේදී ද අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 10ක් සඳහා පමණක් අයවැය ප්‍රතිපාදන වෙන්විය. අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන සඳහා 2024 හා 2025 වර්ෂ අවසානයේදී අත්පත් කරගත් සමස්ත මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 45% හා 95% කි. ප්‍රතිශතාත්මකව විශ්ලේෂණය කිරීමේදී අයවැය ප්‍රතිපාදනයන්හි උපයෝජනය 2024 වසරට සාපේක්ෂව 2025 වර්ෂයේදී 50% කින් වැඩි වී ඇත.

වගු අංක 2.7.2.1. - අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන මඟින් අත් කරගත් සමස්ත මූල්‍ය ප්‍රගතිය

වැඩසටහන	2024 මූල්‍ය ප්‍රගතිය			2025 මූල්‍ය ප්‍රගතිය		
	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)
අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන	102,990.29	46,245.98	45%	100,580.61	96,118.08	95.5%

2024 වර්ෂය අවසන් වන විට අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘති 10 න් ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අතර මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව, කොළඹ - රත්නපුර- පැල්මඩුල්ල අධිවේගී ව්‍යාපෘතිය, නව කැලණි පාලම සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා කුළුණු මතින් ඉදිවන මහාමාර්ග ව්‍යාපෘතිය, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර 04 හි බිල්පත් ගෙවීම සඳහා අමතර ප්‍රතිපාදනයක් වෙන් කෙරුණි.

එසේම, 2025 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘති 10 අතුරින් ව්‍යාපෘති 02ක් සම්පූර්ණයෙන්ම අවසන් කර තිබුණි.

වගු අංක 2.7.2.2.-අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහනේ එක් එක් ව්‍යාපෘති මඟින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2024			2025		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-3-9	දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය අදියර 1 (ගොඩගම-බෙලිඅත්ත)	1,718.47	1,718.47	100%	712.50	712.20	99.9%

	ව්‍යාපෘතියේ නම	2024			2025		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-3-13	රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය	3,131.87	3,129.09	**99.9%**	1,500.00	1,500.00	**100%**
117-2-3-15	නව කැලණි පාලම සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා කුළුණු මතින් ඉදිවන මහාමාර්ග ව්‍යාපෘතිය	494.00	484.55	**98%**	983.30	952.30	**97%**
117-2-3-16	වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය	20,030.00	12,318.30	**61%**	8,013.50	3,878.66	**48%**
117-2-3-18	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර 01	50,904.46	1,889.44	**4%**	70,765.00	70,696.92	**99.9%**
117-2-3-19	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර 02	2,616.84	2,611.48	**99.79%**	1,190.00	1,060.88	**89%**
117-2-3-20	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර 03	23,908.00	23,908.00	**100%**	15,405.31	15,342.50	**99.6%**
117-2-3-21	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර 04	1.65	1.65	**100%**	1,000.00	974.97	**97%**
117-2-3-22	මධ්‍යම අධිවේගී මාර්ගයේ I වන කොටසෙහි කඩවත අන්තර් හුවමාරුව (System Interchange) සහ මීරිගම දෙසට මීටර් 500 ක මාර්ගය ඉදිකිරීම.	-	-	-	1,000.00	999.67	**99.9%**
117-2-3-23	පිටකොටුව සහ අලුත්මාවත පිවිසුම් මාර්ග සහිත අන්තර්භූවමාරුව (Interchange with Ramp) ඉදිකිරීම.	-	-	-	11,000.00	0.00	-
	එකතුව	**102,990.29**	**46,245.98**	**45%**	**100,580.61**	**96,118.08**	**96%**

වාර්තා ගත දත්තයන්ට අනුව, 2025 වර්ෂයේදී එක් අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් පමණක් තම ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනය කර ඇති අතර, ව්‍යාපෘතීන් 06 ක් 90% ඉක්ම වූ මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත. 2025 වර්ෂය තුලදී අවම මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කර ඇත්තේ කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය මඟිනි.

පිටකොටුව සහ අලුත්මාවත පිවිසුම් මාර්ග සහිත අන්තර්හුවමාරුව ඉදිකිරීම් ව්‍යාපෘතිය කිසිදු මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර නොමැත.

2024 වර්ෂයේදී දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර III සහ මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර IV යන ව්‍යාපෘතීන් මඟින් ඉහළම මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කර ඇති අතර මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර II ව්‍යාපෘතිය මඟින් දෙවන ඉහළම මූල්‍ය කාර්යසාධනය වාර්තා කර ඇත. 2024 වර්ෂය තුලදී අවම මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කර ඇත්තේ මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර I මඟිනි.

(ආ) මහාමාර්ග සංවර්ධන වැඩසටහන

මහාමාර්ග සංවර්ධන වැඩසටහන යටතේ, 2025 වර්ෂයේදී ව්‍යාපෘති/වැඩසටහන් 27 ක් සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

මහාමාර්ග සංවර්ධනය සඳහා 2025 වර්ෂයේදී වෙන්කළ මුදල 2024 වර්ෂයට සාපේක්ෂව රු.මි. 52,748.64 කින් පමණ පහළ බැස ඇති අතර ඇති අතර මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය 2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේදී 9%කින් වර්ධනය වී ඇත.

වගු අංක 2.7.2.3- මහාමාර්ග සංවර්ධන වැඩසටහනෙහි සමස්ත මූල්‍ය ප්‍රගතිය

වැඩසටහන	2024 මූල්‍ය ප්‍රගතිය			2025 මූල්‍ය ප්‍රගතිය		
	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය(%)
මහාමාර්ග සංවර්ධන වැඩසටහන	204,052.83	175,876.72	86%	256,801.47	243,306.28	95%

පූර්වයෙන් සඳහන් කළ ව්‍යාපෘති 27 අතුරින් 2025 වර්ෂය තුලදී බෙස්ලයින් මාර්ගය - අදියර III, ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග වෙත ප්‍රවේශ වීම සහ රථවාහන තදබදය අවම කිරීම සඳහා විකල්ප මාර්ග ජාලය සංවර්ධනය කිරීම, පානදුර දක්වා සමුද්‍රීය මාර්ගය දිගු කිරීම සහ සම්පූර්ණ කරන ලද සහ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම යන ව්‍යාපෘති 100% මූල්‍ය කාර්යසාධනයක් අත්කරගනිමින් තම අයවැය ප්‍රතිපාදන පූර්ණ

වශයෙන් උපයෝජනය කරගෙන තිබූ අතර තවත් ව්‍යාපෘති 07ක් 90% ක් ඉක්මවූ මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. ඉතිරි ව්‍යාපෘති වලින් 09 ක් 90% - 50% අතර මූල්‍ය කාර්ය සාධනයක් වාර්තා කළ අතර තවත් ව්‍යාපෘති 02ක් 30%කට වඩා අඩු මූල්‍ය කාර්යසාධනයක් අත්කරගෙන ඇත.

උක්ත සඳහන් මහාමාර්ග සංවර්ධන වැඩසටහන් අතරින් අවම මූල්‍ය ප්‍රගතිය වන 12% ක මූල්‍ය ප්‍රගතිය වාර්තා කර ඇත්තේ යටිතල පහසුකම්, මාර්ග ආරක්ෂාව සහ රථවාහන කළමනාකරණ (Infrastructure, Road Safety and Traffic Management) ව්‍යාපෘතිය මගින් වන අතර දෙවන අවම මූල්‍ය ප්‍රගතිය වන 17% ක මූල්‍ය ප්‍රගතිය වාර්තා කර ඇත්තේ මාර්ග පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය (GOSL-OFID) මගිනි.

2024 වර්ෂයේ දී මෙන්ම 2025 වර්ෂයේදීද, මහාමාර්ග සංවර්ධන වැඩසටහන යටතේ වාර්ෂික වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර ඊට අමතරව 2025 වර්ෂයේදී ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම වාර්ෂික වැඩසටහනක් ලෙස අලුතින්ම එක් කරන ලදී.

මහාමාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වාර්ෂික වැඩසටහන් ලෙස මාර්ග සහ පාලම් නඩත්තු කිරීම (මාර්ග නඩත්තු භාරකාර අරමුදල), යටිතල පහසුකම් හා මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය, මහකොළඹ නගර ප්‍රදේශයේ රථවාහන ගමනාගමන කළමනාකරණ ව්‍යාපෘතිය, මාර්ග සංවර්ධන අධිකාරියේ බැඳීම්වල මූල්‍ය පරතරය පියවීම,සම්පූර්ණ කරන ලද සහ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කරගැනීම, සහ මාර්ග සංවර්ධන අධිකාරියේ යන්ත්‍රෝපකරණ, පර්යේෂණ හා සංවර්ධන, සමීක්ෂණ සහ ආයෝජන, පුහුණුවීම් සහ ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන යන වැඩසටහන් සඳහන් කළ හැක.

වගු අංක2.7.2.4- මහාමාර්ග සංවර්ධන වැඩසටහනෙහි එක් එක් ව්‍යාපෘතීන් මඟින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2024 මූල්‍ය ප්‍රගතිය			2025 මූල්‍ය ප්‍රගතිය		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-4-1	මාර්ග සහ පාලම් නඩත්තු කිරීම(මාර්ග නඩත්තු භාරකාර අරමුදල)	20,833.0	20,749.81	99.6%	26,151.87	26,091.16	99.8%
117-2-4-10	බෙස්ලයින් මාර්ගය දිර්ඝ කිරීමේ ව්‍යාපෘතිය අදියර III	874.46	874.46	100%	250.00	250.00	100%

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2024 මූල්‍ය ප්‍රගතිය			2025 මූල්‍ය ප්‍රගතිය		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-4-21	රථවාහන ගමනාගමන කළමනාකරණ හා මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය	52.00	51.09	98.3%	1,250.00	149.70	12%
117-2-4-22	මහකොළඹ නගර ප්‍රදේශයේ රථවාහන ගමනාගමන ව්‍යාපෘතිය	55.00	54.87	99.8%	250.00	93.77	37%
117-2-4-23	පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි (ඒ5) මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල	2,906.44	456.81	16%	2,751.00	2,334.04	85%
117-2-4-29	මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල	241.79	189.05	78%	375.00	137.22	37%
117-2-4-31	මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල	461.48	344.14	75%	241.30	40.47	17%
117-2-4-32	කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල	2,011.00	1,759.45	87%	2,603.20	2,004.76	77%
117-2-4-40	බස්නාහිර පළාත් ජාතික මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල	760.00	670.94	88%	355.00	280.84	79%
117-2-4-41	පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි (ඒ5) මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල	2,922.00	1,603.26	55%	672.00	491.42	73%
117-2-4-43	දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකුව	0.065	0.064	99%	-	-	-
117-2-4-45	මධ්‍යම හා ඌව පළාත් හි මාර්ග හා පාලම් පුළුල් කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	3,565.00	0.00	0%	3,536.00	3,535.82	99.9%

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2024 මූල්‍ය ප්‍රගතිය			2025 මූල්‍ය ප්‍රගතිය		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-4-48	ප්‍රවාහන සබඳතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය	183.99	173.10	94%	-	-	-
117-2-4-49	පානදුර දක්වා සමුද්‍රීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය	18.00	15.52	86%	40.00	40.00	100%
117-2-4-51	මාර්ග සංවර්ධන අධිකාරියේ බැඳීම්වල මූල්‍ය පරතරය පියවීම	77,025.04	77,024.22	99%	162,832.65	162,568.06	99.8%
117-2-4-52	සම්පූර්ණ කරන ලද සහ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කරගැනීම	6,438.25	6,438.06	99.9%	7,500.00	7,500.00	100%
117-2-4-53	යන්ත්‍රෝපකරණ, පර්යේෂණ හා සංවර්ධන, සමීක්ෂණ සහ ආයෝජන, පුහුණුවීම්	105.26	93.49	89%	507.32	157.71	31%
117-2-4-56	ගාල්ල - දෙනියාය මාර්ගයේ කි.මී.78+000-130+600 දක්වා වූ දෙනියාය සිට රක්වාන දක්වා වූ මාර්ග කොටස වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	2,213.00	1,748.32	79%	3,540.00	2,782.18	79%
117-2-4-57	ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග වලට ප්‍රවේශ වීමට හැකිවන පරිදි විකල්ප මාර්ග කි.මී. 100,000ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	36,073.76	36,073.76	100%	6,750.00	6,750.00	100%
117-2-4-58	ලෝක බංකු ආධාර මත ක්‍රියාත්මක අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘති	14,209.2	7,294.24	51%	11,984.00	9,704.41	81%
117-2-4-59	රථවාහන ගමනාගමන දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීමේ හා ධාරිතා ගොඩනැඟීමේ ව්‍යාපෘතිය	152.00	151.29	99.5%	130.00	118.17	91%
117-2-4-60	මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය	9,491.96	4,134.11	44%	6,321.82	5,162.12	97%

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2024 මූල්‍ය ප්‍රගතිය			2025 මූල්‍ය ප්‍රගතිය		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-4-61	ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන	7,350.33	7,141.09	97%	4,000.00	2,237.12	56%
117-2-4-63	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන අදියර 1	8,015.00	912.11	11%	3.13	3.12	99.7%
117-2-4-64	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන අදියර 2	7,832.01	7,710.55	98%	4,947.18	4,792.02	97%
117-2-4-65	මහනුවර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයට ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම.	- 262.80	- 212.88	81%	310.00	166.23	54%
	එකතුව	**204,052.83**	**175,876.72**	**86%**	**256,801.47**	**243,306.28**	**95%**

(ඇ) මාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන සඳහා 2025 වර්ෂය තුලදී වාර්තා වූ සමස්ත මූල්‍ය ප්‍රගතිය පහත පරිදි සාරාංශ කර දැක්විය හැකිය.

වගු අංක 2.7.2.5 මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා සමස්ත මූල්‍ය ප්‍රගතිය

වැඩසටහන	2024			2025		
	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන	1,991.00	1,628.83	82%	6,102.65	5,933.71	97%

මෙම වාර්ෂික වැඩසටහන සඳහා 2024 වර්ෂයේ දී , 2025 වර්ෂයට වඩා අඩු මූල්‍ය ප්‍රතිපාදනයක් වෙන්කොට තිබුණු නමුත් ප්‍රතිපාදන උපයෝජනය කිරීම 2024 වසරට සාපේක්ෂව 2025 වසරේදී ඉහළ අගයක් ගෙන ඇත.

වගු අංක **2.7.2.6** මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා පළාත් මට්ටමින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	පළාතෙහි නම	2024			2025		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-5-01,2,3	බස්නාහිර පළාත	337.00	271.61	81%	1,703.24	1,701.93	99.9%
117-2-5-04,5,6	මධ්‍යම පළාත	161.00	126.19	78%	710.94	668.13	94%
117-2-5-07,8,9	දකුණු පළාත	399.00	374.55	94%	1,500.53	1,486.29	99%
117-2-5-10, 11,12,13,14	උතුරු පළාත	264.00	203.24	77%	186.90	184.69	99%
117-2-5-15,16,17	නැගෙනහිර පළාත	171.00	167.77	98%	381.10	378.08	99%
117-2-5-18, 19	වයඹ පළාත	144.00	113.44	79%	123.65	114.04	92%
117-2-5-20,21	උතුරු මැද පළාත	130.00	104.40	80%	677.67	582.37	86%
117-2-5-22,23	ඌව පළාත	105.00	73.40	70%	130.68	130.61	99.9%
117-2-5-24,25	සබරගමුව පළාත	280.00	194.24	69%	687.94	687.56	99.9%
	එකතුව	**1.991.00**	**1,628.83**	**82%**	**6,102.65**	**5,933.71**	**97%**

(ඇ) පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන

වගුඅංක **2.7.2.7** පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන සඳහා සමස්ත මූල්‍ය ප්‍රගතිය

වැඩසටහන	2024			2025		
	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය(%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය(%)
පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ වැඩසටහන	13,109.66	7,410.05	57%	10,717.40	7,837.37	73%

පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂයේදී ව්‍යාපෘති 09ක් ක්‍රියාත්මක විය. තවද මෙම වැඩසටහන සඳහා 2024 වර්ෂයේදී 2025 වර්ෂයට වඩා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇති නමුත් 2025 වර්ෂයේදී වාර්තා වූ මූල්‍ය ප්‍රගතිය 2024 වර්ෂයට සාපේක්ෂව 16% කින් වර්ධනය වී ඇත.

වගු අංක2.7.2.8 පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතීන්හි මූල්‍ය ප්‍රගතිය

අයවැය කේතය	ව්‍යාපෘතියේ නම	2024			2025		
		සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
117-2-6-8	ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත් අබලන් පාලම් නැවත ඉදිකිරීම / ප්‍රතිනිර්මාණය	1,000.00	208.16	21%	3,650.00	1,464.68	40%
117-2-6-14	පැරණි පාලම් කොටස් භාවිතා කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	788.00	787.99	99.99%	400.00	373.48	93%
117-2-6-17	පාලම් 25ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - කුවේට් ආධාර	2,413.00	211.98	9%	250.00	245.91	98%
117-2-6-21	දෙවන නව කැළණි පාලම ඉදිකිරීම - ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය	4,727.24	4,132.39	87%	833.40	833.21	99.9%
117-2-6-26	කොහුවලසහගැටඹේ ගුවන්පාලම්ඉදිකිරීමේ ව්‍යාපෘතිය	2,262.00	254.25	11%	185.00	175.24	95%
117-2-6-27	උත්තරානන්දමාවතේ දුම්රියමාර්ගයටඉහළින්හාකොම්පඤ්ඤවීදියේදුම්රියමාර්ගයආසන්නයේගුවන්පාලම්ඉදිකිරීම	1,769.42	1,747.07	99%	4,579.00	4,263.77	93%
117-2-6-28	යටියන්තොට - මාගම්මන මාර්ගයේ ගරාගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම	150.00	68.19	45%	300.00	57.68	19%
117-2-6-29	ග්‍රාමීය පාලම් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම	-	-	-	300.00	224.62	75%
117-2-6-30	මුලතිව් වඩ්ඩුවාකල් පාලම ඉදිකිරීම	-	-	-	220.00	198.67	90%
	එකතුව	**13,109.66**	**7,410.05**	**57%**	**10,717.40**	**7,837.37**	**73%**

මෙම වැඩසටහන යටතේ, ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත් අබලන් පාලම් නැවත ඉදිකිරීම / ප්‍රතිනිර්මාණය කිරීම සහ පැරණි පාලම් කොටස් හාවිතා කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ ග්‍රාමීය පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම යන ව්‍යාපෘති 03, වාර්ෂික වැඩසටහන් ලෙස ක්‍රියාත්මක විය. 2025 වර්ෂයේ දී පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති අතුරින් ව්‍යාපෘති 6ක් 90% ඉක්මවූ මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

මෙම පාලම් සංවර්ධන ව්‍යාපෘති අතරින් අවම මූල්‍ය කාර්ය සාධනයක් වාර්තා වූයේ යටියන්තොට - මාගම්මන මාර්ගයේ ගරාගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම මගින් වන අතර ඉහළම මූල්‍ය කාර්ය සාධනයක් වාර්තා වූයේ දෙවන නව කැලණි පාලම ඉදිකිරීම් ව්‍යාපෘතිය මඟිනි.

2.8 අනාගතය සඳහා ඉදිරිදැක්ම

2025 වර්ෂයේ සිට ඉදිරියට රජයේ සියළුම අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන විසින් වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ප්‍රතිපත්ති දිශානතියට අනුව ක්‍රියාකිරීමේ වගකීම උසුලනු ලැබේ. ඒ අනුව සියළුම රාජ්‍ය ආයතන විසින් සිය ව්‍යාපෘති හා වැඩසටහන් පවතින රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" මඟින් දක්වා ඇති ප්‍රතිපත්ති සාක්ෂාත් කරගැනීම උදෙසා සැලසුම් සකස් කළ යුතු වේ.

ඉහත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා ජාත්‍යන්තරව පිළිගෙන ඇති තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කර ගනු ලැබූ පහත සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා සිය ප්‍රමුඛ අවධානය යොමු කිරීමට ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය මඟින් බලාපොරොත්තු වේ.

- මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම - අදියර I (කඩවත - මීරිගම)

මහාමාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එක්ව මෙම අධිවේගී මාර්ගය අදියර 03 ක් යටතේ ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. මේ අතුරින් මධ්‍යම අධිවේගී මාර්ගය අදියර I, 2020 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර 2024 වර්ෂයේදී නිමකිරීමට සැලසුම් කර තිබුණ ද එවකට රට තුළ පැවති ආර්ථික අර්බුදකාරීමය තත්ත්වය හේතුවෙන් තාවකාලිකව නතර කිරීමට තීරණය කරන ලදි. නමුත් මේ වන විට මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ඉක්මනින් අවසන් කිරීමේ අරමුණින් අතුරු ගෙවීම් සහතික (IPCs) නැවත ප්‍රතිපූර්ණය කිරීම සඳහා මහාමාර්ග අමාත්‍යාංශය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් සිටියි. මීරිගම සිට කුරුණෑගල දක්වා වූ අදියර II ඉදිකිරීම් කටයුතු නිම කරන ලදි.

- කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය "වරාය නගරය" දක්වා දීර්ඝ කිරීම

මෙම නව මාර්ග ජාලය පහත සඳහන් ව්‍යාපෘතීන්හි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම තුළින් සිදුවේ.

- වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම
- නව කැළණි පාලම ඉදිකිරීම

නව කැලණි පාලම ඉදිකිරීමේ කටයුතු 2021 වර්ෂයේදී අවසන් කළ අතර 2021 නොවැම්බර් මස 25 වන දින මහජනතාව වෙත විවෘත කරන ලදි.

- **ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන**

2025 වර්ෂයේ අයවැය කතාවේදී ශ්‍රී ලංකාව තුළ පවතින ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කෙරුණු අතර ඒ සඳහා සැලකිය යුතු අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයක් වෙන් කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ සියළුම මැතිවරණ කොට්ඨාස ආවරණය වන පරිදි දීප ව්‍යාප්ත වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා අමාත්‍යාංශයේ අවධානය යොමු වී ඇත. මෙම වැඩසටහන පහත සඳහන් සංරචක වලින් සමන්විත වේ.

- උතුර හා නැගෙනහිර පළාත්වල විශේෂ ග්‍රාමීය මාර්ග සංවර්ධනය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

- දිවයිනේ අනෙකුත් පළාත් ආවරණය වන පරිදි ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

- දිවයින පුරා ග්‍රාමීය පාලම් ඉදි කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

- **2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වෙනත් විශේෂ සංවර්ධන වැඩසටහන්**

උක්ත සඳහන් වැඩසටහන් වලට අමතරව ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය මඟින් නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට හා උපදෙස් වලට අනුගත වෙමින් පහත සඳහන් නව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

I. කඩිනමින් අළුත්වැඩියා කළයුතු ග්‍රාමීය හා වතු මාර්ග හඳුනාගැනීම, ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කිරීම සහ ඒ අනුව මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම.

II. අධිවේගී මාර්ග හා මහාමාර්ග කාලානුරූපීව නඩත්තු කිරීම. (A, B හා E ශ්‍රේණියේ මාර්ග)

III. මේ වනවිට ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා ඇති මධ්‍යම අධිවේගී මාර්ගය අදියර Iහි ගැටළු සඳහා විසඳුම් ලබාදීම සහ ඉදිකිරීම් කටයුතු ඉක්මනින් නිම කිරීම.

IV. රථවාහන තදබදයක් ඇති ප්‍රධාන නගර තුළ හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල ආරක්ෂිත පාපැදි මංතීරු ඉදිකිරීම.

V. අළුතින් ඉදිකරන ලද මාර්ගයන් සඳහා හැකි සෑම විටකදීම පාපැදි මංතීරු ඉදිකිරීම් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

VI. ප්‍රධාන දුම්රිය නැවතුම්පොළ හා බස් නැවතුම්පොළ, රජයේ ආයතන හා වෙනත් පොදු ස්ථාවල පාපැදි නතර කිරීමේ පහසුකම් සැපයීම.

VII. ප්‍රධාන නගරයන්හි මාර්ග දෙපස පදික මංතීරු ඉදිකිරීම.

VIII. මාර්ගවල ගමන් ගන්නා පදිකයන්ට සෙවණ සැපයීම සඳහා මාර්ග දෙපස ගස් සිටුවීම.

පරිච්ඡේදය 3

සමස්ත මූල්‍ය කාර්යසාධනය

සියළුම වියදම් 2026/02/10 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද මූල්‍ය වාර්තාවට අනකූලව සකස් කොට ඇත.

3.1 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

[illegible] 2025 රු.		සටහන	කණ්ඩායම 2025 රු.	2024 රු.	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිජ්-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	53,476,861,627		
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		53,476,861,627	-	
	ආදායම් නොවන ලැබීම්				
	භාණ්ඩාගාර අයිතිම්		351,382,080,934	203,669,383,724	ඒසිජ්-3
	කැන්පතු		617,757,407	1,685,254,033	ඒසිජ්-4
	අත්තිකාරම් ගිණුම්		45,219,964	28,816,285	ඒසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		352,545,058,305	205,383,454,043	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		406,021,919,932	205,383,454,043	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		6,315,019,828	1,693,402,713	
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)**		399,706,900,103	203,690,051,330	
	අඩු කළා : වියදම්				
-	**සුනරාවතර්න වියදම්**				
502,500,000	වැටුප්, වෙතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	425,788,983	297,864,461	
458,783,055	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	334,190,018	273,394,184	ඒසිජ්-2(ii)
17,568,518,261	පහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	13,328,364,807	14,032,074,254	
-	පොළී ගෙවීම්	8	-	-	
1,171,945	වෙනත් සුනරාවතර්න වියදම්	9	491,990	423,561	
18,530,973,261	**මුළු සුනරාවතර්න වියදම් (ඈ)**		**14,088,135,797**	**14,603,756,459**	

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රක්ෂේපන 2025 රු.		සටහන	2025 රු.	2024 රු.	
	මූලධන වියදම්				
17,263,320,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	13,211,688,428	2,723,984,358	
214,405,170,239	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	184,149,204,269	156,120,706,970	
4,176,500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	3,838,780,000	1,500,000,000	එඩිජ-2(ii)
3,230,000,000	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	3,000,000,000	-	
2,500,000	හැකියා වර්ධනය	14	1,650,200	1,001,058	
166,454,336,500	වෙනත් මූලධන වියදම්	15	166,186,510,756	79,427,105,020	
405,531,826,739	**මුළු මූලධන වියදම් (උ)**		**370,387,833,653**	**239,772,797,406**	
	තැන්පත් ගෙවීම්		858,539,322	1,401,012,258	එඩිජ-4
	අත්තිකාරම් ගෙවීම්		68,393,298	21,944,948	එඩිජ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ශේෂ		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**926,932,620**	**1,422,957,206**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**389,404,902,070**	**255,799,511,071**	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**10,301,998,033**	**(52,109,459,740)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		**10,300,421,803**	**(52,109,459,740)**	එඩිජ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		1,576,230	-	එඩිජ-3
			10,301,998,033	**(52,109,459,740)**	

2025 දෙසැම්බර් 31 දිනට

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	කෙසේ	2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6		598,488,160,298	459,965,018,179
මූල්‍ය වත්කම්				
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)		74,398,844	51,225,509
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3		1,576,230	-
මුළු වත්කම්			598,564,135,372	460,016,243,688
ශුද්ධ වත්කම් / ස්කන්ධය				
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්			(843,424,924)	(1,106,379,974)
දේපළ පිරියත හා උපකරණ සංචිතය			598,488,160,298	459,965,018,179
කුලී හා වැට අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)			-
ජංගම වගකීම්				
කැන්පතු ගිණුම්	ඒසිඒ-4		916,823,368	1,157,605,483
අනිම ශේෂය	ඒසිඒ-3		1,576,230	-
මුළු වගකීම්			598,564,135,372	460,016,243,688

පිටු අංක 10 සිට 43 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 47 සිට 88 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මූදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවත් ඒවා සම සංඛ්‍යා සමඟ එකඟ වන බවත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා පැලඳායී අභ්‍යන්තර පාලන ප්‍රද්ධතියක් ආවර්තනය ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන ප්‍රද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම ප්‍රද්ධති පැලඳායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සම්මාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්)/ කොමිසාරිස් (මූදල්)
නම :
දිනය :

එස්. පරමේස්වරන්
ප්‍රධාන මූල්‍ය නිලධාරි (මහාමාර්ග අංශය)
ප්‍රවාහන, මහාමාර්ග සහ සිවිල් ගුවන් සංචරණ
අමාත්‍යාංශය

.....
සුපෙත ගුණදේමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

මහාචාර්ය ඩෝ. සාපිල සී.ඉ.ඉ. පෙරේරා
ලේකම්
ප්‍රවාහන, මහාමාර්ග සහ සිවිල් ගුවන් සංචරණ අමාත්‍යාංශය
05 වන මහල, "මහෙනගුම මහමැදුරිය", අංක. 216, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08, ශ්‍රී ලංකාව.

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
මූල බදු ලැබීම්		-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-	-
ලාභ		-	-
ආදායම් නොවන ලැබීම්		-	-
මෙහෙත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		2,067,022,944	2,004,197,593
අග්‍රිම ලැබීම්		351,882,080,934	203,669,383,724
අත්තිකාරම් අයකර ගැනීම්		83,400,854	19,198,441
තැන්පතු ලැබීම්		617,757,432	1,685,254,033
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		**354,650,262,164**	**207,378,033,792**
අඩුකළා : මුදල් වැය කිරීම්			
සේවාලාභ පඩිනවි හා මෙහෙයුම් වියදම්		759,587,666	569,940,030
සහනාධාර සහ මාරුකිරීම්		15,628,564,807	12,633,175,393
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්		183,238,629,384	
මෙහෙත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		1,007,795,652	11,203,791
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්		6,316,596,058	1,693,410,213
අත්තිකාරම් ගෙවීම්		97,807,122	21,075,166
තැන්පතු ගෙවීම්		858,539,347	1,401,012,258
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		**207,907,520,036**	**16,329,816,852**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		**146,742,742,128**	**191,048,216,941**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
පොළී		-	-
ලාභාංශ		-	-
නිමි්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්		534,950	46,000
උපලබ්ධිය අයකර ගැනීම්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)		**534,950**	**46,000**

3.5 වාර්තාකිරීමේ පදනම

1) **පිළියෙල කිරීමේ අරමුණ**

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම් වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) **ආදායම් හඳුනාගැනීම**

භුවමාරු හා භුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව හොඳලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආක්‍රමණය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) **<u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>**

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

7) **<u>මුදල් හා මුදල් සමාන දෑ</u>**

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් හෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

8) **<u>මාර්ග සංවර්ධන අධිකාරියේ ගොඩනැඟිලි පරිශ්‍රය භාවිතය</u>**

මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මගනැගුම මහමැදුර ගොඩනැගිල්මලෙහි 7, 8 සහ 9 මහල්වල මහාමාර්ග අමාත්‍යාංශය ස්ථාපිත කොට ඇත. මෙම ගොඩනැගිල්ල රජය විසින් ලබාගන්නා ලද විදේශ ණය අධාර යටතේ ඉදිකර මාර්ග සංවර්ධන අධිකාරියට පවරන ලද ගොඩනැගිල්ලක් බැවින් අමාත්‍යාංශ භාවිතය වෙනුවෙන් ගොඩනැගිලි කුලියක් ගෙවනු නොලබන අතර උපයෝගිතා වියදම් ප්‍රතිපූරණය කිරීම පමණක් කරනු ලැබේ.

9) **<u>මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කිරීම</u>**

මාර්ග සංවර්ධන අධිකාරිය භරහා ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති වැය විෂයන්ගේ වියදම් මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල ස්ථාවර වත්කම් යටතේ ඇතුලත් කරනු ලබන බැවින් අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශවල මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුලත් කරනු නොලැබේ.

10) 2024 වර්ෂයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ලෙස පැවති මෙම අමාත්‍යාංශයට 2025 වර්ෂයේ සිට වරාය හා සිවිල් ගුවන් සේවා අංශය ද අනියුක්ත කිරීම නිසා 2024 වසරේ අවසාන වත්කම් ශේෂයන් 2025 වසරේ ආරම්භක වත්කම් ශේෂයන් හා නොසැසඳේ.

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : : 117

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/පළාත් සභාවේ නම :ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

රු.

ආර්ථික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමමහි නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.අ.ප. 66/69 මාරු කිරීම (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	1,133,000,000	-	(29,400,000)	1,103,600,000	891,646,178	211,953,822
	(2) ප්‍රාග්ධන	57,000,000	-	12,400,000	69,400,000	32,405,163	36,994,837
	උප එකතුව	**1,190,000,000**	-	**(17,000,000)**	**1,173,000,000**	**924,051,341**	**248,948,659**
වැඩසටහන (2)	(1) පුනරාවර්තන	16,070,000,000	1,870,000,000	(512,626,739)	17,427,373,261	17,198,489,620	228,883,641
	(2) ප්‍රාග්ධන	402,036,000,000	2,896,800,000	529,626,739	405,462,426,739	370,355,428,490	35,106,998,249
	උප එකතුව	**418,106,000,000**	**4,766,800,000**	**17,000,000**	**422,889,800,000**	**387,553,918,110**	**35,335,881,891**
	මුළු එකතුව	**419,296,000,000**	**4,766,800,000**	**-**	**424,062,800,000**	**388,477,969,450**	**35,584,830,550**

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූල්‍ය) /සොහොසාරිස් (මූදල්)
දිනය : 2026 ·02· 26
එස්. පරමේස්වරන්
ප්‍රධාන මූල්‍ය නිලධාරි (මහාමාර්ග අමාත්‍යාංශය)
ප්‍රවාහන, මහාමාර්ග සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
ප්‍රධාන ගණකාධිකාරි මණ්ඩලය

වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

වියදම් ශීර්ෂ අංකය :117

	මූල්‍යකරණය	වැඩසටහන 01*		වැඩසටහන 02*		මූල එකතුව		
සංකේතය	සංකේත විස්තරය	ශුද්ධ ප්‍රතිපාදනය **	සත්‍ය වියදම	ශුද්ධ ප්‍රතිපාදනය **	සත්‍ය වියදම	ශුද්ධ ප්‍රතිපාදනය **	සත්‍ය වියදම	වියදමේ ප්‍රතිශතය ***
		1	2	3	4	5	6	(6÷5)X100
		රු.	රු.	රු.	රු.	රු.	රු.	%
11	දේශීය අරමුදල්	1,173,000,000	924,051,341	363,825,270,000	351,516,622,965	364,998,270,000	352,440,674,306	97
12	විදේශ ණය			53,275,800,000	33,726,606,524	53,275,800,000	33,726,606,524	63
13	විදේශ ප්‍රදාන			3,340,000,000	115,000,000	3,340,000,000	115,000,000	
14	ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය			70,000,000	53,723,770	70,000,000	53,723,770	77
15	ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන							
16	ප්‍රතිපාර්ශවීය අරමුදල්							
17	විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය			2,378,730,000	2,141,964,850	2,378,730,000	2,141,964,850	90
18	විදේශීය මූල්‍යයනය ආශ්‍රිත දේශීය සම මූල්‍යකරය							
21	විශේෂ නීති සේවා							
	එකතුව	**1,173,000,000**	**924,051,341**	**422,889,800,000**	**387,553,918,110**	**424,062,800,000**	**388,477,969,450**	

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2026.02.20

එස්. පරමේශ්වරන්
ප්‍රධාන මූල්‍ය නිලධාරි (මහාමාර්ග අමාත්‍යාංශය)
ප්‍රවාහන, මහාමාර්ග සහ සිවිල් ගුවන් සංචිත්‍රික
අමාත්‍යාංශයේ ලේකම් මණ්ඩලය

2025 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
වියදම ශීර්ෂ අංකය :117

රු.

අග්‍රිම ගිණුම් අංකය	2025 ජනවාරි 01 දිනට අග්‍රිම ශේෂය			අග්‍රිම ලැබීම			අග්‍රිම පියවීම			2025 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය			2025 දෙසැම්බර් 31 දිනට ආයතන පරෙස් අනුව ශේෂය	2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පරෙස් අනුව ශේෂය
	1			2			3			4				
	නොපියවූ උප අග්‍රිම	නොපියවූ අග්‍රිම (නොපියවූ උප අග්‍රිම හැර)	එකතුව	භාණ්ඩාගාරයෙන්	වෙනත් මූලාශ්‍රවලින්	එකතුව	වියදම මඟින්	මූල්‍ය මඟින්	එකතුව	නොපියවූ උප අග්‍රිම ශේෂය	නොපියවූ අග්‍රිම ශේෂය	එකතුව	*5	6
	1(i)	1(ii)	1(iii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	3(i)	3(ii)	3(iii)=3(i)+3(ii)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=1(iii)+2(iii)-3(iii)	
7003/0000/00/0054/0025/000				178,740,000		178,740,000	177,163,770	1,576,230	178,740,000		-	-	-	1,576,230
7002/0000/00/0332/0025/000				351,703,340 934	2,487,377,041	354,190,717,975	347,875,698,147	6,315,019,828	354,190,717,975	-	-	-	-	0 00
	-		-	351,882,080,934	2,487,377,041	354,369,457,975	348,052,861,917	6,316,596,058	354,369,457,975	-	-	-	-	1,576,230

1. ඉහත 4 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න

(1) අදාළ කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙන්වන 2025.12.31 දිනට මූල්‍ය ශේෂය — 1,576,230

(2) වෙනත් හේතු - . . . . . — .....

1,576,230

මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද, නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න.

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වීසින් ගුලි මඟ අක් මූල්‍ය ගිණුමට රු.26,705,665,385.99 ක් ගර හා බැර කර ඇති බැවින් SA-72 ආකෘතියෙහි ගර හා බැර මූල ඵලිනාකම අමාත්‍යාංශයේ විගණනාධිපති වෙතින් වෙනස් මෙ.අවසාන ශේෂය වෙනස් මෙනෙවි.

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි:
අධ්‍යක්ෂ (මූල්‍ය) /සොලිසිටර් (මූල්‍ය)
දිනය : 2026 ෆෙබ්‍රවාරි 26 එස්. ජයමේල්පිටගේ
ප්‍රධාන මූල්‍ය නිලධාරි (අමාත්‍යාංශ අංශය)
ප්‍රවාහන, මහාමාර්ග සහ සිවිල් ගුවන් සේවා
අමාත්‍යාංශයේ ලේකම් කාර්යාලය

2025 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 117 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

රු.

තැන්පතු ගිණුමේ නම	තැන්පතු අංකය	2025 ජනවාරි 01 දිනට ශේෂය	වර්ෂය තුළ බැර කිරීම්	වර්ෂය තුළ හර කිරීම්	2025 දෙසැම්බර් 31 දිනට ශේෂය	2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
මහාමාර්ග අංශය						
මෙන්ඩර් තැන්පත්	6000-0-0-002-0-176-0	-	5,375,000.00	5,375,000.00	-	-
මෙවන පාගරීවයන් වෙත නැවත ගෙවීම් කිරීම් වෙනුවෙන් තාවකාලිකව	6000-0-0-013-0-135-0	2,511,666.16	83,412,237.79	11,880,067.08	74,043,836.87	74,043,836.87
කොන්ත්‍රාත් සඳහා වූ රක්ඛවුම් මුදල්	6000-0-0-016-0-123-0	708,359,005.42	131,952,213.69	413,821,895.76	426,489,323.35	426,489,323.35
වන්දි ගෙවීම	6000-0-0-017-0-033-0	34,189,225.01	25,074,193.93	13,335,641.22	45,927,777.72	45,927,777.72
පළවැස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම්	6000-0-0-018-0-114-0	10,275.00	94,137,107.15	94,135,182.15	12,200.00	12,200.00
කොන්ත්‍රාත් සඳහා වූ රක්ඛවුම් මුදල්	6000-0-0-016-0-153-0	409,608,378.68	8,448,934.23	48,614,176.81	369,443,136.10	369,443,136.10
පළවැස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම්	6000-0-0-018-0-166-0	25.00		25.00	-	-
ප්‍රවාහන අංශය						
මෙන්ඩර් තැන්පත්	6000-0-0-002-0-159-0	300,000.00	9,702,500.00	9,852,500.00	150,000.00	150,000.00
කෙවන පාගරීවයන් වෙත නැවත ගෙවීම් කිරීම් වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු	6000-0-0-013-0-112-0	2,626,907.79	44,644,660.63	46,514,274.26	757,294.16	757,294.16
මෙවන පාගරීවයන් වෙත නැවත ගෙවීම් කිරීම් වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු	6000-0-0-013-0-195-0	-	13,763,615.24	13,763,615.24	-	-
පළවැස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම්	6000-0-0-018-0-190-0	-	37,150.00	37,150.00	-	-
වරාය හා සිවිල් ගුවන් සේවා අංශය						
පළවැස්ථාවික ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම්	6000-0-0-018-0-118-0	-	201,209,794.10	201,209,794.10	-	-
		1,157,605,483.06	**617,757,406.76**	**858,539,321.62**	**916,823,568.20**	**916,823,568.20**

ප්‍රධාන ගිණුම් නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2026-02-26

එච්. පරමේශ්වරන්
ප්‍රධාන මූල්‍ය නිලධාරී (මහාමාර්ග අමාත්‍යාංශය)
ප්‍රවාහන, මහාමාර්ග සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුට

2025 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය :117

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

රු.

අත්තිකාරම් ගිණුමේ නම	අත්තිකාරම් ගිණුම් අංකය	2025 ජනවාරි 01 දිනට ශේෂය (1)	වියදමෙහි උපරිම සීමා රු.35,000,000		ලැබීම්වල අවම සීමා රු. 16,000,000		හර ශේෂයන්ගේ උපරිම සීමා රු.150,000,000	බැරකම් පිළිබඳ උපරිම සීමා රු.	2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
			වර්ෂය තුළ හර කිරීම (2)		වර්ෂය තුළ බැර කිරීම (3)		ශේෂය 4=(1)+(2)-(3)		
			මුදලින්	හරස් සටහන් මගින්	මුදලින්	හරස් සටහන් මගින්			
(1) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම්	117011	51,225,509	35,139,514	33,253,785	20,733,245	24,486,719	74,398,843.73		74,398,844
(2) අනොකුත් අත්තිකාරම්									-
(3) විවිධ අත්තිකාරම්									-
									74,398,844

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2026 .02. 26

එස්. පරමේස්වරන්
ප්‍රධාන මූල්‍ය නිලධාරි (මහාමාර්ග අංශය)
ප්‍රවාහන, මහාමාර්ග සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

ඇමුණුම - (i)

(මූ.රෙ. 106 හා මූ.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය:117 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

වැඩසටහන් අංකය හා නාමය : මෙහෙයුම් ක්‍රියාකාරකම් 01

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කුප්‍රාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

අගය			සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		
රු	25,000.01	වැඩි	1	121,945.00
		එකතුව		

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය		සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1	අත්තිකාරම් බිඳ ගිණුම		121,945.00
2			
	එකතුව		121,945.00

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කුප්‍රා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

අගය			සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		
රු	25,000.01	වැඩි		
		එකතුව		

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය		සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1			
2			
	එකතුව		

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	ගණන	රු 121,945
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	1
	ගණන	රු
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මූ.රෙ. 106 යටතේ වන හානි හා මූ.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමිසාරිස් (මුදල්)
දිනය : 2026 -02- 26

ඒ.පී. පරමේස්වරන්
ප්‍රධාන මූල්‍ය නිලධාරි (මහාමාර්ග අංශය)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන
අමාත්‍යාංශයේ මෙරුම් ඔඩිටුවට

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

ඇමුණුම - (i)

(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය:117 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

වැඩසටහන් අංකය හා නාමය : සංවර්ධන ක්‍රියාකාරකම් 02

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		
රු	25,000.01	වැඩි		
	එකතුව			

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1		
2		
එකතුව		

නැත

(ii) නවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		
රු	25,000.01	වැඩි		
	එකතුව			

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1		
2		
එකතුව		

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2026.02.26

එස්. පරමේශ්වරන්
ප්‍රධාන මූල්‍ය නිලධාරි (මහාමාර්ග අංශය)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික යටිතල
අමාත්‍යාංශයේ ලේකම් මණ්ඩලය

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

වියදම ශීර්ෂ අංකය:117 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම කාර්යාලයේ නම: ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

වැඩසටහන් අංකය හා නාමය : මෙහෙයුම් ක්‍රියාකාරකම 01

1 වර්ෂය තුළ සිදුවූ මූ.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

අඟය	සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i) රු. 25,000.00 අඩු	.....	.....
(ii) රු. 25,000.01 වැඩි	.....	.....
එකතුව		

2 වර්ෂය තුළ මූ.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය

	අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය	අලාභයේ වටිනාකම	අයකර ගැනීම්	පොතෙන් කපා හල අගය	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය	පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය
		රු.	රු.	රු.	රු.	රු.	
ප්‍රවාහන අංශය							
1	**PD-9186	38,230	-	5,250	-	32,980	
2	KQ - 2412	79,875	-	-	-	79,875	
4	PF - 6319	369,957		-	-	369,957	
5	KY - 7563	1,300,255	-	-	-	1,300,255	
8	KH - 6098	56,722	-	-	-	56,722	
9	PF- 6323	-	184,000	184,000	-	-	
11	PE - 1729	-	22,100	22,100	-	-	
12	PD - 9186	-	440,825	440,825	-	-	
13	NB - 2589	-	179,000	-	-	179,000	
මහාමාර්ග අංශය							
12	KX - 5322	5,030,193	-	-	-	5,030,192.58	
13	KR - 5447	6,200,000.00		-	-	6,200,000	
14	CAU - 8608	-	384,847.40	327,861.03	-	56,986	
	එකතුව	**13,075,232**	**1,210,772**	**980,036**	**-**	**13,305,968**	

**PD-9186 මෙම වාහනය රුපියල් 30,000 ක් හෙට 2024 වර්ෂයේදී අයකර ගන්නා ලද නමුත් එය රුපියල් 3000 ක් බලෙන පැවැත්මකින් පවරාගත් බව 2024 දී ඉදිරියට ගෙන යන ලද ශේෂය වැරදීමකි. එබැවින් මෙම වර්ෂයේ ආරම්භක ශේෂය රුපියල් 38,230 ක් විය යුතුය.

ප්‍රධාන මුද්‍රණ නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධීක්ෂණ (මුද්‍රණ) / කොමසාරිස් (මුද්‍රණ)
2026.02.20
එච්. පරණවිතාරණ
ප්‍රධාන මුද්‍රණ නිලධාරි (කොමර්ෂල් අංශය)
ප්‍රවාහන, මහාමාර්ග සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
(අත්සන සහ සුපිරි මිටියුව)

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

වියදම ශීර්ෂ අංකය:117 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
වැඩසටහන් අංකය හා නාමය : සංවර්ධන ක්‍රියාකාරකම 02

1 වර්ෂය තුළ සිදුවූ මූ.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

අගය	සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i) රු. 25,000.00 අඩු	.....	.....
(ii) රු. 25,000.01 වැඩි	.....	.....
එකතුව		

2 වර්ෂය තුළ මූ.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය

අලාභයේ ස්වභාවය	ආරම්භක කපා හොඳල ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා හොඳල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1						
2						
3						
4			නැත			
5						
6						
එකතුව						

සටහන - සටහන (i) හි ඇතුළත් හිඟුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් ගැර මූ.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස (මුදල්)
දිනය : 2024.02.26

ප්‍රධාන මූල්‍ය නිලධාරි සහකාරිය ඇමතියි
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන
අමාත්‍යාංශයේ ගරුකුල් විද්‍යාලය

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් වකුලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2025.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම ශීර්ෂ අංකය:117

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:ප්‍රවාහන,මහාමාර්ග,වරාය හා සිවිල් ගුවන් සේවා

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2025.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2025.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2025.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
	මහාමාර්ග අංශය					
1	ලංකා බැංකුව - නැප්ප්‍රාමෙන්	7040330	193,984,597.18	-	-	දෙසැම්බර්
2	ලංකා බැංකුව - බත්තරමුල්ල	7040370	9,984,565.01	-	-	
3	ලංකා බැංකුව - බත්තරමුල්ල	7042211	-	-	-	
4	ලංකා බැංකුව-බත්තරමුල්ල	7042823	382,801,726	-	-	
	ප්‍රවාහන අංශය					
5	ලංකා බැංකුව - බත්තරමුල්ල	7040312	321,200,000.00	-	-	දෙසැම්බර්
6	ලංකා බැංකුව - බත්තරමුල්ල	7040316	40,399,937.50	-	-	
7	ලංකා බැංකුව - බත්තරමුල්ල	7040307	214,937,592.71	213,784,309.48	-	
8	ලංකා බැංකුව - බත්තරමුල්ල	7040317	50,000.00	-	-	
9	ලංකා බැංකුව - බත්තරමුල්ල	7040556	108,996,248.38	-	-	
10	ලංකා බැංකුව - බත්තරමුල්ල	7042656	3,386,158,999.63	-	-	
	වරාය හා සිවිල් ගුවන් සේවා අංශය					
11	ලංකා බැංකුව - නැප්ප්‍රාමෙන්	7040298	14,918,834.47	-	-	දෙසැම්බර්

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2026.01.28

එස්. පරමේශ්වරන්
ප්‍රධාන මූල්‍ය නිලධාරි (මහාමාර්ග අංශය)
ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

3.6 ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය අදායම් උපයන ආයතනයක් නොවන බැවින් ආදායම් එකතුකිරීමේ කාර්යසාධනය අදාල නොවේ.

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කරගැනීමේ කාර්යසාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	ප්‍රතිපාදනය		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරක ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	354,906,650	351,206,650	259,099,848.50	73.77%
ප්‍රාග්ධන	374,569,500,000	374,232,033,739	353,206,071,856.74	94.38%

3.7 මු.රෙ.208 ප්‍රකාරව, මෙම දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ පළාත් සභාව නියෝජිතයෙකු ලෙස වෙනත් අමාත්‍යාංශවලට/ දෙපාර්තමේන්තු වලටප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදනය		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
01.	විදේශ කටයුතු අමාත්‍යාංශය	ගරු අමාත්‍ය බිමල් රත්නායක මහතාගේ චීන සංචාරයට අදාළ ගුවන් ටිකට්පත් සඳහා වැයවූ වියදම් ප්‍රතිපූර්ණය කිරීම	925,500.00	925,500.00	925,500.00	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2025/12/31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2025/12/31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත ප්‍රමාණය	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	730,000.00	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	5,155,728,004.78	-	-
9153	ඉඩම්	-	526,739,213,485.01	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	1,969,666,153.75	-	-

වත්කම් කේතය	කේත විස්තරය	2025/12/31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2025/12/31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත ප්‍රමාණය	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	356,611,408.51	-	-
9160	කෙරීගන යන වැඩ	-	217,229,364.35	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	31,439,669,209.69	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසන් විගණන වාර්තාව ***ඇමුණුම 07හි*** ඇතුලත් කර ඇත.

පරිච්ඡේදය 4

කාර්ය සාධන දර්ශක

4.1 කාර්ය සාධන දර්ශක හැඳින්වීම

මෙරට ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රධානාංගයක් ලෙස සැලකිය හැකි මාර්ග අංශයේ උන්නතිය උදෙසා සුවිශේෂී දායකත්වයක් සපයනු ලබන ආයතන අතර ප්‍රමුඛතම ආයතනය මහාමාර්ග අමාත්‍යාංශය ලෙස දැක්විය හැකිය. මේ අනුව වාර්තාගත කාලපරිච්ඡේදයක් තුල ප්‍රධාන කාර්යසාධන දර්ශක පිහිටුවා එමඟින් මෙම අංශයේ කාර්ය සාධනය මැන බැලීම සිදු කළ යුතු වේ.ඊට සමගාමීව මෑත කාලීන සෑම මූල්‍ය වර්ෂයකදීම පහත දැක්වෙන ප්‍රධාන කාර්ය දර්ශක පිහිටුවා එමඟින් ආංශික කාර්යසාධනය නියාමනය කරන ලදී.

- නිම කරන ලද මහාමාර්ග දුර (කි.මී.)
- නිම කරන ලද අධිවේගී මාර්ග දුර (කි.මී.)
- නිම කරන ලද ග්‍රාමීය මාර්ග දුර (කි.මී.)
- නිම කරන ලද ග්‍රාමීය පාලම් ගණන
- නිම කරන ලද පාලම් ගණන (ජාතික මාර්ගයන්හි)
- මාර්ගයන්හි රළු භාවය

4.1.1 අමාත්‍යාංශයීය ප්‍රධාන කාර්යසාධන දර්ශකයන්හි ප්‍රගතිය

- 2025 වර්ෂය තුලදී , දැනට සිදු කරමින් පවතින අධිවේගී මාර්ග ඉදිකිරීම් කිසිවක් අවසන් කිරීම සඳහා ඉලක්ක කර නොතිබුණු බැවින් වාර්තා කරනු ලබන වර්ෂයේදී අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්ය දර්ශකයක් වන නිමකරන ලද අධිවේගි මාර්ග සලකා බලනු නොලැබේ.

- 2025 වර්ෂය තුල ඉලක්කගත මහාමාර්ග දුර ප්‍රමාණයෙන් මාර්ග කි.මී.920.76 ක දුර ප්‍රමාණයක් නිම කර ඇත්තේ 78% ක කාර්යසාධනයක් පෙන්නුම් කරමිනි.

- වර්ෂය තුල ඉලක්කගත ග්‍රාමීය මාර්ග දුර ප්‍රමාණයෙන් ග්‍රාමීය මාර්ග කි.මී.800 ක දුර ප්‍රමාණයක් වර්ෂාවසාන වන විට නිම කිරීමට හැකි වී ඇත්තේ 49%ක ඉලක්කයක් පූර්ණය කරමිනි.

- වාර්තාගත කාලපරිච්ඡේදය තුල ජාතික මාර්ගයන්හි ඉදිකිරීමට ඉලක්කගත පාලම් 60ක ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇත්තේ 73% ක කාර්යසාධනයක් අත් කරගනිමිනි.

- එසේම 2025 වර්ෂය අවසන් වන විට ඉලක්කගත ග්‍රාමීය පාලම් අතරින් ග්‍රාමීය පාලම් 92 ක සංවර්ධන කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇත්තේ 53% ක කාර්යසාධනයක් අත් කර ගනිමිනි.

- වර්ෂය තුලදී, ඉලක්කගත මාර්ග රළු භාවය මහාමාර්ගයක් සඳහා මාර්ග කිලෝමීටරයක් සඳහා 4.11 ක් වූ අතර, අධිවේගී මාර්ග සඳහා මාර්ග කිලෝමීටරයකට 1.33කි. එය 2025 වර්ෂය තුලදී පවතින සම්පූර්ණ මාර්ග ජාලය තුලම ස්ථිතික අගයකින් යුතුව පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත. ඒ අනුව එම ඉලක්කය අපේක්ෂා කළ පරිදි පූර්ණ වශයෙන් අත්කරගැනීමට සමත්ව ඇත.

කාර්යසාධන දර්ශකය	තත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස			
	100% -90%	75% - 89%	50% - 74%	50% >
නිමකරන ලද මහාමාර්ග දුර (කි.මී.)		√		
නිමකරන ලද අධිවේගී මාර්ග දුර (කි.මී.)	2025 වර්ෂයේදී ක්‍රියාත්මක වෙමින් පවතින අධිවේගී මාර්ගයන්හි ඉදිකිරීම් අවසන් කිරීම සඳහා ඉලක්ක කර නොතිබූ බැවින් කාර්යසාධන දර්ශකයක් ලෙස සලකා බලනු නොලැබේ.			
නිමකරන ලද ග්‍රාමීය මාර්ග දුර (කි.මී.)				√
නිමකරන ලද පාලම් ගණන (ජාතික මාර්ගයන්හි)			√	
නිමකරන ලද පාලම් ගණන (ග්‍රාමීය මාර්ගයන්හි)			√	
මාර්ගයන්හි රළු භාවය	√			

පරිච්ඡේදය 5

නිරසාර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්යසාධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු අත්පත් කරගැනීමේ කාර්යසාධනය

ලොව පුරා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල බහුපාර්ශවීය හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති හැඩගැස්වීමේදී එකිනෙක සමඟ ඒකාබද්ධිත වූ මෙම තිරසාර සංවර්ධන අරමුණු 17, ගෝලීය වශයෙන් ඉතා වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකේ. ඒ අනුව, ශ්‍රී ලංකාව ද මෙම තිරසාර සංවර්ධන අරමුණු 17, ඉලක්ක 169 හා දර්ශක 244 සමඟ ක්‍රියාත්මක කිරීම සඳහා සිය පක්ෂපාතීත්වය පල කොට ඇති අතර ඒ සඳහා කැපවන බවට එකඟත්වය පළ කර ඇත.

මෙම ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම සඳහා සෘජුව පෙනී සිටීමින් සහ අවශ්‍ය මඟ පෙන්වීම ලබා දෙමින් ජාතික අයවැය ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු සියළුම ආයතන උක්ත ව්‍යාපෘති තිරසර සංවර්ධන අරමුණු වලට අනුකූලව සිදු කිරීමට බැඳී සිටී.

ඉහත දක්වා ඇති කරුණු සලකා බැලීමේ දී ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ සැලසුම් හා මෙහෙයුම් අංශය විසින් මාර්ග අංශය යටතේ ගැනෙන තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනාගනු ලැබූ අතර ඒ යටතේ වූ ප්‍රධාන අරමුණු 03 පහත දැක්වේ. මෙම තිරසර සංවර්ධන අරමුණු ත්‍රිත්වය හැරුණු කොට රටේ සමාජ ආර්ථික සංවර්ධනය සමඟින් ගමන් කරන අනෙකුත් අරමුණු බොහෝමයක් මාර්ග සංවර්ධනය හා සම්බන්ධ වන අතර එය රටේ සමස්ත තිරසාර සංවර්ධන ප්‍රවර්ධනය සමඟ චක්‍ර ලෙස සම්බන්ධවේ.



5.2 හඳුනාගත් අදාළ අරමුණු වල ප්‍රගතිය

අරමුණ	ඉලක්කය	දර්ශකය	2025.12.31 ට ප්‍රගතිය		
			0-%49%	50%-74%	75% - 100%
9	9.1ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබා ගත හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදු කරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.	වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන මාර්ග හා පාලම් ගණන	-	-	90%
11	11.2 විශේෂයෙන්ම අවධානයට ලක් විය හැකි තත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයන් සහ වයස්ගත පුද්ගලයන්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමකින් ව්‍යාප්ත කිරීම මගින් 2030 වන විය සියලු දෙනාට ආරක්ෂාකාරී අඩු මිලට ලබා ගත හැකි ප්‍රවේශ විය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම.	මාර්ග අනතුරු අවම කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘති ගණන	-	-	100%
12	2030 වන විට එකඟතාවයට පත් වී ඇති අන්තර්ජාතික වැඩසැලැස්මට අනුකූලව පරිසර හිතකාමී අන්දමට රසායනික ද්‍රව්‍ය හා සියලුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ක්‍රියාවට නැංවීම සහ එමඟින් මානව සෞඛ්‍යයට සහ පරිසරයට සිදු වන්නා වූ අහිතකර බලපෑම අවම කිරීම සඳහා වාතයට, ජලයට සහ පසට ඒවා මුදා හැරීම අවම කිරීම.	පරිසර හිතකාමී ලෙස ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘති ගණන	-	-	70%

මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුතු කරුණ නම් එක් එක් විෂය ක්ෂේත්‍ර යටතේ හඳුනාගෙන ඇති මෙම අරමුණු අමාත්‍යාංශයේ ක්‍රියාකාරී විෂය පථය සමඟ සම්බන්ධ වීමයි. මේ අනුව තෝරාගත් ඉලක්ක රඳාපවතින්නේ එම තෝරාගත් අරමුණු මත පමණි. ඊට අමතරව සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් අමාත්‍යාංශය යටතට ගැනෙන බැවින් සහ තිරසර සංවර්ධන අරමුණුවල සංරචක ඇතුලත් කර ඇති බැවින් වෙනම ඉලක්ක ලෙස ඇතුලත් කිරීම අනවශ්‍ය වේ.

5.2 මාර්ග අංශයේ තිරසර සංවර්ධන අරමුණු අත්පත් කරගැනීම හා මුහුණ දුන් අභියෝග

- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සියලු ව්‍යාපෘතිවල ප්‍රධාන ඉලක්කය ගුණාත්මක, විශ්වසනීය, තිරසාර හා වඩාත් යෝග්‍ය යටිතල පහසුකම් සැලසීම වන අතර ඒ හේතුවෙන් 2024 වර්ෂයේදී මෙන්ම 2025 වර්ෂාවසානය වන විටද සැලසුම් කළ පරිදිම 9.1 වූ ඉලක්කය 100% කින් අත්කරගැනීමට අමාත්‍යාංශයට හැකි වී ඇති බව නිරීක්ෂණය වේ.
- 11.2 ඉලක්කය සාක්ෂාත් කරගැනීම සඳහා මහාමාර්ග අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පහත දැක්වෙන වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කරන ලදී. ඒවා නම්;

ජාල සැලසුම්කරණය හා මාර්ග ආරක්ෂණය
රථවාහන ගමනාගමන කළමණාකරණය

ඉහත වැඩසටහන් 02 අතුරින් ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණය වැඩසටහන මඟින් මූලික වශයෙන් සැලසුම් කරන ලද සියළුම ක්‍රියාකාරකම් 100%ක ප්‍රගතියක් සහිතව සාර්ථකව නිම කරන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතිය මඟින් අත්කරගත් සමස්ත ප්‍රගතිය 100%කි.

රථවාහන ගමනාගමන කළමණාකරණ වැඩසටහන සඳහා 2025 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් පරිදි ක්‍රියාකාරකම් 06 ක් සිදු කිරීම සඳහා සැලසුම් කර තිබූ අතර 2025 වර්ෂය අවසන් වන විට සැලසුම් කළ පරිදිම එකී ක්‍රියාකාරකම් 06ම 100% ප්‍රගතියක් සහිතව නිම කිරීමට සමත් වී ඇත.

ඒ අනුව මෙම කාර්යසාධක දර්ශකය සඳහා අත්කරගත් සමස්ත ප්‍රගතිය 100% ක් ලෙස දැක්විය හැකිය.

- 1988 අංක 56 (සංශෝධිත) දරණ ජාතික පරිසර පනත යටතේ, පරිසරයට බලපෑම් විය හැකි සියළුම ව්‍යාපෘති එක් එක් ව්‍යාපෘතියේ සිවිල් වැඩ ආරම්භයට පෙර පාරිසරික ඇගැයීම් වාර්තාවක් හෝ මූලික පාරිසරික පරීක්ෂාවක් හෝ වෙනත් ආකාරයේ පාරිසරික ඇගැයීමක් හෝ සිදු කර මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගත යුතුය. ඒ අනුව ඉහත පනත ප්‍රකාරව ව්‍යාපෘතියේ කිසිදු ක්‍රියාකාරකම් තුලින් පරිසරයට බලපෑමක් නොවන බවට තක්සේරුවක් ලබා ගත යුතු අතර පනතේ දැක්වෙන කිසිදු වගන්තියක් උල්ලංඝනය නොකළ යුතුය.

2025 වර්ෂය තුළදී මාර්ග සංවර්ධන අධිකාරිය (Road Development Authority - RDA) යටතේ ක්‍රියාත්මක වූ සහ නිම කරන ලද ව්‍යාපෘති සඳහා අදාළ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව (EIA - Environmental Impact Assessment) සහ මූලික පාරිසරික ඇගයීම (IEE - Initial Environmental Examination) වාර්තා පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගත් ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති

ව්‍යාපෘතියේ නම	ලබාගත් වාර්තාවේ ස්වභාවය
කඩවත අන්තර් හුවමාරුව	සමාජ හා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව (SEIA)
මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර I, II, IV (කඩවත සිට දඹුල්ල දක්වා)	පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව (EIA)

ව්‍යාපෘතියේ නම	ලබාගත් වාර්තාවේ ස්වභාවය
A017 මාර්ගයේ දෙනියාය සිට රක්වාන දක්වා මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරීම	මූලික පාරිසරික ඇගයීම (IEE)
මධ්‍යම අධිවේගී මාර්ගයේ ගම්පහ අන්තර් හුවමාරුව	සමාජ හා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව (SEIA)
කුරික්කඩුවාන් ජැටි ව්‍යාපෘතිය	මූලික තොරතුරු ලේඛන ඉදිරිපත් කර ඇත.
පරන්තන් - කච්චායි මුලතිව් (A035) මාර්ගයේ වඩ්ඩුවාකල් පාලම	මූලික තොරතුරු ලේඛන ඉදිරිපත් කර ඇත

ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට පෙර මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගත් ව්‍යාපෘති

ව්‍යාපෘතිය	වාර්තාවේ ස්වභාවය	වර්තමාන තත්වය
මහනුවර උමං මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව (EIA)	පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව මධ්‍යම පරිසර අධිකාරියට ඉදිරිපත් කර ඇති අතර, පාර්ශ්වකරුවන්ගේ අදහස් තවමත් ලැබී නොමැත.
රත්නපුර අතුරු මාර්ගය	මූලික පාරිසරික ඇගයීම (IEE)	මූලික පාරිසරික ඇගයීම වාර්තාවේ කෙටුම්පත මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත.
A10 මාර්ගයේ කටුගස්තොට - ගලගෙදර කොටස පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම (0.000-13.500 km)	පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව (EIA)	ශක්‍යතා අධ්‍යයනය අවසන් වූ පසු ESDD විසින් පාරිසරික බලපෑම් තක්සේරුව ආරම්භ කරනු ඇත.

ව්‍යාපෘතිය	වාර්තාවේ ස්වභාවය	වර්තමාන තත්වය
යෝජිත පදිරිප්පු පාලම් ව්‍යාපෘතිය	BIQ	පාරිසරික නිර්දේශ ලබා ගැනීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී
කෝකිලායි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය	මේ වන තෙක් තීරණයක් ගෙන නොමැත	සැලසුම් සංශෝධනය වෙමින් පවතින බැවින්, සංශෝධිත සැලසුම් මත පදනම්ව තක්සේරුව ආරම්භ කරනු ඇත.

පරිච්ඡේදය 6

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	35	25	10
තෘතියික	04	02	02
ද්විතියික	118	86	32
ප්‍රාථමික	36	21	15
එකතුව	**193**	**134**	**59**

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

I. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරක් වන අතිරේක ලේකම්(විශේෂ ව්‍යාපෘති) තනතුර දැරූ නිලධාරියා 2025.11.04 දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාම මත එදින සිට එම තනතුර පුරප්පාඩුව පවතී. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් මේ වන තෙක් පුරප්පාඩු තනතුර සඳහා සුදුසු නිලධාරියකු පත් කර නොමැති අතර 2025.11.10 දින සිට 2025.11.09 දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව එම තනතුරේ වැඩ බැලීමට නිලධාරියකු පත් කර ඇත. ග්‍රාමීය මාර්ග හා පාලම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සහ අනෙකුත් ග්‍රාමීය මාර්ග සංවර්ධන කාර්යයන්ට අවශ්‍ය අනුමැතීන්/බලය දීම් සඳහා හා එම සංවර්ධන කාර්යයන් විධිමත් පරිදි අධීක්ෂණය සඳහා සුදුසු නිලධාරියකු ස්ථිරව තනතුරට පත් කර ගැනීම කඩිනමින් සිදු කළ යුතු බව නිරීක්ෂණය වේ.

II. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ තනතුරු 02ක් ද, III/II ශ්‍රේණියේ සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 01ක් ද 2025.12.31 දිනට පුරප්පාඩු වී ඇත. ජාතික මහාමාර්ග පද්ධතියේ ඉදිකිරීම් සම්බන්ධ ඉංජිනේරුමය කටයුතු අධීක්ෂණය හා මෙහෙයවීම, තාක්ෂණික විගණනයන් සිදු කිරීම, මාර්ග ව්‍යාපෘතිවල ප්‍රගතිය හා තත්ත්වය අධීක්ෂණය කිරීම, මාර්ග උත්ශ්‍රේණිගත කිරීම, වාර්ෂික මහාමාර්ග ඒකක මිල ගණන් ලේඛන සැකසීම ආදී තාක්ෂණික ස්වරූපයේ පුළුල් ක්ෂේත්‍රයක රාජකාරි රාශියක් ඉංජිනේරු අංශය වෙත පැවරී ඇති බැවින් එකී රාජකාරි අදාළ කාල රාමු තුළ වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සුදුසු නිලධාරීන් අනුයුක්ත කර ගැනීම තුළින් මානව සම්පත මනාව කළමනාකරණය කර ගත හැකි වේ.

III. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III/II ශ්‍රේණියේ සහකාර ලේකම් තනතුරු 02ක් ද, සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 01ක් 2025.12.31 දිනට පුරප්පාඩු වී ඇත. මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අදාළව පැවරී ඇති ආයතනික හා පරිපාලන කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය, අමාත්‍යාංශයේ 140කට ආසන්න කාර්යය මණ්ඩලයක පරිපාලන කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය, අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක මහාමාර්ග හා අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවල කාර්යය මණ්ඩලය පත් කිරීම සබැඳි ආයතනික කටයුතු මෙහෙයවීම,ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පරිපාලන කටයුතු අධීක්ෂණය, එම සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම හා ප්‍රතිස්ථානගත කිරීම් පරිපාලන කටයුතු මෙහෙයවීම සහ අමාත්‍යාංශයේ කාර්යයන් හා වගකීම් ඉටු කිරීමට අදාළව අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පැවැත්වීම යනාදී කාර්යයන් පැවරී ඇති විධායක තනතුරු 03ක් දිගු කාලයක සිට මෙසේ පුරප්පාඩුව පැවතීම අමාත්‍යාංශයේ අරමුණු ළඟා කර ගැනීමේ දී සැලකිය යුතු බාධාවක්ව පවතී.

IV. 2025.12.31 දිනට මහාමාර්ග අංශයේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පුරප්පාඩු තනතුරු පිළිබඳ සලකා බැලීමේ දී, III/II ශ්‍රේණියේ අභ්‍යන්තර විගණක තනතුරු අතරින් 01ක් පුරප්පාඩු වී තිබේ. වාර්ෂික විසර්ජන පනත මඟින් මහාමාර්ග අංශය වෙත වෙන් කෙරෙන ප්‍රතිපාදන ආර්ථිකභාවයෙන් හා විනිවිදභාවයෙන් ඉටු කිරීම සහ මහාමාර්ග අංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය යටතේ දේශීය හා විදේශීය ආධාර මත ක්‍රියාත්මක විශාල හා මධ්‍ය පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති 08හි මූල්‍යමය හා පරිපාලන පරිචයන් පිළිබඳ අභ්‍යන්තර විගණන පටිපාටි ක්‍රියාත්මක කිරීම හා තවදුරටත් ශක්තිමත් කිරීම වෙනුවෙන් ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය කරුණකි. අමාත්‍යාංශය ඇතුළු එම ව්‍යාපෘතිවල ද විගණන කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය සෘජුවම ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත පැවරී ඇති බැවින් අභ්‍යන්තර විගණකවරයකුගේ සහාය ලබා ගැනීම තුළින් එකී කටයුතු නියමිත කාලරාමුවන් තුළ ඉටු කර ගැනීමේ හැකියාවක් පවතී.

V. තව ද, 2025.12.31 දිනට පුරප්පාඩු රජයේ භාෂා පරිවර්තක සේවයේ I/විශේෂ පන්තියේ ඉංග්‍රීසි-දෙමළ භාෂා පරිවර්තක තනතුරු ගණන 01කි. මහාමාර්ග අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය යටතේ දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති 08කට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් මසකට 7-10ක් අතර ප්‍රමාණයක් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කෙරේ. තව ද, ගරු අමාත්‍යවරයා වෙත යොමු කරන පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම්, උපදේශක පෙත්සම් කාරකා සභා/පාර්ලිමේන්තු කාරක සභා වාර්තා සහ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යය සාධන වාර්තා ද භාෂාත්‍රයෙන්ම සකස් කර ඉදිරිපත් කළ යුතු වේ. මෙම පුරප්පාඩුව හේතුවෙන්, විශේෂයෙන්ම සේවා අවශ්‍යතාවය මත අවස්ථානුකූලව ඉතා කෙටි කාලයක් තුළ ඉදිරිපත් කළ යුතු මට්ටමේ අමාත්‍ය මණ්ඩල සංදේශ, සටහන් හා උපදේශක පෙත්සම් කාරකා සභා/පාර්ලිමේන්තු කාරක සභා වාර්තා වැනි ලේඛන ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට පරිවර්තනය සිදු කර ගැනීම සඳහා ව්‍යත්තීමය සුදුසුකම් සහිත බාහිර සම්පත් දායකයින් සොයා ගැනීමට සිදුව ඇති අතර සීමිත කාල රාමුවක් තුළ ඔවුන් ලවා අදාළ පරිවර්තනයන් සිදු කර ගැනීමේ දී ප්‍රායෝගික දුෂ්කරතා රාශියකට මුහුණ දීමට සිදුව ඇත.

VI. එසේම, 2025.12.31 දිනට මහාමාර්ග අංශය සඳහා අනුමත තොරතුරු තාක්ෂණ සන්නිවේදන නිලධාරී සහ තොරතුරු තාක්ෂණ සන්නිවේදන සහකාර වශයෙන් තනතුරු දෙකක් අනුමත වී ඇති අතර මෙම තනතුරු දෙකම මේ වන විට පුරප්පාඩුව පවතී. අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා මේ වන විට ඉටු කර ගැනීම බරපතල කාර්යයක් වී ඇති අතර ඒ සඳහා වෙනත් සම්බන්ධිත ආයතන වල නිලධාරීන් යොදා ගැනීම මේ වන විට සිදුවේ. නමුත් එම නිලධාරීන්ගේ රාජකාරී කටයුතු තුළ කාර්යබහුල වීම නිසා එම කටයුතු මේ වන විට කාර්යක්ෂමව සහ ඵලදායීව සිදු නොවන බව පෙනී යයි. අමාත්‍යාංශයේ වෙබ් අඩවිය නියමිත පරිදි යාවත්කාලීන නොවීමේ ගැටළුවක්ද මෙම තත්වය මත සිදු වන බැවින් මෙම පුරප්පාඩු දෙක කඩිනමින් සම්පූර්ණ කළ යුතු වේ.

VII. 2025.12.31 දිනට සංවර්ධන නිලධාරී සේවයේ පුරප්පාඩු තනතුරු 21ක් ද, කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 07ක් ද, ඒකාබද්ධ සේවයේ රියදුරු තනතුරු 10ක් ද, කාර්යාල කාර්යය සහායක තනතුරු 04ක් ද පුරප්පාඩුව පවතින බැවින් එම තනතුරු ද සේවා අවශ්‍යතාවය මත කඩිනමින් සම්පූර්ණ කළ යුතුය.

6.3 මානව සම්පත්සංවර්ධනය						
වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් සංවිධානය කරනු ලබන "Towards a prosperous country" (සමෘද්ධිමත් දේශයක් කරා) නමැති දැනුවත් කිරීමේ වැඩසටහන	30	03 Hours	2, 800.00	-	දේශීය	රාජ්‍ය සේවයෙන් අල්ලස් ගැනීම තුරන් කිරීම සඳහා දැනුවත්භාවය වැඩි කිරීම
ආයතන සංග්‍රහයේ 2 කොටස පිළිබඳ පුහුණු වැඩසටහන	24	04 Hours	8,750.00		දේශීය	විනය ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුවත්භාවය
මූලික විමර්ශනය	01	08 Hours	6,500.00	-	දේශීය	මූලික පරීක්ෂණ පවත්වන ආකාරය
මූලික අයිතිවාසිකම්, පරිපාලන නීතිය සහ පෙත්සම් පිළිබඳ පුහුණු වැඩසටහන	05	05 Hours	0.00	-	දේශීය	මූලික අයිතිවාසිකම්, පරිපාලන නීතිය සහ Writ පෙත්සම්
පුද්ගලික ගොනුවක් ඵලදායී ලෙස පවත්වාගෙන යාම	02	08 Hours	13,000.00	-	දේශීය	පුද්ගලික ගොනුවක් ඵලදායී ලෙස පවත්වාගෙන යාම
භාෂා පර්වර්තන ඩිප්ලෝමා පුහුණුව	01	02 Years	30,000.00	-	දේශීය	භාෂා පරිවර්තනය හා අර්ථ නිරූපණය
ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා පුහුණුව	02	08 Hours	36,000.00	-	දේශීය	ප්‍රසම්පාදන ක්‍රියාවලිය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
රාජකාරි ලිපි සහ රැස්වීම් සටහන් ලිවීම	02	09 Hours	13,000.00	-	දේශීය	රාජකාරි ලිපි සහ රැස්වීම් සටහන් නිවැරදිව සැකසීම
නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය	01	02 Years	100,000.0	-	දේශීය	අදාල නීති පිලිබඳ දැනුවත්භාවය
2024 නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ පුහුණු වැඩසටහන	01	16 Hours	6,000.00	-	දේශීය	නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ
රජයේ වාහන නඩත්තුව පිළිබඳ පුහුණු වැඩමුළුව	04	08 Hours	26,000.00	-	දේශීය	රජයේ වාහන නඩත්තු කිරීම
රාජ්‍ය ගිණුම්කරණය සහ මූල්‍ය රෙගුලාසි	31	03 Hours	7,200.00	-	දේශීය	රාජ්‍ය ගිණුම්කරණය සහ මූල්‍ය රෙගුලාසි
රැස්වීම් සටහන් ලිවීම	02	08 Hours	13,000.00	-	දේශීය	රැස්වීම් සටහන් නිවැරදිව සැකසීම
නව ප්‍රසම්පාදන ක්‍රියාවලිය	01	16 hours	6,000.00	-	දේශීය	නව ප්‍රසම්පාදන ක්‍රියාවලිය
මාර්ග ආරක්ෂාව	13	08 hours	-	-	දේශීය	මාර්ග ආරක්ෂාව
නව ප්‍රසම්පාදන ක්‍රියාවලිය	02	24 hours	36,000.00	-	දේශීය	නව ප්‍රසම්පාදන ක්‍රියාවලිය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව
			දේශීය	විදේශීය		
නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය සහ වගකීම	01	08 hours	6,500.00	-	දේශීය	නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය සහ වගකීම
ආහාර පාන සේවා පුහුණු වැඩසටහන	17	09 hours	110,500.00	-	දේශීය	ආහාර පාන සේවා පුහුණුව
සංවර්ධන නිලධාරීන්ගේ සහ කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය	01	16 hours	12,000.00	-	දේශීය	සංවර්ධන නිලධාරීන්ගේ සහ කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය
දෙමළ භාෂාව	02	100 hours	10,000.00	-	දේශීය	දෙමළ භාෂාව
වෘත්තීය ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමාව	01	02 Years	92,000.00	-	දේශීය	ඉංග්‍රීසි භාෂාව
ශ්‍රී ලංකාවේ සංවර්ධන කලාපයේ ඉදිකිරීම් සහ කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	01	15 Days	-	ඇ.ඩො 375 GBP 75	විදේශීය	ගෝලීයකරණය සහ ප්‍රතිසංස්කරණය පිළිබඳ චීනයේ අත්දැකීම්, ගෝලීය විශේෂ ආර්ථික කලාප, නියමු නිදහස් වෙළඳ කලාප සංවර්ධනය කිරීමේ ප්‍රගතිය සහ අත්දැකීම්
ලංකාවේ සිවිල් සේවා නිලධාරීන්ගේ (Civil Servants / SLAS Officers) වෘත්තීය සහ නායකත්ව කුසලතා වර්ධනය කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක ධාරිතා සංවර්ධන වැඩසටහන	01	12 Days	-	ඇ.ඩො 375	විදේශීය	උපායමාර්ගික නායකත්වය, පාලනයේ නායකත්වය, නවෝත්පාදන හා වෙනස්වීම් කළමනාකරණය, පාලනයේ වගකීම

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව
			දේශීය	විදේශීය		
චීනය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සංවර්ධනය සහ දරිද්‍රතාවය පිටුදැකීම පිළිබඳ සම්මන්ත්‍රණය	02	15 Days	-	ඇ.ඩො 750 GBP 75	විදේශීය	ආර්ථික සංවර්ධනය පිළිබඳ දැනුම
කාර්යක්ෂම සහ ඔරොත්තු දෙන නාගරික ප්‍රවාහනය පිළිබඳ දැනුවත් කිරීම	01	05 Days	-	ඇ.ඩො 125	විදේශීය	බස් ප්‍රවාහන කළමනාකරණය හා මෙහෙයවීම, තාක්ෂණික භාවිතය, නවෝත්පාදනය සඳහා පොදු හා පෞද්ගලික අංශවල සහභාගීත්වය, ආපදා ප්‍රතිචාර යාන්ත්‍රණය හා ආපදා වැලැක්වීමේ යාන්ත්‍රණය
ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	01	15 Days	-	ඇ.ඩො 375	විදේශීය	චීනයේ මූල්‍ය කළමනාකරණ පද්ධතිය සහ මූල්‍ය ප්‍රතිසංස්කරණ, ජාතික ආර්ථිකයට පෞද්ගලික ව්‍යවසායන් දක්වන දායකත්වය, නව තාක්ෂණයන් විශ්ලේෂණය කිරීම.

පරිච්ඡේදය 7

අනුකූලතා වාර්තාව

07වන පරිච්ඡේදය -අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල නොවේ.	ඇතැම් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට කාලය දීර්ඝ කර ඇත. අදාළ දිනයේදී පිළිතුරු ලබාදී ඇත.	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාදීපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ.	එක් වාර්තාවකට අතුරු පිළිතුරක් හා මසක් පසුවී පිළිතුරු ලබාදී ඇත.	නිරන්තර දැන්වීම් කිරීම මඟින් පිළිතුරු ලබාගැනීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	**විගණන කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන යාම	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමසම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ.	වාහන අනතුරු හේතුවෙන් අවලංගු කරන ලද වාහන සම්බන්ධයෙන් රක්ෂණ සමාගම් සමඟ කටයුතු කිරීමේදී ප්‍රමාදයන් සිදුවන අතර, මු.රෙ.104හි විමර්ෂණ සඳහා ගතවන කාලය සමඟ,මෙම වාහන මාස 06 කාලයක් තුල බැහැර කිරීම ප්‍රායෝගික නොවනබව නිරීක්ෂණය වී ඇත.	හදිසි අවස්ථාවකදී වාඩකටයුතු කඩිනමින් සිදු කිරීමට හැකිවන පරිදි ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් ඇති කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ.	සංචිත වාහන සඳහා සම්පූර්ණයෙන් ඉන්ධන ටැංකිය පිරවීමට ආයතනයට නොහැකිවන අතර අනුයුක්ත නිලධාරියා ද එසේ සිදුකරනු නොලබයි. 2026 වර්ෂයේදී වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට සැලසුම් කරනු ලබයි.	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.	කුලියට ගත් වාහන නොමැත	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදනසීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	ගැටළුව විසඳීමට පියවර ගෙන ඇත. කෙසේවෙතත් විවිධ ගැටළු හේතුවෙන් මෙතෙක් එය විසඳීමට නොහැකි වී තිබේ.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ.		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාරය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ.		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	-		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

ඡායාරූප එකතුව

අධිවේගී මාර්ග



මධ්‍යම අධිවේගී මාර්ගය අදියර I හි ඉදිකිරීම් කටයුතු සිදුකිරීම



මධ්‍යම අධිවේගී මාර්ගය අදියර III හි ඉදිකිරීම් කටයුතු සිදුකිරීම



කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - මාර්ග ඉදිකිරීමේ කටයුතු



කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - සමුද්‍රීය පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම

මහාමාර්ග



ගාල්ල-දෙනියාය-මාදම්පේ මාර්ගයේ සූරියකන්ද සිට රක්වාන දක්වා මාර්ග කොටස පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම 8වන වංගුව - (පැකේජය B)



බදුල්ල - වෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීම - ලුණුගල සිට යාල්කුඹුර දක්වා මාර්ග කොටස



අන්තර්ගතිකව සම්බන්ධිත මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - මාර්ග සලකුණු කිරීම - අනුරාධපුර දිස්ත්‍රික්කය (LK-RDA-251199-CW-LOT 01)



වල්ගම - දියගම මාර්ගය වැඩිදියුණු කිරීම (Ch. 6+485-6+960 LHS)



මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය (SFD II) - *කුරින්ඩන්කර්නි පාලම ඉදිකිරීම*



බදුල්ල - වෙන්කලාඩි මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, මංගලගම සිය මහඔය දක්වා වූ මාර්ග කොටස



(RR/GA/07/25/223) නිල්කඳුර තේ කර්මාන්තශාලාව අසලින් ගඟ දෙසට ඇති මාර්ගයේ කුට්ටි ගල් ඇතිරීම



ඕමන්ත හල්දොලහේන මාර්ග කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම

පාලම්



පාලම් 25ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය – පරන්තන්-කරච්චි-මුලතිව් මාර්ගයේ පාලම් අංක 53/1 ඉදිකිරීම



පාලම් 25ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය – කටුගස්තොට - කුරුණෑගල- පුත්තලම මාර්ගයේ පාලම් අංක 75/1 ඉදිකිරීම



ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 1/3 පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම OFID I



ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම - දඹේවෙල උඩපොළ මාර්ගය

ගුවන් පාලම්






බාලදක්ෂ මාවත හා සර් විත්තම්පලම් ඒ ගාඩිනර් මාවත යාකරමින් දුම්රිය මාර්ගය හරහා ඉදිකරන ලද ගුවන් පාලම





උත්තරානන්ද මාවත හා විනිසුරු අක්බාර් මාවත ගුවන් පාලම් ඉදිකිරීම





කොහුවල ගුවන් පාලම

ඇමුණුම්

ඇමුණුම - 01

2025 වර්ෂයේදී ප්‍රදානය කරන ලද ප්‍රසම්පාදනයන්			
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය (මහාමාර්ග අංශය)			
අං.	ප්‍රසම්පාදනයේ ස්වභාවය	අදාල ප්‍රසම්පාදන කමිටුව)	ප්‍රසම්පාදනය සඳහා ගිවිසගත් මුදල (බදුසහිත) රු.
1	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ වාවකච්චේරි සහ වඩමාරච්චි නැඟෙනහිර - මරුතන්කේණි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාමීය මාර්ග කිලෝමීටර 14.40 ක් ප්‍රතිසංස්කරණය කිරීම/වැඩිදියුණු කිරීම - LK-RDA-405500-CW-RFB – කොටස 01 (LOT 01)	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	608,068,451.28
2	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ තෙලිප්පලෙයි, උඩුවිල්, පේදුරුතුඩුව සහ කරවෙඩ්ඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 6.20 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම - LK-RDA-405500-CW-RFB – LOT 02	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	330,864,617.59
3	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - උතුරු පළාතේ කරච්චි සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ මුලතිව් දිස්ත්‍රික්කයේ මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිලෝමීටර් 17.00 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම - LK-RDA-405500-CW-RFB – LOT 03	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	730,501,644.00
4	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා - කුරින්චකර්නි පාරේ කුරිංචකර්නි පාලම ප්‍රතිසංස්කරණය කිරීම - කොන්. No.RDA/MFAP/ICB/SFD-2/12	අමාත්‍යා මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටු	1,044,051,106.25
5	පිළියන්දල - මහරගම මාර්ග කොටස(3+700km-5+700km) වැඩිදියුණු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම කොන්ත්‍රාත් අංකය: RDA/MFAP/ICB/OFID-2/08	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	880,468,419.65
6	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - උතුරු පළාතේ මුලතිව් දිස්ත්‍රික්කයේ පුත්තුකුඩුඉරිප්පු, මරිටයිම්පත්තු සහ මරිටයිම්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 13.90 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/වැඩිදියුණු කිරීම - LK-RDA-418325-CW-RFB – LOT 1	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	542,702,597.95
7	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - උතුරු පළාතේ මන්නාරම දිස්ත්‍රික්කයේ නානාද්දන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුසලි හි කිලෝමීටර 4.60 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම - LK-RDA-418325-CW-RFB – LOT 02	අමාත්‍යාංශ උපදේශන ප්‍රසම්පාදන කමිටු	209,609,493.55
8	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - උතුරු පළාතේ වවුනියාව දිස්ත්‍රික්කයේ වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර 8.9 ක් පුනරුත්ථාපනය කිරීම/ වැඩිදියුණු කිරීම - LK-RDA-418325-CW-RFB - LOT 03	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	317,127,002.54

අංකය	ප්‍රසම්පාදනයේ ස්වභාවය	අදාල ප්‍රසම්පාදන කමිටුව)	ප්‍රසම්පාදනය සඳහා ගිවිසගත් මුදල (බදුසහිත) රු.
9	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - උතුරු පළාතේ වවුනියාව දිස්ත්‍රික්කයේ වෙන්ගලවෙඩ්ඩිකුලම් සහ වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිලෝමීටර් 11.60 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරී LK-RDA-418325-CW-RFB – LOT 04	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	387,845,948.38
10	මහනුවර බහුමාධ්‍ය ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය (KMTTDP) - මහනුවර තැපැල් කාර්යාලය අසල KMTT පිවිසුමේ දුම්රිය මාර්ගයට ඉහළින් ගුවන් පාලමක් ඉදිකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවා	අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව	45,364,000.00
11	කොළඹ-ගාල්ල-හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ (A002) අංක 52/2 පාලම ප්‍රතිසංස්කරණය කිරීම	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	379,953,114.05
12	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ P ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 14.55 ක පුනරුත්ථාපන වැඩිදියුණු කිරීම LK-RDA-353946-CW-LOT 2	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	546,605,646.00
13	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව, පූජාපිටිය සහ තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 14.90 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය වැඩිදියුණු කිරීම LK-RDA-353946-CW-LOT 4	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	487,420,430.16
14	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - උතුරු පළාතේ වවුනියාව දිස්ත්‍රික්කයේ වෙන්ගලවෙඩ්ඩිකුලම් සහ වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිලෝමීටර් 11.60 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම LK-RDA-418325-CW-RFB – LOT 04	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	388,030,425.40
15	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිලෝමීටර් 17.5 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම LK-RDA-446907-CW-LOT1	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	441,306,524.29
16	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය -දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 11.90ක් පුනරුත්ථාපනය කිරීම/ වැඩිදියුණු කිරීම LK/RDA-353945-CW-LOT 2	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	357,269,263.56
17	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය -දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ පිටබැද්දර සහ මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 9.90ක් පුනරුත්ථාපනය කිරීම/ වැඩිදියුණු කිරීම - LK/RDA-353945-CW-LOT 3	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	343,347,067.15

අංකය	ප්‍රසම්පාදනයේ ස්වභාවය	අදාල ප්‍රසම්පාදන කමිටුව)	ප්‍රසම්පාදනය සඳහා ගිවිසගත් මුදල (බදුසහිත) රු.
18	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය -දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ අකුර්රාස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර 7.00ක් පුනරුත්ථාපනය කිරීම/ වැඩිදියුණු කිරීම - LK/RDA-353945-CW-LOT 4	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	331,514,022.00
19	දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම, වැලිපිටිය, තිහගොඩ, දික්වැල්ල සහ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කිලෝමීටර් 17.85 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම - LK/RDA-353945-CW-LOT 5	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	782,300,172.10
20	පුත්තලම - මාරවිවිකඩේ පාරේ (B379) පාලම අංක 9/2 ප්‍රතිසංස්කරණය කිරීම - RDA/DC/NWP/GOSL/2025/23	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	374,375,117.31
21	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - I (CEP-I) - මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ කඩවත පද්ධති අන්තර් හුවමාරුව සහ මීරිගම දෙසට මීටර් 500 මාර්ගය ඉදිකිරීම (කොටස -1 (පැකේජය 3)	ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව	8,692,383,547.66
22	පරන්තන්-කරච්චි-මුල්ලතිව් මාර්ගයේ (A035) අංක 50/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම.	ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව	1,379,565,626.71
23	දකුණු අධිවේගී මාර්ගයේ පළමු පැකේජය ඉදිකිරීමේ පුනරුත්ථාපනය, පාදම අසාර්ථක වීම නිවැරදි කිරීම සහ නැවත මතුපිට සකස් කිරීම (කිලෝමීටර් 19+000 සිට කිලෝමීටර් 34+000 දක්වා)	ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව	1,210,011,595.33
24	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය-III (CEP-III) - පොතුහැර සිට ගලගෙදර දක්වා) 32.450km) - CEP 3 ඉදිකිරීම් පැකේජය 1T (පරි.0+000km සිට 4+920km)	ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව	3,348,892,387.03
25	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය-III (CEP-III) - පොතුහැර සිට ගලගෙදර දක්වා)32.450km) - CEP 3 ඉදිකිරීම් පැකේජය 1U (පරිච්ඡේදය 4+920km සිට 9+900km දක්වා)	ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව	2,523,676,316.48
26	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය-III (CEP-III) - පොතුහැර සිට ගලගෙදර දක්වා)32.450km) - CEP 3 ඉදිකිරීම් පැකේජය 1V (පරිච්ඡේදය 9+900km සිට 13+800km දක්වා)	ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව	2,727,985,145.68
27	කන්දෙහෙනිස්ය - අධිකාරිගම-රන්දෙණිගල-ලොග්ගල්ඔය මාර්ගය (B492) කිලෝමීටර 7+000 සිට කිලෝමීටර 11+000 දක්වා (RDA/DC/CP/GOSL/2025/70) පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	458,174,339.45
28	බෙලිඅත්ත - කිරින්ද මාර්ගය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම 0+440 සිට 1+940km දක්වා, 2+300 සිට 3+840 දක්වා, 8+470 සිට 8+640 දක්වා) (B630) (RDA/DC/SP/GOSL/2025/45)	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	349,861,539.15


අංකය	ප්‍රසම්පාදනයේ ස්වභාවය	අදාල ප්‍රසම්පාදන කමිටුව)	ප්‍රසම්පාදනය සඳහා ගිවිසගත් මුදල (බදුසහිත) රු.
29	මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර, යටිනුවර, පස්බාගේකෝරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිලෝමීටර 11.30 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම (LK-RDA-500094-CW-LOT1)	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	568,441,894.32
30	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ සහ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිලෝමීටර 6.5 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම (LK-RDA-500094-CW-LOT1)	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	290,702,706.00
31	හැටන් මස්කෙළිය ඩෙල්හවුස් මාර්ගය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම (B149) කිලෝමීටර 17+930 සිට කිලෝමීටර 22+074 දක්වා (RDA/DC/CP/GOSL/2025/64	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	501,468,783.96
32	දක්ෂිණ අධිවේගී මාර්ගයේ පුනරුත්ථාපනය, පාදම බිඳවැටීම නිවැරදි කිරීම සහ නැවත මතුපිට සකස් කිරීම - පැකේජය 02 ඉදිකිරීම - (කිලෝමීටර 00+000 සිට කිලෝමීටර 19+000 දක්වා) RDA/EOM&M/SE/kott-Dod/Sur-Corr/2025/15	ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව	1,490,960,698.75
33	ඉහළ ගම්පොල මාර්ගය (AB 037) 0+000 සිට කිලෝමීටර 2+282 දක්වා පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම - RDA/DC/CP/GOSL/2025/48	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	411,677,586.90
34	නැගෙනහිර පළාතේ කිලෝමීටර 19.50 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම - ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (iRoad - 2) (සම්බන්ධතා අංකය: RDA/ADB/iROAD-2/OCB/EP/LOT/01)	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	838,342,819.67
35	පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම නැගෙනහිර පළාතේ කිලෝමීටර් 14.21 ක ග්‍රාමීය මාර්ග - ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (iRoad - 2) (සම්බන්ධතා අංකය: RDA/ADB/iROAD-2/OCB/EP/LOT/02)	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	865,946,288.81
36	නැගෙනහිර පළාතේ කිලෝමීටර් 11.10 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (iRoad - 2) (සම්බන්ධතා අංකය: RDA/ADB/iROAD-2/OCB/EP/LOT/03)	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	594,453,567.4
37	නැගෙනහිර පළාතේ කිලෝමීටර් 15.20 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (iRoad - 2) (සම්බන්ධතා අංකය: RDA/ADB/iROAD-2/OCB/EP/LOT/04)	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	626,349,629.95
38	නැගෙනහිර පළාතේ කිලෝමීටර් 13.50 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (iRoad - 2) (සම්බන්ධතා අංකය: RDA/ADB/iROAD-2/OCB/EP/LOT/05)	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	718,976,586.93

අංකය	ප්‍රසම්පාදනයේ ස්වභාවය	අදාල ප්‍රසම්පාදන කමිටුව)	ප්‍රසම්පාදනය සඳහා ගිවිසගත් මුදල (බදුසහිත) රු.
39	නැගෙනහිර පළාතේ කිලෝමීටර් 12.01 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම - ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (iRoad - 2) (සම්බන්ධතා අංකය: RDA/ADB/iROAD-2/OCB/EP/LOT/06)	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	594,938,478.20
40	ඒකල – කොටදෙනියාව – (B 111) මාර්ගය (21+000 – 27+000km) වැඩිදියුණු කිරීම කොන්ත්‍රාත් අංකය: RDA/DC/WP/GOSL/2025/76	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	436,159,587.98
41	මුරුන්කන් විලවතුරෙයි මාර්ගය (B299) 0+000 සිට කිලෝමීටර් 6+200 දක්වා වැඩිදියුණු කිරීම කොන්ත්‍රාත් අංකය: RDA/DC/NP/GOSL/2025/39	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	404,638,357.70
42	කටුගස්තොට-කුරුණෑගල-පුත්තලම මාර්ගය වැඩිදියුණු කිරීම (කිලෝමීටර් 16+320 - 19+175) RDA/DC/NWP/GOSL/2025/06	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	299,282,755.71
43	පිටකෝට්ටේ – තලවතුගොඩ මාර්ගය 0+000 සිට 4+230km දක්වා වැඩිදියුණු කිරීම (B368) කොන්ත්‍රාත් අංකය RDA/DC/WP/GOSL/2025/54	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	367,896,973.41
44	ඒකල-කොටදෙනියාව මාර්ගය (B111) (කිලෝමීටර් 3+400 සිට 9+000km දක්වා) වැඩිදියුණු කිරීම RDA/DC/WP/GOSL/2025/75	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	473,306,465.06
45	විලියම් ගොපල්ලව මාවත 2+900 -3+736km (ප්‍රමිතිය 4) සිට පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම RDA/DC/GOSL/2025/30	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	696,750,000.00
46	පස්සර - හිගුරුකඩුව - පල්වත්ත මාර්ගය (9+000 - 15-000)km RDA/DC/UVA/GOSL/2025/58 පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	392,003,071.16
47	බළන්ගොඩ - රාස්සගල - උවැල්ල මාර්ගයේ (B-603.) 5+000 සිට 10+000km දක්වා පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම RDA/DC/SAB/GOSL/2025/49	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	516,888,434.90
48	මහනුවර බහුමාධ්‍ය ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය (KMTTDP) - ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා යෝජිත සත් මහල් නේවාසික ගොඩනැගිල්ල ඉදිකිරීම මහනුවර - RDA/GOSL/KMTT/LCB/7S/W/01	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	1,802,848,328.19
49	විලියම් ගොපල්ලව මාවත පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම (ප්‍රමිති 4 මංතීරු CH.2+900 - 3+736km - RDA/DC/CP/GOSL/2025/30)	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	696,750,000.00
50	0+650km සිට 0650km දක්වා පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම - අවිස්සාවේල්ල-හැටන් -නුවරඑළිය මාර්ගය (AA007) - RDA/DC/SAB/GOSL/2025/74	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	489,339,889.40

අංකය	ප්‍රසම්පාදනයේ ස්වභාවය	අදාල ප්‍රසම්පාදන කමිටුව)	ප්‍රසම්පාදනය සඳහා ගිවිසගත් මුදල (බදුසහිත) රු.
51	ධර්මරාජ හන්දියේ සිට අම්පිටිය පාර හන්දිය දක්වා ලුවී පීරිස් මාවත (B551) මහනුවර පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම 0+000 - 0654km දක්වා - 0654km දක්වා - RDA/DC/CP/GOSL/2025/33	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	539,055,393.83
52	මාතලේ ඉලුක්කුඹුර ලග්ගල මාර්ගය (B274) 18+000 සිට 25+000km දක්වා පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම - RDA/DC/CP/GOSL/2025/71	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	545,903,121.50
53	අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කොටපොල සහ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ග්‍රාමීය මාර්ග කිලෝමීටර 13.90ක් පුනරුත්ථාපනය කිරීම/ වැඩිදියුණු කිරීම - LK-RDA-506887-CW-LOT1	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු	638,664,192.96
එකතුව			**46,021,021,173.39**

ඇමුණුම 02

ශ්‍රී ලංකාවේ නිමකරන ලද හා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අධිවේගී මාර්ග ජාලය




ඇමුණුම 03

3 (අ) අධිවේගී මාර්ගයන්හි මාසික රථවාහන ධාරිතාව

මාසය	රථවාහන ගමනාගමන ධාරිතාවය - 2025				
	දක්ෂිණ අධිවේගී මාර්ගය	දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව	පිටත වටරවුම් අධිවේගී මාර්ගය	කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය	මධ්‍යම අධිවේගී මාර්ගය - අදියර II
ජනවාරි	1,144,145	286,891	1,235,407	1,159,777	429,622
පෙබරවාරි	1,030,728	256,989	1,112,704	1,018,482	390,721
මාර්තු	1,150,326	283,635	1,255,994	1,075,841	436,994
අප්‍රේල්	1,154,695	313,719	1,207,626	1,022,240	464,670
මැයි	1,126,201	275,640	1,229,566	1,059,785	447,425
ජූනි	1,096,398	268,874	1,225,534	1,056,907	453,287
ජූලි	1,173,853	292,658	1,309,045	1,172,419	480,577
අගොස්තු	1,260,377	325,707	1,360,572	1,191,192	523,541
සැප්තැම්බර්	1,137,522	286,062	1,279,647	1,120,659	459,685
ඔක්තෝබර්	1,186,013	293,929	1,338,200	1,142,719	467,476
නොවැම්බර්	1,055,908	265,537	1,148,967	999,703	427,033
දෙසැම්බර්	1,255,849	328,072	1,251,264	1,182,830	486,648
එකතුව	**13,772,015**	**3,477,713**	**14,954,526**	**13,202,554**	**5,467,679**


3 (ආ) අධිවේගී මාර්ගයන්හි මාසික රථවාහන ධාරිතාවෙහි ප්‍රස්ථාරික නිරූපණය



3(ඇ) – අධිවේගී මාර්ගයන්හි මාසික ආදායම

මාසය	අධිවේගී මාර්ගයන්හි මාසික ආදායම (රු.මි)				
	දක්ෂිණ අධිවේගී මාර්ගය	දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව	පිටත වටරවුම් අධිවේගී මාර්ගය	කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය	මධ්‍යම අධිවේගී මාර්ගය - අදියර II
ජනවාරි	422.93	162.65	360.87	344.18	122.84
පෙබරවාරි	383.28	147.51	327.24	306.22	112.93
මාර්තු	422.57	163.52	367.95	330.42	126.60
අප්‍රේල්	426.57	176.68	356.31	310.80	133.07
මැයි	403.82	155.00	351.31	323.81	127.99
ජූනි	392.30	150.33	349.93	324.08	130.05
ජූලි	423.16	161.36	374.65	353.93	137.92
අගොස්තු	462.77	178.98	400.86	368.00	152.06
සැප්තැම්බර්	415.74	157.51	370.73	340.91	133.66
ඔක්තෝබර්	427.29	156.26	384.08	348.89	135.13
නොවැම්බර්	404.26	146.09	355.41	319.79	129.30
දෙසැම්බර්	455.22	165.19	357.58	377.59	138.91
එකතුව	**5,039.95**	**1,921.11**	**4,356.94**	**4,048.64**	**1,580.47**


3(ඈ) – අධිවේගී මාර්ගයන්හි මාසික ආදායමෙහි ප්‍රස්ථාරික නිරූපණය



ඇමුණුම–04

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය


(අ) අදියර I: කඩවත සිට මීරිගම දක්වා




(ආ)අදියර II: මීරිගම සිට කුරුණෑගල දක්වා කොටස (අඹේපුස්ස සමඟ)



(ඇ) අදියර III: පොතුහැර සිට ගලගෙදර දක්වා




(ඇ) අදියර IV: කුරුණෑගල සිට දඹුල්ල දක්වා කොටස



ඇමුණුම 05

ශ්‍රී ලංකාවේ නිමකරන ලද හා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ග ව්‍යාපෘති



ඇමුණුම 06

අන්තර්ගතිකව සම්බන්ධිත මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වැඩිදියුණු කරන ලද මාර්ගයන්හි ප්‍රගතිය

දිස්ත්‍රික්කය	පැකේජ ගණන	දුර (කි.මී)		වර්තමාන තත්ත්වය
රත්නපුර	04	76.608	100%	මාර්ග කටයුතු අවසන් කර අයිතිකරුවන් වෙත භාර දී ඇත.
මාතලේ	04	88.873	100%	මාර්ග කටයුතු අවසන් කර අයිතිකරුවන් වෙත භාර දී ඇත
අනුරාධපුර	04	83.432	100%	මාර්ග කටයුතු අවසන් කර අයිතිකරුවන් වෙත භාර දී ඇත
කුරුණෑගල	04	111.34	83.78%	මාර්ග කි.මී.80ක වැඩ අවසන් කර ඇති අතර ඉතිරි වැඩ ක්‍රියාත්මක වෙමින් පවති
මොණරාගල	03	43.703	100%	මාර්ග කි.මී.42ක වැඩ අවසන් කර ඇති අතර ඉතිරි වැඩ ක්‍රියාත්මක වෙමින් පවති
පුත්තලම	03	53.132	100%	මාර්ග කි.මී.37ක වැඩ අවසන් කර ඇති අතර ඉතිරි වැඩ ක්‍රියාත්මක වෙමින් පවති
හම්බන්තොට	05	91.28	99.72%	මාර්ග කි.මී.35ක වැඩ අවසන් කර ඇති අතර ඉතිරි වැඩ ක්‍රියාත්මක වෙමින් පවති
කළුතර	01	20.16	100%	මාර්ග කි.මී.5ක වැඩ අවසන් කර ඇති අතර ඉතිරි වැඩ ක්‍රියාත්මක වෙමින් පවති
මඩකලපුව	07	85.771	89.75%	මූලික සමීක්ෂණ කටයුතු සහ ස්ථානීය පරීක්ෂාව, ස්ථානීය පිරිසිදු කිරීම් කටයුතු සහ කැණීම් කටයුතු සිදු කරමින් පවති
පොළොන්නරුව	03	51.05	89.80%	
කොළඹ	05	70.369	54.05%	
ගාල්ල	04	56.113	73.71%	
වවුනියාව	02	20.5	27.01%	
යාපනය	02	26.56	76.08%	
කිලිනොච්චිය	01	16.97	44.90%	
මන්නාරම	01	4.6	30.88%	ලංසු ඇගයීම් කටයුතු සිදු කරමින් පවති
මුලතිව්	01	13.9	28.55%	
මහනුවර	04	47.35	7.24%	ලංසු කැඳවා ඇති අතර ලංසු භාර ගන්නා අවසන් දිනය 31.01.2025
මාතර	04	59.65	4.12%	ලංසු කැඳවීම සඳහා සූදානම් කර ඇත.

අන්තර්ගතිකව සම්බන්ධිත මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) යටතේ දුර්වල පාලම් වැඩිදියුණු කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රගතිය.

විස්තරය	පාලම් ගණන	වර්තමාන තත්ත්වය	
කොළඹ-ගාල්ල-හම්බන්තොට-වැල්ලවාය මාර්ගයේ (A002) (LK-RDA-462585-CW) අංක 52/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම සහ අංක 52/2 බෝක්කුව ඉදිකිරීම.	1	44%	කටයුතු සිදුවෙමින් පවතී
උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ (LK-RDA-474042-CW-LOT 1) යාපනය - මනිපායි - කරෙයිනගර් පාරේ (AB017) පාලම අංක 27/1 ප්‍රතිසංස්කරණය කිරීම	1	30%	
උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ යාපනය - පොන්නලාල් - පේදුරුතුඩුව මාර්ගයේ (AB021) අංක 51/1,53/1 සහ 55/2 පාලම් ප්‍රතිසංස්කරණය කිරීම (LK-RDA-474042-CW-LOT2)	3	5%	
උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ තොණ්ඩයිමමාරු වල්ලෙයි තුන්නාල් පාරේ අංක 4/1 පාලම සහ චාවකච්චිරි-පුලොලි පාරේ අංක 14/2 පාලම ප්‍රතිසංස්කරණය කිරීම (LK-RDA-474042-CW-LOT3)	2	20%	
බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ඒකල කොටදෙණියාව මාර්ගයේ අංක 4/2 පාලම ප්‍රතිසංස්කරණය කිරීම (LK-RDA-489537-CW-LOT1)	1	1%	බලමුලු ගැන්වීම, සමූහ මධ්‍යස්ථාන පිහිටුවීම සහ උපයෝගිතා මාරු කිරීමේ කටයුතු සඳහා මූලික පරීක්ෂාව සිදු වෙමින් පවතී
බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ දූනගහ නිල්පනාගොඩ පාරේ අංක 1/2 පාලම සහ මීගමුව ගිරිඋල්ල පාරේ අංක 17/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම (LK-RDA-474051-CW-LOT 1)	2	0%	
පාලම ප්‍රතිසංස්කරණය කිරීම අංක. 11/2 සහ පාලම් නො. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වැලිවාරිය - කිරිදිවැල පාරේ (b 472) 11/3. (LK-RDA- 474051-CW-LOT 2)	2	-	2025.12.10 දින කැමැත්ත පලකිරීමේ ලිපි නිකුත් කරන ලදී.
බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ උඩුගම්පොළ - දිවුලපිටිය මාර්ගයේ (ආ- 430) අංක 11/3 පාලම සහ මීගමුව - මීරිගම මාර්ගයේ (ආ- 324) අංක 25/6 පාලම ප්‍රතිසංස්කරණය කිරීම. (LK-RDA - 462606-CW-LOT 1)	2	-	ආරම්භ කරන ලදි
දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර - උහරගහ - ඇල්පිටිය මාර්ගයේ (ආ- 055) අංක 24/3 දරන පාලම ප්‍රතිසංස්කරණය කිරීම. (LK-RDA - 474056-CW-LOT 1)	1	-	
පාලම ප්‍රතිසංස්කරණය කිරීම අංක. 52/12 මරදන්කඩවල - හබරණ - තිරුක්කොන්ඩිමඩු මාර්ගයේ (a- 001) පොලොන්නරුව දිස්ත්‍රික්කය, උතුරු මැද පළාත. .(LK-RDA - 510180-CW-LOT 3)	1	-	

ඇමුණුම 07

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ආර්ඒඑව්/ඒ/එම්ඔටීඑච්/එෆ්ඒ/02/25/13 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 ජූනි 30 දින

01 JUL 2026

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ශීර්ෂය 117 - ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ශීර්ෂය 117 - ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම' උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

(අ) මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

(ආ) 2024 වර්ෂයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ලෙස පැවති මෙම අමාත්‍යාංශයට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024 නොවැම්බර් 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර අංක 2412/08 අනුව වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයද අනුයුක්ත කිරීම නිසා ඉහත වැය ශීර්ෂය සඳහා 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය ලෙස පිළියෙල කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශණවල 2024 සහ 2025 වර්ෂවල ශේෂයන් අනුරූපී වී නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති ආරම්භයේදී කොන්ත්‍රාත්කරුවන්ට ලබාදී තිබූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වටිනාකම අමාත්‍යාංශය විසින් අදාල වැය ශීර්ෂවල වියදම් ලෙස වාර්තා කර තිබුණද 2025 දෙසැම්බර් 31 දිනට පහත ව්‍යාපෘතිවල තවදුරටත් අයකර ගතයුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වටිනාකම රු.මිලියන 45,477.14 ක් විය.

ව්‍යාපෘතිය	**2025** දෙසැම්බර් **31** දිනට අයකර ගැනීමට ඇති වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වටිනාකම
	රු.මිලියන
ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන	2,892.72
දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන	4,399.13
මධ්‍යම අධිවේගී මාර්ගය- 01 කොටස	38,185.29

එකතුව	45,477.14

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ

ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

(අ) වාර්ෂික අයවැය ලේඛණය මඟින් 2023 වර්ෂය දක්වා වැය ශීර්ෂ 117 වැඩසටහන් අංක 02 සංවර්ධන වැඩසටහන , ආයතනික සහාය (08) මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා දායකත්වය-මූල්‍ය ආයතන (117-2-08-001-2201) යටතේ මාර්ග සංවර්ධන අධිකාරියේ සේවක වැටුප් හා පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණි. 2025 වර්ෂය සඳහා වූ 2025 අංක 03 දරන විසර්ජන පනත මඟින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. වැඩසටහන් අංක 02 සංවර්ධන වැඩසටහන , ව්‍යාපෘති අංක 04 මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ උප ව්‍යාපෘති අංක 001 මාර්ග නඩත්තුව සහ වැඩි දියුණු කිරීම වැය විෂය අංක 2001 හා 2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා සලසා තිබූ රු.මිලියන 31,135 ක ප්‍රතිපාදනයෙන් 2025 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 25,735.40 ක වියදමක් දරා තිබුණු අතර, ඉන් රු.මිලියන 11,500 ක් එනම් සියයට 45 ක් මාර්ග සංවර්ධන අධිකාරියේ වැටුප් හා චේතන වෙනුවෙන් දරා තිබුණි.

වැය විෂය	වැය විස්තරය	2025 දෙසැම්බර් 31 දිනට මුළු වියදම	2025 දෙසැම්බර් 31 දිනට වැටුප් හා චේතන සඳහා දරන ලද වියදම
		රු.මිලියන	රු.මිලියන
117-2-04-001-2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	11,323.53	3,795
117-2-04-001-2104	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	14,411.87	7,705
එකතුව		25,735.40	11,500

මේ අනුව 2025 අංක 3 දරන විසර්ජන පනත මඟින් 2025 වර්ෂය සඳහා වියදම් දැරීමට අනුමත කර තිබූ අරමුණු නොසලකා මූලධන ප්‍රතිපාදන මඟින් පුනරාවර්තන ස්වභාවයේ වියදමක් වන වැටුප් හා වේතන ගෙවීම් සිදු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන සලසා තිබුණි. මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වැය ශීර්ෂ 117 වැඩසටහන් අංක 02 සංවර්ධන වැඩසටහන , ව්‍යාපෘති අංක 04 මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ උප ව්‍යාපෘති අංක 001 මාර්ග නඩත්තුව සහ වැඩි දියුණු කිරීම වැය විෂය අංක 2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ 2025 වර්ෂය තුල ගොඩනැගිලි හා ඉදිකිරීම් වත්කම් අත්පත්කර ගැනීම් ලෙස රු.මිලියන 14,411.87 ක් ගිණුම්ගතකර තිබූ අතර, ඒ තුල මාර්ග සංවර්ධන අධිකාරියේ වැටුප් හා වේතන ලෙස ගෙවන ලද රු.මිලියන 7,705 ක පුනරාවර්තන වියදම් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියේ බැඳීම් වල මූල්‍ය පරතරය පියවීම (117-2-04-051-2506)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ අනුව වැඩසටහන් අංක 02 සංවර්ධන වැඩසටහන , ව්‍යාපෘති අංක 04 මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ උප ව්‍යාපෘති අංක 051 මාර්ග සංවර්ධන අධිකාරියේ බැඳීම් වල මූල්‍ය පරතරය පියවීම යටතේ සලසා තිබූ රු.මිලියන 162,832.65 ප්‍රතිපාදනයෙන් ප්‍රවර්තන වර්ෂය තුල රු.මිලියන 162,568.06 ක් වැය කල බව වාර්තා කර තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘති සඳහා වර්ෂ 2011 සිට 2021 දක්වා බැංකු වලින් සෘජුව ලබාගත් ණය සඳහා වාරික හා පොළි ලෙස පහත දැක්වෙන පරිදි ගෙවීම් කර තිබුණි.

ණය පහසුකම ලබාගත් මූල්‍ය ආයතනය	**2025** වර්ෂය තුල ගෙවා තිබූ ණය වාරික හා පොළී මුදල (රු.මිලියන)
.....	.....
ලංකා බැංකුව	34,855.66
ජාතික ඉතිරිකිරීම් බැංකුව	58,297.02
මහජන බැංකුව	28,894.19
කොමර්ෂල් බැංකුව	5,497.18
HNB බැංකුව	23,313.57
NDB බැංකුව	7,338.67
DFCC බැංකුව	1,952.49
සම්පත් බැංකුව	2,419.28
	162,568.06

මේසම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ලබාගත් ණය මුදල, ණය ලබාගත් දිනය, පොළී අනුපාතය හා තව දුරටත් ගෙවීමට ඇති ණය මුදල ආදි තොරතුරු හෙළිදරවු කර නොතිබුණි.

(ඇ) මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය ඉදිකිරීම-ගොඩනැඟිලි සහ ඉදිකිරීම -විදේශ ණය (117-2-4-60 -2104 -12) යටතේ අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට වියදම රු.මිලියන 4,170.88 ක් වුවද එම ව්‍යාපෘතිය මගින් 2025 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන අනුව වියදම රු.මිලියන 4,205.98 ක් විය. ඒ අනුව රු.මිලිනය 35.10 ක් වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ 2025 දෙසැම්බර් 31 දිනට වියදම් ප්‍රකාශය (ACA – 2 (ii)) අනුව ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක් වෙනුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදන වටිනාකම පිළිවෙලින් රු.මිලියන 1,250 ක් හා ශූන්‍ය අගයක් දක්වා තිබුණද භාණ්ඩාගාර පිටපත් අනුව එම වටිනාකම් පිළිවෙලින් රු. මිලියන 1,944.51 ක් හා රු. මිලියන 400 ක් වූයෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදන වටිනාකම පිළිවෙලින් රු. මිලියන 694.51 ක් හා රු.මිලියන 400 ක වෙනසක් පැවතුණි. තවද එක් ප්‍රාග්ධන වැය විෂයක් සඳහා තත්‍ය වියදම අමාත්‍යාංශයේ වියදම් ප්‍රකාශය (ACA – 2 (ii)) අනුව දක්වා නොතිබුණු අතර භාණ්ඩාගාර පිටපත් අනුව එය රු. මිලියන 1,524.01 ක් විය.

(ඉ) භාණ්ඩාගාර පිටපත් අනුව 117-2-29-6-2104 දරන වැය විෂයය සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,225 ක් විය. එසේ වුවද 117-2-29-2-2302 දරන වැය විෂයයට අදාළ ශුද්ධ ප්‍රතිපාදනය වන රු.මිලියන 230 ක් මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී 117-2-29-6-2104 දරන වැය විෂයය තුල වරදවා දැක්වීම හේතුවෙන් වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ ACA – 2 (ii) ප්‍රකාශනය අනුව 117-2-29-6-2104 දරන වැය විෂයය සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදන ලෙස රු.මිලියන 3,455 ක් දක්වා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 (SLPSAS7) ට අනුව වත්කමක් වශයෙන් ගිණුම්ගත කිරීම සඳහා, වත්කම හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒම, පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි වීම යන නිර්ණායක සපුරාලිය යුතු වුවද, ත්‍රිරෝද රථ පරිවර්තන ව්‍යාපාතිය ක්‍රියාත්මක කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ප්‍රදානයක් වශයෙන් ලැබී මෙරටට ආනයනය කරන ලද භෞතිකව අමාත්‍යාංශය සතුව නොපැවතියදී උපකරණවල වටිනාකම අමාත්‍යාංශයේ වත්කම් ගිණුමෙහි අනාවරණය කිරීමකින් ඊට අදාලව දරන ලද රු.මිලියන 16.76 ක බදු මුදල් හා ප්‍රමාද ගාස්තු පමණක් වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.6.2 අත්තිකාරම් ගෙවීම්

වර්ෂ 2004 සිට 2025 කාලසීමාව තුළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් සභා ආයතන අතර ස්ථාන මාරුවීම් ලබාගිය නිලධාරීන්ගෙන්, මිය ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනමට ලක්වූ සහ සේවය අතහැර ගොස් තිබුණු නිලධාරීන් 15 දෙනෙකුගෙන් 2025 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.මිලියන **3.09** ක ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

1.6.3 වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්

(අ) 2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 7.7 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මුදල් හා හරස් සටහන් යොදාගත යුතු බව දක්වා තිබුණද වරාය සහ සිවිල් ගුවන් සේවා අංශය විසින් සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී අත්තිකාරම් ගෙවීම් ලෙස දක්වා තිබූ රු.මිලියන 69.7 ක වටිනාකම් තුළ රු. මිලියන 15.29 ගැලපුම්ද ඇතුළත්ව තිබුණි.

(ආ) වරාය සහ සිවිල් ගුවන් සේවා අංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී අත්තිකාරම් ගෙවීම් ලෙස රු. මිලියන 69.7 ක් සටහන් කර තිබුණද ඒසිඒ-5 ආකෘතිය අනුව එම වටිනාකම රු. මිලියන 68.31 ක් වූයෙන් රු. මිලියන 1.39 ක වෙනසක් පැවතුණි.

1.6.4 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

අමාත්‍යාංශයේ 2025 දෙසම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම ගැලපුම් ප්‍රකාශයෙහි අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් සිදු කරන ලද වියදම රු.මිලියන 1,007.80 ක් විය. ඒ සඳහා ඉදිරිපත් කර ඇති උප ලේඛණයෙහි වැය විෂයය අංක 020-1-01-007-1409-11 (මැතිවරණ කොමිෂන් සභාව) වෙනුවෙන් අමාත්‍යාංශය විසින් සිදු කළ ශුද්ධ වියදම රු.මිලියන 1.47 ක් මහහැරී තිබුණි.

1.6.5 මූල්‍ය නොවන වත්කම්

(අ) 2024 වර්ෂය තුළ මූලධන වියදම් ලෙස වැයකර තිබුණු රු.මිලියන 8,648.82 කට අදාල මූල්‍ය නොවන වත්කම් එම වර්ෂය අවසානයේ හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. 2025 වර්ෂය සඳහා පිළියෙල කර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයෙහි මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය - 2025 (ඒසිඒ-6) තුළ ආරම්භක ශේෂයට එකතුකිරීම් (Opening Balance Addition) ලෙස නොනිමි වැඩ-ගොඩනැගිලි හා ඉදිකිරීම් (කේත අංක 9160-1.4) යටතේ රු.මිලියන 27.92 ක්ද ප්‍රවාහන උපකරණ (කේත අංක 9152 – 2.1) යටතේ රු.මිලියන 16.76 ක්ද වෙනත් යන්ත්‍ර හා උපකරණ(කේත අංක 9152 – 2.2) යටතේ රු.මිලියන 5.93 ක්ද ඉඩම් (කේත අංක 9153 - 4.1) යටතේ රු.මිලියන 1,498.99 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 1,549.60 ක ශේෂයක් පමණක් ඇතුළත් කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් පෙර වර්ෂයේ දරන ලද මූලධන වියදම් ගිණුම්ගත කිරීම අවසන් කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2013 ජූලි 12 දිනැති අංක එස්ඒ/ඒඑස්/ඒඒ/චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ වැය විෂය අංක 2101 (වාහන), 2102 (ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ), 2103 (යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ), 2104 (ගොඩනැගිලි සහ ඉදිකිරීම්), 2105 (ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්), 2106 (මෘදුකාංග සංවර්ධනය) හා 2506 (යටිතල පහසුකම් සංවර්ධනය) යටතේ එකතුව රු.මිලියන 347,749.79 ක් අමාත්‍යාංශය විසින් දේශීය හා විදේශීය මූල්‍යනයන් මඟින් වැය කර තිබුණද, 2025 වර්ෂයේ වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ රු. මිලියන 71.85 ක් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2026 ජනවාරි 28 දිනැති අංක MOH/09/2026 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව 2025 නොවැම්බර් මස ඇති වූ දිට්වා සුළිකුණාටුව නිසා හානියට පත් ජාතික මාර්ග කොටස් ප්‍රමාණය 437ක් වූ සහ හානියට පත් පාලම් ගණන 33 ක් බව දක්වා තිබුණි. මෙම හානියට පත් මාර්ග කොටස් හා පාලම් යථාතත්වයට පත්කිරීමට පිළිවෙලින් රු.මිලියන 64,500 ක් හා රු.මිලියන 13,800 ක් ඇස්තමේන්තු කර තිබුණි. නමුත් මේ පිළිබඳ 2025 දෙසම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්හි කිසිදු හෙලිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

(ඈ) මහා මාර්ග අංශයේ වත්කම් ලේඛණයේ හා 2025 දෙසැම්බර් 31 දිනට ඒසීඒ - 6 - මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ සඳහන් සිගාස් වැඩසටහනේ වත්කම් ලේඛණයන්හි සඳහන් වත්කම් කේත අංක අමාත්‍යාංශය විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීමේදී උපයෝගී කර ගැනීමකින් තොරව අදාල සමීක්ෂණ කටයුතු සිදු කර තිබුණු බැවින් 2025 දෙසැම්බර් 31 දිනට ඒසීඒ - 6 - මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ සඳහන් රු.මිලියන 5,206.88 ක වාහන, වෙනත් යන්ත්‍ර හා උපකරණ නිවැරදිව සත්‍යාපනය කර ඇති බව තහවුරු නොවිය.

(ඉ) ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මහා මාර්ග අංශයට අදාල වාහන සම්බන්ධ තොරතුරු විමසීමට අදාලව ඉදිරිපත් කර තිබූ 2026 මැයි 08 දිනැති අංක MOH/HWY/ADM-19/AUDIT/2020(iii) දරන ලිපිය ප්‍රකාරව වාහන 06ක් අමාත්‍යාංශය නමින් ලියාපදිංචි අයිතිය පවතින බව සඳහන් වුවද, එම වාහන වත්කම් ලේඛණය තුළ ඇතුළත් කර නොතිබුණි.

(ඊ) මහා මාර්ග අංශයට අදාල වාහන සම්බන්ධ තොරතුරු විමසීමට අදාලව ඉදිරිපත් කර තිබූ 2026 මැයි 08 දිනැති අංක MOH/HWY/ADM/-19/AUDIT/2020(iii) දරන ලිපිය ප්‍රකාරව වාහන 04ක් 2025 වර්ෂයේ වෙනත් ආයතන වෙත පවරා තිබුණද, 2025 දෙසැම්බර් 31 දිනට වත්කම් ලේඛණයෙන් ඉවත් කර නොතිබුණි.

(උ) 2025 අප්‍රේල් 07 දින සහ 2025 අප්‍රේල් 16 දින අපහරණය කරන ලද අමාත්‍යාංශයේ මහාමාර්ග අංශයට අයත් වාහන 02ක් 2025 දෙසැම්බර් 31 දිනට වත්කම් ලේඛණයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට ඒසීඒ - 6 - මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ සඳහන් ප්‍රවාහන උපකරණ වටිනාකම රු.මිලියන 4,657.66 ක් වූ අතර ඉන් මහාමාර්ග අංශයේ ප්‍රවාහන උපකරණ වටිනාකම වත්කම් ලේඛණය අනුව රු.මිලියන 501.2 කි. අපහරණය කරන ලද වාහන 02 ක පොත් අගය රු.මිලියන 30 ක් හා වර්ෂයේ වෙනත් ආයතන වෙත පවරා තිබුණු වාහන 04 ක පොත් අගය රු.මිලියන 31.9 ක් වශයෙන් එකතුව රු.මිලියන 61.9 ක් මූල්‍ය ප්‍රකාශනයන්හි ඒසීඒ - 6 - මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ අපහරණයන් යටතේ දක්වා නොතිබුණි. එමෙන්ම අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය තුල පවරාගෙන තිබූ තක්සේරු වටිනාකම රු.මිලියන 103 ක් වූ වාහන 06 ක වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගතකර නොතිබුණි.

(එ) අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි අයිතිය හා භෞතික පැවැත්ම පවතින Nissan Shylphy වර්ගයේ කාර් රථයක් මහාමාර්ග අංශයේ වත්කම් ලේඛණය අනුව ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින බව සඳහන් කර තිබුණි.

(ඒ) ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් තුළ වාර්තා කර තිබුණු මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලට අයත් වත්කම් එම ව්‍යාපෘති අවසන් කිරීමෙන් පසු මාර්ග සංවර්ධන

අධිකාරිය වෙත පවරා දීමේදී CIGAS පද්ධතිය මඟින් වාර්තා කිරීම සිදු කළද, එම වත්කම් පවරාදීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටීන් (Handing over Procedures) හා ඒ සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් අමාත්‍යාංශය සතුව නොපවතින බව විගණනයට නිරීක්ෂණය වූ අතර 2025 දෙසැම්බර් 31 දිනට එසේ පවරා දෙන ලද වත්කම් සම්බන්ධ තොරතුරු ඇතුළත් ලිපිගොනුවක් හෝ ලේඛණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඔ) මහාමාර්ග අංශයේ 2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පරීක්ෂා කිරීමේදී පහත කරුණු අනාවරණය විය.

I. 2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්ථාවේ ආයතන ශාඛාවේ අයිතම 07 ක හා ගිණුම් ශාඛාවේ අයිතම 02 කට අදාල ලැජරය අනුව ශේෂය ද, ගිණුම් ශාඛාවේ අයිතම 03 ක තත්‍ය ශේෂයද සඳහන් කර නොතිබුණි. එම නිසා එම අයිතමයන්ට අදාළ ඌනතාවයන් හෝ අතිරික්තයන් අනාවරනය වී නොතිබුණි.

II. මහාමාර්ග අංශයේ 2025 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ලැජරය අනුව ශේෂය හා තත්‍ය ශේෂය අනුව ගිණුම් ශාඛාවේ අයිතම 12 ක්, සංවර්ධන ශාඛාවේ අයිතම 10 ක්, සහකාර ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ එක් අයිතමයකද සහ අමාත්‍ය කාර්යාලයේ අයිතම 06 ක් ඌනතා සහ අතිරික්ත පැවතිය ද එම ඌනතා හෝ අතිරික්ත සඳහන් කර නොතිබුණි.

(ඕ) මුල්‍ය නොවන වත්කම් අපහරණය කිරීමේදී සිගාස් පරිශීලක අත්පොතෙහි 27.6 ප්‍රකාරව සිගාස් පද්ධතිය තුළ අදාළ වත්කම් අපහරණය සිදු කළ යුතු වුවද, අමාත්‍යාංශයේ වරාය හා සිවිල් ගුවන් සේවා අංශය විසින් අපහරණය කරන ලද වාහනවල විස්තර විගණිත දිනය වූ 2025 නොවැම්බර් වන විටත් සිගාස් පද්ධතිය තුළ යාවත්කාලීන කර නොතිබුණි.

1.6.6 මූල්‍ය වත්කම්

2025 දෙසැම්බර් 31 දිනට වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු ආපදා ණය වටිනාකම සාමාජික ණය ලේඛනය (CC 10 ලේඛනය) අනුව රු. මිලියන 0.63 ක් වුවද අත්තිකාරම් "බී" ගිණුම අනුව ශේෂය රු. මිලියන 0.60 ක් වූයෙන් රු. මිලියන 0.03 ක වෙනසක් පැවතුණි. තවද 2014 වර්ෂයේ වැඩ තහනම් කරන ලද නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. මිලියන 0.29 ක ආපදා ණය ශේෂය 2025 දෙසැම්බර් 31 දින වන විට වසර 21 ක් ගත වී තිබුණද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.6.7 දේපළ පිරියත හා උපකරණ සංචිතය

අමාත්‍යාංශයේ වත්කම් වාර්තා කිරීමේ පදනම අනුව වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගන්නා බව සඳහන් වුවද අතරමගදී අතහැර දමා තිබූ කොළඹ - රත්නපුර - පැල්මඩුල්ල අධිවේගී මාර්ග ව්‍යාපෘතිය, නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කුළුණු මත ඉදිකෙරෙන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය, මධ්‍යම අධිවේගී මාර්ගය - **04** කොටස - කුරුණෑගල සිට දඹුල්ල ව්‍යාපෘතිය සහ බෙස්ලයින් මාර්ගයේ තෙවන අදියර ව්‍යාපෘතිය සඳහා පිලිවෙලින් රුපියල් මිලියන 6,638.38ක්, 2454.99ක්, 2,622.99ක් හා 3,334.28ක් ලෙස සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සිදු කරන ලද රු.මිලියන 15,050.62 ක් වූ සමස්ථ වියදම ඉඩම් (කේත අංක 9152-4.1) යටතේ ප්‍රාග්ධනීත කර, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබුණි.

1.6.8 තැන්පතු ගිණුම් ශේෂ

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 අනුව ඉකුත් වූ සියළුම තැන්පතු අදාළ ක්‍රියාපටිපාටීන් අනුගමනය කිරීමෙන් පසු රාජ්‍ය ආදායමට බැර කල යුතු වුවත් 2025 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය යටතේ වූ තැන්පතු ගිණුම් 04 ක පවතින වර්ෂ 02 ක ඉක්ම වූ රු.මිලියන 427.24 ක තැන්පතු ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මු.රෙ. 427 ප්‍රකාරව එක් එක් මාසය සඳහා වන සම්පූර්ණ වියදම, එකී දෙපාර්තමේන්තු විසින් අදාළ මාසය යටතේ අනුරූප භාණ්ඩාගාර පොත් වල දැක්වෙන ගණන් සමඟ නොකඩවා සැසඳිය යුතු වුවත්, වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ පොදු තැන්පත් ගිණුමේ මාසිකව ඉදිරියට ගෙන යන ලද ශේෂය දක්වමින් මාසිකව තුලනය කොට නොතිබුණු අතර වර්ෂය අවසානයේ දී පොදු තැන්පත් ගිණුම තුලනය කොට ශේෂය දක්වා නොතිබුණි.

1.6.9 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) 2025 ඔක්තෝබර් 03 දිනැති අංක RAH/A/MOTH/2025/38 දරන ලිපිය මගින් විගණනය විසින් මහා මාර්ග අංශයේ උප ව්‍යාපෘති 178 ක් සම්බන්ධයෙන් විමසන ලද ලිපියට පිලිතුරු වශයෙන් 2025 ඔක්තෝබර් 13 දිනැති අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) ගේ අංක MPH/HWY/PLM//Do.3/02 දරන ලිපිය ප්‍රකාරව ව්‍යාපෘති 145 ක් පිළිබඳව පමණක් තොරතුරු ඉදිරිපත් කර තිබුණද උප ව්‍යාපෘති 33 ක් පිළිබඳ අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) මධ්‍යම අධිවේගී මාර්ග 1 ව්‍යාපෘති ගිවිසුම් ප්‍රකාරව 2021 අප්‍රේල් 30 දින රු.මිලියන 33,025 ක අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරුට ලබාදී තිබුණි. නමුත් 2025 දෙසැම්බර් 31 වන විට ඉන් රු.මිලියන 8,371 ක් එනම් සියයට 25 ක් පමණක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරුට ලබාදී ඇති අත්තිකාරම් මුදලින් සියයට 75 ක් අයකර ගැනීමට තිබියදී 2023 සිට 2025 අතර කාලය තුල අවස්ථා 12 කදී නැවතත් රු.මිලියන 6,500 ක මුදලක් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත ගිවිසුම් කොන්දේසි වලින් බැහැරව අත්තිකාරම් ලෙස ලබාදී තිබුණි. මේ සඳහා අත්තිකාරම් ඇපකරයක් කොන්ත්‍රාත්කරුගෙන් ලබාගෙන නොතිබුණු අතර අදාල ගෙවීම් සඳහා විගණනයට ඉදිරිපත් කරන ලද වවුචර් වල ගෙවීම් සම්බන්ධ කිසිදු ලියවිල්ලක් අමුණා නොතිබුණි. තවද ඉහත පරිදි කොන්ත්‍රාත්කරු වෙත ලබාදී තිබුණු රු. මිලියන 6,500 ක මුදලින් රු. මිලියන 3,500 ක මුදලක් 2026 මැයි මස බිල්පත්වලින් අඩුකර ඇති බවත් කාර්යසාධන ඇපකරයක් නාමමාත්‍රිකව ලබාගත් බවත් ප්‍රධාන ගනන්දීමේ නිලධාරී විසින් දන්වා තිබුණි.

1.6.10 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ආරවුල් නිරවුල් කිරීමේ ක්‍රියාමාර්ගවලට එළඹීම

කොන්ත්‍රාත් ගිවිසුම් සම්බන්ධයෙන් සේවායෝජක හා කොන්ත්‍රාත්කරු අතර ඇතිවන ආරවුල් නිරවුල්කරණය සඳහා විධිමත් වාර්තා පවත්වාගෙන යාම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමක් වුවද, මහාමාර්ග අංශය විසින් 2005-2024 කාලසීමාව තුළ ක්‍රියාත්මක කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘතීන්වල ආරවුල් නිරවුල්කරණය

සම්බන්ධව එවැනි විධිමත් වාර්තා පවත්වා නොගැනීම හේතුවෙන් ආරවුල් නිරවුල්කරණය සම්බන්ධව පැන නැගිය හැකි වගකීම වල ප්‍රමාණය හා ස්වභාවය පිළිබඳ හඳුනාගැනීමට නොහැකි වී තිබුණි.

එසේම කොන්ත්‍රාත්කරුවන්ගේ අයිතිවාසිකම් හා ආරවුල් විසඳීමේ කාර්යය වෙනුවෙන් එම කටයුතු වල නිරත වීම අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශයේ ප්‍රධාන කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණද ආරවුල් නිරවුල් කිරීමේ කාර්යයන් සඳහා අදාල අංශය විසින් සෘජු මැදිහත් වීමක් සිදුකර නොතිබීමෙන් මහාමාර්ග අංශයේ මෙම ක්ෂේත්‍රයට අදාල අභ්‍යන්තර පාලනය සහ කොන්ත්‍රාත් ආරවුල් විසඳීමේ කාර්යය වෙනුවෙන් මැදිහත් වීම දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

විගණන නිරීක්ෂණය	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
2024 වර්ෂයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ලෙස පැවති මෙම අමාත්‍යාංශයට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024 නොවැම්බර් 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර අංක 2412/08 අනුව වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයද අනුයුක්ත කිරීම නිසා ඉහත වැය ශීර්ෂය සඳහා 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය ලෙස පිළියෙල කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශණවල 2024 සහ 2025 වර්ෂවල ශේෂයන් අනුරූපී වී නොතිබුණි.	1.3(ආ)

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.3 මූල්‍ය නොවන වත්කම් (එ)	2018 අංක 18 දරණ ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තිය යටතේ වූ පද්ධති සමාලෝචනයේදී විශේෂ අවධානය යොමු කර ලේඛණගත වත්කම් නිරවුල්ව හා පහසුවෙන් හඳුනාගැනීමට සුදුසු වැඩපිළිවෙලක් සකස්කර ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය.	1.6.5 මූල්‍ය නොවන වත්කම් (ඉ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ 2024 වර්ෂයේ හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනය (ඒසිඒ - 1 (i)) අනුව වර්ෂ අවසාන ශේෂය රු.මිලියන 36,449.19 ක් වුවද, 2025 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස දක්වා ඇත්තේ රු.මිලියන 27,702.4 කි. ඒ අනුව 2025 වර්ෂයේ හිඟ ආදායම් ආරම්භක ශේෂය රු.මිලියන 8,746.79 කින් ඌණ ගණනය වී තිබුණි.

(ආ) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ ආදායම් ප්‍රකාශනය (ඒසිඒ - 1) අනුව හිඟ අදායම් රැස් කිරීම රු.මිලියන 5,558.38 ක් ලෙස වාර්තා වුවද, හිඟ ආදායම් පිළිබඳව ප්‍රකාශනයේ (ඒසිඒ - 1(i)) කිසිදු හිඟ අදායම් අයකර ගැනීමක් සටහන් කර නොතිබුණි.

3.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ සැපයීම් නඩත්තු වියදම්, මාරු කිරීම් සහ වෙනත් පුනරාවර්තන වියදම් වශයෙන් පුනරාවර්තන වැය විෂයන් 06 ක එකතුව රු.මිලියන 3.60 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමකින් තොරව ඉතිරි වී තිබුණි.

(ආ) කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය (ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ ප්‍රතිණය දීම්), පිටකොටුව සහ අලුත් මාවත සඳහා බැවුම් සහිත අන්තර් භුවමාරු මධ්‍යස්ථාන 02 ක් ඉදිකිරීම (ගොඩනැගිලි සහ ඉදිකිරීම්), ඇ.ඩො.මිලියන 318 ණය මාලාවේ ශේෂව ඇති අරමුදල් මඟින්

ශ්‍රී ලංගමය සඳහා බස් රථ 600 ක් මිලදී ගැනීම (වාහන), සමුද්‍ර වරායක් සහ ගුවන්තොටුපොළ සංවර්ධන (යන්ත්‍රාගාර,යන්ත්‍ර සහ උපකරණ) ඇතුළු මූලධන වැය විෂයන් 13 ක් වෙනුවෙන් වෙන්කර තිබූ එකතුව රු.මිලියන 7,072.55 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමකින් තොරව ඉතිරිවී තිබුණි.

(ඇ) මෙහෙයුම් වැඩසටහන අමාත්‍ය කාර්යාලය (01 – 01) යටතේ ගමන් වියදම් -දේශීය, විදේශීය, සේවා වියදම්- ප්‍රවාහන, යන්ත්‍ර හා කාර්යාල උපකරණ සේවා ගිවිසුම්, වාහන රක්ෂණය සහ මෙහෙයුම් වැඩසටහන පරිපාලනය හා ආයතනික සේවා (01-02) යටතේ නඩත්තු වියදම්- මෘදුකාංග නඩත්තු,මාරු කිරීම්- සම්මාදම් සහ දායක මුදල්, සැපයීම්-වෙනත් සහ මාරුකිරීම්- වෙනත් ඇතුලු පුනරාවර්ථන වැය විෂයන් 20 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 122.35 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 72.44 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක විය.

(ඈ) මෙහෙයුම් වැඩසටහන (117 – 01) මූලධන වියදම් යටතේ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම- යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ, මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම- වාහන, මූලධන වත්කම් අත්පත්කර ගැනීම -ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ යටතේ මූලධන වැය විෂයන් 08 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 28.40 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 20.39 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. එම ඉතිරිවීම් සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක විය.

(ඉ) සංවර්ධන වැඩසටහන (117 -02) යටතේ රථවාහන කළමනාකරණය (ගොඩනැගිලි සහ ඉදිකිරීම්), ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම (ගොඩනැගිලි සහ ඉදිකිරීම්) - උතුරු පළාත සහ බටහිර බහළුම් පර්යන්ත II සඳහා බටහිර දිය කඩනය දිගු කිරීම පිණිස වන විස්තරාත්මක සැලසුම- කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ අදියර II ඇතුළු මූලධන වැය විෂයන් 17 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 30,979.43 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 18,400.58 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක විය.

(ඊ) වැය විෂයයන් 95 ක් සඳහා මූලික වියදම් ඇස්තමේන්තුව රු.මිලියන 213,418.35 ක් වූ අතර සංශෝධිත වියදම් ඇස්තමේන්තුව රු.මිලියන 232,858.26 ක් විය. ඒ අනුව මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර රු.මිලියන 209,897.98 ක විචලනයක් වූ අතර එය මූලික වියදම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 50 සිට 687 ක පරාසයක් ගෙන තිබුණි.

(උ) වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ පුනරාවර්තන වැය විෂයන් 12 ක්, මූලධන වැය විෂයන් 4 ක් හා උප ව්‍යාපෘති 2 ක් සම්බන්ධයෙන් ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,150.43 ක් වූ අතර තත්‍ය වියදම රු.මිලියන 993.69 ක් වූයෙන් ඉතිරිවීම් රු.මිලියන 1,156.74 ක් විය. වර්ෂය තුල උපයෝජනය කල පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 99 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ඌ) වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ පුනරාවර්තන වැය විෂයක් හා මූලධන වැය විෂයන් 3 ක් වෙනුවෙන් වෙන්කර තිබූ ශුද්ධ ප්‍රතිපාදන මුදල රු.මිලියන 3,855.50 ක් වුවද, වර්ෂය තුලදී කිසිදු වියදමක් එම වැය විෂයයන් වලින් නොදැරීම මත සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(එ) මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව පරීක්ෂා කිරීමේදී වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ පුනරාවර්තන වැය විෂයයන් 03 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක විචලතාවය සියයට 50 සිට සියයට 720 අතර පරාසයකින් වෙනස් වී තිබුණි.

(ඒ) පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන

වැය ශීර්ෂ 117 යටතේ 2025 වර්ෂය තුල වැය විෂයයන් 05 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් එකතු වටිනාකම රු.මිලියන 38,879 ක් වෙන් කර තිබුණු අතර ඉන් මූලික ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන් කිරීම් සිදු නොකළ වැය විෂයයන් 03 ක් සඳහා එකතුව රු.මිලියන 620 ක ප්‍රතිපාදන පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන් කර තිබුණි. එම ප්‍රතිපාදන වලින් රු.මිලියන 414.91 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉතිරිව තිබුණි.

(ඔ) මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයන් 8 ක් සඳහා මූලික ප්‍රතිපාදනයකින් තොරව රු.මිලියන 4,763.48 ක ප්‍රතිපාදනයක් මාරුකර ඇති අතර ඉන් වැය විෂයයන් 03ක මු.රෙ 66 ප්‍රතිපාදනයට සාපේක්ෂව සියයට 15 සිට සියයට 45 ක් දක්වා ඉතිරිවීම් තිබුණි.

(ii) වැය විෂයන් 06 ක එහි මූලික ප්‍රතිපාදනය ඉක්මවා මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් සිදු කර ඇති අතර එම වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරිවීම් මු.රෙ.66 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම් වලට සාපේක්ෂව සියයට 24 සිට 105 ක පරාසයක පැවතුණි. එසේම වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරිවීම මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් වටිනාකම ඉක්මවා පැවතිණි. ඒ අනුව මූලික ඇස්තමේන්තුව හා මු.රෙ.66 මාරු කිරීම් නිසි ඇගයීමකින් යුතුව පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 **සීමා ඉක්මවීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මු.රෙ 503 (2) අනුව අත්තිකාරම් ගිණුම් සඳහා නියමිත සීමාවන් ඉක්මවීම් හෝ පහත වැටීම් ඇතිවීම වලක්වාලීමට කටයුතු කළ යුතු අතර එසේ සීමාවන් ඉක්මවීමට ඉඩ ඇති බව දැනගත් විට මුදල් අමාත්‍යවරයාගෙන් එම සීමා ඉක්මවීමට මත්තෙන් අදාළ නියෝගය ලබා ගත යුතුය. වරාය සහ සිවිල් ගුවන් සේවා අංශයේ උපරිම වියදම් සීමාව රු.මිලියන 8 ක් වුවද CC 10 ලේඛනය අනුව වර්ෂය තුළ ලබා දී තිබූ මුළු ණය ප්‍රමාණය රු.මිලියන 8.083 ක් වූයෙන් උපරිම අත්තිකාරම් වියදම් සීමාව රු.මිලියන 0.083 කින් ඉක්මවා තිබූ අතර මෙම ඉක්මවීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) වරාය සහ සිවිල් ගුවන් සේවා අංශයේ උපරිම වියදම් සීමාව රු.මිලියන 8 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශයන්හි ඒසීඒ-5 ආකෘතිය අනුව මුදලින් කරන ලද හර කිරීම් රු.මිලියන 23.24 ක් ලෙස දක්වා තිබුණි.ඒ අනුව අත්තිකාරම් හි උපරිම වියදම් සීමාව ඉක්මවීම රු.මිලියන 15.34 ක් වශයෙන් නිරීක්ෂණය විය. මු.රෙ. 503 (1) යටතේ සිදුවූ ගැළපුමක් බව හඳුනාගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කල යුතු බව අත්තිකාරම් "බී" ගිණුමෙහි වාර්ෂික සැසඳුම් ප්‍රකාශනයෙහි සඳහන් කර තිබුණද, මෙම නිරීක්ෂණය වූ වෙනසට අදාළව ගණනයට ගතයුතු

නැති ගනුදෙනු සම්බන්ධයෙන් වූ ගැලපීම් ඉදිරිපත් කර තිබුනේ රු.මිලියන 1.61 ක් සඳහා පමණි.

(ඇ) වරාය සහ සිවිල් ගුවන් සේවා අංශයේ උපරිම වියදම් සීමාව රු.මිලියන 8 ක් ද, අවම ලැබීම් සීමාව රු.මිලියන 3.2 ක වටිනාකමක්ව පැවතියද, උපරිම හර ශේෂ සීමාව රු.මිලියන 53 ක් වීමෙන් 2025 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද ඇස්තමේන්තු අධි තක්සේරු වී තිබුණි.

3.4 **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය යටතේ අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘති 09 ක්ද, මාර්ග සංවර්ධන ව්‍යාපෘති 25 ක්ද, මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 25 ක්ද සහ පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘති 09 ක්ද වශයෙන් ව්‍යාපෘති 68 කට 2025 වර්ෂයේ ප්‍රතිපාදන සලසා ක්‍රියාත්මක කර තිබුණි. ක්‍රියාත්මක ව්‍යාපෘති වල පැන නැඟ ඇති ආරවුල් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ආරවුල් 14 ක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණු අතර විගණනයට ඉදිරිපත් කළ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන මඟින් හා අමාත්‍ය මණ්ඩල සංදේශ මඟින් පිළිවෙලින් ආරවුල් 11 ක් සහ ආරවුල් 05 ක් සම්බන්ධ තොරතුරු විගණනයට අනාවරණය විය. ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කරගත් ආරවුල් සඳහා බැරකම් වටිනාකම රු.මිලියන 4,083.89 ක් ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන් මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණු නමුත් එම ආරවුල් සම්බන්ධයෙන් අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ගැලපීමක් හෝ අනාවරණයක් සිදු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනයන්හි බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය -ඇමුණුම (iii) හා බැරකම් පිළිබඳ ප්‍රකාශය-(i), -ඇමුණුම -(iv) පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මු.රෙ. 128(1)(ඒ) අනුව දරන ලද කිසියම් වියදමක් හෝ වගකීම් බැඳීමක් වුවද, තම වැය විෂය පථය හෝ සීමාවන් හෝ වෙනත් බලය දෙනු ලැබූ මූල්‍ය ප්‍රතිපාදනයක ඇතුළත වැටෙන බවට හා එය ප්‍රමාණවත් තරම් අධිකාර බලයෙන් ආවරණය වන බවටද තහවුරු කර ගැනීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වුවත්, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන නිකුත් කිරීමේදී හා පියවීමේදී කොන්ත්‍රාතවල ගිවිසුම්ගත වටිනාකම, මේ දක්වා දරා ඇති පිරිවැය, ගෙවනු ලබන වටිනාකම, සහතික කළ වැඩවල වටිනාකම හා මු.රෙ.94 ප්‍රකාරව එළඹ ඇති බැඳීම් හා බැරකම් තොරතුරු ඇතුළත් සාරාංශගත වාර්තා කැඳවීමකින් තොරව අක්මුදල් නිදහස් කර තිබුණි. ඒ හේතුවෙන් අමාත්‍යාංශයේ ලේඛණ අනුව ව්‍යාපෘතීන්හි බැරකම් හා බැඳීම් පිළිබඳ සංඛ්‍යා හඳුනාගත නොහැකි විය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනයන්හි ඇමුණුම (iv) හි දැක්වෙන බැරකම් පිළිබඳ ප්‍රකාශයේ-(i) ඇතුළත් සංඛ්‍යාවල සංසන්දනාත්මක තොරතුරුද අමාත්‍යාංශයේ ලේඛණ හා පොත්පත්වලින් හඳුනාගැනීමට නොහැකි විය.

(ii) මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් ප්‍රකාශය - (ඇමුණුම-iv) අනුව,2025 දෙසැම්බර් 31 දිනට මු.රෙ. 94 (2) හා (3) ප්‍රකාරව බැඳීම් හා බැරකම්වල සමස්ථ වටිනාකම රු.මිලියන 249,525.46 ක් විය. අමාත්‍යාංශය විසින් 2025 වර්ෂයේ ප්‍රතිපාදන සලසා

තිබූ අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘති 09 කින්ද, මාර්ග සංවර්ධන ව්‍යාපෘති 25 කින්ද සහ පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම් ව්‍යාපෘති 09 ක් ඇතුළු ව්‍යාපෘති 43 කින් තෝරාගත් ව්‍යාපෘති 13 ක මූල්‍ය ප්‍රකාශන අනුව 2025 දෙසැම්බර් 31 දිනට බැරකම් රු.මිලියන 40,964.64 ක් වූ අතර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල, ඇමුණුම-(iv) බැඳීම් හා බැරකම් ප්‍රකාශය අනුව එම ව්‍යාපෘතින්ට අදාලව හඳුනාගත් බැරකම් හා බැඳීම් රු.මිලියන 50,693.05 ක් විය. ඒ අනුව අමාත්‍යාංශය විසින් 2025 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 06 ක රු.මිලියන 21,537.76 ක් අඩුවෙන්ද ව්‍යාපෘති 07 ක රු.මිලියන 40,266.18 ක් වැඩියෙන්ද බැරකම් ශේෂ හඳුනාගෙන තිබුණි.

(iii) මූල්‍ය ප්‍රකාශනයන්හි බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි -ඇමුණුම (iii) ගෙවීම්ලාභියා නිශ්චිතව හඳුනාගත හැකි පරිදි බැඳීම් හා බැරකම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(iv) මු.රෙ.94(2) සහ (3) ප්‍රකාරව, බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ (ඇමුණුම iv), ඇතැම් ව්‍යාපෘතිවල මු.රෙ.94 (3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව සහ බැඳීම් හා බැරකම් වටිනාකම සමාන අගයක් වී තිබුණු අතර බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි -ඇමුණුම (iii) අනුව ඇතැම් ව්‍යාපෘති වල 2025 දෙසැම්බර් 31 දිනට බැඳීම හඳුනා ගෙන තිබුණද, ඒ හා සම්බන්ධ බැරකම හඳුනාගෙන නොතිබුණි.

(ඇ) වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i) (ඇමුණුම iv) තුළ 2026 වර්ෂයේ ජනවාරි මාසය තුලදී ගෙවා තිබූ වවුචර් 15 කට අදාළ රු. මිලියන 1.96 ක බැරකම් ඇතුළත් කර නොතිබුණි.

(ඈ) 2025 වර්ෂයට අදාළව වරාය හා සිවිල් ගුවන් සේවා අංශය විසින් බැරකම් සඳහා බැඳීම් ඇතිකර ගැනීමේදී අදාළ වැය විෂයන්වල ඉතිරිවීම් සම්බන්ධයෙන් සලකා බැලීමෙන් තොරව කටයුතු කිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 02 ක රු. මිලියන 0.22 ක ප්‍රතිපාදන ඉතිරිවීම් වටිනාකම රු. මිලියන 0.27 ක බැරකම් තිබූහෙයින් රු. මිලියන 0.05 ක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා එළඹී තිබුණි.

3.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.6 (අ) I ඡේදය ප්‍රකාරව විගණන විමසුම් යොමුකර දින 33 සිට දින 145 ක කාලයක් පිලිතුරු එවීම සඳහා ලබාගෙන තිබුණි.

3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත	
I. 38(1)(ඉ) වගන්තිය	සමාලෝචිත වර්ෂය තුල විගණකාධිපති විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළත පිළිතුරු ඉදිරිපත් නොකරන ලද අවස්ථා 11 ක් නිරීක්ෂණය විය. එම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදී තිබුණද, එසේ පිළිතුරු ලබා දීමේදී විගණන විමසුම යොමුකර දින 33 සිට දින 145 ක කාලයක් පිලිතුරු එවීම සඳහා ලබාගෙන තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
I. මුදල් රෙගුලාසි 104 (3) හා (4)	i. මහා මාර්ග අංශය සතු වාහනයක් 2025 ඔක්තෝබර් 21 දින හදිසි අනතුරුකට ලක් වී තිබුණු අතර 2026 අප්‍රේල් 30 වන විටත්, මුදල් රෙගුලාසි අනුව පූර්ණ වාර්තාව විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි. ii. හදිසි අනතුරකට ලක්වී තිබූ ග්‍රාමීය මාර්ග අංශය සතු මෝටර් රථයක් අමාත්‍යංශය විසින් රු.මිලියන 6.15 ක් වැය කරමින් අලුත්වැඩියා කර තිබුණද, එම වියදම රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූරණය කර ගැනීමට 2025 දෙසැම්බර් 31 වන විටත් අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. iii. මුදල් රෙගුලාසි 104(3),(4)ප්‍රකාරව අලාභයන් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාව සකස් කර විගණකාධිපතිට පිටපතක් සහිතව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු නමුත් අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශයේ වාහන අනතුරු සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා පිළියෙළ කිරීම නිවැරදිව සිදුකර නොතිබුණු අතර, මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පවත්වා ගෙන යායුතු හානි පාඩු ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
II. මුදල් රෙගුලාසි 373	2025 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පවතින අග්‍රිම ශේෂය එදිනම භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතු වුවද, අමාත්‍යාංශයේ ගිණුම් අංක 7003/0000/00/0054/0025/000 හි පැවති 2025 දෙසැම්බර් 31 දිනට වූ මුදල් ශේෂය රු.මිලියන 1.58 ක් එදිනම භාණ්ඩාගාර වෙත යවා නොතිබුණි.
III. මුදල් රෙගුලාසි 396 (ඈ)	මු.රෙ. 396 (ඈ) අනුව චෙක්පත නිකුත් කරන දිනය, එය වලංගු කළ දිනය යන දෙකින් පසුව එළඹෙන දින සිට මාස 6 කට වැඩි

		කාලයක් එය මුදල් නොකර තිබුණහොත්ද, එය අවලංගු කරනු ලැබුවා සේ සලකා මු.රෙ. 394 (ඇ) ප්‍රකාරව අවලංගු කල චෙක්පතෙහි වටිනාකම ආයතනයට ලැබුණ මුදලක් සේ සලකා අදාළ ක්‍රියාමාර්ග ගත යුතු වුවත්, වරාය හා සිවිල් ගුවන් සේවා අංශය විසින් නිකුත් කරන ලද වටිනාකම රු. 35,360 ක් වූ චෙක්පත් 3 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.
IV.	මුදල් රෙගුලාසි 392 (ඇ) (IV)	මු.රෙ.392 (ඇ) (IV) ප්‍රකාරව නිකුත් කරන ලද අලුත් චෙක්පත පිළිබඳ විස්තරද, මුල් චෙක්පතට හරස් යොමු සහිත අලුත් සටහනක්ද, අලුත් චෙක්පත නිකුත් කළ දිනය, ව්‍යවහාරයෙහි පවත්නා මුදල් පොතෙහි රතු තීන්තෙන් සටහන් කළ යුතු අතර, මුදල් පිළිබඳ තීරු නිස්ව තැබිය යුතු වුවත් සිදුකරන ලද නියැදි පරීක්ෂණයට අනුව වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ රු. මිලියන 24.33 ක චෙක්පත් 09 ක් අවලංගු කර ඇති අතර එම චෙක්පත් අවලංගු කළ බව පමණක් සඳහන් කර තිබුණු අතර නිකුත් කරන ලද නව චෙක්පත පිළිබඳ සඳහන් කිරීමක් සිදුකර නොතිබුණි.
V.	මුදල් රෙගුලාසි 264	මු.රෙ 264 ප්‍රකාරව සෑම ගෙවීමකදීම වවුචරයේ සඳහන් දළ මුදල ලද බවට ආදායකයාගෙන් ලබාගත් කුවිතාන්සියකින් තහවුරු විය යුතු අතර මු.රෙ 263 (1) ප්‍රකාරව ගෙවීම් ලබා ගැනීම සඳහා ආදායකයා නොපැමිණෙන්නේ නම් අත්සන තබා ආපසු එවීම පිණිස කාරණයට අදාළ වවුචරය ප්‍රේෂණය හා සමඟ නොයැවිය යුතුය. එහෙත් ප්‍රේෂණය වෙනුවෙන් කුවිතාන්සියක් ලබාගෙන එය පහසුවෙන් නොගැලවෙන සේ වවුචරයට අමුණා හෝ අලවා තැබිය යුතුය. නමුත් වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ නියැදි වවුචර් පරීක්ෂා කිරීමේදී ජනවාරි, පෙබරවාරි, මාර්තු හා අප්‍රේල් මාසවලදී නිකුත් කරන ලද රු.387,802 ක්වූ වවුචර් 5 කට අදාළව කුවිතාන්සි ලබාගෙන නොතිබුණි.
VI.	මුදල් රෙගුලාසි 262 (2)	මු.රෙ 262 (2) යටතේ "ගෙවන ලදී" මුද්‍රාව ගෙවන ලද සියලුම වවුචර්වලත් ඒවා තහවුරු කරන ලියවිලිවලත් යෙදීමෙන් සෑම අවස්ථාවකදීම වරක් ගෙවූ වවුචර් නැවත වරක් ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමේ අවදානම අවම කර ගත හැකි වුවද වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ විසින් මාර්තු හා අප්‍රේල් මාස වලදී නිකුත් කරන ලද රු.606,791 ක්වූ වවුචර් 06 කට අදාළව ගෙවීම් තහවුරු කිරීමේ ලියවිලි වල "ගෙවන ලදී" මුද්‍රාව යොදා නොතිබුණි.
VII.	මුදල් රෙගුලාසි 262 (3)	මු.රෙ 262 (3) ප්‍රකාරව ගෙවීම කෙරෙන්නේ චෙක්පතකින් නම් චෙක්පතට අත්සන් තබන අවස්ථාවේ ගෙවන නිළධාරියා විසින් සිය අත්සන හෝ කෙටි අත්සන හෝ වවුචර් වලත් තහවුරු කරන ලියවිලි වලත් යෙදිය යුතු වුවත්, අවස්ථා 8 කට අදාළව එකතුව රු.මිලියන 7.38 ක්වූ වවුචර්වල හා තහවුරු කරනු ලබන ලියවිලිවල කෙටි අත්සන් යොදා නොතිබුණි.
VIII.	මුදල් රෙගුලාසි 371	මුදල් රෙගුලාසි 371 සංශෝධනය කරමින් මුදල් අමාත්‍යාංශය විසින් 2015 ජූලි 14 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 03/2015 හි 371 (2) ප්‍රකාරව සුළු මුදල් අග්‍රිමයෙන් ගෙවීම් සිදු

		කිරීමේදී එක් බිල්පතකට රු. 5,000 ඉක්මවා ගෙවීම් සිදු කළ නොහැකි වුවත්, වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ නියැදි වවුචර්පත් පරීක්ෂා කිරීමේදී සුළු මුදල් ප්‍රතිපූර්ණය කිරීමේ ගෙවීම් එකතුව රු. 36,463 ක් තුළ රු. 5,000 ඉක්මවූ බිල්පත් 4 ක් පැවතුණි.
IX.	මුදල් රෙගුලාසි 1645	මුදල් රෙගුලාසි 1645 ප්‍රකාරව ප්‍රවාහන අංශයේ වාහන සම්බන්ධයෙන් පවත්වාගෙන යායුතු ලොග් සටහන් පොත් යාවත්කාලීනකර පවත්වා නොතිබුණු අතර, මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව ධාවන සටහන් සහ මාසික ධාවන සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ)	1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	නිල වාහනයක් ලෙස පරිහරණය කිරීමට වෙන්කල වාහන හැර, අනෙකුත් සියළුම රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු වුවද, මහාමාර්ග අංශය සතු වාහන 40 ක රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි.
(ඈ)	2024 දෙසැම්බර් 18 දිනැති අංක 05/2024 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	රාජ්‍ය ආයතනවල පවතින විශාල වැය බරක් වන සුඛෝපභෝගී වාහන රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව අපහරණය කිරීම සඳහා වූ මෙම චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය සතු වාහන 10 ක් අපහරණය කිරීමට හඳුනාගෙන තිබුණු අතර අපහරණ කටයුතු නිමකර 2025 මාර්තු 01 දිනට පෙර රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියේ වාර්තා කළ යුතු බව සඳහන් වුවද, 2025 වර්ෂයේ ඉන් වාහන 02 ක් පමණක් අපහරණය කර තිබුණු අතර අනෙක් වාහන 08 සඳහා මේ වන විටත් අපහරණ කටයුතු අවසන් කර නොතිබුණි. තවද, අපහරණය කිරීම සඳහා හඳුනාගත් වාහන 04ක් තවදුරටත් අමාත්‍යාංශය විසින් පරිහරණය කිරීමට තීරණය කර තිබුණද, ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ඉ)	2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින්ම ලියාපදිංචි කර තිබීමේ අවශ්‍යතාවය අවධාරණය කරන අතර මෙම චක්‍රලේඛයේ 02.i ඡේදය ප්‍රකාරව ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන, ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත තම ආයතනය නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරාදීමට කටයුතු කළ යුතු වුවද, අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය සතු වාහන 09 ක හිමිකාරිත්වය පැවරීමකින් තොරව වෙනත් ආයතන වෙත මාරු කර තිබුණි.
(ඊ)	2024 ඔක්තොම්බර් 24 දිනැති අංක DMA/02/2024 දරන කළමණාකරන විගණන චක්‍රලේඛය	කළමණාකරන විගණන මාර්ගෝපදේශයේ උපවගන්ති 5 ප්‍රකාරව වැඩසටහන නිමකිරීමෙන් පසු භාණ්ඩ සමීක්ෂණයට අනුව පැවරිය යුතු වත්කම් එකී වත්කම් වල භාරකාරිත්වය,වර්තමාන තත්ත්වය හා වටිනාකම නිශ්චය කොට ප්‍රධාන ගණුන්දීමේ නිලධාරි වෙත පැවරිය යුතු වුවද, ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන ඇවර කිරීමේදී එහි වත්කම් භාණ්ඩ සමීක්ෂණය මගින් භෞතිකව හඳුනාගැනීමෙන් තොරව දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන වෙත මාරු කර තිබුණි.

(උ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය

සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කි.මී. 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, මහා මාර්ග අංශය සතු වාහන 36 ක සමාලෝචිත වර්ෂය තුල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.

3.7 බැංකු ගිණුම් මෙහෙයවීම

සිගාස් පරිශීලක අත්පොතෙහි 16 ප්‍රකාරව බැංකු සැසඳුම් ප්‍රකාශය සිගාස් පද්ධතිය භාවිතයෙන් වෙනම පරිශීලක නාමයක් හා මුර පද භාවිතයෙන් පිළියෙළ කළයුතු වුවද, වරාය හා සිවිල් ගුවන් සේවා අංශය විසින් සිගාස් පද්ධතිය භාවිතා නොකර බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙළ කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉංජිනේරු අංශය

ක්‍රියාත්මක ව්‍යාපෘති අධීක්ෂණය, ප්‍රගතිය, සමාලෝචනය කිරීම හා ව්‍යාපෘති වල තාක්ෂණික විගණනයන් සිදු කිරීම අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශයේ ප්‍රධාන කාර්යයන් වුවද, එම කාර්යභාරයන් අතරින් ව්‍යාපෘතිවල තාක්ෂණික විගණනයන් සිදු කිරීම සමාලෝචිත වර්ෂය තුල මෙම අංශය විසින් සිදුකර නොතිබුණි.

(ආ) විෂය භාර අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම සඳහා 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 6 (1) වගන්තිය යටතේ මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාවක් පිහිටුවිය යුතු අතර, මෙම කමිටුව විසින් උසස් මහා මාර්ග ප්‍රතිපත්තියක් සකස් කිරීම, මාර්ග තත්ත්වය වැඩිදියුණු කිරීම, මාර්ග පිළිබඳ පර්යේෂණ, මාර්ග සැලසුම්, මාර්ග සංවර්ධන තාක්ෂණය සහ ආරක්ෂණ පියවර සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් ලබාදිය යුතුය. නමුත් 2008 වසරේ මංමාවත් පනත ක්‍රියාත්මක වන දින සිට මේ දක්වා වසර 17 ක් ගත වී ඇතත් මෙම උපදේශන සභාව සඳහා සාමාජිකයින් පත්කිරීම හා අදාල කාර්යභාරය ඉටුකිරීම සිදු වී නොතිබුණි. ඒ අනුව මාර්ග සම්බන්ධ ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී උක්ත සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, පාර්ලිමේන්තුව විසින් නියම කර ඇති පටිපාටි පිළිපැදීමකින් තොරව මාර්ග සම්බන්ධයෙන් වූ උක්ත කරුණු වලට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගෙන තිබුණි.

(ඇ) 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 7(1) වගන්තිය යටතේ දිවයිනේ එක් එක් දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් මාර්ග පද්ධති සම්බන්ධීකරන කමිටු පත්කළ යුතු අතර මාර්ග පද්ධති සංවර්ධනය හා නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම, සංවර්ධනය හා නඩත්තු

කටයුතු සම්බන්ධීකරණය සහ නඩත්තුව, ව්‍යාපෘති යම් පාර්ශවයකට භාර කිරීම සහ අධීක්ෂණය, මාර්ග සංවර්ධන ව්‍යාපෘති භාරගෙන ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කිරීම ආදී කර්තව්‍යන් මෙම කමිටුව විසින් ඉටුකල යුතු නමුත් මෙම කමිටු සඳහා සාමාජිකයින් පත්කිරීම හා අදාල කාර්යභාරය ඉටු කිරීම සිදු වී නොතිබුණි.

(ඈ) මාර්ග සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති සඳහා අත්පත් කරගතයුතු ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් අත්පත් කරගැනීමේ පනත ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග අධීක්ෂණය, ඉඩම් අත්පත් කරගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටු සමඟ සාකච්ඡා පැවැත්වීම, නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා ඉඩම් අවසතු කිරීම හා සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීම ආදිය අමාත්‍යාංශයේ ඉඩම් අංශයේ කාර්යභාරය වේ. නමුත් ව්‍යාපෘති මගින් අත්පත් කරගනු ලබන ඉඩම් සම්බන්ධයෙන් යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වා නොගැනීම හේතුවෙන් මෙම අංශයෙන් අපේක්ෂිත කාර්යභාරය ඵලදායීව ඉටුනොවන බව නිරීක්ෂණය විය.

4.1.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **කොළඹ - රත්නපුර - පැල්මඩුල්ල අධිවේගී මාර්ගය - (117-02-03-013)**

I. කහතුඩුව සිට ඉංගිරිය හා රත්නපුර හරහා පැල්මඩුල්ල දක්වා රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම "සෞභාග්‍යයේ ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ වූ ව්‍යාපෘතියකි. 2024 මාර්තු 6 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 3,350 ක් සහ ඉදිකිරීම් කටයුතු සඳහා රු.මිලියන 7,478 ක් වශයෙන් එකතු වටිනාකම රු.මිලියන 10,828 ක වියදමක් දරා තිබුණි. වර්ෂ 2015 සිට 2025 දක්වා කාල සීමාව තුල රු.මිලියන 7,682.58 ක වියදමක් දරා තිබුණු බව අමාත්‍යාංශයේ ඇස්තමේන්තු පරීක්ෂාවේදී විගණනයට අනාවරණය වුවද මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2022 වර්ෂයේදී අතරමඟ අතහැර දමා තිබුණි.

II. 2014 වර්ෂයේදී මහනැහුම උපදේශන සේවා (පුද්ගලික) සමාගම විසින් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ඒ අනුව කහතුඩුව, ඉංගිරිය, කිරිඇල්ල, කුරුවිට, රත්නපුර හරහා පැල්මඩුල්ල දක්වා අධිවේගී මාර්ගයේ මාර්ග අනුරේඛණය අවසන් කර තිබියදීත් එම මාර්ගයේ අතර මැද කොටසක්වූ ඉංගිරිය සිට ගොරකාඇල දක්වා මාර්ග කොටස සඳහා විකල්ප මාර්ග අනුරේඛණයක් හා සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සඳහා රු.මිලියන 68 ක අමතර පිරිවැයක්ද දරා තිබුණි.

(ආ) **නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කුළුණු මත ඉදිකෙරෙන අධිවේගී මාර්ගය (117-02-03-015)**

I. 2025 අප්‍රේල් 07 දින නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 14/2025 අනුව මෙම ව්‍යාපෘතිය රාජගිරිය සිට අතුරුගිරිය දක්වා වන II වන අදියර යෝජිත මාර්ග පථය තලංගම පාරිසරික ආරක්ෂක කළාපය මතින් යාම සම්බන්ධව අධිකරණ නඩු කටයුතු පැවතීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වාරණය කරමින් නියෝගයක් අභියාචනාධිකරණය මඟින් නිකුත් කර තිබුණි. තවද ව්‍යාපෘතියේ II අදියරට අදාල පාරිසරික බලපෑම් ඇඟයීමට

අසමත් වී ඇති අතර ඒ සම්බන්ධව යොමු කල අභියාචනය ද ප්‍රතික්ෂේප වී තිබුණි.ඒ අනුව මෙම ව්‍යාපෘතියේ II අදියර ක්‍රියාත්මක කිරීමට හැකිවී නොතිබුණි.

II. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන්, වර්ෂ 2017 සිට 2025 දක්වා කාල සීමාව තුල අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ රු.මිලියන 3,118.77 ක සමස්ථ වියදමක් දරා තිබුණි. ව්‍යාපෘතිය නිසා බලපෑමට ලක්වන අනවසර පදිංචිකරුවන් සිටින පවුල් සහ අනුපවුල් සඳහා නිවාස 1100 ක් ලබාදීමට නියමිතව තිබුණි. ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය හා නාගරික සංවර්ධන අධිකාරිය අතර අවබෝධතා ගිවිසුමක් මගින් නිවාස 1100 ක් වෙන් කර ගෙන ඇති අතර වාරික 5 ක් යටතේ රු.මිලියන 2,388.85 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු බැවින් ඒ වෙනුවෙන් රු.මිලියන 480 ක් බැගින් වූ වාරික 3 ක් යටතේ රු.මිලියන 1,440 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණු අතර නිවාස අත්පත්කර ගැනීමේ ක්‍රියාවලියද අතරමඟ ඇණහිට තිබුණි.

(ඇ) **මධ්‍යම අධිවේගී මාර්ගය - 04 කොටස - කුරුණෑගල සිට දඹුල්ල (117 -02-03-021)**

2016 සැප්තැම්බර් 02 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව කුරුණෑගලින් ආරම්භ වී දඹුල්ල දක්වා දිවෙන කි.මී.60 ක දිගින් යුත් මධ්‍යම අධිවේගී මාර්ගයේ 04 වන කොටස මේ යටතේ ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන තිබුණි එහිදී 2022 අගෝස්තු 22 දිනැති අංක:අමප/ 22/1168/608/012 අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්පත්කර ගැනීමේ වත්මන් තත්ත්වය සැලකිල්ලට ගනිමින් වන්දි මුදල් ගෙවීමට අනුගමනය කලහැකි උපාය මාර්ග හඳුනාගැනීම සඳහා කමිටුවක් පත්කර තිබුණි. එම කමිටු වාර්තාව අනුව මෙම ව්‍යාපෘතිය සඳහා හෙක්ටයාර් 475 ක් පමණ වූ භූමි ප්‍රමාණයට අදාල ඉඩම් කැබලි සියල්ල 2016,2017,2018 වර්ෂවල ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ පවරාගෙන ඇති බවත්, ඒ අනුව ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය සියයට 73 ක් බවත් සඳහන් විය. තවද එම කමිටු වාර්තාව අනුව මෙම මාර්ග පථයට අයත් මුළු ඉඩමේ කැබලි 5055 අතරින් ඉඩම් කැබලි 3505 ක් පෞද්ගලික ඉඩම් කැබලි වූ අතර, ඒම ඉඩම් කැබලි 266 ක් සඳහා රු.මිලියන 334.5 ක් ගෙවා ඇති බවත් තවත් රු.මි.108 ගෙවීමට ඇති බවත් සඳහන් කර තිබුණි. එම කමිටුව මඟින් අත් කරගත් ඉඩම් අවසතු කිරීමට නිර්දේශ කර තිබුණි. තවද, එම කමිටු වාර්තාව ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වර්ෂ 2022 වන විට වැය කර තිබූ වටිනාකම රු.මි.982 කි. මෙම ව්‍යාපෘතිය මේ වන විට නිම කිරීමකින් තොරව අත්හැර දමා තිබුණි.

(ඈ) බේස්ලයින් මාර්ගයේ තෙවන අදියර - (117-02-04-010)

I. 2004 අගෝස්තු 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම ව්‍යාපෘතියේ තෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලැබී තිබුණු අතර මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා හයිලෙවල් මාර්ගයේ සිට ගාලු පාරේ රත්මලාන මැලිබන් හන්දිය දක්වා (කි.මී.7.4) මාර්ග කොටස දීර්ඝ කිරීමට අපේක්ෂිතව තිබුණි එහිදී කොළඹ හා අවට වාසස්ථාන අධික වූ ප්‍රදේශයක් හරහා ගමන්ගන්නා වූ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම නිසා විශාල නිවාස ප්‍රමාණයක් කඩා දැමීමට සිදුවීම හේතුවෙන් 2009 මැයි 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කොළඹ හොරණ මාර්ගයේ සිට කොළඹ ගාල්ල මාර්ගයේ රත්මලාන දක්වා වූ මාර්ග කොටසේ ඉඩම් අත්කර ගැනීම හා ඉදිකිරීම් අතහැර දැමීමටත්, පවරාගත් සියළු ඉඩම් මුදාහැරීමටත් කටයුතු කර තිබුණි.

II. මෙම ව්‍යාපෘතිය නිසා අවතැන්වන පවුල් සඳහා නිවාස ඒකක 45 ක් නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කාලිංග මාවතෙහි පිහිටි නිවාස යෝජනා ක්‍රමයෙන් ලබාදීමට සහ එක් නිවාස ඒකකයක් සඳහා රු.මිලියන 4 බැගින් නිවාස 45 ක් සඳහා රු.මි. 180 ක් 2021 අයවැය ප්‍රතිපාදන මඟින් දැරීමට 2021 ඔක්තෝබර් 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණි. 2015 සිට 2025 දක්වා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දරා ඇති මුළු වියදම රු.මිලියන 3,519.43 ක් වන අතර, ඉන් සියයට 98 ක් එනම් රු.මිලියන 3,469.73 ක් ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම සඳහා දරා තිබුණි.

(ඉ) මහනුවර උමඟ ඉදි කිරීමේ ව්‍යාපෘතිය - (117-02-04-054)

I. මහනුවර නාගරික ප්‍රදේශයේ රථවාහන තදබදය අවම කිරීම සහ ප්‍රදේශයේ ගමනාගමනය වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ගික මැදිහත්වීමක් වශයෙන් යෝජනා කෙරුණු මහනුවර උමං මාර්ගික ව්‍යාපෘතිය 2017 අප්‍රේල් මස 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබී තිබුණු අතර, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො. මිලියන 252.3 ක් විය. නමුත් මෙය ප්‍රමුඛ අවශ්‍යතාවයක් නොවන බව සඳහන් කරමින් ආර්ථික කළමණාකරණය සඳහා වන අමාත්‍ය මණ්ඩල කමිටුව 2017 අගෝස්තු 21 දින මෙම ව්‍යාපෘතිය නතර කර තිබුණි.

II. මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට අනුමැතිය ලබා ගැනීම පිණිස 2019 දෙසැම්බර් 24 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2020 ජනවාරි 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම සවිස්තරාත්මක පාරිසරික අධ්‍යයනයක් සිදුකර එහි ප්‍රතිඵල මත පදනම්ව කටයුතු කරන ලෙස තීරණය කර තිබුණි. උමං කැනීම් කටයුතු හේතුවෙන් භූගත ජල මට්ටම සහ මතුපිට ජල සම්භාරය යන ද්විත්වය කෙරෙහි සැලකියයුතු බලපෑමක් සිදුවන බවත් පාෂාණ ස්ථරයක් හරහා කනිනු ලබන දෙවන උමඟ ඩොවින් ජලාශය (Dorwin Reservoir) යටින් ඇති පාෂාණ ස්ථරයේ දිගු ප්‍රදේශයකට නිරාවරණය වීම හේතුවෙන් ජලාශයෙන් උමග වෙත ජලය කාන්දුවීමේ අවදානමක් ඇති බව පාරිසරික බලපෑම් ඇඟයීමෙන් අණාවරණය වී තිබුණි.

III. 2020 ජනවාරි 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට තීරණය කළද පාරිසරික බලපෑම මත 2025 නොවැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය අවලංගු කිරීමට තීරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වර්ෂ 2021 සිට 2023 දක්වා විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය ලෙස රු.මි.70.18 ක් හා දේශීය අරමුදලින් රු.මි.19.99 ක් වශයෙන් එකතුව රු.මි.90.17 ක වියදමක් දරා තිබුණි.

(ඊ) ප්‍රධාන මාර්ග හා අධිවේගී මාර්ග වෙත ප්‍රවේශය සඳහා සහ මාර්ග තදබදය අවම කිරීම සඳහා විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීම-කි.මී.100,000 ව්‍යාපෘතිය (117 -02-04-057)

I. "සෞභාග්‍යයේ ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ප්‍රධාන මහා මාර්ග හා අධිවේගී මාර්ගයන් වෙත ඉහළ මට්ටමේ ප්‍රවේශයක් සඳහා පහසුකම් සැලසීම පිණිස කි.මී.100,000 ක "විකල්ප මාර්ග ජාලයක්" සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2020 ජනවාරි 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමත ලැබී තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වර්ෂ 2020 සිට 2023 දක්වා වූ කාල සීමාව තුල වැය ශීර්ෂ අංක 2506-යටිතල පහසුකම් සංවර්ධනය යටතේ රු.මිලියන 127,770.94 ද, 2024 වර්ෂයේ වැය ශීර්ෂ අංක 2104- ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ රු. මිලියන 36,073.76 ක වියදමක්ද දරා තිබුණි. තවද, 2025 වර්ෂයේ වැය

ශීර්ෂ අංක 2104- ගොඩනැඟිලි සහ ඉදිකිරීම් යටතේ රු. මිලියන 6,750 ක වියදමක්ද දරා තිබුණි. එසේ වුවද 2022 අප්‍රේල් 26 දිනැති "ජාතික අයවැය වක්‍රලේඛ 03/2022" අනුව වැඩ කටයුතු සීමා කර තිබුණි.

II. මෙම ව්‍යාපෘතිය යටතේ වැඩ සිදු කරමින් පැවති කි.මී.11,550 කින් කි.මී.1,610 ක මාර්ග දුර ප්‍රමාණයක් අවම පිරිවැයකින් ආරක්ෂිතව ගමනාගමනයට සුදුසු අයුරින් පුනුරුත්ථාපනය කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදී තිබුණි. නමුත් 2025 නොවැම්බර් 25 දිනැති අංක 61/2025 අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව කි.මී.17,550 ආවරණය වන පරිදි කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කර පැවතිය ද ඉතිරි මාර්ග ප්‍රමාණයේ කාර්යසාධනය සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(උ) **මුලතිව් - කෝකිලායි - පුල්මුඩේ මාර්ගයෙහි කෝකිලායි කළපුව හරහා නව පාළමක් ඉදිකිරීම**

වෙරළ තීරය ඔස්සේ නැගෙනහිර පළාත සහ උතුරු පළාත අතර ගොඩබිම මතින් අඛණ්ඩ සම්බන්ධතාවයක් සැපයීම පිණිස මුලතිව් - කෝකිලායි - පුල්මුඩේ මාර්ගයෙහි කෝකිලායි කළපුව හරහා නව පාළමක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව යූරෝ මිලියන 48.88 ක (වැට් රහිත) ගිවිසගත් කොන්ත්‍රාත් මුදලකට වෙක් ජනරජයේ Bilffinger MCE slang s.r.o. වෙත ප්‍රදානය කිරීමට 2014 ජූලි 10 දිනැති අංක.අමප/14/0830/505/021/ටීබීආර් දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. 2021 හා 2022 වර්ෂවල පිළිවෙළින් රු.මිලියන 1,015 ක් හා රු.මිලියන 5 ක ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදුකර තිබුණද මෙම ව්‍යාපෘතිය මේ දක්වා ක්‍රියාත්මක වී නොතිබුණි.

4.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

(අ). ග්‍රාමීය මාර්ග අංශය

I. ග්‍රාමීය මාර්ග අංශය යටතේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය, ග්‍රාමීය පාලම් සංවර්ධනය හා ග්‍රාමීය මාර්ග වලට අදාළ ව්‍යුහයන් වැඩි දියුණු කිරීම් සිදු කරන අතර මෙම අංශය සඳහා ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන (117-2-4-61-2104) හා ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් වැඩසටහන (117-2-4-67-2104) යටතේ සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 13,500 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉහත ප්‍රතිපාදන මුදලින් රු.මිලියන 5,347 ක් ඉතිරිව තිබුණු අතර ඒ අනුව ප්‍රතිපාදන උපයෝජනය සියයට 60ක් පමණ විය.

II. කාර්යසාධන වාර්තාව අනුව ග්‍රාමීය මාර්ග අංශය විසින් සමාලෝචිත වර්ෂය තුල ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති 3,189 ක් පිරිනමා තිබුණි. එයින් ව්‍යාපෘති 2,702 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් පිරිනමා තිබුණු අතර අනුමැතිය ලබාදී මාස 02 සිට මාස 07 දක්වා කාලයක් ගතවී තිබුණු එකතුව රු.මිලියන 746.7 ක් වූ ව්‍යාපෘති 198 ක වැඩ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර හෝ නොතිබුණි. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ප්‍රමාණවත් පසු විපරම් ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි.

4.2. විදේශ ආධාර ව්‍යාපෘති

4.2.1. කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (CSREIP) විෂය පථය වෙනස්වීම 2019 - 2025

(අ) ව්‍යාපෘති අරමුණු හා ප්‍රමුඛතා සැලසුම් අනුව කටයුතු නොකිරීම

ආසියානු සංවර්ධන බැංකු ණය අරමුදල් යටතේ 2019 වර්ෂයේදී එ.ජ.ඩො. මිලියන160 ක් වූ ව්‍යාපෘති ප්‍රතිපාදනය 2021 වර්ෂයේදී පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් එ.ජ.ඩො. මිලියන 125 දක්වා අඩුකර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යභාරය සැලසුම්කළ පරිදි 2024 දෙසැම්බර් 31 දිනට අවසන් නොවීම හේතුවෙන් ව්‍යාපෘති කාලය 2026 දෙසැම්බර් 31 දක්වා දීර්ඝකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

I. ව්‍යාපෘතිය යටතේ සැලසුම් කරන ලද කාර්යයන් සැලසුම් කරන ලද කාලය තුළ ඉටු නොකිරීම මත ව්‍යාපෘති කාලය වර්ෂ 2 කින් දීර්ඝ කිරීම හේතුවෙන් ව්‍යාපෘති ණය පොලිය එ.ජ.ඩො. මිලියන 7.96 සිට එ.ජ.ඩො. මිලියන 16 දක්වා සියයට 100 න්ද, ප්‍රයාපන ගාස්තු එ.ජ.ඩො. මිලියන 0.74 සිට එ.ජ.ඩො. මිලියන 1.03 දක්වා සියයට 40 ක් ද, වශයෙන් ව්‍යාපෘතියෙහි සමස්ථ මූල්‍ය පිරිවැය (Financial Charges) එ.ජ.ඩො.මිලියන 8.71 සිට එ.ජ.ඩො. මිලියන 17.03 දක්වා සියයට 96 කින් ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයට සාපේක්ෂව මූල්‍ය පිරිවැය එ.ජ.ඩො. මිලියන 8.32 ක අමතර පිරිවැයක් දැරීමට සිදුව ඇති බවත්, ඒ අනුව ව්‍යාපෘතියේ මූල්‍ය පිරිවැය මුළු ණය මුදලෙන් සියයට 7 සිට සියයට 14 ක් දක්වා ඉහළ යාම හේතුවෙන් සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට ඇති අරමුදල් මූල්‍ය පිරිවැය ආවරණය කිරීම සඳහා යෙදවීමට සිදුවී තිබුණි.

II. 2019 වර්ෂයේ ව්‍යාපෘතිය ආරම්භයේදී ක්‍රියාවට නැංවීමට සැලසුම් කර තිබූ දුම්රිය නඩත්තු ධාරිතාවය ඉහළ නැංවීම, දුම්රිය ධාවනය හා මගී ආරක්ෂාව ඉහළ නැංවීම සහ පුහුණු මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම, කාර්යමණ්ඩල පුහුණු හා සංවර්ධනය කිරීමේ වැඩ සඳහා එ.ජ.ඩො. මිලියන 30.58 ක් වෙන්කර තිබුණද, 2025 දෙසැම්බර් 31 වනවිට එම දිගුකාලීන ප්‍රතිලාභ ලැබිය හැකි ප්‍රාග්ධන වත්කම් ප්‍රසම්පාදනය හා මානව සම්පත් සංවර්ධන කටයුතු සම්පූර්ණයෙන් ඉවත් කර කෙටිකාලීන ප්‍රග්ධන නඩත්තු සඳහා එ.ජ.ඩො. මිලියන 2.06 ක්ද, වැඩිවූ මූල්‍ය පිරිවැය ආවරණය සඳහා එ.ජ.ඩො. මිලියන 8.32 ක්ද, උපදේශන සේවා සඳහා එ.ජ.ඩො. මිලියන 9.6 ක්ද වශයෙන් එ.ජ.ඩො. මිලියන 19.98 ක් යොදවා තිබුණි.

III. නිමවුම් 5 යටතේ එ.ජ.ඩො. මිලියන 6.30 ක් යොදා ගනිමින් 2019 නොවැම්බර් 28 දින සිට මාස 18 ක කාලයකින් නිම කිරීමට සැලසුම් කරන ලද මහනුවර තදාසන්න දුම්රිය මාර්ග සංවර්ධනය සඳහා වූ විස්තරාත්මක සැලසුම් සකස් කිරීමේ උපදේශන සේවාව සඳහා 2025 දෙසැම්බර් 31 දිනට වසර 5 ක කාලයක් ගත කර රු. මිලියන 694.35 ක් වැයකර තිබියදී ක්‍රියාත්මක වීම 2023 වර්ෂයේදී උපදේශක සමාගම විසින් අත්හිටුවා තිබුණි. උඩරට දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීම තුළින් මහනුවර නගරාශ්‍රිත වාහන තදබදයට තිරසර විසඳුම් ලබාදීමෙන් ප්‍රවාහන ක්ෂේත්‍ර සංවර්ධනට දායකවීම සඳහා වූ අරමුණු කරගනිමින් ව්‍යාපෘතිය යටතේ සැලසුම් කළ මෙම උප ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමකින් තොරව නැවතී තිබුණු අතර ඒ සඳහා දරන ලද සෘජු පිරිවැය

මෙන්ම ප්‍රමාදයන් හේතුවෙන් දරන ලද මූල්‍ය පිරිවැයද මෙතෙක් නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

IV. 2025 පෙබරවාරි 21 දිනැති ආසියානු සංවර්ධන බැංකු මෙහෙවර (ADB Mission) වාර්තාව හා 2025 ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත අනුව ව්‍යාපෘතිය යටතේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තිරසාරභාවය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය සඳහා නව උපදේශන සේවා දෙකක් ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණද, 2025 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම ඒ අනුව සංශෝධනය කර නොතිබුණි.

(ආ) කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

I. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ දුම්රිය මාර්ග ආශ්‍රිත දේපල උපරිම ඵලදායීතාවයකින් යුතුව කළමනාකරණය කිරීමේ උපායමාර්ගික අරමුණු ළඟාකර ගැනීම සඳහා දුම්රිය මාර්ග ආශ්‍රිත "ප්‍රවාහනය පාදක කරගත් සංවර්ධන" (Transit Oriented Development - TOD) සැලසුම් සකස් කිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට 2019.04.10 දින සිට 2020.04.09 දක්වා මාස 12 ක කාලසීමාවක් සඳහා උපදේශන සේවාවක් ලබාගෙන තිබුණු අතර, එහි මූලික අපේක්ෂාව වූයේ ව්‍යාපෘතියේ දුම්රිය දෙපාර්තමේන්තුවේ දේපල කළමනාකරණය සහ ප්‍රවේශ පත්‍ර නොවන ආදායම් උත්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණික වාර්තා සහ උපායමාර්ගික රාමුවක් සකස් කිරීමයි. එහිදී 2015.09.09 සිට 2017.09.09 දක්වා ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් හා ව්‍යාපෘති මෙහෙයුම් කමිටු සභාපති ලෙස කටයුතු කරමින් සිටි ප්‍රධාන නිලධාරියෙකු 2019.04.10 දින ව්‍යාපෘතිය විසින් උපදේශකයෙකු ලෙස බඳවාගෙන තිබුණි. මෙම නිලධාරියා ADB Consultant Guidelines 1.11 (c) ප්‍රකාරව "අයුතු තරහකාරී වාසියක්" සහිත පුද්ගලයකු ලෙස හඳුනාගත යුතු වුවත් එසේ හඳුනාගෙන නොතිබුණි. තවද, ව්‍යාපෘති ඒකකය විසින් විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා මෙම උපදේශකවරයාගේ සුවිශේෂී තත්ත්වය පිලිබඳව ආසියානු සංවර්ධන බැංකුව වෙත එම බඳවා ගැනීම සඳහා වූ (ADB) අනුමැතිය (NOL) ලබාගැනීමේදී හෙළිදරව් කළ යුතුව තිබූ බව ආසියානු සංවර්ධන බැංකුව විසින් දන්වා ඇතත්, එම තොරතුරු අනාවරණය කිරීමකින් තොරව ලබාගත් අනුමැතියක් මත සිදුකළ මෙම ප්‍රසම්පාදනයය හරහා, 2019 ව්‍යාපෘති පරිපාලන අත්පොතේ (PAM - VI පරිච්ඡේදය) සඳහන් "සර්වසාධාරණත්වය" සහ "පාරදෘශ්‍යභාවය" පිලිබඳව මූලධර්මයන්ද ඉටු වී නොමැති වීම බව නිරීක්ෂණය විය.

II. මෙම ගිවිසුම 2023 දෙසැම්බර් 27 වන දින කොන්ත්‍රාත්කරු සමග අත්සන් කළද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1(ආ) ප්‍රකාරව ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියළු කටයුතු ඉටුකර ඇති බවට ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සහතික වියයුතු වුවද යෝජිත ඉදිකිරීම් භූමිය සඳහා ඉඩම පිරිසිදු කිරීමේ කාර්යයද නිසි පරිදි සිදු නොවීම හා ප්‍රමාද වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා බාධා වී තිබුණි.

තවද, කර්මාන්ත ශාලාව සඳහා උඩිස් දොඹකර (Overhead crane) දෙකක් සැපයීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව විදේශීය නිෂ්පාදකයින් 5 දෙනෙකු නිර්දේශකර තිබුණි. ඉන් එක් නිශ්පාදකයෙකුගෙන් මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු 2025 ජනවාරි 21 දින අනුමැතිය ඉල්ලා තිබුණද, ඒ සඳහා අනුමැතිය ලබා දීමට 2025 ජුනි 24 දින දක්වා ප්‍රමාද වී තිබීම හේතුවෙන් එම දොඹකර සපයා ස්ථාපිත කිරීමේ කටයුතු ප්‍රමාද වී තිබුණි.

III. කොන්ත්‍රාත්කරු සමග වූ ගිවිසුම ප්‍රකාරව වටිනාකම රු.මිලියන 2,040.69 ක සම්පූර්ණ කාර්යභාරය 2024 දෙසැම්බර් 27 වන විට සම්පූර්ණකර තිබිය යුතු වුවත් ව්‍යාපෘති කළමනාකරණය, දුම්රිය දෙපාර්තමේන්තුව, සහ කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදයන් හේතුවෙන් අවස්ථා ගණනාවකදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර වසර 2 ½ ක(මාස 30) කාල දිගුවක් ලබා දී 2026 ජූලි 27 දින වන විට කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කළ යුතුව තිබුණද, 2026 පෙබරවාරි වන විට ව්‍යාපෘතියේ අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 85 ක් වුවද තත්‍ය භෞතික ප්‍රගතිය සියයට 63 ක් පමණක් වී තිබුණි.

4.2.2. කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය- ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියෙහි වර්තමාන කාර්යසාධනය

(අ) නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් නිවාස ලබා ගැනීම

කැලණිවැලි දුම්රිය මාර්ගයේ සංවර්ධන කටයුතු හේතුවෙන් බලපෑමට ලක්වන පවුල් වලින් වැඩි ප්‍රමාණයක් අනවසර පදිංචිකරුවන් බවත්, ඔවුන් ප්‍රතිෂ්ඨාපනය කිරීම ආසියානු සංවර්ධන බැංකුවේ ආරක්ෂණ ප්‍රතිපත්තියට සහ ශ්‍රී ලංකා රජයේ ස්වේච්ඡාවෙන් තොරව නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය (NIRP) අනුව සිදු කළයුතු බවත් තීරණය කර තිබුණි. ඒ අනුව එම දුම්රිය මාර්ග අයිතියේ (RoW) පදිංචි පවුල් ඒකක 1244 ක් නැවත පදිංචි කිරීමට අවශ්‍ය නිවාස රු.මිලියන 5,412 කට මිලදි ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සහ ප්‍රවාහන අමාත්‍යාංශය (MOT) 2017 හා 2018 වර්ෂවලදී අවබෝධතා ගිවිසුම්වලට එළඹ තිබුණු අතර ගිවිසුම්ගත දින සිට වසර 2 ක් ඇතුළත ඒම නිවාස ඉදිකර භාරදියයුතු විය. ඒ අනුව නාවල 01 අදියරෙන් නිවාස සංකීර්ණයෙන් නිවාස ඒකක 406 ක් ද, නාවල 02 අදියර නිවාස සංකීර්ණයෙන් නිවාස ඒකක 144 ක් ද වශයෙන් මුළු නිවාස ඒකක 550 ක් මෙතෙක් භාරදී නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

I. නාවල 01 අදියර නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් වල භෞතික ප්‍රගතිය සියයට 39 ක්වන අතර එහි ඉදිකිරීම් කටයුතු වසර 03 කට වැඩි කාලයක් තිස්සේ තාවකාලිකව නතර කර තිබීම හේතුවෙන්, ඉදිකිරීම් නැවත ආරම්භ කිරීමෙන් පසු නිවාස ඒකකයක ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 5 සිට රු.මිලියන 10 දක්වා වැඩිවන බවත් මේ හේතුවෙන් නිවාස ඒකක 406 වෙනුවට නිවාස 100 ක් සඳහා රු.මිලියන 10 බැගින් ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2025 මාර්තු 17 දිනැතිව හිමිවී තිබුණද, එම අනුමැතිය ලැබී මාස 06 කට පසුව එම අවබෝධතා ගිවිසුම කෙටුම්පත් කර 2025 නොවැම්බර් 06 දින ප්‍රවාහන අමාත්‍යාංශය වෙත යොමු කර ඇතත් 2026 පෙබරවාරි මස වන විටත් අවබෝධතා ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

II. නාවල අදියර 02 නිවාස සංකීර්ණයේ නිවාස සඳහා ගෙවිය යුතු රු.මිලියන 576 ක වටිනාකමින් රු.මිලියන 544.32 ක් එනම් සියයට 95 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගෙවා තිබුණද, අප ජලනල පද්ධති සවිකර නොතිබීමෙන් නිවාස ඒකක 144 ක් මෙතෙක් ව්‍යාපෘතිය වෙත භාරදී නොතිබුණි.

III. බලපෑමට ලක්වන පවුල් අතුරින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආර්ථික ප්‍රතිලාභ කමිටුව (EAC) මඟින් පවුල් 219 ක ප්‍රතිලාභ නිර්ණය කර නොතිබූ අතර පවුල් 05 ක ප්‍රතිලාභ වටිනාකම් තක්සේරු කර නොතිබුණි.

IV. අදියර 1 හි 4 කොටසේ සංවර්ධන පිරිවැය ලබා දීමට තීරණය කරන ලද පවුල් 06 ක් සහ ස්වයං ප්‍රතිෂ්ඨාපනය සඳහා එකඟ වූ පවුල් ඒකක 04 ක් ඉවත් කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

V. නඩු කටයුතු හේතුවෙන් පවුල් ඒකක 14 ක්ද, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA) විසින් ඉදිකරන ලද නිවාස 66 ක් සහ ඉඩම් අයිතිය කොළඹ මහ නගර සභාව සහ දුම්රිය දෙපාර්තමේන්තු යන ආයතන දෙකටම අයත් වීම හේතුවෙන් නිවාස 9 ක්ද වශයෙන් නිවාස ඒකක 101 කට අදාලව මෙතෙක් නොවිසඳුණු ගැටලු පැවතීමෙන් නැවත පදංචි කිරීමේ හා ඉඩම් නිදහස්කර ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම වී නොතිබුණි.

VI. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් සුදුසු පියවර ගෙන නොතිබුණු බවත්, 2018 වසරේ සිට නිවාස ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමේ දිනය අවස්ථා ගණනාවක දී දීර්ඝ කර නව අවබෝධතා ගිවිසුම් වලට එළඹ තිබුණද, 2025 වසර අවසන් වන විටත් කැලණිවැලි මාර්ග අයිතිය තුළ සිටින පවුල් නැවත පදිංචි කිරීමේ කටයුතු නිම කිරීමට නොහැකිවී තිබුණි.

VII. බලපෑමට ලක්වන පුද්ගලයින්ගේ ප්‍රතිස්ථාපන කිරීමේ කටයුතු ප්‍රමාද වීම හේතුකොට ගෙන දුම්රිය මාර්ගය සංවර්ධන කටයුතු තවදුරටත් ප්‍රමාද වී තිබුණු අතර එසේම වන්දි ගෙවා නිදහස් කර ගත් දුම්රිය රක්ෂිතය තුල නැවතත් අනවසර ඉදිකිරීම් ඇතිවීමේ අවධානමක් පවතින බවත්, තක්සේරු කිරීම් හා පවරාගැනීම් ප්‍රමාදවීම අමතර පිරිවැය ඇතිවීමටත්, අඛණ්ඩව ව්‍යාපෘති පරිපාලන පිරිවැය ඉහළ යාමටත් හේතු වී තිබුණි.

(ආ) කැලණිවැලි දුම්රිය මාර්ගයේ පැගිරිවත්ත, පාදුක්ක කොටස තුළ ජීවත්වූ පවුල් නැවත පදිංචි කිරීම.

I. කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියට අදාලව හදුනාගත් ප්‍රධාන නිමවුමක් ලෙස ආසියානු සංවර්ධන බැංකුවේ ණය ප්‍රතිපාදන උපයෝගි කරගෙන කැලණිවැලි දුම්රිය මාර්ගයේ පැගිරිවත්ත, පාදුක්ක කොටස තුළ දුම්රිය මාර්ගයට ඉතා ආසන්නව ජීවත්වූ පවුල් 120 කට මාලපල්ලෙහි සහාධිපත්‍යක් ඉදිකර ප්‍රතිස්ථාපනය කිරීම සඳහා නිවාස ඒකක 120 ක් රු.මිලියන 1,317.01 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2021 ජුනි 21 සිට 2024 ජුනි 04 දක්වා කාලය තුළ ඉදිකිරීම සඳහා පෞද්ගලික සමාගමක් සමග ගිවිසුම්වලට එළඹ තිබුණි. එම ඉදිකිරීම් ප්‍රමාද වීම හේතුවෙන් කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 2,175.53 ක් ලෙස සංශෝධනය කර කොන්ත්‍රාත් කාලය 2024 දෙසැම්බර් 10 දක්වා දීර්ඝ කර තිබූ බැවින් නිවාස ඒකකයක මිල රු.මිලියන 18.13 ක් වී තිබුණි.

II. නැවත පදිංචිකිරීමේ සැලැස්මට අනුව ප්‍රතිලාභීන් සඳහා නිවාස ලබා දීමේදී ඔවුන් පදංචිව සිටි නිවසේ බිම් ප්‍රමාණය හා පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින් ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් යටතේ වර්ග අඩි 400 හා 500 ප්‍රමාණයේ නිවාස ලබා දීමට තීරණය කර තිබුණද, මාලපල්ල නිවාස සංකීර්ණයේ නිවාස ඒකකයක වර්ග අඩි ප්‍රමාණය 550 ක් වීමෙන් නැවත පදිංචිකිරීමේ සැලැස්මට අනුව තිබියයුතු වර්ග අඩි ප්‍රමාණය අනුව ඉදිකිරීම් සිදු වී නොතිබුණි.

4.3 ප්‍රසම්පාදනයන්

(අ) 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.3(i) මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන කළමනාකරණ අංශයක් (Procurement Management Division) පිහිටු වීම ප්‍රසම්පාදන අස්තිත්වයේ කාර්යභාර්යක් සහ වගකීමක් වුවද, වරාය හා සිවිල් ගුවන් සේවා අංශය විසින් ප්‍රසම්පාදන කළමනාකරණ අංශයක් පිහිටුවා නොතිබුණි.

(ආ) 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.5 (අ) මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන අස්තිත්වය වෙනුවෙන් භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා ප්‍රසම්පාදනයන් නිසි පරිදි භාරගැනීම හා වාර්තා කිරීමට ප්‍රධාන ගණුන්දීමේ නිලධාරී/ ගණුන්දීමේ නිලධාරී විසින් භාරගැනීමේ කමිටුවක් (Acceptance Committee) පත්කළ යුතු වුවද වරාය හා සිවිල් ගුවන් සේවා අංශය විසින් භාරගැනීමේ කමිටුවක් පත්කර නොතිබුණි.

(ඇ) 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 8.5.3.(ඇ) අනුව අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වන කිසිදු නිලධාරියෙකු, අමාත්‍යාංශ ප්‍රසම්පාදන අභියාවන කමිටුවක/ කමිටුවල සේවය සඳහා පත්නොකල යුතු වුවද 2025 සැප්තැම්බර් 17 දිනැති ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ අංක MPS/ACC/01/02/AUDIT දරන ලිපිය මඟින් වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ ප්‍රධාන ගණකාධිකාරිවරයා අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ලෙස පත්කර තිබූ අතර එම නිලධාරියා අමාත්‍යාංශ ප්‍රසම්පාදන අභියාවන කමිටු සමාජිකයකු ලෙස පත්කර තිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

(අ) 2024 වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තා තොග පොත් හා ලේඛන සම්බන්ධව කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී, බඩු වට්ටෝරු පොත අනුව ශේෂය හා භාණ්ඩ සමීක්ෂණය අනුව භෞතිකව අනාවරණය වූ ශේෂයන් අතර පැවති වෙනස්කම් සම්බන්ධයෙන් වරාය හා සිවිල් ගුවන් සේවා අංශය මු.රෙ 757 (2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදය මඟින් හඳුන්වා දෙන ලද මු.රෙ 756 (6) ප්‍රකාරව ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 15 ට පෙර පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකළයුතු වුවත් වරාය හා සිවිල් ගුවන් සේවා අංශය විසින් එම කටයුතු විගණිත දිනය වන 2025 අගෝස්තු 15 වන විටත් සිදුකර නොතිබුණි.

(ඇ) පැරණි බඩු වට්ටෝරු පොතෙන් නව බඩු වට්ටෝරු පොතකට ශේෂයන් රැගෙන යාමේදී පැරණි පොතෙහි පවතින අයිතම ශේෂයන් සියල්ල මහහැරීමකින් තොරව නව බඩු වට්ටෝරු පොතට රැගෙන යා යුතු වුවත් වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ මාධ්‍ය අංශයේ පැරණි බඩු වට්ටෝරු පොතෙහි පවතින අයිතම 22 ක් නව බඩු වට්ටෝරු පොත වෙත රැගෙන ගොස් නොතිබුණු අතර පැරණි බඩු වට්ටෝරු පොතෙන් නව බඩු වට්ටෝරු පොතට ගෙනයාමේදී පැරණි බඩු වට්ටෝරු පොතෙහි අවසාන ශේෂය හා නව බඩු වට්ටෝරු පොතෙහි ආරම්භක ශේෂය අසමාන වන අවස්ථා පැවතුණි.

(ඉ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2023 අගෝස්තු 24 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 හි 04 (iii) (ඇ) ප්‍රකාරව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් වාහන මොඩියුලය සඳහා නිකුත් කර ඇති අත්පොතෙහි 4.1.2 අනුව වාහනයේ අයිතිය පිළිබඳව නොසලකා, ආයතනය විසින් භාවිතා කරන සියලුම වාහන ඇතුළත් කළ යුතු බව දක්වා තිබුණද වරාය හා සිවිල් ගුවන් සේවා අංශය විසින් භාවිතා කරනු ලබන මෝටර් රථ දෙකක් මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය තුළ ඇතුළත් කර නොතිබුණි.

(ඊ) මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2024 අප්‍රේල් 30 දිනැති වත්කම් කළමණාකරණ චක්‍රලේඛ අංක 02/2024 හා මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියෙහි වාහන මොඩියුලය සඳහා වන අත්පොතෙහි 4.4.1 අනුව වාහන වල වටිනාකම තක්සේරු කිරීම සිදු කළ යුතු අතර 2023 දෙසැම්බර් 31 දිනට පෙර තක්සේරුව සිදුකර නිවැරදි අගය මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියෙහි ඇතුළත් කළ යුතු වුවද වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ වාහන 21 කට අදාළව එසේ තක්සේරු කරන ලද නව වටිනාකම් පිළිබඳව විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(උ) අංක 04/2018, 02/2019 සහ 05/2021 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය මඟින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයෙහි සඳහන් පරිදි සෑම වර්ෂ 05 කට වරක් මූල්‍ය නොවන වත්කම් තක්සේරු කල යුතු වුවද, ප්‍රවාහන අංශය සතු මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ඌ) ප්‍රවාහන අංශය සතු වටිනාකම සඳහන් නොවන අස්ථානගත වාහන 09 ක් වූ අතර, මාතර බෙලිඅත්ත දුම්රිය ව්‍යාපෘතිය සඳහා ආනයනය කරන ලද අමාත්‍යාංශය විසින් ආනයන බදු හා ගාස්තු වශයෙන් රු.මිලියන 23.33 ක් ගෙවා තිබුණු එම ව්‍යාපෘති කටයුතු අවසන් වීමේදී අමාත්‍යාංශය වෙත පවරා නොගත් වෙනත් පාර්ශවයන් විසින් පරිහරණය කරනු ලබන කැබ් රථ 06 ක් විය.

4.5 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

(අ) දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - පළමු පැකේජය කොට්ටාව සිට දොඩංගොඩ

කොට්ටාව සිට දොඩංගොඩ දක්වා වන දක්ෂිණ අධිවේගී මාර්ගයේ පළමු පැකේජය සඳහා වූ කොන්ත්‍රාත්තුව 2005 සැප්තැම්බර් 08 දින China Harbour Engineering Company (Group) වෙත රු.මිලියන 9,585.87 ක මුදලකට පිරිනමා තිබුණි. මෙහි මූලික කොන්ත්‍රාත් කාලය 2009 සැප්තැම්බර් 18 දින අවසන් වීමට නියමිතව තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් විය.

I. කාල දීර්ඝ කිරීම් (EOT) සහ කොන්ත්‍රාත් විෂය පථයේ වෙනස්කම් කිහිපයකින් පසු 2011 නොවැම්බර් 23 දින අවසන් කිරීමේ සහතිකය (Certificate of Substantial Completion) නිකුත් කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඔහුගේ නිම කිරීමේ ප්‍රකාශයේදී (Statement at Completion) රු.මිලියන 15,221.24 ක් වූ බිල්පත් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පත් කළ ව්‍යාපෘති කමිටුව ලබාදී තිබුණු නිර්දේශය වූ අවසන් බිල්පත් වටිනාකම වූ රු.මිලියන 4,646.23 ක අගයට එකඟ වන බව 2023 ඔක්තෝබර් 24 දින කොන්ත්‍රාත්කරු විසින් දන්වා තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාත්කරුට එම අවස්ථාවේ ගෙවීම් කර නොතිබුණි.

කොන්ත්‍රාත්කරු විසින් 2018 ජනවාරි 22 දින අවසන් ප්‍රකාශ බිල්පත ඉදිරිපත් කර තිබියදීත් එම ගෙවීම් කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව සිදුනොකිරීම සම්බන්ධව හා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම වගකීම් පැහැරහැර ඇති බවත් එමගින් රජයට අධික මූල්‍ය පිරිවැයක් දැරීමට සිදුවිය හැකි බවත් සඳහන් කර තිබුණි. 2024 ජුනි 30 දිනැති අංක 31/2024 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි අවධාරණය කර තිබුණි.

II. අමාත්‍යාශය විසින් ඉදිරිපත් කළ ඉහත අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද 2024 ජූලි 30 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය පරිදි කොන්ත්‍රාත්කරුට ගෙවීමට නිර්දේශිත රු.මිලියන 7,912.06 ක වටිනාකම ගෙවීම සඳහා මුළු ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 21,978.07 සිට රු. මිලියන 29,890.13 දක්වා නිසි ක්‍රමවේදය අනුගමනය කරමින් සංශෝධනය කිරීමට අනුමැතිය ලබාදී තිබුණද ඊට පටහැනිව ගෙවීම් කිරීම සඳහා 2024 වර්ෂය තුල පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි.

III. කොන්ත්‍රාත්කරුගේ හිඟ ගෙවීම් විමර්ශණය සඳහා පත්කළ කමිටුවේ 2024 දෙසැම්බර් මස ලබාදී තිබුණු වාර්තාව ප්‍රකාරව අමතර ගෙවීම් සිදුකිරීමට 2024 සැප්තැම්බර් 06 දින කොන්ත්‍රාත්කරු සමග අත්සන් කළ නිරාකරණ ගිවිසුම නිසි ක්‍රියා පටිපාටිය උල්ලංඝනය කිරීමක් හා වගකීම් පැහැරහැරීමක් බවට තීරණය කර තිබුණි එසේම ස්ථාවර ප්‍රසම්පාදන කමිටු නිරීක්ෂණ ප්‍රකාරව මීට අදාලව පවතින තොරතුරු සීමිත බව දක්වා තිබුණි. මෙවැනි බැරකම් නිරවුල් නොවූ ව්‍යාපෘතියක අදාල වගකීම් නිරවුල්වන තුරු ලිපි ලේඛණ ආරක්ෂා කිරීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

IV. FIDIC පොදු කොන්දේසි 14.12 වගන්තිය ප්‍රකාරව අවසාන ගෙවීම් සහතිකය (Final Payment Certificate) නිකුත් කිරීමට ප්‍රථම හිමිකම්පෑමේ අයිතිය අවසන් කිරීමේ ලිපියක් (Discharge Letter) කොන්ත්‍රාත්කරුගෙන් ලබාගැනීම අදාල වගකිවයුතු නිලධාරීන් පැහැරහැරීම නිසා ව්‍යාපෘතිය අවසන්වී සැලකියයුතු කාලසීමාවකින් පසුව වුවද ඉහත පරිදි විවිධ හිමිකම්පෑම් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉදිරිපත්වීමේ හැකියාව බැහැර නොවන බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර 2024 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් ලබා දී තිබූ නිර්දේශ ප්‍රකාරව වගකීම් පැහැර හැර ඇති නිලධාරීන්ට විරුද්ධව පරීක්ෂණයක් පවත්වා විනය ක්‍රියාමාර්ග ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ). අධිවේගී මාර්ග පද්ධතියේ පරිශීලක ගාස්තු රැස්කිරීම

2019 නොවැම්බර් මස සිට 2024 ජූලි දක්වා වූ වර්ෂ 04 මාස 09 ක් තුළ ප්‍රවේශ ටිකට් පත් (Entry Tickets) 133,840,213 ක් නිකුත් කර තිබුණු අතර ඉන් වාහන 18,291,430 ක් සඳහා පිටවීමේ ටිකට් පත් (Exit Ticket) නිකුත් කර නොතිබීම හේතුවෙන් එම කාලය තුළ අධිවේගී මාර්ගයන්හි ගමන්කළ වාහනයකින් අයකළ සාමාන්‍ය ගාස්තුව පදනම් කරගෙන සිදු කළ ගණනය කිරීම් අනුව, අධිකාරියට අහිමි වූ ආදායම දළ වශයෙන් රු. මිලියන 4,614.47 ක් පමණ වන අතර දෛනික ආදායම් අහිමි වීම රු.මිලියන 01 කට ආසන්න වී තිබුණි. එමගින් අධිවේගී මාර්ග ආදායම් විවිධ උපක්‍රම භාවිතාකර සාවද්‍ය පරිහරණයට හා වංචාවන්ට ලක්කර තිබුණු නමුත්, වගකිව යුතු මුදල් අයකැමියන් හඳුනාගෙන විනයානුකූලව කටයුතු කිරීමට හා ඒම

අඩුපාඩු වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අධිවේගී මාර්ග කළමනාකරණය කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, වරාය පිවිසුම් ව්‍යාපෘතිය යටතේ විදුලුත් ගාස්තු රැස්කිරීමේ පද්ධතියක් සකස්කිරීමට රු. මිලියන 176.48 දරා තිබුණද, පසුව එය 2023 වර්ෂයේදී අවලංගු වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2019 වර්ෂයේ සිට වසර 04 මාස 09 ක කාල සීමාව තුළ ප්‍රවේශ වීමේ කවුළුවේ සිටි අයකැමිවරුන් විසින් තම අභිමතය පරිදි හෝ නොසැලකිල්ල හේතුවෙන් වාහනයේ වර්ගය (Category) වැරදියට සටහන් කළ ඇතුල් වීමේ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම හෝ වාහන පිටවීමේ කවුළුවේ සිටින අයකැමිවරුන් විසින් තම අභිමතය පරිදි වාහනයේ වර්ගය වෙනස් කිරීම හේතුවෙන් වර්ගීකරණය වෙනස් කරන (Category Change) ලද ටිකට්පත් 241,964 ක් වාර්තා වී තිබුණි. මෙවැනි අවස්ථා පාලනය කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් 2019 වර්ෂයේ සිට මේ දක්ව එවැනි දෝෂ වාර්තා වීමේ ප්‍රවණතාවය (Trend) වර්ධනය වී තිබුණි.

මෙම අක්‍රමිකතා අවම කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් නිසි අධීක්ෂණයක් සිදුකර නොතිබුණු බවද නිරීක්ෂණය විය.

4.6 පාඩු හා හානි

(අ). කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයෙහි උපාංග සොරකම් කිරීම හා විදුලි රැහැන් නැවත ක්‍රියාකාරී තත්ත්වයට පත්කිරීම.

I. කොළඹ කටුනායක අධිවේගී මාර්ගය 2020 වර්ෂයේ සිට මහජනයාට විවෘත කර තිබූ අතර අධිවේගී මාර්ගයන්හි වැටෙහි මධ්‍ය තීරුවේ තඹ කම්බි කැපීම, විදුලි පහන් කණු කපා ගෙන යාම ආදී සොරකම් සිදු වී තිබූ බව වාර්තා වී තිබුණි. 2021,2022,2023 යන වර්ෂ 03 හි සිදුවී ඇති සොරකම් 100 න් සොරකම් 11 ක වටිනාකම රු.මිලියන 580 ක් ලෙස ගණනය කර තිබුණි. වාර්තා වී ඇති අනෙකුත් සොරකම් 89 ක වටිනාකම හඳුනා ගත නොහැකි සොරකම් ද පවතින බව නිරීක්ෂණය විය. මෙම මාර්ගයේ මාර්ග විදුලි රැහැන් සැලසුම් කිරීමේ දී මධ්‍ය තීරුවේ එලා ඇති විදුලි රැහැන් පද්ධතිය සම්පූර්ණ කොන්ක්‍රීට් ආවරණයකින් තොරව අඩි 03 ක අඩකව විෂ්කම්භය සහිත හියුම් පයිප්පයක් මගින් (Hume Pipe) අර්ධ වශයෙන් ආවරණය කර තිබූ අතර එම සැලසුම් අනුව ඉතා පහසුවෙන් එම විදුලි රැහැන් කපා ඉවත් කර ගැනීමේ හැකියාවක් පැවතුණි. එම සැලසුම් කිරීමේ දෝෂය ද මෙසේ විදුලි රැහැන් සොරකම් කිරීමට හේතුවක් වී ඇති බව ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. පළමු සොරකම සිදුවූ 2021 වර්ෂයේ දී සුදුසු ආරක්ෂිත ක්‍රමවේදයක් හඳුන්වා නොදීම තුලින් හා වගකිව යුතු අධීක්ෂණ නිලධාරීන් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් මාර්ගයේ විදුලි රැහැන් හා උපාංග සොරකම අඛණ්ඩව වර්ධනය වීමට හේතු වී තිබූ බව නිරීක්ෂණය විය. පළමු කි.මී.10 සඳහා සිදුකර ඇති ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී සම්පූර්ණ මාර්ගයේ හානි පූර්ණ පිරිවැය රු.මිලියන 1770 ක් ඉක්මවන නමුත් ඒ සඳහා වගකිව යුත්තන් හඳුනාගෙන ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 2024 අගෝස්තු 13 දිනැති අංක MPH/HWY/ADM/06/30/05/3 දරන ප්‍රවාහන

මහා මාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව විදුලි පහන් වලින් සියයට 15ක පමණ ප්‍රතිශතයක් බවත්, එසේම රැහැන් විශාල ප්‍රමාණයක් සහ විදුලි කණු කිහිපයක් අස්ථානගත වී ඇති බවත් සඳහන් කර තිබුණි.

II. අමාත්‍යාංශ ලේකම්ගේ උක්ත ලිපියෙහි 05 , 06 සහ 07 වගන්තීන්ට අනුව පිළිවෙළින් අධිවේගී මාර්ග මෙහෙයුම් හා නඩත්තු අංශය විසින් වටිනාකම හඳුනා ගත් හා හඳුනා නොගත් සොරකම්වල ඇතැම් සිද්ධි පිළිබඳ පොලිසියට වාර්තා කර තිබුණද, ඒ පිළිබඳ පසු විපරම් කටයුතු සිදු වී නොතිබීම, දේපළ අවභාවිතා වීමට ඉඩ හැරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ වගකිවයුතු නිලධාරීන් වෙතින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව කරුණු විමසා සුදුසු අයුරින් ඔවුන් සම්බන්ධයෙන් පියවර ගැනීමට උපදෙස් ලබා දී තිබුණද, 1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත යටතේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කර නොතිබීම සහ හානි සම්බන්ධයෙන් පොලිස් ස්ථාන වෙත පැමිණිලි කිරීමට අමතරව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත හා අමාත්‍යාංශය වෙතද කඩිනමින් දැනුම් දීමට සුදුසු ක්‍රමවේදයක් සැකසීම සහ මුදල් රෙගුලාසි 104 යටතේ පරීක්ෂණයක් ආරම්භ කරද නොතිබුණි.

(ආ) 2025 දෙසැම්බර් 31 දිනට පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනයෙහි වූ කපා නොහල ඉදිරියට ගෙන යන රු. මිලියන 13.3 ක ශේෂයෙහි ඇතුළත් පාඩු හා අත්හැරීම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ග්‍රාමීය මාර්ග සංවර්ධන අංශය සතු මෝටර් රථයක් 2023 අප්‍රේල් 03 දින අනතුරකට ලක් වී තිබුණු අතර එහි අලාභය රු.මිලියන 6.2 ක් ලෙස හඳුනාගෙන තිබුණි. මෙම ගර්හිත තත්ත්වයට පත් වූ වාහනය අදාළ රක්ෂණ සමාගමට භාර දී රක්ෂණ වන්දි ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) ග්‍රාමීය මාර්ග අංශය සතු 2022 අගෝස්තු 10 දින සිට ජනාධිපති කාර්යාලයට අනුයුක්ත කර තිබූ මෝටර් රථයක් කි.මී. 75129 පමණක් ධාවනය කර තිබියදී හදිසි අනතුරකට ලක්වී තිබූ අතර මේ සඳහා අමාත්‍යාංශය විසින් රු.මිලියන 6.15 ක් වැය කරමින් අලුත්වැඩියා කර තිබුණි. එම වියදම රක්ෂණ සමාගමෙන් හෝ අදාළ වගකිව යුතු නිලධාරීන්ගෙන් ප්‍රතිපූරණය කර ගැනීමට 2025 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - අදියර I යටතේ වූ කේඑල්-01 කොන්ත්‍රාත් පැකේජය මගින් රු. මිලියන 7.47 ක පිරිවැයක් දරා මිලදීගෙන තිබුණු WP-PH-6328 ඩබල් කැබ් රථයක් අදාළ පැකේජයේ මාර්ග ප්‍රතිසංස්කරණය අවසන් කර මාර්ග සංවර්ධන අධිකාරියට භාරදීමට පෙර 2019 දෙසැම්බර් 07 දින අනතුරට ලක්ව තිබුණි. උපදේශන සමාගම සමඟ එකඟ වූ කොන්ත්‍රාත් ගිවිසුමෙහි ඇතුලත් පිරිවිතර ප්‍රකාරව මෙම රථය රියදුරෙකු සමඟ ලබාදීමට එකඟ වී තිබුණද උපදේශන සමාගමේ ඉංජිනේරුවරයා විසින් පදවාගෙන යන අවස්ථාවේ අනතුරට ලක්ව තිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධව උපදේශන සමාගමේ ඉංජිනේරුවරයාට හෝ සමාගමට එරෙහිව ව්‍යාපෘතිය විසින් කිසිදු නෛතික ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. අදාල අලුත්වැඩියාව සඳහා රු. මිලියන. 6.92 ක මූලික ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද රක්ෂණ සමාගමෙන් ලබා දීමට එකඟ වූ රු. මිලියන 4 ක මුදලින් අලුත්වැඩියාව සිදුකර තිබුණි. මෙම කැබ් රථය මාර්ග සංවර්ධන අධිකාරිය සතු බැවින් අලුත්වැඩියාව හා රක්ෂණ මුදල් ලබාගැනීමට මාර්ග සංවර්ධන

අධිකාරිය හෝ ව්‍යාපෘතිය විසින් කටයුතු කල යුතු වුවද ඊට පටහැනිව ඒ සඳහා කොන්ත්‍රාත් සමාගම මැදිහත් වී මෙම කැබ් රථයේ අලුත්වැඩියාව සිදුකර 2024 ඔක්තොම්බර් 29 දින ව්‍යාපෘතිය විසින් අඩුපාඩු සහිතව භාර ගෙන තිබූ බව අනාවරණය වූ අතර එය සුදුසුකම් ලත් නිලධාරියකුගේ තත්ත්ව ඡරික්ෂණයකින් තොරව මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබූ බවද නිරීක්ෂණය විය.

4.7 කළමනාකරණ දුර්වලතා

(අ) චෙක්පත් අතින් ලිවීමේදි ඇතිවිය හැකි දෝෂ අවම කර ගැනීම, පැහැදිලි බව, කාර්යක්ෂම ලෙස ඉටු කර ගැනිම හා වවුචරයේ විස්තර ස්වංක්‍රියව චෙක්පතෙහි සටහන් වන බැවින් ගෙවීම සම්බන්ධ නිරවද්‍යතාවය ඉහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා සිගාස් පද්ධතිය මඟින් චෙක්පත් මුද්‍රණය කිරීම හඳුන්වා දී ඇති නමුත් වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ මේ දක්වා එය භාවිතයට නොගෙන චෙක්පත් ලිවීම අතින් සිදු කරනු ලබයි.

(ආ) වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ සිගාස් පද්ධතිය මඟින් හඳුන්වා දී ඇති ගෙවීම් වවුචර හා රිසිට් පත්වල ගෙවීම් හා ලැබීම් වලට අදාළව විස්තර ඇතුළත් කරනු ලබන තීරුව සම්පූර්ණ කර නොමැති බැවින් ගෙවීම් හා ලැබීම් සිදුකර ඇත්තේ කුමක් සඳහාද යන්න හඳුනාගැනීම අපහසු වන අතර මු.රෙ.128 (1) ප්‍රකාරව මුල්‍ය පරිපාලනයක් පවත්වාගෙන යාම හා මනා අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දීමට පිළියෙල කර ඇති සිගාස් පද්ධතියට ඇතුළත් කල යුතු විස්තර ඇතුළත් නොකිරීම මහහැරීම මත ඉදිරි කළමනාකරණ තීරණ ගැනීම සඳහා අවශ්‍ය විශ්ලේෂණාත්මක තොරතුරු ලබා ගැනීම ගැටළු සහගත විය හැකි බව නිරීක්ෂණය විය.

(ඇ) ඉන්ධන දහනයෙන් ධාවනය වන ත්‍රිරෝද රථ විදුලි බලයෙන් ධාවනය වන ත්‍රිරෝද රථ බවට පරිවර්තනය කිරීමේ නියමු ව්‍යාපෘතිය

(I) මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යවසායන් සහ අත්‍යාවශ්‍ය සේවාවන්හි පුනර්ජීවනය උදෙසා ප්‍රවාහන පහසුකම් ඉහළ නැංවීමේ මාධ්‍යයක් ලෙස විද්‍යුත් ටුක් ටුක් (E- TUK TUK) රථවල තාක්ෂණික, සමාජීය සහ මූල්‍යමය ශක්‍යතාව වේගවත් කිරීම,ආර්ථිකය යථා තත්වයට පත් කිරීමේ ක්‍රියාවලිය තුළ අඩු කාබන් විමෝචනයක් සහිත සියලු දෙනා ඇතුළත් සාධාරණ සංවර්ධන මාවත් වේගවත් කිරීමේ අරමුණින් ඒ යටතේ අවිධිමත් ආර්ථිකය සඳහා තිරසර සංචලන ක්‍රමයක් ලෙස විද්‍යුත් ටුක් ටුක් රථවල තාක්ෂණික, මුල්‍ය සහ සමාජීය ශක්‍යතාව පරීක්ෂා කිරීම, ප්‍රදර්ශනය කිරීම,විද්‍යුත් ත්‍රිරෝද රථ ලියාපදිංචි කිරීම සඳහා පවතින වේදිකාව යාවත්කාලීන කිරීමට මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට සහාය වීම,පරිවර්තිත විද්‍යුත් ත්‍රිරෝද රථ සඳහා අවම ප්‍රමිති අවශ්‍යතා සකස් කිරීම, පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ පුළුල් පරාසයක පාර්ශවකරුවන් අතර පුනර්ජනනීය ප්‍රවාහන විකල්පයන් වෙත වර්යාත්මක වෙනසක් ඇති කිරීම සඳහා දැනුවත් කිරීම්, සහ දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ත්‍රිරෝද රථ සහ බස්රථ සඳහා විද්‍යුත් සංචලනය වර්ධනය සඳහා සංකල්ප සංවර්ධනය යන කාර්යයන් ඉටු කිරීමට අපේක්ෂා කරන ලදී. ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය USD 989,661 ක් වටිනා ප්‍රතිපාදන වලින් USD 57,000 ක් ශ්‍රී ලංකා රජය විසින් දැරීමට හා ඉතිරිය ප්‍රදානයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් ලබාදීමට ප්‍රවාහන අමාත්‍යාංශය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන එකඟ වී තිබුණු අතර

මෙම අරමුදල් යොදා ගනිමින් ඉන්ධන දහනයෙන් ධාවනය වන ත්‍රිරෝද රථ 208 ක් විදුලි බලයෙන් ධාවනය වන ත්‍රිරෝද රථ බවට පරිවර්තනය කිරීම 2022 ජූලි 22 සිට 2024 ජනවාරි 22 දක්වා කාලය තුළ ඉටු කිරීමට අපේක්ෂිත විය. මෙම ව්‍යාපෘතිය පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) මෙම ත්‍රිරෝද රථ පරිවර්තන ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේදී අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේ සංවර්ධන වැඩසටහන් - නව දුම්රිය මාර්ග සංවර්ධනය කිරීම (වැය විෂය අංක 117-2-26-005-2103-(17)- යටතේ රු.මිලියන 20.2 ක ප්‍රතිපාදන සලසා ගෙන ඉන් රු.මිලියන 15.57 ක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට UNDP ප්‍රදාන යොදාගෙන ආනයනය කරන ලද උපකරණ සඳහා බදු මුදල් වශයෙන්ද රු.මිලියන 1.19 ක් එකී භාණ්ඩ නිදහස් කර ගැනීමේ ප්‍රමාද ගාස්තු වශයෙන්ද එකතුව රු.මිලියන 16.76 ක් වැයකර තිබුණි.

(II) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම්ගත වීම ප්‍රවාහන අමාත්‍යාංශයේ කාර්යභාරය

(i) ව්‍යාපෘතිය සඳහා සේවා සපයන්නෙකු ලෙස පෞද්ගලික සමාගමක් තෝරා ගෙන අත්සන් කරන ලද ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ ප්‍රධාන තාක්ෂණික හවුල්කරු වශයෙන් ප්‍රවාහන අමාත්‍යාංශය කටයුතු කරනු ලැබුවද අමාත්‍යාංශය විසින් ඉහත බදු හා ප්‍රමාද ගාස්තු ගෙවීම හැර මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් වෙනත් අධීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර, ගිවිසුමෙහි ඇමුණුම 02 පරිදි සේවා සපයන්නා විසින් සපුරාලිය යුතු අවශ්‍යතා වන පරිවර්තන කට්ටල තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූලද, මෙම පරිවර්තන කට්ටල සඳහා පිළිගත් ප්‍රමිති ආයතනයකින් ලබා ගත් ආරක්ෂණ සහතික තිබේද සහ අනෙකුත් සේවා සම්බන්ධ අවශ්‍යතා, සේවා සපයන ආයතනය විසින් සම්පූර්ණ කර ඇත්ද යන්න පිළිබඳ සොයා බැලීමට අවශ්‍ය පියවරයන් ප්‍රවාහන අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබුණි.

(ii) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) ප්‍රතිපාදනය යොදා ගනිමින් ප්‍රවාහන අමාත්‍යාංශය නමින් USD 422,942 ක් වටිනා උපාංග මෙරටට ආනයනය කර තිබුණු අතර ඒවා ප්‍රවාහන අමාත්‍යාංශය විසින් විධිමත්ව භාර ගත් බවට හෝ ඉහත සේවා සැපයුම්කාර සමාගම හෝ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත විධිමත් පරිදි භාරදුන් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූද, මෙම උපාංග ආනයනය සඳහා වැටිබදු හා ප්‍රමාද ගාස්තු ලෙස රු. මිලියන 16.76 ක පිරිවැයක් අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ දරා තිබුණි.

III. ව්‍යාපෘතියේ කාර්යසාධනය

(i) විද්‍යුත් මෝටර් ට්‍රයිසිකල් ලියාපදිංචිය සඳහා ප්‍රතිපාදන සැලසීමට මෝටර් වාහන පනත සංශෝධනය කිරීම යන මැයෙන් ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජිත පරිදි මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය

අමප/22/1076/608/005 හා 2022 අගෝස්තු 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව හිමි වී තිබුණද, ඒ සඳහා අවශ්‍ය නීතිරීති මෙතෙක් සම්පාදනය කර නොතිබුණි. තවද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය 2023.12.06 දිනැතිව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමඟ එකඟ වී ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ අරමුණු ලඟාකර ගනිමින් 2024 ජනවාරි 22 වන විට ත්‍රිරෝද රථ 208 ක පරිවර්තන කටයුතු අවසන් කළ යුතුව පැවතුනද, ත්‍රිරෝද රථ 160 ක පරිවර්තන කටයුතු පමණක් සිදුකර ඇතත්, මෙතෙක් එකී අරමුණු සාක්ෂාත් කරගනිමින් අදාල කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර නොතිබුණි.

(ii) සේවා සැපයුම්කරු විසින් පරිවර්තනය කරනු ලැබ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත පරීක්ෂාව සඳහා යොමු කරන ලද රථ පරිවර්තනය සම්බන්ධයෙන් සෑහීමකට පත් වීමට නොහැකි වීම හා මෙම පරිවර්තිත රථය පරිශීලක හිතකාමී නොවීම ආදී දෝෂ නිවැරදි කර දෙපාර්තමේන්තු පරීක්ෂණය හා ජාතික ඉංජිනේරු සහ පර්යේෂන සංවර්ධන මධ්‍යස්ථානයේ (NERDC) පරීක්ෂණ වාර්තාව ලැබුණු පසු අදාල ලියාපදිංචිය සඳහා තීරණය ලබා දෙන තුරු කිසිදු ත්‍රිරෝද රථ විද්‍යුත් පරිවර්තනය සිදු නොකරන ලෙසටත්, ඒ සඳහා සිදුකළ සාකච්ඡා වලදී එකඟවූ පරිදි පමණක් ත්‍රිරෝද රථ පරිවර්තනය සිදු කල යුතු බවටත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සේවා සැපයුම්කරු වෙත දන්වා තිබුණු අතර, මෙම පරිවර්තනය සඳහා අදාල වන තාක්ෂණික පිරිවිතර හා පරිවර්තිත රථ ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය අනුමත කර ගැනීම විධිමත් පරිදි සම්පූර්ණ වන තෙක් ත්‍රිරෝද රථ පරිවර්තනය කර ලියාපදිංචි කිරීමේ කටයුතු තාවකාලිකව නවතන ලෙස ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් විසින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දී තිබුණි. UNDP 2025 ඔක්තෝබර් මස නිකුත් කරන ලද ප්‍රගති වාර්තාවට අනුව මේ වන විට ත්‍රිරෝද රථ 160 ක් පරිවර්තනය කර එයින් ත්‍රිරෝද රථ 21 ක් පමණක් ලියාපදිංචි කර තිබුණු බවත්, අනෙකුත් ත්‍රිරෝද රථ ලියාපදිංචියකින් තොරව ධාවනයේ යෙදෙන්නේද යන්න පිළිබඳව මෙන්ම පරිවර්තිත රථ සම්බන්ධයෙන් ඉහත උපදෙස් අනුගමනය කළේද යන්න හා එසේ ධාවනය කිරීමේදී පරිවර්තනය කිරීමේ දෝෂයක් හේතුවෙන් සිදුවිය හැකි අනතුරක් හෝ සිද්ධියක් සම්බන්ධයෙන් මෙම ව්‍යාපෘතියට අදාල ගිවිසුම්ගත ප්‍රධාන පාර්ශවකරු වශයෙන් ප්‍රවාහන අමාත්‍යාංශයට වගකීමක් පැවතියද, ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කිරීම හා සුදුසු නියාමනයන් අමාත්‍යාංශය විසින් මෙතෙක් සිදුකර නොතිබුණි.

(iii) මෙම නියමු ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ගිවිසුම් ප්‍රකාරව සලකා බලනු ලැබියයුතු නිර්ණායක අනුව ප්‍රතිලාභීන් හා ත්‍රිරෝද රථ තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) ව්‍යාපෘතියට අදාල පළමු උපාංග කට්ටල වරායට පැමිණීමෙන් පසුව ප්‍රවාහන මහාමාර්ග සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය විසින් ගිවිසුම් සඳහා 2023.12.06 දිනැතිව අත්සන් තබා ඇති බව නිරීක්ෂණය වූ අතර, මෙම ව්‍යාපෘතිය ප්‍රදානයක් වශයෙන් ලැබුණද, ව්‍යාපෘතිය යටතේ ආනයනිත

උපාංග සඳහා බදු නිදහස් කිරීම් නොලැබීම හේතුවෙන් එම බදු හා අනෙකුත් ගාස්තු අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වැය කිරීමට කටයුතු කර තිබුණු බවත් නිරීක්ෂණය වේ. මේ අනුව ව්‍යාපෘතියට අදාල ගිවිසුමෙහි එක් එක් පාර්ශවයන් සතු වගකීම සහ කාර්යභාර්යය නිසි පරිදි දක්වා නොතිබීම, නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව හා ඊට අදාල නීතිමය රාමුව සකස් කර ගැනීමකින් තොරව ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘතියට සම්බන්ධ පාර්ශවකරුවන් අතර නිසි සන්නිවේදනයක් නොමැති වීම, අරමුදල් කළමනාකරණය සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් නොමැති වීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යාංශය නියාමනය අවම මට්ටමක පැවතීම යනාදී කරුණු හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු මේ වන තෙක් ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණු අතර එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් (UNDP) ආධාර මෙන්ම ඒ සඳහා දරන ලද දේශීය අරමුදල්ද නිශ්කාර්ය වී තිබුණි.

(ඇ) **දීප ව්‍යාප්ත දුම්රිය සන්නිවේදන පද්ධතිය නවීකරණය කිරීමේ ව්‍යාපෘතියෙහි වර්තමාන භාවිතය**

වඩාත් කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවයක් පවත්වාගෙන යාම සඳහා වේගවත් හා ඵලදායී දුම්රිය සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා දුම්රිය සන්නිවේදන පද්ධතිය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ඒ සඳහා 2020 නොවැම්බර් 16 දිනැතිව ප්‍රවාහන අමාත්‍යාංශය හා දේශීය බද්ධ ව්‍යාපාරයක් අතර එ.ජ.ඩො.මිලියන 7.49 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක කර එ.ජ.ඩො.මිලියන 7.18 කට සමාන රු.මිලියන 1,878.04 ක පිරිවැයක් දරා තිබුණි. එම පද්ධතියෙහි මෙහෙයුම්, නඩත්තු හා සේවා අවශ්‍යතා සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව, ප්‍රවාහන අමාත්‍යාංශය සහ කොන්ත්‍රාත්රු අතර වසර 09 ක මෙහෙයුම් සහ නඩත්තු සේවා අවශ්‍යතා සඳහා ගිවිසුමක් 2022 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2031.07.31 දක්වා වසර 03 වගකීම් කාලයක්ද සහිතව ක්‍රියාත්මක කර ඒ සඳහා රු.මිලියන 376.38 ක් ගිවිසුමෙහි 7.1 ඡේදය ප්‍රකාරව මාසිකව රු.මිලියන 3.48 බැගින් කොන්ත්‍රාත්රුට ගෙවීමට ඒකග වී තිබුණි. එම ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කාර ආයතනය විසින් මාසිකව පද්ධතියේ මෙහෙයුම් සහ කාර්යසාධන තත්ත්වය පිළිබඳ වාර්තාවක් සැපයිය යුතු අතර මෙම වාර්තාව සමඟ ඉදිරිපත් කරන නඩත්තු සහ සේවා වියදම් ඉන්වොයිසිය මත මාසික ගෙවීම් සිදු කරනු ලබයි. ගිවිසුම් ප්‍රකාරව සේවා සැපයුකරු විසින් මාසිකව මෙහෙයුම් සහ කාර්යසාධන තත්ත්වය පිළිබඳ දත්ත වාර්තාවක් සැපයිය යුතු අතර මෙම වාර්තාව සමඟ ලබා දෙන නඩත්තු සහ සේවා වියදම් ඉන්වොයිසිය මත මාසිකව ගෙවීම් සිදු කරනු ලබයි. ඒ අනුව 2025 දෙසැම්බර් 31 දිනට පද්ධතියට අදාල මෙහෙයුම් සහ නඩත්තු සේවා ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණු රු.මිලියන 118.49 ක් විය. පද්ධතියෙහි ක්‍රියාකාරිත්වය සහ මෙහෙයුම් හා නඩත්තු සේවා කටයුතු පරීක්ෂා කිරීමේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

I. ජනවාරි සිට මැයි දක්වා මාසිකව ඉදිරිපත් කර තිබුණු වාර්තා අනුව හා නියැදි විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පරිදි දුම්රිය සන්නිවේදන පද්ධතියට අදාල පරිශීලකයින්ගෙන් කොටසක් විසින් මෙම පද්ධතිය අවම මට්ටමකින් භාවිතයට ගන්නා බවත්, ඇතැම් පරිශීලකයින් කිසිසේත්ම භාවිතා නොකරන බවත්, භාවිතයට ගනු ලබන්නන් එය සාමාන්‍ය ස්ථාවර දුරකථනයේ කාර්යභාරය ඉටුකර ගැනීම සඳහා පමණක් භාවිතා කරන බවත්, නිරීක්ෂණය වූයෙන් සමාලෝචිත වර්ෂය අවසන්වන

විට රු.මිලියන1,996.54 ක පිරිවැයක් දරන ලද එම පද්ධතිය තවදුරටත් ඌණ උපයෝජිතව පැවතුණි.

II. තවද, මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවන බාධාවන් ඉවත් කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් 2024 අප්‍රේල් 25 දිනැතිව පත් කරන ලද කමිටුව විසින් 2024 ජුනි 18 දිනැතිව ඉදිරිපත් කරන ලද යෝජිත විසඳුම් ක්‍රියාත්මක කරමින් සුදුසු පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණු අතර ඒ අනුව සමස්ථ පද්ධතිය කාර්යක්ෂමව භාවිතයට ගැනීම සඳහා සියළුම පාර්ශවයන්ගේ සාමූහික වගකීම තවදුරටත් ඉටුවී නොතිබුණි.

(ඉ) **කුරුණෑගල - හබරණ දුම්රිය ව්‍යාපෘතිය යටතේ ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කිරීම**

රු.මිලියන 26,860 ක පිරිවැය ඇස්තමේන්තුවක් සහිතව 2018 ජුලි 04 සිට 2023 ජුලි 03 දක්වා කාලය තුල ක්‍රියාත්මක කර අවසන් කරමින් කුරුණෑගල සිට හබරණ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයක් ඉදිකිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු අතර, ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 880 ක් වැය කර ව්‍යාපාති කාර්යභාරය අවසන් කිරීමකින් තොරව කටයුතු වසා දැමීමට පියවර ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

I. මෙම ව්‍යාපෘතිය යටතේ දරන ලද පරිපාලන වියදම් සහ අනෙකුත් වියදම් (ප්‍රා/ලේ හා ප්‍රා/ලේ කාර්ය මණ්ඩල වෙත ලබා දෙන ලද දීමනා ඇතුළුව) සම්බන්ධයෙන් තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද බවට 2023 මාර්තු 03 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශයේ ඇතුළත් කර තිබුණු රු.මිලියන 880 ක වියදම් විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය.

II. ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 කින් ඉඩම් ඒකක 4400 ක් රු.මිලියන 7,000 ක් වන්දි වශයෙන් වැය කර පවරා ගැනීමට සැලසුම් කර ඉන් ඉඩම් ඒකක 149 ක් සඳහා රු.මිලියන 298.04 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. කෙසේ නමුත් ව්‍යාපෘති කටයුතු නවතා දැමීමට තීරණය කිරීම හේතුවෙන් එසේ වන්දි ගෙවන ලද ඉඩම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකර රජය වෙත විධිමත්ව පවරාගැනීමට සිදුකර නොතිබුණු අතර තව දුරටත් වන්දි ලැබූවන් විසින් එම ඉඩම් පරිහරණය කෙරෙමින් පවතී.

III. ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයේ යොජනා සඳහා ඉදිරිපත් කරන ලද අංක MT/22/2023 හා 2023 මාර්තු 03 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2023 මාර්තු 28 දිනැතිව හිමිව තිබුණද, අමාත්‍යාංශය විසින් එම තීරණ මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණු බවත්, වන්දි මුදල් ගෙවා රජයට අත්පත් කරගෙන නොමැති ඉඩම් සම්බන්ධයෙන් අවසතු /ප්‍රත්‍යදිෂ්ඨ කිරීමේ ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් කෙටුම්පත් කර දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නිර්දේශ කැඳවා ඇති බව විගණනයට වාර්තා කර තිබුණු අතර, ව්‍යාපෘති කටයුතු නවතා දැමීමට තීරණය කර මෙවන විට වසර 03 ගතවී ඇතත් ඊට අදාල කටයුතු මෙතෙක් අවසන් කර නොතිබුණි.

(ඊ) වාහන අනතුරු සම්බන්ධයෙන් කටයුතු කිරීම

2025 වර්ෂයට අදාළව ප්‍රවාහන අංශයට අයත් හදිසි අනතුරුවලට ලක්වී තිබුණු තක්සේරු හානි වටිනාකම රු.438,100 ක් වූ වාහන 3 ක අනතුරු සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

I. PE- 1729 කැබ් රථය රථය අනතුරට පත්වූවිට මුදල් රෙගුලාසි 103 (1) හා මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 යටතේ අංක 4.3 ප්‍රකාරව රථය අලුත්වැඩියා කිරීමට මිල ගණන්වල සාධාරණත්වය තාක්ෂණික නිලධාරී වෙතින් ලිඛිතව සහතික කර ගැනීම සිදුකර නොතිබුණු බවත්, අළුත්වැඩියා ඇස්තමේන්තුවට තාක්ෂණික නිලධාරී නිර්දේශය ලද විට එම ඇස්තමේන්තුගත මුදලට අලුත්වැඩියාව සිදු කිරීම සඳහා මූල්‍ය බලය ඇති ආසන්නතම මාණ්ඩලික නිලධාරියාගෙන් අනුමැතියක් ලබා ගෙන නොතිබීම, වාහනයක් අනතුරට ලක් වූ මෝටර් රථයේ අනන්‍යතාවය හා අනතුරේ ස්වභාවය නිරූපනය වන පරිදි ගොනු ගත කළයුතු ඡායාරූපය වාහනයේ අංකය රහිතව ලබා ගෙන තිබුණු බවත්, අනතුර සම්බන්ධයෙන් රියදුරුගේ ප්‍රකාශය අවස්ථාවන් දෙකකදී ලියවිලි 2 ක් ලෙස ලබා ගැනීම, හිමිකම් පෑමේ රක්ෂණ අයදුම් පත්‍රයෙහි ඇතුළත් තොරතුරුවල පරස්පරතා නිරීක්ෂණය වීම, අළුත්වැඩියාව සඳහා මිල ගණන් ලබාගැනීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි 4.3 ඡේදය ප්‍රකාරව කටයුතු නොකිරීම, හානිය හඳුනා ගැනීමටත් පෙර අදාල මිල කැඳවීම් සිදු කිරීම, මුදල් රෙගුලාසි 110 (1) හා 102 අමාත්‍යාංශය විසින් මෙම අනතුර සම්බන්ධයෙන් හානි හා පාඩු ලේඛනයෙහි තොරතුරු ඇතුළත් කර නොතිබීම,වාහන ලොග් සටහන් පොතෙහි අනතුර සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කර නොතිබීම සහ අනතුර සම්බන්ධයෙන් ඉල්ලුම් කර තිබුණ විමර්ශනය මෙතෙක් අවසන් කරද නොතිබුණි.

II. තවද, රු.55,900 ක් වටිනා අළුත්වැඩියා ඇස්තමේන්තුවක් එක් ගරාජයකින් පමණක් ලබාගෙන ඇති අතර රක්ෂණ ආයතනය විසින් රු.22,500 ක් පමණක් ප්‍රතිපූර්ණය කිරීමට එකඟ වීම හේතුවෙන් එම වටිනාකමට රථය අලුත්වැඩියා කිරීමට ගරාජය එකඟවී තිබීමත් එම එකඟවූ වටිනාකම ගරාජයේ හානි ඇස්තමේන්තුවට වඩා සියයට 60 කින් අඩුවීමත් හේතුවෙන් මෙම අලුත්වැඩියාව සම්බන්ධයෙන් ලබාගත හැකිව තිබුණු ප්‍රශස්ත මිල හා සේවාව ලබා ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි 4.3 වගන්තිය ප්‍රකාරව වාහනය කොටස්වලට ගැල වූ ගරාජයේ මිල ගණන් පිළිගැනීමේදී එම මිල ගණන්වල සාධාරණත්වය සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ මණ්ඩලයක සුදුසුකම් සහිත යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබාගත යුතු වුවත්, අනතුරට පත් PD-9186 කැබ් රථයේ අලුත්වැඩියා වාහනය කොටස්වලට ගැලවූ ගරාජයෙන් ලබාගත් අළුත්වැඩියා ඇස්තමේන්තුව සඳහා එම සහතික ලබාගෙන නොතිබුණි. තවද, අණතුරට පත් PF-6323 කැබ් රථය අණතුරට පත් වීමේදී, මුදල් රෙගුලාසි 103 (1) ප්‍රකාරව අනතුර සිදු වූ විගස ලබාගතයුතු පොලිස් පැමිණිල්ලේ පිටපතක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

මේ අනුව වාහන අනතුරු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී මුදල් රෙගුලාසි, චක්‍රලේඛ විධිවිධාන ආදී නිතිරීති හා අභ්‍යන්තර පාලන ක්‍රම මනා නිවැරදිතාවයකින් හා විනිවිදභාවයකින් යුතුව අනුගමනයකර නොතිබුණු බව විගණනයේදී වැඩිදුරටත් නිරීක්ෂණය විය.

5 යහපාලනය

5.1 විගණන හා කළමනාකරණ කමිටුව

2025 අප්‍රේල් 28 දිනැති අංක DMA/01/2025 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 2.2 (i) ඡේදය අනුව සෑම කාර්තුවක් තුළම එක් රැස්වීමක් වන පරිදි අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් ප්‍රවර්තන වර්ෂයට අදාළව පැවැත්විය යුතු වුවද 2025 වර්ෂය සඳහා ප්‍රවාහන අංශය විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

අමාත්‍යාංශයේ මහා මාර්ග අංශය, ප්‍රවාහන අංශය සහ වරාය හා සිවිල් ගුවන් සේවා අංශයේ සමාලෝචිත වර්ෂය අවසාන දිනට කාර්ය මණ්ඩල සංයුතිය පහත පරිදි වේ.

සේවක වර්ගය	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍යය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු/අතිරික්තය
ජ්‍යෙෂ්ඨ මට්ටම	94	63	31
තෘතීය මට්ටම	13	07	06
ද්විතීය මට්ටම	347	242	105
ප්‍රාථමික මට්ටම	126	79	47
එකතුව	580	391	189

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2025 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳව නිරීක්ෂණය කිරීමේදී තනතුරු 56 ක පුරප්පාඩු 190 ක්ද, එක් තනතුරක අතිරික්තතාවයක්ද, නිරීක්ෂණය විය. එම තොරතුරු පරිදි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 28 ක පුරප්පාඩු 32 ක්ද, එක් තනතුරක අතිරික්තයක්ද තෘතීය මට්ටමට අයත් තනතුරු 05 ක පුරප්පාඩු 06 ක්ද, ද්විතීයක මට්ටමට අයත් තනතුරු 14 ක පුරප්පාඩු 105 ක්ද, ප්‍රථමික මට්ටමට අයත් තනතුරු 09 ක පුරප්පාඩු 47 ක්ද පවතින බව නිරීක්ෂණය විය. පුරප්පාඩු පවතින තනතුරුවල අවශ්‍යතාවය ඇගයීමකට ලක්කර තවදුරටත් අවශ්‍ය නොවන තනතුරු යටපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2018 ජනවාරි 24 දිනැති හා අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.1 ඡේදය පරිදි කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුලින් සහතික විය යුතු අතර, 6.3 ඡේදය ප්‍රකාරව ධුරාවලියේ එක් එක් තලය සඳහා අනන්‍ය වූ නිපුණතා ඉලක්ක සපුරා ගැනීම පිණිස සුදුසු ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම සිදුකල යුතුය. අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුලින් එක් එක් මට්ටමේ තනතුරු සඳහා අවම පැය 12 ක පුහුණු කාලයක් සහතික වන පරිදි පුහුණු වැඩසටහන් සැලසුම් කර නොතිබුණු අතර යෝජිත නිපුණතා ඉලක්ක සපුරා

ගැනීම පිණිස එක් එක් තලය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් වාර්ෂික පුහුණු සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) තවද එම චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීම අවම වශයෙන් වසර දෙකකට වරක් සිදුවිය යුතු වුවත්, 2022-2025 සඳහා පිළියෙළ කර තිබුණු ප්‍රවාහන අංශයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම 2025 වර්ෂය වන විට චක්‍රලේඛ ප්‍රකාරව යාවත්කාලීන කර නොතිබුණි.

(ඈ) අමාත්‍යාංශයේ මහාමාර්ග අංශයේ කාර්ය මණ්ඩලය සඳහා තෝරාගත් පුහුණු වැඩසටහන් 29 ක් යටතේ පැය 256 ක පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර තිබුණු අතර 2025 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල පුහුණු සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සියයට 48 ක් විය. උක්ත ප්‍රතිශතය ගණනය කිරීමේදී මානව සම්පත් සංවර්ධන සැලැස්මෙහි ඇතුලත් නොවූ පුහුණු වැඩසටහන් 04 ක්ද ඇතුළත් කර තිබුණි.



වී.ඩී. සීතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

සැලසුම් හා මෙහෙයුම් අංශය

මහාමාර්ග අංශය

ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

කාර්යසාධන වාර්තාව

2025

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය

වරාය සහ සිවිල් ගුවන්සේවා අංශය

නො.19, චෛත්‍ය පාර, කොළඹ 01
දුරකථන : 011-2439352 , 011-2435161
වෙබ්: www.portmin.gov.lk
විද්‍යුත් ලිපිනය : secretary@portmin.gov.lk

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
ආයතනයේ නම - ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය
වරාය සහ සිවිල් ගුවන්සේවා අංශය
වැය ශීර්ෂ අංකය - 176

අන්තර්ගතය පිටු අංකය

පරිච්ඡේදය 01	-	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1-6
පරිච්ඡේදය 02	-	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	7-8
පරිච්ඡේදය 03	-	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	9-14
පරිච්ඡේදය 04	-	කාර්යසාධන දර්ශක	15-16
පරිච්ඡේදය 05	-	තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	17-18
පරිච්ඡේදය 06	-	මානව සම්පත් පැතිකඩ	19-22
පරිච්ඡේදය 07	-	අනුකූලතා වාර්තාව	23-28
පරිච්ඡේදය 08	-	වෙනත්	29-74

8.1 වෙළඳ නාවික ලේකම් කාර්යාලය 30-37
8.2 ශ්‍රී ලංකා වරාය අධිකාරිය 38-51
8.3 සීමාසහිත ලංකා නැව් සංස්ථාව 52-54
8.4 ජයා කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ් 55-57
8.5 සිවිල් ගුවන්සේවා අධිකාරිය 58-62
8.6 සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික)සමාගම 63-74
8.7 ඇමුණුම - I (සංවිධාන ව්‍යුහය) 75
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය
වරාය සහ සිවිල් ගුවන්සේවා අංශය
8.8 ඇමුණුම - II (සංවිධාන ව්‍යුහය) 77
වෙළඳ නාවික ලේකම් කාර්යාලය

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි ප්‍රධාන නාවික හා ගුවන් ගමන් කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ වගකීම පැවරී ඇත්තේ වරාය සහ සිවිල් ගුවන්සේවා අංශයටයි.

රටේ දළ දේශීය නිෂ්පාදිතයට සෘජු දායකත්වයක් සපයන මෙම අංශයට අයත්වන වෙළඳ නාවික ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සීමාසහිත ලංකා නැව් සංස්ථාව, ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය, ගුවන්තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම ජාත්‍යන්තර වෙළඳාම සහ මගී ප්‍රවාහනය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම මෙම අංශය මඟින් සිදු කරයි. රටේ ද්වාරයන් ලෙස ක්‍රියාකරන වරාය සහ ගුවන්තොටුපළවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මඟින් ගෝලීය වෙළඳාම සහ සංචාරක කර්මාන්තය සක්‍රීය කිරීම වරාය සහ සිවිල් ගුවන්සේවා අංශයේ අරමුණයි.

1.2 ආයතනය පිහිටුවා ඇති නෛතික රාමුව

අංක 2412/08 හා 2024.11.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව වරාය සහ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය සඳහා පහත කාර්යයන් හා කර්තව්‍යයන් පවරා ඇත.

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්ති මත පිහිටා වරාය සහ සිවිල් ගුවන්සේවා අංශයට අයත් විෂයයන්ට හා යටත් ආයතනයන්හී විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂයය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමණාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- වාණිජ වරායන් සංවර්ධනය, කළමනාකරණය සහ ඒවායේ ආයෝජන අවස්ථා පුළුල් කිරීම.
- බහාලුම් අංගන සංවර්ධනය කිරීම.
- අද්මිරාල්තියට අයත් ඒවා හැර අනෙකුත් වරාය තෙල් ටැංකි උපකරණ, ප්‍රදීපාගාර සහ ප්‍රදීපස්ථම්භ සංවර්ධන සහ පරිපාලන කටයුතු.
- නාවික සේවා සැපයුම්කරුවන් හා පරිහරණය කරන්නන් අතර ආරාවුල් බේරුම්කරණය.
- නාවික සේවාවන් සඳහා තරඟ රීති මාලාවක් පැනවීම.
- නාවික සැපයුම්කරුවන් සහ පරිහරණය කරන්නන් අතර උපදේශාත්මක සම්බන්ධීකරණය තහවුරු කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම.

- බුන් යාත්‍රා සහ සමුද්‍ර මුක්තාවශේෂ භාරගැනීම.
- ප්‍රවාහන සහ නාවික සේවාවන් සහ වෙරළාසන්න මගී තදබදය සඳහා පහසුකම් සැලසීම.
- නෞකා හිමිකාරිත්වය සහ මෙහෙයුම්, නැව් කළමණාකරණය, නැව් තැරැව්කරණය සහ නියෝජිත සේවා
- රේගු නියෝජිතායතන සහ සමස්ථ නෞකා භාණ්ඩ ප්‍රවාහන විසඳුම්
- ජාත්‍යන්තර හා දේශීය ගුවන්තොටුපලවල් සංවර්ධනය සහ නියාමන කටයුතු සිදුකිරීම.
- ගුවන්තොටුපොල මඟින් සැලසෙන සේවාවන්වල ගාස්තු සහ ගුණාත්මකභාවය නියාමනය කිරීම.
- ජාත්‍යන්තර ගුවන්සේවාවන් පුළුල් කිරීම සඳහා අනෙකුත් රටවල් සමඟ ගිවිසුම්වලට එළඹීම ඇතුළුව අනෙකුත් අවශ්‍ය පියවර ගැනීම.
- ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපොලවල් විදේශ රටවල් විසින් භාවිතා කිරීමට අදාළ කටයුතු ප්‍රවර්ධනය හා නියාමනය
- ගුවන් මඟින් සිදුකරන භාණ්ඩ ප්‍රවාහන පහසුකම් පුළුල් කිරීම.
- දේශීය ගුවන් ගමන් ප්‍රවර්ධනය කිරීම.
- පුද්ගලික ගුවන් ගමන් සේවා නියාමනය
- ගුවන්යානා ලියාපදිංචි කිරීම.
- යටත් ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු, යටත් ආයතන අධීක්ෂණය කිරීම.

1.3 ආයතනයේ, දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"දකුණු ආසියානු කලාපයේ උපරිම තරඟකාරිත්වයකින් යුතු සමුද්‍රික සේවා මධ්‍යස්ථානය වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම තුළින් සියලුම සේවාලාභීන්ට හිතකාමී ඉහළ මට්ටමේ සමුද්‍රීය සේවාවන් ලබාදීම" මෙන්ම "කලාපයේ ප්‍රමුඛතම ගුවන් ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම"

මෙහෙවර

"ජාතික ආර්ථික වර්ධනය සඳහා සමුද්‍රික ප්‍රවාහන කටයුතු ක්ෂේත්‍රය තුළ දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස තරඟකාරිත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක වරාය හා නාවික සේවාවන් සැලසීමට ඉවහල් වන වඩාත් යෝග්‍ය ප්‍රතිපත්ති රටාවක් පිළියෙල කිරීම හා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සැකසීම" මෙන්ම "අදාළ ආර්ථික අංශවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් ගුවන් ප්‍රවාහන, සේවා කාර්යක්ෂම, ආරක්ෂිත සහ පරිශීලක-හිතකාමී සේවාවන් බවට පත් කිරීම"

අරමුණු

අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා අනුබද්ධිත ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සපයන්නෙකු, ප්‍රතිපත්ති සම්පාදකයෙකු, සම්බන්ධීකාරකයකු සහ ප්‍රගති සමාලෝචකයෙකු ලෙස කටයුතු කිරීම.

1.4 ප්‍රධාන කාර්යයන්

- අනුබද්ධ ආයතනවලට අදාළ ප්‍රතිපත්ති සැකසීම.
- වරාය සහ සිවිල් ගුවන්සේවා අංශයට අයත් විෂය පථයට නතුවන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති සමායෝජනය කිරීම හා අධීක්ෂණය කිරීම.
- වරාය සහ සිවිල් ගුවන්සේවා කටයුතුවලට අදාල සේවාලාභීන්ට වඩාත් හොඳ සේවාවන් සැලසීම සඳහා නව මෙහෙයුම් නිර්නායකයන් හඳුන්වා දීම.
- වරාය සහ සිවිල් ගුවන්සේවා සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාශීලී යාන්ත්‍රණයක් විධිමත්ව සැකසීම.
- නැව් ඒජන්තවරුන්, බහළු මධ්‍යස්ථාන මෙහෙයුම්කරුවන්, නැව් බඩු ඉදිරිපත් කරන්නන්, යාත්‍රා හිමිකම් නොමැති පොදු ප්‍රවාහන සේවා සපයන්නන්, සංචාරක ඒජන්තවරුන් හා වෙනත් සේවා සපයන්නන් සඳහා වඩාත් ක්‍රියාශීලී හා ව්‍යාපාර හිතකාමී නියාමනයක් හා අධීක්ෂණයක් ඇති කිරීම.
- ගුවන් යානා සහ මගීන්ගේ ආරක්ෂාව සහතික කරමින් කාර්යක්ෂමව ගුවන් මෙහෙයුම් කටයුතු කිරීම සඳහා ගුවන්සංතරණ සේවා (ගුවන් ගමන් පාලන සේවා, ගගන නාවික සන්නිවේදන සේවා, ගහන නාවික තොරතුරු සේවා), ගිනි නිවීම් සේවා සහ ගුවන් ආරක්ෂක සේවා සැපයීම මෙන්ම ශ්‍රී ලංකාවේ ඇති ජාත්‍යන්තර ගුවන් තොටුපලවල් සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- වරාය සහ සිවිල් ගුවන්සේවා අංශයේ විෂය පථයට අයත් වන ආයතනවල කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය කරන නීතිමය රාමුවක් හඳුන්වා දීම.

1.5 සංවිධාන සටහන

ඇමුණුම I

1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

1. අ) ව්‍යාපෘතියේ නම - වරාය ප්‍රවේශ අධිවේගී ගුවන් මාර්ග ව්‍යාපෘතිය (වැඩහල් ප්‍රතිස්ථාපනය)

ආ) දායක නියෝජිතායතන - ආසියානු සංවර්ධන බැංකුව

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු.මි. 2,039

ඈ) ව්‍යාපෘති කාල සීමාව - 2021 සැප්. – 2023 දෙසැ.

2. අ) ව්‍යාපෘතියේ නම - කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

ආ) දායක නියෝජිතායතන - ඉන්දියානු එක්සිම් බැංකුව

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු.මි. 18,326.9

ඈ) ව්‍යාපෘති කාල සීමාව - 2020.10.12 සිට

3. අ) ව්‍යාපෘතියේ නම - බටහිර බහළු පර්යන්ත II සඳහා බටහිර දියකඩනය දිගු කිරීම පිණිස වන විස්තරාත්මක සැලසුම් ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ආ) දායක නියෝජිතායතන - ආසියානු සංවර්ධන බැංකුව

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - ඇ.ඩො.මි. 5.00

ඈ) ව්‍යාපෘති කාල සීමාව - 2025 අප්‍රේල් - 2027 අප්‍රේල්

1.7 අමාත්‍යාංශය (වරාය සහ සිවිල් ගුවන්සේවා අංශය) යටතේ පවතින ආයතන

1. වෙළඳ නාවික ලේකම් කාර්යාලය
2. ශ්‍රී ලංකා වරාය අධිකාරිය
3. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
4. සීමාසහිත ලංකා නැව් සංස්ථාව
5. සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම
6. ජයා කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ්

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

02. පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

විශේෂ ජයග්‍රහණ

- අමාත්‍යාංශයේ දැක්ම අනුව අදාළ අරමුණු ළඟාකර ගැනීමට හැකිවන අයුරින් නව ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම හා ඒ සඳහා අනුමැතීන් ලබා ගැනීම, සංවර්ධන කටයුතු අධීක්ෂණය හා ප්‍රගතිය විමසා බැලීම මූලික කාර්යයන් අතර වේ. අමාත්‍ය මණ්ඩල සංදේශ 64 ක් 2025.12.31 වන විට ඉදිරිපත් කරන ලද අතර ඒවායින් පත්‍රිකා 60 ක් සඳහා අනුමැතිය ලැබී ඇත. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 04 ක් සඳහා අනුමැතිය අපේක්ෂිතය.
- අනෙකුත් රේඛීය අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 09 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
- 2024 වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් පිළියෙල කර පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම.
- 2025 වසර සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ අදාල අනෙකුත් ආයතනවලට ඉදිරිපත් කිරීම.
- 2025 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව සහ 2026 වර්ෂය සඳහා සැලසුම් ඇතුළත් අයවැය කාරක සභා සැසිය සඳහා සකස් කරන ලද ප්‍රගති වාර්තාව පාර්ලිමේන්තුවට වෙත යොමු කිරීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම. මාසික /ත්‍රෛමාසික/ වාර්ෂික ප්‍රගති වාර්තා පිළියෙල කිරීම, ප්‍රගති සමාලෝචනය කිරීම සහ අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.

අභියෝග

- සංවර්ධන කටයුතු සඳහා සුදුසු ආයෝජකයින් සොයා ගැනීම.
- අරමුදල් සපයන ආයතනවලින් මූල්‍ය ආධාර සොයා ගැනීම.

ඉදිරි ඉලක්ක

- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල ගැටළු විසඳා ගැනීම සඳහා වඩා කාර්යක්ෂම සේවාවක් ලබා දීම.
- වසර ආරම්භයේදී හඳුනා ගන්නා ලද ඉලක්ක අත්පත් කරගැනීම සඳහා ආයතන මෙහෙයවීම.
- තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම සහ එම ඉලක්ක ලඟාකර ගැනීම සඳහා වැඩසටහන්/ ව්‍යාපෘති හඳුනාගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
- කොළඹ වරායේ වර්තමාන ගෝලීය දර්ශකයේ අගය ඉහළ නැංවීම සඳහා දායක වීම.
- භාණ්ඩ හා මගී ප්‍රවාහනයට අනෙකුත් වරායන්හි දායකත්වය වැඩි කිරීම.
- ගුවන්සේවා වඩා කාර්යක්ෂමව, ආරක්ෂාකාරී හා පරිශීලක හිතකාමී තත්වයට දියුණු කිරීම.

03 පරිච්ඡේදය

සමස්ත මූල්‍යකාර්ය සාධනය

03. පරිච්ඡේදය

සමස්ථ මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2025.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය **ඒසීඒ - එෆ්**

අයවැය (වර්තමාන වර්ෂය-2025)		සටහන	තත්‍ය		
			වර්තමාන වර්ෂය- 2025 රු.	ඉකුත් වර්ෂය-2024 රු.	
	ආදායම් ලැබීම්		-	-	
	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	
	බදු නොවන ආදායම් සහ වෙනත්	4	52,642,052,085	38,311,806,768	
	මුළු ආදායම් ලැබීම් (අ)		**52,642,052,085**	38,311,806,768	
	ආදායම් නොවන ලැබීම්		-	-	
	භාණ්ඩාගාර අග්‍රිම		2,922,055,359	1,005,670,781	ඒසීඒ - 3
	තැන්පතු		201,209,819	1,174,474	ඒසීඒ - 4
	අත්තිකාරම් ගිණුම්		67,099,020	7,340,612	ඒසීඒ - 5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**3,190,364,198**	**1,014,185,867**	
	මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ) +(ආ)		**55,832,416,283**	**39,325,992,635**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**191,048,168**	-	
	ශුද්ධ ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) – (ඇ)		**55,641,368,114**	**39,325,992,635**	
	අඩුකලා : වියදම්				
	පුනරාවර්තන වියදම්		-	-	
	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	91,544,402	111,650,205	
	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	65,440,528	115,514,691	ඒසීඒ-2 (II)
	සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	125,804,685	420,929,172	
	පොළී ගෙවීම්	8	-	-	
	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	466,057	
	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**282,789,615**	**648,560,395**	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	6,447,215	30,046,342	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	8,042,235	787,564,503	
	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2 (II)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
	හැකියා වර්ධනය	14	541,500	498,000	
	වෙනත් මූලධන වියදම්	15	2,749,046,825	329,238,238	
	මුළු මූලධන වියදම් (උ)		**2,764,077,774**	**1,147,347,083**	
	තැන්පතු ගෙවීම්		**201,209,819**	**1,174,474**	ඒසීඒ - 4
	අත්තිකාරම් ගෙවීම්		**68,307,611**	**7,699,535**	ඒසීඒ - 5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර වියදම් (ඌ)		**269,517,430**	**8,874,010**	
	මුළු වියදම් එ = (ඊ +උ+ ඌ)		**3,316,384,819**	**1,804,781,488**	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ -එ)		**52,324,983,294**	**37,521,211,147**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**52,324,983,294**	**37,521,211,147**	ඒසීඒ - 7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ - 3
			52,324,983,294	**37,521,211,147**	

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2025 රු.	2024 රු.
මූල්‍ය ඉන්වෙස්ට්මන්ට්			
දේවල්, පිරියම සහ උපකරණ	එම්ටී-1	295,774,607	430,298,544
		4,189,350,769	
මූල්‍ය වත්කම්			
	එම්ටී-5(i),(ii)	15,258,308	14,049,717
මුල් සහ මුල්‍ය මත්තිකාව	එම්ටී-3		
මුළු වත්කම්		4,500,383,774	444,348,261
සුදුසු වත්කම් / බැඳුම්කර			
		15,258,308	14,049,717
		4,485,125,466	430,298,544
	එම්ටී-5(iii)		
සහතික වගකීම්			
	එම්ටී-4	-	-
	එම්ටී-3	-	-
මුළු වගකීම්		4,500,383,774	444,348,261

මූල්‍ය ප්‍රකාශන ..... දිනට ..... දරන එම්ටී 1 සිට එම්ටී 7 දක්වා වූ සහගත අනුසටහන් සමඟ කියවන විට සහ සැසඳුම්

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - සී

	තත්‍ය	
	2025 වර්ෂය රු.	**2024 වර්ෂය රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	202,201,588	5,434,829
අග්‍රිම ලැබීම	2,922,055,359	1,005,670,781
අත්තිකාරම් අයකර ගැනීම	67,099,020	5,638,492
තැන්පතු ලැබීම	201,209,819	1,174,474
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**3,392,565,786**	**1,017,918,577**
අඩු කලා - මුදල් වැය කිරීම් :		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	156,984,930	226,681,586
සහනාධාර සහ මාරු කිරීම්	125,804,685	420,929,172
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	15,030,950	31,860
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	34,239,179	-
අත්තිකාරම් ගෙවීම්	191,048,168	7,645,907
තැන්පතු ගෙවීම්	69,701,445	1,174,474
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	201,209,819	**656,472,003**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) –(ආ)	**794,019,177**	**361,446,574**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	**192,925,424**	-
උපණය අය කර ගැනීම		-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**192,925,424**	-
අඩු කලා - මුදල් වැය කිරීම්:		
මූලධන වියදම්	2,598,546,609	361,446,574
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,598,546,609**	**361,446,574**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ) – (ඉ)	**(2,598,546,609)**	**(361,446,574)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-

මූල්‍ය ක්‍රියාකරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	-
අඩු කළා - මුදල් වැය කිරීම් :		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) = (උ) – (එ)	-	-
මුදල් වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) + (ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

මූල්‍ය ප්‍රකාශ සටහන්

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසළකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන	360,460,127.00	42,210,503.32	318,249,623.68	88%
ප්‍රාග්ධන	8,919,650,000.00	5,252,061,349.59	3,667,588,650.41	41%

3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය

පරිත්‍යාග කළ ආයතනය	පරිත්‍යාගයේ අරමුණු	පරිත්‍යාග මුදල
-	-	-

1.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය රු.	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි ව්‍යුහය	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	-	-	-
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක	-	-	-	-
9160	කෙරිගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

මහාමාර්ග අංශයේ කාර්යසාධන වාර්තාවට අමුණා ඇත.

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

04. පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100 - 90 %	75 - 89%	50-74 %
කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් 04ක් පැවැත්වීම	√		
ප්‍රගති වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීම	√		
වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ විගණන සැලැස්ම ඉදිරිපත් කිරීම	√		
කාර්ය සාධන වාර්තාව භාෂාත්‍රයෙන්ම සකස් කිරීම සහ පාර්ලිමේන්තුව වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම	√		
අයවැය විවාද කාරක සභා අවස්ථාව සඳහා ප්‍රගති වාර්තාව භාෂාත්‍රයෙන්ම සකස් කර ඉදිරිපත් කිරීම	√		
අමාත්‍ය මණ්ඩල සංදේශ භාෂාත්‍රයෙන්ම සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම	√		
අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ නියමිත දිනට ඉදිරිපත් කිරීම	√		
අවශ්‍ය අවස්ථාවලදී අනුබද්ධිත ආයතන සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සම්බන්ධීකරණය	√		
අමාත්‍ය මණ්ඩල සහ අමාත්‍යාංශ මට්ටමේ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම	√		
විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම 4ක් පැවැත්වීම (කාර්තුමය)		√	
අමාත්‍යාංශය සහ අනුබද්ධිත ආයතන සඳහා අභ්‍යන්තර විගණනයන් පැවැත්වීම	√		
විගනණ විමසුම් සඳහා පිළිතුරු සැපයීම	√		
අදාල ආයතන සඳහා මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම	√		
අයවැය ඇස්තමේන්තු සකස්කිරීම	√		
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම	√		
භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීම සහ වාර්තා කිරීම	√		
සැපයුම් කළමනාකරණය	√		
මූල්‍ය පුරෝකථන සකස් කිරීම	√		
ගෙවීම් (වැටුප් සහ වේතන, අතිකාල, ණය)	√		
පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම	√		
අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි නීතිමය කටයුතු	√		
වාහන නඩත්තු	√		
ආයතනයන්හි පරිපාලන කටයුතු	√		
පුහුණු සහ ශිෂ්‍යත්ව	√		
සේවක සුබසාධනය	√		
මානව හිමිකම් කමිටුව, මහජන පෙත්සම් කාරක සභාව, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිලිබඳ කාරක සභාව (COPE) සඳහා සහභාගි වීම	√		

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

05. පර්ච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0 - 49%	50 - 74%	75 - 100%
සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා අනුබද්ධ ආයතනවලට පහසුකම් සැපයීම	සංවර්ධනය කරන ලද ප්‍රතිපත්ති සංකල්ප ගණන			√
සවිමත් යටිතල පහසුකම් ගොඩ නැගීම, පර්පූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම	මුහුදු මඟින් භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය	ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය			√
		ප්‍රවාහනය කරන ලද මගීන් සංඛ්‍යාව			√
	ගුවන් මඟින් භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය	ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය			√
		ප්‍රවාහනය කරන ලද මගීන් සංඛ්‍යාව			√
ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගිතාවයේ පුනර්ජීවනය	වරාය හා නාවික ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන්ට වඩා හොඳ පහසුකම් සැපයීම	වරාය හා නාවික කටයුතු පිලිබඳ ප්‍රතිපත්ති			√
	නාවිකයන් ලියාපදිංචි කිරීම	ලියාපදිංචි කර ඇති නාවිකයින් සංඛ්‍යාව			√
පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම	ආධුනික නාවිකයින් සඳහා පුහුණු අවස්ථා ලබා දීම	පුහුණු කර ඇති ආධුනික නාවිකයින් සංඛ්‍යාව			√
	ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ඇති මහපොළ පුහුණු ආයතනය මගින් පාසැල හැරයන තරුණ ප්‍රජාවට පුහුණු අවස්ථා ලබා දීම	වරාය හා නාවික ක්ෂේත්‍රයට අදාලව ලබා දී ඇති පුහුණු අවස්ථා සංඛ්‍යාව		√	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රාහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

- තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක වුවද, ප්‍රතිඵල/ ප්‍රගතිය ගණනය කිරීම සඳහා පදනම් වන මූලික දත්ත සපයා ගැනීම අපහසුවීම
- අංශ මත පදනම්වූ පුහුණු / වැඩමුළු වල අවශ්‍යතා

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

06. පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව **2025.12.31**	ඇබෑර්තු* / (අතිරික්ත)** **2025.12.31**
ජ්‍යෙෂ්ඨ	29	16	13
තෘතීයික	04	01	3
ද්විතීයික	62	46	16
ප්‍රාථමික	33	21	12

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ආයතනයේ දෛනික රාජකාරි කටයුතු සඳහා පුරප්පාඩු පිරවීම අත්‍යවශ්‍ය වේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)	වැඩ සටහනහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
ප්‍රසම්පාදන මාර්ග උපදේශන පුහුණු වැඩසටහන	02	දින 01	නැත	දේශීය	ප්‍රසම්පාදන මාර්ග උපදේශන පුහුණුව
හානි පාඩු හා මු.රෙ.104 යටතේ වූ පරීක්ෂණය	02	දින 01	රු.13,000.00	දේශීය	හානි පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණය පුහුණුව
ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය	02	දින 01	රු.13,000.00	දේශීය	ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය පුහුණුව
නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම	01	දින 01	රු.6500.00	දේශීය	නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම
විද්‍යාත්මක පිරිමැසුම්දායක හා	05	දින 01	රු.30,000.00	දේශීය	විද්‍යාත්මක පිරිමැසුම්දායක හා

ආරක්ෂිත රිය පැදවීම.					ආරක්ෂිත රිය පැදවීම.
පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම	04	දින 01	රු.26,000.00	දේශීය	පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම පුහුණුව
කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරි	02	දින 02	රු.24,000.00	දේශීය	කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරි පුහුණුව
ප්‍රසම්පාදන ලේඛන (ලංසු ලියවිලි)	09	දින 01	රු.112,500.00	දේශීය	ප්‍රසම්පාදන ලේඛන (ලංසු ලියවිලි) පුහුණුව
ලේකම් පර්වය	01	දින 01	රු.14,000.00	දේශීය	ලේකම් පරිවය පුහුණුව
කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි	01	දින 01	රු.6500.00	දේශීය	කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි පුහුණුව
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම නව වැටුප් චක්‍රලේඛනයට අනුව	01	දින 01	රු.6500.00	දේශීය	රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම නව වැටුප් චක්‍රලේඛනයට අනුව
Project Management	03	දින 02	රු.36,000.00	දේශීය	Project Management
Certificate program in ICT & Artificial Intelligence (AI)for office Productivity	07	දින 05	රු.21,000.00	දේශීය	Certificate program in ICT & Artificial Intelligence (AI)for office Productivity
මූලික විමර්ශන	02	දින 01	රු.13,000.00	දේශීය	මූලික විමර්ශන පුහුණුව
ගුණාත්මක කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය	01	දින 01	රු.6500.00	දේශීය	ගුණාත්මක කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය
කාර්යාල ක්‍රම	01	දින 02	රු.12,000.00	දේශීය	කාර්යාල ක්‍රම පුහුණුව
කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරි පුහුණුව රාජ්‍ය අංශය හා අර්ධ රාජ්‍ය අංශය	01	දින 02	රු.12.000.00	දේශීය	කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරි පුහුණුව රාජ්‍ය අංශය හා අර්ධ රාජ්‍ය අංශය

* **ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

- නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වැඩි දියුණු කර ගැනීම.
- නිලධාරීන් අභිප්‍රේරණය කිරීම.
- රාජකාරී වඩාත් කර්යක්ෂම කිරීම.
- වෘත්තීය පරිණතභාවයකින් යුතු කාර්යක්ෂම නිලධාරීන් රාජ්‍ය සේවයට දායාද කිරීම.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

07. පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය) GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		

3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	03	අමාත්‍යාංශය හා අමාත්‍යාංශ ලේකම්වරු මාරු වීම සහ විෂය පථය වෙනස් වීම	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම්	අනුකූල නොවේ		

	පිළිබඳ තොරතුරු කොමිස්ත්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම			
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිස්ත්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල නොවේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		

11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම්**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපත්වරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා	අනුකූල වේ.		

	ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.			
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව, මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.		

08 පරිච්ඡේදය

වරාය සහ සිවිල් ගුවන්සේවා අංශයට අයත් ආයතන

08. පරිච්ඡේදය

8.1 වෙළඳ නාවික ලේකම් කාර්යාලය

8.1.1 හැඳින්වීම

වෙළඳ නාවික ලේකම් කාර්යාලය මඟින් මුහුදේ සැරිසරන ජීවිතවල සහ දේපළවල ආරක්ෂාව, සමුද්‍රීය අධ්‍යාපනය, පුහුණුව, ප්‍රවීණත්වය ඇගයීමෙන් පසු සහතික දීම, ශ්‍රී ලංකා ධජය යටතේ නැව් ලියාපදිංචි කිරීම, නැව් එජන්තවරුන්ට, බහළුම් මධ්‍යස්ථාන මෙහෙයුම්කරුවන්ට, බහළුම් පර්යන්ත මෙහෙයුම්කරුවන්ට, බහළුම් නැව් බඩු මෙහෙයුම්කරුවන්ට, නැව් බඩු ඉදිරිපත් කරන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවෙකු නොවන පොදු ප්‍රවාහකයන්ට වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සහ අදාළ වන සියලු ජාතික සහ ජාත්‍යන්තර සම්මුති සහ රෙගුලාසිවලට අනුගතව ක්‍රියාත්මකවීම පිළිබඳ වගකීම දරයි.

8.1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

"සාමුද්‍රික විශිෂ්ඨතාව තුලින් ජගත් නාවුක කර්මාන්තයේ පිළිගැනීම"

8.1.3 ප්‍රධාන කාර්යයන්

- ශ්‍රී ලංකාවේ සියලු නාවික කටයුතු සම්බන්ධයෙන් නීති රීති සම්පාදනය කොට නියාමනය කිරීම හා ජාත්‍යන්තර සමුද්‍රීය ප්‍රඥප්තිවලට අනුකූලව, දේශීය නීති රෙගුලාසි සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- වෙළඳ නාවිකයන් සඳහා අඛණ්ඩ මුදාහැරීමේපත් නිකුත් කිරීම (CDC) සහ ඔවුන්ගේ සුභසාධනය සම්බන්ධයෙන් කටයුතු කිරීම.

- ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව විභාග පවත්වා නැවිපති (කපිතාන්) සහ ප්‍රධාන නාවික ඉංජිනේරු යන මට්ටම් දක්වා වන ප්‍රවීණතා සහතිකපත් (COC) නිකුත් කිරීම.

- ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත වෙළඳ නාවිකයන් පුහුණු කිරීමේ ආයතන අනුමත කිරීම, නියාමනය කිරීම, ඒවායේ කටයුතු අධීක්ෂණය හා විගණනය කිරීම.

- ශ්‍රී ලංකා ධජය යටතේ නෞකා ලියාපදිංචි කිරීම සහ එම නෞකාවල තත්වය පරීක්ෂා කිරීම, ව්‍යවස්ථාපිත සහතික නිකුත් කිරීම, ගාස්තු අය කිරීම හා ශ්‍රී ලාංකික නෞකා වර්ගීකරණ සංගම්වල කටයුතු අධීක්ෂණය කිරීම.

- විදේශීය නෞකා ශ්‍රී ලංකා වරායන් කරා සේන්දු වූ විට එහි සේවය කරනු ලබන නාවිකයන් සඳහා සපයන වැටුප්, සෞඛ්‍ය, ආහාර හා අනෙකුත් සේවා පහසුකම් සම්බන්ධ පැමිණිලි විභාග කිරීම.

- ශ්‍රී ලංකා මුහුදු සීමාව තුළ නාවික ගමනාගමනයට පවත්නා අනතුරු, බාධක ඉවත් කිරීම හා එවැනි ස්ථාන සිතියම්ගත කර ප්‍රසිද්ධියට පත්කිරීම.

- ශ්‍රී ලංකා මුහුදු තීරයෙහි සැරිසරන විදේශ වෙළඳ නෞකා සහ ශ්‍රී ලංකා ධජය යටතේ පවත්නා වෙළඳ නෞකාවලට සිදුවන හදිසි අනතුරු පිළිබඳව ජාත්‍යන්තර සම්මුතීන්ට

අනුකූලව පරීක්ෂණ පවත්වා ඒ පිළිබඳව වාර්තා සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ශ්‍රී ලංකාවේ ජලතීරය තුළදී විනාශයට පත්ව ඇති නෞකා සුන්බුන්වල ප්‍රධාන භාරකරු ලෙස කටයුතු කරමින් ඒවා යථායෝග්‍ය පරිදි අපහරණය කිරීම.

- "වරාය රාජ්‍ය පාලනය" (Ports State Control) පිළිබඳ ඉන්දියානු සාගර අවබෝධතා ගිවිසුමට අනුව ශ්‍රී ලංකා වරායයන් වෙත සේන්දුවන නෞකාවලින් 10% ක් වූ අවම ප්‍රමාණයක්වත් ජාත්‍යන්තර සමුද්‍රීය සම්මුතීන්ට හා ප්‍රමිතීන්ට අනුකූල වන්නේදැයි පරීක්ෂා කිරීම හා අවශ්‍ය වේ නම්, මුහුදු ප්‍රවාහනයට නුසුදුසු නෞකා රඳවා තබා ගැනීම.

- ශ්‍රී ලංකාවේ නැව් නියෝජිතවරුන්, බහළුම් මෙහෙයුම්කරුවන්, නැව්බඩු ගෙනයන්නන්, හා යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු මෙහෙයුම්කරුවන් සඳහා බලපත් නිකුත් කිරීම සහ එම නියෝජිතයන්ගේ කටයුතු නියාමනය කිරීම.

- 1913 අංක 40 දරණ අද්මිරාල්ති අධිකරණ බලසීමා පනත හා 1991 මහාධිකරණ (අද්මිරාල්ති අධිකරණ බලසීමා) නියෝග යටතේ ශ්‍රී ලංකාවේ මහාධිකරණ අද්මිරාල්ති උසාවිය විසින් තීන්දු කරනු ලබන පරිදි නෞකා අත් අඩංගුවට ගැනීම, ආරක්ෂකභාරයට ගැනීම සහ මුදාහැරීම හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

8.1.4 සංවිධාන සටහන

ඇමුණුම II

8.1.5 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ඉදිරි සැලසුම්

- වෙළඳ නාවික ලේකම් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ලබා ගැනීම.

- වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ ආයතන ව්‍යුහය ශක්තිමත් කිරීම.

- IMO හා ILO සම්මුතීන්ට අනුකූලව දේශීය නීතිරීති සකස්කිරීම හා අවශ්‍යතාවය පරිදි යාවත්කාලීන කිරීම.
- ඊ- රාජ්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

- ශ්‍රී ලාංකා ධජය යටතේ නෞකා ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම

- නාවිකයන් සඳහා විදේශීය ධජය සහිත නෞකා වල සේවය කිරීමට අවශ්‍ය සමානතා සහතික නිකුත් කිරීම සඳහා සුදුසු විදේශීය රාජ්‍යයන් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

- වරාය රාජ්‍ය පාලන කටයුතු විධිමත් කිරීම.

- මහජනයා සඳහා විනිවිදභාවයෙන් යුතු කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා තත්ත්ව පද්ධති හඳුන්වාදීම, යාවත්කාලීනකිරීම සහ ප්‍රතිව්‍යුගත කිරීම.


- නාවික ක්ෂේත්‍රයේ නව ගෝලීය ප්‍රවණතාවයන් සඳහා අවශ්‍යවන නීතිරීති ස්ථාපිත කිරීම.

මෙහෙයුම් ප්‍රගතිය

සහතිකපත් නිකුත්කිරීම - 2025

අඛණ්ඩ මුදාහැරීමේ සහතිකය (CDC)

මාසය	නව CDC සංඛ්‍යාව	යාවත්කාලීන කල CDC සංඛ්‍යාව
ජනවාරි	167	291
පෙබරවාරි	214	227
මාර්තු	277	179
අප්‍රේල්	158	274
මැයි	175	286
ජූනි	225	275
ජූලි	208	273
අගෝස්තු	209	251
සැප්තැම්බර්	218	274
ඔක්තෝබර්	206	289
නොවැම්බර්	263	202
දෙසැම්බර්	194	287
එකතුව	**2,514**	**3,108**



මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

ප්‍රවීණතා සහතික/මුරකාවලෙහි යෙදවීමේ සහතික සංඛ්‍යාව

I. නාවික අංශය

සහතික වර්ගය	නිකුත්කරන ලද සහතික ප්‍රමාණය
නැව්පති (1 වන පන්තිය)	29
නැව්පති නිලධාරී (2 වන පන්තිය)	42
නැව්පති නිලධාරී (3 වන පන්තිය)	126
ජලතරණ /මුරකාවල් සහතික (නිලධාරී / නිලධාරී නොවන)	605
නිපුණතා සහතික	248

මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

II. ඉංජිනේරු අංශය

සහතික වර්ගය	නිකුත්කරන ලද සහතික ප්‍රමාණය
ප්‍රධාන ඉංජිනේරු	30
දෙවන ඉංජිනේරු	52
තෙවැනි ඉංජිනේරු	62
ඉංජිනේරු /මුරකාවල් සහතික (නිලධාරී / නිලධාරී නොවන)	255
නිපුණතා සහතික	103

මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

නැව් ඒජන්තවරුන් බහළුම් මෙහෙයුම්කරුවන්, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු මෙහෙයුම්කරුවන් සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම - 2025

බලපත්‍ර වර්ග	නිකුත්කරන ලද බලපත්‍ර ප්‍රමාණය
නැව් නියෝජිතයන්	220
බහළු මෙහෙයුම්කරුවන්	26
නැව් බඩු ගෙනයන්නන්	545
නැව් බඩු ගෙනයන්නන් හා යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු මෙහෙයුම්කරුවන්	86
යාත්‍රා නාවික බලපත්‍ර	507
නැව් සමාගම් එකතු කිරීම	54

මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

බහාළුම් බර සත්‍යාපනය කිරීමේ සහතිකපත් නිකුත් කිරීම - 2025

බලපත්‍ර වර්ග	නිකුත්කරන ලද බලපත්‍ර ප්‍රමාණය
පාලම් තරාදි සඳහා (Weigh Bridge)	27
භාණ්ඩ අපනයනකරුවන් (Shipper)	61
ප්‍රයිම් මුවර් (Prime Mover)	09
ට්‍රේලර් (Trailer)	19
ලොරි රථ (Lorry)	01

මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

නාවිකයන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම (SID) - 2025

මාසය	හැඳුනුම්පත් සංඛ්‍යාව
ජනවාරි	189
පෙබරවාරි	304
මාර්තු	301
අප්‍රේල්	230
මැයි	227
ජූනි	280
ජූලි	269
අගෝස්තු	257
සැප්තැම්බර්	235
ඔක්තෝබර්	297
නොවැම්බර්	303
දෙසැම්බර්	309
එකතුව	**2292**

වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් සපයනු ලබන සේවාවන් සඳහා උපයන ලද මාසික ආදායම් පහත පරිදි වේ.

මාසය	ආදායම (රු.)
ජනවාරි	14,732,428.79
පෙබරවාරි	12,328,362.18
මාර්තු	15,183,102.94
අප්‍රේල්	12,425,945.08
මැයි	11,866,354.50
ජූනි	15,016,294.40
ජූලි	16,586,882.95
අගෝස්තු	18,664,459.31
සැප්තැම්බර්	13,713,969.08
ඔක්තෝබර්	15,242,281.25
නොවැම්බර්	37,970,278.85
දෙසැම්බර්	31,167,884.93
එකතුව	**215,198,244.26**

8.1.6 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

8.1.6.1 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2025.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ - එල්

අයවැය (වර්තමාන වර්ෂය- 2025)		සටහන	තත්‍ය		
			වර්තමාන වර්ෂය- 2025 රු.	ඉකුත් වර්ෂය-2024 රු.	
	ආදායම් ලැබීම්				
	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	
	බදු නොවන ආදායම් සහ වෙනත්	4	215,198,244	224,984,808	
	මුළු ආදායම් ලැබීම් (අ)		215,198,244	224,984,808	
	ආදායම් නොවන ලැබීම්				
	භාණ්ඩාගාර අග්‍රිම		148,416,000	171,714,000	ඒසීඒ - 3
	තැන්පතු		1,334,258	976,750	ඒසීඒ - 4
	අත්තිකාරම් ගිණුම්		3,570,543	2,617,002	ඒසීඒ - 5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්			-	
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**153,320,801**	**175,307,752**	
	මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ) +(ආ)		**368,519,045**	**400,292,561**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**148,416,000**	**225,907,101**	
	ශුද්ධ ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) – (ඇ)		**220,103,045**	**174,385,460**	
	අඩුකලා : වියදම				
	පුනරාවර්තන වියදම්				
	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	66,138,572	60,511,170	
	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	73,632,330	78,193,023	ඒසීඒ-2 (II)
	සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	6,793,462	10,983,163	
	පොළී ගෙවීම්	8	-	-	
	වෙනත් පුනරාවර්තන වියදම්	9	74,960	63,000	
	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**146,639,324**	**149,750,356**	
	මූලධන වියදම්				

	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	645,335	184,600	ඒසිඒ-2 (II)
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	1,691,875	20,574,167	
	ප්‍රාග්ධන මාරුකිරීම්	12		-	
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13		-	
	හැකියා වර්ධනය	14	722,900	470,770	
	වෙනත් මූලධන වියදම්	15			
	මුළු මූලධන වියදම් (උ)		**3,060,110**	**21,229,537**	
	තැන්පතු ගෙවීම්		**1,062,622**	**728,811**	ඒසිඒ - 4
	අත්තිකාරම් ගෙවීම්		**5,594,147**	**5,890,673**	ඒසිඒ - 5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර වියදම් (ඌ)		**6,656769**	**6,619,484**	
	මුළු වියදම් එ = (ඊ +උ+ ඌ)		**156,356,203**	**177,599,377**	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ -එ)		**(4,266,377)**	**(3,213,917)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**(4,266,377)** **-**	**(3,523,357)** **309,441**	ඒසිඒ - 7 ඒසිඒ - 3
			(4,266,377)	**(3,213,917)**	

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ - පී

		තත්‍ය	
	සටහන	**2025 වර්ෂය රු.**	**2024 වර්ෂය රු.**
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, යන්ත්‍රෝපකරණ	ඒසිඒ - 6	118,872,047	118,872,047
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ - 5/5 (ඒ)	**9,639,782**	**7,616,178**
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ - 3	-	**309,441**
මුළු වත්කම්		**128,511,829**	**126,797,666**
ශුද්ධ වත්කම්/ ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		8,872,207	7,120,239
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		118,872,047	118,872,047
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ - 5 (බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ - 4	767,575	495,939
අග්‍රිම ශේෂය	ඒසිඒ - 3	-	309,441
මුළු වගකීම්		**128,511,829**	**126,797,666**

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

එස්ඒඒ - සී

	තක්සා	
	2025 වර්ෂය රු.	**2024 වර්ෂය රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	**215,198,244**	**224,984,808**
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	3,756,765	3,011,852
අග්‍රිම ලැබීම	172,980,236	205,777,042
අත්තිකාරම් අයකර ගැනීම	4,535,322	3,061,377
තැන්පතු ලැබීම	1,344,258	976,750
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**397,804,825**	**437,811,829**
අඩු කලා - මුදල් වැය කිරීම් :		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	139,845,862	138,805,078
සහනාධාර සහ මාරු කිරීම්	6,793,462	10,983,163
ගොඩනැගිලි සහ අනෙකුත් ප්‍රාග්ධන වියදම්	1,368,235	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	509,754	311,126
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම 479/25	208,323,576	259,970,143
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම 479/24	32,431,028	-
අත්තිකාරම් ගෙවීම්	6,087,851	5,945,301
තැන්පතු ගෙවීම්	1,062,622	728,811
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**396,422,391**	**416,743,621**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) –(ආ)	**1,382,434**	**21,068,208**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අය කර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩු කලා - මුදල් වැය කිරීම්:		
මූලධන වියදම්	1,691,875	20,758,767
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**1,691,875**	**20,758,767**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඈ) – (ඉ)	**(1,691,875)**	**(20,758,767)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ) + (ඊ)	**(309,441)**	**309,441**

මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	-
අඩු කළා - මුදල් වැය කිරීම් :		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) = (උ) – (එ)	-	-
මුදල් වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) + (ඒ)	**(309,441)**	**309,441**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**309,441**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන	166,000,000	162,800,000	146,639,324	90.07%
ප්‍රාග්ධන	25,000,000	28,200,000	3,060,110	10.85

පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය

පරිත්‍යාග කළ ආයතනය	පරිත්‍යාගයේ අරමුණු	පරිත්‍යාග මුදල
-	-	-

මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය රු.	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි ව්‍යුහය	33,802,055.01	33,802,055.01	-	
9152	යන්ත්‍රෝපකරණ	85,069,992.22	85,069,992.22	-	
9153	ඉඩම්	-	-	-	
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

8.2 ශ්‍රී ලංකා වරාය අධිකාරිය

8.2.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ වරායයන්හි අනාගතය කෙරෙහි අවධානය යොමු කරමින්, අභියෝග මෙන්ම අවස්ථාවන් රාශියකට මහ සලසන ජාත්‍යන්තර වෙළඳාමේ උත්පාතය අපේක්ෂා කරමින්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි විශිෂ්ටතම, බහළු මෙහෙයුම් කේන්ද්‍රස්ථානය බවට පත්වීමේ සිට ගෝලීය වශයෙන් විශිෂ්ටතම සේවා සැපයුම් බවට පත් කිරීමට කැපී පෙනෙන වෙනසක් සිදු කරමින් සිටී. ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික තත්ත්වය සංවර්ධනය කිරීමෙහිලා, ජාතික හා අන්තර්ජාතික වශයෙන් යෝග්‍ය ක්‍රියාමාර්ග සෑම මට්ටමකින්ම ජාතික සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන් මිණුම් සලකුණු කරන අතරම, සියළු තොරතුරු ක්ෂණිකව "එක් ස්පර්ශ" තොරතුරු ප්‍රවාහයක් සමඟින් සිය සංකීර්ණ සැපයුම් ප්‍රවේශයන් ශක්තිමත් කිරීමට වරාය අධිකාරිය සැලසුම් කරයි.

8.2.2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

1. නැගෙනහිර බහළු පර්යන්තය - අදියර II

1.1 සිවිල් වැඩ සංරචකය

- **භෞතික ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතියේ සිවිල් වැඩ සංරචකය යටතේ සිදු කළ ජැටි බැම්ම ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇති අතර, සමස්ථ භෞතික ප්‍රගතිය 71.9%ක් වේ.

- **මූල්‍ය ප්‍රගතිය**

මුළු ව්‍යාපෘති පිරිවැය	එ.ජ.ඩො.මිලියන 69.5 ක් සහ ශ්‍රී ලංකා රු.බිලියන 58.5
ගෙවීම් ප්‍රගතිය	එ.ජ.ඩො.මිලියන 45.4 ක් සහ ශ්‍රී ලංකා රුපියල් බිලියන 29.28 (බදු සහිත ලංකා රු.බිලියන 34.53

1.2 නැගෙනහිර බහළු පර්යන්තය සඳහා උපකරණ ප්‍රසම්පාදනය කිරීම

නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කරන දොඹකර සහ රේල් පීලි මත සවිකල ස්වයංක්‍රීය දොඹකර සියල්ලම ලැබී ඇත. නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කරන දොඹකර හයක් ක්‍රියාත්මක කර මෙහෙයුම් සඳහා මුදා හැර ඇත. නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කරන ඉතිරි දොඹකර (STS) හය සහ රේල් පීලි මත සවිකල ස්වයංක්‍රීය දොඹකර (ARGM) හතළිහ අංගන ඉදි කිරීම් සහ විදුලි සැපයුම අවසන් වූ පසු ක්‍රියාත්මක කරනු ඇත. ඉතිරි එක්සත් ජනපද ඩොලර් මිලියන 28.256 ගෙවීමට නියමිතව ඇත.

1.3 නැගෙනහිර බහළු පර්යන්තයේ පර්යන්ත මෙහෙයුම් පද්ධතිය

නෞකා මෙහෙයුම්, අංගන සැලසුම්, ගේට්ටු මෙහෙයුම් වලට සහාය ලබා දීමට සහ උපකරණ පාලන පද්ධති සමඟ ඒකාබද්ධ කිරීමට අර්ධ ස්වයංක්‍රීය නැගෙනහිර බහලු පර්යන්තය සඳහා ශක්තිමත් පර්යන්ත කළමනාකරණ පද්ධතියක් / පර්යන්ත මෙහෙයුම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම මෙම මෙහෙයුම් පද්ධතිය මඟින් සිදු කරනු ලබයි.

මෙම ව්‍යාපෘතියට අදාළව පහත කාර්යයන් අවසන් කර ඇත.

- අර්ධ ස්වයංක්‍රීය පර්යන්ත මෙහෙයුම් අවශ්‍යතා සහ අනුකූලව නැගෙනහිර බහාලු පර්යන්තයේ පර්යන්ත මෙහෙයුම් පද්ධතිය සඳහා පද්ධති වින්‍යාස කිරීම (System Configuration) සහ මෙහෙයුම් ක්‍රියාවලී සම්පූර්ණ කිරීම.

- නෞකා මෙහෙයුම්, අංගන මෙහෙයුම් සහ පර්යන්ත ක්‍රියාවලීන් ඇතුළු ප්‍රධාන මෙහෙයුම් මොඩියුල සඳහා කාර්යමය පරීක්ෂණ පැවැත්වීම.

- ස්වයංක්‍රීයකරණ අවශ්‍යතා සඳහා සහය වීමට පර්යන්ත මෙහෙයුම් පද්ධතිය සහ උපකරණ පාලන පද්ධතිය අතර මූලික ඒකාබද්ධ කිරීමේ කටයුතු ආරම්භ කිරීම.

- පද්ධති ප්‍රවේශය සහ මෙහෙයුම් සූදානම සහතික කිරීම සඳහා සර්වර් (Server) සකස් කිරීම හා ජාල පහසුකම් සැපයීම ඇතුළුව අවශ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

- ව්‍යාපාර අවශ්‍යතාවයන් ඉටු කිරීම හා පද්ධති කටයුතු හා අනුගත වීම සඳහා අදාල මෙහෙයුම් පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම.

2026 ජුනි 30 වන විට අපේක්ෂිත සිවිල් වැඩ නිම කිරීමට අනුකූලව නැගෙනහිර බහළු පර්යන්තයේ පර්යන්ත මෙහෙයුම් පද්ධතියේ අවසන් වශයෙන් සූදානම සහ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සැලසුම් කර ඇත.

1.4 නැගෙනහිර බහළු පර්යන්තය සඳහා මෙහෙයුම් ගොඩනැගිල්ල ඉදි කිරීම - සිවිල් වැඩ

නැගෙනහිර බහලු පර්යන්තයේ මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා, මෙහෙයුම් හා අනෙකුත් කාර්ය මණ්ඩලයට ඉඩ පහසුකම් ලබා දීමට හා මෙහෙයුම් යටිතල පහසුකම් පවත්වා ගෙන යාම සඳහා සිවි මහල් මෙහෙයුම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. මුළු බිම් ප්‍රමාණය ආසන්න වශයෙන් වර්ග මීටර් 4500 ක් වේ.

මෙම ව්‍යාපෘතිය සඳහා මුළු ඇස්තමේන්තු මුදල රු.මිලියන 1600 ක් වේ. 2025.12.31 දිනට වැට බඳු ඇතුළුව සියලුම කොන්ත්‍රාත්තු වල සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 1,409 (97.5 %) ක් වේ.

2. බටහිර බහළු පර්යන්තය - I (WCT – I)

කොළඹ දකුණු වරායේ බටහිර බහළු පර්යන්තය - I (WCT – I) මඟින්, පසුපස අංගන ප්‍රදේශයක් සහිත ගැඹුර මීටර් 20 කින් යුත් දිගින් මීටර් 400 ක් හෝ ඊට වැඩි දිගින් යුත් අතිවිශාල බහළු නෞකා 3 කට ඉඩ පහසුකම් සැලසීම සඳහා මීටර් 1400 ක දිගින් ජැටියක් ඉදිකිරීමට අපේක්ෂා කෙරේ. ආසන්න වශයෙන් පර්යන්ත ප්‍රදේශය හෙක්ටයාර 65 ක් වන අතර පර්යන්තයේ වාර්ෂික ධාරිතාවය විස්සේ සම ඒකක මිලියන 3.0 කි.

බටහිර බහළු පර්යන්ත - I හි සංවර්ධනය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) ආයෝජනයක් ලෙස සිදු කෙරෙන අතර මුළු ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය ඇ.ඩො.මිලියන 762 කි.

මුළු ඉදිකිරීම් කාලය 2022.02.26 සිට 2027.02.26 දක්වා වසර පහක් වේ. ඒ අනුව, ව්‍යාපෘතියේ සමස්ත ඉදි කිරීම් ප්‍රගතිය 89.5% ක් වන අතර පර්යන්තයේ සහ ජැටි බැම්මේ පළමු මීටර් 600 හි මෙහෙයුම් ආරම්භ කර ඇත.

3. කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය

මේ වන විට අපේක්ෂිත නැව් භාණ්ඩ ප්‍රමාණය වැඩි කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නැගෙනහිර බහළු පර්යන්තයේ අදියර II හා බටහිර බහළු පර්යන්තයේ අදියර I ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. ඉහත පර්යන්ත දෙක අවසන් කිරීමෙන් පසු, බටහිර බහළු පර්යන්ත II හි ඉදිකිරීම් කටයුතු 2029 – 2030 වර්ෂයේදී ආරම්භ වන අතර

කොළඹ වරායේ බහළු ධාරිතාවය පිළිබඳ පුරෝකථනයට අනුව 2030 වර්ෂය වන විට සමස්ත වරාය එහි උපරිම ධාරිතාවයට ළඟා වනු ඇත. ඉහත කරුණු සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකා වරාය අධිකාරිය පවතින කොළඹ වරායේ උතුරු පැත්තෙහි නව වරායක් සංවර්ධන කිරීම ආරම්භ කර ඇත. යෝජිත කොළඹ උතුරු වරාය (CNP) මෝදර ප්‍රදේශයේ කැළණි ගඟේ සිට කොළඹ වරායේ පවතින උතුරු දියකඩනය දක්වා විහිදෙනු ඇත. යෝජිත කොළඹ උතුරු වරාය දුව තොග, වියළි තොග, රෝ - රෝ සහ බහාලුම් සඳහා භාවිතා කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදහස් කරයි. ඉල්ලුම මත පදනම්ව, කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඉල්ලුමට පෙර යටිතල පහසුකම් සහ වරාය සේවා සැපයීම කෙරෙහි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවධානය යොමු වී ඇත.

ඉහත සංකල්පයේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සහ පාරිසරික බලපෑම් තක්සේරුවක් (EIA) ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදු කර ඇත. ඊට අමතරව, ව්‍යාපෘතිය කැළණි ගඟ ආශ්‍රිතව සිදු කිරීම හේතුවෙන් කැළණි ගඟට ව්‍යාපෘතියෙන් ඇතිවිය හැකි බලපෑම් තක්සේරු කිරීම සඳහා අතිරේක අධ්‍යනයන් සිදු කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලසුම් කර ඇත.

ඉහත ශක්‍යතා අධ්‍යනයෙන් හඳුනාගත් පරිදි, සංවර්ධන කාල රාමුව පහත පරිදි වේ.

සංවර්ධන අදියර	ආරම්භක මෙහෙයුම් වර්ෂය	
	පදනම	ඉහළ
බටහිර දියකඩනය දීර්ඝ කිරීම	2027	2027
බටහිර බහළු පර්යන්ත II	2029	2029
සේවා සැපයුම් ගොඩනැගිල්ල	ඉල්ලුම මත රඳා පවතී	
කොළඹ උතුරු වරාය දියකඩනය	2029-2031	
නැගෙනහිර බහාලු පර්යන්ත - අදියර 2	2032	2030
SAGT - අදියර 2	2036	2033
CNP - අදියර 1, මීටර් 1400	2044	2034
CNP - අදියර 2, මීටර් 1400	-	2038
CNP - අදියර 3, මීටර් 1400	-	2043-2048

4. බටහිර බහළු පර්යන්තය – II

4.1 දියකඩනය දීර්ඝ කිරීම

ජාතික වරාය ප්‍රධාන සැලැස්ම - 2019 ට අනුකූලව, මීළඟ යෝජිත සංවර්ධන සැලැස්ම වනුයේ, බටහිර බහළු පර්යන්ත I හි ජැටි බැම්ම දීර්ඝ කරමින් බටහිර බහළු පර්යන්තය - II නිර්මාණය කිරීම සඳහා කොළඹ දකුණු වරායේ බටහිර දියකඩනය දීර්ඝ කිරීම වේ.

බටහිර බහළු පර්යන්ත II ව්‍යාපෘතියට දැනට පවතින බටහිර දියකඩනය ගැඹුරු මුහුද දක්වා තවදුරටත් දීර්ඝ කිරීම සහ බටහිර බහළු පර්යන්ත II පිටුපස ප්‍රදේශය අවම වශයෙන් හෙක්ටයාර 50 -70 ක භූමි ප්‍රදේශයක් බටහිර දෙසට දීර්ඝ කරමින් බටහිර බහළු පර්යන්තය I ට යාබදව විස්සේ සම ඒකක මිලියන 3.5 ක ධාරිතාවක් සහිත මීටර් 20 ගැඹුරින් යුත් මීටර් 1200- මීටර් 1400 ක ජැටි බැම්මක් ඉදි කිරීම සඳහා දකුණු වරාය ද්‍රෝණියක් නිර්මාණය කිරීම ඇතුලත් වේ. මෙම ව්‍යාපෘතිය නිම වූ පසු, බටහිර බහළු පර්යන්තය - I ලෙස මීටර් 18 – 20 ක ගැඹුරකින් යුත් මීටර් 2600-2800 ක සෘජු ජැටි බැම්මක් හා සේවා සැපයුම් පහසුකම් ගොඩනැගිල්ල සඳහා බටහිර බහළු පර්යන්තය II පිටුපස හෙක්ටයාර 50 -70 ක භූමි ප්‍රදේශයක් බටහිර බහළු පර්යන්තය - II සඳහා නිර්මාණය වනු ඇත.

4.2 බටහිර දියකඩනය දීර්ඝ කිරීම සඳහා සවිස්තරාත්මක සැලසුම් සඳහා උපදේශක සේවා

ව්‍යාපෘතිය	බටහිර බහළු පර්යන්ත II හි බටහිර දියකඩනය දීර්ඝ කිරීමේ සවිස්තරාත්මක සැලසුම් සඳහා උපදේශක සේවා කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (CPEP) අදියර II
ආරම්භක දිනය	2025.04.21
අපේක්ෂිත නිම කිරීමේ දිනය	2027.04.21
2025 වර්ෂය සඳහා මුදල් වෙන් කිරීම	රු. මිලියන 550
2025 වර්ෂය තුළ වියදම්	රු. මිලියන 90.51

යෝජිත කාර්යයන් සඳහා සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය, Dohwa Engineering Co. (Ltd) සමාගම සමඟ 2025.03.06 වන දින උපදේශක ගිවිසුමකට එළැඹෙන ලදී. ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදල එක්සත් ජනපද ඩොලර් මිලියන 5ක් වේ.

5. වරාය ප්‍රවේශ අධිවේගී ගුවන්මාර්ග ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පරිශ්‍රය හරහා දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී ගුවන්මාර්ග ව්‍යාපෘතිය ඉහුරුකඩේ හංදියේ සිට ගාලු මුවදොර දක්වා ඉදි කෙරේ. එය කිලෝමීටර් 5.3 ක දිගින් යුත් මංතීරු 4 කින් සමන්විත අධිවේගී ගුවන් මාර්ගයක් වේ. මෙම ව්‍යාපෘති පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 300 ක් වන අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලැබේ.

5.1 සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය (ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල)

- වරාය ප්‍රවේශ අධිවේගී ගුවන්මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් හේතු කොටගෙන, බලපෑමට ලක් වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලයට පහසුකම් සැලසීම සඳහා කැනල් අංගන පරිශ්‍රයේ මහල් 17 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට සැලසුම් කරන ලද අතර මේ වන විට ඉදිකිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

- ව්‍යාපෘති පිරිවැය රුපියල් බිලියන 4.9 ක් (එක්සත් ජනපද ඩොලර් මිල ඉහළයාම හැර) වන අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් මෙහි අරමුදල් සපයනු ලබන අතර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් භාර ගෙන ඇත.

- මේ දක්වා අත් කර ගෙන ඇති භෞතික ප්‍රගතිය 71% කි.

5.2 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා ගෘහභාණ්ඩ මිළදී ගැනීම.

- සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ වරාය අධිකාරියේ අරමුදල් භාවිතයෙන් මිලදී ගනු ඇත.

5.3 නව වැඩහල් ගොඩනැගිලි සංකීර්ණය

- ව්‍යාපෘතිය අවසන් කර ඇති අතර දැනට දෝෂ දැනුම් දීමේ කාල සීමාවේ පවතී.

- මේ දක්වා මුළු වියදම රුපියල් මිලියන 1,731.19 ක් වන අතර කොන්ත්‍රාත්කරු හට අවසන් ගෙවීම පමණක් සිදු කළ යුතුව ඇත.

5.4 සභාපති කාර්යාල ගොඩනැගිල්ලේ ඉතිරි නවීකරණ කාර්යයන් සිදු කිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අරමුදල් ලබා දෙනු අතර විදුලි සහ සිවිල් කොට්ඨාශ වල දායකත්වයෙන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරනු ලැබේ. මේ දක්වා භෞතික ප්‍රගතියෙන් 70% ක් අත්කර ගෙන ඇත.

6. කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය කිරීම.

කාණ්ඩ අංකය	ව්‍යාපෘතිය	ආරම්භක දිනය	අපේක්ෂිත නිම කිරීමේ දිනය	2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන	2025 වර්ෂය තුල වියදම්
01	කන්කසන්තුර වරාය ප්‍රතිසංස්කරණය කිරීම - උපදේශක කොන්ත්‍රාත්තුව	2020.10.12	2024.12.31	ශ්‍රී ලංකා රුපියල් මිලියන 3,455	-
02	වරාය ප්‍රතිසංස්කරණය කිරීම - ඉදි කිරීම් කොන්ත්‍රාත්තුව	තවමත් ආරම්භ කර නොමැත.	-		-

මෙම ව්‍යාපෘතියට අරමුදල් සැපයීම සඳහා, 2018.01.10 වන දින ශ්‍රී ලංකා රජය, ඉන්දියාවේ Export – Import බැංකුව සමඟ ඩොලර් ණය සහන ගිවිසුමකට එළඹ ඇති අතර එම කාර්යය ඉටු කිරීම සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 45.27ක මූල්‍ය ආධාර ලබා ගෙන ඇත.

උපදේශක කොන්ත්‍රාත්තුව සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව වශයෙන් මෙම ව්‍යාපෘතිය කොන්ත්‍රාත් 2 කින් සමන්විත වේ.

උපදේශක කොන්ත්‍රාත්තුව

- මේ දක්වා උපදේශක වෙත 20% ක අත්තිකාරම් ගෙවීමක් ඇතුළුව රුපියල් මිලියන 197 ක මුදලක් ගෙවා ඇත.

- සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව (DPR) – 2021, පූර්ව සුදුසුකම් (PQ) ලේඛනය, ටෙන්ඩර් ලේඛන, පිරිවිතර හා නිර්මාණ ඇදීම් ඇතුළුව මේ දක්වා උපදේශක කටයුතු වලින් 47% කට ආසන්න ප්‍රමාණයක් අවසන් කර ඇත.

- සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව සඳහා අනුමැතිය ඉන්දියාවේ EX-IM බැංකුව වෙතින් ලබා ගෙන ඇත.

- සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව (DPR) 2021 ට අනුව, ඇස්තමේන්තුගත පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 45.27 සිට එක්සත් ජනපද ඩොලර් මිලියන 61.5 දක්වා ඉහළ යාමත් සමඟ ව්‍යාපෘති පිරිවැය ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, ණය මුදල දීර්ඝ කිරීම සඳහා සහ ඉන්දියාවේ Ex-Im බැංකුවෙන් පූර්ව සුදුසුකම් ලේඛනය සඳහා අනුමැතිය ලබා ගැනීම පසුගිය වසර හතරක කාලය තුල ලබා ගැනීමට නොහැකිව ඇත.

- මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ඉන්දියානු රජය විසින් එක්සත්

ජනපද ඩොලර් මිලියන 63.65 ක ප්‍රදානයක් ලබා ගැනීමට යෝජනා කර ඇත. ඉහත සඳහන් ප්‍රදානය ලබා ගැනීම සඳහා සහ ඉන්දියානු රජය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට සහ පවත්නා ඩොලර් ණය ගිවිසුම් අවලංගු කරන ලෙස ඉල්ලීමක් සිදු කිරීමට මුදල්, ආර්ථික ස්ථායීකරණය හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2024.04.29 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.

- මෙම කාර්යය තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ඉන්දියානු රජයේ කෙටුම්පත් අවබෝධතා ගිවිසුම්, වරාය නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය හරහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඇතුළු අදාල බලධාරීන් සහ අමාත්‍යාංශ වෙත අදහස් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

- වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශයේ එවක ලේකම්ගේ සභාපතීත්වයෙන් යුත් කමිටුවක් විසින් මෙම අවබෝධතා ගිවිසුම සමාලෝචනය කර පරිශීලනය කිරීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට හා ශ්‍රී ලංකා රජය හා ඉන්දීය රජය අතර සාකච්ඡා සම්මුති මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ (PIA) කාර්යභාරය තීරණය කිරීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ කාර්යභාරය නිර්වචනය කර ඇති සංශෝධිත කෙටුම්පත් අවබෝධතා ගිවිසුම, රේඛීය අමාත්‍යාංශය හරහා අදහස් දැක්වීම සඳහා ඉන්දීය මහ කොමසාරිස්වරයා විසින් යවා ඇත. පාර්ශවකරුවන් වන අමාත්‍යාංශ කිහිපයක් මඟින් සංශෝධිත කෙටුම්පත් අවබෝධතා ගිවිසුම සඳහා ඔවුන්ගේ අදහස් දැක්වීම් යවා ඇත. රේඛීය අමාත්‍යාංශය 2024.10.16 දින සියලුම පාර්ශවකරුවන් සමඟ මේ සම්බන්ධයෙන් රැස්වීමක් පවත්වන ලදී. ඉන් අනතුරුව, සංශෝධිත කෙටුම්පත් අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් දක්වන අදහස් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද අතර කෙටුම්පත් අවබෝධතා ගිවිසුම පිළිබඳ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක්ද සකස් කර වැඩිදුර සලකා බැලීම සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

- 2025.03.04 දින ඉන්දියානු මහ කොමසාරිස්වරයා සහ වරාය අධිකාරියේ සභාපතිවරයා අතර පැවැති රැස්වීමේදී අවබෝධතා ගිවිසුමට අදාලව පැවති ගැටළු සාකච්ඡා කරන ලදී. අදාල විශේෂඥයින් සමඟ අදහස් හුවමාරු කර ගැනීමෙන් පසුව සාකච්ඡා කිරීමට දෙපාර්ශවයම එකඟ වන ලදී. නුදුරු අනාගතයේදී අවබෝධතා ගිවිසුමට අත්සන් කිරීමට ඉන්දියාව අපේක්ෂා කරනු ලබයි.

- 2025 ඔක්තෝම්බර් මස 22 සහ 31 යන දිනයන්හි පිළිවෙලින් ගරු අමාත්‍යතුමා සහ රේඛීය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීම් දෙකක් පවත්වන ලදී. මෙම රැස්වීම් වල අරමුණ වූයේ කන්කසන්තුර වරාය ප්‍රදානය සඳහා වන කෙටුම්පත් අවබෝධතා ගිවිසුම සමාලෝචනය කිරීමය. 2025.12.23 වන දින රේඛීය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අදාල සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් තවත්

රැස්වීමක් පවත්වන ලදී. රැස්වීම අතරතුර පාර්ශවකරුවන්ගෙන් වැඩි දෙනෙකු ප්‍රදානය සඳහා යෝජිත අවබෝධතා ගිවිසුම පිළිබඳ සිය නිරීක්ෂණ සහ අදහස් ඉදිරිපත් කළ අතර විදේශ කටයුතු අමාත්‍යාංශයේ අදහස් ලැබීමෙන් අනතුරුව රේඛීය අමාත්‍යාංශය විසින් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව

මූල්‍ය සහාය ලබා දීම අවසන් වූ පසු ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රමාදයකින් තොරව ආරම්භ කළ හැකිය.

කන්කසන්තුර වරාය (ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අරමුදල් සහිතව)

යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

කන්කසන්තුර වරායේ ප්‍රධාන ව්‍යාපෘතියේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පහසුකම් සැලසීමට, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ස්වකීය අරමුදල් සැපයීම මඟින් පහත සඳහන් කටයුතු සිදු කරනු ලබන අතර ඒවාහි ප්‍රගතිය පහත පරිදි වේ.

නව ගේට්ටු සංකීර්ණය ඉදි කිරීම, අක්කර 16 ක ඉඩම වටා ආරක්ෂක මායිම් වැටක් ඉදි කිරීම, ජල ගබඩා ටැංකිය ඉදි කිරීම, උස් ජල ටැංකිය, මාර්ග වැඩ සහ ව්‍යාපෘති පරිපාලන කටයුතු සඳහා මිලදී ගත් නිවස ප්‍රතිසංස්කරණය කිරීම අවසන් කර ඇත.

(i) කන්කසන්තුර වරායේ ඉතිරි ඉඩම් සඳහා මායිම් තාප්පයක් සහ වැටක් ඉදි කිරීම.

මුළු ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලංකා රුපියල් මිලියන 40 කි.

සැලසුම් සහ ඉංජිනේරු ඇස්තමේන්තු අවසන් කර ඇති අතර ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය සමඟ ප්‍රසම්පාදනය සඳහා අවසරය ලබා ගෙන ඇත.

(ii) කන්කසන්තුර වරායේ ගේට්ටුව අසල ආරක්ෂක නිළධාරීන් සඳහා විවේකාගාරයක් ඉදි කිරීම.

මුළු ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලංකා රුපියල් මිලියන 30 කි.

2025.12.12 දින ටෙන්ඩරය විවෘත කරන ලද අතර ලංසු ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම සිදු කරමින් පවතී.

(iii) කන්කසන්තුර වරායේ මඟී පර්යන්ත ගොඩනැගිල්ල නවීකරණය කිරීම.

ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 30 කි.

සැලසුම් සහ ඉංජිනේරු ඇස්තමේන්තුව, ප්‍රසම්පාදන කටයුතු සඳහා අවසරය සහ ලංසු ලේඛන පරිශීලනය කිරීම අවසන් කර ඇත. ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලැබීමට නියමිතය.

7. ඔලුවිල් වරාය සංවර්ධනය කිරීම

දැනට ඔලුවිල් වරායෙහි වරාය පිවිසුමේ වැලි අවසාදනය වීමේ ගැටළුවක් පවතින අතර නැව්වලට වාණිජ වරායට සහ ධීවර වරායට නැව් ඇතුළු වීමේ හැකියාවක් නොමැත. Danish Hydraulic Institute ආයතනයේ සහයෝගය ඇතිව ඉංජිනේරු අධ්‍යයනයක් සිදු කර ඇති අතර ඔවුන්ගේ නිර්දේශයට කඩිනම් විසඳුමක් සහ සැලකිය යුතු මූල්‍ය ප්‍රමාණයක් වැයවන ක්‍රියාකාරී තත්වයක වරාය පවත්වා ගෙන යාමේ ක්‍රමවේදයක් ඇතුලත් වේ. මූල්‍ය හා තාක්ෂණික සීමාවන් හේතුකොටගෙන මෙයින් කිසිදු ක්‍රමයක් ක්‍රියාත්මක නොකරන ලදී.

ඔලුවිල් වරාය ධීවර වරායක් ලෙස සංවර්ධනය කිරීම සඳහාවන වැඩපිළිවෙල අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට 2021.09.22 දිනැති අංක

CP/211574/311/023 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇති අතර පළමු අදියර ලෙස අයිස් යන්ත්‍රාගාරය සහ ඒ ආශ්‍රිත පහසුකම් ධීවර අමාත්‍යාංශය වෙත භාර දී ඇත.

ධීවර වරාය පරිශ්‍රය ධීවර අමාත්‍යාංශයට පවරා දීමට අමතරව, ඉඩම් සහ පරිපාලන ගොඩනැගිල්ලකින් යුක්ත වාණිජ වරාය හා ආපනශාලවක්, ඉංජිනේරු කාර්ය මණ්ඩලය සඳහා ගොඩනැගිල්ලක්, නේවාසික කළමනාකරු නිල නිවාස ඇතුලත්වන අතර ඉංජිනේරු නිල නිවාස මේ වන විටත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධීක්ෂණය යටතේ පවතී.

සුදුසු ආයෝජක / ආයෝජකයින් තෝරා ගැනීම සඳහා විශේෂ ව්‍යාපෘති ඇගයීම් කමිටුවක් (SPEC) පත් කිරීම මඟින් ඔලුවිල් වරාය සඳහා ආයෝජන අවස්ථා සැලසීමට අභිලාෂය ප්‍රකාශ කිරීම / යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීම සඳහා 2022.11.22 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, වරාය ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා ඔලුවිල් වරායෙහි වාණිජ වරායේ ඉඩම් සහ ගොඩනැගිලි දිගු කාලීනව බදු දීම සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI) කැඳවා ඇත. ව්‍යාපෘති යෝජකයින් තිදෙනෙකු මූලික යෝජනා සමඟ අභිලාෂය ප්‍රකාශ කර ඇති අතර ඔලුවිල් වරාය ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා සුදුසු ව්‍යාපෘති යෝජකයෙකු/යෝජකයින් තෝරා ගැනීමට යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීමට විශේෂ ව්‍යාපෘති ඇගයීම් කමිටුව තීරණය කර ඇත.

ඒ අනුව 2025.03.21 දින සාර්ථක ලංසුකරුවෙකු තෝරා ගන්නා ලදී. අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව අභිලාශය ප්‍රකාශ කිරීමේ ලිපියක් නිකුත් කළද ලංසුකරු නියමිත කාලසීමාව තුල ප්‍රතිචාර නොදක්වන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් අභිලාෂය ප්‍රකාශ කිරීම/ යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීමේ ක්‍රියාවලිය අසාර්ථක විය.

වර්තමානයේදී, ඔලුවිල් වරාය ප්‍රදේශයේ වැලි එක්රැස් වීමේ ගැටලුවට තිරසර විසඳුමක් හඳුනා ගැනීම සඳහා ධීවර අමාත්‍යාංශය අධ්‍යනයක් සිදු කරමින් සිටී. මෙම අධ්‍යයනයේ නිර්දේශය ලැබුණු පසු, 2025.11.11 දිනැති අංක CP/25/2048/814/103 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව ඔලුවිල් වරාය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනා ගැනීමට ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට සැලසුම් කර ඇත.

8. මන්නාරම වරායේ තලෙයිමන්නාරම උතුරු ජැටිය සංවර්ධනය කිරීම.

කලාපයේ ආර්ථික සහ සාමාජීය පසුබිම වැඩිදියුණු කිරීම සඳහා මන්නාරම වරාය සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා රජය ගත් තීරණයට අනුකූලව, වරාය සීමාව ගැසට් කර ඇති අතර තලෙයිමන්නාරම ජැටිය සංවර්ධනය කිරීමේ තාක්ෂණික, මූල්‍ය, වෙළෙඳපොළ, ආර්ථික සහ පාරිසරික අංශ තක්සේරු කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට තීරණය කර ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමේ නිරතව සිටී.

9. ත්‍රිකුණාමලය වරායේ ඉංජිනේරු වැඩහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම.

දෛනික මෙහෙයුම් වල දී අනවශ්‍ය ගමන් බිමන් සහ ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා ත්‍රිකුණාමල වරායේ, වරාය මෙහෙයුම් ගොඩනැගිල්ල ආසන්නයේ එක් ස්ථානයකට සියලුම ඉංජිනේරු අංශයේ, කාර්යමණ්ඩලය සහ අනෙකුත් අදාල පහසුකම් රැගෙන යාමට තීරණය කර ඇත.

මෙම කොන්ත්‍රාත්තුව යටතේ භූමිය සකස් කිරීම, පස්වැඩ, පෙදරේරු, ලෝහ, ජල රෝධක, ටයිල්ඇතිරීම, තීන්ත ආලේප කිරීම ආදිය හා සම්බන්ධ වැඩ කටයුතු සහිත තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සහ වානේ කුළුණු, වානේ කාප්ප, වහලය, බිත්ති ආවරණ (Wall Cladding) හකුලන දොරවල් ආදිය සහිතව RC ගොඩනැගිල්ලට සම්බන්ධිත වානේ වැඩහල් (ගරාජය) ගොඩනැගිල්ල ඉදිකිරීම සහ විදුලිය, ජලනල සහ වෙනත් අවශ්‍ය පහසුකම් සහිතව කාණු පද්ධතිය ඉදිකිරීම සහ ගොඩනැගිල්ලේ සහ වරාය මෙහෙයුම් වල මනා ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය සේවා ප්‍රධාන වශයෙන් ඇතුලත් වනු ඇත. මුළු බිම් ප්‍රමාණය ආසන්න වශයෙන් වර්ග මීටර් 1800 වේ.

ටෙන්ඩරය ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව වෙත බදු රහිතව රු.252,851,266.93 ක මූලික කොන්ත්‍රාත් මුදලකට ප්‍රදානය කර ඇත. ඉදිකිරීම් කටයුතු 2023 අප්‍රේල් 03 වන දින ආරම්භ කර ඇත. ව්‍යාපෘතිය සැලකිය යුතු ප්‍රමාණයකින් අවසන් කර 2024.08.15 දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ත්‍රිකුණාමලය වරාය වෙත භාර දී ඇත.

මේ වන විට, අවසාන ගෙවීම සහ රැඳවුම් මුදල නිදහස් කිරීම රුපියල් මිලියන 104ක් වන 2025 වසරේ අයවැය ප්‍රතිපාදනයෙන් (සංශෝධිත) සිදු කර ඇත.ව්‍යාපෘතිය අවසන් වන විට බදු ඇතුලුව මුළු පිරිවැය රු.304,205,791.30 ක් වේ.

10. ජල සැපයුම් ටැංකිය සහ පොම්පාගාරය ඉදි කිරීම - ත්‍රිකුණාමල වරාය - පොම්ප සවි කිරීම

ත්‍රිකුණාමලය වරායේ ජල ඉල්ලුම සපුරාලීම සඳහා එය ඝණ අඩි 500 ක ධාරිතාවයෙන් යුත් ජල ගබඩා ටැංකියක් 2020/2021 වසර වල ඉදි කරන ලද අතර, ඉහත ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ජල ගබඩා ටැංකිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පීඩන පොම්ප පද්ධතිය සහ පයිප්ප ජාලය එහි ස්ථාපිත කල යුතුව ඇත.

මෙම කොන්ත්‍රාත්තුවට ප්‍රධාන වශයෙන් නෞකා උපනල (ship hydrants) සඳහා පොම්ප සැපයීම සහ සවි කිරීම සහ අෂ්රෆ් ජැටියට නල මාර්ග එලීම සහ වරාය මෙහෙයුම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් සහ සේවාවන් සමඟ විදුලි, ජලනල හා ජලාපවහන පද්ධතිය හා සේවාවන් ඇතුලත් වේ.

කොන්ත්‍රාත්තුව, කොන්ත්‍රාත්කරු වන **M/S Puritas (Pvt) Ltd** වෙත බදු රහිතව රු.44,040,795.80 ක මූලික කොන්ත්‍රාත් මුදලකට ප්‍රදානය කරන ලදී.ඉදිකිරීම් කටයුතු 2023.12.02 වන දින ආරම්භ කර ඇත. ව්‍යාපෘතිය 2024.08.15 වන දින සැලකිය යුතු ලෙස නිම කරන ලදී.

2025 වසරේ අයවැය වෙන් කිරීම් වන (සංශෝධිත) ලංකා රුපියල් මිලියන 1.3 භාවිතයෙන් අවසන් ගෙවීම හා රඳවා ගැනීමේ මුදල් ගෙවා ඇත. ව්‍යාපෘතිය නිමවීමේදී මුළු ව්‍යාපෘති පිරිවැය බදු මුදල්ද ඇතුළුව රුපියල් 51,968,138.53 ක් වේ.

11. ජය බහළු පර්යන්ත V (JCT – V) හි ගැඹුරු නැංගුරම් ධාරිතාව වැඩි කිරීමේ ව්‍යාපෘතියේ සිවිල් වැඩ සංරචකය

මධ්‍යම ප්‍රමාණයේ බහළු නෞකා දෙකකට පහසුකම් සැලසීමට සහ අංගන ධාරිතාව වැඩි කිරීම සඳහා අංගන ප්‍රදේශයේ පිටුපස ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා පවතින ජය බහළු පර්යන්ත IV හි ජැටි බැම්ම දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලසුම් කර තිබුණි. මෙම සංවර්ධන කටයුතු අදියර දෙකකින් එනම් (i),

අංගන ප්‍රදේශය සඳහා අවශ්‍ය භූමිය ගොඩ කිරීමේ වැඩ සමඟ පවතින ජැටි බැම්ම දීර්ඝ කිරීම සහ (ii) ගොඩ කරන ලද අංගන ප්‍රදේශයේ ගල් අතුරා තාර දැමීම හා පවතින අංගනයට සම්බන්ධ කිරීම වශයෙන් සැලසුම් කර තිබිණ.

ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම (ICB) යටතේ ලංසු කැඳවීමෙන් පසු, සංවර්ධනයේ පළමු අදියර වන සමුද්‍රීය ඉදි කිරීම් කටයුතු අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව ක්‍රියාත්මක කර අවසන් කරන ලදී.මීටර් 120 ක අමතර දිග ප්‍රමාණයකින් ජය බහළු පර්යන්ත IV ජැටි බැම්ම දීර්ඝ කිරීම හා හෙක්ටයාර 2.6 ක අමතර අංගන ප්‍රදේශය ගොඩ කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුලත් විය. අංගන ප්‍රදේශයේ ගොඩ කිරීම LWOST මට්ටමේ මීටර් +1.8 දක්වා අවසන් කර ඇත.

කොන්ත්‍රාත්තුව, M/s China Harbour Engineers Company Limited යන කොන්ත්‍රාත්කරු වෙත බදු රහිතව ලංකා රුපියල් මිලියන 5,035 ක මූලික කොන්ත්‍රාත් මිලකට ප්‍රදානය කරන ලද අතර 2024.05.15 දින සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩ නිම කරන ලදී. වර්තමාන සමස්ත ව්‍යාපෘති පිරිවැය බදු රහිතව ලංකා රුපියල් 4,901,281,238.76 ක් වන අතර ව්‍යාපෘතිය දෝෂ නිවැරදි කිරීමේ වගකීම් කාල සීමාව යටතේ පවතී. 2025වසර සඳහා අය වැය ප්‍රතිපාදන වෙන් කිරීම (සංශෝධිත) ලංකා රුපියල් මිලියන 1,141.38 ක් වන අතර 2026 වර්ෂය සඳහා ලංකා රුපියල් මිලියන128.6 ක් වේ.

12. කොළඹ වරායේ ජය බහළු පර්යන්ත - V අංගන ප්‍රදේශයේ ගල් අතුරා තාර දැමීමේ කටයුතු

සමස්ත ජය බහළු පර්යන්තයම ක්‍රියාත්මක කිරීම සඳහා ජය බහළු පර්යන්ත V හි ඉතිරි සංවර්ධන වැඩ කටයුතු සම්පූර්ණ කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හි ක්‍රියාකාරී සැලැස්ම 2025 තුළ ජය බහළු පර්යන්ත V සඳහා ගල් අතුරා තාර දැමීම ඇතුලත් කර මෙම වසර සඳහා ලංකා රුපියල් මිලියන 500 ක අය වැය ප්‍රතිපාදන වෙන් කර ඇති අතර එය ලංකා රුපියල් මිලියන 1020 ක ඇස්තමේන්තුගත පිරිවැය සමඟ 2026 වර්ෂය සඳහා ලංකා රුපියල් මිලියන 520 ක් වේ.

මෙම කොන්ත්‍රාත්තුවට ප්‍රධාන වශයෙන් අංගනය ඉදි කිරීම සහ මාර්ගය ඉදිකිරීම ඇතුලත් වේ. මුළු අංගන ප්‍රදේශය ආසන්න වශයෙන් වර්ග මීටර් 26,000 ක් වන අතර ජය බහළු පර්යන්ත IV හි අඩු කිරීමේ තහඩු ඉදි කිරීම, රබර් ටයර් යෙදූ ග්‍රැන්ට් දොඹකර ධාවන පථ ඉදි කිරීම සහ ගල් අතුරා තාර දැමීම ඇතුළුව මුළු මාර්ග ප්‍රදේශය ආසන්න වශයෙන් වර්ග මීටර් 5,250 ක් වේ.

ඒ අනුව, කොන්ත්‍රාත්තුව 2025.06.30 වන දින කොන්ත්‍රාත්කරු වන M/s MAGA Construction (Pvt) Ltd සමාගම වෙත වැට් බදු සහිතව ලංකා රුපියල් මිලියන 844.93 ක මූලික කොන්ත්‍රාත් මිලකට ප්‍රදානය කර ඇත. ව්‍යාපෘති කාල සීමාව දින 365 වන අතර ව්‍යාපෘතිය 2025.07.16 දින ආරම්භ කර ඇති අතර අපේක්ෂිත නිම කිරීමේ දිනය 2026.07.15 වේ. 2025.12.31 දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සහ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 17.3% ක් සහ 26.01% (රුපියල් 194,275,332.58) ක් වේ.

13. විජය කුමාර ජැටියේ ගල් අතුරා තාර දැමීමේ කටයුතු - අදියර II

අමාත්‍ය මණ්ඩල තීරණයක් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු වන M/s Maga Neguma Construction Equipment Company සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට නියමිත බව දන්වා ඇති අතර ඔවුන් මෙම කොන්ත්‍රාත්තුවෙන් නිදහස් කරන ලෙස ඉල්ලා ඇත.

එබැවින්, කොන්ත්‍රාත්තුව අවසන් කර ව්‍යාපෘතිය සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට තීරණය කර ඇත. ඉතිරි ඉදිකිරීම් කටයුතු M/s Sanguine – Sri Ram Joint Venture සමාගම වෙත ප්‍රදානය කිරීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබා දී ඇත. කොන්ත්‍රාත්තුව 2023.10.30 දින ආරම්භ කර ඇති අතර 2025.06.30 දින සැලකිය යුතු ලෙස අවසන් කර ඇත. මේ වන විට ව්‍යාපෘතිය දෝෂ නිවැරදි කිරීමේ වගකීම් කාල සීමාව යටතේ පවතී.

2025.12.31 දිනට (වැට් බදු රහිතව) සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.144,192,268.74 (97.5%) ක් වේ.

14. වරාය සන්නිවේදන පද්ධතිය (Port Community System)

ශ්‍රී ලංකා රේගුව, නැව් ඒජන්තවරුන්,නැව්භාණ්ඩ ප්‍රවාහකයින්, නියාමන බලධාරීන් සහ පර්යන්ත ක්‍රියාකරුවන් වැනි ප්‍රධානපෙළේ බාහිර පාර්ශවකරුවන් සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධ කරමින් තනි කවුළු ඩිජිටල් වේදිකාවක් නිර්මාණය කිරීමට ජාතික වශයෙන් ඒකාබද්ධ වූ වරාය සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීමයි.

2025 වර්ෂයේ ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන්

- වරාය සන්නිවේදන පද්ධතිය සඳහා නම්කරන ලද නියාමකවරයා (PCS Regulator) වෙත බලය පැවරීම සඳහා යාවත්කාලීන කරන ලද සංකල්ප පත්‍රිකාවක් සහ කෙටුම්පත් නීති සම්පාදන යෝජනාවක් සමඟ සංශෝධිත අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී.

- වරාය සන්නිවේදන පද්ධතියේ කාර්ය රාමු අවශ්‍යතාවයන් පෙළගැස්වීමට පාර්ශවීය උපදේශණ සහ පද්ධති සංකල්ප සකස් කිරීමේ කටයුතු අඛණ්ඩව සිදුකරන ලදී.

- වරාය සන්නිවේදන පද්ධතියේ වරාය මෙහෙයුම් පද්ධති හා බාහිර පාර්ශවීය පද්ධති ඒකාබද්ධ කිරීම සඳහා මූලික තාක්ෂණික හා මෙහෙයුම් සැලසුම ආරම්භ කරන ලදී.

- වරාය සන්නිවේදන පද්ධතියේ දිගු කාලීන තිරසර ක්‍රියාත්මකතාවය සහතික කිරීම සඳහා නෛතික හා නියාමන පදනම ශක්තිමත් කරන ලදී.

නිම කළ යුතුව ඇති කාර්යයන් / අභියෝග

- ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය අනුමැතිය ලබා ගැනීම සහ නියාමන කාර්යය රාමුව අවසන් කිරීමේ කටයුතු නිම කිරීම අවශ්‍ය කෙරේ.

- ප්‍රතිපත්තිමය මට්ටමේ නිශ්කාශනයන් ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රධාන පරිගණකය ආශ්‍රිත ක්‍රමානුකූල පාර්ශවීය ඒකාබද්ධ කිරීම් හා පද්ධති ඒකාබද්ධ කිරීමේ සැලසුම් ප්‍රගමනය වනු ඇත.

නිම කිරීමට අපේක්ෂිත කාලය

- වරාය සන්නිවේදන පද්ධතියේ මූලික ක්‍රියාත්මක කිරීම 2026–2027 කාලය අතරතුර ඉලක්ක ගත කර, නියාමන අනුමැතිය ලබා ගැනීමට යටත්ව අදියරින් අදියර ක්‍රියාත්මක කරන පද්ධතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කෙරේ.

මෙහෙයුම් ප්‍රගතිය

කොළඹ වරාය - නෞකා පැමිණීම

විස්තරය	2024	2025	%
නැව්බඩු නෞකා			
බහළුගත	3,522	3,604	2.3
සාම්ප්‍රදායික	54	38	-29.6
වෙනත් නැව් බඩු	230	272	18.3
අළුත්වැඩියා සඳහා නෞකා	46	45	-2.2
නැව් තෙල් සඳහා නෞකා	74	104	40.5
වෙනත් නෞකා	42	39	-7.1
පැමිණි මුළු නෞකා සංඛ්‍යාව	**3,968**	**4,102**	**3.4**

බහළු මෙහෙයුම් ධාරිතාවය (විස්සේ සම ඒකක)

විස්තරය	2024	2025	
ආනයන	**589,927**	**670,073**	**13.6**
භාණ්ඩ සහිත	541,155	641,052	18.5
භාණ්ඩ රහිත	48,772	29,021	-40.5
අපනයන	**579,328**	**659,473**	**13.8**
භාණ්ඩ සහිත	301,094	308,943	2.6
භාණ්ඩ රහිත	278,234	350,530	26.0
ප්‍රතිනැවිගත කිරීම (Transshipment)	6,315,195	6,587,218	4.3
නැන්මාරු මෙහෙයුම් (Re-stowing)	307,619	384,446	25.0
සමස්ත විස්සේ සම ඒකක	**7,792,069**	**8,301,210**	**6.5**
ප්‍රතිනැවිගත කිරීමේ ප්‍රතිශතය(%)	**81**	**79**	**-2.1**

බහළු මෙහෙයුම් ධාරිතාවය අනුව (විස්සේ සම ඒකක)

විස්තරය	2024	2025	%
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	2,413,163	2,383,139	-1.2
සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්	2,025,839	1,948,935	-3.8
කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්	3,353,067	3,251,910	-3.0
කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්තය	0	717,226	-

කොළඹ වරාය - නැව්බඩු මෙහෙයවීම (ටොන්)

විස්තරය	2024	2025	%
බහළුගත *	107,223,929	107,262,453	0.0
තොගකඩන	593,815	781,488	31.6
වියළි තොග	1,473,873	1,414,734	-4.0
ද්‍රවමය තොග නැව්බඩු	5,302,293	5,902,946	11.3
මෙහෙයවන ලද මුළු නැව්බඩු	**114,593,910**	**115,361,621**	**0.7**

මෙහෙයුම් කරන ලද සමස්ත ටොන් ප්‍රමාණය

විස්තරය	2024	2025	%
ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA)	36,487,633	32,131,582	-11.9
එස් ඒ ජී ටී සමාගම (SAGT)	25,563,582	24,615,913	-3.7
සී අයි සී ටී සමාගම (CICT)	45,172,714	42,463,960	-6.0
කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්තය (CWIT)	0	8,050,998	-

සී පී සී (CPC)	4,019,619	4,544,219	13.1
වෙනත් පාලම්	3,350,362	3,554,949	6.1

* එස්ඒජීටී හා සීඅයිසීටී සඳහා ඇස්තමේන්තුගත ටොන් ප්‍රමාණය ඇතුළුව

බහළු මෙහෙයුම් ධාරිතාවය - පර්යන්ත/ ඇටි

(විස්සේ සම ඒකක)

විස්තරය	2024	2025	%
ශ්‍රී ලංකා වරාය අධිකාරිය (JCT සහ ECT)			
දේශීය	285,204	390,003	36.7
ප්‍රතිනැවිගත කිරීම	2,042,577	1,853,448	-9.3
තැන්මාරු මෙහෙයුම	85,381	139,688	63.6
එකතුව	**2,413,162**	**2,383,139**	**-1.2**
සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT)			
දේශීය	229,291	221,041	-3.6
ප්‍රතිනැවිගත කිරීම	1,757,097	1,697,180	-3.4
තැන්මාරු මෙහෙයුම	39,452	30,714	-22.1
එකතුව	**2,025,840**	**1,948,935**	**-3.8**
කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්තය (CICT)			
දේශීය	654,760	658,802	0.6
ප්‍රතිනැවිගත කිරීම	2,515,521	2,467,189	-1.9
තැන්මාරු මෙහෙයුම	182,786	125,919	-31.1
එකතුව	**3,353,067**	**3,251,910**	**-3.0**
කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්තය			
දේශීය	0	59,700	-
ප්‍රතිනැවිගත කිරීම	0	569,401	-
තැන්මාරු මෙහෙයුම	0	88,125	-
එකතුව	**0**	**717,226**	**-**
කොළඹ වරාය (Port of Colombo)			
දේශීය	1,169,255	1,329,546	13.7
ප්‍රතිනැවිගත කිරීම	6,315,195	6,587,218	4.3
තැන්මාරු මෙහෙයුම	307,619	384,446	25.0
එකතුව	**7,792,069**	**8,301,210**	**6.5**

සියලුම වරායන්

කොළඹ වරාය, හම්බන්තොට වරාය, ත්‍රිකුණාමලය වරාය, ගාලු වරාය හා කන්කසන්තුරය, මයිලිඩ්ඩි, පේදුරු තුඩුව හා කරෙයිනගර් වරායන් යන සියලු වරායන්හි මෙහෙයුම් කාර්යසාධනය

විස්තරය	එකතුව
නෞකා ගණන	5,293
ගොඩබාන ලද නැව් බඩු (ටොන්)	69,933,472
පටවන ලද නැව් බඩු (ටොන්)	56,421,955
මෙහෙයවන ලද නැව්බඩු (ටොන්)	126,355,427

8.2.3 මූල්‍ය කාර්යසාධනය

විස්තරය	2025 රු. මිලියන
ආදායම	
මෙහෙයුම් ආදායම	81,768.49
වෙනත් මෙහෙයුම් ආදායම හා පොලී ආදායම	33,801.97
මුළු ආදායම	**115,570.46**
වියදම	
සේවක වේතන	21,860.42
අතිකාල	7,823.45
ඉන්ධන, විදුලිය සහ වෙනත් ලිහිසි ද්‍රව්‍ය	5,348.58
වත්කම් නඩත්තු කිරීම	3,340.44
වෙනත් වියදම් (බාහිර කුලී ගාස්තු, කොන්ත්‍රාත් වැඩ, ගමන් වියදම් ආදිය)	17,346.96
උප එකතුව	55,719.85
විදේශ විනිමය (පාඩු)/ ලැබීම් වලට සහ විදේශ ණය පොළියට පෙර ලාභ /(පාඩු)	**59,850.61**
විදේශ ණය පොළිය	2,869.72
විදේශ විනිමය (පාඩු)/ලැබීම් වලට පෙර සහ විදේශ ණය පොළියට පසු ලාභ/ (පාඩු)	**56,980.89**
විදේශ විනිමය (පාඩු)/ලැබීම්	265.34
විදේශ විනිමය (පාඩු)/ලැබීම් සහ විදේශ ණය පොළියට පසු සහ බදු වලට පෙර ලාභ/ (පාඩු)	**57,246.23**
ඒකාබද්ධ අරමුදලට දායකත්වය	**(5,000.00)**
ආදායම් බදු	**(14,311.90)**
විලම්භිත බදු	**48.88**
වසරේ ලාභය	**37,983.20**
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් නැවත ගණනය කිරීම	688.18
වෙනත් විස්තීර්ණ ආදායම් මත සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් වල අගය වෙනස් වීම	243.98
ලැයිස්තුගත නොකල කොටස් මත හානිකරණ සඳහා ප්‍රතිපාදන	3,417.57
වසර තුළ වෙනත් මුළු විස්තීර්ණ ආදායම	4,349.73
වසර තුළ මුළු විස්තීර්ණ ආදායම	**42,332.93**

8.3 සී/ස ලංකා නැව් සංස්ථාව

8.3.1 හැඳින්වීම

සී/ස ලංකා නැව් සංස්ථාව, ජාතික මුහුදු ප්‍රවාහකයා වශයෙන් නැව් සේවා සපයන්නෙකු ලෙස ක්‍රියා කරමින් ජාතික ආර්ථික වර්ධනයට සහාය වෙමින් රටේ ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ද මහඟු සේවයක් සිදු කරයි. තවද නැව් අත්පත් කර ගැනීම, නැව් කුලියට ගැනීම හා කුලියට දීම, නැව් කළමනාකරණය, තැරැව්කාර කටයුතු, භාණ්ඩ නැවිගත කිරීම් සහ නැව් නියෝජිත ජාලය පවත්වාගෙන යාම, සී/ස ලංකා නැව් සංස්ථාව මඟින් සිදු කරනු ලැබේ.

8.3.2 දැක්ම, මෙහෙවර, අරමුණු

ප්‍රධාන අරමුණු

වෙළෙඳ ක්ෂේත්‍රය හා පාරිභෝගිකයන් උදෙසා

- ජාතික ආර්ථික වර්ධනයට උර දෙමින් රටෙහි ආර්ථික අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා පහසුකම් සපයන්නෙකු වශයෙන් කටයුතු කිරීම.
- කෙටිම කාලයක් තුල අවම මිල ගණන් යටතේ උපරිම පාරිභෝගික විශ්වාසය රකිමින් පාරිභෝගික අවශ්‍යතා සම්පූර්ණ කිරීම.

රට හා සමාජය උදෙසා

- අනාගත ජාතික සංවර්ධන ක්‍රියාවලියෙහිදී නාවික මධ්‍යස්ථානයක් වශයෙන් රටෙහි සංවර්ධනයට උර දීම.
- පාරිභෝගික අවශ්‍යතාවය හඳුනා ගනිමින් තරහකාරී මිල ගණන් ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ආනයන ක්‍රියාවලියේදී නැව් ගාස්තු මෙරටදී ගෙවීම තුලින් (FOB Basis) විදේශ විනිමය රට තුළ ඉතිරිකර ගැනීමට දායක වීම.
- රටෙහි තාප බල ශක්ති උත්පාදන අංශයෙහි නාවික සැපයුම් හා ප්‍රවාහන සහකරුවෙකු වශයෙන් දිගටම ක්‍රියා කිරීම.
- රටෙහි බලශක්ති/ඛණිජ තෙල් සැපයුම් කාර්යයෙහි නාවික සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කිරීම.

භිමිකාරිත්වය උදෙසා

- ලාභය උපරිම කරමින් විදේශ විනිමය රටට ඉතිරි කර ගැනීම තුළින්, රාජ්‍ය භාණ්ඩාගාරයට ඉහළම දායකත්වයක් සැපයීම.

8.3.3 ප්‍රධාන කාර්යයන්

- නැව් හිමිකාරිත්වය, නැව් කළමනාකරණය, නැව් කුලියට ගැනීම හා තැරැව් කිරීම.
- මුහුදු මාර්ගයෙන් නැව් භාණ්ඩ ප්‍රවාහනය.
- භාණ්ඩ හා සේවා සම්පාදන කටයුතු (logistics) හා රේගු නිෂ්කාශන සේවා (අපනයන හා ආනයන).
- නැව් නියෝජිත සේවා (Agency Services).
- නාවික තැරැව්කාර සේවා (Brokering).
- නැව් කුලියට ගැනීම හා කුලියට දීම.
- පුත්තලම තාප විදුලි බලාගාරය සඳහා නාවික යාත්‍රා මඟින් ගල් අඟුරු ප්‍රවාහනය කිරීම, ගොඩ බෑම.
- ශ්‍රී ලාංකික තරුණ තරුණියන් සඳහා නාවික පුහුණුව ලබාදීම.

8.3.4 ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

2024 හා 2025 වර්ෂවල පවත්නා ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය අප්‍රේල් 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය

	ක්‍රියාකාරකම	අනු ක්‍රියාකාරකම්	භෞතික කාර්ය සාධනය		ආදායම (රු. මිලියන)	
			2025	2024	2025	2024
1.1	භාණ්ඩ ප්‍රවාහනය - NVOCC ක්‍රියාකාරිත්වය (යාත්‍රා මෙහෙයුම් නැති පොදු වාහකයා)	සම්පූර්ණ බහාලුම් භාණ්ඩ ප්‍රවාහනය (FCL)	818	*බහාලුම් 793	298.70	*368.75
1.2		බහාලුම් නොවන භාණ්ඩ ප්‍රවාහනය කිරීම (LCL)	2,091.39	*2,033.84 F/T		
2	භාණ්ඩ ප්‍රවාහන සේවය	නිෂ්කාශන සේවා	305	**කාර්යයන් 345	30.55	124.02
3	නියෝජිත සේවා	පොහොර ප්‍රවාහන යාත්‍රා	-	යාත්‍රා 2	-	-
		ගල් අඟුරු ප්‍රවාහන නැව් නියෝජිත	යාත්‍රා 15	***යාත්‍රා 20	6.47	24.90
		කොළඹ හා ත්‍රිකුණාමල වරායන් ආශ්‍රිත නැව් නියෝජිත සේවා	යාත්‍රා 10	යාත්‍රා 02	2.72	2.37
4	ලක්විජය විදුලි බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහනය	ප්‍රවාහන කුළිය මත යොමු වට්ටම්	-	-	-	-
		බත්තල් ගාස්තු මත යොමු වට්ටම්	මෙ. ටොන් මි. 0.90	මෙ. ටොන් මි. 1.27	91.70	337.45
5	නාවික යාත්‍රා 02 සේවයෙහි යෙදවීම	ල.නැ.සංස්ථා නැව් ගාස්තු ආදායම (ගල් අඟුරු ප්‍රවාහනය)	-	-	294.30	-
		ල.නැ.සංස්ථා නැව් කුළී ආදායම	කුළී දින 537.18	***** කුළී දින 530	1,651.86	***** 2,408.31
6	නාවික පුහුණුව	තෙවන පාර්ශවීය යාත්‍රාවල ශිෂ්‍යාභට / නිලධාරීන් සංඛ්‍යාව	නිලධාරී 1	****** ශිෂ්‍යාභට 1	0.05	0.11
	*******මුළු ආදායම				**2,376.34**	**3,265.91**

මූලාශ්‍රය: මූල්‍ය කාර්ය සාධනය - කෙටුම්පත් ගිණුම් / භෞතික කාර්ය සාධනය - දෙපාර්තමේන්තු වාර්තා

2025.12.31 දිනට නැවවල නියුතු ශිෂ්‍ය භටයින්

තනතුර	සිලෝන් ප්‍රින්සස්	සිලෝන් බ්‍රිස්
නාවික ශිෂ්‍යභට	01	-
ඉංජිනේරු ශිෂ්‍යභට	10	07
විදුලි ශිෂ්‍යභට	01	01
සාමාන්‍ය ශිෂ්‍යභට	11	17
මුළු ගණන	23	25

මූලාශ්‍රය - CSC තාක්ෂණික දෙපාර්තමේන්තුව

8.3.5 සමස්ථ මූල්‍ය ප්‍රගතිය

අප්‍රේල් 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා ලාභ / අලාභ ප්‍රකාශය

	වර්ෂය 2025 රු. මි.	වර්ෂය 2024 රු. මි.
ආදායම	2,376.34	3,265.91
සෘජු මෙහෙයුම් වියදම්	(1,589.68)	(1,718.94)
දළ ලාභය	**786.66**	**1,546.97**
වෙනත් ආදායම්	48.83	71.10
පරිපාලන වියදම්	(187.70)	(174.50)
මෙහෙයුම් ලාභය	**647.79**	1,443.57
<u>මූල්‍ය වියදම්</u>		
ණය පොළී වියදම් (නෞකා සඳහා ගත් ණය)	(1,149.20)	(1,236.63)
විනිමය අලාභය (Exchange Loss)	(651.15)	(40.56)
විනිමය ලාභය (නෞකා සඳහා ගත් ණය)- Exchange Gain – Vessel Loan (Nominal Entry)	-	388.21
බදුවලට පෙර ලාභය / (අලාභය)	**(1,152.56)**	**554.59**

8.3 ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

8.4.1 හැඳින්වීම

කොළඹ තෙල් බැංකුව ලෙසින්ද හඳුන්වනු ලබන ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (JCT ලිමිටඩ්) ශ්‍රී ලංකා වරාය අධිකාරියට සම්පූර්ණයෙන් අයත් පරිපාලිත සමාගමක් වන අතර එය කලාපය තුළ ප්‍රමුඛ පෙළේ ඉන්ධන ගබඩා කිරීමේ හා සැපයීමේ ආයතනයක් වේ. ජය කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ් (PB 960) 2002 වර්ෂයේ පෙබරවාරි 21 වන දින 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලද අතර 100% ක්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සමාගමක් වශයෙන් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2008 වර්ෂයේ අප්‍රේල් 25 වන දින ලියා පදිංචි කරන ලදී.

8.4.2 දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"ආසියානු කලාපයේ නාවික යාත්‍රා සඳහා ඉන්ධන සපයන කේන්ද්‍රස්ථානය බවට පත් වීම."

මෙහෙවර

"නාවික ඉන්ධන සැපයීමේ බලපත්‍ර හිමිකරුවන් හට යටිතල/ගබඩා පහසුකම් සංවර්ධනය කර දීම තුළින් රටේ වටිනාකම උපරිම තලයකට ගෙන ඒම."

අරමුණු

- නාවික ඉන්ධන ගබඩා කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- නාවික ඉන්ධන සැපයීමේ ව්‍යාපාරයේ කේන්ද්‍රස්ථානය ලෙස කාර්යක්ෂම හා ඵලදායී අයුරින් කොළඹ තෙල් බැංකුව කළමනාකරණය කිරීම.
- ආදායම් ඉපයීම් උපරිම මට්ටමකට ගෙන ඒම සහ ඵලදායී පිරිවැය කළමනාකරණ ක්‍රමවේද තුළින් මූල්‍ය ස්ථාවරත්වය සහ තිරසාරබව තහවුරු කර ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා අඛණ්ඩව ප්‍රබල දායකත්වයක් සැපයීම.
- පරිශ්‍රයෙහි ඇති නිෂ්පාදන ගබඩාවෙහි ආරක්ෂාව තහවුරු කිරීම.
- සියළුම සේවකයින් අතර ඉහළ ඵලදායිතා මට්ටමක් වර්ධනය කර පවත්වා ගෙන යාම.
- මෙහෙයුම් කටයුතු වලදී සෞඛ්‍යය, ආරක්ෂාව සහ පරිසර හිතකාමී ක්‍රියාමාර්ග හඳුන්වා දීම.
- පාරිභෝගිකයින් හට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීම.

8.4.3 ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

2025 වර්ෂයේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

ව්‍යාපෘතිය	මූල්‍ය දායකත්වය	අපේක්ෂිත පිරිවැය (රු.)	භෞතික ප්‍රගතිය
මෙට්‍රික් ටොන් 12000ක ධාරිතාවකින් යුත් ඉන්ධන ටැංකි 01ක් ඉදිකිරීම.	ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ජය කන්ටේනර් ලිමිටඩ්	මිලියන 900	සංවර්ධන බලපත්‍ර ලබා ගෙන ඇත.
බොයිලේරු කාමරය එන්ජින් කාමරය සහ ජෙනරේටර් කාමරය යන ස්ථාන සඳහා තාප පිරික්සුම් යන්ත්‍ර සැපයීම සහ සවි කිරීම.	ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිඩට්	මිලියන 2	අවසන්

මෙහෙයුම් ප්‍රගතිය

මෙහෙයුම් කටයුතුවල නව ප්‍රවර්ධනයන්

2025 වර්ෂයේ මුළු පැටවුම් ප්‍රමාණය හා මුදා හරින ලද ප්‍රමාණය

නිෂ්පාදනය	පැටවූම් ප්‍රමාණය		නිකුත් කිරන ලද ප්‍රමාණය	
	මෙ.ටො.	%	මෙ.ටො.	%
LSFO 380Cst	522,984.865	88.47%	524,075.149	88.88%
MGO	68,143.798	11.53%	65,587.736	11.12%
එකතුව	**591,128.663**		**589,662.885**	

ඉහත වගුවෙහි දක්වා ඇති සම්පූර්ණ පැටවීම් සහ නිකුත් කිරීම් ප්‍රමාණයන් සහ ඒවායේ ප්‍රතිශතයන්ට අනුව, ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් (JCT) මෙට්‍රික් ටොන් 591,128.663ක මුලු පැටවීම් ප්‍රමාණයක් හසුරුවා ඇත. එම ප්‍රමාණයෙන් 88.47%ක් අඩු සල්ෆර් ඉන්ධන තෙල් (LSFO 380 Cst) වන අතර, 11.53%ක් නාවික ඉන්ධන ගෑස් තෙල් (MGO) වේ. එම කාලය තුළදීම මුළු නිකුත් කිරීම් ප්‍රමාණය මෙ.ටො. 589,662.885 ක් වන්නේ අඩු සල්ෆර් ඉන්ධන තෙල් (LSFO 380 Cst) 88.88% ක් සහ නාවික ඉන්ධන ගෑස් තෙල් 11.12% වශයෙනි. මෙම සංඛ්‍යාත්මක දත්ත වලට අනුව අඩු සල්ෆර් ඉන්ධන තෙල් (LSFO 380 Cst) 2025 වර්ෂයේ පැටවීම් සහ නිකුත් කිරීම් මෙහෙයුම් වල ප්‍රමුඛ නිෂ්පාදනය වශයෙන් පැවතුනේ අඛණ්ඩ වෙලඳපොළ ඉල්ලුම සහ ජය ටර්මිනල් කන්ටේනර් ලිමිටඩ්හි බන්කර් කටයුතු වල මෙහෙයුම් ඉලක්ක පිළිබිඹු කරමිනි.

මෙහෙයුම් කාර්යසාධනය

2025 සහ 2024 මෙහෙයුම් සංසන්දනය කිරීම

නිෂ්පාදනය	පැටවූම් ප්‍රමාණය		නිකුත් කිරන ලද ප්‍රමාණය	
	2024 මෙ.ටො.	**2025 මෙ.ටො.**	**2024 මෙ.ටො.**	**2025 මෙ.ටො.**
LSFO 380 Cst	487,642.826	522,984.865	492,791.987	524,075.149
MGO	76,694.246	68,143.798	75,913.226	65,587.736
එකතුව	564,337.072	591,128.663	568,705.213	589,662.885

ඉහත වගුවට අනුව 2024 සහ 2025 කාල පරාසය තුළ පැටවීම් සහ නිකුත් කිරීම් මෙහෙයුම් සන්සන්දනය කිරීමේදී සමස්ත බන්කර් ඉන්ධන මෙහෙයුම්වල අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරයි. 2024 වර්ෂයේ මුළු පැටවීම් ප්‍රමාණය වන මෙ.ටො. 564,337.072 2025 වර්ෂයේදී මෙ. ටො. 591128.663 දක්වා මෙ. ටො. 26791.591 ක වර්ධනයක් සටහන් කරයි. මෙය පැහැදිළි ලෙස 4.7%ක වර්ධනයකි. මෙමඟින් අඩු සල්ෆර් ඉන්ධන තෙල් (LSFO) බන්කර මෙහෙයුම් සඳහා ඉල්ලුම් කේන්ද්‍රගතවීම සහ එම අංශයේ ක්‍රියාකාරිත්වයෙහි වර්ධනය වන කාර්යක්ෂමතාව පෙන්නුම් කරයි.

8.4.4 වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය

2024 වර්ෂයේ සහ 2025 වර්ෂයේ මූල්‍ය කාර්යසාධනය සංසන්දනය

	2024 (රු.)	**2025 (රු.)**
ආදායම	**719,870,640**	**538,200,787**
දළ ලාභය	**431,564,505**	**275,573,777**
ශුද්ධ ලාභය	**243,415,111**	**128,474,646**

8.5 ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

8.5.1 හැඳින්වීම

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත යටතේ ස්ථාපිත කරන ලදී. සිවිල් ගුවන් සේවා මෙහෙයුම්වල නිරුපද්‍රිතතාව, සුරක්ෂිතබව, කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය සහතික කිරීම, කර්මාන්තයේ අඛණ්ඩතාව සහ විශ්වසනීයත්වය පවත්වා ගැනීම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූලික අවධානය යොමු කර ඇති කරුණු වේ. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය ආරක්ෂක රෙගුලාසි, සහතික කිරීම, බලපත්‍ර ලබා දීම, ගුවන් යානා අධීක්ෂණය, ගුවන් සංතරණ සේවා සහ ආර්ථික අධීක්ෂණය ඇතුළු පුළුල් පරාසයක ක්ෂේත්‍ර ආවරණය කරයි.

8.5.2 දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"සෑමට නිරුපද්‍රිත අහසක් සහතික කරමින් ප්‍රවීණ හා විශ්වසනීය ගුවන්සේවා නිරුපද්‍රිත නියාමකයෙකු බවට පත් වීම."

මෙහෙවර

"උපායමාර්ගික සැලසුම්කරණය සහ ප්‍රබලකර නියාමනය මඟින්, ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිවයන් සමඟත් ජාතික ව්‍යවස්ථාමය අවශ්‍යතා සමඟත් අනුගත නිරුපද්‍රිත, සුරක්ෂිත, කාර්යක්ෂම, ක්‍රමවත් සහ පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන්සේවා පද්ධතියක් මෙහෙයවීම සුසාධනය කිරීම."

8.5.3 ප්‍රධාන කාර්යභාරය

- දිවයිනේ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය සැලසුම් කිරීමේදී ගරු සිවිල් ගුවන් සේවා විෂය භාර අමාත්‍යවරයාගේ සහ අනෙකුත් රජයේ පාර්ශ්වකරුවන්ගේ අදහස් පිළිබිඹු වන බව සහතික කිරීම සඳහා ඔවුන් සමඟ අදහස් හුවමාරු කර ගැනීම.

- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සහ ඉලක්ක සැකසීම සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංවිධානාත්මක කාර්යසාධනය අධීක්ෂණය කිරීම සහ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයට ඇතුළත් කර ඇති රජයේ අරමුණු පිළිබිඹු කිරීම සඳහා අදාළ වන පරිදි ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම.

- නිල බලයෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියාද වන සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වගකීම පැවරීම.

- ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ කාර්යයන් සහ රාජකාරි ඉටු කිරීමට හැකිවන පරිදි සුදුසුකම්ලත් නිපුණ පුද්ගලයින් සේවයේ යොදවා ගැනීම සහ ඔවුන්ගේ සේවා නියම සහ කොන්දේසි නිර්ණය කිරීම.

- ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ සංයුක්ත සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා පවත්නා සැලසුම් සහ ප්‍රගතිය පිළිබඳව සිවිල් ගුවන් සේවා විෂය භාර ගරු අමාත්‍යවරයාට වගකිව යුතුවීම.

8.5.4 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ

- 2025 වර්ෂය සමස්ත ගුවන් ගමනාගමනයේ, විශේෂයෙන් ජාත්‍යන්තර මගී ප්‍රවාහනයේ, ශක්තිමත් ප්‍රවර්ධනයක් පෙන්නුම් කළ වසරක් ලෙස සැලකිය හැකිය. සියලුම කාණ්ඩවලට අයත් ජාත්‍යන්තර මගී සංඛ්‍යාව සැලකිය යුතු වර්ධනයක් දැක්වීය. ගුවන්ගතව පිටත් වූ මගීන් සංඛ්‍යාව මෙහින් මිලියන 5.08 දක්වා 15%කින් වැඩි වූ අතර, ගොඩබසින ලද පැමිණි මගීන් සංඛ්‍යාව 16%කින් වර්ධනය වූ අතර, එය මිලියන 5.06 ක් විය. එය පිටතට යන සහ පැමිණෙන ගමන් සඳහා ඇති අඛණ්ඩ ඉල්ලුම පිළිබිඹු කරයි.

- සංක්‍රමණ (Transit) ගුවන් මගී ගමනාගමනය 18%කින් ඉහළම වර්ධනයක් ලබාගෙන 915,495ක් දක්වා ඉහළ ගිය අතර, එය රටේ කලාපීය සම්බන්ධතා ශක්තිමත් වීම හා සංක්‍රමණ ගමනාගමන මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය වීම පෙන්වයි.

- මෙම වසර තුල ගුවන්යානා ගමන් සංඛ්‍යාව ද මගී වර්ධනයට සමගාමීව ධනාත්මක ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කාලසටහන්ගත නියමිත (Scheduled) ගුවන්ගමන් සංඛ්‍යාව 15%කින් වැඩි වී 62,056ක් දක්වා ඉහළ ගිය අතර, එමඟින් වැඩිදියුණු කළ ගුවන්සේවා මෙහෙයුම් සහ මාර්ග සංඛ්‍යාතය වර්ධනය වී ඇති බව පෙන්වයි. කුළී මෙහෙයුම් (Charter) ගුවන්ගමන් 2%ක වර්ධනයක් වාර්තා කළ අතර, මුළු ගුවන් ගමන් සංඛ්‍යාව 2,000ක් විය.

- දේශීය ගුවන් ගමනාගමනය සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවති අතර, මගී සංඛ්‍යාව 14,473ක් ලෙස වාර්තා විය. මෙහිදී ගුවන්යානා ගමන් 5,366ක් දක්වා ඉහළ ගිය අතර, එමඟින් මගී ඉල්ලුම ස්ථාවර වුවද මෙහෙයුම් ක්‍රියාකාරීත්වයේ වර්ධනයක් සිදුවී ඇත. දේශීය ගුවන්සේවා සමාගම් සංඛ්‍යාව 25%කින් ඉහළ ගොස් ක්‍රියාකරුවන් පස් දෙනෙකු දක්වා ඉහළ ගියේය. කුළී මෙහෙයුම් (Charter) ගුවන් ගමන් 50%කින් ශක්තිමත් වර්ධනයක් දැක්වුවද, එය අඩු පදනමක සිට ආරම්භ වූ වර්ධනයකි. කාලසටහන්ගත සැලසුම් කරන ලද දේශීය ගුවන් ගමන් සංඛ්‍යාව වෙනස් නොවීය.

- සමස්තයක් වශයෙන්, 2025 වසර, හාණ්ඩ ප්‍රවාහන පරිමාවන්හි සුළු අඩුවීමක් සහ කාලසටහන්ගත ගුවන්සේවා තුළ යම් ප්‍රතිව්‍යුහගත කිරීමක් තිබියදීත්, මගී ගමනාගමනය ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් කිරීම, සම්බන්ධතාවය ශක්තිමත් කිරීම සහ මෙහෙයුම් පුළුල් කිරීම සිදු වූ වසරක් ලෙස හැඳින්විය හැකිය.

- ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) ගුවන්සේවා මෙහෙයුම්වල නිරුපද්‍රතාවය, එහි ඉහළම ප්‍රමුඛතාවය ලෙස පවත්වා ගෙන ගිය අතර, වැඩිදියුණු කළ රාජ්‍ය නිරුපද්‍රතා වැඩසටහන (SSP) සහ නිරුපද්‍රත කළමනාකරණ පද්ධති (SMS) හරහා අවදානම් මත පදනම්ව ක්‍රියාශීලී අධීක්ෂණ ප්‍රවේශය ශක්තිමත් කළේය. එලදායී නිරුපද්‍රතාවය ප්‍රතිඵල සහතික කිරීම සඳහා අවදානම් දර්ශක, දත්ත විශ්ලේෂණය සහ වැළැක්වීමේ පියවර භාවිතා කරමින් නිරීක්ෂණ සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ශක්තිමත් කරන ලදී.

- මෙම වසර තුල ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය, ගුවන් නිරුපද්‍රතතාවය සහ සැපයීම අතර සමබර ප්‍රවේශයක් තහවුරු කරන ලදී, දැඩි ආරක්ෂක පියවරයන් රැක ගනිමින් මගී ප්‍රවාහය පහසු කර, ප්‍රමාදයන් අඩු කරමින් සහ පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කරන ලදී.

- ගුවන් නාවික සේවා අධීක්ෂණය කිරීම මඟින් (Air Navigation Services Oversight) මෙහෙයුම් නිරුපද්‍රතතාවය, පද්ධති ස්ථායීභාවය සහ ඵලදායී සම්බන්ධීකරණය අවධාරණය කරන ලද අතර, සෙවීම් සහ මුදාගැනීමේ (Search and Rescue) ක්‍රියාකාරී සූදානමෙහි ශක්තිමත් කාර්ය සාධනයක් පවත්වාගෙන යන ලදී.

- CAASL, ICAO ප්‍රමිතීන් හා නිර්දේශිත ක්‍රියාමාර්ග (SARPs) සමඟ අනුකූලව කටයුතු කරමින්, විගණන සූදානම, නියාමන යාවත්කාලීන කිරීම සහ ගුණාත්මකභාව පාලන ක්‍රියාවලීන් ශක්තිමත් කරමින් අවශ්‍ය කටයුතු කරන ලදී. එමෙන්ම ඩිජිටල් පරිවර්තන වැඩසටහන් මඟින් කාර්යක්ෂමතාව, පැහැදිලිතාව සහ දත්ත පදනම් වූ තීරණ ගැනීම වැඩිදියුණු කරන ලදී.

- ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රධාන සැලැස්ම (NCAMP) අවසන් කිරීමේදී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගනිමින්, ජාතික ප්‍රමුඛතා හා තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ ගුවන්සේවා සංවර්ධනය සමාලෝචනය කරන ලදී. තවද, 2050 වන විට ශූන්‍ය කාබන් විමෝචනය (net-zero carbon emissions) ලබා ගැනීම සඳහා ICAO දිගුකාලීන අරමුණ (LTAG) පිළිබඳ ශ්‍රී ලංකාවේ කැපවීම නැවත තහවුරු කර ඇත.

- ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය කාර්ය මණ්ඩල නිපුණතාවය, වෘත්තීය ප්‍රමිතීන් සහ ස්ථායීභාවය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කල අතර පාලනය, මූල්‍ය විනය සහ වගවීම ශක්තිමත් කළේය. වැඩිදියුණු කළ සන්නිවේදනය, පැමිණිලි හැසිරවීම සහ සේවා සැපයීම තුළින් මගී කේන්ද්‍රීය ප්‍රවේශයක් ප්‍රවර්ධනය කරන ලදී.

- ක්‍රියාකාරී ජාත්‍යන්තර සහ කලාපීය සහයෝගීතාවය තුළින්, CAASL නියාමන හැකියාව වැඩිදියුණු කර, සුදුසු පිළිවෙත් ක්‍රියාපටිපාටි අනුගමනය කර ගුවන්සේවා නිරුපද්‍රතතාවය, ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය සඳහා දායක විය.

මුහුණ දුන් අභියෝග

- සේවා-නැඹුරු ප්‍රතිසංස්කරණ Service-Oriented Reforms (SOR), ක්‍රියාත්මක කිරීමේ සහ ආයතනික ඉලක්ක සමඟ පෙළගැස්වීමේ ගැටලු.
- වැටුප් විෂමතා, කාර්ය මණ්ඩල චිත්ත ධෛර්යය සහ සාධාරණත්වයට බලපාන වැටුප් ව්‍යුහයන්ගේ පවතින විෂමතා.
- කාර්ය මණ්ඩල අවශ්‍යතා – ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැති වීම.
- වෘත්තිකයන් රඳවා තබා ගැනීම සහ තාක්ෂණික දීමනා – තාක්ෂණික දීමනා ගෙවීමේ ප්‍රමාද හෝ අසම්පූර්ණතා නිසා දක්ෂ සේවකයන් රඳවා ගැනීමේ අපහසුතා.
- නීති සංශෝධන ක්‍රියාවලිය ප්‍රමාද වීම.
- සංවිධානික බඳවාගැනීම් සඳහා අවශ්‍ය අනුමැති ලබා ගැනීමේ ප්‍රමාද.

ඉදිරි ඉලක්ක

- ඉදිරියේදී පැවැත්වීමට නියමිත ICAO ආරක්ෂණ විගණනයේ සාර්ථක ප්‍රතිඵලයක් සඳහා සූදානම ශක්තිමත් කිරීම.
- ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
- වෘත්තිකයන් සඳහා ගුවන්සේවා පුහුණුව ලබා දීම සහ ශ්‍රී ලංකාව කලාපීය පුහුණු මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා කැපුන්ගොඩ CAASL පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම.
- මත්තල MRO ගම්මානය පිහිටුවීම.
- ඩ්‍රෝන යානා සඳහා බලපත්‍ර ක්‍රමයක් සංවර්ධනය කිරීම.
- මිනිසුන් රහිත ගුවන් යානා පද්ධති (UAS) සහ උසස් ගුවන් සංචලතා (AAM) තාක්ෂණයන් සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා උසස් ගුවන් සංචලතා රෙගුලාසි සංවර්ධනය කිරීම.
- සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම සඳහා ජල ගුවන්තොටුපළ සහතික කිරීම.
- ශ්‍රී ලංකාවේ හෙලිකොප්ටර් මෙහෙයුම් සංවර්ධනය.
- ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රධාන සැලැස්මට අනුකූලව යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළේ CAASL උප කාර්යාලය ස්ථාපිත කිරීම.
- පිදුරුතලාගල සහ කඳපොල ගුවන්විදුලි මධ්‍යස්ථානවල මෙහෙයුම් සහ කාර්ය මණ්ඩල අවශ්‍යතා සඳහා නුවරඑළිය කඳපොල පිහිටි CAASL පරීක්ෂක නිල නිවාසය සංවර්ධනය කිරීම.
- අනාගත ගුවන්සේවා වර්ධනයට සහාය වීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන මුලපිරීම් ප්‍රවර්ධනය කිරීම.
- සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා දේශීය ගුවන්සේවා ජාල පුළුල් කිරීම.
- ශ්‍රී ලංකා ගුවන් සංචාලන සැලැස්මේ අදියර 1 ක්‍රියාත්මක කිරීම.
- කොළඹ FIR හි සුවිශේෂී නොවන ADS-B ගුවන් අවකාශය තුළ PIDURU MSSR ප්‍රතිස්ථාපනය කිරීම සහ FL290 ට අඩු ADS - B නිරීක්ෂණ සේවා ක්‍රියාත්මක කිරීම.
- කොළඹ TMA පාලන ස්ථානය තුළ ATM අංශකරණය ක්‍රියාත්මක කිරීම.
- ස්වාධීන ගුවන් යානා අනතුරු විමර්ශන කාර්යාංශයක් පිහිටුවීම සඳහා නීති සම්පාදනය කිරීම.
- ජාත්‍යන්තර සම්මුතීන් සහ දේශීය කර්මාන්ත අවශ්‍යතාවලට අනුකූලවන පරිදි සිවිල් ගුවන්සේවා නීති සංශෝධනය කිරීම.
- 2050 වන විට ජාත්‍යන්තර ගුවන්සේවාවලින් ශුද්ධ ශූන්‍ය කාබන් විමෝචනය සාක්ෂාත් කර ගැනීම.
- රජයේ ඩිජිටල්කරණ ප්‍රතිපත්තියට (AI, සයිබර් ආරක්ෂාව, ආදිය) අනුකූලව ගුවන්සේවා ආශ්‍රිත තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම.
- කාර්යක්ෂමතාව සහ පාලනය වැඩිදියුණු කිරීම සඳහා CAASL හි ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම.
- ගැසට් නිවේදන යටතේ පවරා ඇති දේපළ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා සැලැස්ම.

8.5.5 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

ආදායම්	අයවැය ආදායම - 2025 රු. මි.	සැබෑ ආදායම 2025 - රු. මි.	මූල්‍ය ප්‍රගතිය %
විදේශීය විකුණුම් අධිභාරය	1,080	1,080	100%
අපගමන බද්දේ (Embarkation Levy) සේවා ගාස්තුව	460	495	107%
නියාමන සේවා වලින් උපයන ආදායම	150	157	105%
පොලී ආදායම	545	579	106%
වෙනත් මෙහෙයුම් නොවන ආදායම්	5	37	740%
මුළු ආදායම	2,240	2,348	104%

වියදම	අයවැය වියදම් - 2025 රුපියල් . මිලියන	සැබෑ අයවැය වියදම් - 2025 රුපියල් . මිලියන	මූල්‍ය ප්‍රගතිය %
පුනරාවර්තන වියදම්	812	946	116%
ප්‍රාග්ධන වියදම්	120	30	25%
මුළු වියදම	932	976	104%

8.5.6 මානව සම්පත් කාර්යසාධනය

අධිකාරියේ අනාගත සාර්ථකත්වය සඳහා අවශ්‍ය කුසලතා සහ දැනුම සේවකයින් විසින් වර්ධනය කරන බව සහතික කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම සහ එහි දැක්මට අනුකූලව ඵලදායී ශ්‍රම බලකායක් ක්‍රියාත්මක කිරීම CAASL මඟින් අඛණ්ඩව සිදු කරන ලදි. ඒ සඳහා අධිකාරියේ සේවකයින්හට ලබා දී ඇති පුහුණු වැඩසටහන් පිළිබඳව තොරතුරු පහත පරිදි වේ.

2025 ජනවාරි 1 සිට 2025 දෙසැම්බර් 31 දක්වා

	පුහුණුවීම් සංඛ්‍යාව	පුහුණුවන්නන් සංඛ්‍යාව
අභ්‍යන්තර පුහුණු වැඩසටහන්	9	95
විදේශ රැස්වීම්/සම්මේලන/පරිසංවාද	21	21
විදේශ පුහුණුව/සම්මන්ත්‍රණ/වැඩමුළු	33	52
දේශීය පුහුණුවීම්/සම්මන්ත්‍රණ/වැඩමුළු	15	33
මාර්ගගත පුහුණුවීම්/සම්මන්ත්‍රණ/වැඩමුළු	08	11
එකතුව	**86**	**212**

8.6 ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

8.6.1 හැඳින්වීම

සී / ස ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (AASL) යනු 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනත මඟින් ලබා දී ඇති විධි විධාන යටතේ ව්‍යවස්ථාපිත රාජකාරි ඉටු කිරීම සඳහා 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමකි. එය, ශ්‍රී ලංකාවේ ඇතැම් විශේෂිත සිවිල් ගුවන් සේවාවන් හී එකම ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස සිය කාර්යභාර්ය අඛණ්ඩව ඉටු කරයි.

8.6.2 දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"තිරසාර ආර්ථිකයක් සඳහා වූ ගෝලීය සම්බන්ධතාවයේ මිත්‍රශීලී ගුවන් සේවා හවුල්කරු වීම".

මෙහෙවර

"පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය සහතික කරනු වස්, නවීන තාක්ෂණය මුසුකරගත් හොඳම පරිවයන් තුලින්, වඩා තරඟකාරී මෙන්ම ආරක්ෂිත ගුවන් සේවා සැපයීම සහ ඉහල ගුණාත්මකභාවයෙන් යුතු ආගන්තුක අත්දැකීම් ලබාදීම".

අරමුණු

- අනාගත ඉල්ලුම සපුරාලීම සඳහා ධාරිතාවය උපරිම මට්ටමින් පවත්වා ගැනීම.
- පාරිභෝගික තෘප්තිමත්භාවය සඳහා සේවාවන්වල තත්ත්වය වැඩිදියුණු කිරීම.
- එක්සත් ජාතීන්ගේ තිරසාර අරමුණු ලඟාකර ගැනීමට දායකත්වය ලබාදීම.
- දියුණුවන තාක්ෂණයට අනුගත වීම.
- මානව සම්පත්වල ඵලදායීතාව ඉහළ නංවාලීම.
- ගුවන්සේවා ආරක්ෂක හා සුපරීක්ෂක ප්‍රමිතීන්ට අනුකූලවීම.
- මූල්‍යමය ප්‍රතිලාභ උපරිම කිරීම.

සමාගමේ මූලික ක්‍රියාකාරකම්

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ, ශ්‍රී ලංකා ගුවන් ගමන් තොරතුරු කලාපය (FIR) තුළ ගුවන් යානා සහ මගීන්ගේ ආරක්ෂාව සහතික කරමින් කාර්යක්ෂමව ගුවන් මෙහෙයුම් කටයුතු කිරීම සඳහා ගුවන්සන්තරණ සේවා (ගුවන් ගමන් පාලන සේවා, ගගන නාවික සන්නිවේදන සේවා, ගගන නාවික තොරතුරු සේවා) සැපයීම, ගිනි නිවීම් සේවා සැපයීම සහ ගුවන් ආරක්ෂක සේවා සැපයීම මෙන්ම ශ්‍රී ලංකාවේ ඇති ජාත්‍යන්තර ගුවන් තොටුපලවල් සංවර්ධනය කිරීම,නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම යි. මීට අමතරව යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ (JIA) වැනි දුරස්ථ ගුවන් තොටුපළවල් සඳහා බිම් හැසිරවීමේ සේවා සැපයුම්කරු ලෙස AASL කටයුතු කරයි.

2025 දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

1. **පිටත්වීමේ පර්යන්තයේ ගමන් මලු සැකසීම් සඳහා වූ පහසුකම වැඩි දියුණු කිරීම.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි (බ.ජා.ගු.) පිටත්වීමේ

ගමන් මලු හැසිරවීමේ ධාරිතාව ආසන්න වශයෙන් 45%කින් වැඩි දියුණු කිරීමයි. මෙම ව්‍යාපෘතිය යටතේ පිටත්වයන ගමන් මලු සැකසීමේ කැරොසල් ප්‍රතිසංස්කරණය සහ දිගු කිරීම සිදුවන අතර, ඒ සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද සිදුකරයි. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 937ක් වන අතර, මෙය 2025 ජූලි මාසයේ දී නිම කරන ලදී.

2. ආනයන භාණ්ඩ පර්යන්ත ගොඩනැගිල්ල - පළමු අදියර

ආනයන ගුවන් භාණ්ඩ පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය මඟින් බ.ජ.ගු. හි වාර්ෂික ගුවන් භණ්ඩ හැසිරවීමේ ධාරිතාව මෙට්‍රික් ටොන් 150,000කින් වැඩි කරයි. රුපියල් බිලියන 4.6ක් වැය කෙරෙන මෙම ව්‍යාපෘතිය මඟින් තුන් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම, මාර්ග පුළුල් කිරීම සහ වර්ග අඩි 1,620ක වාහන නැවැත්වීමේ පහසුකම් සැකසීම සිදුකරයි. මෙහි ඉදිකිරීම් 2021 ජනවාරි මාසයේ දී ආරම්භ කරන ලද අතර, 2026 ජනවාරි මාසයේ දී නිම කරන ලදී.

3. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ දෘශ්‍ය ගොඩබෑමේ මාර්ගෝපදේශ පද්ධතිය (VDGS) වැඩිදියුණු කිරීම.

2025 ඔක්තෝබර් මාසයේදී රුපියල් මිලියන 400ක වියදමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ දෘශ්‍ය ගොඩබෑමේ මාර්ගෝපදේශ පද්ධතිය (VDGS) සඳහා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සාර්ථකව නිම කරන ලදී. අවසාන නැවැත්වීමේ අදියරේදී ගුවන් යානා නිවැරදිව ස්ථානගත කිරීමට මෙම පද්ධතිය නියමුවන්ට සහාය වේ.

4. ගුවන්තොටුපළ පහසුකම් සංකීර්ණය ඉදිකිරීම - CIAR

CIAR හි මෙහෙයුම් ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහානව ගුවන්තොටුපොළ පහසුකම් සංකීර්ණයක් ඉදිකිරීම 2026 ජනවාරි මාසයේදී ආරම්භ වී 2027 ජූලි වනවිට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් බිලියන 4.6 කි.

5. BIA සඳහා වූ ප්‍රධාන සැලැස්ම

2026 – 2055 සැලසුම් කාලය සඳහා BIA ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලිය 2025 සිව්වන කාර්තුවේදී ආරම්භ විය. එය ගුවන්සේවා කර්මාන්තය සඳහා ප්‍රධාන සන්ධිස්ථානයක් ලෙස සේවය කරනු ඇත. එහි ප්‍රතිඵල ඉදිරි දශක තුන තුළ පවතින යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ අනාගත පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මඟ පෙන්වනු ඇති අතර, BIA සඳහා දිගුකාලීන යටිතල පහසුකම් සංවර්ධන උපාය මාර්ගය ගෙනහැර දක්වයි. මෙම පැවරුම 2026 මැද භාගය වනවිට අවසන් කිරීමට නියමිතය.

6. ආරක්ෂක පරීක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම.

ගුවන්තොටුපොළ පරීක්ෂණ හැකියාවන් තවදුරටත් ශක්තිමත් කරමින්, AASL විසින් ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානයේ (IOM) ප්‍රදානයක් හරහා ලැබුණු උසස් X-ray ගමන් මලු ස්කෑනර් දහතුනක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. මෙයට ECAC C1 හැකියාවන් සහිත කැබින් ගමන් මලු ස්කෑනර් 07ක්, ECAC C2 හැකියාවන් සහිත උසස් කැබින් ගමන් මලු

ස්කෑනර් 04ක් සහ ද්විත්ව දර්ශන රඳවා ගැනීමේ ගමන් මලු ස්කෑනර් 02ක් ඇතුළත් වේ.

ඉහත සඳහන් කළ සංවර්ධනයන් සාමූහිකව මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණුකර, ජාතික දේශසීමා ආරක්ෂාව ශක්තිමත්කර, මගී ආරක්ෂාව වැඩි දියුණුකර ඇති අතර, ගුවන්සේවා ආරක්ෂාව සහ පහසුකම් සැපයීමේ ගෝලීය හොඳම භාවිතයන් සමඟ ගුවන්තොටුපොළ මෙහෙයුම් පෙළගස්වා ඇත.

7. BIA හි ස්වයංක්‍රීය දේශසීමා පාලන (ABC) ගේට්ටු.

ස්පර්ශ රහිත දේශසීමා පාලන පියවරයන් හඳුන්වාදීම හරහා BIA හි පැමිණීමේ පර්යන්තයේ ස්වයංක්‍රීය දේශසීමා පාලන (ABC) ගේට්ටු 04ක් (ඉලෙක්ට්‍රොනික (E) ගේට්ටු) ස්ථාපනය කිරීම 2025 ජුනි මාසයේදී සිදු වූ අතර, එය ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්තොටුපොළක පළමු E-ගේට්ටු ක්‍රියාත්මක කිරීම සනිටුහන් කරයි. මේවා ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානයේ (IOM) ප්‍රදානයක් හරහා ලැබුණු අතර, මගී සැකසුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට සහ රැඳී සිටීමේ කාලය අඩු කිරීමට අපේක්ෂා කෙරේ. 2025 අවසාන කාර්තුවේදී නියමු ක්‍රියාත්මක කිරීම සාර්ථකව සිදු කරන ලදී.

8. මගී පර්යන්තයේ පොදු වැසිකිළි පහසුකම් ඉදිකිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ පිටත්වීමේ පර්යන්තයේ අත්‍යවශ්‍ය වැසිකිළි පහසුකම් ඉදිකරන ලද අතර, එය ආසන්න වශයෙන් වර්ග මීටර් 213ක් ආවරණය කරයි. මෙයට පිරිමි සහ කාන්තා වැසිකිළි, පිරිසිදු කිරීමේ ප්‍රදේශ, ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශ වියහැකි වැසිකිළියක්, ගබඩා කිරීම සහ පිරිසිදු කිරීමේ පහසුකම් ඇතුළත් වේ. මීට අමතරව, භාණ්ඩ පර්යන්තය 5 හි, ෂවර් කුටි සහිත පිරිමි සහ කාන්තා වැසිකිළි ඇතුළුව ආසන්න වශයෙන් වර්ග මීටර් 35 ක භූමි ප්‍රදේශයක වැසිකිළි පහසුකම් සංවර්ධනය වෙමින් පවතී. 2025 දී ව්‍යාපෘතිය සඳහා අයවැය වෙන් කිරීම රුපියල් මිලියන 178 ක් වූ අතර, කොන්ත්‍රාත් මිල රුපියල් මිලියන 137 ක් විය. ව්‍යාපෘතිය 2025 ඔක්තෝබර් මාසයේදී නිම කරන ලදී.

9. ලෝටස් විවේකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම.

මෙම ව්‍යාපෘතියට වර්ග මීටර් 310 ක ආසන්න බිම් ප්‍රමාණයක් ආවරණයවන පරිදි ලෝටස් විවේකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළත් වන අතර මෙයට කාපට් ඇතිරීම, පාකට් බිම්, දැව ආවරණ, කොටස් කිරීම සහ ගෘහ භාණ්ඩ සහ මුළුතැන්ගෙයි උපකරණ සැපයීම ඇතුළත් වේ. ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් මිල රුපියල් මිලියන 273.3 ක් වන අතර, 2025 සඳහා රුපියල් මිලියන 350 ක් වෙන් කර ඇත. 2025 වසර අවසන් වන විට, වැඩවලින් 95% ක් අවසන් කර ඇති අතර, අපේක්ෂිත නිම කිරීමේ දිනය 2026 සැප්තැම්බර් වේ.

10. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ ගුවන් ආරක්ෂක සේවා සඳහා පහසුකම් සංවර්ධනය කිරීම.

මෙම ව්‍යාපෘතියට පිරිමි සහ කාන්තා ආරක්ෂක නිලධාරීන් 210 දෙනෙකු සඳහා නවාතැන් පහසුකම් සැපයීම සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම ඇතුළත් වේ. කොන්ත්‍රාත්තුව 2025 අගෝස්තු මාසයේදී ප්‍රදානය කරන ලද අතර, මුළු කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 555 කි. 2025

අවසානය වන විට, ඉදිකිරීම් කටයුතුවලින් 6% ක් අවසන් කර ඇති අතර, අපේක්ෂිත නිම කිරීමේ දිනය 2026 ජුනි වේ.

11. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ පවතින වෙක්-ඉන් කවුන්ටර සහ ගමන් මලු පටි ප්‍රතිසංස්කරණය කිරීම.

මෙම ව්‍යාපෘතියට අතිරේක කවුන්ටර 14 ක් සඳහා පහසුකම් සැලසීම සඳහා පවතින වෙක්-ඉන් කවුන්ටර 58 ප්‍රමාණය වෙනස් කිරීම සහ නව ගමන් මලු පටි ස්ථාපනය කිරීම ඇතුළත් වේ. කොන්ත්‍රාත්තුව 2025 ඔක්තෝබර් මාසයේදී රු. මිලියන 588 ක වටිනාකමකින් ප්‍රදානය කරන ලදී. 2025 අවසානය වන විට භෞතික ප්‍රගතිය 5% දක්වා ළඟා වූ අතර, ව්‍යාපෘතිය 2026 ජුනි වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

12. JIA හි මගී පර්යන්ත ගොඩනැගිල්ල පුළුල් කිරීම සහ වෙනස් කිරීම.

පවතින මගී පර්යන්තය සහ ඒ ආශ්‍රිත පහසුකම් අවම අවශ්‍යතා සපුරාලීම සඳහා සංවර්ධනය කර ඇති බැවින්, මගී සුවපහසුව වැඩි දියුණු කිරීම සඳහා පර්යන්තය වැඩිදියුණු කිරීමේ සැලකිය යුතු අවශ්‍යතාවයක් පවතී. මෙම ව්‍යාපෘතිය මඟින් වාර්ෂිකව මගීන් 200,000 ක මගී ධාරිතාවක් සඳහා පර්යන්ත පහසුකම් වැඩි දියුණු කිරීම අරමුණු කරයි. ව්‍යාපෘතිය පැකේජ දෙකකින් ක්‍රියාත්මක වේ. පැකේජය A 2025 නොවැම්බර් මාසයේදී ප්‍රදානය කරන ලද අතර, එය 2026 ජුනි වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ, එහි කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 311 කි. පැකේජය B සඳහා ටෙන්ඩරය කැඳවා ඇති අතර එය 2026 පෙබරවාරි මාසයේදී ප්‍රදානය කිරීමට අපේක්ෂා කෙරේ.

13. BIA හි නව පිරික්සුම් කවුන්ටර 14 ක් හඳුන්වා දී ඇත.

ශීත සමයේදී මගීන්ට සුමට ගුවන්තොටුපොළ මෙහෙයුම් සහතික කිරීම සහ කරදරයකින් තොර අත්දැකීමක් ලබා දීම සඳහා, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ (BIA) අලුතින් ඉදිකරන ලද මාකියේ අත්හදා බැලීමේ පදනමක් මත නව පිරික්සුම් කවුන්ටර 14 ක් හඳුන්වා දෙන ලදී. මෙම පහසුකම 2025 නොවැම්බර් 10 වන දින නිල වශයෙන් විවෘත කරන ලදී. ශ්‍රී ලංකාවේ සංචාරක අත්දැකීම් වැඩිදියුණු කිරීමේ සැලකිය යුතු ඉදිරි පියවරක් සනිටුහන් කරමින් මගී ඉල්ලුම මත පදනම්ව මෙහෙයුම් තවදුරටත් පුළුල් කිරීමට AASL සැලසුම් කරයි.

14. ගුවන් සංතරණ සේවා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

i) **ගුවන් ගමනාගමන කළමනාකරණ පද්ධතිය (ATM):** ගුවන් ගමනාගමන පාලන මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා නව ATM පද්ධතියක් ස්ථාපිත කරන ලද අතර, එය 2023 අවසානයේ සිට ක්‍රියාත්මක වේ. මෙම පද්ධතිය අවම වශයෙන් වසර 10 ක ආයු කාලයක් සඳහා නිර්මාණය කර ඇති අතර, නියාමන අවශ්‍යතා අනුව දීර්ඝ කිරීමේ හැකියාව ඇත. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් බිලියන 1.15 ක් වන අතර එය 2025 ඔක්තෝබර් මාසයේදී නිම කරන ලදී.

ii) **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ ධාවන පථය 04 සඳහා උපකරණ ගොඩබෑමේ පද්ධතිය (ILS):** උපකරණ ගොඩබෑමේ පද්ධතිය සැපයීම,

ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතිය 2023 දී ආරම්භ වූ අතර එය සාර්ථකව ප්‍රගතියක් ලබා ඇත. මෙහෙයුම් භාවිතය සඳහා මුදා හැරීමට පෙර එය දැනට ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) විසින් පරීක්ෂා කිරීම සඳහා බලා සිටී. අඩු දෘශ්‍යතා තත්වයන් යටතේ ආරක්ෂිත ගුවන් යානා ගොඩබෑම සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වන මෙම පද්ධතිය සඳහා AASL රුපියල් බිලියන 1.2 ක් ආයෝජනය කර ඇත.

iii) **ස්වයංක්‍රීය කාලගුණ නිරීක්ෂණ පද්ධතිය (AWOS):** 2024 දී, AASL විසින් ආරක්ෂිත ගොඩබෑමේ සහ ගුවන්ගත කිරීමේ මෙහෙයුම් සඳහා නියමුවන්ට සහ ගුවන් ගමනාගමන පාලකයන්ට අවශ්‍ය තත්‍ය කාලීන කාලගුණ දත්ත සපයන ස්වයංක්‍රීය කාලගුණ නිරීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීම සම්පූර්ණ කරන ලදී. BIA හි AWOS සහ ගුවන්තොටුපොළ පර්යන්ත තොරතුරු පද්ධතිය (ATIS) 2025 දී රුපියල් මිලියන 307 ක මුළු වියදමකින් සම්පූර්ණයෙන්ම නිම කර ක්‍රියාත්මක කරන ලදී.

iv) **පිදුරුතලාගල ද්විතීයික නිරීක්ෂණ රේඩාර්:** ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. බිලියන 1.71 ක් වන මෙම ව්‍යාපෘතිය 2018 දී ආරම්භ කරන ලදී. 2025 අවසානය වන විට, උපකරණ ස්ථානයට ලබා දී ඇති අතර සිවිල් කටයුතු සිදුවෙමින් පවතින අතර, භෞතික ප්‍රගතිය 77% ක් අත්කර ගෙන ඇත. 2025 වන විට මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 576 කි.

මෙහෙයුම් කාර්ය සාධනය

1. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (බ.ජා.ගු.)

2025 දී, බ.ජා.ගු. විසින් ගුවන් යානා මෙහෙයුම් 66,875 ක් හසුරුවා ඇති අතර, ජාත්‍යන්තර මෙහෙයුම් 62,432 ක් සහ දේශීය මෙහෙයුම් 4,443 ක් ඇතුළත් වේ. ගුවන්තොටුපොළ ජාත්‍යන්තර මගීන් 10,008,052 ක් සහ දේශීය මගීන් 7,181 ක් සඳහා සේවා සපයා ඇත. බ.ජා.ගු. විසින් හසුරුවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 190,255කි. 2024 ට සාපේක්ෂව, මගී මෙහෙයුම් 15% ක වර්ධනයක් පෙන්නුම් කරන අතර, ගුවන් යානා මෙහෙයුම් 13% කින් වැඩි විය. කෙසේ වෙතත්, 2024 ට සාපේක්ෂව භාණ්ඩ ප්‍රවාහන පරිමාව 1% කින් පහත වැටුණි. BIA දැනට කාලසටහන්ගත ගුවන් සමාගම් තිස් තුනක් සහිත ගුවන් ගමන් ජාලයක් ක්‍රියාත්මක කරන අතර, එය එහි පූර්ව COVID ජාල ආවරණය වන ගුවන් සමාගම් විසි නවය ඉක්මවා යයි.

2. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ (ම.රා.ජ.ගු.)

2025 දී, MRIA ගුවන් යානා මෙහෙයුම් 733 ක් සිදු කළ අතර, ඉන් ජාත්‍යන්තර 703 ක් සහ දේශීය මෙහෙයුම් 30 ක් ඇතුළත් විය. ගුවන්තොටුපොළ මගී මෙහෙයුම් 140,614 කට පහසුකම් සැලසූ අතර, ඒ සියල්ල ජාත්‍යන්තර විය. භාණ්ඩ හැසිරවීම අවම මට්ටමක පැවති අතර, වසර තුළ වාර්තා වූයේ මෙට්‍රික් ටොන් 25 ක් පමණි. 2024 ට සාපේක්ෂව, 2025 දී මගී මෙහෙයුම් 6% කින්, ගුවන් යානා මෙහෙයුම් 3% කින් සහ භාණ්ඩ මෙහෙයුම් 7% කින් වැඩි විය. වසර තුළ, රෙඩ්වින්ග්ස් ගුවන් සේවය රුසියාවේ මොස්කව් සම්බන්ධ කරමින් MRIA

වෙත සහ ඉන් පිටතට නියමිත මෙහෙයුම් ආරම්භ කළේය.

3. යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (යා.ජා.ගු.)

2025 දී JIA ගුවන් යානා මෙහෙයුම් 1,392 ක් මෙහෙයවූ අතර, ඉන් ජාත්‍යන්තර ගුවන් ගමන් 1,138 ක් සහ දේශීය ගුවන් ගමන් 254 ක් (පුහුණු ගුවන් ගමන් ඇතුළුව) ඇතුළත් විය. මගී මෙහෙයුම් 54,074 දක්වා 33% කින් වැඩි වූ අතර ඉන් 53,443 ක් ජාත්‍යන්තර මගීන් විය. 2024 ට සාපේක්ෂව ගුවන් යානා මෙහෙයුම් 20% කින් වැඩි විය. ඉන්ඩිගෝ ගුවන් සේවය දැනට JIA හි එකම කාලසටහන්ගත ක්‍රියාකරු වන අතර, යාපනය සහ චෙන්නායි අතර සහ යාපනය සහ තිරුචිරප්පල්ලි අතර සතිපතා ගුවන් ගමන් දහයක් ක්‍රියාත්මක කරයි. 2024 සැප්තැම්බර් මාසයේදී ඉන්ඩිගෝ ගුවන්සේවා ආරම්භ කිරීමෙන් පසු එලායන්ස් එයාර් JIA වෙත සහ ඉන් පිටතට මෙහෙයුම් නතර කළේය.

4. රත්මලාන කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (කො.ජා.ගු.ර.)

2025 වසර තුළ CIAR ගුවන් යානා මෙහෙයුම් 25,913 ක් (පුහුණු ගුවන් ගමන් ඇතුළුව) හසුරුවා ඇති අතර, මගී මෙහෙයුම් 2,634 කට පහසුකම් සපයයි. මෙයට ජාත්‍යන්තර මගී මෙහෙයුම් නොමැති ජාත්‍යන්තර ගුවන් යානා මෙහෙයුම් 67 ක් ඇතුළත් වූ අතර, එයින් පෙන්නුම් කරන්නේ ගුවන්තොටුපොළ ප්‍රධාන වශයෙන් මගී ගමනාන්තයක් වෙනුවට තාක්ෂණික නැවතුමක් හෝ වාහන නැවැත්වීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරන බවයි. CIAR මෙහෙයුම්වලින් සැලකිය යුතු කොටසක් වන පුහුණු ගුවන් ගමන් ඇතුළුව දේශීය ගුවන් යානා මෙහෙයුම් ස්ථාවරව පැවති අතර, 2025 දී 1% ක සුළු වැඩිවීමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2024 ට සාපේක්ෂව දේශීය මගී මෙහෙයුම් 18% කින් අඩු විය. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ඇතැම් දේශීය ගුවන් යානා මුහුණ දෙන මෙහෙයුම් බලපත්‍ර ගැටළු වන අතර එමඟින් මෙහෙයුම් සිදු කිරීමේ හැකියාව සීමා විය.

5. මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (ම.ජා.ගු.)

2025 දී, BTIA විසින් දේශීය ගුවන් යානා මෙහෙයුම් 716 ක් සහ දේශීය මගී මෙහෙයුම් 1,836 ක් සඳහා පහසුකම් සපයන ලදී. මෙහෙයුම් මට්ටම 2024 ට අනුකූලව පැවතුනි. 2018 දී නැවත විවෘත කිරීමෙන් පසු BTIA හි ජාත්‍යන්තර මෙහෙයුම් සිදු කර නොමැත.

2025 දී සියලුම ගුවන් තොටුපොළවල ගුවන් යානා, මගී සහ භාණ්ඩ මෙහෙයුම්

ගුවන්තොටුපළ	මුළු ගුවන් යානා මෙහෙයුම්	මුළු මගී මෙහෙයුම්	මුළු ගුවන් භාණ්ඩ මෙහෙයුම් (මේ. ටොං)
බ.ජා.ගු.	66,875	10,015,233	190,255
ම.රා.ජ.ගු.	733	140,614	25
යා.ජා.ගු.	1,392	54,074	-
ම.ජා.ගු.	716	1,836	-
කො.ජා.ගු.ර.	25,913	2,634	-
එකතුව	**95,629**	**10,214,391**	**190,280**

8.6.3 මූල්‍ය කාර්ය සාධනය

රු.මී.

අයිතමය	2024	2025
ආදායම	43,897	50,148
මෙහෙයුම් වියදම්	(24,317)	(23,381)
මෙහෙයුම් ලාභය / (අලාභය)	**19,580**	**26,768**
ශුද්ධ මූල්‍ය ආදායම / (පිරිවැය)	9,091	6,891
ණය පොලී	(2,516)	(2,249)
විනිමය (ලාභ)/ පාඩුව	3,864	1,783
බදු පෙර ලාභය / (අලාභය)	**28,671**	**33,658**

8.6.4 අනාගත ව්‍යාපෘති සහ වැඩසටහන්

1. **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ පවතින මගී පර්යන්ත ගොඩනැගිල්ල (PTB) ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.**

මගී පර්යන්ත ගොඩනැගිල්ලේ (PTB) පවතින ධාරිතාව ඵලදායී ලෙස භාවිතා කිරීම සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ අධික ධාරිතා ගැටළු විසඳීම සඳහා, 2026 සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු කිහිපයක් සැලසුම් කර ඇත.

i) **පිටත්වීමේ පර්යන්ත පුළුල් කිරීම:** මෙය 2026 සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් වන අතර, කාර්යක්ෂම මගී සැකසුම් සහ සුමට මෙහෙයුම් ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු සහායක පහසුකම් සමඟින් ගුවන්සේවා පිරික්සුම් කවුන්ටර තිස් හයක් (36) සහ දුරස්ථ ගේට්ටු විවේකාගාර හයක් (06) එකතු කිරීම ඇතුළත් වේ. ඇස්තමේන්තුගත ආයෝජනය රු. බිලියන 6 කි.

ii) **පිටත්වීමේ ලොබි පුළුල් කිරීම:** මගී සංසරණ ප්‍රවාහය වැඩිදියුණු කිරීම සඳහා පිටත්වීමේ ලොබිය වර්ග මීටර් 1,700 කින් පමණ පුළුල් කෙරේ. මෙම ව්‍යාපෘතිය 2026 දී රු. බිලියන 1.7 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් නිම කිරීමට සැලසුම් කර ඇත. එයට විශාල පිවිසුම් ලොබියක් (මගීන් සහ අමුත්තන් සඳහා) සහ ශ්‍රී ලාංකික සහ අනෙකුත් ගුවන් මගීන් සඳහා කැපවූ මාර්ග දෙකක් එකතු කිරීම ඇතුළත් වේ.

iii) **පැමිණීමේ ආගමන රැඳවුම් ප්‍රදේශයක් ස්ථාපිත කිරීම:** රුපියල් මිලියන 700 ක ඇස්තමේන්තුගත වියදමකින් පැමිණීමේ ආගමන රැඳවුම් ප්‍රදේශයක් ස්ථාපිත කෙරේ. ඉලෙක්ට්‍රොනික වෙළඳසැල් ඉහළ මහලට ගෙනයාමෙන් හිස් අවකාශය වාණිජමය අරමුණු සඳහා යොදා ගැනීම සඳහා පෙර යෝජනා සංශෝධනය කිරීම මෙම සැලැස්මට ඇතුළත් වේ. ආගමන කවුන්ටර ගණන 25 සිට 36 දක්වා වැඩි කෙරෙන අතර, පෝලිම් දිග මීටර් 12 සිට මීටර් 16.6 දක්වා පුළුල් කෙරේ. ඊට අමතරව, තීරුබදු රහිත මෙහෙයුම් සඳහා වාණිජ අවකාශය තවදුරටත් වැඩි දියුණු කෙරේ.

iv) **පැමිණීමේ ලොබිය පුළුල් කිරීම:** පැමිණීමේ මගී අත්දැකීම වැඩි දියුණු කිරීම සහ වඩාත් පිළිගැනීමේ වාතාවරණයක් නිර්මාණය

කිරීම සඳහා, පැමිණීමේ ලොබිය රුපියල් මිලියන 720 ක ඇස්තමේන්තුගත වියදමකින් ප්‍රතිසංවිධානය කෙරේ. මෙයට මුදල් හුවමාරුව සහ බැංකු කවුන්ටර ශාලාවේ කෙළවරට ස්ථානගත කිරීම සහ සංචාරක සහ රට ප්‍රවර්ධන කටයුතු සඳහා සහාය වීම සඳහා හතු තීරු වැනි ව්‍යුහාත්මක අංග හඳුන්වා දීම ඇතුළත් වේ.

v) **පැමිණීමේ පර්යන්තයේ ගමන් මලු හැසිරවීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම:** ගමන් මලු පටි ධාරිතාව වැඩි කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, මෙම ව්‍යාපෘතියට පැමිණීමේ ගමන් මලු කැරොසල් අංක 01 දිගු කිරීම සහ පැමිණීමේ පර්යන්තයේ කැරොසල් අංක 03 සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළත් වේ. මෙම මුලපිරීම අරමුණු කරන්නේ ගමන් මලු හැසිරවීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, මගී පහසුව වැඩි දියුණු කිරීම සහ වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා පහසුකම් වැඩිදියුණු කිරීමයි. ඇස්තමේන්තුගත ආයෝජනය රු. මිලියන 200 කි.

2. **ගුවන් සංචරණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා යෝජිත නව ව්‍යාපෘති.**

i) **E&ANE ජාලයේ AASL සහ IP සංක්‍රමණය සඳහා MW සම්බන්ධතා හතරක්:** මෙම ව්‍යාපෘතිය අරමුණු කරන්නේ ඉතා විශ්වාසදායක සන්නිවේදන යටිතල පහසුකම් හරහා ගුවන් ආරක්ෂාව වැඩි දියුණු කිරීම සහ නවීන ඉහළ ප්‍රතිදාන තාක්ෂණයන්ට සහාය වීමෙන් ගුවන් අවකාශයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමයි. එයට පවතින උරුම මයික්‍රෝවේව් සම්බන්ධතා හතරක් (RMA–PID, PID–KDP, PID–NYB, සහ NYB–MRIA) MW පැකට් රේඩියෝ සම්බන්ධතා සමඟ ප්‍රතිස්ථාපනය කිරීම, සෑම ස්ථානයකම මූලික IP රවුටර යෙදවීම සහ යල් පැන ගිය බහුකාර්ය ප්‍රතිස්ථාපනය කිරීමයි. මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 340 ක් වැය වන අතර, 2027 මාර්තු වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ.

ii) **කඳපොල ඉහළ සංඛ්‍යාත ග්‍රාහක (HF Receivers) පද්ධතිය වැඩි දියුණු කිරීම:** මේ මඟින් සංඥා ලැබීම වැඩි දියුණු කිරීම, විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම සහ පවත්නා සන්නිවේදන ප්‍රමිතීන්ට අනුකූලවීම අපේක්ෂා කෙරේ. ගුවන්තොටුපොළ ක්‍රියාකාරකම් වලදී දීර්ඝ පරාසයක සන්නිවේදන අවශ්‍යතා කාර්යක්ෂමව කිරීම සඳහා මෙම පද්ධතිය උපකාරී වේ. මෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 200 ක් වේ.

iii) **බා.ජා.ගු.: Modes, 5, පිවිසුම් පාලන රේඩා පද්ධතිය නවීකරණය, සැපයුම, ස්ථාපිත කිරීම හා පැවරීම:** මෙම ව්‍යාපෘතිය මඟින් ගුවන් ගමනාගමනය නිරීක්ෂණය කිරීම හා පාලනය කිරීමට නව රේඩාර් පද්ධතියක් ස්ථාපිත කිරීමට බලාපොරොත්තුවේ. අද වන විට මෙහි ප්‍රසම්පාධන ක්‍රියාවලියෙන් 30% ක පමණ කොටසක් අවසන් වී ඇති අතර, තාක්ෂණික පිරිවිතර කටයුතු අවසන් වී ඇත. මෙම ව්‍යාපෘතිය 2028 ජනවාරි මාසය අවසානයේ නිම කිරීමට

බලාපොරොත්තු වන අතර මෙහි ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල් බිලියන 1 ක් වේ.

vi) බා.ජා.ගු: සඳහා නව TETRA භූමික සේවා සන්නිවේදන පද්ධතිය මෙම ව්‍යාපෘතිය මගින් වැඩි දියුණු කරන ලද TETRA සන්නිවේදන පද්ධතියක් සංස්ථාපනය කරන අතර, ඉන් සන්නිවේදන ජාලවල ස්ථාවරත්වය වැඩිදියුණු කිරීම, ආවරණ කලාපය පුළුල් කිරීම, හඬෙහි පැහැදිලිකම වැඩි කිරීම තුලින් ඉක්මනින් තීරණ ගැනීමේ හැකියාව හා වඩා කාර්යක්ෂම සමායෝජනයක් ඇතිවේ. ඉහළ ගමනාගමන තත්වයකදී හෝ අර්බුදකාරී තත්ත්වයකදී මෙම පද්ධතිය විශ්වාසනීයව හා ප්‍රමුඛත්වය අනුව ප්‍රතිචාර දැක්වීම සිදු කිරීම අපේක්ෂා කෙරේ. එමෙන්ම මෙම පද්ධතිය ගු. ගු. සේ.ස. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සන්නිවේදන යටිතල පහසුකම් හා අ.සී.ගු.ස. ප්‍රමිතින්ටද අනුකූල වන අතර, අනාගත මෙහෙයුම් අවශ්‍යතාව සමඟ සැසඳේ. මෙම ව්‍යාපෘතිය 2028 පෙබරවාරී මාසයේ නිම කිරීමට අපේක්ෂා කරන අතර, එහි ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල් මිලියන 500 කි.

3. ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීමේ (ERP) ව්‍යාපෘතිය.

ව්‍ය.ස.සැ. පද්ධතිය වර්තමානය වන විට ආයතනය විසින් ක්‍රියාත්මක කර ඇති අතර ඉන් ආයතනය තුල ඇති දත්ත පද්ධතිය ඒකාබද්ධ කිරීම ආයතනයේ දැක්ම හා උපායමාර්ගික අරමුණු හා ජාතික ගුවන්සේවා මාර්ග උපදේශනයන්ට අනුගතව සිදුකර ඇත. මෙම ව්‍යාපෘතිය අදියර දෙකකින් සමන්විත වේ.

පළමු අදියරේදී මුදල් හා සැපයුම් දාම කළමනාකරණ යන ඒකකවල සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි. මෙම අදියර 2021 ජූලි මස 15 වන දින දියත් කරන ලද අතර, 2023 අවසානයේදී අවසාන පිළිගැනීමේ සහතිකය නිකුත් කරන ලදි. දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට පෙර යටිතල පහසුකම් වල වෙනස්කම් සිදු කිරීම 2026 දී අපේක්ෂා කෙරේ. A Cloude-base System දෙවන අදියර 2027 අවසානයේ ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. මුළු ව්‍යාපෘති පිරිවැය රු. මි. 400 වන අතර, වාර්ෂික ග්‍රාහක මුදල රු. මි. 200කි.

4. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි සූර්ය බල ශක්ති උත්පාදනය.

ගුවන්තොටුපොළ හා ගුවනෙසේවා සමාගම විසින් පුනර්ජනනීය බලශක්තිය භාවිතය කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, ඉන් බලශක්තිය උත්පාදනයේදී ඇතිවන අභියෝග වලට මුහුණ දීම සාර්ථකව සිදු කිරීමට අපේක්ෂා කෙරේ. තිරසාර සංවර්ධන අරමුණු ලභා කර ගැනීම මෙම සැලැස්මේ කොටසක් ලෙස 2026 වසරේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවනතොටුපොළ, කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ යන ගුවන්තොටුපොළවල කි.වො. 1300 ක බෙදා හරින සූර්ය බල ශක්ති පද්ධතියක් ක්‍රියාත්මක වන අතර, එහි ඇස්තමේන්තුගත පිරිවැය රු. මි. 200කි. මීට අමතරව කි.වො.600 ක ධාරිතාවයක් ඇති වහල මත ස්ථාපනය කරන සූර්ය පැනල පද්ධතියක්ද 2026 වර්ෂය තුල බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළට එක්වීමට නියමිතය.

5. ගුවන්තොටුපොළ මෙහෙයුම් ගොඩනැගිල්ල (බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ) ඉදි කිරීම.

යෝජිත ගුවන්තොටුපොළ මෙහෙයුම් ගොඩනැගිල්ල මහල් 09කින් සමන්විත වන අතර, අතරමැදි වාහන නැවතීමේ පහසුකම් සහිත මහල් දෙකකින් යුක්ත වේ. මහල් 07ක් පරිපාලන අරමුණු සඳහා වෙන් කෙරේ.

පළමු අදියරේදී මුළු සැකැස්ම සමඟ මහල් හතරක් පරිපාලන අරමුණු සඳහා වාහන නැවතුම් පහසුකම් සමඟ ගොඩනැගීමට අපේක්ෂා කෙරේ. දෙවන අදියරේදී ඉතිරි කොටස් සම්පූර්ණ කිරීම අපේක්ෂාවයි. පළමු අදියර 2029 මැයි මස නිම කිරීමට අපේක්ෂා කරන අතර, එහි මුළු පිරිවැය රු. බිලියන 5.2 වේ.

මුහුණු දුන් අභියෝග

- **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ මෙහෙයුම්**

2025 වසරේදී, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ තුල මගින් මිලියන 10.2 ක් හසුරුවා ඇති අතර, 2026 අවසන් වන විට වාර්ෂික මගී සංචලනය මිලියන 11.3 දක්වා ලඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පවතින පර්යන්තය මුලින් සැලසුම් කර තිබුනේ මගින් මිලියන 06ක් සඳහා පහසුකම් සැලසීමටය. නමුත් පර්යන්තය 01හි සිදුකරන ලද ධාරිතා වැඩිකිරීමේ වෙනස් කිරීම් තදබදය අඩු කිරීමට උපකාරී වී ඇත. කෙසේ වෙතත්, පර්යන්තය 02හි ඉදි කිරීම් 2029 දක්වා ප්‍රමාද වී ඇති අතර, 2027 වන විට මගී සංචලනයන් මිලියන 12.5 දක්වා වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළට ඇති ප්‍රධාන අභියෝගය වන්නේ පර්යන්තය 2 ක්‍රියාත්මක වෙන තෙක් වැඩිවන මගී පරිමාව කළමනාකරණය කිරීමයි. එහි ඉදිකිරීම් ප්‍රමාදය තදබදයේ පීඩනය තවදුරටත් තීව්‍ර කර ඇත.

- **මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවතොටුපොළ මෙහෙයුම්**

පසු කැබිනට් අනුමැතියට යටත්ව ගුවන්තොටුපොළ හා ගුවන්සේවා සමාගම මඟින් දැනටමත් ආයෝජන අවස්ථා පිලිබඳ කැමැත්ත දක්වන පාර්ශවයන්ට අවස්ථාව ලබා දී ඇති අතර, සුදුසු ආයෝජකයන් තෝරාගැනීම සමාගමට විශාල අභියෝගයක් වී ඇත.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ තුල වන සතුන් හා පාරිසරික ගැටළු මෙන්ම මෙහෙයුම් අඩුකම නිසා අභියෝග රැසකට මුහුණ දීමට සිදු වී ඇත. 2025 මුල් භාගයේදී මිට අදාලව වනජීවී දෙපාර්තමේන්තුව, සිවිල් ආරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික ඉංජිනේරු හා සංවර්ධන මධ්‍යස්ථානය සමඟ සාකච්ඡා කර ස්ථිරසාර විසඳුමක් ලබා ගැනීමට අපේක්ෂා කර ඇත. වනසතුන් පලවා හැරීම සහ ගුවන්තොටුපොළ වටා ඇති ආරක්ෂිත වැටවල් ශක්තිමත් කිරීම වරින් වර සිදු කරන ලදි. ආලෝකකරණය වැඩි දියුදියුණු කිරීම හා කැළෑ කපා ඉවත්කිරීම තුලින් ආරක්ෂාව හා දර්ශනපථය අවහිර වීම වැලැක්වීම සිදු කරන ලදි. මෙය ඉතාමත් අභියෝගාත්මක කාර්යයක් වන්නේ වන සතුන්ගේ ක්‍රියාකාරකම් හා ප්‍රතිචාර වරින් වර වෙනස් වන නිසාවෙනි.

- **යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සංවර්ධනය ශක්‍යතා අධ්‍යනයකින් පසු ජාත්‍යන්තර ගුවන්තොටුපොළ පුළුල් කරන්නේද යන්න පිළිබඳ තීරණය ගැනීම අවසන් වී නොමැති නමුත්, 2026 අයවැය**

මඟින් රු. මිලියන 625 ක මුදලක් යාපනය ගුවන් තොටුපල සංවර්ධන කටයුතු සඳහා වෙන්කර ඇත.

මෙයට යටිතල පහසුකම් සංවර්ධනය, මාර්ග ගොඩනැගීම, මගී පර්යන්තය නවීකරණය හා ගගන යාත්‍රාගණය, වැඩි දියුණු කිරීම ඇතුලත් වේ. ශක්‍යතා අධ්‍යනය වාර්තා නොලැබීම නිසා බා.ජා.ගු: පිළිබඳ තීරණ ගැනීම අභියෝගාත්මක වී ඇත. ශක්‍යතා අධ්‍යනය නොමැතිකම ගුවන්තොටුපොළ පුළුල් කිරීම පිළිබඳ තීරණ ගැනීමේදී අභියෝග එල්ල කරයි.

- **අභ්‍යන්තර ගුවන්සේවා**

සාකච්ඡාවට කිහිපයක් තුලින් අභන්තර ගුවන්සේවාවලට ඇති ප්‍රශ්න හා ඒවාට අදාල නිදන්ගත හේතු සැලකිල්ලට ගන්නා ලදි. මීට අදාල යෝජනා ලෙස අභ්‍යන්තර ගුවන්සේවාවලට අදාලව අන්තර් ජාතික ගුවන්සේවා නීතිරීති ලිහිල් කිරීම. ඉන්ධන සහනාධාර ලබා දීම හා අවශ්‍ය අවම සේවක පිරිස පවත්වාගෙන යාම දැක්විය හැකිය. මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක වී ඇත. තවද පහත 2.4.5. හි සඳහන් කර ඇති අභියෝග අභ්‍යන්තර ගුවන්සේවා පුළුල් කිරීමේදී බරපතල ගැටළුවක් වන්නේ ඉන්ධන පිරිවැය ඉහළ අගයක් ගන්නා බැවිනි.


8.6.5 මානව සම්පත් කාර්යසාධනය

දේශීය පුහුණු වැඩසටහන් 22ක් සඳහා සේවකයින් 7342ක් සහ විදේශීය පුහුණු වැඩසටහන් 74 සඳහා සේවකයින් 198ක් යොදවා ඇත.


සමාගම විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් තුලින් සේවක කැපවීම ඉහළ නැංවීමට, තාක්ෂණික කුසලතා වැඩිදියුණු කිරීමට සහ විශේෂිත පුහුණුව තුලින් සේවා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම මගින් සමාගමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීමට සෘජුවම සහාය වන්නේය. ශ්‍රී ලංකා ගුවන්තොටුපොල සහ ගුවන්සේවා විද්‍යාලය විසින් පවත්වනු ලබන විශේෂිත පුහුණුවක් මඟින් ICAO ප්‍රමිතීන්ට අදාළ ප්‍රධාන නිපුනතා වර්ධනය කරන අතර අවසානයේ මෙහෙයුම් ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව ශක්තිමත් කරනු ලැබේ. එමෙන්ම අනෙකුත් විදේශීය සහ දේශීය පුහුණු අවශ්‍යතාද සපුරාලන අතර, එමඟින් සේවකයින්ට අවසාන ආන්ෂණික ආයතනික අරමුණු ඉටුකර ගැනීමට හැකි වන්නේය.

ඇමුණුම I

සංවිධාන ව්‍යුහය - වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය



ඇමුණුම II


වෙළඳ නාවික ලේකම් කාර්යාලය
වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්
පාලන අංශය
ගිණුම් අංශය
නාවික අංශය
විභාග හා පුහුණු අංශය
ඉංජිනේරු අංශය
නෞකා සමීක්ෂණ අංශය
නීති අංශය
බලපත්‍ර හා සංවර්ධන අංශය
අධ්‍යක්ෂ (පාලන)
ප්‍රධාන ගණකාධිකා
අධ්‍යක්ෂ (නාවික)
අධ්‍යක්ෂ (පුහුණු)
විභාග පරීක්ෂක (නැව් තට්ටු)
විභාග පරීක්ෂක (ඉංජිනේරු)
අධ්‍යක්ෂ (ඉංජිනේරු)
අධ්‍යක්ෂ (නෞකා සමීක්ෂණ)
වරාය රාජ්‍ය පාලන (නැව් තට්ටු)
වරාය රාජ්‍ය පාලන (ඉංජිනේරු
අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා නීති)
අධ්‍යක්ෂ (බලපත්‍ර)
සහකාර අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ
ගණකාධිකාරී
සහකාර අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ (පුහුණු සහ විභාග)
සහකාර අධ්‍යක්ෂ
නැව් ලියාපදිංචි සහ ව්‍යාපාර සංවර්ධන
අතිරේක අධ්‍යක්ෂ (නෞකා සමීක්ෂණ)
නීති නිළධාරී
සහකාර අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ
අභ්‍යන්තර විගණක
පරි. නිල.
නො.කා. නිල.
රජයේ සහකාර නෞකා සමීක්ෂක
සංවර්ධන නිලධාරී
නැව් ගමන් නිලධාරී/ සහකාර නැව් ගමන් නිලධාරී
කළමණාකරණ සේවා නිලධාරී
කා.කා.ස. / රියදුරු



ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

போக்குவரத்துஇ நெடுஞ்சாலைகள்இ துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு

MINISTRY OF TRANSPORT, HIGHWAYS, PORTS AND CIVIL AVIATION